බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා: 25

## සූත්‍රාන්ත පිටකයෙහි

19 වන ග්‍රන්ථය

# සුත්තනිපාතය

ලංකා බෞද්ධමණ්ඩලයේ ආරාධනයෙන්
දෙමටගොඩ පධානසරවිහාරාධිපති
භාෂාන්තරවිශාරද ශාස්ත්‍රාචාර්ය
**රාජකීය පණ්ඩිත**
**පරවාහැර සිරි පඤ්ඤානන්දාභිධාන**
කොළඹ නවකෝරළයේ ප්‍රධාන නායකස්ථවිරයන්වහන්සේ
විසින් සපයනලද සිංහල පරිවර්තනය

ත්‍රිපිටක සම්පාදකමණ්ඩලයේ මහතෙරවරුන්ගේ
පාඨසංශොධන පූර්වක සංස්කරණයෙන් යුක්තයි.

ශ්‍රී ලංකා ජනරජය මගින් ප්‍රකාශිත යි.

බු: ව: 2550
ක්‍රි: ව: 2006

Free Distribution www.aathaapi.org

Buddha Jayanti Tripitaka Series, Volume 25

The Nineteenth Book in the

**Suttanta-Pitaka**

**Khuddaka-Nikāya (2)**

**19**

# SUTTANIPĀTO

With the Sinhala translation by

**The Venerable Pandita**
**Paravāhera Siri Paññānanda**
The Chief Sangha Nāyake Thero, B.A. of
Nine Korales of Colombo

නමෝ තස්ස භගවතෝ සබ්බධම්මේසු අප්පටිහතඤාණචාරස්ස දසබලධරස්ස චතුවේසාරජ්ජවිසාරදස්ස සබ්බසත්තුත්තමස්ස ධම්මිස්සරස්ස ධම්මරාජස්ස ධම්මස්සාමිස්ස තථාගතස්ස සබ්බඤ්ඤුනො සම්මාසම්බුද්ධස්ස !!!

භාග්‍යවත් වූ සියලු ධර්මයන්හි නොපැකිල ඥානචාර සහිත වූ දසබලධාරී වූ චතුර්වෛශාරදත්ව විශාරද වූ සියලු සත්වයන්ට උත්තම වූ ධර්මයට ඊශ්වර වූ ධර්මරාජ වූ ධර්මස්වාමී වූ තථාගත වූ සර්වඥ වූ සම්මා සම්බුදුනට නමස්කාර කරමි !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද මාගේ නමස්කාරය පිළිගනිත්වා !!!

## බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පරිගණක ගත කර නොමිළයේ බෙදාහැරීමේ මහා ධර්ම දානමය පුණ්‍යකර්මය

**"අපාරුතා තේසං අමතස්ස ද්වාරා
යේ සෝතවන්තෝ පමුඤ්චන්තු සද්ධං"**

"කන් ඇත්තාහු සැදැහැ මුදත්වා
ඔවුනට අමා දොර විවෘත කරන ලදී"

අප භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම අනුසාසනය මෙහි ලා සිහි කිරීම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය පරිශීලනය කරන්නා වූ පින්වතුන්ගේ අභිවෘද්ධිය පිණිස ම වන බව අපගේ හැඟීම ය.

සැම කල්හි ඥාන සම්ප්‍රයුක්ත ව ක්‍රියා කරන්නා වූ සියලු සම්මා සම්බුදුරජාණන් වහන්සේලාගේ පලමු අනුශාසනය, බුද්ධ රත්නය කෙරෙහි ගෞරව කරන්නා වූ බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුදු බෝධිය අදහන්නා වූ කවර නම් පුද්ලයෙකු නො සළකා හිදිත් ද ? චතු වෛශාරදත්ව සහිත වූ දශ බල සහිත වූ අනාවරණ ඥාන සහිත වූ සර්ඥ වූ මහා කාරුණිකයන් වහන්සේ පවා නිවන අවබෝධ කර ගැනීම පිණිස ධම්මානුධම්ම ප්‍රතිපදාව ආරම්භ කරන පුද්ගලයා තුල 'සද්ධා' නම් වූ ගුණය අත්‍යාවශ්‍ය ය යන්න අවධාරනය කරන සේක.

මෙම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය සැක නොකළ යුතු ය. සැක කරමින් හදාරන ලෞකික ශිල්ප ශාස්ත්‍ර පවා පරිපූර්ණ ව නො පිහිටන බව සිහි ඇතිව බැලීමෙන් නුවණ ඇත්තාහට දැක ගත හැකි ය. පුරුෂයා ශ්‍රේෂ්ඨ බවට පමුනු වන්නා වූ සද්ධා ධනය සහිත ව ("සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං") මෙම ධර්ම රත්නය පරිශීලනය කරන්නාහට සද්ධා අංගයෙන් ලැබිය යුතු සියල්ල ලැබෙනු නො අනුමාන ය. එසේ ම සිහියෙන් ලැබිය යුතු කොටස ද වීර්යයෙන් ලැබිය යුතු කොටස ද සමාධියෙන් ලැබිය යුතු කොටස ද ප්‍රඥාවෙන් ලැබිය යුතු කොටස ද ලැබෙන පරිදි සද්ධා, සති, විරිය, සමාධි සහ ප්‍රඥා යන පංච ධර්මයන් තමා තුල ඇති කර ගෙන මහත් වූ ගෞරවය සහිත ව ධර්මාවබෝධය පිණිස ම යොමු වූ දැඩි අධිෂ්ඨානයෙන් මෙම ධර්ම පුස්තක පරිශීලනය කළ යුතු ය. අපගේ බුද්ධ ශාසනයෙහි

ධර්ම ශ්‍රවනයෙන් මග ඵල ලැබුවෝ ම අධික ය. විමුක්තිය ලබන්නා වූ ක්‍රම වේදයන් පහක් විස්තර කරන්නා වූ අංගුත්තර පංචක නිපාතයෙහි 'විමුත්තායතන' සූත්‍රයෙහි නිවන ලබන ක්‍රම වේද සතරක් ම ධම්ම දේශණාමය සහ ධම්ම සවනමය පුණ්‍ය කර්ම ඇසුරින් සිදුවන බව පැහැදිලි කර ඇත. පස්වැනි ක්‍රම වේදය භාවනාමය පුණ්‍ය කර්මය ප්‍රගුණ කිරීමෙන් සාර්ථක වන බව ද එහි සඳහන් වේ.

මහත් වූ ගෞරවාදරයෙන් මහා සුගතයන් වහන්සේගේ අනුශාසනය පිළිපදින්නා වූ අප්‍රමාදී ව ධම්මානුධම්ම ප්‍රතිපදාව වඩන්නා වූ සියලු සත්නට, ත්‍රෛකාලික වූ සියලු දුකින් මිදී ලබන්නා වූ අජර වූ අමර වූ අමා මහ නිවන අවබෝධ වීම පිණිස මෙම මහඟු පුණ්‍ය කර්මය උපනිශ්‍රය වේවා !

ආර්යයන් වහන්සේලා පහළවීමෙන් සිරිලක බැබලේවා !

බුද්ධ ශාසනය දියුණුවී චිරස්ථිතික වේවා !

ලෝ සත්නට සෙත් වේවා !

**"අමතං දදෝ ච සෝ හෝති, යෝ ධම්මමනුසාසති"**

( *යමෙක් ධර්මානුශාසනය කරන්නේ ද, හේ අමෘතය දෙන්නේ ය* )

මෙම ධර්ම දානමය පුණ්‍ය කර්මය

මෝහ තිමිර විධ්වංසනය කරන්නා වූ ලොවට උතුම් ආලෝකය වූ මහා කාරුණික වූ සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ සර්වඥතා ඥානයට ද මහා කරුණා ගුණයට ද පූජෝපහාරයක් ම වේවා !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද අපගේ පුණ්‍ය කර්මය අනුමෝදන් වෙත්වා !!!

ශාසනාභිවෘද්ධිකාමී,

සමින්ද රණසිංහ.

2009.06.28

සුත්තන්තපිටකෙ

ඛුද්දකනිකායො

# සුත්තනිපාතො

සූත්‍රාන්තපිටකයෙහි

කුදුගත්සඟිය

# සූත්‍රනිපාතය

Free Distribution www.aathaapi.org

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති, නො පටිච්ඡන්නො."

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරන ලද ධර්මය හා විනය විවෘත වූයේ බබලයි. වැසුණේ නො ම බබලයි."

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත - හරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

සැලකිය යුතුය : මෙම පොතෙහි පටුන, පිටු අංක 17 හි ඇතුලත් කර ඇත. එම පටුනෙහි මාතෘකාවන් හා පිටු අංක අදාළ පිටු සමඟ සම්බන්ධ කර ඇත. මෙහි කියවීමට ඇති ප්‍රදේශයට වම් පසින් ඇති 'පිටු යොමුව' භාවිතා කිරීමෙන් නැවත පටුනට පැමිණීමට පුලුවන. වම් පසින් පාළි පිටුව ද දකුණු පසින් අදාළ සිංහළ පිටුව ද කියවීම සඳහා VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS යන ක්‍රමය භාවිතා කරන්න.

Please note : The TABLE OF CONTENTS of this book is located in page no:17 and it is linked with associated pages in the book for your convenience. You can easily click on the page number or content description in the 'Table of Contents' and you will be directed to the relevant page. Bookmarks located to the left of reading area can be used to navigate back to 'Table of Contents' Page. If you would like to view Pali page on your left and the relevant Sinhala page on your right select the menu items as follows; VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS.

# පටුන

# CONTENTS


| | | | | |
|---|---|---|---|---|
| සංස්කාරක නිවේදනය | ... | ... | ... | ix |
| ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය | ... | ... | ... | xi |
| සංඥපනය | ... | ... | ... | xiii |
| සංකේත නිරූපණය | ... | ... | ... | xvii |
| පාළි හෝඩිය | ... | ... | ... | xix |
| විසය සූචි | ... | ... | ... | xxi |
| පෙළ හා පරිවර්තනය | ... | ... | ... | 2–353 |
| ගාථාදිපාද සූචි | ... | ... | ... | 355–373 |
| සංඥනාම සූචි | ... | ... | ... | 375–377 |
| විශෙෂ පදනුක්කමණිකා | ... | ... | ... | 379–400 |




Free Distribution www.aathaapi.org

# සංස්කාරක නිවේදනය

සම්බුද්ධපරිනිර්වාණයෙන් දෙදහස්පන්සියවසක් පිරීම ප්‍රීතිකොට ගෙන ථෙරීය බුද්ධධර්මය ව්‍යාප්තව පවත්නා රටවල බෞද්ධජනතාව විසින් එම බුද්ධජයන්තිය විශෙෂ උත්සව සහිත ව පවත්වාලීමට විධිවිධාන යෙදූ අතර අප සිංහලද්වීපයෙහි එකල පැවැති ලඞ්කාරජය මගින් බුද්ධජයන්ති උත්සවය ඉතා උත්කර්ෂව පවත්වාලුව මැනැවැයි සලකා ඒ සඳහා කටයුතු සංවිධානය පිණිස 1954 ඔක්තෝබර් මස 12 වැනිදින තත්කාලීන අග්‍රාමාත්‍යවර සර් ජෝන් කොතලාවල මැතිතුමන් විසින් ලඞ්කාබෞද්ධමණ්ඩලය පිහිටුවන ලද්දේය.

බුද්ධජයන්ති අනුස්මරණය සඳහා ඒ ලඞ්කාබෞද්ධමණ්ඩලය මගින් යොජිත වූ කාර්‍ය්‍යයන් අතුරෙහි අතිශයින් ශ්‍රේෂ්ඨ වූ ද එහෙත් ඉතා දුෂ්කර වූ ද කර්තව්‍යය වූයේ ත්‍රිපිටක පර්‍ය්‍යාපන්න වූ සියලු ග්‍රන්ථයන් සිංහල-භාෂායෙන් පරිවර්තන කොට මුද්‍රණය කරවාලීම ය. ග්‍රන්ථපරිවර්තනය සඳහා පත්කරනලද මහතෙරවරුන් අතුරෙහි සුත්තනිපාත පරිවර්තනය ප්‍රවරනලදුයේ රාජකීය පණ්ඩිත පරවාහැර සිරි පඤ්ඤානන්ද නායකස්ථවිරයන් වහන්සේට යැ. උන්වහන්සේ ස්වකීය අධිකාරය යථාකාලයෙහි නිමහම් කළ බව ප්‍රකාශ කළ යුතු ය.

සූත්‍රනිපාතය බුද්ධජයන්ති ත්‍රිපිටකග්‍රන්ථමාලායෙහි පස්විසිවන ග්‍රන්ථය ද සූත්‍රාන්තපිටකාගත එකුන්විසිවැනි ග්‍රන්ථය ද වේ. ධර්ම හෙයින් ද අර්ථ හෙයින් ද ගම්භීර වූ සූත්‍රනිපාතව්‍යාඛ්‍යානය දුෂ්කර වූයෙකි. එහි වඩාත් ගැඹුරු වූ අට්ඨක වර්ගයෙහි සූත්‍ර සොළොස යැ, පාරායන වර්ගයෙහි සූත්‍ර සොළොස යැ, ඛග්ගවිසාණ සූත්‍ර යැ යන තෙතිස් සූත්‍රයනට අගසව් සැරියුත් මහරහතුන් වහන්සේ විසින් ශ්‍රාවකපාරමීඥානයෙහි සිට නිද්දෙස වදරන ලදුයේ කුදුගත් සඟියෙහි වෙන ම ග්‍රන්ථයක් ලෙස සඞ්ගීතියට නැඟී ඇත. නිද්දෙස පාළියෙහි උද්දිෂ්ට වූ තෙතිස් සූත්‍රයන්ගේ පරිවර්තනය අප විසින් නිමවන ලදු වැ මුද්‍රණයෙන් පළවූයේ ද වෙයි.

සූත්‍රනිපාතය මුද්‍රණ අවස්ථාවට පැමිණ වර්තමාන ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයේ ශාස්ත්‍රාගමධර මහතෙරවරුන්ගේ මහත් පරිශ්‍රමයෙන් විරාගත දෙෂස්ථාන බැහැර කිරීමෙන් පාඨශොධනය හා පරිවර්තන සංස්කරණය ද සිදුකරන ලද්දේය. ආදියෙහි මැ ත්‍රිපිටකමණ්ඩලය විසින් සම්මත වූ පරිදි පරිවර්තක නායකස්ථවිරයන් වහන්සේ විසින් ආදෘත වූ අක්ෂරවින්‍යාසය



Free Distribution www.aathaapi.org

මෙහි තබන ලද බව ද කියැයුතු ය. ග්‍රන්ථමුද්‍රණය ඉක්මනින් නිමහම් කරවාලීම සඳහා දවරයෙහි මද විවෙකයකුදු නො ලැබ ක්‍රියා කරන සම්පාදකමණ්ඩලයේ නියුක්ත වූ තෙරවරුනට මෙහි දී ප්‍රශංසා කළයුතු ව ඇත.

තවද ත්‍රිපිටක මුද්‍රණය සඳහා ශ්‍රී ලඞ්කාජනරජයේ ගරු අග්‍රාමාත්‍යවර **සිරිමාවෝ බණ්ඩාරනායක** උත්තමාව විසින් පළකරන ප්‍රසාදය හා අනුග්‍රහය ද, එසේ ම ගරු සංස්කෘතික ඇමතිතුමාණන් ප්‍රමුඛ එම අධිකාරියේ සියලු පින්වතුන්ගේ අනුග්‍රහය ද, දෙහිවල තිසර මුද්‍රණාලයාධිකාරීතුමා ප්‍රමුඛ සෙවකමණ්ඩලයේ උද්‍යොගය ද, සිංහල පරිවර්තන සහිත සූත්‍රනිපාතය මෙසේ බෞද්ධමහාජනයා අතට පමුණුවාලීමට උපකාර වූ බව කෘතඥතා පූර්වක ව සඳහන් කරම්හ.

සදෙවක ලොකයාට හිත පිණිස පවත්නා අතිපරිශුද්ධ ත්‍රිපිටක පර්‍ය්‍යාප්තිය ව්‍යාප්ත කරවාලීමෙහි යත්න දරන සියලු පින්වත්හු සුඛිත වෙත්වා’යි ආශංසනය කරම්හ.

මෙවගට ශාසනොදයකාරී;

ලබුගම ලඞ්කානන්ද සථවිර
ත්‍රිපිටකමණ්ඩලයේ ප්‍රධාන සම්පාදක

1977 පෙබරවාරි මස 25 වැනි දින
ත්‍රිපිටක කාර්‍ය්‍යාලය,
මහානායක, වාරිකාරාමය,
115, විජේරාම මාවත,
කොළඹ 7.



Free Distribution www.aathaapi.org

# ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

**උපදේශක:**

අග්‍රමහාපණ්ඩිත බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහා ස්ථවිරපාදයන් වහන්සේ.

**සභාපති:**

අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨයෙහි (භික්ෂු විශ්වවිද්‍යාලයෙහි) අධිපති ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය, කෝදාගොඩ ශ්‍රී ඥානාලෝක දක්ෂිණ ලඞ්කායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

**ප්‍රධාන සම්පාදක:**

මොල්ලිගොඩ, ප්‍රවචනෝදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්ය, ත්‍රිපිටක වාගීශ්වර, රාජකීය පණ්ඩිත ලබුගම ශ්‍රී ලඞ්කානන්ද-කෝට්ටෙ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහා සඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

**සම්පාදක:**

ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, රද්දැල්ලේ සිරි පඤ්ඤාලෝක – ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, වෙඩරුවෙ සිරි අනොමදස්සී බටහිර දිශායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ – මාකඩවර විහාරාධිපති රාජකීය පණ්ඩිත, කරහම්පිටිගොඩ සිරි සුමනසාර ස්ථවිරයන්වහන්සේ.

කොළඹ, තිඹිරිගස්යායේ අශොකාරාමාධිපති, රාජකීය පණ්ඩිත, කරදන පඤ්ඤාලඞ්කාර නායක ස්ථවිරයන් වහන්සේ.

**ලේඛකාධිකාරී:**

කොළඹ, බෞද්ධාලෝක මාවතෙහි බෞද්ධාලෝක විහාරාධිපති, පණ්ඩිත, දෙරගමුවේ සිරි ධම්මපාල – කොළඹ පළාතේ ප්‍රධානසඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.



Free Distribution www.aathaapi.org

# සංඥපනය

අප භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සාරාසඞ්ඛ්‍යකල්පලක්ෂයකින් පෙර දීපඞ්කරපාදමූලයෙහි නියත විවරණ ලත් තැන් පටන් කසුප් සම්මාසම්බුදුන් දක්වා සූවිසි බුදුන් හමුයෙහි විවරණසිරි ලබමින් විශ්වන්තරාත්මභාවයෙහි සිට සමතිස් පැරුම් නිෂ්ඨාවට පමුණුවා තුසිපුරයෙහි ඉපද එහි ආයුපමණින් දිවසිරි වළඳා එයින් සැවැ ශාක්‍යරාජකුලයෙහි ඉපද අනුක්‍රමයෙන් මහබිනික්මන් කොට බෝධිමූල වජ්‍රාසනයෙහි වැඩහිඳ සම්‍යක්සම්බොධිසමධිගමය කොට දම්සක් පවත්වා දෙව්මිනිස්නට හිත පිණිස තුන්සපුන් පිහිටුවා පන්සාළිස් වසක් මුළුල්ලෙහි සුවාසූදහසක් දහම්කඳ පවත්වා නිරුපධිශේෂ නිර්වාණ ධාතුයෙන් පිරිනිවි කල්හි–

මහාකාශ්‍යපාදී මහරහතුන් වහන්සේ ප්‍රථම මහාධර්මසඞ්ගීති අවසථාවට පැමිණ පිටකාදී වශයෙන් සියලු ධර්මය සඞ්ගායනාවට නඟාලූහ. එහි සූත්‍රාන්තපිටකය 'දීඝ, මජ්ඣිම, සංයුත්ත, අඞ්ගුත්තර, ඛුද්දක' යන ආගම හෙවත් නිකාය පසට බෙදී ඇත. දීඝාදී සතර ආගමයෙහි නො බැසගත් 'ඛුද්දකපාඨ, ධම්මපද, උදනා'දී දේශනාපාළිය සංගායනා කොට ඛුද්දක ග්‍රන්ථයන්ගේ සංග්‍රහය වූයෙන් 'ඛුද්දකනිකාය' නමැයි තැබූහ. ප්‍රස්තුත වූ තෙල 'සුත්තනිපාත'ය කුදුගත්සඟියෙහි පස්වැනි ග්‍රන්ථය වේ.

සියගණන් ගාථායෙන් සමාකීර්ණ වූ ශාස්තෘශාසනනවාඞ්ගයෙහි ගෙය්‍ය–වෙය්‍යාකරණාඞ්ග දෙකින් ලක්ෂිත වූ තෙල තන්ති සංග්‍රහය කුමක් හෙයින් 'සුත්තනිපාත' නම් වී යැ යත්: ආත්මාර්ථ පරාර්ථාදී භේද වූ වෛනෙය්‍යහිත සංඛ්‍යාත අර්ථජාතය ප්‍රකාශ කරන හෙයින් ද (අත්ථානං සූචනතො) වෛනෙය ජනයාගේ අධ්‍යාශයට – චරිතයට අනුරූප කොට වදළ හෙයින් ද (සුවුත්තතො) වී ආදී ශස්‍යය ඵල උපදවන්නා සේ හිතාර්ථයන් ප්‍රසව කරන හෙයින් ද (සවනතො) දෙනගෙන් කිරි දෙවන්නා සේ උපායසම්පන්නයහට හිතාවහ හෙයින් ද (සූදනතො) ප්‍රතිපන්නයන් මැනැවින් රක්නා හෙයින් ද (සුත්තාණ) වඩුවාට දැළිනූල සෙයින් විඥයනට ප්‍රමාණ වන හෙයින් හෝ හුයෙන් ගෙතුණු මල් නො විසිරෙන්නා සේ පාළියෙන් ගෙතුණු අර්ථයෝ නො විසිරෙත් නුයි සූත්‍ර සදෘශ හෙයින් ද (සුත්තසභාගතො) උරගසූත්‍රාදී ධර්මය 'සුත්ත' යී ප්‍රකාශ කරන ලද වෙයි. මෙ කී ලක්ෂණ ඇති උරග සූත්‍රාදී පිඬිය සූත්‍රාන්ත වූ සූත්‍රයන් නිපාතනය කොට – සංග්‍රහ කොට සංගීත වූ ග්‍රන්ථය ධම්මපද උදනාදිය සෙයින් අන්‍යසංඥ නිමිත්තක් නැතියෙන් සංගීතිකාරක මහතෙරවරුන් විසින් ''සුත්තනිපාත'' නාමයෙන් ම තබන ලද්දේය.



Free Distribution www.aathaapi.org

තෙල ‘සුත්තනිපාත’ය වර්ගහෙයින් උරගවග්ග, චූලවග්ග, මහාවග්ග, අට්ඨකවග්ග, පාරායනවග්ග, යී වර්ග පසෙක් ඇත්තේ වෙයි, සූත්‍ර හෙයින් උරගවර්ගයෙහි සූත්‍ර දෙළොසෙක් ද, චූලවර්ගයෙහි තුදුසෙක් ද, මහාවර්ගයෙහි දෙළොසෙක් ද, අට්ඨකවර්ගයෙහි සොළොසෙක් ද, පාරායනවර්ගයෙහි සොළොසෙක් දැයි සමසැත්තෑ සූත්‍ර කෙනෙක් වෙති. එහි උරගසූත්‍රය ආදීම වෙයි. පර්‍ය්‍යාප්තිප්‍රමාණයෙන් සූත්‍රනිපාතය අටබණවරෙකි. අෂ්ටාක්ෂරපාද ඇති ගාථා දෙසිය පනසෙක් බණවරක් වනුයෙන් සූත්‍රනිපාතය සූසැටදහසක් පමණ අක්ෂරයෙන් ප්‍රතිමණ්ඩිත වේ.

සූත්‍රනිපාත පාළියෙහි සංගෘහීත වූ පද්‍ය (ගාථා) සංඛ්‍යාව එක්දහස් එකසියසූපනසෙකි (1154) මේ ගාථා අතුරෙහි දේශනාපාළියෙහි කලාතුරෙකින් දක්නට ලැබෙන අතිජගතීඡන්දසෙහි ලා ගැණෙන ගාථා ස්වල්පයෙක් නාලක-වත්ථුගාථා තුළ දක්නට ලැබේ. මේ ලක්ෂණ ඇති ගාථා ජාතක-පාළියෙහි කිසි තැනෙක දක්ක හැකි ය.

සූත්‍රනිපාතය වූ කලි ඒ ඒ දේශනාපාත්‍රයන්ගේ වශයෙන් වෛනෙය-ජන අධ්‍යාශයානුරූප කොට වදාළ ගම්භීර වූ අර්ථව්‍යඤ්ජනයන්ගෙන් සැදුම් ලත් සූත්‍රයෙන් පරිපූර්ණ වෙයි. එහෙයින් ම අග්‍රශ්‍රාවක සර්වඥකල්ප ශාරීපුත්‍ර මහරහතුන් වහන්සේ සූත්‍රනිපාතයෙහි එන අට්ඨකවග්ග සූත්‍ර සොළොස යැ, පාරායනවග්ග සූත්‍ර සොළොස යැ, ඛග්ගවිසාණ සූත්‍ර යැ යන තෙතිස් සූත්‍රයන් උද්දෙසපද වශයෙන් තබා අර්ථවිභාවනද්වාරයෙන් නිද්දෙස වදාළහ. (මහානිද්දෙස-සංඥපනය ද බලන්න.) එසේ මැ ‘නෙත්තිප්පකරණ පෙටකොපදෙස’ දෙක්හිදු ධර්මන්‍යාය විභාග කරනු සඳහා අට්ඨකවග්ගිය, පාරායනවග්ගිය සූත්‍ර බෙහෙවින් නිදර්ශිත වෙයි.

තවද ධම්මභාණ්ඩාගාරික ආනන්ද තෙරණුවන් විසින් විචාළ ප්‍රශ්නයක් සඳහා අර්හත් මාර්ග-ඵලසමාධිය විස්තර කරන බුදුරජාණන් වහන්සේ තිකඞ්ගුත්තර දෙවදූතවර්ගයෙහි “ආනන්දයෙනි මෙ කරුණ සඳහා මා විසින් පාරායනයෙහි පුණ්ණකප්‍රශ්නයෙහි ලා තෙල ප්‍රකාශ කරනලදැ”යි (ඉදං ච පන මෙතං ආනන්ද සන්ධාය භාසිතං පාරායනෙ පුණ්ණකපඤ්හෙ) පාරායන-පුණ්ණක සූත්‍රයෙහි එන “සඞ්ඛාය ලොකස්මිං පරොවරානි” යනාදි ගය නිදර්ශන කොට වදාළහ. එසේ ම ධර්මසෙනෙවි සැරියුත් මහතෙරණුවනට අර්හත්ඵලවිමොක්ෂය දක්වාලීම සඳහා යට කී දේවදූතවර්ගයේ සාරිපුත්ත-සූත්‍රයෙහි දී පාරායන උදයසූත්‍රය නිදර්ශන කරමින් “පහානං කාමච්ඡන්දානං” යනාදි දෙගය වදාළහ. එහි ‘කාමච්ඡන්දානං’ යන පදය අඞ්ගුත්තර භාණකයන්ගේ වාචනාමාර්ගයෙහි ‘කාමසඤ්ඤානං’ යි එයි. අර්ථයෙන් සම සම වේ. මේ බලත් මැ සුත්තනිපාත පාළියෙහි සංගෘහීත වූ සූත්‍රධර්ම-යන්ගේ පරමගාම්භීර්‍ය්‍යය වටහාගත හැකි ය.



Free Distribution www.aathaapi.org

තවද කියැ යුත්තෙකි: ප්‍රථම ධර්මසංගීතියෙහි දී තෙවළාදහම් පිළිබඳ නිකාය පණ්ණාසක, වර්ගාදි විවිධ විභාගයන් නිශ්චය කළබව ප්‍රකාශ වෙයි. ඒ විභාගකල්පනය වැලිත් බුදුරදුන්ගේ ධරමානකාලයෙහි ම එකදේශයෙකින් පැවැතිණ. ධම්මපද, උදාන, ඉතිවුත්තකාදි ඛුද්දකග්‍රන්ථයන් මෙනි. එසේ 'ම පාරායනවග්ග, අට්ඨකවග්ග, ආදි ව්‍යවහාරය ද ආදියෙහි මැ සිද්ධ යැ: මහකසයින් තෙරණුවන්ගේ අතැවැසි කුරරඝරවැසි කාළි උපාසිකාවගේ පුත් සොණකුටිකණ්ණ තෙරුන් බුදුරදුන් හමුයෙහි මධුරස්වරයෙන් අට්ඨකවග්ගිය සූත්‍ර ප්‍රකාශ කළ බව සඳහන් වෙයි. මෙකරුණ දම්සක් පැවැත්වීමෙන් යටත්පිරිසෙයින් සුවිසිවසකින් පසුව සිදුවූවකි. මෙ වන විට සූත්‍රනිපාතයෙහි බොහෝ සූත්‍ර දේශිත වැ තිබිණ. සොණ-තෙරුන් සිය වත්තෙරුන් වෙත සූත්‍රනිපාතය උගත්බව සඳහන්වන හෙයිනි, එහිදු අත්තදණ්ඩ සූත්‍රය ශාක්‍ය-කොලිය කලහය සන්හිඳුවීම සඳහා ද, පුරාභෙද, කලහවිවාද, චූලවියූහ, මහාවියූහ, තුවටක, සම්මාපරිබ්බා-ජනීය සූත්‍ර මහාසමය සමාගමයෙහි ද වදරනලද වෙයි. මෙසේ බොහෝ සූත්‍ර ප්‍රථමබෝධියෙහි වදළබව පෙනෙන අතර උරගසූත්‍රය වැනි කිසි සූත්‍රයෙක් පශ්චිමබෝධියෙහි දී වදළබව ද සැලැකියයුතු ය. "යො වෙ උප්පතිතං විනෙති කොධං" යනාදිය භූතගාම ශික්ෂාපදය පැනැවීමෙන් පසු වදරන ලද වෙයි. උද්දෙසපරියාපන්න ශික්ෂාපද බුද්ධත්වයෙන් විසිහවුරුද්දක් ඉක්මැගිය පසු පශ්චිමබොධියට අයත්වන හෙයිනි. මෙසේ 'සුත්තනිපාත පාළිය' ගෙන බොහෝ විචාරකයන් ප්‍රකාශ කරන කරුණු ද විමසුව යෙහෙකි.

සුත්තනිපාතයෙහි ශෝධනය හා ව්‍යාඛ්‍යානය ගෙන කියැයුතු කරුණු බෙහෙවින් ඇත. එහෙත් සංඥපනය සංක්ෂිප්ත කළ මනා වූයෙන් දෙතුන් තැනෙක් සඳහන් කරනු ලැබෙ. ඛග්ගවිසාණ සූත්‍රයෙහි "එකො චරෙ ඛග්ගවිසාණකප්පො" යනු එයි. එහි 'චරෙ' යනු කිසි තැනෙක ප්‍රථමපුරුෂ වශයෙන් ද කිසි තැනෙක උත්තමපුරුෂ වශයෙන් ද ආයේ යැ, පසේබුදුහු උදානවශයෙන් මේ ගාථා ප්‍රකාශ කළහ. එහි ක්‍රියාපදය ප්‍රථම පුරුෂයෙහි වෙයි. කිසි තැනෙක අධිගත වූ කර්මස්ථානය ප්‍රකාශ කිරීම් වශයෙන් ද උදාන ගාථාව ම වදළහ, එහි ක්‍රියාපදය උත්තම පුරුෂ යි. අර්ථ ව්‍යාඛ්‍යානයෙහි ලා මේ විශේෂය දතහෙයි.

මෙහි අනෙකුදු කියැයුත්තෙකි: නාලකසූත්‍රවත්ථුගාථායෙහි "සක්කඤ්ච ඉන්දං සුචිවසනෙ ච දෙවෙ" (682) යී සිංහල මුද්‍රණයෙහි හා බුරුම සංස්-කරණයෙහි ද එයි. එය "සක්කං ච ඉන්දං" යී ශුද්ධ වියයුතු ය. 'සක්දෙවිඳු (ඉන්ද්‍ර වූ ශක්‍රයා) ද පිවිතුරු දිවසළු ඇති දෙවියන් ද, යී ව්‍යාඛ්‍යාන වෙයි. මෙබඳු ශොධ්‍යස්ථාන ද විමසිය යුතු ය.



Free Distribution www.aathaapi.org

මෙ ද සැලැකියැ යුත්තෙකි; සුත්‍රනිපාතයෙහි සංගෘහීත වූ 'මෙත්ත, රතන, මඞ්ගල' සූත්‍ර ඛුද්දකපාඨයෙහි ද සංග්‍රහ වී ඇත. සසුන් වදනා කුලදරුවනට මුලින් මැ පුහුණුකරවාලි යැ යුතු සරණගමන, දසසික්ඛා ආදි දහම් කොටස් නඟාගෙන බුද්ධකාලයෙහි සිට මැ ඛුද්දකපාඨය සම්මත වැ තුබූබව සිතියැ හෙයි. එහි නික්ෂෙපක්‍රමය අටුවායෙහි ඇත. සංගීතිකාරක-යන් විසිනුදු එය ඛුද්දකග්‍රන්ථයක් සේ ගෙන කුදුගත්සඟියේ පළමුවන ගත සෙයින් සංගීත විය. යළි සුත්තනිපාතයෙහි බැසගැනීමට නිසිව සිටි හෙයින් එහිදු නියතස්ථානයෙහි සංග්‍රහ කරනලද වෙයි. එසේ මැ 'සෙල' සූත්‍රය මැදුම්සඟි යැ සඟහාලියැයුතු මධ්‍යමප්‍රමාණ සූත්‍රයක් වූයෙන් එහි මජ්ඣිමපණ්ණාසකයෙහි ලා සංගීත විය. යළි සෙලසූත්‍රයෙහි බැසගෙන සිටි ධර්මපරියාය සලකා සූත්‍රනිපාතයෙහි ද සංග්‍රහ කළබව කියැයුතු ය.

තවද, අශෝකාධිරාජයන් විසින් භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකාවෝ නිතර අසත් නම්, ධරත් නම් මැනැවැයි "භාබ්‍රැ" ශිලා ලිපියෙහි දක්වාලූ, 'මුනිගාථා' මොනෙය්‍ය (නාලක) සූත්‍ර, උපතිස්සපඤ්හ (සාරිපුත්ත සූත්‍ර) රාහුලොවාද' යන ධර්මපරියායයෝ මේ සූත්‍රනිපාතයෙහි සංග්‍රහ වෙති, මෙසේ බුදුන් දවස පටන් සූත්‍රනිපාතය ප්‍රශස්ත වූ බව සැලැකිය යුත්තේ යි.

සූත්‍රනිපාතාගත ධර්මාත්තරයන්ගේ ගැඹුරුබව හෙතු කොට ගෙන මැ අගසවු සැරියුත් මහරහතුන් වහන්සේ විසින් යට දැක්වූ තෙතිස් සූත්‍රයනට වදළ නිද්දෙස ද, අර්ථකථාචාර්ය බුද්ධඝෝෂ මහතෙරණුවන් විසින් ලියනලද 'පරමත්ථජෝතිකා' නම් අටුවාව ද, පුරාණ ආචාර්යවරයකු විසින් අට්ඨක-වග්ගාදි කිසි සූත්‍ර කෙනකුන්ට ලියනලද ව්‍යාඛ්‍යානය ද සූත්‍රනිපාතාර්ථාව-බෝධයට වහල් වෙයි. එසේ ම පරවාහැර සිරිපඤ්ඤානන්ද නායක ස්ථවිරයන්ගේ මේ සූත්‍රනිපාත සිංහලානුවාදය ද බෞද්ධජනතාවගේ ධර්මාවබොධය පිණිස වෙතී සිතමහ.

මේවගට ශාසනොදයකාරී
ලබුගම ලඞ්කානන්ද ස්ථවිර

බු: ව: 2520
ක්‍රි: ව: 1977, පෙබරවාරි 25 දින
මොල්ලිගොඩ,
ප්‍රවචනොදය පිරිවෙන්හිදී ය.



Free Distribution www.aathaapi.org

# සංකේත නිරූපණය

සී මු. 1, සිංහලාක්ෂර මුද්‍රණය, බු: ව: 2484

සිමු. 2, සිංහලාක්ෂර මුද්‍රණය – හේවාවිතාරණ,

මජසං. මරම්මජරට්ඨ සංගීති මුද්‍රණය,

සයා. ස්‍යාමක්ෂර මුද්‍රණය,

ප. පරමත්ථජෝතිකා, සුත්තනිපාත අටුවා

PTS. Pali Text Society, Suttanipata



Free Distribution www.aathaapi.org

පාළි හෝඩිය

# THE PALI ALPHABET

## IN SINHALA CHARACTERS

### VOWELS

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අ a | ආ ā | ඉ i | ඊ ī | උ u | ඌ ū | එ e | ඔ o |

### CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa |
| ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña |
| ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa |
| ත ta | ථ tha | ද da | ධ dha | න na |
| ප pa | ඵ pha | බ ba | භ bha | ම ma |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ය ya | ර ra | ල la | ව va | ස sa | හ ha | ළ ḷa | ං ṃ |
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ ke | කො ko |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khe | ඛො kho |
| ග ga | ගා gā | ගි gi | ගී gī | ගු gu | ගූ gū | ගෙ ge | ගො go |

### CONJUCT - CONSONANTS

| | | | |
|---|---|---|---|
| ක්ක kka | ඤ්ඤ ñña | ත්‍ර tra | ම්ඵ mpha |
| ක්ඛ kkha | ණ්හ ṇha | ද්ද dda | ම්බ ,mba |
| ක්‍ය kya | ඤ්ච ñca | ද්ධ ddha | ම්භ mbha |
| ක්‍රි kri | ඤ්ඡ, ñcha | ද්‍ර dra | ම්ම mma |
| ක්ව kva | ඤ්ජ, ñja | ද්ව, dva | ම්භ mbha |
| ඛ්‍ය khya | ඤ්ඣ ñjha | ධ්ව dhva | ය්‍ය, ය්‍ය yya |
| ඛ්ව khva | ට්ට ṭṭa | න්ත nta | ය්හ yha |
| ග්ග gga | ට්ඨ, ṭṭha | න්ථ ntha | ල්ල lla |
| ග්ඝ ggha | ඩ්ඩ ḍḍa | න්ද nda | ල්‍ය lya |
| ඞ්ක ṅka | ඩ්ඪ ḍḍha | න්ධ ndha | ල්හ lha |
| ග්‍ර gra | ණ්ණ ṇṇa | න්න nna | ව්හ wha |
| ඞ්ඛ ñkha | ණ්ට ṇṭa | න්හ nha | ස්ස ssa |
| ඞ්ග ñga | ණ්ඨ ṇṭha | ප්ප ppa | ස්ම sma |
| ඞ්ඝ ṅgha | ණ්ඩ, ṇḍa | ප්ඵ ppha | ස්ව sva |
| ච්ච cca | ත්ත tta | බ්බ bba | හ්ම hma |
| ච්ඡ ccha | ත්ථ ttha | බ්භ bbha | හ්ව hva |
| ජ්ජ jja | ත්ව tva | බ්‍ර bra | ළ්හ ḷha |
| ජ්ඣ jjha | | ම්ප mpa | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ා ā | ි i | ී ī | ු u | ූ ū | ෙ e | ො o |



Free Distribution www.aathaapi.org

# සුත්තනිපාත

## විසය සූචි

### 1. උරගවග්ගො 2—67


| | | |
|---|---|---|
| 1— 1. | උරග සුත්තං ... ... ... ... | 6— 11 |
| 1— 2. | ධනිය සුත්තං ... ... ... ... | 12— 23 |
| 1— 3. | ඛග්ගවිසාණ සුත්තං ... ... ... | 22— 29 |
| 1— 4. | කසිභාරද්වාජ ,, ... ... ... | 28— 31 |
| 1— 5. | චුන්ද ,, ... ... ... | 30— 37 |
| 1— 6. | පරාභව ,, ... ... ... | 36— 43 |
| 1— 7. | වසල ,, ... ... ... | 44— 47 |
| 1— 8. | මෙත්ත ,, ... ... ... | 46— 55 |
| 1— 9. | හෙමවත ,, ... ... ... | 54— 61 |
| 1—10. | ආළවක ,, ... ... ... | 54— 61 |
| 1—11. | විජය ,, ... ... ... | 60— 63 |
| 1—12. | මුනි ,, ... ... ... | 62— 67 |


### 2. චූළවග්ගො 68—121


| | | |
|---|---|---|
| 2— 1. | රතන සුත්තං ... ... ... | 68— 73 |
| 2— 2. | ආමගන්ධ ,, ... ... ... | 74— 77 |
| 2— 3. | හිරි ,, ... ... ... | 78— 79 |
| 2— 4. | මඞ්ගල ,, ... ... ... | 80— 83 |
| 2— 5. | සූචිලොම ,, ... ... ... | 82— 85 |
| 2— 6. | කපිල ,, ... ... ... | 84— 87 |
| 2— 7. | බ්‍රාහ්මණධම්මික ... ... ... | 86— 95 |
| 2— 8. | ධම්ම (නාවා) ... ... ... | 94— 97 |
| 2— 9. | කිංසීල සුත්තං ... ... ... | 96— 99 |
| 2—10. | උට්ඨාන ,, ... ... ... | 98—101 |
| 2—11. | රාහුල ,, ... ... ... | 100—103 |
| 2—12. | නිග්‍රොධකප්ප (වංගීස) සුත්තං ... ... | 102—107 |
| 2—13. | සම්මාපරිබ්බාජනීය ,, ... ... | 108—113 |
| 2—14. | ධම්මික ,, ... ... | 112—121 |




Free Distribution www.aathaapi.org

## විසය සූචි

### 3. මහාවග්ගො 122—241


| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 3— 1. | පබ්බජ්ජා සුත්තං | | ... | ... | ... | 122—125 |
| 3— 2. | පධාන | ,, | ... | ... | ... | 126—131 |
| 3— 3. | සුභාසිත | ,, | ... | ... | ... | 130—133 |
| 3— 4. | සුන්දරිකභාරද්වාජ (පූරලාස) සුත්තං | | ... | | ... | 132—143 |
| 3— 5. | මාඝ | සුත්තං | ... | ... | ... | 144—151 |
| 3— 6. | සභිය | ,, | ... | ... | ... | 152—167 |
| 3— 7. | සෙල | ,, | ... | ... | ... | 166—181 |
| 3— 8. | සල්ල | ,, | ... | ... | ... | 182—185 |
| 3— 9. | වාසෙට්ඨ | ,, | ... | ... | ... | 186—201 |
| 3—10. | කොකාලික | ,, | ... | ... | ... | 200—213 |
| 3—11. | නාලක | ,, | ... | ... | ... | 212—223 |
| 3—12. | ද්වයතානුපස්සනා | ,, | ... | ... | ... | 224—241 |


### 4. අට්ඨකවග්ගො 242—305


| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 4— 1. | කාම | සුත්තං | ... | ... | ... | 242—243 |
| 4— 2. | ගුහට්ඨක | ,, | ... | ... | ... | 244—247 |
| 4— 3. | දුට්ඨට්ඨක | ,, | ... | ... | ... | 246—249 |
| 4— 4. | සුද්ධට්ඨක | ,, | ... | ... | ... | 248—253 |
| 4— 5. | පරමට්ඨක | ,, | ... | ... | ... | 252—255 |
| 4— 6. | ජරා | ,, | ... | ... | ... | 254—259 |
| 4— 7. | තිස්සමෙත්තෙය්‍ය | ,, | ... | ... | ... | 258—261 |
| 4— 8. | පසූර | ,, | ... | ... | ... | 260—265 |
| 4— 9. | මාගන්දිය | ,, | ... | ... | ... | 264—269 |
| 4—10. | පුරාභෙද | ,, | ... | ... | ... | 268—273 |
| 4—11. | කලහවිවාද | ,, | ... | ... | ... | 272—277 |
| 4—12. | චූලවියූහ | ,, | ... | ... | ... | 278—283 |
| 4—13. | මහාවියූහ | ,, | ... | ... | ... | 282—289 |
| 4—14. | තුවටක | ,, | ... | ... | ... | 288—295 |
| 4—15. | අත්තදණ්ඩ | ,, | ... | ... | ... | 294—299 |
| 4—16. | සාරිපුත්ත | ,, | ... | ... | ... | 300—305 |




Free Distribution www.aathaapi.org

## විසය සූචි

### 5. පාරායනවග්ගො 306—353


| | | |
|---|---|---|
| | පාරායනවත්ථුගාථා ... ... ... | 306—315 |
| 5—1. | අජිත සුත්තං ... ... ... ... | 316—317 |
| 5—2. | තිස්සමෙත්තෙය්‍ය සුත්තං ... ... ... | 318—319 |
| 5—3. | පුණ්ණක සුත්තං ... ... ... | 318—321 |
| 5—4. | මෙත්තගූ ,, ... ... ... | 320—325 |
| 5—5. | ධොතක ,, ... ... ... | 324—227 |
| 5—6. | උපසීව ,, ... ... ... | 328—331 |
| 5—7. | නන්ද ,, ... ... ... | 330—333 |
| 5—8. | හෙමක ,, ... ... ... | 334—335 |
| 5—9. | තොදෙය්‍ය ,, ... ... ... | 334—337 |
| 5—10. | කප්ප ,, ... ... ... | 336—337 |
| 5—11. | ජතුකණ්ණි ,, ... ... ... | 338—339 |
| 5—12. | භද්‍රාවුධ ,, ... ... ... | 338—341 |
| 5—13. | උදය ,, ... ... ... | 340—343 |
| 5—14. | පොසාල ,, ... ... ... | 342—343 |
| 5—15. | මොඝරාජ ,, ... ... ... | 344—345 |
| 5—16. | පිඞ්ගිය ,, ... ... ... | 344—347 |
| | පාරයනත්ථුතිගාථා ... ... ... | 345—349 |
| | පාරායනානුගීති ගාථා ... ... ... | 348—353 |




Free Distribution www.aathaapi.org

ඛුද්දකනිකායෙ

# සුත්තනිපාතො

Free Distribution www.aathaapi.org

# ඛුද්දකනිකායෙ

# සුත්තනිපාතො

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස

## උරගවග්ගො

### 1 -- 1

### උරගසුත්තං

1 යො[1] උප්පතිතං විනෙති කොධං විසටං සප්පවිසංව ඔසධෙහි,
සො භික්ඛු ජහාති ඔරපාරං උරගො ජිණ්ණමිව තචං[2] පුරාණං.

2 යො රාගමුදච්ඡිදා අසෙසං භිසපුප්ඵං'ව සරොරුහං විගය්හ,
සො භික්ඛු ජහාති ඔරපාරං උරගො ජිණ්ණමිව තචං පුරාණං.

3 යො තණ්හමුදච්ඡිදා අසෙසං සරිතං සීඝසරං විසොසයිත්වා,
සො භික්ඛු ජහාති ඔරපාරං උරගො ජිණ්ණමිව තචං පුරාණං.

4 යො මානමුදබ්බධී අසෙසං නළසෙතුං'ව සුදුබ්බලං මහොඝො,
සො භික්ඛු ජහාති ඔරපාරං උරගො ජිණ්ණමිව තචං පුරාණං.

5 යො නාජ්ඣගමා භවෙසු සාරං විචිනං පුප්ඵමිව[3] උදුම්බරෙසු,
සො භික්ඛු ජහාති ඔරපාරං උරගො ජිණ්ණමිව තචං පුරාණං.

---

1. යො වෙ - ස්‍යා.
2. ජිණ්ණ මිවත්තචං - මජසං.
3. පුප්ඵමිවා - සීමු2, මජසං.



Free Distribution www.aathaapi.org

## කුදුගත්සඟියෙහි

# සූත්‍රනිපාතය

ඒ භාග්‍යවත් අර්හත් සම්මාසම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා !

# උරගවග්ගය

## 1 -- 1
## උරග සූත්‍රය

1. යම් මහණෙක් උපන් ක්‍රෝධය පැතිරගිය සර්පවිෂ ඖෂධයෙන් නසාලන්නාක් සෙයින් දුරු කෙරේ ද එ මහණ උරගයකු දිරාගිය පැරණි සැව හැරලන්නාක් මෙන් (පඤ්චොරම්භාගිය සංයොජන සඞ්ඛ්‍යාත) ඔරපාරය ඔරිමතීරය හැරපියයි.

2. යම් මහණෙක් විලට බැස නෙලුම්මල් නෙළන්නාක් සෙයින් පඤ්චකාමගුණරාගය නිරවශේෂ කොට සිඳලන්නේ වේ ද, ඒ මහණ උරගයකු දිරාගිය පැරණි සැව හැරලන්නාක් මෙන් (පඤ්චොරම්භාගිය සංයොජන සඞ්ඛ්‍යාත) ඔරපාරය හැරපියයි.

3. යම් මහණෙක් වෙළෙවි ව ගලාබස්නා හොයක් බඳු තෘෂ්ණාව නිඃශෙෂ කොට වියළවා සිඳලන්නේ වේ ද එ මහණ උරගයකු දිරාගිය පැරණි සැව හැරලන්නාක් මෙන් (පඤ්චොරම්භාගිය සංයොජන සඞ්ඛ්‍යාත) ඔරපාරය හැරපියයි.

4. යම් මහණෙක් මහවතුරක් ඉතාදුබල නළමුවා හෙයක් බිඳලන්නාක් සෙයින් (නවවිධ) මානය නිඃශේෂ කොට (රහත්මඟින්) නසාලන්නේ වේ ද එ මහණ උරගයකු දිරාගිය පැරණි සැව හැරලන්නාක් මෙන් ඔරපාරය හැරපියයි.

5. යම් මහණෙක් මල් නෙළන්නකු දිඹුල්රුක්හි මල් නොලබන්නාක් සෙයින් (කාමාදි) භවයෙහි සාරයක් නොලබන්නේ වේ ද එ මහණ උරගයකු දිරාගිය පැරණි සැව හැරලන්නාක් මෙන් ඔරපාරය හැරපියයි.

6 යස්සන්තරතො න සන්ති කොපා ඉති භවාභවතං ච වීතිවත්තො,
සො භික්ඛු ජහාති ඔරපාරං උරගො ජිණ්ණමිව තචං පුරාණං.

7 යස්ස විතක්කා විධූපිතා අජ්ඣත්තං සුවිකප්පිතා අසෙසා,
සො භික්ඛු ජහාති ඔරපාරං උරගො ජිණ්ණමිව තචං පුරාණං.

8 යො නාච්චසාරී න පච්චසාරී සබ්බං අච්චගමා ඉමං පපඤ්චං,
සො භික්ඛු ජහාති ඔරපාරං උරගො ජිණ්ණමිව තචං පුරාණං.

9 යො නාච්චසාරී න පච්චසාරී සබ්බං විතථමිදන්ති ඤත්වා[1] ලොකෙ,
සො භික්ඛු ජහාති ඔරපාරං උරගො ජිණ්ණමිව තචං පුරාණං.

10 යො නාච්චසාරී න පච්චසාරී සබ්බං විතථමිදන්ති වීතලොභො,
සො භික්ඛු ජහාති ඔරපාරං උරගො ජිණ්ණමිව තචං පුරාණං.

11 යො නාච්චසාරී න පච්චසාරී සබ්බං විතථමිදන්ති වීතරාගො,
සො භික්ඛු ජහාති ඔරපාරං උරගො ජිණ්ණමිව තචං පුරාණං.

12 යො නාච්චසාරී න පච්චසාරී සබ්බං විතථමිද'න්ති වීතදොසො,
සො භික්ඛු ජහාති ඔරපාරං උරගො ජිණ්ණමිව තචං පුරාණං.

13 යො නාච්චසාරී න පච්චසාරී සබ්බං විතථමිදන්ති වීතමොහො,
සො භික්ඛු ජහාති ඔරපාරං උරගො ජිණ්ණමිව තචං පුරාණං

14 යස්සානුසයා න සන්ති කෙචි මූලා අකුසලා සමූහතාසෙ,
සො භික්ඛු ජහාති ඔරපාරං උරගො ජිණ්ණමිව තචං පුරාණං.

1. ඤත්වා – මජසං, සයා, PTS. ප.

6. යම් මහණෙක්හුගේ සිත්හි කෝප නැත්ද (ශාශ්වතාදි) ඉතිභවාභවතාව ඉක්මසිටියේ වේ ද එ මහණ උරගයකු දිරාගිය පැරණි සැව හැරලන්නාක් මෙන් ඔරපාරය හැරපියයි.

7. යම් මහණෙක්හු විසින් (කාමාදි) විතර්කයෝ නසන ලද්දහු වෙත් ද, සිය සතන්හි එ හැම විතර්කයෝ මොනොවට සිඳින ලද්දහු වෙත් ද, එ මහණ උරගයකු දිරාගිය පැරණි සැව හැරලන්නාක් මෙන් ඔරපාරය හැරපියයි.

8. යම් මහණෙක් (අත්‍යාරබ්ධවීර්ය වශයෙන්) අතිධාවන නො කරන්නේ නො පසුබස්නේ වේ ද (තෘෂ්ණාදි,) මෙ හැම ප්‍රපඤ්චය සමතික්‍රමණ කෙළේ වේ ද එ මහණ උරගයකු දිරාගිය පැරණි සැව හැරලන්නාක් මෙන් ඔරපාරය හැරපියයි.

9. යම් මහණෙක් අවකාශලෝකයෙහි ලා මෙ හැම විතථ යයි දැන අතිධාවන නො කරන්නේ නො පසුබස්නේ වේ ද එ මහණ උරගයකු දිරාගිය පැරණි සැව හැරලන්නාක් මෙන් ඔරපාරය හැරපියයි.

10. යම් මහණෙක් මෙ හැම විතථ යයි දැන පහවගිය ලොභ ඇත්තේ අතිධාවන නො කරන්නේ නො පසුබස්නේ වේ ද එ මහණ උරගයකු දිරාගිය පැරණි සැව හැරලන්නාක් මෙන් ඔරපාරය හැරපියයි.

11. යම් මහණෙක් මෙ හැම විතථ යයි දැන පහවගිය රාග ඇත්තේ අතිධාවන නො කරන්නේ නො පසුබස්නේ වේ ද, එ මහණ උරගයකු දිරාගිය පැරණි සැව හැරලන්නාක් මෙන් ඔරපාරය හැරපියයි.

12. යම් මහණෙක් (අත්‍යාරබ්ධවීර්යවශයෙන්) අතිධාවන නො කරන්නේ (කුසීතභාවයෙහි වැටෙමින්) නො පසු බස්නේ මෙ හැම ධර්මසමූහය විතථ යැයි දැනැ පැහූ ද්වෙශ ඇත්තේ වේ ද, එ මහණ උරගයකු දිරාගිය පැරණි සැව හැරලන්නාක් මෙන් ඔරපාරය හැරපියයි.

13. යම් මහණෙක් අතිධාවන නො කරන්නේ නො පසු බස්නේ මෙහැම ධර්මසමූහය විතථ යැයි දැනා පහකළ මොහ ඇත්තේ වේ ද, එ මහණ උරගයකු දිරාගිය පැරණි සැව හැරලන්නාක් මෙන් ඔරපාරය හැරපියයි.

14. යම් මහණෙක්හට කිසිදු අනුශය කෙනෙක් නැත් ද, මූල නම් ලත් අකුශලයෝ ද නසන ලද්දහු වෙත් ද, එ මහණ උරගයකු දිරාගිය පැරණි සැව හැරලන්නාක් මෙන් ඔරපාරය හැරපියයි.



Free Distribution www.aathaapi.org

15 යස්ස දරථජා න සන්ති කෙචි ඔරං ආගමනාය පච්චයාසෙ,
සො භික්ඛු ජහාති ඔරපාරං උරගො ජිණ්ණමිව තචං පුරාණං.

16 යස්ස වනථජා න සන්ති කෙචි විනිබන්ධාය[1] භවාය හෙතුකප්පා,
සො භික්ඛු ජහාති ඔරපාරං උරගො ජිණ්ණමිව තචං පුරාණං.

17 යො නීවරණෙ පහාය පඤ්ච අනීඝො තිණ්ණකථංකථො විසල්ලො,
සො භික්ඛු ජහාති ඔරපාරං උරගො ජිණ්ණමිව තචං පුරාණං.

උරගසුත්තං නිට්ඨිතං.

## 1 – 2

## ධනියසුත්තං

18 පක්කොදනො දුද්ධඛීරො හමස්මි (ඉති ධනියො ගොපො)
අනුතීරෙ මහියා සමානවාසො,
ඡන්නා කුටි ආහිතො ‘ගිනි
අථ චෙ පත්ථයසි පවස්ස දෙව.

19 අක්කොධනො විගතඛිලො හමස්මි (ඉති භගවා)
අනුතීරෙ මහියෙකරත්තිවාසො,
විවටා කුටි නිබ්බුතො ‘ගිනි
අථ චෙ පත්ථයසි පවස්ස දෙව.

20 අන්ධකමකසා න විජ්ජරෙ (ඉති ධනියො ගොපො)
කච්ඡෙ රූළ්හතිණෙ චරන්ති ගාවො,
වුට්ඨිම්පි සහෙය්‍යුමාගතං
අථ චෙ පත්ථයසි පවස්ස දෙව.

21 බද්ධා හි[2] භිසි සුසඞ්ඛතා (ඉති භගවා)
තිණ්ණා පාරගතො විනෙය්‍ය ඔඝං,
අත්ථො භිසියා න විජ්ජති
අථ චෙ පත්ථයසි පවස්ස දෙව.

1. විනි බද්ධාය – සිමු 2.
2. බද්ධා – සිමු 2.



Free Distribution www.aathaapi.org

15. යම් මහණෙක්හට (සත්කායසඞ්ඛ්‍යාත) අවරයට ඊමට හේතු වන පළමු පළමු උපන් කෙලෙස් නමැති දරථයෙන් උපන් කිසිදු ක්ලේශ කෙනෙක් නැත් ද, එ මහණ උරගයකු දිරාගිය පැරණි සැව හැරලන්නාක් මෙන් ඔරපාරය හැරපියයි.

16. යම් මහණෙක්හට (තෘෂ්ණාසඞ්ඛ්‍යාත) වනථයෙන් උපන් භව-බන්ධනයට හේතු වන කිසිදු කෙලෙස් කෙනෙක් නැත් ද, එ මහණ උරග-යකු දිරාගිය පැරණි සැව හැරලන්නාක් මෙන් ඔරපාරය හැරපියයි.

17. යම් මහණෙක් පඤ්චනීවරණයන් ප්‍රහාණ කොට නිදුක් වූයේ වේ ද, (මාර්ගඥානයෙන්) තරණය කළ සැක ඇතියේ වේ ද, පැහූ රාගාදී හුල් ඇතියේ වේ ද, එමහණ උරගයකු දිරාගිය පැරණි සැව හැරලන්නාක් මෙන් ඔරපාරය හැරපියයි.

**උරග සූත්‍රය නිමි.**

## 1 -- 2

## ධනිය සූත්‍රය

18. (ධනියගොපලු මෙසේ කී:) මම සිදු කළ බත්කිස ඇතියෙමි, දෝනා ලද කිරි ඇතියෙමි, 'මහී' ගංතෙර සමීපයෙහි අනුකූලපරිජනයා සමඟ වාස ඇතියෙම් වෙමි. වාසගෘහය (තෘණපර්ණච්ඡදනයෙන්) සෙවෙණි කරණ ලදි. ගිනි දල්වන ලදි. මේඝය, ඉදින් රිසියෙහි නම් වැසි වස්ව.

19. (බුදුහු මෙසේ වදළෝ:) මම නොකිපෙන සැහැවි ඇතියෙමි, පහ වැ ගිය සිත්කණුපස ඇතියෙමි, 'මහී' ගංතෙර සමීපයෙහි ඒකරාත්‍රිවාස ඇතියෙම් වෙමි. (ආත්මභාවසඞ්ඛ්‍යාත) කුටිය (කෙලෙස්සියන් නැතියෙන්) විවෘත වියැ. (රාගාදී) ගිනි සන්හින. මේඝය, ඉදින් රිසියෙහි නම් වැසි වස්ව.

20. (ධනියගොපලු මෙසේ කී:) කණමැස්සන් හා මදුරුවෝ (මෙහි) නැත. තණ නැඟි දෙණිකඩ බිමෙහි ගෙරි හී තණ කති. (ඔහු) අහසින් ආ වැසි ද ඉවසත්. මේඝය, ඉදින් රිසියෙහි නම්, වැසි එළව.

21. (බුදුහු මෙසේ වදළහ:) මොනවට සකස් කළ පසුර බැඳ නිමවන ලදී. චතුරෝඝ තරණය කොට උත්තීර්ණ වූයෙම් පරතෙර ගියෙම් වෙමි. (දැන්) පසුරෙන් වැඩෙක් නැති. මේඝය, ඉදින් රිසියෙහි නම් වැසි එළව.

22 ගොපී මම අස්සවා අලොලා (ඉති ධනියො ගොපො)
දීඝරත්තං සංවාසියා මනාපා,
තස්සා න සුණාමි කිඤ්චි පාපං
අථ චෙ පත්ථයසි පවස්ස දෙව,

23 චිත්තං මම අස්සවං විමුත්තං (ඉති භගවා)
දීඝරත්තං පරිභාවිතං සුදන්තං,
පාපං පන මෙ න විජ්ජති
අථ චෙ පත්ථයසි පවස්ස දෙව.

24 අත්තවෙතනභතොහමස්මි (ඉති ධනියො ගොපො)
පුත්තා ච මෙ සමානියා අරොගා,
තෙසං න සුණාමි කිඤ්චි පාපං
අථ චෙ පත්ථයසි පවස්ස දෙව.

25 නාහං භතකො'ස්මි කස්සචි (ඉති භගවා)
නිබ්බිට්ඨෙන චරාමි සබ්බලොකෙ,
අත්ථො භතියා[1] න විජ්ජති
අථ චෙ පත්ථයසි පවස්ස දෙව.

26 අත්ථි වසා අත්ථි ධෙනුපා (ඉති ධනියො ගොපො)
ගොධරණියො පවෙණියොපි අත්ථි,
උසභොපි ගවම්පතීධ අත්ථි
අථ චෙ පත්ථයසි පවස්ස දෙව.

27 නත්ථි වසා නත්ථි ධෙනුපා (ඉති භගවා)
ගොධරණියො පවෙණියොපි නත්ථි,
උසභොපි ගවම්පතීධ නත්ථි
අථ චෙ පත්ථයසි පවස්ස දෙව.

28 ඛීලා නිඛාතා අසම්පවෙධී (ඉති ධනියො ගොපො)
දමා මුඤ්ජමයා නවා සුසණ්ඨානා,
න හි සක්ඛින්ති ධෙනුපාපි ඡෙත්තුං
අථ චෙ පත්ථයසි පවස්ස දෙව.

1. භරියා—සු



Free Distribution www.aathaapi.org

22. (ධනිය ගොපල්ලු මෙසේ කී:) මාගේ ගෙවිලිය කීකරු යැ (ආහාරාදීන්) ලොල් නොවූ යැ. දීර්ඝරාත්‍රයෙහි සමගි වාස ඇත්තී මනාපචාරී වූ යැ. ඇයගේ කිසි දු පවක් නො අසමි. මේඝය ඉදින් රිසියෙහි නම් වැසි එළව .

23. (බුදුහු මෙසේ වදාළෝ:) මාගේ සිත වසඟ විය, (කෙලෙසුන් කෙරෙන්) මිදීන, දීර්ඝරාත්‍රයෙහි පරිභාවිත විය, මොනොවට දමුනේ විය. මාගේ පවෙක් නම් නැත. මේඝය ඉදින් කැමැතියෙහි නම් වර්ෂණය කර.

24. (ධනියගොපාල මෙසේ කී:) මම සිය වැටුපින් පුස්නා ලද්දෙමි. මාගේ පුත්‍රයෝ ද (මා හා) සන්නිහිත වූවාහු නිරාබාධයහ. උන්ගේ කිසිදු පවක් නො අසමි. මේඝය ඉදින් රිසියෙහි නම් වැසි එළව.

25. (බුදුහු මෙසේ වදාළෝ:) මම කිසිවක්හට බැළයෙකිම් නො වෙමි. මුළුලොවහි මිදීගිය බැළමෙහෙයෙන් හැසිරෙමි. බැළයෙන් (මට) වැඩෙක් නැති. මේඝය ඉදින් රිසියෙහි නම් වැසි එළව.

26. (ධනියගොපාල මෙසේ කී:) මට නහඹු වස්සෝ ඇත. දෙනගේ කිරි බොන වස්සෝ ද ඇත. ගැබිනි දෙන්නු ද ඇත. ප්‍රවේණි සටනාවට නිසි දෙන්නු ද ඇත. මේ ගවමඩලෙහි ගවම්පති වෘෂභයෝ ද ඇත. මේඝය ඉදින් රිසියෙහි නම් වැසි එළව.

27. (බුදුහු මෙසේ වදාළෝ:) මට නහඹු වස්සෝ නැත. දෙනගේ කිරි බොන වස්සෝ ද නැත. ගැබිනි දෙන්නු ද නැත. ප්‍රවේණි සටනා කරන දෙන්නු ද නැත. මෙහි ගවම්පති වෘෂභයෝ ද නැත. මේඝය ඉදින් රිසියෙහි නම් වැසි එළව.

28. (ධනියගොපාල මෙසේ කී:) නො සැලෙන වැම්භු සිටුනා ලදහ. මුදුනණුවා මනාසටහන් ඇති අලුත් දමයෝ ඇත. කිරිබොන නහඹු වස්යෝ ද එය නොසිඳියහෙති. මේඝය ඉදින් රිසියෙහි නම් වැසි එළව.

29 උසභොරිව ඡෙත්ව[1] බන්ධනානි (ඉති භගවා)
නාගො පූතිලතං ව දළයිත්වා,[2]
නාහං පුන උපෙස්සං ගබ්භසෙය්‍යං
අථ චෙ පත්ථයසී පවස්ස දෙව.

30 නින්නඤ්ච ථලඤ්ච පූරයන්තො
මහාමෙඝො පාවස්සි තාවදෙව,
සුත්වා දෙවස්ස වස්සතො
ඉමමත්ථං ධනියො අභාසථ.

31 ලාභා වත නො අනප්පකා
යෙ මයං භගවන්තං අද්දසාම,
සරණං තං උපෙම චක්ඛුම
සත්ථා නො හොහි තුවං මහාමුනි.

32 ගොපී ච අහඤ්ච අස්සවා
බ්‍රහ්මචරියං සුගතෙ චරාමසෙ,
ජාතිමරණස්ස පාරගා
දුක්ඛස්සන්තකරා භවාමසෙ.

33 නන්දති පුත්තෙහි පුත්තිමා (ඉති මාරො පාපිමා)
ගොමිකො ගොහි තථෙව නන්දති,
උපධීහි නරස්ස නන්දනා
න හි සො නන්දති යො නිරූපධී.

34 සොචති පුත්තෙහි පුත්තිමා (ඉති භගවා)
ගොමිකො ගොහි තථෙව සොචති,
උපධීහි නරස්ස සොචනා
න හි සො සොචති යො නිරූපධීති.

ධනියසුත්තං නිට්ඨිතං.

1. ඡෙත්වා – සයා, PTS.
2. පූතිලතං පදාළයිත්වා – සයා,



Free Distribution www.aathaapi.org

29. (බුදුහු මෙසේ වදාළහ:) බන්ධනයන් සිඳ යන වෘෂභයකු සෙයින් ද පූතිලතාවක් කඩා යන ඇතකු සෙයින් ද මම යළිත් ගර්භ-ශයනයට නො පැමිණෙමි. මේඝය ඉදින් රිසියෙහි නම් වැසි වස්ව.

30. එකෙණෙහි මැ වළ හා ගොඩ හා පුරවමින් මහමෙ (වැසි) වට. වස්නා වැසිහඬ අසා ධනිය ගොපාල මෙ කරුණ කී:

31. යම් අපි භාග්‍යවතුන් වහන්සේ දක්මෝ ද (එයින්) අපට අනල්ප වූ ලාභයෙක් මැ යැ. භාග්‍යවතුන් වහන්ස, නුඹ වහන්සේ සරණ කොට යම්හ. මහාමුනි වූ භාග්‍යවතුන් වහන්ස, නුඹවහන්සේ අපට ශාස්තෘ වන සේක්වා.

32. ගොපිය ද මම ද කීකරු වැ සුගතයන් වහනසේ වෙත, බඹසර වස් වසම්හ. ජාතිමරණයාගේ පාරයට යන්නමෝ වම්හ. දුක් කෙළවර කරන්නමෝ වම්හ.

33. (පවිටු මර මෙසේ කී:) පුතුන් ඇතියේ පුතුන් හේතු කොටගෙන සතුටු වෙයි. ගවහිමි ගවයන් හේතු කොටගෙන එසේ මැ සතුටු වෙයි. මිනිසාට උපධීහු මැ නන්‍දන වෙති. යමෙක් උපධි රහිත වූයේ ද හේ නන්‍දන නො කෙරේ.

34. (බුදුහු මෙසේ වදාළෝ) පුතුන් ඇතියේ පුතුන් හේතුකොටගෙන ශෝක කෙරෙයි. ගවහිමි ගවයන් හේතු කොටගෙන එසෙයින් මැ ශෝක කෙරේ. මිනිසාට උපධීහු මැ සොචනාවෝ යැ. යමෙක් උපධි රහිත වූයේ ද හේ ශෝක නො කෙරේ මැ යි.

**ධනිය සූත්‍රය නිමි.**



Free Distribution www.aathaapi.org

## 1 – 3

## ඛග්ගවිසාණ සුත්තං

35 සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං
අවිහෙඨයං අඤ්ඤතරම්පි තෙසං,
න පුත්තමිච්ඡෙය්‍ය කුතො සහායං
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

36 සංසග්ගජාතස්ස භවන්ති ස්නෙහා
ස්නෙහන්වයං දුක්ඛමිදං පහොති,
ආදීනවං ස්නෙහජං පෙක්ඛමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

37 මිත්තෙ සුහජ්ජෙ අනුකම්පමානො
හාපෙති අත්ථං පටිබද්ධචිත්තො,
එතං භයං සන්ථවෙ පෙක්ඛමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

38 වංසො විසාලො ච යථා විසත්තො
පුත්තෙසු දාරෙසු ච යා අපෙඛා,[1]
වංසකළීරොව[2] අසජ්ජමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

39 මිගො අරඤ්ඤම්හි යථා අබද්ධො[3]
යෙනිච්ඡකං ගච්ඡති ගොචරාය,
විඤ්ඤූ නරො සෙරිතං පෙක්ඛමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

40 ආමන්තනා හොති සහායමජ්ඣෙ
වාසෙ ඨානෙ ගමනෙ චාරිකාය,
අනභිජ්ඣිතං සෙරිතං පෙක්ඛමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

41 ඛිඩ්ඩා රතී හොති සහායමජ්ඣෙ
පුත්තෙසු ච විපුලං හොති පෙමං,
පියවිප්පයොගඤ්ච ජිගුච්ඡමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

---

1. අපෙක්ඛා – ප.
2. වංසක්කලීරොව – මජසං. වංසාකලීරොව – PTS
3. අබන්ධො – සයා. PTS.



Free Distribution www.aathaapi.org

## 1 – 3

## ඛග්ගවිසාණ සූත්‍රය

35. සියලු සතුන් කෙරෙහි (කාය, වාක්, මනස්) දණ්ඩය හැරපියා ඒ සතුන් කෙරෙන් අන්‍යතර එකකුදු නොපෙළනුයේ පුතකුදු නො පතන්-නේ යැ. 'යහළුවකු පතන්නේ යැ' යනු කොයින් ලැබේ ද, කගවෙහෙණ හඟක් බඳු වූයේ එකලා වැ හැසිරෙන්නේ යැ.

36. හටගත් (දර්ශනාදි) සංසර්ග ඇතියහුට බලවත් ස්නෙහයෝ උපදනාහ. මේ (ශොකාදි) දුක ස්නෙහ පරම්පරානුගත වැ උපදනේ යැ. ස්නෙහයෙන් උපන් ආදීනව දකිමින් කගවෙහෙණහඟක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ යැ.

37. සුහෘද්මිත්‍රයනට අනුකම්පා කෙරෙමින් පිළිබඳ සිතැති තැනැත්-තේ (ත්‍රිවිධ) අර්ථය නසාලයි. සන්ථවයෙහි ඇති තෙල බිය දක්මින් කග-වෙහෙණහඟ බඳු වූයේ එකලා වැ හැසිරෙන්නේ යැ.

38. පුතුන් කෙරෙහි ද අඹුවන් කෙරෙහි ද යම් අපේක්ෂායෙක් ඇද්ද, ඒ (හුණ ළැහැබෙක්හි) හිවීගිය මහ හුණගසක් වැන්න. මම එහි නො ලැගෙන හුණකිළිලක් සෙයින් කගමුවහඟ බඳු වී එකලා වැ හැසිරෙන්නෙමි.

39. යම් පරිදි වෙනෙහි තිත්මුවා නො බැඳුනේ ගොදුරු පිණිස රිසියෙන තැනෙක යේ ද එපරිදි නුවණැති මිනිසා සෛවරීභාවය පතනුයේ කගවෙහෙණහඟක් බඳු වූයේ එකලා වැ හැසිරෙන්නේ යැ.

40. යහළුවන් මැද වසනුවහට (දිවාශයන සඞ්ඛ්‍යාත) වාසයෙහි දු (මහාඋපස්ථාන සඞ්ඛ්‍යාත) ස්ථානයෙහි දු ගමනයෙහි දු චාරිකායෙහි දු (මේ අසව, මේ දෙව ආදි) ඇමැතීම් ඇත. (කාමීන් විසින්) නො ඉස්නා පැවිද්ද ද සෛවරීභාවය ද පතනුයෙම් කගවෙහෙණහඟක් බඳු වූයෙම් එකලා වැ හැසිරෙන්නෙමි.

41. යහළුවන් මැද ක්‍රීඩා හා පඤ්චකාමගුණරතිය හා වෙයි. දරුවන් කෙරෙහිදු විපුල ප්‍රේමය වෙයි. (එයින් හටගන්නා) ප්‍රියවිප්‍රයොග දුඃඛය වෙසෙසින් පිළිකුල් කරනුයෙම්. කගවෙහෙණහඟක්බඳු වූයෙම් එකලා වැ හැසිරෙන්නෙමි.



Free Distribution www.aathaapi.org

42 චාතුද්දිසො අප්පටීඝො ච හොති
සන්තුස්සමානො ඉතරීතරෙන,
පරිස්සයානං සහිතා අඡම්භී
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

43 දුස්සඞ්ගහා පබ්බජිතාපි එකෙ
අථො ගහට්ඨා ඝරමාවසන්තා,
අප්පොස්සුක්කො පරපුත්තෙසු හුත්වා
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

44 ඔරොපයිත්වා ගිහිව්‍යඤ්ජනානි
සංසීනපත්තො යථා කොවිළාරො,
ඡෙත්වාන වීරො ගිහිබන්ධනානි
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

45 සචෙ ලභෙථ නිපකං සහායං
සද්ධිං චරං සාධුවිහාරි ධීරං,
අභිභුය්‍ය සබ්බානි පරිස්සයානි
චරෙය්‍ය තෙනත්තමනො සතීමා.

46 නො චෙ ලභෙථ නිපකං සහායං
සද්ධිං චරං සාධුවිහාරි ධීරං,
රාජා'ව රට්ඨං විජිතං පහාය
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

47 අද්ධා පසංසාම සහායසම්පදං
සෙට්ඨා සමා සෙවිතබ්බා සහායා,
එතෙ අලද්ධා අනවජ්ජභොජී
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

48 දිස්වා සුවණ්ණස්ස පභස්සරානි
කම්මාරපුත්තෙන සුනිට්ඨිතානි,
සඞ්ඝට්ටමානානි දුවෙ භුජස්මිං
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

49 එවං දුතියෙන සහා මමස්ස
වාචාභිලාපො අභිසජ්ජනා වා,
එතං භයං ආයතිං පෙක්ඛමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.



Free Distribution www.aathaapi.org

42. ඉතරීතර (කුදුමහත්) ප්‍රත්‍යයෙන් සතුටු වනුයේ සතර ඛඹ-විහරණයෙන් පතළ සිවුදිග ඇතියේ ප්‍රතිඝ රහිත වූයේ ද වෙයි. උවදුරු සහනුයේ තැතිගැනුම් නැත්තේ කගවෙහෙණහඟක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ යැ.

43. ඇතැම් පැවිද්දෝ ද යළි ගිහිගේ වැසි ගෘහස්ථයෝ ද සඞ්ග්‍රහ කිරීමට දුෂ්කර වෙති. පරපුත්‍රයන් කෙරෙහි අල්පොත්සුක වැ කග-වෙහෙණහඟක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ යැ.

44. ගිලිහුණු පත්‍ර ඇති කොබෝලීල රුකක් සෙයින් (කෙහෙරවුළු ඈ) ගිහිව්‍යඤ්ජනයන් බැහැර කොට මාර්ගවීර්යය ඇත්තේ ගිහි (කාම) බන්‍ධනයන් (මාර්ගඥනයෙන්) සිඳපියා කගවෙහෙණහඟක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ යැ.

45. ඉදින් (කිසුණු පිරියම් ආදියෙහි නිපුණ වූ සාධු (අර්පණඋපචාර) විහරණ ඇති ප්‍රාඥ වූ සමග හැසිරෙන සහායයකු ලබන්නේ නම් හැම උවදුරු මැඩලා එයින් තුටු වැ සිහි ඇති වැ හැසිරෙන්නේ යැ.

46. ඉදින් නිපුණ වූ සාධුවිහාර ඇති ප්‍රාඥ වූ සමග හැසිරෙන සහාය-යකු නො ලබා නම් දිනුරට හැරපියා එකලා වැ යන රජක්හු සෙයින් බාලයා හැරපියා කගවෙහෙණහඟක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ යැ.

47. ඒකාන්තයෙන් සහාය සම්පත් පසසම්හ. ශ්‍රෙෂ්ඨ වූ සම වූ සහාය-යෝ සෙවියයුත්තාහ. නිරවද්‍ය භොජන (ආජීව) ඇත්තේ තුලුන් නො ලැබැ කගවෙහෙණහඟක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ යැ.

48. තරහල් පුතක්හු විසින් මැනැවින් නිමවනලද දිලියෙනසුලු රන්වලය දෙක අත්හි ගැටෙනු දැක කගවෙහෙණහඟක් සෙයින් එකලා වැ හැසිරෙන්නෙමි.

49. මෙසෙයින් (ගණවාස ඇතිකල) මට දෙවැන්නකු සමග වාගභි-ලාප (දෙතිස්කථා) වන්නේ යැ. (ඔහු කෙරෙහි) ඇල්ම හෝ වන්නේ යැ. ආයතිභවයෙහි තෙල බිය දක්මින් කගවෙහෙණහඟක් බඳු වැ එකලා වැ හැසිරෙන්නෙමි.

50 කාමා හි චිත්‍රා මධුරා මනොරමා
විරූපරූපෙන මථෙන්ති චිත්තං,
ආදීනවං කාමගුණෙසු දිස්වා
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

51 ඊතී ච ගණ්ඩො ච උපද්දවො ච
රොගො ච සල්ලඤ්ච භයඤ්ච මෙතං,
එතං භයං කාමගුණෙසු දිස්වා
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

52 සීතඤ්ච උණ්හඤ්ච ඛුදං පිපාසං
වාතාතපෙ ඩංසසිරිංසපෙ ච,
සබ්බානි පෙතානි අභිසම්භවිත්වා
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

53 නාගො ච යූථානි විවජ්ජයිත්වා
සඤ්ජාතඛන්ධො පදුමී උළාරො,
යථාභිරන්තං විහරෙ අරඤ්ඤෙ
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

54 අට්ඨානතං සඞ්ගණිකාරතස්ස
යං ඵස්සයෙ සාමයිකං විමුත්තිං,
ආදිච්චබන්ධුස්ස වචො නිසම්ම
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

55 දිට්ඨිවිසූකානි උපාතිවත්තො
පත්තො නියාමං පටිලද්ධමග්ගො,
උප්පන්නඤාණො'ම්හි අනඤ්ඤනෙය්‍යො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

56 නිල්ලොලුපො නික්කුහො නිප්පිපාසො
නිම්මක්ඛො නිද්ධන්තකසාවමොහො,
නිරාසයො සබ්බලොකෙ භවිත්වා
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

57 පාපසහායං පරිවජ්ජයෙථ
අනත්ථදස්සිං විසමෙ නිවිට්ඨං,
සයං න සෙවෙ පසුතං පමත්තං
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

50 විසිතුරු වූ මියුරු වූ (අඳබාල් පුහුදුනන් ගේ) සිත් අලවන (වස්තු ක්ලේශ) කාමයෝ විවිධස්වරූපයෙන් සිත් අලළති. කාමගුණයෙහි ආදීනව දැක කගමුවහහක් සෙයින් එකලා වැ හැසිරෙමි.

51 'තෙල (ආගන්තුක ව්‍යසනහෙතුවූ) ඊතිය ද ගණ්ඩය ද උපද්‍රවය ද රෝගය ද (ඇතුළත පෙළන) ශල්‍යය ද භය ද කාමයට නමෙකි. කාමගුණයෙහි තෙල ආදීනව දැක කගවෙහෙණහග සෙයින් එකලා වැ සරනෙමි.

52 සිහිලස ද උණුසුම ද සා පවස් ද වා අවු මැසි මදුරුවන් ද යන තෙල හැම මැඩැගෙණ කගවෙහෙණහහක් සෙයින් එකලා වැ හැඩිරෙමි.

53 ඇත්මුළ හැරපියා අරන්හි සිත්සේ වෙසෙන, මොනොවට වැඩුනු කඳ ඇති, පද්මකුල සම්භූත වූ, (වීර්ය ජව බලාදියෙන්) මහත් වූ ඇත්රජක්හු සෙයින් හටගත් අශෛක්ෂ ශීලස්කන්ධාදිය ඇතියෙම් පද්මසදෘශ බොධ්‍යඞ්ග ඇතියෙම් (හෝ ආර්යජාති ඇතියෙම්) උදාර වූ ශීල-සමාධි ප්‍රඥා ඇතියෙම් ගණයා හැරපියා අරනෙහි සිත්සේ වාස කරනුයෙම් කගවෙහෙණහගක් සෙයින් එකලා වැ හැසිරෙමි.

54 යමෙක් යම්කරුණෙකින් සාමයිකවිමුක්තිය (ලෞකික සමාපත්ති) අධිගම කෙරේ නම් ගණසඞ්ගණිකායෙහි ඇලුනහුට ඒ අස්ථාන'ය යන ආදිත්‍ය බන්ධුහු (පසේ බුදුන්) ගේ වචනය අසා කගවෙහෙණහගක් සෙයින් එකලා වැ සරනෙමි.

55 දෘෂ්ටිවිශූකයන් (සත්කායදෘෂ්ටිය හෝ දෙසැට මිස දිටු) ශ්‍රොතආපත්තිමාර්ගසඞ්ඛ්‍යාත දර්ශනයෙන් ඉක්මවූයෙම් (සම්‍යක්ත්ව සඞ්ඛ්‍යාත) නියාමයට පැමිණියෙම් පිළිලදශෙෂමාර්ග ඇතියෙම් උපන් ප්‍රත්‍යෙකබොධිඥාන ඇතියෙම් වෙමි. එහෙයින් අනෙකක්හු විසින් සත්‍යාවබොධයට නො පැමිණැවියයුතුවූයෙම් කගවෙහෙණහහක් සෙයින් එකලා වැ හැසිරෙන්නෙමි.

56 (රසතෘෂ්ණායෙහි) ලොල් නො වූයෙම්, කුහක නො වූයෙම් (මියුරුරස බුදිනු කැමැති) පවස් නැතියෙම්, මකු නො වූයෙම්, නසාලූ රාගාදි කෙලෙස් කසට හා මොහ ඇතියෙම්, සවුලොවිහි තෘෂ්ණා නැති වැ කගමුවහහක් සෙයින් එකලා ව හැසිරෙන්නෙමි.

57 අනර්ථ එළවන, කායදුශ්චරිතාදි විෂමයෙහි බැසගත් පාපමිත්‍රයන් දුරලන්නේ ය. මිසදිටුහි ලැගුනු පස්කම්ගුණෙහි වුහුටු සිත් ඇතියහු නො සෙවුනෝ ය. කගවෙහෙණහහක් සෙයින් එකලා වැ සරන්නේ ය.



Free Distribution                www.aathaapi.org

58 බහුස්සුතං ධම්මධරං භජෙථ
මිත්තං උළාරං පටිභානවන්තං,
අඤ්ඤාය අත්ථානි විනෙය්‍ය කඞ්ඛං
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

59 ඛිඩ්ඩං රතිං කාමසුඛඤ්ච ලොකෙ
අනලංකරිත්වා අනපෙක්ඛමානො,
විභූසනට්ඨානා විරතො සච්චවාදී
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

60 පුත්තඤ්ච දාරං පිතරඤ්ච මාතරං
ධනානි ධඤ්ඤානි ච බන්ධවානි,
හිත්වාන කාමානි යථොධිකානි
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

61 සඞ්ගො එසො පරිත්තමෙත්ථ සොඛ්‍යං
අප්පස්සාදො දුක්ඛමෙත්ථ භිය්‍යො,
ගළො[1] එසො ඉති ඤත්වා මුතිමා[2]
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

62 සන්දාළයිත්වාන සංයොජනානි
ජාලමෙභත්වා සලිලම්බුචාරී,
අග්ගීව දඩ්ඪං අනිවත්තමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

63 ඔක්ඛිත්තචක්ඛූ න ච පාදලොලො
ගුත්තින්ද්‍රියො රක්ඛිතමානසානො,
අනවස්සුතො අපරිඩය්හමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

64 ඔහාරයිත්වා ගිහිව්‍යඤ්ජනානි
සඤ්ඡන්නපත්තො[3] යථාපාරිඡත්තො,
කාසායවත්ථො අභිනික්ඛමිත්වා
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

1. ගලො - සිමු 2. ගණ්ඩො - ස්‍යා,
2. මතිමා - ස්‍යා
3. සඤ්ඡින්නපත්තො - ස්‍යා-PTS,



Free Distribution www.aathaapi.org

58. බහුශ්‍රැත වූ ධර්මධර වූ උදාර වූ ප්‍රතිභාන ඇති, මිත්‍රයකු භජනය කරන්නේ ය. (ආත්මාර්ථාදි) අර්ථයන් දැන, කගවෙහෙණහඟක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ ය.

59. ලොවිහි කායිකවාචසික ක්‍රීඩා ද පඤ්චකාමගුණික රතිය ද වස්තු-කාමසුඛය ද (සාර විසින්) නො ගැණ එය අපේක්ෂා නො කරන්නේ විභූෂණකාරණයෙන් දුරුවූයේ සත්‍යවචන කියනසුලු වූයේ කගවෙහෙණ-හඟක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ ය.

60. අඹුදරුවන් ද මාපියන් ද ධනය ද ධාන්‍ය ද බන්ධුසමූහය ද යන කාමයන් ස්වකීය අවධිවශයෙන් හැරපියා කගවෙහෙණහඟක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ ය.

61. "මෙල පඤ්චකාමගුණය සඞ්ගයෙකි, මෙහි සෞඛ්‍යය අල්ප යැ, අල්පාස්වාද ඇත්තේ ය. මෙහි දුක් බොහෝ ය. මෙල බිලියෙකැ"යි දැන නුවණැතියේ කගවෙහෙණහඟක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ ය.

62. දියෙහි දැල බිඳගෙණ ගිය මසකු සෙයින් සංයොජනයන් පලා දැවුනු තැනට පෙරලා නො එන ගින්නක් සෙයින් (කෙලෙසුන් කරා) නැවැත නො එනුයේ කගවෙහෙණහඟක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ ය.

63. යට බලා හෙලු ඇස් ඇතියේ නො ද පාදලොල වූයේ ගෝපනය කළ ඉඳුරන් ඇතියේ රක්නාලද මනස ඇතියේ, කෙලෙසුන් විසින් නො-තෙත් වූයේ, (කෙලෙස් ගින්නෙන්) නොදැවුනේ කගවෙහෙණහඟක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ ය.

64. (කෙස්රවුළු ආ) ගිහිව්‍යඤ්ජනයන් හැරපියා සැදුම්ලත් පත්‍ර ඇති පරසතු රුකක්සෙයින් හැඳපෙරවූ කහවත් ඇතියේ අභිනික්මන් කොට කගවෙහෙණහඟක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ ය.

65 රසෙසු ගෙධං අකරං අලොලො
අනඤ්ඤපොසී සපදානචාරී,
කුලෙ කුලෙ අප්පටිබද්ධචිත්තො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

66 පහාය පඤ්චාවරණානි චෙතසො
උපක්කිලෙසෙ ව්‍යපනුජ්ජ සබ්බෙ,
අනිස්සිතො ඡෙත්වා ස්නෙහදොසං
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

67 විපිට්ඨිකත්වාන සුඛං දුඛඤ්ච
පුබ්බෙව ච සොමනස්සදොමනස්සං,
ලද්ධානුපෙක්ඛං සමථං විසුද්ධං
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

68 ආරද්ධවිරියො පරමත්ථපත්තියා
අලීනචිත්තො අකුසීතවුත්ති,
දළ්හනික්කමො ථාම බලූපපන්නො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

69 පටිසල්ලානං ඣානමරිඤ්චමානො
ධම්මෙසු නිච්චං අනුධම්මචාරී,
ආදීනවං සම්මසිතා භවෙසු
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

70 තණ්හක්ඛයං පත්ථයං අප්පමත්තො
අනෙළමූගො සුතවා සතීමා,
සඞ්ඛාතධම්මො නියතො පධානවා
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

71 සීහො ව සද්දෙසු අසන්තසන්තො
වාතො ව ජාලම්හි අසජ්ජමානො,
පදුමංව තොයෙන අලිප්පමානො[1]
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

1. අලිම්පමානො - සිමු - 1, 2.



Free Distribution www.aathaapi.org

65. රසයෙහි ගිජුබව නො කරණුයේ රසවිසාහි ලොල් නොවූයේ, අනෙකක්හු නො පුස්නාසුලුයේ, ගෙපිළිවෙළින් පිඩුසිඟා වඩනුයේ (කෙලෙස් විසින්) කුලයෙහි නොලැගි සිත් ඇතියේ කගවෙහෙණහතක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ ය.

66. චිත්තයට ආවරණ වූ පඤ්චනීවරණයන් හැරපියා (අභිධ්‍යාදි) හැම උපක්ලේශයන් විවසුන්-මගින් දුරු කොට (දෘෂ්ටිනිඃශ්‍රයෙන්) අඃනිශ්‍රිත වූයේ (ත්‍රෛධාතුකවූ) සෙනහද්වේෂය සිඳපියා, කගවෙහෙණහතක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ ය.

67. කායික වූ සුඛය ද දුඃඛය ද පිටු දක පළමු මැ චෛතසික සොම්නස්, දොම්නස් ද හැරපියා චතුර්ථධ්‍යාන උපේක්ෂාව ද (පඤ්ච-නීවරණයෙන්) විශුද්ධ වූ චිත්තශමථය ද ලැබ, කගවෙහෙණහතක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ ය.

68. පරමාර්ථ (නිර්වාණ) යට පැමිණීම සඳහා රුකුළු වැර ඇතියේ නො හැකුළුනු සිත් ඇතියේ ප්‍රධන්වීර්‍ය්‍ය ඇතියේ ස්ථිර වූ ඥනබලයට පැමිණියේ කගවෙහෙණහතක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ ය.

69. (කායවිවෙක සඞ්ඛ්‍යාත) පිළිසලන ද (චිත්තවිවෙක සඞ්ඛ්‍යාත) ධ්‍යානය ද නොහරනුයේ, නිරතුරු (විදර්ශනොපග වූ) පඤ්චස්කන්ධාදි ධර්මයන්හි අනුධර්මචාරී වූයේ. භවත්‍රයෙහි ආදීනව දක්නේ කගවෙහෙණ හතක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ ය.

70. තෘෂ්ණාක්ෂය සඞ්ඛ්‍යාත නිර්වාණය පතනුයේ නොපමා වූයේ කෙළතොලු නොවූයේ ආගමධර වූයේ, ස්මෘතිමත් වූය් (ධර්මොප-පරීක්ෂායෙන්) පරිඥත ධර්ම ඇතියේ, අරිමගින නියාමයට පැමිණියේ සම්‍යක්ප්‍රධන්වීර්‍ය්‍ය ඇතියේ, කගවෙහෙණහතක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ ය.

71. ශබ්දයෙහි කේශරසිංහයකු සෙයින් (අනිත්‍යාදියෙහි) ත්‍රස්ත නො වනුයේ දැලෙහි වාතය සෙයින් (ස්කන්ධධාත්වායතනාදියෙහි) නො ලැගෙනු යේ ජලය හා නො මුසුවන පියුමක් සෙයින් සර්වභවභොගලොභයෙන් නො තැවැරෙනුයේ කගවෙහෙණහතක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ ය.

72 සීහො යථා දාඨබලී පසය්හ
රාජා මිගානං අභිභුය්‍යචාරී,
සෙවෙථ පන්තානි[1] සෙනාසනානි
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

73 මෙත්තං උපෙක්ඛං කරුණං විමුත්තිං
ආසෙවමානො මුදිතඤ්ච කාලෙ,
සබ්බෙන ලොකෙන අවිරුජ්ඣමානො
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

74 රාගඤ්ච දොසඤ්ච පහාය මොහං
සන්දාලයිත්වා සංයොජනානි,
අසන්තසං ජීවිතසඞ්ඛයම්හි
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

75 භජන්ති සෙවන්ති ච කාරණත්ථා
නික්කාරණා දුල්ලභා අජ්ජ මිත්තා,
අත්තට්ඨපඤ්ඤා අසුචී මනුස්සා
එකො චරෙ ඛග්ගවිසාණකප්පො.

ඛග්ගවිසාණසුත්තං නිට්ඨිතං.

## 1--4

## කසිභාරද්වාජසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා මගධෙසු විහරති දක්ඛිණාගිරිස්මිං එකනාළායං බ්‍රාහ්මණගාමෙ, තෙන ඛො පන සමයෙන කසිභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස පඤ්චමත්තානි නඞ්ගලසතානි පයුත්තානි හොන්ති වප්පකාලෙ.

අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන කසිභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස කම්මන්තො තෙනුපසංකමි. තෙන ඛො පන සමයෙන කසිභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස පරිවෙසනා වත්තති, අථ ඛො භගවා යෙන පරිවෙසනා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා එකමන්තං අට්ඨාසි, අද්දසා ඛො කසිභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං පිණ්ඩාය ඨිතං. දිස්වාන භගවන්තං එතදවොච:

1. පන්තානි - සිමු - 1-2,



Free Distribution www.aathaapi.org

72. මෘගරාජන් වූ කේශරසිංහ තෙම දළ බල කොට ඇතියේ යම්සේ ලා හෙලා හැසිරේ ද (කායබලයෙන්) තේජසින් සතුරන් අභිභවා හැසිරේ ද එසෙයින් වනයෙහි දුරසෙනසුන් සෙවුනේ ය. කඟවෙහෙණහභක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ ය.

73. (හිතසුඛොපනයනකාමතා සඞ්ඛ්‍යාත) මෛත්‍රිය ද (සුඛදුඃඛාධුපෙක්ෂණතා සඞ්ඛ්‍යාත) උපේක්ෂාව ද (අහිතදුඃඛාපනයනකාමතා සඞ්ඛ්‍යාත) කරුණාව ද (හිතසුඛාවිප්‍රයොගකාමතා සඞ්ඛ්‍යාත) මුදිතාව ද යන චතුර්විධ විමුක්තිය යුක්තප්‍රාප්ත කාලයෙහි සෙවුනේ හැම සත්ත්වලෝකයා හා අවිරුද්ධ වෙමින් කඟවෙහෙණහභක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ ය.

74. රාගය ද ද්වේෂය ද මෝහය ද ප්‍රහීණ කොට දශසංයොජනයන් ප්‍රදලනය කොට (ච්‍යුතිචිත්තපරිභෙද සඞ්ඛ්‍යාත) ජීවිතක්ෂයෙහි ත්‍රස්ත නො වනුයේ කඟවෙහෙණහභක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ ය.

75. අර්ථය කරුණු කොට ඇත්තාහු භජනය කෙරෙති. සේවනය ද කෙරෙති. (අර්ථප්‍රතිලාභ කාරණයෙන්) නිෂ්කාරණ වූ ආයමිත්‍රයෝ දුලබ වෙති. ආත්මාර්ථයෙහි ප්‍රඥ ඇති මනුෂ්‍යයෝ අපවිත්‍ර වූ කායකර්මාදියෙන් යුක්ත වෙති. එහෙයින් කඟවෙහෙණහභක් සෙයින් එකලා වැ හැසිරෙන්නේ යි.

ඛග්ගවිසාණ සූත්‍රය නිමි.

## 1 - 4
## කසීභාරද්වාජ සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද:

එක් කලෙක්හි භාග්‍යවතුන්වහන්සේ මගධදනවුයෙහි දක්ඛිණාගිරියෙහි 'එකනාළා' නම් බමුණුගම්හි වැඩවසනසේක. එකල්හි කසීභාරද්වාජ නම් බමුණු විසින් වප්දවස්හි පන්සියක් පමණ නගුල් යොදනලද වෙයි.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පෙරවැ පාසිවුරුගෙණ කසීභාරද්වාජ බ්‍රාහ්මණයාගේ කර්මාන්තස්ථානය කරා වැඩිසේක. එසමයෙහි කසීභාරද්වාජබ්‍රාහ්මණයාගේ බත්පිරිවීසීම ඇත. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බිඳ හිඳුනාතැන් කරා වැඩිසේක. වැඩැ එකත්පසෙක සිටිසේක. කසීභාරද්වාජ බමුණා පිඩු පිණිස වැඩසිටි භාග්‍යවතුන් වහන්සේ දිටී. දැකැ භාග්‍යවතුන් වහන්සේට මෙලෙ බස් කීය:

අහං ඛො සමණ කසාමි ච වපාමි ච කසිත්වා ච වපිත්වා ච භුඤ්ජාමි ත්වම්පි සමණ කසස්සු ච වපස්සු ච කසිත්වා ච වපිත්වා ච භුඤ්ජස්සූති. අහම්පි ඛො බ්‍රාහ්මණ කසාමි ච වපාමි ච කසිත්වා ච වපිත්වා ච භුඤ්ජාමීති.

න ඛො පන මයං පස්සාම ගොතමස්ස යුගං වා නඞ්ගලං වා ඵාලං වා පාචනං වා බලිවද්දෙ වා, අථ ච පන භවං ගොතමො එවමාහ: අහම්පි ඛො බ්‍රාහ්මණ කසාමි ච වපාමි ච කසිත්වා ච වපිත්වා ච භුඤ්ජාමීති, අථ ඛො කසීභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං ගාථාය අජ්ඣභාසි:

76 කස්සකො පටිජානාසි න ච පස්සාම තෙ කසිං,
කසිං නො පුච්ඡිතො බ්‍රෑහි යථා ජානෙමු තෙ කසිං.

77 සද්ධා බීජං තපො වුට්ඨි පඤ්ඤා මෙ යුගනඞ්ගලං,
හිරි ඊසා මනො යොත්තං සති මෙ ඵාලපාචනං.

78 කායගුත්තො වචීගුත්තො ආහාරෙ උදරෙ යතො.
සච්චං කරොමි නිද්දානං සොරච්චං මෙ පමොචනං.

79 විරියං මෙ ධුරධොරය්හං යොගක්ඛෙමාධිවාහනං,
ගච්ඡති අනිවත්තන්තං යත්ථ ගන්ත්වා න සොචති.

80 එවමෙසා කසීකට්ඨා සා හොති අමතප්ඵලා
එතං කසිං කසිත්වාන සබ්බදුක්ඛා පමුච්චතීති.

අථ ඛො කසීභාරද්වාජො බ්‍රාහ්මණො මහතියා කංසපාතියා පායාසං වඩ්ඪෙත්වා භගවතො උපනාමෙසි, භුඤ්ජතු භවං ගොතමො පායාසං කස්සකො භවං යං හි භවං ගොතමො අමතප්ඵලං කසිං කසතීති.



Free Distribution www.aathaapi.org

"මහණ, මම සී සාමි, වපුරමි. සී සා, වපුට වළඳ කෙරෙමි. මහණ, තොපිත් සී සා, වපුර. සී සා වපුට වළඳව"යි

"බමුණ, මමත් සී සාමි, බිජුවට වපුරමි. සී සා වපුට වළඳමි"යි.

"අපි භවත් ගෞතමයන්ගේ වියගස වේවයි, නගුල් වේවයි, හීවැල් වේවයි, කෙවිටි වේවයි, ගෙරිසරක් වේවයි නො නොදක්මහ. එතෙකුදුවත් භවත් ගෞතම මෙසේ කියයි; මම ද බමුණ සී සාමි, වපුරමි, සී සා වපුට වළඳමි" ඉක්බිති කසීභාරද්වාජ බමුණු භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් මෙසේ කී:

76. '(තෙපි) 'කෘෂිකයෙමි'යි ප්‍රතිඥා කරව. තොපගේ කෘෂිභාණ්ඩ නො ද දකුම්හ. යම් පරිද්දෙකින් තොපගේ කෘෂිභාණ්ඩ දනුමෝ නම්, එපරිද්දෙන් පුළුවුස්නාලද තෙපි අපට කෘෂිභාණ්ඩ කියව'යි.

77. මාගේ ශ්‍රද්ධාව බිජුවට වෙයි. තපස වැසිදහර වෙයි, ප්‍රඥාව විය හා නගුල් වෙයි. හිරිය නගුලිස් වෙයි. චිත්තය වියරුහැන් වෙයි. සමෘතිය මාගේ හීවැල හා කෙවිට යි.

78. (ත්‍රිවිධ) කායසුචරිතයෙන් ගුප්තයෙමි. (චතුර්විධ) වාක්සුචරිතයෙන් ගුප්තයෙමි. සිවුපසෙහි (භොජනයෙහි) ද (මාත්‍රඥතායෙන්) සංයතයෙමි. අවිසංවාදන සඞ්ඛ්‍යාත සත්‍යයෙන් කැම්පීම් කෙරෙමි. (නිවනෙහි ඇලෙන හෙයින් අර්හත් ඵල සඞ්ඛ්‍යාත) සුරතභාවය මාගේ විය මිදීම වෙයි.

79. (නිර්වාණසඞ්ඛ්‍යාත) යම් ක්ෂේමයකට ගොස් ශෝක නොකෙරේ නම් එ යෝගක්ෂෙම (නිර්වාණ) ය කරා නොනවත්මින් යන සම්‍යක්-ප්‍රධානවීර්‍ය්‍යය මාගේ ධුරවාහක වෙයි.

80. මෙසෙයින් (මාවිසින්) තෙල සීසෑම කරනලදි. ඒ කෘෂිකර්මය අමා ඵල ඇත. තෙල කෘෂිකර්මය කොට සී සා හැම දුකින් මිදේය"යි.

එක්බිති කසීභාරද්වාජ බ්‍රාහ්මණ මහරන්තලියෙක්හි කිරිපිඩු වඩා "යම් හෙයෙකින් භවත් ගෞතමයන් වහන්සේ අමෘත ඵලවත් කෘෂිකර්ම කරන්නාහු නම්, භවත් ගෞතමයන් වහන්සේ එබඳු කර්ෂක (ගොවි) වන්නාහ. භවත් ගෞතමයෝ පායාස වළඳත්වා"යි භාග්‍යවතුන් වහන්සේට පිරිනැමී.

81 ගාථාභිගීතං මෙ අභොජනෙය්‍යං
සම්පස්සතං බ්‍රාහ්මණ නෙස ධම්මො
ගාථාභිගීතං පනුදන්ති බුද්ධා
ධම්මෙ සති බ්‍රාහ්මණ වුත්තිරෙසා,

82 අඤ්ඤෙන ච කෙවලිනං මහෙසිං
ඛීණාසවං කුක්කුච්චවූපසන්තං,
අන්නෙන පානෙන උපට්ඨහස්සු
ඛෙත්තං හි තං පුඤ්ඤපෙඛස්ස හොතීති

අථ කස්ස චාහං භො ගොතම ඉමං පායාසං දම්මීති,

න ඛ්වාහං තං බ්‍රාහ්මණ පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය යස්ස සො පායාසො භුත්තො සම්මා පරිණාමං ගච්ඡෙය්‍ය අඤ්ඤත්‍ර තථාගතස්ස වා තථාගතසාවකස්ස වා, තෙන හි ත්වං බ්‍රාහ්මණ තං පායාසං අප්පහරිතෙ වා ඡඩ්ඩෙහි, අප්පාණකෙ වා උදකෙ ඔපිලාපෙහීති,

අථ ඛො කසීභාරද්වාජො බ්‍රාහ්මණො තං පායාසං අප්පාණකෙ උදකෙ ඔපිලාපෙසි. අථ ඛො සො පායාසො උදකෙ පක්ඛිත්තො චිච්චිටායති චිටිචිටායති සන්ධූපායති සම්පධූපායති, සෙය්‍යථාපි නාම ඵාලො දිවසසන්තත්තො උදකෙ පක්ඛිත්තො චිච්චිටායති චිටිචිටායති සන්ධූපායති සම්පධූපායති, එවමෙව සො පායාසො උදකෙ පක්ඛිත්තො චිච්චිටායති චිටිචිටායති සන්ධූපායති සම්පධූපායති,

අථ ඛො කසීභාරද්වාජො බ්‍රාහ්මණො සංවිග්ගො ලොමහට්ඨජාතො යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවන්තං එතදවොච:

අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති, එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච, ලභෙය්‍යාහං භොතො ගොතමස්ස සන්තිකෙ පබ්බජ්ජං, ලභෙය්‍යං උපසම්පදන්ති.

81. බ්‍රාහ්මණය, ගාථාභිගීත වූ (ගී ගැයුමින් ලත්) පායාසය මා විසින් වළඳනට නො නිසි යැ. සම්‍යක්ආජීවපාරිශුද්ධිය දක්නා බුදුවරයනට තෙල (චාරිත්‍ර) ධර්ම නොවේ. සර්වඥයෝ ගාථාභිගීත භෝජනය පිළිකෙවූ කෙරෙති. බ්‍රාහ්මණය, චාරිත්‍රධර්මය (ලොවිහි) පවතිත් ම ඒකාන්තව්‍යවද්ත වූ පයෙෘෂණය (බුදුවරුන්ගේ) ජීවිතවෘත්තිය වෙයි.

82. (සර්වගුණයෙන් පිරිපුන් හෙයින්) කේවලී වූ මහර්ෂී වූ ක්ෂීණාස්‍රව වූ සන්හුන් කුකුස් ඇති බුදුනට අන්‍ය ආහාරපානයෙකින් ම උවටන් කරව. යම් හෙයෙකින් එ පින් කැමැතියහුට පින්කෙත් වේ ද, එහෙයිනි.

භවත් ගෞතමයන් වහන්ස, එසේ වත් ම මෙ පායාසය මම් කවරකු-හට දෙම් දැ?යි.

බමුණ, දෙවියන් සහිත වූ මරුන් සහිත වූ බඹුන් සහිත වූ ලොවැ දෙවිමිනිසුන් සහිත, මහණබමුණන් සහිත සත්ත්වාඛ්‍ය ප්‍රජායෙහි තථාගතයන් වහන්සේ හෝ තථාගතශ්‍රාවකයකු හෝ විනා යමකු විසින් ඒ පායාසය වළඳන ලද්දේ මොනොවට පරිණාමයට යේ නම්, එබන්දකු නො දක්මි. බමුණ, එකරුණින් තෝ ඒ පායාසය නිල්තණ නැති බිමෙක හෝ දමව. (එයින් නැසෙන) ප්‍රාණීන් රහිත දියෙහි හෝ උල්පවාලවයි.

ඉක්බිති කසීභාරද්වාජ බමුණු ඒ පායාසය ප්‍රාණීන් රහිත දියෙහි උල්පවාලිය. එකල්හි ඒ පායාසය, දියෙහි බහාලන ලදුයේ, චිච්චිට යන අනුකරණ කෙරෙයි. චිටිචිටි යන අනුකරණ කෙරෙයි. හාත්පසින් දුමයි, අධිමාත්‍ර ව හාත්පසින් දුමයි. යම්සේ දවසක් තැවුනු සීවැලෙක් දියෙහි බහාලනලදුයේ චිච්චිට යන අනුකරණ කෙරේ ද, චිටිචිටි යන අනුකරණ කෙරේ ද හාත්පසින් දුමා ද අධිමාත්‍රවැ හාත්පසින් දුමා ද, එසෙයින් මැ එ පායාසය දියෙහි බහාලන ලදුයේ චිච්චිට යන ශබ්ද කෙරෙයි. චිටිචිටි යන ශබ්ද කෙරෙයි. හාත්පසින් දුමයි. අධිමාත්‍ර වැ හාත්පසින් දුමයි.

එකල්හි කසීභාරද්වාජ බ්‍රාහ්මණ සංවිග්න වූයේ හටගත් ලොමුදහ ඇත්තේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේගේ පාමුල්හි හිසින් වැඳ හෙව භාග්‍යවතුන් වහන්සේට තෙල සැලකෙළේ ය:

''භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනැවැ, භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනැවැ. භවත් ගෞතමයන් වහන්ස, යම් සේ වනාහි යටිකුරු කොට තබනලද්දක් උඩුකුරු කොට තබන්නේ වේද, පිළිසන් වූවක් වැසුම් හරණේ වේද, මංමුළා වූවකුට හෝ මග කියන්නේ වේද, ඇස් ඇත්තාහු රූ දක්නාහයි අඳුරෙහි හෝ තෙල් පහනක් දල්වන්නේ වේද එපරිදි ම භවත් ගෞතමයන් වහන්සේ විසින් නන්අයුරින් ධර්මය දෙසන ලද. මම භවත් ගෞතමයන් වහන්සේ ද ධර්මය ද භික්ෂුසඞ්ඝයා ද සරණ කොට යෙමි. මම භවත් ගෞතමයන් වහන්සේ සමීපයෙහි පැවිදි ලබම්වා උපසපුව ලබම්වයි.



Free Distribution www.aathaapi.org

අලත්ථ ඛො කසීභාරද්වාජො බ්‍රාහ්මණො භගවතො සන්තිකෙ පබ්බජ්ජං. අලත්ථ උපසම්පදං, අචිරූපසම්පන්නො ඛො පනායස්මා භාරද්වාජො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති.

තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි අඤ්ඤතරො ච ඛො පනායස්මා භාරද්වාජො අරහතං අහොසීති.

කසීභාරද්වාජසුත්තං නිට්ඨිතං.

## 1--5

## චුන්දසුත්තං

83 පුච්ඡාමි මුනිං පහූතපඤ්ඤං (ඉති චුන්දො කම්මාරපුත්තො)
බුද්ධං ධම්මස්සාමිං වීතතණ්හං
දිපදුත්තමං සාරථීනං පවරං
කති ලොකෙ සමණා තදිඞ්ඝ බ්‍රෑහි.

84 චතුරො සමණා න පඤ්චමත්ථි (චුන්දාති භගවා)
තෙ තෙ ආවිකරොමි සක්ඛිපුට්ඨො.
මග්ගජිනො මග්ගදෙසකො ච
මග්ගෙ ජීවති යො ච[1] මග්ගදූසි.

85 කං මග්ගජිනං වදන්ති බුද්ධා (ඉති චුන්දො කම්මාරපුත්තො)
මග්ගක්ඛායී කථං අතුල්‍යො හොති,
මග්ගෙ ජීවති මෙ බ්‍රෑහි පුට්ඨො
අථ මෙ ආවිකරොහි මග්ගදූසිං.

1. නො ච-සිමු, 2



Free Distribution www.aathaapi.org

කසීභාරද්වාජ බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පැවිදි ලැබීය. උපසපුව ලැබීය. උපසපුව ලැබූ නොබෝ කල් ඇති ආයුෂ්මත් භාරද්වාජ එකලා වූයේ කයින් සිතින් වෙන්වූයේ නොපමා වූයේ කෙලෙස් තවන වැර ඇතියේ නිවනට මෙහෙයූ සිත් ඇතිව වෙසෙනුයේ යම් රහත් පලයක් පිණිස කුලපුත්‍රයෝ මනා කොට මැ ගිහිගෙන් නික්මැ පැවිද්දට පැමිණෙත් ද,

මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යය අවසන් කොට ඇති එ අර්හත්ඵලය ඉහාත්මයෙහි මැ තමා විසින් දැනැ පසක් කොට සපයා විසී. ජාතිය ක්ෂීණ වූ යැ, සපුන් බ්‍රම්සර මගබ්‍රම්සර වස් වැස නිමවන ලද. සිවුමගින් කළ යුතු සොළොස් වැදැරුම් කරණී කරණ ලද, පිළිමෙබවට නො එම් යි දැනගති. ආයුෂ්මත් භාරද්වාජ රහතුන් කෙරෙහි අන්‍යතරයෙක් වී යයි.

**කසීභාරද්වාජ සූත්‍රය නිමි.**

## 1 – 5

## චුන්ද සූත්‍රය

83. විපුල ප්‍රඥ ඇති, සම්‍යක්සම්බුද්ධ වූ, ධර්මස්වාමි වූ විගත තෘෂ්ණා ඇති ද්විපදෝත්තම වූ සාරථීන් කෙරෙහි උතුම් වූ, මුනින්ද්‍රයන් පුළුවුස්මි. ලොව්හි මහණහු කෙතෙක් ද? ඔවුන් වදළ මැනවැ''යි චුන්ද කර්මාරපුත්‍ර මෙසේ කී.

84. (භාග්‍යවතුන් වහන්සේ චුන්ද යි අමතා) ශ්‍රමණයෝ සිවුදෙනෙකි. පස්වැනියෙක් නැති. සාක්ෂි කොට හමියෙහි පුළුවුස්නා ලද්දෙම් තොපට උන් පාළ කොට කියමි. සිවුමගින් සවුකෙලෙස් දිනූ **මග්ගජින** නම් එකෙකැ, (මෙරමා හට) මග දෙසන **මග්ගදෙසක** නම එකෙකැ, (කලණ පුහුදුන් ඇතුළු ශෛක්ෂ.) ලොව්-ලොවුතුරු මගෙහි වෙසෙන **මග්ගජීවී** නම එකෙකැ, යම (දුශ්ශීල වූ) **මග්ගදූසී** නම එකෙක යන මොහු යයි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

85. බුදුවරැ කවරකු **මාර්ගජින** යයි කියත් ද, කෙසේ නම් **මාර්ගදෙශක** අතුල්‍ය වේ ද? යමෙක් මාර්ගයෙහි වෙසේ නම මා විසින් පුළුවුස්නා ලද සේක් (ඔහු) වදරණ සේක්වා! වැලිදු මට මාර්ගදූෂකයා ප්‍රකට කරණ සේක් වා''යි චුන්දකම්මාරපුත්‍ර විචාළේය.

86 යො තිණ්ණකථංකථො විසල්ලො
නිබ්බානාභිරතො අනානුගිද්ධො,
ලොකස්ස සදෙවකස්ස නෙතා
තාදිං මග්ගජිනං වදන්ති බුද්ධා.

87 පරමං පරමන්ති යොධ ඤත්වා
අක්ඛාති විභජති ඉධෙව ධම්මං,
තං කඞ්ඛච්ඡිදං මුනිං අනෙජං
දුතියං භික්ඛුනමාහු මග්ගදෙසිං.

88 යො ධම්මපදෙ සුදෙසිතෙ
මග්ගෙ ජීවති සඤ්ඤතො සතිමා,
අනවජ්ජපදානි සෙවමානො
තතියං භික්ඛුනමාහු මග්ගජීවිං.

89 ඡදනං කත්වාන සුබ්බතානං
පක්ඛන්දි කුලදූසකො පගබ්භො,
මායාවී අසඤ්ඤතො පලාපො
පතිරූපෙන චරං ස මග්ගදූසී.

90 එතෙ ච පටිවිජ්ඣි යො ගහට්ඨො
සුතවා අරියසාවකො සපඤ්ඤො
සබ්බෙ තෙ තාදිසාති ඤත්වා
ඉති දිස්වා න හාපෙති තස්ස සද්ධා.
කථං හි දුට්ඨෙන අසම්පදුට්ඨං
සුද්ධං අසුද්ධෙන සමං කරෙය්‍යාති.

චුන්දසුත්තං නිට්ඨිතං.

## 1 -- 6

## පරාභවසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.



Free Distribution www.aathaapi.org

86. යමෙක් පහකළ කථංකථභාවය ඇත්තේ ද, රාගාදි (පඤ්චවිධ) කෙලෙස් හුලින් මිදුනේ ද, නිවණෙහි ඇලුනේ ද, කිසි ධර්මයෙක්හිදු ගිජු නො වූයේ ද, සදෙවකලෝකයට නායක වූයේ ද, බුදුවරු තාදි ගුණ ඇති ඔහු මාර්ගජින යයි කියත්.

87. යමෙක් මෙලොවහි පරම නම් නිවණ උතුමැ'යි (පස් විකුම් නැණින්) දැන මෙසස්නෙහි ම නිවන් දහම පවසා ද, විස්තර කොට මාර්ගධර්මය විභාග කෙරේ ද, සැක දුරලන (මොනෙය්‍ය ගුණයෙන් සමන්විත හෙයින්) මුනි වූ තෘෂ්ණා එජා නැති ඒ දෙවෙනි මහණහු මාර්ගදේශී යයි කීහු.

88. යමෙක් මොනොවට දෙසනලද නිර්වාණපදය වූ මාර්ගයෙහි සංයත වූයේ සමෘතිමත් වූයේ ජීවත් වේ ද, (සත්තිස්බෝපැකිදම් නමැති) නිරවද්‍ය පද සෙවනේ ද, ඒ මහණහු තෙවන වූ මාර්ගජීවී යයි කීහු.

89. (බුදුපසේබුදුසවු යන) මනාව්‍රත ඇතියවුන්ගේ පිළිරූ වෙස් ගෙණ පිරිස් මැදට පණින සුලු වූයේ නො මනාපිළිවෙතින් කුලදූෂණ කරන්නේ (කාය-වාක්-මනස්) ප්‍රගල්භතා (නොසරුප් බිහුටිකම්) ඇත්තේ කළපව් සැඟවීම් සඞ්ඛ්‍යාත මායා ඇත්තේ, ශීලසංයමයෙන් සංයත නො වූයේ, හිස්වදන් ඇත්තේ පිළිරුවින් (ව්‍යාජයෙන්) හැසිරෙන්නේ ද, හේ මාර්ගදූෂී වේ.

90. යම් ගැහැවියෙක් ශ්‍රැතවත් වූයේ ආර්‍ය්‍යශ්‍රාවක වූයේ ප්‍රඥ ඇත්තේ මොවුන් පිළිවිදියේ ද, ඔහු සියලු දෙන එබඳු යයි දැන, මෙසේ දැක ඔහුගේ ශ්‍රද්ධාව නො නස්නේය. කෙසේ නම් දුෂ්ටයකු හා අදුෂ්ටයකු ද අශුද්ධයකු හා ශුද්ධයකු ද සම කරන්නේදැ?යි.

**චුන්දසූත්‍රය නිමි.**

## 1 -- 6

## පරාභව සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර දෙව්රම නම් අනේපිඩු සිටුහුගේ ආරාමයෙහි වැඩවසන සේක. එකල එක්තරා දෙවියෙක් රැ පෙරයම ඉක්ම ගිය කල්හි විශිෂ්ට වර්ණ ඇත්තේ සියලු ජේතවනය එකලු කෙරෙමින් භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන්වහන්සේ සකසා වැඳ එකත්පස්ව සිටියේ ය. එකත්පස්ව සිටි ඒ දෙවි භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් සැළ කෙළේ ය.



Free Distribution www.aathaapi.org

91 පරාභවන්තං පුරිසං මයං පුච්ඡාම ගොතමං,
භගවන්තං පුට්ඨුමාගම්ම කිං පරාභවතො මුඛං.

92 සුවිජානො භවං හොති සුවිජානො පරාභවො,
ධම්මකාමො භවං හොති ධම්මදෙස්සී පරාභවො.

93 ඉති හෙතං විජානාම පඨමො සො පරාභවො,
දුතියං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

94 අසන්තස්ස පියා හොන්ති සන්තෙ න කුරුතෙ පියං,
අසතං ධම්මං රොචෙති තං පරාභවතො මුඛං.

95 ඉති හෙතං විජානාම දුතියො සො පරාභවො,
තතියං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

96 නිද්දසීලී සභාසීලී අනුට්ඨාතා ච යො නරො,
අලසො කොධපඤ්ඤාණො තං පරාභවතො මුඛං.

97 ඉති හෙතං විජානාම තතියො සො පරාභවො,
චතුත්ථං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

98 යො මාතරං වා පිතරං වා ජිණ්ණකං ගතයොබ්බනං,
පහු සන්තො න භරති තං පරාභවතො මුඛං.

99 ඉති හෙතං විජානාම චතුත්ථො සො පරාභවො,
පඤ්චමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

100 යො බ්‍රාහ්මණං වා සමණං වා අඤ්ඤං වාපි වණිබ්බකං
මුසාවාදෙන වඤ්චෙති තං පරාභවතො මුඛං.



Free Distribution www.aathaapi.org

91. අපි ගෞතමයන් වහන්සේ පිරිහෙන පුඟුල් පුළුවුසුම්හ. භාග්‍යවතුන් වහන්සේ පුළුවුස්නට අවුත් සිටියම්හ. (ගෞතමයන් වහන්ස) පිරිහෙන පුඟුල්හුගේ මුඛය (කාරණය) කිම?

92. වැඩෙන (දියුණුවන) පුරුෂ සුවසේ දත හෙයි. පිරිහෙන පුරුෂ මොනොවට දත හෙයි. (දසකුසල්) දහම් කැමැත්තේ වැඩෙනු වෙයි. දහමට දෙවෂ කරණුයේ පිරිහෙනු වෙයි.

93. මෙසෙයින් තෙල දැනගණුම්හ. එ ධර්මද්වෙෂිතා ලක්ෂණය පළමුවන පරාභවය යි, භාග්‍යවතුන් වහන්ස, පිරිහෙන පුඟුල්හුගේ දෙවන පරාභව මුඛය කිමැයි වදාළ මැනැවැ.

94. ඔහුට අසත්පුරුෂයෝ ප්‍රිය වෙති. (බුද්ධාදි) සත්පුරුෂයා කෙරෙහි ප්‍රිය නො කෙරෙයි. අසත්පුරුෂයන්ගේ (දෙසැට මිසදිටු) දහම රුස්නේ වෙ. එය පිරිහෙන පුඟුල්හුගේ කරුණු වෙයි.

95. මෙසෙයින් තෙල කරුණ දැනගනුම්හ. එ ලක්ෂණය දෙවන පරාභවය යි. භාග්‍යවතුන් වහන්ස, පිරිහෙන පුඟුල්හුගේ තෙවන පරාභව කාරණය කිමැයි වදාළ මැනැව.

96. යම් මිනිසෙක් නිදනසුලු වේ ද, ගණයාකෙරෙහි ඇලෙන සුලු වෙ ද, උත්ථානවීර්‍ය්‍ය නැතියේ ද, උපතින් අලස වේ ද, ක්‍රොධය ලක්ෂණ කොට ඇති වෙ ද, එය පිරිහෙන පුඟුල්හුගේ මුඛ යි.

97. මෙසෙයින් තෙල කරුණ දැනගණුම්හ. තෙල ලක්ෂණය තෙවන පරාභවය යි. භාග්‍යවතුන් වහන්ස, පිරිහෙනුහුගේ තෙල සිව්වන දෙර කිමැයි වදාළ මැනැවි.

98. යමෙක් පොහොසත් වූයේ ජරාජීර්ණ වූ ඉක්මගිය යොවුන් බව ඇති මව හෝ පියා නො පුස්නේ ද, එ පිරිහෙන පුඟුල්හුගේ දෙර යි.

99. මෙසෙයින් එ කරුණ දැනගණුම්හ. තෙල ලක්ෂණය සිවුවන කරුණැයි. භාග්‍යවතුන් වහන්ස, පිරිහෙන පුඟුල්හුගේ තෙල පස්වන දොර කිමැයි වදාළ මැනැවැ.

100. යමෙක් බමුණකු වේවයි මහණකු වේවයි අන් කිසි යදියකු වේවයි මුසවායෙන් රවටා ද, එ පිරිහෙන පුඟුල්හුගේ දොර යි.



Free Distribution www.aathaapi.org

101 ඉති හෙතං විජානාම පඤ්චමො සො පරාභවො,
ඡට්ඨමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

102 පහූතවිත්තො පුරිසො සහිරඤ්ඤො සභොජනො,
එකො භුඤ්ජති සාදූනි තං පරාභවතො මුඛං.

103 ඉති හෙතං විජානාම ඡට්ඨමො සො පරාභවො,
සත්තමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

104 ජාතිත්ථද්ධො ධනත්ථද්ධො ගොත්තත්ථද්ධො ච යො නරො
සඤ්ඤාතිං අතිමඤ්ඤෙති තං පරාභවතො මුඛං.

105 ඉති හෙතං විජානාම සත්තමො සො පරාභවො,
අට්ඨමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං,

106 ඉත්ථිධුත්තො සුරාධුත්තො අක්ඛධුත්තො ච යො නරො,
ලද්ධං ලද්ධං විනාසෙති තං පරාභවතො මුඛං.

107 ඉති හෙතං විජානාම අට්ඨමො සො පරාභවො,
නවමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

108 සෙහි දාරෙහසන්තුට්ඨො වෙසියාසු පදිස්සති,
දිස්සති පරදාරෙසු තං පරාභවතො මුඛං.

109 ඉති හෙතං විජානාම නවමො සො පරාභවො,
දසමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

110 අතීතයොබ්බනො පොසො ආනෙති තිම්බරුත්ථනිං,
තස්සා ඉස්සා න සුපති තං පරාභවතො මුඛං.

111 ඉති හෙතං විජානාම දසමො සො පරාභවො,
එකාදසමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං,



Free Distribution www.aathaapi.org

101. මෙසෙයින් එ කරුණ දැනගනුම්හ. තෙල ලක්ෂණය පස්වන කරුණයි. භාග්‍යවතුන් වහන්ස, තෙල පිරිහෙන පුඟුල්හුගේ සවන දොර කිමැයි වදළ මැනැව.

102. බොහෝ රන් රිදී මිණිරුවන් ඇති කහවනු ඇති සූපව්‍යඤ්ජන භෝජනයෙන් සමෘද්ධ වූ, පුරුෂ එකලා වූයේ පිණි බොදුන් වළඳනේ ද, එය පිරිහෙන පුඟුල්හුගේ සවන දොර යි.

103. මෙසෙයින් එ කරුණ දැනගණුම්හ. තෙල ලක්ෂණය සවන කරුණයි. භාග්‍යවතුන්වහන්ස, පිරිහෙන පුඟුල්හුගේ සත්වන දොර කිමැයි වදාළ මැනවැ.

104. යම් මිනිසෙක් ජාතිමානයෙන් තද වූයේ ධන මානයෙන් තද වූයේ කුලමානයෙන් තද වූයේ සිය නැයන් ඉක්මැ සිතා ද, එය පිරිහෙන පුඟුල්හුගේ දොර යි.

105. මෙසෙයින් එ කරුණ දැනගණුම්හ. තෙල ලක්ෂණය සත්වන කරුණ යි. භාග්‍යවතුන් වහන්ස, පිරිහෙන පුඟුල්හුගේ අටවන දොර කිමැයි වදළ මැනවැ.

106. යම් මිනිසෙක් ස්ත්‍රීධූර්ත වූයේ සුරාධූර්ත වූයේ අක්ෂධූර්ත වූයේ ලද ලද දෑ වනසා ද එය පිරිහෙන පුඟුල්හුගේ දොර යි.

107. මෙසෙයින් එ කරුණ දැනගණුම්හ. තෙල ලක්ෂණ අටවන පිරිහෙන පුඟුල්හුගේ කරුණ යි. භාග්‍යවතුන් වහන්ස, නවවන පිරිහීමේ කරුණ කිමැයි වදාළ මැනව.

108. සිය දාරයන් විසින් නොසතුටු වූයේ වෙශ්‍යාවන් කෙරෙහි පැමිණේ ද, පරඹුවන් වෙතැ පැමිණේ ද, එ පිරිහෙන පුඟුල්හුගේ දොර යි.

109. මෙසෙයින් එ කරුණ දැනගනුම්හ. තෙල ලක්ෂණය පිරිහෙන පුඟුල්හුගේ නවවන කරුණ යි. භාග්‍යවතුන් වහන්ස, දසවන දොර කිමැයි වදාළ මැනවැ.

110. ඉක්මගිය යොවුන් ඇති පුරුෂ තිඹිරිපල බඳු පියොවුරු ඇති තුරුණු දැරියක් ආවාහ කොට ගණී ද (හේ) ඇයට ඊර්ෂ්‍යායෙන් නො නිදා ද එ පිරිහෙන පුඟුල්හුගේ දොර යි.

111. මෙසෙයින් එ කරුණ දැනගණුම්හ. තෙල ලක්ෂණය පිරිහෙන පුඟුල්හුගේ දසවන කරුණ යි. භාග්‍යවතුන් වහන්ස, එකොළොස්වන පිරිහෙන පුඟුල්හුගේ කරුණ කිමැයි වදාළ මැනවැ.

112 ඉත්ථිසොණ්ඩිං විකිරණිං පුරිසං වාපි තාදිසං,
ඉස්සරියස්මිං ඨාපෙති තං පරාභවතො මුඛං.

113 ඉති හෙතං විජානාම එකාදසමො සො පරාභවො,
ද්වාදසමං භගවා බ්‍රෑහි කිං පරාභවතො මුඛං.

114 අප්පභොගො මහාතණ්හො ඛත්තියෙ ජායතෙ කුලෙ,
සොධ රජ්ජං පත්ථයති තං පරාභවතො මුඛං.

115 එතෙ පරාභවෙ ලොකෙ පණ්ඩිතො සමවෙක්ඛිය,
අරියො දස්සනසම්පන්නො ස ලොකං භජතෙ සිවන්ති.

පරාභව සුත්තං නිට්ඨිතං.

## 1 -- 7

## වසල සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, අථ ඛො භගවා පුබ්බන්හ සමයං නිවාසෙත්වා පත්තචීවරං ආදය සාවත්ථියං පිණ්ඩාය පාවිසි. තෙන ඛො පන සමයෙන අග්ගික භාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනෙ අග්ගි පජ්ජලිතො හොති ආහුති පග්ගහිතා. අථ ඛො භගවා සාවත්ථියං සපදනං පිණ්ඩායචරමානො යෙන අග්ගිකභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. අද්දසා ඛො අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං දූරතො'ව ආගච්ඡන්තං. දිස්වාන භගවන්තං එතදවොච: තත්‍රෙව මුණ්ඩක තත්‍රෙව සමණක තත්‍රෙව වසලක: තිට්ඨාහීති.

එවං වුත්තෙ භගවා අග්ගිකභාරද්වාජං බ්‍රාහ්මණං එතදවොච: ජානාසි පනාත්වං බ්‍රාහ්මණ වසලං වා වසලකරණෙ වා ධම්මෙ ති,

නඛ්වාහං භො ගොතම ජානාමි වසලං වා වසලකරණෙ වා ධම්මෙ. සාධු මෙ භවං ගොතමො තථා ධම්මං දෙසෙතු යථාහං ජානෙය්‍යං වසලං වා වසලකරණෙ වා ධම්මෙති.

112. (මත්ස්‍ය මාංස මද්‍යපාන ආදියෙහි) ලොල් වූ එ සඳහා ධනය විසුරුවන මාගමක් හෝ එබඳු වූ පුරුෂයකු ඉසුරෙහි (ආධිපත්‍යයෙහි) තබා ද, එ පිරිහෙන පුහුල්හුගේ දොර යි.

113. මෙසෙයින් එ කරුණු දැන ගණුමහ. තෙල ලක්ෂණය පිරිහෙන පුහුල්හු ගේ එකොළොස්වන කරුණ යි. භාග්‍යවතුන් වහන්ස, දොළොස් වන පිරිහීමෙ කරුණ කිමැයි වදාළ මැනවැ.

114. අල්පභෝග ඇති මහත් වූ භොගතෘෂ්ණා ඇති, යමෙක් ක්ෂත්‍රිය කුලයෙහි උපදී ද, හෙ ද රාජ්‍යය පතා නම්, එ පිරිහෙන පුහුල් හුගේ දොර යි.

115. පණ්ඩිත වූ පරාභව දක්නා නුවණැති ඒ ආර්‍ය්‍ය පුද්ගල ලොවහි තෙල පරාභවයන් නුවණැයින් පිරිසිඳ දැන දෙව්ලොවට පැමිණේ යයි.

පරාභව සූත්‍රය නිමි.

## 1 -- 7

## වසල සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදැ: එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවන නම් අනේපිඩු මහසිටුහුගේ අරම්හි වැඩවෙසෙන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු යෙහි හැඳ පෙරෙවැ පාසිවුරු ගෙණ සැවැත් නුවරට පිඩු සිඟා වැඩිසේක. එසමයෙහි අග්ගික භාරද්වාජ බ්‍රාහමණයාගේ නිවෙස්න සමීපයෙහි හෝම ගිනි දල්වන ලද වෙයි. ඉදිරියෙහි හොමද්‍රව්‍ය එළවනලද වෙයි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ගෙපිළි වෙළින් පිඩුසිඟා වඩනාසේක්. අග්ගික භාරද්වාජ බ්‍රාහමණයාගේ නිවෙසට වැඩිසේක, අග්ගික භාරද්වාජ බ්‍රාහමණ දුර ම වඩනා භාග්‍යවතුන් වහන්සේ දිටී. දැක භාග්‍යවතුන් වහන්සේට තෙල බස් කීය: මුණ්ඩකය, ඔබ මැ සිට, ශ්‍රමණකය ඔබ මැ සිට, වසලකය, ඔබ මැ සිට යි.

මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ අග්ගික භාරද්වාජ බමුණු හට තෙල වදළහ: ''බමුණ, තෝ වැලිත් වසලයා වෙවයි වසල කරණ ධර්ම වෙවයි. දන්හි දැ''යි,

භවත් ගෞතමයානන් වහන්ස, මම වසලයා වෙවයි වසල කරණ ධර්ම වෙවයි නොදන්මි ඉදින් භගවත් ගෞතමයන් යම් පරිදි මම වසල වෙවායි. වසල කරණ ධර්ම වෙවයි දැනගණිම් ද එපරිදි භවත් ගෞතම- යන් වහන්සේ දහම දෙසන සේක්වා'' යි.

තෙන හි බ්‍රාහ්මණ සුණාහි සාධුකං මනසි කරොහි භාසිස්සාමීති. එවං භොති ඛො අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවතො පච්චස්සොසි, භගවා එතදවොච:

116 කොධනො උපනාහී ච පාපමක්ඛී ච යො නරො,
විපන්නදිට්ඨි මායාවී තං ජඤ්ඤා වසලො ඉති.

117 එකජං වා ද්විජං වාපි යොධ පාණානි හිංසති,
යස්ස පාණෙ දයා නත්ථි තං ජඤ්ඤා වසලො ඉති.

118 යො හන්ති පරිරුන්ධති ගාමානි නිගමානි ච,
නිග්ගාහකො සමඤ්ඤාතො තං ජඤ්ඤා වසලො ඉති,

119 ගාමෙ වා යදි වා රඤ්ඤෙ යං පරෙසං මමායිතං,
ථෙය්‍යා අදින්නං ආදියති තං ජඤ්ඤා වසලො ඉති.

120 යො හවෙ ඉණමාදාය චුජ්ජමානො පලායති,
න හි තෙ ඉණමත්ථීති තං ජඤ්ඤා වසලො ඉති.

121 යො වෙ කිඤ්චික්ඛකම්‍යතා පන්ථස්මිං වජන්තං ජනං,
හන්ත්වා කිඤ්චික්ඛමාදෙති තං ජඤ්ඤා වසලො ඉති.

122 යො අත්තහෙතු පරහෙතු ධනහෙතු ච යො නරො.
සක්ඛිපුට්ඨො මුසා බ්‍රෑති තං ජඤ්ඤා වසලො ඉති.

123 යො ඤාතීනං සඛානං වා දාරෙසු පතිදිස්සති,
සහසා සම්පියෙන වා තං ජඤ්ඤා වසලො ඉති.

124 යො මාතරං වා පිතරං වා ජිණ්ණකං ගතයොබ්බනං,
පහු සන්තො න භරති තං ජඤ්ඤා වසලො ඉති.

එසේ නම් "බ්‍රාහ්මණය, අසව, මොනොවට මෙනෙහි කරව, කියන්නෙමි"යි. "භවත්නි, එසේය යි අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස් වීය. භාග්‍යවතුන් වහන්සේ මෙල වසල සුත් වදළ සේක:

116 යම් මිනිසෙක් කිපෙන සුලු යේත් බඳනාලද වෙර ඇතියේත් පව්වූ ලමු ගුණමකු වූයේත්, විපයර්‍යස්තදෘෂ්ටි ඇතියේත් මායාවීත් වේ ද, ඔහු (ලමුදම් වස්වන හෙයින්) වසලයෙකැයි දන්නේය.

117 මෙලොවැ යමෙක් ඒකජ වේවයි. ද්විජ වේවයි ප්‍රාණීන් දිවිගලවා ද, යමක්හට ප්‍රාණීන් කෙරෙහි දයා නැත් ද, ඔහු වසල යෙකැ' යි දන්නේය.

118 යමෙක් ගමුදු නියම්ගමුදු වනසා ද, වටලාගණී ද "ගම පහරණ සොරෙකැ"යි පළට වේ ද, ඔහු 'වසල යෙකැ'යි දන්නේය.

119 ගම්හි වේවයි වල්හි වේවයි අනුන් විසින් මමත්‍ව කළ (හිමියන් විසින් නොදුන් වතක් සොර සිතින් ගණී ද, ඔහු 'වසල යෙකැ'යි දන්නේය.

120 යමෙක් එකැතින් (පරාගෙන්) ණය ගෙණ චෝදනා කරණු ලබන්නේ "තට මාගේ ණයෙක් නැතැ"යි පලායේ නම් ඔහු 'වසල යෙකැ'යි දන්නේය.

121 යමෙක් අල්පමාත්‍ර වූ ද, කිසිවක් කැමැත්තෙන් මගැ යන ජනයා නසා බඩු වොලො ගණී ද ඔහු 'වසල යෙකැ'යි දන්නේය.

122 යමෙක් ආත්ම හේතුයෙන් හෝ පරහේතුයෙන් හෝ වේවයි තවද යම් මිනිසෙක් ධනය හේතු යෙන් හෝ සාක්ෂි කොට පුළුවුස්නා ලදුයේ දැන දැන මුසාබණේ ද ඔහු 'වසල යෙකැ'යි දන්නේය.

123 යමෙක් නෑසබඳුන්ගේ වේවයි යහලුවන්ගේ වේවයි අඹුවන් කෙරෙහි බලහත්කාරයෙන් හෝ දෙදෙනාගේ සනායෙන් හෝ ප්‍රතිකූල සේ මයර්‍යාද හෙද කරණු දක්නාලැබෙ ද ඔහු 'වසලයෙකැ'යි දන්නේය.

124 යමෙක් අර්ථෝපකරණයෙන් පොහොසත් වූයේ ජරාවෙන් දිරූ ගිය යොවුන් ඇති මව හෝ පියා හෝ නො පුස්නේ ද ඔහු 'වසලයෙකැ'යි දන්නේය.

125 යො මාතරං වා පිතරං වා භාතරං භගිනිං සසුං,
හන්ති රොසෙති වාචාය තං ජඤ්ඤා වසලො ඉති.

126 යො අත්ථං පුච්ඡිතො සන්තො අනත්ථමනුසාසති,
පටිච්ඡන්නෙන මන්තෙති තං ජඤ්ඤා වසලො ඉති.

127 යො කත්වා පාපකං කම්මං මා මං ජඤ්ඤාති ඉච්ඡති,
යො පටිච්ඡන්නකම්මන්තො තං ජඤ්ඤා වසලො ඉති.

128 යො වෙ පරකුලං ගන්ත්වා භුත්වාන සුචිභොජනං,
ආගතං න පටිපූජෙති තං ජඤ්ඤා වසලො ඉති.

129 යො බ්‍රාහ්මණං වා සමණං වා අඤ්ඤං වාපි වණිබ්බකං,
මුසාවාදෙන වඤ්චෙති තං ජඤ්ඤා වසලො ඉති.

130 යො බ්‍රාහ්මණං වා සමණං වා භත්තකාලෙ උපට්ඨිතෙ,
රොසෙති වාචා න ච දෙති තං ජඤ්ඤා වසලො ඉති.

131 අසතං යොධ පබ්‍රෑති මොහෙන පළිගුණ්ඨිතො,
කිඤ්චික්ඛං නිජිගිංසානො තං ජඤ්ඤා වසලො ඉති.

132 යො චත්තානං සමුක්කංසෙ පරඤ්ච මවජානති,
නිහීනො සෙන මානෙන තං ජඤ්ඤා වසලො ඉති.

133 රොසකො කදරියො ච පාපිච්ඡො මච්ඡරී සඨො,
අහිරිකො අනොත්තාපී තං ජඤ්ඤා වසලො ඉති.

134 යො බුද්ධං පරිභාසති අථ වා තස්ස සාවකං,
පරිබ්බාජං ගහට්ඨං වා තං ජඤ්ඤා වසලො ඉති.

135 යො වෙ අනරහා සන්තො අරහං පටිජානාති,
චොරො සබ්‍රහ්මකෙ ලොකෙ එස ඛො වසලාධමො.
එතෙ ඛො වසලා වුත්තා මයා වො යෙ පකාසිතා.



Free Distribution www.aathaapi.org

125 යමෙක් මව හෝ පියා හෝ බෑයා බුහුන හෝ පෙළා ද, වචන යෙන් හෝ කෝප උපදවා ද, ඔහු ''වසලයෙකැ''යි දන්නේය.

126 යමෙක් (සාන්දෘෂ්ටිකාදි අර්ථය) පුළුවුස්නා ලදුයේ (ඔහුට) අහිතයක් මැ පවසා ද, (අභීය මැ හෝ) ප්‍රතිච්ඡන්නක වශයෙන් බෙණේ ද ඔහු 'වසලයෙකැ'යි දන්නේ ය.

127 යමෙක් පවිකම් කොට 'මා නහමක් දනීවා' යි කැමැති වේ ද, යමෙක් ප්‍රතිච්ඡන්න කර්ම ඇතියේත් වේ ද ඔහු 'වසල යෙකැ' දන්නේ ය.

128 යමෙක් පරකුලයට ගොස් පිණි බොජුන් වළඳා (තම නිවෙසට) පැමිණියහුට ප්‍රතිපූජා නොකෙරේ ද ඔහු වසල යෙකැ'යි දන්නෙ ය.

129 යමෙක් බමුණකු වේවයි මහණකු වේවයි අන්කිසි යදියකු වේවයි මුසවායෙන් රවටා ද ඔහු 'වසල යෙකැ'යි දන්නේ ය.

130 යමෙක් භෝජන කාලය එළැඹෙත්ම බමුණකු වෙයයි මහණකු වේවයි පරොස් බසින් කෝප උපදවා ද, කිසිත් නො දේ ද ඔහු 'වසල යෙකැ'යි දන්නේ ය.

131 මෙලොවැ යමෙක් මෝහයෙන් වෙළුනේ කිසිවක් (ලබා) ගනු කැමැත්තේ අසත් බස් තෙපලා ද ඔහු 'වසල යෙකැ'යි දන්නේ ය.

132 යමෙක් සවකීය මානයෙන් ඉතා හීන වූයේ තමා හුවා දක්වා ද, මෙරමා හෙළා දකී ද ඔහු 'වසල යෙකැ යි දන්නේ ය.

133 (මෙරමාහට) කෝප උපදවනුයේ තද මසුරු වූයේත් වේ ද, ලාමක වූ ඊජ්සා ඇත්තේ ද මසුරු බැව් ඇත්තේ ද, ශඨභාවයෙන් යුක්ත වේ ද පවට ලජ්ජා නැත්තේ පවට බිය නැත්තේ වේ ද, ඔහු 'වසල යෙකැ'යි දන්නේ ය.

134 යමෙක් සම්මා සම්බුදුනට පරිභව බෙණේ ද, නොහොත් උන්වහන්සේගේ සවු වූ පැවිද්දකුට වේවයි ගැහැවියකුට වේවයි අපවාද කෙරේ ද ඔහු 'වසලයෙකැ'යි දන්නේ ය.

135 යමෙක් රහත් නොවූයේ මම රහත්මියි පිළින කෙරේ ද, බඹුන් සහිත වූ ලොවිහි සොරකු වූ මෙතෙමේ මැ අධම වූ ම වසල වෙයි. යම් පුහුල් කෙනෙක් මා විසින් තොපට පවසන ලද්දහු ද මොහු ඒකාන්තයෙන් වසලයහ යි කියනලදහ.

136 න ජච්චා වසලො හොති න ජච්චා හොති බ්‍රාහ්මණො,
කම්මනා වසලො හොති කම්මනා හොති බ්‍රාහ්මණො.

137 තදමිනාපි ජානාථ යථා මෙදං නිදස්සනං,
චණ්ඩාලපුත්තො සොපාකො මාතඞ්ගො ඉති විස්සුතො,

138 සො යසං පරමං පත්තො මාතඞ්ගො යං සුදුල්ලභං,
ආගඤ්ඡුං තස්සුපට්ඨානං ඛත්තියා බ්‍රාහ්මණා බහූ.

139 සො දෙවයානමාරුය්හ විරජං සො මහාපථං,
කාමරාගං විරාජෙත්වා බ්‍රහ්මලොකූපගො අහු.

140 න නං ජාති නිවාරෙසි බ්‍රහ්මලොකූපපත්තියා,
අජ්ඣායකකුලෙ ජාතා බ්‍රාහ්මණා මන්තබන්ධුනො.

141 තෙ ච පාපෙසු කම්මෙසු අභිණ්හමුපදිස්සරෙ,
දිට්ඨෙව ධම්මෙ ගාරය්හා සම්පරායෙ ච දුග්ගතිං,
න තෙ ජාති නිවාරෙති දුග්ගච්චා ගරහාය වා.

142 න ජච්චා වසලො හොති න ජච්චා හොති බ්‍රාහ්මණො,
කම්මනා වසලො හොති කම්මනා හොති බ්‍රාහ්මණො.

එවං වුත්තෙ අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච:

අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම, සෙය්‍යථාපි භො ගොතම, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි, ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

**වසලසුත්තං නිට්ඨිතං.**



Free Distribution www.aathaapi.org

136 (පරමාර්ථ විසින්) ජාතියෙන් වසල නො වෙයි, ජාතියෙන් (උපතින්) බමුණු ද නො වේ (අපරි ශුද්ධ) කර්මයෙන් වසල වෙයි (පරිශුද්ධ) කර්මයෙන් බ්‍රාහ්මණ වේ.

137 යම් ප්‍රකාරයකින් මාගේ මේ නිදසුන වේ ද, එකරුණ මේ ප්‍රකාරයෙනු දු දැන ගණිවු. (කෑමට) බලුමස් උයන ශ්වපාක නම් සැඩොල් පුතෙක් මාතඞ්ගයයි ප්‍රසිද්ධ වීය.

138 ඒ මාතඞ්ග හීනකුලොත්පන්නයකු විසින් ඉතා දුර්ලභ වූ යම් යශසකට පැමිණියේ ද, ඔහුට උවටැනට බොහෝ ක්ෂත්‍රියෝ ද බ්‍රාහ්මණයෝ ද පැමිණියහ.

139–140 හේ (රාගාදි කෙලෙස් රජස්නැති) බුද්ධාදීන් විසින් පිළිපන් හෙයින් මහාමාර්ග වූ (අටසමවත්) දේව යානයට නැග කාමරාගය ප්‍රහීණ කොට බඹලොවට පිළිසඳ විසින් පැමිණියේය. ජාතිය බඹලොව උපතින් ඔහු නො වැළැකීය. වෙදහදරණ කුලෙහි උපන්, වෙදය පිළිසරණ කොට ඇති,ඒ බ්‍රාහ්මණයෝ ද නිතර පව් කම්හි (ගැලුනාහු) දක්නා ලැබෙත්.

141 දිටු දැමියෙහි ගැරහීමට පත්වූවාහු පරලොවහි දුගතියට ද පත්වූවාහු දක්නා ලැබෙති. ජාතිතොමෝ ඔවුන් දුගතියෙන් හෝ ගැරහීමෙන් හෝ නො වළහා.

142 ජාතියෙන් වසල නොවේ: ජාතියෙන් බ්‍රාහ්මණ නො වේ, කර්මයෙන් වසල වේ: කර්මයෙන් බ්‍රාහ්මණ වේ.

මෙසේ වදළ කල්හි අග්ගික භාරද්වාජ බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේට මෙල සැළ කෙළේය:

භවත් ගෞතමයන් වහන්ස, ඉතා මනහරය. භවත් ගෞතමයන් වහන්ස, ඉතා මනහර ය, භවත් ගෞතමයන් වහන්ස, යටිහුරු කොට තබන ලද්දක් උඩුහුරු කොට තබන්නේ යම්සේ ද, වසන ලද්දක් හෝ විවෘත කරන්නේ යම්සේ ද, මං මුළා වූවකුට මග කියන්නේ හෝ යම් සේ ද, ඇස් ඇත්තාහු රූ දක්නාහ'යි අඳුරෙහි තෙල් පහනක් හෝ දරන්නේ යම් සේ ද, එපරිද්දෙන් ම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් දහම් දෙසන ලද. ඒ මම භවත් ගෞතමයන් වහන්සේ ද ධර්මය ද භික්ෂුසඞ්ඝයා ද සරණ කොට යෙමි. භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවිහිමියෙන් සරණ ගිය උවසුවකු කොට මා දරණ සේක් ව යි.

**වසල සූත්‍රය නිමි.**

## 1 -- 8

# මෙත්තසුත්තං

143 කරණීය මත්ථකුසලෙන යං තං සන්තං පදං අභිසමෙච්ච
සක්කො උජූ ච සුජූ ච සුවචො චස්ස මුදු අනතිමානී.

144 සන්තුස්සකො ච සුභරො ච අප්පකිච්චො ච සල්ලහුකවුත්ති,
සන්තින්ද්‍රියො ච නිපකො ච අප්පගබ්භො කුලෙසු අනනුගිද්ධො,

145 න ච ඛුද්දං සමාචරෙ කිඤ්චි යෙන විඤ්ඤූ පරෙ උපවදෙය්‍යුං,
සුඛිනො වා ඛෙමිනො හොන්තු සබ්බෙ සත්තා භවන්තු
සුඛිතත්තා

146 යෙ කෙචි පාණභූතත්ථි තසා වා ථාවරා වා අනවසෙසා,
දීඝා වා යෙ මහන්තා වා මජ්ඣිමා රස්සකාණුකථූලා.

147 දිට්ඨා වා යෙ ච අද්දිට්ඨා යෙ ච දූරෙ වසන්ති අවිදූරෙ,
භූතා වා සම්භවෙසී වා සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා.



Free Distribution www.aathaapi.org

## 1 – 8

## මෙත්ත සූත්‍රය

143 ශාන්ත (නිර්වාණ) පදයට එළඹ වසනු කැමති වූ (ශික්ෂාත්‍රය සඞ්ඛ්‍යාත) ප්‍රතිපත්ති සඞ්ඛ්‍යාත අර්ථයෙහි දක්ෂ වූවහු විසින් (සතර මාර්ග ඵල සඞ්ඛ්‍යාත) යම් කරණීය වේ නම්, ඒ කළයුතු වෙයි. (හෙ) සත්‍යප්‍රතිවෙධයෙහි සමර්ථ වන්නේ ය (තෙවන ප්‍රධානාඞ්ගයෙන් සමන්වාගත විමෙන්) ඍජු ද මොනොවට ඍජු ද වන්නේය. (අවවාදක්ෂමතායෙන්) සුවච වන්නේය. (සසුන් බඹසරෙහි) මෘදු වන්නේය. (ජාති ගොත්‍රාදි විසින්) අතිමාන නැති වන්නේය.

144 (ද්වාදශවිධ සන්තොෂයෙන්) සන්තුෂ්ට වන්නේය. (දායකයනට) සුපොෂ්‍ය වන්නේය. (කර්මාරාමතාදි අනෙකකෘත්‍යව්‍යාපෘත නොවීමෙන්) අල්ප කෘත්‍ය ඇති වන්නේය. (අල්ප පරිෂ්කාරතායෙන්) සැහැල්ලු වැටුම් ඇති වන්නේය. සන්හුන් ඉඳුරන් ඇති වන්නේය. (ශීලානුරක්ෂණ, චීවරාදි විචාරණ සත්ප්‍රාය පරිජානන ප්‍රඥායෙන්) තන්වැසි නුවණැති වන්නේය. (කාය, වාඞ්, මනඃ ප්‍රගල්භතා නැති යෙන්) නොසරුප් බුහුටි බැවින් තොර වන්නේය. අනුලොම් නුවූ ගිහිසඟ විසින්) කුලන්හි නොගිජු වන්නේය.

145. යම් ලමුකමෙකින් විඥ වූ අන්‍යයෝ උපවාද කෙරෙත් නම්, එබඳු (ත්‍රිවිධදුශ්චරිත සඞ්ඛ්‍යාත) කිසිදු ක්ෂුද්‍රකර්ම නො ද කරන්නේය. සව්සත්හු සුවපත් වූවෝ, නිරුපද්‍ර ව වූවෝ සුඛිතචිත්ත වෙත්වා.

146. (තෘෂ්ණා සහිත හෙයින්) ත්‍රස නම් වූ ද (තෘෂ්ණාප්‍රහාණයෙන් රහත් වූ හෙයින්) ස්ථාවර වූ ද (නාග මත්ස්‍ය ගොධාදි) දීඝජාතික වූ ද (හස්තිනාග දනවාදි) මහාකාය ඇත්තාවූ ද (අශ්ව ගවමහිෂාදි) මධ්‍යම ශරීර ඇත්තා වූ ද (වාමනාදි) ලුහුඬු සිරිරි ඇත්තාවූ ද (දිවැසට ගොදුරුවන) සියුම් අත්බැව් ඇත්තා වූ ද (මත්ස්‍ය කූර්මාදි) ස්ථූල වූ ද (පඤ්චවොකාර භවයෙහි) යම් නිරවශෙෂ ප්‍රාණීහු වෙත් නම්, (එක වොකාර, චතුවොකාර භවයන්හි) යම්බඳු නිවරශෙෂ භූතයෝ වෙත් නම,

147. (ඇස් සමුවට ඊම් විසින්) දුටු විරූ හෝ යම් ප්‍රාණී කෙනෙක් ඇත් ද, දුරෙහි හෝ නොදුරෙහි යම් සත්ව කෙනෙක් වෙසෙත් ද, (අභිනිර්වෘත හෙයින් අර්හත් සඞ්ඛ්‍යාත) යම් භූත කෙනෙක් වෙත් ද පුනර්භව සොයන හෙයින් ශෛක්ෂ පෘථග්ජනසඞ්ඛ්‍යාත) යම් සම්භවෙසී සත්ව කෙනෙක් වෙත් ද, එ හැම සත්වයෝ සුඛිතාත්ම වෙත්වා.



Free Distribution www.aathaapi.org

148 න පරො පරං නිකුබ්බෙථ නාතිමඤ්ඤෙථ කත්ථචි නං කඤ්චි
බ්‍යාරොසනා පටිඝසඤ්ඤා නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය.

149 මාතා යථා නියං පුත්තං ආයුසා එකපුත්තමනුරක්ඛෙ,
එවම්පි සබ්බභූතෙසු මානසං භාවයෙ අපරිමාණං

150 මෙත්තඤ්ච සබ්බලොකස්මිං මානසං භාවයෙ අපරිමාණං,
උද්ධං අධො ච තිරියඤ්ච අසම්බාධං අවෙරං අසපත්තං,

151 තිට්ඨං චරං නිසින්නො වා සයානො වා යාව තස්ස විගතමිද්ධො
එතං සතිං අධිට්ඨෙය්‍ය බ්‍රහ්මමෙතං විහාරං ඉධමාහු.

152 දිට්ඨිඤ්ච අනුපගම්ම සීලවා දස්සනෙන සම්පන්නො,
කාමෙසු විනෙය්‍ය ගෙධං න හි ජාතු ගබ්භසෙය්‍යං පුනරෙතීති.

මෙත්තසුත්තං නිට්ඨිතං.

## 1 – 9

## හෙමවතසුත්තං

153 අජ්ජ පණ්ණරසො උපොසථො (ඉති සාතාගිරො යක්ඛො)
දිබ්‍යා රත්ති උපට්ඨිතා
අනොමනාමං සත්ථාරං
හන්ද පස්සාම ගොතමං

154 කච්චි මනො සුපණිහිතො (ඉති හෙමවතො යක්ඛො)
සබ්බභූතෙසු තාදිනො,
කච්චි ඉට්ඨෙ අනිට්ඨෙ ච
සංකප්පස්ස වසීකතා.



Free Distribution    www.aathaapi.org

148. අන්‍යජනයෙක් පරජනයකු නො රවටන්නේය. කිසි තැනෙක් හිදු එබඳු (ක්ෂත්‍රියාදි) කිසිවකු ඉක්ම නො හඟන්නේය. (කායවාග් විකාර සඞ්ඛ්‍යාත) විවිධ රෝෂණයෙන් හා (මනොවිකාර සඞ්ඛ්‍යාත) ප්‍රතිඝසංඥ-යෙන් අනෙකෙක් අනෙකක් හට දුක් නොරුස්නේය.

149. මවක් තම එක ම උරෙයිදු පුතු සිය දිවියෙන් යම් සේ රක්නී ද, එසෙයිනුදු සවු සතුන් කෙරෙහි අප්‍රමාණ මෛත්‍රී චිත්තය වඩන්නේය.

150. (අරූප භවය තෙක් ඇති) උඩ හා (කාම භවය තෙක් ඇති) යට හා (රූපභව සඞ්ඛ්‍යාත) සරස හා හැම සත්ලොවිහි සම්බාධ විරහිත (නිඃසීම) වූ අවෛර වූ සතුරන් නැති අප්‍රමාණ වූ මෙත්සිත වඩන්නේය.

151. සිටුනේ වේවයි. ඇවිදුනේ වේවයි, හොනේ වේවයි යම් තාක් විගත නිද්‍රා ඇතියේ වේ නම්, තෙල මෛත්‍රී ස්මෘතිය ඉටන්නේය. (බුද්ධාදි ආර්යයෝ එය මෙලොවිහි බ්‍රහ්මවිහාර යී කීහු.

152. (ලොවුතුරු සිලින්) සිල්වත් වූයේ (සොවන් මග සම්දිටු යයි කියූ) සම්‍යක් දර්ශනයෙන් සපන් වූයේ සත්කායදෘෂ්ටියට නොපැමිණ (සෙද ගැමි අනගැමි දෙමගින්) කාමයන්හි ගිජුබව සන්හිඳුවා ඒකාන්තයෙන් කිසි වැනෙක්හිදු මාතෘගර්භශය්‍යාවට (පුනර් භවයට) යළි නො මැ එන්නේය යි.

මෙත්ත සූත්‍රය නිමි.

## 1 – 9

## හේමවත සූත්‍රය

153. සාතාගිර යක්ෂ මෙසේ කියයි: අද පසළොස්වක් පොහෝ දවස යි. දිව්‍ය වූ රාත්‍රිය එළඹ සිටියා වෙයි. එහෙයින් නො ලමු නම් ඇති ගෞතම ශාස්තෘන් වහන්සේ දකුම්හ.

154. හෙමවත යක්ෂ මෙසේ අසයි: කිම! (එ ශාස්තෘහුගේ) සිත මොනොවට සමාහිත වේ ද? සව් සතුන් කෙරෙහි සමසිත් ඇද්ද? (නොහොත්) නැද්ද? කිම, ඉටු අනිටු අරමුණෙහි ඔබගේ සංකල්පයෝ වශීකෘත වෙද්ද?

155 මනො වස්ස සුපණිහිතො (ඉති සාතාගිරො යක්ඛො)
සබ්බභූතෙසු තාදිනො,
අථො ඉට්ඨෙ අනිට්ඨෙ ච
සඞ්කප්පාස්ස වසීකතා.

156 කච්චි අදින්නං නාදියති (ඉති හෙමවතො යක්ඛො)
කච්චි පාණෙසු සඤ්ඤතො,
කච්චි ආරා පමාදම්හා
කච්චි ඣානං න රිඤ්චති.

157 න සො අදින්නං ආදියති (ඉති සාතාගිරො යක්ඛො)
අථො පාණෙසු සඤ්ඤතො,
අථො ආරා පමාදම්හා
බුද්ධො ඣානං න රිඤ්චති.

158 කච්චි මුසා න භණති (ඉති හෙමවතො යක්ඛො)
කච්චි න ඛීණව්‍යප්පථො,[1]
කච්චි වෙභූතියං නාහ
කච්චි සම්ඵං න භාසති.

159 මුසා ච සො න භණති (ඉති සාතාගිරො යක්ඛො)
අථො න ඛීණව්‍යප්පථො[1]
අථො වෙභූතියං නාහ
මන්තා අත්ථං සො භාසති.

160 කච්චි න රජ්ජති කාමෙසු (ඉති හෙමවතො යක්ඛො)
කච්චි චිත්තං අනාවිලං,
කච්චි මොහං අතික්කන්තො[2]
කච්චි ධම්මෙසු චක්ඛුමා.

161 න සො රජ්ජති කාමෙසු (ඉති සාතාගිරො යක්ඛො)
අථො චිත්තං අනාවිලං,
සබ්බමොහං අතික්කන්තො
බුද්ධො ධම්මෙසු චක්ඛුමා.

1. න ඛීණා ව්‍යප්පථො - සිමු 2, නාඛීණා ව්‍යප්පථො - පු.
2. අභික්කන්තො - සිමු 2.



Free Distribution www.aathaapi.org

155. **සාතාගිර යක්ෂ මෙසේ කියයි:** සියල් සතුන් කෙරෙහි සමසිත් ඇති උන්වහන්සේගේ සිත ද මොනොවට සමාහිත වෙයි. වැලිත් ඉටු අනිටු අරමුණෙහි උන්වහන්සේගේ විතර්කයෝ වශීකෘතයහ.

156. **හේමවත යක්ෂ මෙසේ අසයි:** කිම, ඔබ අයිනාදන් දැ නොගන්නේ ද? කිම, ප්‍රාණීන් විෂයයෙහි සංයත ද? කිම, අබ්‍රහමචර්ය සංඛ්‍යාත) ප්‍රමාදයෙන් (පාධාන්තරයෙහි මාගම් කෙරෙන්) දුරු වූයේ ද? කිම, ධ්‍යානය නොසිස් කෙරේද?

157. **සාතාගිර යක්ෂ මෙසේ කියයි:** හෙ අයිනාදන් නොගන්නේය. යළි ප්‍රාණීන් කෙරෙහි සංයත ද වෙයි. යළිදු අබ්‍රම්සරින් (නොහොත් මාගම් කෙරෙන්) දුරු වූයේය. ඒ බුදුරජ දහැන් සිස් නොකෙරේ.

158. **හේමවත යක්ෂ මෙසේ අසයි:** කිම, මුසවා නො බෙණේ ද? කිම, පරොස් බස් නැත්තේ ද? කිම, වෙහුතිය යි කියූ බස් නො කියා ද? කිම, පලප් නො බෙණේ ද?

159. **සාතාගිර යක්ෂ මෙසේ කියයි:** හේ මුසා නො බෙණෙයි, වැලි පරොස් බස් නැත්තේ වෙයි. තවද පිසුනු නො ද තෙපලයි. හෙතෙම නුවණින් පිරිසිඳ දැන අරුත්ම බෙණෙයි.

160. **හේමවත යක්ෂ මෙසේ අසයි:** කිම, (කෙලශකාමයෙන්) වස්තුකාමයන්හි නො ඇලේ ද? කිම, සිත (ව්‍යාපාදයෙන්) නො කැලඹුනේද? කිම, මෝහය ඉක්ම වූයේ ද? කිම සියලු දහම්හි (සවන්නැණ) නුවණැස් ඇත්තේ ද?

161. **සාතාගිර යක්ෂ මෙසේ කියයි:** හේ කාමයන්හි නො ඇලෙයි, වැලිදු සිත නො කැලඹුනේ වෙයි. සියලු මොහය ඉක්ම වූයේ වෙයි, බුදුරජ සියලු දහම්හි (අප්‍රතිහත) නුවණැස් ඇත්තේ ය,



Free Distribution www.aathaapi.org

162 කච්චි විජ්ජාය සම්පන්නො (ඉති හෙමවතො යක්ඛො)
කච්චි සංසුද්ධචාරණො,[1]
කච්චිස්ස ආසවා ඛීණා
කච්චි නත්ථි පුනබ්භවො.

163 විජ්ජාය චෙව සම්පන්නො (ඉති සාතාගිරො යක්ඛො)
අථො සංසුද්ධචාරණො,[1]
සබ්බස්ස ආසවා ඛීණා
නත්ථි තස්ස පුනබ්භවො.

164 සම්පන්නං මුනිනො චිත්තං කම්මනා ව්‍යප්පථෙන ච
විජ්ජාචරණසම්පන්නං ධම්මතො නං පසංසසි. *

165 සම්පන්නං මුනිනො චිත්තං කම්මනා ව්‍යප්පථෙන ච,
විජ්ජාචරණසම්පන්නං ධම්මතො අනුමොදසි. *

166 සම්පන්නං මුනිනො චිත්තං කම්මනා ව්‍යප්පථෙන ච,
විජ්ජාචරණසම්පන්නං හන්ද පස්සාම ගොතමං. *

167 එණිජඞ්ඝං කිසං වීරං[2] අප්පාහාරං අලොලුපං,
මුනිං වනස්මිං ඣායන්තං එහි පස්සාම ගොතමං.

168 සීහංවෙකචරං නාගං කාමෙසු අනපෙක්ඛිනං,
උපසංකම්ම පුච්ඡාම මච්චුපාසා පමොචනං.

169 අක්ඛාතාරං පවත්තාරං සබ්බධම්මාන පාරගුං,
බුද්ධං වෙරභයාතීතං මයං පුච්ඡාම ගොතමං.

170 කිස්මිං ලොකො සමුප්පන්නො (ඉති හෙමවතො යක්ඛො)
කිස්මිං කුබ්බති සන්ථවං.
කිස්ස ලොකො උපාදාය
කිස්මිං ලොකො විහඤ්ඤති.

1. සංසුද්ධචාරණො සිමු 2. 2. ධීරං සිමු 2.
* ස්‍යාම පොත්ථකෙ නත්ථි.



Free Distribution www.aathaapi.org

162. හේමවත යක්ෂ මෙසේ අසයි: කිම (ඒ බුදුරජ) (අෂ්ට) විද්‍යායෙන් සමන්වාගත වේද? කිම, සුපිරිසිදු පසළොස් චරණධර්ම ඇත්තේ ද? කිම, ඔබගේ ආස්‍රවයෝ ක්ෂීණ වූහු ද? කිම, පුනර්භවයෙක් නැත්ද?

163. සාතාගිර යක්ෂ මෙසේ කියයි: හේ අෂ්ට විද්‍යායෙන් ද සමන්වාගත වෙයි, යලිදු සුපිරිසිදු වූ පසළොස් චරණධර්ම ඇත්තේය, ඔබගේ සියලු ආස්‍රවයෝ ක්ෂීණ වෙති, උහුට පුනර්භවයෙක් නැත.

164. මුනිහුගේ සිත ශුද්ධ කායකර්මයෙන් ද ශුද්ධවාක් කර්මයෙන් ද සපන් වෙයි. එහෙයින් ම විදුසරණසපත් ඒ ගෞතම බුදුන් තථ්‍යධර්මයෙන් පසස්නෙහි,

165. මුනිහුගේ සිත ශුද්ධ කායකර්මයෙන් හා ශුද්ධ වාක්කර්ම යෙන් හා සපන් වෙයි. විද්‍යාචරණ සම්පන්න වූ ඒ ගෞතම බුදුන් තථ්‍යධර්ම හෙයින් සමාරාධන කරහි.

166. මුනිහුගේ සිත ශුද්ධ කායවාක් කර්මයෙන් සපන් වෙයි: විද්‍යාචරණ සම්පන්න වූ ඒ ගොතම බුදුන් ඒකාන්තයෙන් දකුම්හ.

167. ඉළමුවකුට බඳු කෙංඩා ඇති (මොනවට ලියූ කෙලෙස් ඇති හෙයින්) කෘශ වූ (පස්මරුන් දිනූ හෙයින්) වීර වූ (ඒකාසන භෝජන පරිමිත භෝජන ඇති හෙයින්) අල්පාහාර වූ ආහාරයෙහි ඡන්දරාග නැති හෙයින් අලොල වූ විවෙකයෙහි ඇලුනු බැවින් වෙනෙහි ධ්‍යාන කරණ ගෞතම මුනිහු එව, දකුම්හ,

168. සිංහයකු සේ එකලාව හැසිරෙණ (පුනර්භවයට නොයන හෙයින්) නාග වූ, ද්විවිධකාමයන්හි (ඡන්දරාගය) අපේක්ෂා නැති බුදුන් කරා එළැඹ, (ඝසර වටින් මිදුම) මෘත්‍යුපාශයෙන් මිදීම හෙවත් නිවණ පුළුවුස්මහ.

169. සිවුසස් දහම් දෙසන්නා වූ (එය ම කිච්චඤාණ කතඤාණ විසින්) පවසන්නා වූ, චාතුර්භූමකධර්මයන්ගේ පරතෙර පත් (පස්විද) හැම වෙර බිය ඉක්ම වූ, ගෞතම බුදුන් අපි විචාරම්හ.

170. හේමවත යක්ෂ මෙසේ අසයි: කවරක් උපන් කල්හි (සත්ත්වසංස්කාර) ලෝකය උපන්නේද? කවරෙක්හි ලා (තණ්හා මාන දිඨි) සන්ථව කෙරේ ද? කවරක් ඇසුරු කොට ලොව පවත්නේ ද? කුමක් ඇති කල්හි (කවර කරුණෙකින්) ලෝකය පෙළේ ද?

171 ඡසු ලොකො සමුප්පන්නො (හෙමවතාති භගවා)
ඡසු කුබ්බති සන්ථවං,
ඡන්නමෙව උපාදය
ඡසු ලොකො විහඤ්ඤති.

172 කතමං තං උපාදනං යත්ථ ලොකො විහඤ්ඤති,
නීය්‍යානං පුච්ඡිතො බ්‍රෑහි කථං දුක්ඛා පමුච්චති.

173 පඤ්ච කාමගුණා ලොකෙ මනො ඡට්ඨා පමොදිතා,
එත්ථ ඡන්දං විරාජෙත්වා එවං දුක්ඛා පමුච්චති.

174 එතං ලොකස්ස නිය්‍යානං අක්ඛාතං වො යථා තථං,
එතං වො අහමක්ඛාමි එවං දුක්ඛා පමුච්චති.

175 කො සූධ තරති ඔඝං කො සූධ තරති අණ්ණවං,
අප්පතිට්ඨෙ අනාලම්බෙ කො ගම්භීරෙ න සීදති.

176 සබ්බද සීලසම්පන්නො පඤ්ඤවා සුසමාහිතො,
අජ්ඣත්තචින්තී සතිමා ඔඝං තරති දුත්තරං.[1]

177 විරතො කාමසඤ්ඤාය සබ්බසංයොජනාතිගො,
නන්දී භව පරික්ඛීණො සො ගම්භීරෙ න සීදති.

178 ගම්භීරපඤ්ඤං නිපුණත්ථදස්සිං
අකිඤ්චනං කාමභවෙ අසත්තං,
තං පස්සථ සබ්බධි විප්පමුත්තං
දිබ්බෙ පථෙ කමමානං මහෙසිං.

1. දුත්තරං – සිමු 2.



Free Distribution www.aathaapi.org

171. (බුදුහු හෙමවත යි, අමතා මෙසේ වදාළහ;) ෂඩායතන උපන් කල්හි ලෝකය උපන්නේ වෙයි. ෂඩායතන පවත්නා කල්හි (කෙලශ) සන්ථව කෙරෙයි. ෂඩායතනයන් ම ඇසුරු කොට ලෝකය පවත්නේය, ෂඩායතනයන් ඇති කල්හි ම ලොකය පෙළෙයි.

172. යම් තැනෙක ලෝකය වැනසේ නම්, ඒ උපාදානය (දුඃඛසත්‍යය) කවරේද? (මාර්ග සත්‍ය සඞ්ඛ්‍යාත) නිර්යාණය පුළුවුස්නාලදහු කෙසේ සසර දුකින් මිදේදැයි වදාළ මැනැව.

173. මනායතනය සවන කොට ඇති (පඤ්චායතන සඞ්ඛ්‍යාත) පස්කම් ගුණයෝ (මා විසින්) පවසනලද වෙති. මේ (දෙලොස් ආයතන සඞ්ඛ්‍යාත) දුඃඛසත්‍යයෙහි (තෘෂ්ණා සඞ්ඛ්‍යාත) ඡන්දය දුරලා මෙසේ සසර දුකින් මිදෙයි.

174. මා විසින් තොපට ලෝකයාගේ මේ නිර්යාණය තත්වූ පරිදි පවසන ලද. මෙසේ සසර දුකින් මිදෙයින තෙල කරුණ මම තොපට පවසමී.

175. මෙ ලොවහි කවරෙක් (කාමාදි) චතුරොඝ තරණය කෙරේ ද? කවරෙක් භවසාගර තරණය කෙරේද? ප්‍රතිෂ්ඨාරහිත පිහිටක් නැති අනාලම්බ වූ ගැඹුරු සයුරෙහි කවරෙක් නොගැලේ ද?

176. හැම කල්හි ශීල සම්පන්න වූයේ ලොවීලොවුතුරු නුවණින් ප්‍රඥාවත් වූයේ (සමථ විපස්සනා මාර්ගඵල සමාධියෙන්) මොනොවට සමාහිත වූයේ ආධ්‍යාත්ම චින්තනය සැහැවි කොට ඇති (අප්‍රමාද සඞ්ඛ්‍යාත) ස්මෘති ඇත්තේ තරණය කිරීමට දුෂ්කර වූ චතුරොඝය තරණය කෙරෙයි.

177. කාමසංඥායෙන් (චතුර්ථ මාර්ග සම්ප්‍රයුක්ත සමුච්ඡේද විරතියෙන්) විරත වූ (සිවුමග නුවණින් මැ) සියලු (දශවිධ) සංයෝජනයන් ඉක්ම වූ (තෘෂ්ණා සඞ්ඛ්‍යාත) නන්දිය හා භවයත් ක්ෂය කළ එ ක්ෂීණාශ්‍රව මහණ ගැඹුරු (සසර) සයුරෙහි නො ගැලෙයි.

178. (ස්කන්ධාදියෙහි) ගාම්භීර ප්‍රඥා ඇති, නිපුණ වූ පණ්ඩිතයන් විසින් ගොතන ලද) ප්‍රශ්නයන්ගේ අරුත් දක්නා වූ, රාගාදිකිඤ්චන රහිත (ද්විවිධ) කාමයන්හි හා (ත්‍රිවිධ) භවයෙහි නො ඇලුනු (ස්කන්ධාදි අරමුණුවල ඡන්දරාගය නැති හෙයින්) සියලු තන්හි මිදුනු (අෂ්ටසමාපත්ති සඞ්ඛ්‍යාත) දිව්‍ය මාර්ගයෙහි යන ඒ මහාර්ෂීන් බලව.

179 අනොමනාමං නිපුණත්ථදස්සිං
පඤ්ඤාදදං කාමාලයෙ අසත්තං
තං පස්සථ සබ්බවිදුං සුමෙධං
අරියෙ පථෙ කමමානං මහෙසිං.

180 සුදිට්ඨං වත නො අජ්ජ සුප්පභාතං සුවුට්ඨිතං,[1]
යං අද්දසාම සම්බුද්ධං ඔඝතිණ්ණමනාසවං.

181 ඉමෙ දසසතා යක්ඛා ඉද්ධිමන්තො යසස්සිනො,
සබ්බෙ තං සරණං යන්ති ත්වං නො සත්ථා අනුත්තරො.

182 තෙ මයං විචරිස්සාම ගාමා ගාමං නගා නගං,
නමස්සමානා සම්බුද්ධං ධම්මස්ස ච සුධම්මතන්ති.

හෙමවතසුත්තං නිට්ඨිතං.

## 1–10

## ආළවකසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා ආළවියං විහරති ආළවකස්ස යක්ඛස්ස භවනෙ අථ ඛො ආළවකො යක්ඛො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච: නික්ඛම සමණාති.

සාධාවුසොති භගවා නික්ඛමි,
පවිස සමණාති,
සාධාවුසොති භගවා පාවිසි,

දුතියම්පි ඛො ආලවකො යක්ඛො භගවන්තං එතදවොච. නික්ඛම සමණාති,

සාධාවුසොති භගවා නික්ඛමි,
පවිස සමණාති,
සාධාවුසොති භගවා පාවිසි,

1. සුහුට්ඨිතං - සිමු 2.



Free Distribution www.aathaapi.org

179. අලාමක නාම ඇති, නිපුණාත්ථදක්නා වූ (නුවණ ලබන පිළිවෙත දන්න හෙයින්) ප්‍රඥාදායක වූ කාමාලයෙහි නොඇලුණා වූ (සර්වඥභාවයට මාර්ග වූ පාරමී ප්‍රඥා ඇති හෙයින්) සුමෙධ වූ, සර්වඥ වූ ආර්යාෂ්ටාඞ්ගික මාර්ග හෝ ඵලසමාපත්ති සඞ්ඛ්‍යාත) ආර්යමාර්ගයෙහි යන ඒ මහර්ෂීන් බලව.

180. ඒකාන්තයෙන් අද අපට මනා දර්ශණයෙක් විය. අද අපට සොඳුරු උදෑසෙණක් විය, ශෝභන උත්ථානයෙක් විය. යම් හෙයෙකින් ඕඝ තරණය කළ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ දුටුමෝද, එහෙයිනි.

181. ඍද්ධිමත් වූ යශස්වී වූ දහසක් වූ මේ හැම යක්ෂයෝ ඔබ සරණ කොට යෙති. ඔබ වහන්සේ අපගේ නිරුත්තර ශාස්තෘ වහු.

182. අපි සම්බුදුන් නමදිමින් ධර්මයාගේ ස්වාක්ඛ්‍යාත භාවය ද වණමින් ගමින් ගමට පව්යෙන් පව්යට යම්හයි.

**හේමවත සූත්‍රය නිමි.**

## 1 – 10

## ආළවක සූත්‍රය.

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ අළවුරට ආලවක නම් යක්හුගේ භවනයෙහි වැඩවසන සේක. ඉක්බිති අළවූ යක් භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේය. එළැඹ භාග්‍යවතුන් වහන්සේට තෙල කීය:

"මහණ, නික්ම යා,"යි.

"මැනැවැ ඇවැතැ"යි භාග්‍යවතුන් වහන්සේ නික්මුනු සේක.

"එව මහණැ"යි.

"මැනැවැ, ඇවැතැ"යි භාග්‍යවතුන් වහන්සේ පිවිසි සේක. දෙවන වට ද අළවු යක් භාග්‍යවතුන් වහන්සේට තෙල කීය: "නික්ම යා මහණ" යි.

"මැනැවැ 'ඇවැතැ"යි භාග්‍යවතුන් වහන්සේ නික්ම ගිය සේක. එව "එව මහණැ", යි

"මැනැවැ, ඇවැතැ"යි භාග්‍යවතුන් වහන්සේ පිවිසි සේක.

තතියම්පි ඛො ආළවකො යක්ඛො භගවන්තං එතදවොච: නික්ඛම සමණාති,

සාධාවුසොති භගවා නික්ඛමි,
පවිස සමණාති,
සාධාවුසොති භගවා පාවිසි,

චතුත්ථම්පි ඛො ආළවකො යක්ඛො භගවන්තං එතදවොච: නික්ඛම සමණාති,

නඛ්වාහං තං ආවුසො නික්ඛමිස්සාමි යං තෙ කරණීයං තං කරොහීති,

පඤ්හං තං සමණ පුච්ඡිස්සාමි, සචෙ මෙ න ව්‍යාකරිස්සසි චිත්තං වා තෙ ඛිපිස්සාමි. හදයං වා තෙ ඵාලෙස්සාමි, පාදෙසු වා ගහෙත්වා පාරගඞ්ගාය ඛිපිස්සාමීති,

නඛ්වාහං තං ආවුසො පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය යො මෙ චිත්තං වා ඛිපෙය්‍ය හදයං වා ඵාලෙය්‍ය පාදෙසු වා ගහෙත්වා පාරගඞ්ගාය ඛිපෙය්‍ය, අපි ච ත්වං ආවුසො පුච්ඡ, යදාකඞ්ඛසීති.

අථ ඛො ආළවකො යක්ඛො භගවන්තං ගාථාය අජ්ඣභාසි:

183 කිං සූධ විත්තං පුරිසස්ස සෙට්ඨං
කිං සු සුචිණ්ණං[1] සුඛමාවහාති,
කිංසු හවෙ සාදුතරං[2] රසානං
කථං ජීවිං ජීවිතමාහු සෙට්ඨං.

184 සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං
ධම්මො සුචිණ්ණො සුඛමාවහාති
සච්චං හවෙ සාදුතරං රසානං
පඤ්ඤාජීවිං ජීවිතමාහු[3] සෙට්ඨං

185 කථං සු තරති ඔඝං කථං සු තරති අණ්ණවං,
කථං සු දුක්ඛං අච්චෙති කථං සු පරිසුජ්ඣති.

1. සුචිණ්ණො සීමු 2,
2. සාධුතරං - සු. ස්‍යා.
3. ජීවිතමාහු - සු.



Free Distribution www.aathaapi.org

තෙවනවට ද අළවු යක් භාග්‍යවතුන් වහන්සේට තෙල කීය: ''නික්ම යා මහණ'' යි.

''මැනවැ ඇවැතැ යි භාග්‍යවතුන් වහන්සේ නික්ම වැඩි සේක. ''එව මහණ'' යි.

''මැනැවැ ඇවැත'' යි භාග්‍යවතුන් වහන්සේ පිළිවිසි සේක,

සතරවන වට ද අළවු යක් භාග්‍යවතුන් වහන්සේට තෙල කීය: ''නික්ම යා මහණ''යි.

''එ කරුණින් ම ඇවැත, මම් නොයම්, තා විසින් යමක් කට හැකි නම්, එය කරව''යි.

''මහණ, තා පැන පුළුවුස්මි. ඉදින් තෝ එය මට නො විසඳනෙහි නම්, තාගේ සිත හෝ පෙරලන්නෙමි, තාගේ හදවත හෝ පළන්නෙමි, දෙපය අල්වා ගෙණ ගඟිනෙතර හෝ දමාපියමි''යි.

ඇවැත යමෙක් මාගේ සිත හෝ පෙරලා නම් හදවත හෝ පළානම් දෙපය හෝ අල්වා ගෙණ ගඟිනෙතර දමාඟසා නම් එබන්දකු දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙහි හෝ මහණ බමුණන් සහිත දෙවිමිනිසුන් සහිත ප්‍රජාවෙහි, නො මැ දක්මි. එහෙත් ඇවැත, යමක් කැමැත්තෙහි නම් විචාර''යි.

එකල් හි අළවු යක් භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කීය:

183 මෙලොවහි පුරුෂ හට කවර ධනයෙක් ශ්‍රෙෂ්ඨ වේ ද? මොනොවට පුරුදු කරණ ලද කවරෙක් සුව එළවා ද? කවරෙක් රසයන් අතුරෙන් ඉතා මියුරු වේ ද? කිසෙයින් දිවිවටනහුගේ ජීවිතය ශ්‍රෙෂ්ඨයයි කීහුද?''යි.

184 මෙලො වැ ශ්‍රද්ධාව පුරුෂ හට ශ්‍රෙෂ්ඨ ධනය වේ, (දන, සීල, භාවනා) ධර්මය මොනොවට පුරුදු කරණ ලදුයේ සුව එළවයි, රසයන් අතුරෙන් සත්‍යය ඒකාන්තයෙන් මියුරු වෙයි. ප්‍රඥාවෙන් දිවිවටනු වහුගේ ජීවිතය ශ්‍රෙෂ්ඨ යයි කීහු,

185 කිසෙයින් ඔඝ තරණය කෙරේ ද? කිසෙයින් සසර සයුරු තරණය කෙරේ ද? කිසෙයින් වෘත්තදුඃඛය ඉක්මයේ ද? කිසෙයින් පිරිසිදු වේ ද? යි.

186 සද්ධාය තරති ඔඝං අප්පමාදෙන අණ්ණවං,
විරියෙන දුක්ඛමච්චෙති[1] පඤ්ඤාය පරිසුජ්ඣති.

187 කථං සු ලභතෙ පඤ්ඤං කථං සු වින්දතෙ ධනං,
කථං සු කිත්තිං පප්පොති කථං මිත්තානි ගන්ථති.
අස්මා ලොකා පරං ලොකං කථං පෙච්ච න සොචති.

188 සද්දහානො අරහතං ධම්මං නිබ්බානපත්තියා,
සුස්සූසා ලභතෙ පඤ්ඤං අප්පමත්තො විචක්ඛණො.

189 පතිරූපකාරී ධුරවා උට්ඨාතා වින්දතෙ ධනං,
සච්චෙන කිත්තිං පප්පොති දදං මිත්තානි ගන්ථති.

190 යස්සෙතෙ චතුරො ධම්මා සද්ධස්ස ඝරමෙසිනො,
සච්චං ධම්මො ධිති චාගො ස වෙ පෙච්ච න සොචති.

191 ඉඞ්ඝ අඤ්ඤෙපි පුච්ඡස්සු පුථූ සමණබ්‍රාහ්මණෙ,
යදි සච්චා දමා චාගා ඛන්ත්‍යා භිය්‍යොධ විජ්ජති.

192 කථං නු දානි පුච්ඡෙය්‍යං පුථූ සමණබ්‍රාහ්මණෙ,
යොහං අජ්ජ පජානාමි යො අත්ථො සම්පරායිකො.

193 අත්ථාය වත මෙ බුද්ධො වාසායා' ළවිමාගමී,
සොහං අජ්ජ පජානාමි යත්ථ දින්නං මහප්ඵලං.

194 සො අහං විචරිස්සාමි ගාමා ගාමං පුරාපුරං,
නමස්සමානො සම්බුද්ධං ධම්මස්ස ච සුධම්මතං.

1. දුක්ඛං අච්චෙ ති - සීමු 2.



Free Distribution www.aathaapi.org

186. ශ්‍රද්ධායෙන් දෘෂ්ටිසඞ්ඛ්‍යාත ඕඝ තරණය කෙරෙයි. අප්‍රමාදයෙන් භවාර්ණව තරණය කෙරෙයි. අනාගාමි මාර්ගවධ්‍ය වූ කාමදුඃඛය වීර්යයෙන් තරණය කෙරෙයි. අර්හත්මාර්ගප්‍රඥාවෙන් පිරිසිදු වෙයි.

187. කිසෙයින් ප්‍රඥා ලබා ද? කිසෙයින් ධනය ලබා ද? කිසෙයින් කීර්තියට පැමිණේ ද? කිසෙයින් මිතුරන් සපයා ද? මෙලොවින් පරලොව ගොස් කිසෙයින් ශෝක නො කෙරේ ද?''යි

188. නිවනට පැමිණීම පිණිස (බුද්ධාදී) රහතුන්ගේ ධර්මය හදහනුයේ (දහම්) අසනු කැමැත්තේ අප්‍රමත්ත වැ විචක්ෂණ වූයේ ලෞකික ලොකොත්තර ප්‍රඥා ලබා,

189. ලෞකික ලෝකෝත්තර ධනයට ප්‍රතිරූප වැ ක්‍රියා කරණ සුලු වූයේ රැකුළු වැර ඇතියේ නොලිහිල් පැරකුම් ඇත්තේ ලොවිලොවුතුරු ධනය ලබා. වාක්සත්‍යයෙන් කීර්තියට පැමිණේ. කැමැති දැ දෙන්නේ මිතුරන් සපයා.

190. ගිහිගෙහි වසන යම් සැදැහැතියකුනට වාක්සත්‍යය හා ප්‍රඥාව හා වීර්යය හා ත්‍යාගය හා මේ සිව් දහම්හු ඇත් ද, හේ ඒකාන්තයෙන් පරලොව ගොස් ශෝක නො කෙරේ. මෙලොවින් පර ලොව ගිය හේ ඒකාන්තයෙන් ශෝක නොකෙරේ.

191. ඉදින් වාක්සත්‍යයෙන් වැඩි තරම් වූ ප්‍රඥා සඞ්ඛ්‍යාත දමයෙන් වැඩි තරම් වූ ත්‍යාගයෙන් වැඩිතරම් වූ වීර්යසඞ්ඛ්‍යාත ක්ෂාන්තියෙන් වැඩිතරම් වූ අනෙක් දහමෙක් මෙ ලෝකයෙහි ඇත් නම්, වැලිත් අන්‍ය වූ නොයෙක් මහණ බමුණන් විචාරවයි.

192. මෙලොවැ නුවණ ලැබීම් ඈ යම් කරුණෙක් වේ නම්, එ ද පරලොව පිළිබඳ යම් අර්ථයෙක් වේ නම්, එ ද, අද මම දැනගතිමි. එබදු මම දැන් කිසෙයින් නම් අන් බොහෝ මහණ බමුණන් විචාරම් ද?

193. ඒකාන්තයෙන් බුදුහු මට වැඩ සඳහා වාසය පිණිස අළවු පුරට වැඩියහ. (එහෙයින්) යම් පින් කෙතෙක්හි දෙන ලද් ද මහත් ඵල වේ නම්, මම ඒ පින් කෙත දැනගතිමි.

194. මම බුදුන් නමදිමින් ධර්මයාගේ සුධර්මත්වය ද කියමින් ගමින් ගම නුවරින් නුවර හැසිරෙමි යයි.



Free Distribution www.aathaapi.org

එවං වුත්තෙ ආළවකො යක්ඛො භගවන්තං එතදවොච. අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම, සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති, එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො, එසාහං භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි, ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

ආළවකසුත්තං නිට්ඨිතං.

## 1 – 11

## විජයසුත්තං

195 චරං වා යදි වා තිට්ඨං නිසින්නො උද වා සයං,
සම්මිඤ්ජෙති පසාරෙති එසා කායස්ස ඉඤ්ජනා.

196 අට්ඨි නහාරු සංයුත්තො තචමංසාවලෙපනො,
ඡවියා කායො පටිච්ඡන්නො යථාභූතං න දිස්සති.

197 අන්තපූරොදරපූරො යකපෙළස්ස වත්ථිනො,
හදයස්ස පප්ඵාසස්ස වක්කස්ස පිහකස්ස ච.

198 සිඞ්ඝාණිකාය ඛෙළස්ස සෙදස්ස මෙදස්ස ච,
ලොහිතස්ස ලසිකාය පිත්තස්ස ච වසාය ච.

199 අථස්ස නවහි සොතෙහි අසුචී සවති සබ්බදා,
අක්ඛිම්හා අක්ඛිගූථකො කණ්ණම්හා කණ්ණගූථකො.

200 සිඞ්ඝාණිකා ච නාසාතො මුඛෙන වමතෙ' කදා,
පිත්තං සෙම්හඤ්ච වමති කායම්හා සෙදජල්ලිකා.

201 අථස්ස සුසිරං සීසං මත්ථලුඞ්ගස්ස පූරිතං,
සුභතො නං මඤ්ඤති බාලො අවිජ්ජාය පුරක්ඛතො.



Free Distribution www.aathaapi.org

මෙසේ වදාළ කල්හි අළවු යක් භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනවි, භවත් ගෞතමයන් වහන්ස ඉතා මැනැවි, යම් සේ භවත් ගෞතමයන් වහන්ස, යටිහුරු කරණ ලද්දක් උඩුහුරු කෙරෙන්නේ වේද, පිළිසන්වූවක් විවෘත කරන්නේ හෝ වේ ද, මුළාවූවකුට මඟ පවසන්නේ හෝ වේ ද, 'ඇස් ඇත්තාහු රූ දක්නාහ'යි අඳුරෙහි තෙල් පහනක් දල්වන්නේ හෝ වේ ද, එසෙයින් මැ භවත් ගෞතමයන් වහන්සේ විසින් ධර්මය පවසන ලද, තෙල මම භවත් ගෞතමයන් වහන්සේ සරණ කොට යමි, ධර්මය ද භික්ෂු සඞ්ඝයා ද සරණ කොට යමි. භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවිහිම් ව සරණගත උපාසකයකු කොට ධරණ සේක්ව යි.

ආළවක සූත්‍රය නිමි.

## 1 - 11

## විජය සූත්‍රය

195. යන්නේ හෝ ඉදින් සිටින්නේ හෝ හුන්නේ හෝ නොහොත් හොවන්නේ වේ ද, (අත්-පා) හකුළුවනු ද විදහනුද වේ. තෙල ශරීරයාගේ චලනය යි.

196. ඇටින් හා නහරින් හා බැඳුනු, සමින් හා මසින් හා අවලිප්ත වූ සිවියෙන් පිළිසන් වූ සිරුර තත් වූ පරිදි නො පැණේ.

197. (මේ සිරුර) අතුනුයෙන් පිරුණේ නොපැසුනු අහරින් පිරුණේ අක්මායෙන් ද වටනින් ද හදවතින් ද පපුකැණින් ද වකුගඩුයෙන් ද බඩදිවෙන් ද -

198. මුකුනුයෙන් ද කෙළෙන් ද ඩහදියෙන් ද මෙදසින් ද ලෙහෙයින් ද සඳමිදුලෙන් ද පිතින් ද වුරුණු තෙලෙන් ද පිරුණේ වෙයි.

199. යළිදු මේ ශරීරයාගේ නවදෙරින් හැමකල්හි මල වැහෙයි, ඇසින් කබ ද කණින් කාරලු ද වැහෙයි.

200. නැහැයෙන් සොටු ද කලෙක මුවින් පිත ද සෙම ද වමයි, කයින් හෝදිය හා දැලි ද වැගිරෙයි.

201. වැලිදු මේ ශරීරයාගේ සිදුරු සහිත හිස හිස්මුලින් පිරුණේ වෙයි. අවිද්‍යායෙන් පෙරටුකරණ ලද බාල එය ශුභ විසින් හඟනේය.

202 යදච සො මතො සෙති උද්ධුමාතො විනීලකො,
අපවිද්ධො සුසානස්මිං අනපෙක්ඛා හොන්ති ඤාතයො.

203 ඛාදන්ති නං සුවාණා ච සිගාලා ච වකා කිමී,
කාකා ගිජ්ඣා ච ඛාදන්ති යෙ චඤ්ඤෙ සන්ති පාණිනො.

204 සුත්වාන බුද්ධවචනං භික්ඛු පඤ්ඤාණවා ඉධ,
සො ඛො නං පරිජානාති යථාභූතං හි පස්සති.

205 යථා ඉදං තථා එතං යථා එතං තථා ඉදං,
අජ්ඣත්තඤ්ච බහිද්ධා ච කායෙ ඡන්දං විරාජයෙ.

206 ඡන්දරාගවිරත්තො සො භික්ඛු පඤ්ඤාණවා ඉධ,
අජ්ඣගා අමතං සන්තිං නිබ්බාන[1]පදමච්චුතං.

207 දිපාදකො යං අසුචි දුග්ගන්ධො පරිහීරති,[2]
නානා කුණපපරිපූරො විස්සවන්තො තතො තතො.

208 එතාදිසෙන කායෙන යො මඤ්ඤෙ උණ්ණමෙතවෙ,
පරං වා අවජානෙය්‍ය කිමඤ්ඤත්‍ර අදස්සනාති.

විජයසුත්තං නිට්ඨිතං

## 1–12

## මුනි සුත්තං

209 සන්ථවාතො භයං ජාතං නිකෙතා ජායතෙ රජො,
අනිකෙතමසන්ථවං එතං වෙ මුනිදස්සනං.

210 යො ජාතමුච්ඡිජ්ජ න රොපයෙය්‍ය
ජායන්තමස්ස නානුප්පවෙච්ඡෙ,
තමාහු එකං මුනිනං චරන්තං
අද්දක්ඛි සො සන්තිපදං මහෙසි.

1. නිබ්බානං–ම.
2. පරිජාරති–ම.



Free Distribution www.aathaapi.org

202. යම් විටෙක ඒ කය ආයු උෂ්මා විඥානාපගමයෙන් මළේ ඉදිමුනේ නිල් වූයේ හෝනේ වේද, එකල්හි අමු සොහොන්හි හැරදමන ලදුයේ ඥතීහු අපේක්ෂා රහිත වූවාහු වෙති.

203. ශුනකයෝ ද සිවල්ලු ද වෘකයෝ ද, පණුවෝ ද කවුඩෝ ද ගිජුලිහිණිහු ද කති. වෙනත් ප්‍රාණිහු ද වෙත් නම් ඔහු දු එය කති.

204. මෙසස්නෙහි විදසුන් නුවණින් යුත් මහණ බුදු වදන් අසා එය පිරිසිඳ දනගනී. තත් වූ පරිදි අනිත්‍යාදී විසින් දක්නා හෙයිනි.

205. මේ සවිඥානක අශුභය යම් සේ ද තෙල අවිඥානක අශුභය ද එබඳු වෙයි. තෙල අවිඥානක අශුභය යම් බඳු ද, මෙ සවිඥානක අශුභය ද එබඳු වෙයයි. (එහෙයින්) ආධ්‍යාත්මික වූ ද බාහ්‍ය වූ ද සිරුරෙහි ඡන්දරාගය දුරලන්නේ ය.

206. මෙ සස්නෙහි රහත්මග නුවණින් යුත් එ මහණ ඡන්දරාගයෙන් වෙන් වූයේ අමෘත නම් වූ ශාන්තිය වූ ච්‍යුති රහිත වූ, නිර්වාණයට ද පැමිණියේ ය.

207. අපවිත්‍ර වූ දුගඳ වහනය කරණ නොයෙක් කුණපයෙන් පිරුණු ඒ ඒ දෙරින් මලවහන දෙපායුත් මේ කය (සුවඳ කැවීම් ආදියෙන්) පරිහරණය කරණු ලබයි.

208. යමෙක් මෙබඳු වූ සිරුරින් යුක්තව තෘෂ්ණාදි විසින් තමා හුවා දක්වන්නට සිතා ද, මෙරමා හට හෝ අවමන් කරන්නේ ද මෙහිලා ආයර්‍යමාර්ගයෙන් සත්‍යය නො දැක්ම විනා අන් කවරෙක් ද?

**විජය සූත්‍රය නිමි.**

## 1 – 12
## මුනි සූත්‍රය

209. (තෘෂ්ණා - දෘෂ්ටි - මිත්‍ර සඞ්ඛ්‍යාත ත්‍රිවිධ) සන්‍ථවයෙන් (කෙලෙස්) බිය උපන. (රූපාදි අරමුණු නමැති) නිකෙතයෙන් (ගෙයින්) රාගාදි කෙලෙස් රජස් උපන. නිකෙත නැති, සන්‍ථවයෙන් තොර වූ තෙල නිර්වාණය ඒකාන්තයෙන් (බුඩ) මුනිහුගේ දර්ශනය වෙයි.

210. යමෙක් උපන් කෙලෙස් නසා මතු උපදනා කෙලෙස් නූපදවා ද, (අනාගතයෙහි උපදනා) ඒ ක්ලෙශයට යලි ප්‍රවෙශ නො දෙන්නේ ද, (ලොකාර්‍ථවයර්‍යාවෙහි) හැසිරෙන ඔහු ශ්‍රෙෂ්ඨමුනිවරයෙකැයි (බුදුවරු) කීහු. ඒ මහර්ෂි අත්‍යන්ත ශාන්ති පදය (පසක් විසින්) දුටුයේ ය.

211 සඞ්ඛාය වත්ථූනි පහාය බීජං
සිනෙහ මස්ස නානුප්පවෙච්ඡෙ,
ස වෙ මුනි ජාතිඛයන්තදස්සී
තක්කං පහාය න උපෙති සඞ්ඛං.

212 අඤ්ඤාය සබ්බානි නිවෙසනානි
අනිකාමයං අඤ්ඤතරම්පි තෙසං,
ස වෙ මුනි වීතගෙධො අගිද්ධො
නායූහතී පාරගතො හි හොති.

213 සබ්බාභිභුං සබ්බවිදුං සුමෙධං
සබ්බෙසු ධම්මෙසු අනූපලිත්තං,
සබ්බඤ්ජහං තණ්හක්ඛයෙ විමුත්තං
තං වාපි ධීරා මුනිං[3] වෙදයන්ති.

214 පඤ්ඤාබලං සීලවතූපපන්නං
සමාහිතං ඣානරතං සතීමං,
සඞ්ගාපමුත්තං අඛිලං අනාසවං
තං වාපි ධීරා මුනිං[3] වෙදයන්ති.

215 එකං චරන්තං මුනිං අප්පමත්තං
නින්දාපසංසාසු අවෙධමානං,
සීහංව සද්දෙසු අසන්තසන්තං
වාතංව ජාලම්හි අසජ්ජමානං,
පදුමං ව තොයෙන අලිප්පමානං
නෙතාරමඤ්ඤෙසමනඤ්ඤනෙය්‍යං
තං වාපි ධීරා මුනිං[3] වෙදයන්ති.

216 යො ගාහණෙ ථම්භොරිවාභිජායති
යස්මිං පරෙ වාචාපරියන්තං වදන්ති,
තං වීතරාගං සුසමාහිතින්ද්‍රියං
තං වාපි ධීරා මුනිං වෙදයන්ති.

1. මුනි-මජස.
2. මවෙඛාය-සී. යා



Free Distribution www.aathaapi.org

211. (ස්කන්ධායතනාදි) ක්ලේශවස්තූන් පිරිසිඳ දැන (අභිසංස්කාර විඥාන සංඛ්‍යාත) වස්තුබීජය සමුච්ඡේද වීයින් නසා එයට නැවත තෘෂ්ණා දෘෂ්ටි නමැති සෙනහය (දිය) නොවැද්දදේද, ජාතිමරණයන්ගේ අන්තය වන නිවන දක්නා සුළු ඒ මුනි ඒකාන්තයෙන් නවවිධ අකුශල විතර්කය ප්‍රහීණ කොට (දෙවියෙමි, මිනිසෙකිමි යන ආදි) සංඛ්‍යාවට නො පැමිණෙයි.

212. (කාමභවාදි) හැම නිවෙසනයන් (අනිත්‍යාදිවශයෙන්) දැන, ඔවුනතුරෙහි එකකුදු නො පතනුයේ ඒ බුඩමුනි පහකළ තෘෂ්ණා ඇතියේ (එහෙයින්ම) ගිජු නො වූයේ ඒකාන්තයෙන් කුශලාකුශල කර්ම රැස් නො කෙරෙයි. යම් හෙයෙකින් නිවන් පරතෙරට ගේ ගියේ ද එහෙයිනි.

213. (ඡන්දරාගප්‍රහාණයෙන් ස්කන්ධ ධාතු ආයතන සංඛ්‍යාත) සියලු ධර්මයන් මැඩ ලූ, සර්වාකාරයෙන් ඒ සියලු ධර්මයන් දන්නා වූ, (සර්වධර්මයන් දෙසීමෙහි සමත් වූ මහා ප්‍රඥ ඇති හෙයින්) සුමෙධ වූ සර්වධර්මයන්හි (ඡන්දරාගා භාවයෙන්) නො ඇලුනු සර්වධර්මයන්හි ඡන්දරාගය හළ, තෘෂ්ණා-ක්ෂය සංඛ්‍යාත නිර්වාණයෙහි විමුක්ත වූ ඒ බුදුහු මුනි යයි බුඩාදි පණ්ඩිතයෝ දනිති.

214. (ක්ලෙශප්‍රහාණය කරණ) ප්‍රඥබලය ඇති, චතුපාරිශුද්ධි ශීලයෙන් හා තෙළෙස් දුහඟින් යුත්, මාගීඑල ඊයඝීපථසමාධියෙන් සමාහිත වූ, (උපචාර – අර්පණා) ධ්‍යානයන්හි ඇලුනු, සමෘතිමත් වූ, රාගාදි සඞගයෙන් මිදුනු, (පඤ්චචෙතොඛිල සඞඛ්‍යාත) කෙලෙස් හුල් නැති, ඔහු මුනියයි පණ්ඩිතයෝ දනිත්.

215. (ප්‍රව්‍රජ්‍යා සඞඛ්‍යාතාදියෙන්) එකලාව හැසිරෙන මොනෙය්‍ය-ධර්මයෙන් යුක්ත වූ, (හැමතන්හි) නොපමා වූ, නින්ද, ප්‍රශංසායෙහි (ප්‍රතිසානුනය දෙකින්) නො සැලෙනු වූ, සිංහයකු සෙයින් (අටලෝදහම්හි) තැති නො ගන්නා වූ, දලෙහි සුළං සෙයින් (තෘෂ්ණා – දෘෂ්ටි ජාලයෙහි) නො ලැගෙන දියෙන් නොතැවරෙන පියුමක් සෙයින් ලෝකය හා තෘෂ්ණා දෘෂ්ටි ලේපයෙන් නොනැවරෙන, මෙරමා නිවනට පමුණුවන, අනිකකු විසින් (නිවන්මගට) නො පැමිණැවිය හැකි, ඒ බුදුහු මුනි යයි පණ්ඩිතයෝ දනිත්.

216. යමෙක් යම් වස්තුවක් කෙරෙහි අන්‍ය තීර්ථකයෝ (ගුණාගුණ වශයෙන්) නින්ද ප්‍රශංසා වචන කියත් ද, එබන්දෙහි නානතොටෙහිලු වැඹක් මෙන් ස්ථිර වේ ද, (ඉටු අරමුණෙහි) පහ වූ රාග ඇති, (වෙෂ මොහ අභාවයෙන්) සමාහිත වූ ඉඳුරන් ඇති, ඒ බුදුහු මුනි යයි පණ්ඩිතයෝ දනිත්.



Free Distribution www.aathaapi.org

217 යො වෙ ඨිතත්තො තසරංව උජ්ජුං
ජිගුච්ඡති කම්මෙහි පාපකෙහි,
වීමංසමානො විසමං සමඤ්ච
තං වා පි ධීරා මුනිං වෙදයන්ති.

218 යො සඤ්ඤතත්තො න කරොති පාපං
දහරො ච මජ්ඣිමො ච[1] මුනී යතත්තො,
අරොසනෙය්‍යො සො න රොසෙති කඤ්චි
තං වාපි ධීරා මුනිං වෙදයන්ති.

219 යදග්ගතො මජ්ඣතො සෙසතො වා
පිණ්ඩං ලභෙථ පරදත්තූපජීවි,
නාලං ථුතුං නොපි නිපච්චවාදී
තං වාපි ධීරා මුනිං වෙදයන්ති:

220 මුනිං චරන්තං විරතං මෙථුනස්මා
යො යොබ්බනෙ න උපනිබජ්ඣතෙ ක්වචි,
මදප්පමාද විරතං විප්පමුත්තං
තං වාපි ධීරා මුනිං වෙදයන්ති.

221 අඤ්ඤාය ලොකං පරමත්ථදස්සිං
ඔඝං සමුද්දං අතිතරිය තාදිං,
තං ඡින්නගන්ථං අසිතං අනාසවං
තං වාපි ධීරා මුනිං වෙදයන්ති.

222 අසමා උභො දූරවිහාරවුත්තිනො
ගිහී දාරපොසී අමමො ච සුබ්බතො,
පරපාණරොධාය ගිහී අසඤ්ඤතො
නිච්චං මුනී රක්ඛති පාණිනො යතො.

223 සිඛී යථා නීලගීවො විහඞ්ගමො
හංසස්ස නොපෙති ජවං කුදාචනං,
එවං ගිහී නානුකරොති භික්ඛුනො
මුනිනො විවිත්තස්ස වනම්හි ඣායතොති.

මුනිසුත්තං නිට්ඨිතං

## උරගවග්ගො පඨමො

තස්සුද්දානං:

උරගො ධනියො චෙව විසාණඤ්ච තථා කසි,
චුන්දො පරාභවො චෙව වසලො මෙත්තභාවනා.
සාතාගිරො ආළවකො විජයො ච තථා මුනි,
ද්වාදසෙතානි සුත්තානි උරගවග්ගොති වුච්චති,

1. මජ්ඣිමො ච - සී-ස්‍යා



Free Distribution www.aathaapi.org

217. යමෙක් ඒකාන්තයෙන් (භවාන්තරොපගමන නැති හෙයින්) ස්ථිත වූ සිත් ඇත්තේ, හුවෙලුවක් (පිළී වියන තරස් දණ්ඩක්) සෙයින් ඍජු වූයේ පවිකම් පිළිකුල් කෙරේ ද. සම විසම දෙක මාර්ග ප්‍රඥයෙන් විමසා බලන්නේත් වේ ද, ඒ බුදුහු මුනි යයි පණ්ඩිතයෝ දනිති.

218. යමෙක් (සීල සංයමයෙන්) සංයත වූයේ තරුණ වූයේ හෝ මැදුම් වියෙහි වූයේ හෝ දමුනු සිත් ඇත්තේ මොනෙය්‍ය ධර්මයෙන් සමන්විත වූයේ, නො පෙළියයුතු වූයේ කිසිවකු නො ගටා ද, ඔහු මුනි යයි පණ්ඩිතයෝ පවසත්.

219. මෙරමා විසින් දුන් දිවිවටනා සැළි මුවින් හෝ මැදින් හෝ සෙසු තැනින් ගත් පිඩු ලබා ද, හේ (තමා හෝ දයකයා) පැසසීමට නො නිසිවේ ද, දයකයා පහත් කොට බණන්නේ හෝ නො වේද, ඔහු මුනි යයි පණ්ඩිතයෝ පවසත්.

220. යමෙක් යොවුන් වියෙහි (ස්ත්‍රී රූපාදි) කිසි අරමුණක (කෙලෙස් විසින්) නො බැඳේ ද, මුනි වූ ඒකවිහාරී ව හැසිරෙන, මෙවුන් දමින් දුරු වූ මදයෙන් හා ප්‍රමාදයෙන් විරත වූ, සියලු කෙලෙස් බැඳුමෙන් මිදුනු ඔහු මුනි යයි පණ්ඩිතයෝ පවසත්.

221. (ස්කන්ධාදී) ලෝකය (දුකැයි) දැන, (නිරොධසත්‍යය සාක්ෂාත් කිරීමෙන්) පරමාර්ථය දක්නා සුලු (සමුදය ප්‍රහාණයෙන්) වතුරොඝය ද (වක්ෂුරාදි ආයතන) සමුද්‍රය ද (මාර්ගභාවනාවෙන්) තරණය කොට තාදි වූ, සිඳින ලද වතුර්ග්‍රන්ථ ඇති තෘෂ්ණා – දෘෂ්ටි විසින් ඇසුරු නො කරණලද, ඔහු මුනි යයි පණ්ඩිතයෝ පවසත්.

222. (ගිහි – පැවිදි) දෙදෙන නො සම වූවාහු උනුන්ගෙන් දුර වූ වාහු හෝ දිවි වැටුම් ඇති වෙති. ගෘහී තෙමේ අඹුදරුවන් පුස්නේ වෙයි. පවිත්‍ර ව්‍රත ඇති පැවිදි (අඹුදරුවන් කෙරෙහි) මමත්ව නැති වෙයි. ගිහි පරපණ නැසීමෙන් අසංයත වෙයි. මුනි සංයත වූයේ ප්‍රාණීන් රක්නේය.

223. අහස්හි සරණා නිල් ගෙල ඇති මොණර කිසිකලෙකත් හංසයාගේ ජවයට යමසේ නො පැමිණේ ද, එසෙයින් ගෘහී වෙනෙහි ධ්‍යාන කරණසුලු කාය – චිත්ත විවෙක ඇති, මුනි වූ මහණහු අනුකරණ නො කෙරේයි.

මුනි සූත්‍රය නිමි.

පළමු වැනි උරගවර්ගය.

**එහි උද්දනය:**

උරග සූත්‍රය ද, ධනිය සූත්‍රය ද, ඛග්ගවිසාණ සූත්‍රය ද, එසේ ම කසීභාරද්වාජ සූත්‍රය ද, චුන්ද සූත්‍රය ද, පරාභව සූත්‍රය ද, වසල සූත්‍රය ද, (කරණීය) මෙත්ත සූත්‍රය ද, සාතාගිරි සූත්‍රය ද, ආළවක සූත්‍රය ද, විජය සූත්‍රය ද, එසේ ම මුනි සූත්‍රය ද යන මේ දෙළොස් සුතුරු උරගවගැයි කි යනු ලැබෙ.

# 2. චූළවග්ගො

## 2–1

### රතනසුත්තං

224 යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ,
සබ්බෙව භූතා සුමනා භවන්තු
අථොපි සක්කච්ච සුණන්තු භාසිතං.

225 තස්මා හි භූතා නිසාමෙථ සබ්බෙ
මෙත්තං කරොථ මානුසියා පජාය,
දිවා ච රත්තො ච හරන්ති යෙ බලිං
තස්මා හි නෙ රක්ඛථ අප්පමත්තා.

226 යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා
සග්ගෙසු වා යං රතනං පණීතං,
න නො සමං අත්ථි තථාගතෙන
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

227 ඛයං විරාගං අමතං පණීතං
යදජ්ඣගා සක්‍යමුනී සමාහිතො,
න තෙන ධම්මෙන සමත්ථි කිඤ්චි
ඉදම්පි ධම්මෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

228 යං බුද්ධසෙට්ඨො පරිවණ්ණයී සුචිං
සමාධිමානන්තරිකඤ්ඤමාහු,
සමාධිනා තෙන සමො න විජ්ජති
ඉදම්පි ධම්මෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

229 යෙ පුග්ගලා අට්ඨසතං පසත්ථා
චත්තාරි එතානි යුගානි හොන්ති,
තෙ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා
එතෙසු දින්නානි මහප්ඵලානි,
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.



Free Distribution www.aathaapi.org

# 2. චූල වග්ගය

## 2 - 1

### රතන සූත්‍රය

224. මෙහි රැස්වූ යම් භූම්‍යස්ථ අමනුෂ්‍ය කෙනෙක් හෝ වෙත් ද- යම් අන්තරීක්ෂයෙහි වැසි අමනුෂ්‍ය කෙනෙක් හෝ වෙත් ද, ඒ හැම භූතයෝ සොම්නස් වෙත්වා! තවද මාගේ භාෂිතය සකසා අසත් වා.

225 එසෙයින් ම හැම අමනුෂ්‍යයෝ අසත්වා! මනුෂ්‍ය ප්‍රජාවට මෛත්‍රී කරව. යම් මනුෂ්‍ය කෙනෙක් දවා රෑ දෙක්හි පුද එළවත් ද, එහෙයින් ම අප්‍රමත්ත වූවාහු ඔවුන් රකුව.

226 මෙ මිනිස් ලොවැ හෝ නාග සුපර්ණාදි අන් ලොවෙකැ හෝ යම් ධනයෙකුත් වේද, ස්වර්ගයෙහි හෝ යම් ප්‍රණීත වූ රත්නයෙකුත් වේද, ඔවුනතර තථාගතයන් හා සම එක ද රුවනෙක් නැත, මෙ ද බුදුරදුන් කෙරෙහි වූ ශ්‍රෙෂ්ඨ රත්න භාවයයි. ඒ සත්‍යයෙන් සත්නට සෙත් වේවා!

227 (ආයර්‍ෂමාර්ග සමාධියෙන්) සමාහිත වූ ශාක්‍යමුනි රාගාදී කෙලෙසුන්ගෙන් දුරු වූ හෙයින් විරාග නම් වූ ක්ලේශ ක්ෂය වූ අමෘත වූ ප්‍රණීත වූ යම් නිවනක් අවබොධ කෙළේ ද, ඒ නිර්වාණ ධර්මය හා සමවූ අන් කිසිදු රුවනෙක් නැත, මෙද ධර්මයෙහි ශ්‍රෙෂ්ඨ රත්න භාව යයි, ඒ සත්‍යයෙන් (සත්නට) සෙත් වේවා !

228 බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ (කෙළෙස් මල මුලුසුන් කරන හෙයින්) අත්‍යන්තයෙන් ව්‍යවදාන වූ යම් මාර්ගධර්මයක් වර්ණනා කළ සේක්ද, යම් ඵල සමාධියක්(මාර්ගයට අනතුරුව ම පල දෙන බැවින්) ආනන්තරිකය'යි වදළ සේක් ද, ඒ සමාධිය හා සම වූ අනෙක් රුවනෙක් නැත. මෙ ද ධර්මයෙහි ශ්‍රෙෂ්ඨ වූ රත්න භාව යි. ඒ සත්‍යයෙන් සත්නට සෙත් වේවා!

229 බුද්ධාදි සත්පුරුෂයන් විසින් පසස්නා ලද යම් අට අර් පුගුල් කෙනෙක් වෙත් ද, තෙල පුරුෂ යුගලයෝ සතර දෙනෙක් වෙති. බුධ ශ්‍රාවක වූ ඔහු දක්ෂිණාර්හ වෙති. තුලුන් කෙරෙහි දන්හු මහත් ඵල වෙති. මෙ ද සඞ්ඝයා කෙරෙහි ශ්‍රෙෂ්ඨ රත්න භාවය වේ. තෙල සත්‍යයෙන් සත්නට සෙත් වේවා.



Free Distribution www.aathaapi.org

230 යෙ සුප්පයුත්තා මනසා දළ්හෙන
නික්කාමිනො ගොතම සාසනම්හි
තෙ පත්තිපත්තා අමතං විගය්හ
ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

231 යථින්දඛීලො පඨවිංසිතො සියා
චතුබ්භි වාතෙභි අසම්පකම්පියො,
තථූපමං සප්පුරිසං වදාමි
යො අරියසච්චානි අවෙච්ච පස්සති,
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

232 යෙ අරියසච්චානි විභාවයන්ති
ගම්භීරපඤ්ඤෙන සුදෙසිතානි
කිඤ්චාපි තෙ හොන්ති භුසප්පමත්තා
න තෙ භවං අට්ඨමං ආදියන්ති,
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

233 සහාවස්ස දස්සනසම්පදාය
තයස්සු ධම්මා ජහිතා භවන්ති,
සක්කායදිට්ඨි විචිකිච්ඡිතඤ්ච
සීලබ්බතං වාපි යදත්ථි කිඤ්චි,
චතූහපායෙහි ච විප්පමුත්තො
ඡ චාභිඨානානි අභබ්බො කාතුං
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

234 කිඤ්චාපි සො කම්මං කරොති පාපකං
කායෙන වාචා උද චෙතසා වා
අභබ්බො සො තස්ස පටිච්ඡාදාය
අභබ්බතා දිට්ඨපදස්ස වුත්තා,
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.



Free Distribution www.aathaapi.org

230 යම් රහත් කෙනෙක් ගෞතම සාසනයෙහි දෘඩි සිතින් මොනොවට විදර්ශනායෙහි ප්‍රයුක්ත වූවාහු (ප්‍රඥා වීර්‍ය ධුර දෙකින්) සියලු කෙලෙසුන්ගෙන් නික්මුනාහු වෙත් ද, ඔවුහු අර්හත් ඵල සංඛ්‍යාත ප්‍රාප්තියට පැමිණියාහු නිර්වාණ නම් වූ අමෘතයට බැස ගෙන නිවන් ලැබ ව්‍යය රහිතව වළඳනාහු වෙති. මෙ ද සඞ්ඝයා කෙරෙහි ශ්‍රේෂ්ඨ රත්න භාව යි. ඒ සත්‍යයෙන් (සත්නට) සෙත් වේවා!

231 යම් (සෝවාන්) පුඟුලෙක් චතුරාර්‍යසත්‍යයන් මාර්ග ප්‍රඥාවෙන් විනිවිද දක්නේ ද, ඒ සත්පුරුෂ පොළොවෙහි සිටුවන ලද ඉන්ද්‍රකීලය සිවු දිගින් හමන සුළඟින් යම් සේ නොසැලිය හේ ද, එ සත්පුරුෂ එවැනි උපමා ඇතිකොට කියමි. මෙ ද සඞ්ඝරත්නය කෙරෙහි ශ්‍රේෂ්ඨ රත්නභාව යි. තෙල සත්‍යයෙන් සත්නට සෙත්වේවා!

232 (සතතකඛතතුපරම යි කියන ලද) යම් පුද්ගල කෙනෙක් ගැඹුරු පැණ ඇති බුදුරජුන් විසින් මොනොවට දෙසන ලද ආර්‍යසත්‍යයන් (ප්‍රඥාවභාසයෙන්) ප්‍රකට කෙරෙත් ද, ඔවුහු (දෙව්රජසිරි, සක්විතිරජසිරි ඈ ලබා) සසර බෙහෙවින් පමාවූවාහු නමුදු ඔහු අට වැනි භවයක් (උපත් විසින්) නො ගනිත්. මෙ ද සඞ්ඝයා කෙරෙහි ශ්‍රේෂ්ඨ රත්නභාව යි. තෙල සත්‍යයෙන් සත්නට සෙත් වේවා!

233 ඔහුගේ (සොතාපත්තිමග්ගසම්පත්තිසංඛ්‍යාත) දර්ශන සම්පත් සමග මැ සත්කාය දෘෂ්ටි ද විචිකිත්සා ද ශීලව්‍රතපරාමර්ශ දෘෂ්ටි යන යම් කිසිවක් ඇත් ද, ඒ ධර්මයෝ තුන් දෙන (ප්‍රහීණ කිරීම් වශයෙන් හරණ ලද වෙති. සිව් අපායෙනුදු හෙ විප්‍රමුක්ත වෙයි. (පඤ්ච ආනන්තර්‍යය හා අන්‍යශාස්තෘ උද්දෙශකය ද යන) ඖදාරික කර්ම සය කිරීමට ද නොනිසි වෙයි. මෙ ද සඞ්ඝයා කෙරෙහි ශ්‍රේෂ්ඨ රත්න භාව යි. තෙල සත්‍යයෙන් සත්නට සෙත් වේවා!

234 තවද හේ කයින් වේවයි බසින් වේවයි යලි සිතින් වේවයි පව්කම් කෙරේ නමුදු, එය පිළිසන් කිරීමට අභව්‍ය වෙයි. දුටු නිර්වාණ පද ඇතියහුගේ (දර්ශන සම්පන්න පුද්ගලයාගේ) (ඒ) අභව්‍යතාව කියන ලදු. මෙද සඞ්ඝයා කෙරෙහි ශ්‍රේෂ්ඨ රත්නභාව යි. තෙල සත්‍යයෙන් සත්නට සෙත් වේවා !

235 වනප්පගුම්බෙ යථා ඵුස්සිතග්ගෙ
ගිම්හානමාසෙ පඨමස්මිං ගිම්හෙ,
තථූපමං ධම්මවරං අදෙසයි
නිබ්බානගාමිං පරමං හිතාය,
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

236 වරො වරඤ්ඤූ වරදො වරාහරො
අනුත්තරො ධම්මවරං අදෙසයි
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

237 ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං
විරත්තචිත්තා ආයතිකෙ භවස්මිං,
තෙ ඛීණබීජා අවිරූළ්හිච්ඡන්දා
නිබ්බන්ති ධීරා යථායම්පදීපො,
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

238 යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ.
තථාගතං දෙවමනුස්සපූජිතං
බුද්ධං නමස්සාම සුවත්ථි හොතු.

239 යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ,
තථාගතං දෙවමනුස්සපූජිතං
ධම්මං නමස්සාම සුවත්ථි හොතු.

240 යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානි ව අන්තලික්ඛෙ,
තථාගතං දෙවමනුස්සපූජිතං
සඞ්ඝං නමස්සාම සුවත්ථි හොතු.

රතනසුත්තං නිට්ඨිතං.



Free Distribution www.aathaapi.org

235 ග්‍රීෂ්ම ඍතුයෙහි ප්‍රථම ග්‍රීෂ්ම මාසයෙහි, (බක් මසැ) පිපී ගිය මල් බර අතු පතර ඇති වන ගොමුවක් යම් සේ වේ ද, එය උපමා කොට ඇති අත්‍යුත්තම වූ, නිර්වාණගාමී වූ (පර්‍ය්‍යාප්ති) ධර්මය (සත්ත්වයනට) හිත පිණිස දෙසූහ. මෙ ද බුදුරජුන් කෙරෙහි වූ ශ්‍රේෂ්ඨ රත්නභාව යි. තෙල සත්‍යයෙන් සත්නට සෙත්වේවා!

236 (සර්වඥතාඥානලාභයෙන්) උතුම් වූ, (නිර්වාණ ධර්ම සංඛ්‍යාත) වරය දන්නා වූ, (දෙව් මිනිස්නට නිර්වේද භාගීය වාසනා භාගීය) වරධර්මය දෙන්නා වූ, (ආර්යමාර්ගසංඛ්‍යාත) වර එළවන්නාවූ, අනුත්තර බුදුහු ලෝකෝත්තර ධර්මය දෙසූහ. මෙ ද බුදුන් කෙරෙහි ශ්‍රේෂ්ඨ රත්න-භාව යි. තෙල සත්‍යයෙන් සත්නට සෙත් වේවා!

237 (රහත්හුගේ) පැරණි කර්ම ගෙවී ගියේ ය. නව (කර්ම) ප්‍රාදුර්-භාවයෙක් නැත. පුනර්භවයෙහි පහ වූ රාගසිත් ඇති ගෙවුනු කර්ම බීජ ඇති, නොවැඩෙන ඡන්දරාග ඇති, ඒ පණ්ඩිත වූ ක්ෂීණාශ්‍රවයෝ මේ පහන සෙයින් නිවෙත්. මෙ ද සඞ්ඝයා කෙරෙහි ශ්‍රේෂ්ඨ රත්න භාව යි. ඒ සත්‍යයෙන් සත්නට සෙත් වේවා!

238 මෙහි රැස් වූ යම් භූමිෂ්ඨ වූ අමනුෂ්‍ය කෙනෙක් වෙත් ද, යම් ආකාශස්ථ අමනුෂ්‍ය කෙනෙක් හෝ වෙත් ද, (ඒ අපි) දෙව්මිනිසුන් විසින් පුදන ලද තථාගත බුදුරජුන් නමදිමහ. සත්හට සෙත් වේවා!

239 මෙහි රැස් වූ යම් භූමිස්ථ අමනුෂ්‍ය කෙනෙක් වෙත් ද, යම් ආකශස්ථ අමනුෂ්‍ය කෙනෙක් හෝ වෙත් ද, (ඒ අපි) දෙව්මිනිසුන් විසින් පුදන ලද තථාගත ධර්මය නමදිම හ. සත්නට සෙත් වේවා!

240 මෙහි රැස් වූ යම් භූමිස්ථ අමනුෂ්‍ය කෙනෙක් වෙත් ද, යම් ආකාශස්ථ අමනුෂ්‍ය කෙනෙක් හෝ වෙත් ද, (ඒ අපි) දෙව්මිනිසුන් විසින් පුදන ලද තථාගත සඞ්ඝයා නමදිමහ. සත්නට සෙත් වේවා!

**රතන සූත්‍රය නිමි.**



Free Distribution www.aathaapi.org

## 2 – 2

### ආමගන්ධසුත්තං

241 සාමාකචිඞ්ගූලකචීනකානි ච
පත්තප්ඵලං මූලප්ඵලං ගවිප්ඵලං,
ධම්මෙන ලද්ධං සතමස්නමානා[1]
න කාමකාමා අලිකං භණන්ති.

242 යදස්නමානො සුකතං සුනිට්ඨිතං
පරෙහි දින්නං පයතං පණීතං,
සාලීනමන්නං පරිභුඤ්ජමානො
සො භුඤ්ජතී කස්සප ආමගන්ධං.

243 න ආමගන්ධො මම කප්පතීති
ඉච්චෙව ත්වං භාසසි බ්‍රහ්මබන්ධු,
සාලීනමන්නං පරිභුඤ්ජමානො
සකුන්තමංසෙහි සුසඞ්ඛතෙහි,
පුච්ඡාමි තං කස්සප එතමත්ථං
කථංපකාරො තව ආමගන්ධො.

244 පාණාතිපාතො වධඡෙදබන්ධනං
ථෙය්‍යං මුසාවාදෙ නිකති වඤ්චනානි,
අජ්ඣෙනකුජ්ඣං පරදාරසෙවනා
එසාමුගන්ධො න හි මංසභොජනං.

245 යෙ ඉධ කාමෙසු අසඤ්ඤතා ජනා
රසෙසු ගිද්ධා අසුචීකමිස්සිතා,[2]
නත්ථිකදිට්ඨී විසමා දුරන්නයා
එසාමගන්ධො න හි මංසභොජනං.

246 යෙ ලූඛසා දරුණා පිට්ඨිමංසිකා,
මිත්තද්දුනො නික්කරුණා තිමානිනො
අදානසීලා න ච දෙන්ති කස්සචි
එසාමගන්ධො න හි මංසභොජනං.

---

1. සතමසමානා සී. PTS. සකමසමානා–ස්‍යා.
2. අසුචිභාවමස්සිත–ම



Free Distribution www.aathaapi.org

## 2 – 2
## ආමගන්ධ සූත්‍රය

241 දැහැමින් ලත් බොධහමුය, කර හමුය, චීනමුංය, නිල් පළාය, අල මුල්ය, රුක් ලිය පලතුරුය යන මෙ ද වළඳන, කම්සුව නො පතන ශාන්ත පුරුෂයෝ මුසවා නො බණන්නාහ.

242 කාශ්‍යපයන් වහන්ස, (කපා සෝද ගැනීම් විසින්) මොනොවට පිළියෙළ කරන ලද, (පිසුම් සුවඳ කුළුබඩු බැහීම් විසින්) මනාසේ නිමවන ලද, මෙරමෑ විසින් දෙන ලද පිවිතුරුවූ යම් පිණි සුවඳ හැල් බොජුනක් වලදනා හේ ආමගන්ධය වළඳන්නේය.

243 බ්‍රාහමණ ගුණ නැතිව (බ්‍රාහමණජාතිමාත්‍රවූ) බ්‍රහ්මබන්ධුයෙනි, මොනොවට පිළියෙළ කරන ලද ලිහිණි මස් හා සුවඳහැල් බත් වලදනුවෝ මැ (තෙපි) "මට ආමගන්ධය නො සරුප් වේය" යි මෙසේ කියව, කාශ්‍යපයෙනි, තෙල අරුත් තොප පුළුවුස්මි, තොපගේ ආමගන්ධය කවර ප්‍රකාර ඇත්තේ ද?

244 ප්‍රාණඝාත ය, (දඩු මුගුරු ආදියෙන්) හිංසා කිරීම ය, හස්තපාදදිච්ඡේද ය, (යදම් හැකිලි ආදියෙන්) බැඳුම ය, අයිනාදන් ය, මුසවා ය, ප්‍රතිඥාඝාත ය, වඤ්චනා ය, නිරර්ථක ශාස්ත්‍ර පිරිවැහුම්ය, පරඹුන් සෙවුම් ය යන තෙල ආමගන්ධ වෙයි. මාංස භොජන (ආමගන්ධ) නො වේ.

245 මෙ ලොවැ කාමයන්හි අසංයත වූ රසයන්හි ගිජුවූ (මිථ්‍යාජීවිකා සංඛ්‍යාත) අපවිත්‍ර භාවයෙන් මුසු වූ, දශවස්තුක නාස්තිකදෘෂ්ටිගත්තාවූ (සත්දිට්ඨිපරාමාසිතාදී හේතුයෙන්) කරුණු ගැන්විය නොහෙන, (දුර්විඥප්‍ය) යම් ජන කෙනෙක් වෙත් නම්, තෙල ආමගන්ධ වෙයි. මාංසභොජන (ආමගන්ධ) නො වේ.

246 යම් කෙනෙක් (ආත්මක්ලමථානුයොගයෙන්) රූක්ෂ වූවාහු දරුණු (කැකුළු) වූවාහු, පිටුමස් කන්නාහු, මිත්‍රද්‍රොහී වූවාහු, කුළුණුගුණ නැතියාහු, අතිමාන ඇත්තාහු, පරා අයත් ධන පැහැර ගන්නාහු, කවරකුහටවත් කිසි වතකුත් නොදෙත් නම්, තෙල ආමගන්ධ වෙයි. මාංස භොජනය (ආමගන්ධ) නො වේ.

247 කොධො මදො ථම්භො පච්චුට්ඨාපනා ච
මායා උසූයා භස්සසමුස්සයො ච,
මානාතිමානො ච අසබ්භි සන්ථවො
එසාමගන්ධො න හි මංසභොජනං.

248 යෙ පාපසීලා ඉණඝාතසූචකා
වොහාරකූටා ඉධ පාටිරූපිකා
නරාධමා යෙ'ධ කරොන්ති කිබ්බිසං
එසාමගන්ධො න හි මංසභොජනං.

249 යෙ ඉධ පාණෙසු අසඤ්ඤතා ජනා
පරෙසමා'දය විහෙසමුය්‍යුතා,
දුස්සීලලුද්දා ඵරුසා අනාදරා
එසාමගන්ධො න හි මංසභොජනං.

250 එතෙසු ගිද්ධා විරුද්ධාතිපාතිනො
නිච්චුය්‍යුතා පෙච්ච තමං වජන්ති යෙ,
පතන්ති සත්තා නිරයං අවංසිරා
එසාමගන්ධො න හි මංසභොජනං

251 න මච්ඡමංසං නානාසකත්තං
න නග්ගියං න මුණ්ඩියං ජටාජල්ලං
ඛරාජිනානි නාග්ගිහුත්තස්සුපසෙවනා වා
යෙ වාපි ලොකෙ අමරා බහූ තපා
මන්තා'හුතී යඤ්ඤමුතූපසෙවනා
සොධෙන්ති මච්චං අවිතිණ්ණකඞ්ඛං.

252 සොතෙසු ගුත්තො විදිතින්ද්‍රියො චරෙ
ධම්මෙ ඨිතො අජ්ජවමද්දවෙ රතො,
සඞ්ගාතිගො සබ්බදුක්ඛප්පහීනො
න ලිප්පති[1] දිට්ඨසුතෙසු ධීරො.

1. ලිම්පති-සයා.



Free Distribution www.aathaapi.org

247 ක්‍රොධය ද, මදය ද, (චිත්තයාගේ තදබව වූ) ථම්භය ද (ධර්ම න්‍යාය දෙකට විරුද්ධව) නැගී සිටුම ද, (තමා කළ පව් සැඟවීම ලක්ෂණ කොට ඇති) මායාව ද, (පරලාභ සත්කාරාදියෙහි) ඊර්ෂ්‍යාව ද, (ආත්මොත්කර්ෂණ සංඛ්‍යාත) එජ්සුනුබස ද මානාති මානය ද, අසත්පුරුෂ ආශ්‍රය ද යන මේ ආමගන්ධ වෙයි. මාංස භොජනය ආමගන්ධ නො වේ.

248 යම් කෙනෙක් පව් සැහැවි ඇත්තාහු ද, ගත් ණය නසනසුලු වෙත් ද, (නයාායාධිකරණයෙහි දී අල්ලස් ගැනීම් ආදී) කූට ව්‍යවහාර ඇත්තාහු ද, ඉහාත්මයෙහි ම දූහැමි පිළිරූ ඇත්තාහු (දුශ්ශීල) වෙත් ද, මෙලොව් හි යම් අධම නර කෙනෙකුත් අපරාධ කෙරෙත් ද, මේ ආම-ගන්ධ වෙයි, මාංසභොජනය නො වේ.

249 මෙලෙව්හි, යම් ජන කෙනෙක් ප්‍රාණීන් කෙරෙහි සංයම නැත්තාහු, මෙරමාගේ වස්තු පැහැර ගෙන (ඔවුන්ට) වෙහෙස කිරීමෙහි උත්සුක වූවාහු, දුශ්ශීල වූවාහු, කුරිරුකම් ඇත්තාහු, පරොස් බස් බණන්නාහු, ආදර රහිත වූවාහු වෙත් ද මේ ආමගන්ධය වෙයි, මාංස භොජනය නො වේ.

250 මේ ප්‍රාණීන් කෙරෙහි (ලොභයෙන්) ගිජු වූවාහු (ද්වෙෂයෙන්) විරුද්ධ වූවාහු, (මොහයෙන්) අතිපාත කරන්නාහු, (අකුසල් කිරීමෙහි) නිතර උත්සුක වූවාහු යම් සත්ත්ව කෙනෙක් (මෙයින් සැව) පරලොව ගොස් ලොකාන්තරිකාන්ධකාර, නීච කුලාදී) අඳුරට යෙත් ද, යටිහුරු හිස් ඇත්තාහු නිරයෙහි හෙත් ද මේ ආමගන්ධය වෙයි. මාංසභොජනය නො වේ.

251 මසු මස් නොවැළඳීම ද, නග්නතාව ද, හිස මුඩුකිරීම් හා දලම්බුලු දැරීම ද, දූවිලි දූලි ඇඟ තවරාගැනීම ද, රළු ගෝණසම් දැරීම ද, යම්බඳු ගිනිදෙවියා පිදීම ද, ලෝකයෙහි යම්බඳු වූ නොයෙක් අමරතප වේ ද, වෙද මන්ත්‍ර හෝ හොම කර්ම ද අශ්වමෙධාදී යඥයන් හා ඍතුපසෙවනය ද තරණ කළ සැක නැති මිනිසා පිරිසිදු නො කෙරෙත්.

252 ධෘතිමත් සයිඳුරන්හි ගෝපනයෙන් (ඉන්ද්‍රිය සංවර ශීලයෙන්) යුක්ත වූයේ (ඥාත පරිඥාවෙන්) දූනගත් ඉඳුරන් ඇත්තේ හැසිරෙන්නේය. (ආර්‍යමාර්ගයෙන් දතයුතු වූ) සිව්සස් දහම්හි පිහිටියේ (සෙද ගැමි නැණින්) ඉදූ මුදු බවහි රැඳීයේ (අනගැමි මගින්) රාග, ද්වේෂ සඞ්ගයන් ඉක්ම වූයේ (රහත් මගින්) පැහූ සව්දුක් ඇත්තේ දෘෂ්ටශ්‍රැත ධර්මයන්හි නො ලැගෙයි.



Free Distribution www.aathaapi.org

253 ඉච්චෙතමත්ථං භගවා පුනප්පුනං
අක්ඛාසි නං[1] වෙදයි මන්තපාරගූ,
චිත්‍රාහි ගාථාහි මුනීපකාසයී
නිරාමගන්ධො අසිතො දුරන්නයො.

254 සුත්වාන බුද්ධස්ස සුභාසිතං පදං
නිරාමගන්ධං සබ්බදුක්ඛප්පනූදනං,
නීචමනො වන්දි තථාගතස්ස
තත්ථෙව පබ්බජ්ජමරොචයිත්ථාති.

ආමගන්ධසුත්තං නිට්ඨිතං.

## 2 – 3

## හිරිසුත්තං

255 හිරිං තරන්තං විජිගුච්ඡමානං
සඛා හමස්මි[2] ඉති භාසමානං,
සය්හානි කම්මානි අනාදියන්තං
නෙ සො මමන්ති ඉති තං විජඤ්ඤා.

256 අනන්වයං පියං වාචං යො මිත්තෙසු පකුබ්බති,
අකරොන්තං භාසමානං පරිජානන්ති පණ්ඩිතා.

257 න සො මිත්තො යො සදා අප්පමත්තො
භෙදා සඞ්කී රන්ධමෙවානුපස්සී,
යස්මිඤ්ච සෙති උරසීව පුත්තො
ස වෙ මිත්තො සො පරෙහි අභෙජ්ජො

258 පාමුජ්ජකරණං ඨානං පසංසාවහනං සුඛං,
ඵලානිසංසො භාවෙති වහන්තො පොරිසං ධුරං.

259 පවිවෙකරසං පිත්වා රසං උපසමස්ස ච,
නිද්දරො හොති නිප්පාපො ධම්මපීති රසං පිබන්ති.

හිරිසුත්තං නිට්ඨිතං.

1. තං–මූ. 2. සඛාහමස්මි–මජසං.



Free Distribution www.aathaapi.org

253 මෙසේ භාග්‍යවතුන්වහන්සේ මේ අර්ථය පුනපුනා වදළ සේක, වෙද මන්ත්‍රයන්හි පරතෙර පත් ඒ (තිෂ්‍ය) බ්‍රාහ්මණ, එය දැනගත්තේය. ආමගන්ධ (සංඛ්‍යාත ක්ලෙශ) යන්ගෙන් මිදුනු, තෘෂ්ණාදෘෂ්ටි නිඃශ්‍රයන් නැති (බාහිර දෘෂ්ටි වශයෙන් කිසිවකු විසිනුදු) නොපැමිණවිය හැකි මුනිරජ විසිතුරු වූ ගයින් මෙය පැවසීය.

254 බුදුරජුන් ගේ සියලු දුක් දුරලන නිකෙලෙස් වූ සුභාෂිත (ධර්ම) පදය අසා නැමුණු සිතැත්තේ තථාගතයන්වහන්සේගේ (සිරිපා) වැන්දේය. ඒ අස්නෙහිදී ම පැවිද්ද සැලකෙළේය.

**ආමගන්ධ සූත්‍රය නිමි.**

## 2 – 3

## හිරි සූත්‍රය

255 ලජ්ජාව ඉක්මවා යන්නාවූ (නිර්ලජ්ජවූ), (හිරියට) පිළිකුල් කරන්නාවූ, "මම ඔබගේ යහළුවෙකිමි"යි කියන්නා වූ කළ හැකි කර්ම නො පිළිගන්නාවූ, ඒ මිත්‍ර ප්‍රතිරූපකයා තෙල මාගේ යහළු නොවේ"යි (පණ්ඩිත තෙමේ) දන්නේ ය.

256 යමෙක් මිතුරන් අතරදී අනුගත නො වන ප්‍රිය වචන කථා කෙරේ ද, (ක්‍රියාවෙන්) නො කරණ, (වචනයෙන් පමණක්) කථාකරණ, ඔහු පණ්ඩිතයෝ (මෙ වචීපරමයෙකැයි) හඳුනා ගනිත්.

257. යමෙක් හැම කල්හි භේදය ම පතන්නේ (යහළුවාගේ) සිදුරක් ම බලන්නේ. සිදුරු සෙවීමෙහි ම නො පමා වේ ද, හේ මිත්‍රයෙක් නො වේ. (යමෙක්) යම් මිතුරකු කෙරෙහි උරෙයිද පුතකු සෙයින් වෙසේ ද, යමෙකු ත් (කරුණු දහසක් නමුදු කියා) මෙරමා විසින් නො බිදිය හේ ද, ඒකාන්තයෙන් හේ මිත්‍ර වෙයි.

258 පුරුෂයකු හට අනුරූ බර උසුලන්නේ, නිර්වාණ ඵල (සංඛ්‍යාත) අනුසස් පතන්නේ, ප්‍රමෝදය දනවන්නා වූ සුඛහෙතු වූ ප්‍රශංසා එළවන්නාවූ, (සම්‍යක්ප්‍රධාන වීර්‍ය්‍ය සංඛ්‍යාත) කාරණය වඩා නම්–

259. හේ ආර්‍ය්‍ය ධර්ම ප්‍රීතිරස පානය කරන්නේ (අර්හත්ඵල සංඛ්‍යාත) ප්‍රකර්ෂ විවෙක රසය ද (නිර්වාණ සංඛ්‍යාත) උපසමයාගේ රසය ද පානය කොට කෙලෙස් පිරිතැවුලි නැත්තේ නිෂ්පාපයෙක් (පව් නැත්තෙක්) වේ.

**හිරි සූත්‍රය නිමි.**



Free Distribution www.aathaapi.org

## 2 – 4

# මඞ්ගලසුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි, එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.

260 බහූ දෙවා මනුස්සා ච මඞ්ගලානි අචින්තයුං,
ආකඞ්ඛමානා සොත්ථානං බ්‍රෑහි මඞ්ගල මුත්තමං.

261 අසෙවනා ච බාලානං පණ්ඩිතානඤ්ච සෙවනා,
පූජා ච පූජනීයානං එතං මඞ්ගලමුත්තමං.

262 පතිරූපදෙසවාසො ච පුබ්බෙ ච කතපුඤ්ඤතා,
අත්තසම්මාපණිධි ච එතං මඞ්ගලමුත්තමං.

263 බාහුසච්චඤ්ච සිප්පඤ්ච විනයො ච සුසික්ඛිතො,
සුභාසිතා ච යා වාචා එතං මඞ්ගලමුත්තමං.

264 මාතාපිතු උපට්ඨානං පුත්තදාරස්ස සඞ්ගහො,
අනාකුලා ච කම්මන්තා එතං මඞ්ගලමුත්තමං.

265 දානඤ්ච ධම්මචරියා ච ඤාතකානඤ්ච සඞ්ගහො,
අනවජ්ජානි කම්මානි එතං මඞ්ගලමුත්තමං.

266 ආරති විරති පාපා මජ්ජපානා ච සඤ්ඤමො,
අප්පමාදො ච ධම්මෙසු එතං මඞ්ගලමුත්තමං.

267 ගාරවො ච නිවාතො ච සන්තුට්ඨී ච කතඤ්ඤුතා,
කාලෙන ධම්මස්සවණං එතං මඞ්ගලමුත්තමං.



Free Distribution www.aathaapi.org

## 2 – 4

## මහාමඞගල සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර දෙවුරම් නම් වූ අනාථපිණ්ඩික සිටුහුගේ අරමහි වැඩ වසන සේක. ඉක්බිත්තෙන් ඉක්ම ගිය පෙර යම ඇති රැයෙක විසිතුරු සිරුරු පැහැයෙන් යුත් එක්තරා දෙවියෙක් මුලු මහත් දෙවුරම එකලු කොට භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක සිටියේ ය. එකත්පසෙක සිටි ඒ දෙවි තෙමේ භාග්‍යවතුන් වහන්සේට ගාථාවකින් සැළකෙළේ ය:-

260 සෙත් පතන්නාවූ බොහෝ දෙවියෝ ද මනුෂ්‍යයෝ ද (සව සැපට කරුණුවූ) මඟුල් සිතූහ. (එහෙයින්) උතුම්වූ මඟුල් (කිම දැ යි) දෙසන සේක්වා!

261 බාලයන් නො සෙවීම ද, පණ්ඩිතයන් සේවනය කිරීම ද, පිදිය යුත්තන් පිදීම ද, යන මෙය උතුම් මඟුලි.

262. සුදුසු පියසෙක්හි විසීම ද, පෙර කළ පින් ඇතිබව ද, සිත මොනොවට පිහිටුවීම ද යන මෙය උතුම් මඟුලි.

263. බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව ද, ශිල්පයෙහි දක්ෂ බව ද. (කාවිසිමුනු දෙර) හික්මවීම ද, (ආචාර ගුණව්‍යවස්ථානයෙන්) මොනවට හික්මුනු බව ද, සුබැසි බස ද යන මෙය උතුම් මඟුලි.

264. මවුපිය උවටන ද, අඹුදරුවන් සැඟහීම ද, නිරවුල් වූ කර්මාන්ත ද යන මෙය උතුම් මඟුලි.

265. දන්දීම ද, (දසකුසල්) දම්හි හැසිරීම ද, නෑයන්ට සැඟහීම ද, නිරවද්‍යකර්ම ද යන මේ උතුම් මඟුලි.

266 (සිතින්) පවෙහි නො ඇල්ම ද, (ත්‍රිවිධ විරතීන්ගේ වශයෙන්) පවින් වැළකීම ද, මත්පැනින් වෙන් වීම ද, (කුසල්) දහම්හි නොපමා බව ද යන මෙය උතුම් මඟුලි.

267. (බුදු-පසේ බුදු-බුදුසවු-ඇදුරු උවදැ ඇනට) ගරු කිරීම ද, නිහතමාන බව ද, ලද දෑයින් සතුටු වීම ද, කළගුණ දන්නා බව ද; සුදුසු කල්හි දහම් ඇසීම ද යන මෙය උතුම් මඟුලි.



Free Distribution www.aathaapi.org

268 ඛන්ති ච සොවචස්සතා සමණානඤ්ච දස්සනං,
කාලෙන ධම්මසාකච්ඡා එතං මඞ්ගලමුත්තමං.

269 තපො ච බ්‍රහ්මචරියඤ්ච අරියසච්චානදස්සනං,
නිබ්බානසච්ඡිකිරියා ච එතං මඞ්ගලමුත්තමං.

270 ඵුට්ඨස්ස ලොකධම්මෙහි චිත්තං යස්ස න කම්පති,
අසොකං විරජං ඛෙමං එතං මඞ්ගලමුත්තමං.

271 එතාදිසානි කත්වාන සබ්බත්ථ මපරාජිතා,
සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති තං තෙසං මඞ්ගලමුත්තමන්ති.

මඞ්ගලසුත්තං නිට්ඨිතං

## 2 – 5

## සූචිලොම සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා ගයායං විහරති ටංකිතමඤ්චෙ සූචිලොමස්ස යක්ඛස්ස භවනෙ. තෙන ඛො පන සමයෙන ඛරො ච යක්ඛො සූචිලොමො ච යක්ඛො භගවතො අවිදූරෙ අතික්කමන්ති.

අථ ඛො ඛරො යක්ඛො සූචිලොමං යක්ඛං එතදවොච; එසො සමණොති: නෙසො සමණො සමණකො එසො. යාව ජානාමි යදි වා සො සමණො යදි වා සමණකොති.

අථ ඛො සූචිලොමො යක්ඛො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවතො කායං උපනාමෙසි.

අථ ඛො භගවා කායං අපනාමෙසි,

අථ ඛො සූචිලොමො යක්ඛො භගවන්තං එතදවොච,

භායසි මං සමණාති.

නඛ්වාහන්තං ආවුසො භායාමි, අපි ච තෙ සම්ඵස්සො පාපකොති.

පඤ්හං තං සමණ පුච්ඡිස්සාමි සචෙ මෙ න ව්‍යාකරිස්සසි චිත්තං වා තෙ ඛිපිස්සාමි හදයං වා තෙ ඵාලෙස්සාමි පාදෙසු වා ගහෙත්වා පාරගඞ්ගාය ඛිපිස්සාමීති.

268. ඉවසීම ද සුවච බව ද මහණුන් දැක්ම ද සුදුසු කල්හි ධර්ම සාකච්ඡාව ද යන මෙය උතුම් මඟුලි.

269. (ඉන්ද්‍රිය සංවර, වීර්‍ය්‍ය සඞ්ඛ්‍යාත) තපස ද බඹසර ද චතුරාර්‍ය්‍ය සත්‍යයන් දැකීම ද නිවන් පසක් කිරීම ද යන මෙය උතුම් මඟුලි.

270. අටලෝ දහමින් පහස්නා ලද යමකුගේ සිත නො සැලේ ද ශෝකයෙන් තොර ද පහ වූ කෙලෙස් රජස් ඇත්තේ ද බිය රහිත ද යන මෙය උතුම් මඟුලි.

271. (ස්කන්ධ-ක්ලෙශ - අභිසංස්කාර – දෙවපුත්‍රමාර සඞ්ඛ්‍යාත) සියලු තන්හි නො පැරදුනාහු මෙබඳු මඞ්ගලයන් කොට (මෙලෝ පරලෝ) හැම තන්හි සැපයට පැමිණෙත් යි.

මඞ්ගල සූත්‍රය නිමි.

## 2 – 5
## සූචිලෝම සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ගයා ගම නොදුරෙහි ටඞ්කිතමඤ්චයෙහි වූ සූචිලෝම යක්ෂයාගේ භවනයෙහි වැඩවෙසෙන සේක. එ සමයෙහි 'ඛර' නම් යක්ෂ ද, සූචිලෝම යක්ෂ ද, භාග්‍යවතුන් වහන්සේට නුදුරෙහි ඉක්මයෙති.

ඉක්බිති ඛර යක්ෂ සූචිලෝම යක්ෂයා හට මෙසේ කී ය: මෙතෙල ශ්‍රමණයෙක. මෙතෙල ශ්‍රමණයෙක් නො වේ. මෙතෙල (ශ්‍රමණ ප්‍රතිරූපක) ශ්‍රමණකයෙකි. මෙතෙමේ ශ්‍රමණයෙක් ද නැතහොත් ශ්‍රමණකයෙක් දැ යි යම්තාක් දනිම් නම් ඒ තාක් නවතු ව.

ඉක්බිති සූචිලෝම යක්ෂ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ භාග්‍යවතුන් වහන්සේට (සිය) කය නතු කෙළේ ය.

ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ (සිය) කය පසෙකට නැමූ සේක.

ඉක්බිති සූචිලෝම යක්ෂ භාග්‍යවතුන් වහන්සේ හට මෙතෙල කීය: මහණ මට, බානෙහි ද?

ඇවත, මම තට නො බානෙම් ම ය, එතෙකුදු වුව තාගේ පහස පවිටු ය.

මහණ, තා පැන පුළුවුස්නෙමි. ඉදින් මට (එය) නො පවසන්නෙහි නම් තාගේ සිත හෝ පෙරළන්නෙමි, තා හදවත හෝ පලන්නෙමි, දෙපයැ හෝ ගෙණ ගඟින් එතර දමා ගසන්නෙමි.

න ඛ්වාහං තං ආවුසො පස්සාමි, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය යො මෙ චිත්තං වා ඛිපෙය්‍ය හදයං වා ඵාලෙය්‍ය පාදෙසු වා ගහෙත්වා පාරගඞ්ගාය ඛිපෙය්‍ය, අපි ච ත්වං ආවුසො පුච්ඡ යදාකඞ්ඛසීති.

අථ ඛො සූචිලොමො යක්ඛො භගවන්තං ගාථාය අජ්ඣභාසි:

272 රාගො ච දොසො ච කුතොනිදානා
අරතී රතී ලොමහංසො කුතොජා,
කුතො සමුට්ඨාය මනොවිතක්කා
කුමාරකා ධඞ්කමිවොස්සජන්ති.

273 රාගො ච දොසො ච ඉතොනිදානා
අරතී රතී ලොමහංසො ඉතොජා,
ඉතො සමුට්ඨාය මනො විතක්කා
කුමාරකා ධඞ්කමිවොස්සජන්ති.

274 ස්නෙහජා අත්තසම්භූතා නිග්‍රොධස්සෙව ඛන්ධජා,
පුථූ විසත්තා කාමෙසු මාලුවා'ව විතතා වනෙ.

275 යෙ නං පජානන්ති යතො නිදානං
තෙ නං විනොදෙන්ති සුණොහි යක්ඛ,
තෙ දුත්තරං ඕඝමිමං තරන්ති
අතිණ්ණපුබ්බං අපුනබ්භවායාති.

සූචිලොමසුත්තං නිට්ඨිතං.

## 2 – 6

## කපිලසුත්තං

276 ධම්මචරියං බ්‍රහ්මචරියං එතදාහු වසුත්තමං,
පබ්බජිතොපි චෙ හොති අගාරස්මා අනගාරියං.

277 සො චෙ මුඛරජාතිකො විහෙසාභිරතො මගො,
ජීවිතං තස්ස පාපියො රජං වඩ්ඪෙති අත්තනො.



Free Distribution www.aathaapi.org

ඇවත, යමෙක් මා සිත හෝ පෙරළා නම් හදවත හෝ පලා නම්, දෙපයැ හෝ ගෙණ ගඟිනෙතර දමා ගසා නම්, එබන්දකු මම දෙවියන් සහිත, මරුන් සහිත බඹුන් සහිත, ලොවිහි මහණ බමුණන් සහිත දෙවි මිනිසුන් සහිත සත්ත්වප්‍රජාව අතර නො ම දක්මි. එතෙකුදු වුව ඇවත, තෝ යමක් රිසියෙහි නම් පුළුවුස්ව.

ඉක්බිති සූචිලෝම යක්ෂ භාග්‍යවතුන් වහන්සේට ගාථාවෙකින් සැලකෙළේ ය:

272. රාගය හා ද්වේෂය හා කුමක් නිදාන කොට ඇත්තාහු ද? (ප්‍රාන්තශයනාසනයන්හි හා අධිකුශලධර්මයන්හි නො ඇලීම වූ) අරතිය හා (පඤ්චකම් ගුණෙහි ඇල්ම වූ) රතිය හා (චිත්තෝත්‍රාසය වූ) ලොමුදහගැණීම හා කොයින් උපදනාහු ද? කාමාදී විතර්කයෝ කොයින් ඉපද ළදරුවන් කවුඩකු (පා හුයෙකින්) බැඳ මුදා හරින්නාක් මෙන් කුසල චිත්තය බැඳ හරිත් ද?

273. රාගය හා ද්වේෂය හා (පංචස්කන්ධසඞ්ඛ්‍යාත) මේ ආත්මභාවය නිදන කොට ඇත්තාහ. අරතිය හා රතිය හා ලොමුදහගැණීම හා, මෙයින් (ආත්මභාවයෙන්) උපදනාහු වෙති. මෙයින් ඉපදී විතර්කයෝ කුඩා කුමරුන් කවුඩකු මෙන් කුසල් සිත බැඳ හරිත්.

274. නුගරුකෙහි කඳින් උපදනා අරළු (ප්‍රරෝහ) මෙන් ස්නේහයෙන් උපන් රාගාදිහු (පඤ්චස්කන්ධ සඞ්ඛ්‍යාත) ආත්මභාවයෙන් උපන්නාහු වෙති. වෙනෙහි පැතිර ගිය මාලුව ලිය මෙන් ඔහු නන් අයුරු වූවාහු කාමයන්හි පැතිරගත්තාහු වෙති.

275. යක්ෂය, අසව, යමෙක් තුමූ ඒ රාගාදි ක්ලේශ සමූහය යමක් නිදන කොට ඇතැයි දනිත් ද, ඔහු එය දුරලති. ඔහු අපුනර්භවය පිණිස තරණය නොකළ විරූ, දුකසේ තරණය කළ යුතු, මේ චතුරොඝය තරණය කෙරෙත් යි.

සූචිලෝම සූත්‍රය නිමි.

## 2 – 6

## කපිල සූත්‍රය

276. (කාය සුචරිතාදී) ධර්මචර්යය හා මගබඹසර හා යන මේ දෙ කරුණ උතුම් රුවනැයි (ආර්යයෝ) පැවසූහ. ඉදින් ගිහිගෙන් නික්ම අනගාර්ය සඞ්ඛ්‍යාත ශාසනයෙහි පැවිදිවූයෙක් වේ නම්,

277. ඉදින් හේ පරොස්බස් ඇත්තේ වේ ද, මෙරමා වෙහෙසීමෙහි නියලුනේ (හිරි ඔතප් නැති හෙයින්) තිරිසන් බඳු වේ ද, ඔහුගේ ජීවිතය ලාමක වෙයි. තමාගේ (රාගාදි) කෙලෙස් වඩයි.



Free Distribution www.aathaapi.org

278 කලහාභිරතො භික්ඛු මොහධම්මෙන ආවටො,
අක්ඛාතම්පි න ජානාති ධම්මා බුද්ධෙන දෙසිතං.

279 විහෙසං භාවිතත්තානං අවිජ්ජාය පුරක්ඛතො,
සංකිලෙසං න ජානාති මග්ගං නිරයගාමිනං.

280 විනිපාතං සමාපන්නො ගබ්භා ගබ්භං තමා තමං,
සවෙ තාදිසකො භික්ඛු පෙච්ච දුක්ඛං නිගච්ඡති.

281 ගූථකූපො යථා අස්ස සම්පුණ්ණො ගණවස්සිකො,
යො ච එවරූපො අස්ස දුබ්බිසොධො හි සාඞ්ගණො.

282 යං එවරූපං ජානාථ භික්ඛවො ගෙහනිස්සිතං,
පාපිච්ඡං පාපසඞ්කප්පං පාපආචාරගොචරං.

283 සබ්බෙ සමග්ගා හුත්වාන අභිනිබ්බිජ්ජයාථ නං,
කාරණ්ඩවං[1] නිද්ධමථ කසම්බුං චාපකස්සථ.

284 තතො පලාපෙ වාහෙථ අස්සමණෙ සමණමානිනෙ,
නිද්ධමිත්වාන පාපිච්ඡෙ පාපආචාරගොචරෙ.

285 සුද්ධා සුද්ධෙහි සංවාසං කප්පයව්හො පතිස්සතා,
තතො සමග්ගා නිපකා දුක්ඛස්සන්තං කරිස්සථාති.

කපිලසුත්තං නිට්ඨිතං.

## 2 – 7

## බ්‍රාහ්මණධම්මික සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො සම්බහුලා කොසලකා බ්‍රාහ්මණමහාසාලා ජිණ්ණා වුද්ධා මහල්ලකා අද්ධගතා වයො අනුප්පත්තා යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයං කථං සාරානීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නා ඛො තෙ බ්‍රාහ්මණමහාසාලා භගවන්තං එතදවොචුං:

1. කාරණ්ඩවං – ස්‍යා.
2. ධම්මචරිය – මු.



Free Distribution www.aathaapi.org

278. කලහයෙහි නියැලුනු ඒ මහණ (අවිද්‍යාසඞ්ඛ්‍යාත) මෝහධර්මයෙන් ඇවුරුණේ, බුදුරජුන් විසින් දෙසන ලද ධර්මය කියන ලද නමුදු නො දනී.

279. අවිද්‍යාවෙන් මෙහෙයන ලද්දේ බැවූ සිත් ඇතියවුන් (රහතුන්) වෙහෙසන්නේ සකිලිටු වූ නිරයගාමීමාර්ගය නො දනියි.

280. (සතර අපාය යි කියන ලද) විනිපාතයට පැමිණි ඒ මහණ ඒකාන්තයෙන් මවුකුසින් මවුකුසට ද අඳුරෙන් අඳුරට ද (යමින්) පරලොව ගොස් දුකට පැමිණේ.

281. ඉක්ම ගිය බොහෝ හවුරුදු ගණන් ඇති පිරුණු වැසිකිළි වළක් යම් සේ (පිරිසිදු කළ නො හැක්කේ) වේ ද, එබඳු වූ යමෙක් වේ නම් මෙහ පිරුණු කෙලෙස් ඇත්තේ පිවිතුරු කළ නො හැකි වන්නේ ම ය.

282. මහණෙනි, පස්කම් ගුණ ඇසුරු කළා වූ ලාමක ඊර්ෂ්‍යා ඇති පාප විතර්ක ඇති, පවිටු ආචාර ගොචර ඇති යම් මෙබඳු පුඟුලකු දනිවු නම්,

283. හැම දෙන සමග ව ඔහු වර්ජනය කරවු. කසළක් බඳු ඔහු බැහැර කරවු. කෙලෙස් කසට සහිත ඔහු නෙරපාලවූ.

284. එහෙයින් අශ්‍රමණ වූ ශ්‍රමණයෙමැ යි හඟනාවූ බොල් පුඟුලන් පිඹ හරිවු. ලාමක ඉච්ඡා ඇති පවිටු ආචාර-ගොචර ඇති ඔවුන් බැහැර කොට,

285. (කායසමාචාරාදියෙන්) පිරිසිදු වූවාහු (ඔවුනොවුන් කෙරෙහි ගෞරව සහිත වූවාහු ශුඩ වූ පුඟුලන් සමග ම සමාන සංවාසය කරවු) ඉක්බිති මුහුකළ නුවණ ඇත්තාහු (දෘෂ්ටි ශීල ඈ ශ්‍රමණ ගුණයන්ගෙන්) යුක් වූවාහු දුක් කෙළවර කරවු.

කපිල සූත්‍රය නිමි.

## 2 – 7

## බ්‍රාහ්මණධම්මික සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඬු මහසිටුහුගේ අරම්හි වැඩවෙසෙන සේක. ඉක්බිත්තෙන් කොසොල් දනවු වැසි ජරාවෙන් ජීර්ණ වූ වැඩි මහලු වූ තෙවන වියට පැමිණි පිළිවෙළින් පැසුළු වියට පැමිණි බොහෝ බමුණු මහසල්හු භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ හා සමග සතුටු වූහ. සතුටුවිය යුතු සිහිකටයුතු කථාව කොට නිමවා එකත්පසෙක හුන්හ. එකත් පසෙක හුන් ඒ බමුණුමහසල්හු භාග්‍යවතුන් වහන්සේට මෙල කරුණ සැලකළහ:

සන්දිස්සන්ති නු ඛො භො ගොතම එතරහි බ්‍රාහ්මණා පොරාණානං බ්‍රාහ්මණානං බ්‍රාහ්මණධම්මෙති.

න ඛො බ්‍රාහ්මණා සන්දිස්සන්ති එතරහි බ්‍රාහ්මණා පොරාණානං බ්‍රාහ්මණානං බ්‍රාහ්මණධම්මෙති.

සාධු නො භවං ගොතමො පොරාණානං බ්‍රාහ්මණානං බ්‍රාහ්මණධම්මං භාසතු සචෙ භොතො ගොතමස්ස අගරූති.

තෙන හි බ්‍රාහ්මණා සුණාථ සාධුකං මනසි කරොථ භාසිස්සාමීති.

එවං භො'ති ඛො තෙ බ්‍රාහ්මණමහාසාලා භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

286 ඉසයො පුබ්බකා ආසුං සංයතත්තා තපස්සිනො
පඤ්චකාමගුණෙ හිත්වා අත්තදත්ථමචාරිසුං.

287 න පසූ බ්‍රාහ්මණානාසුං න හිරඤ්ඤං න ධානියං
සජ්ඣායධනධඤ්ඤාසුං බ්‍රහ්මං නිධිමපාලයුං.

288 යං තෙසං පකතං ආසි ද්වාරභත්තං උපට්ඨිතං
සද්ධාපකතමෙසානං දාතවෙ තදමඤ්ඤිසුං.

289 නානාරත්තෙහි වත්ථෙහි සයනෙහාවසථෙහි ච
ඵීතා ජනපදා රට්ඨා තෙ නමස්සිංසු බ්‍රාහ්මණෙ.

290 අවජ්ඣා බ්‍රාහ්මණා ආසුං අජෙය්‍යා ධම්මරක්ඛිතා
න තෙ කොචි නිවාරෙසි කුලද්වාරෙසු සබ්බසො.

291 අට්ඨචත්තාරිසං වස්සානි කොමාරං බ්‍රහ්මචරියං චරිංසු තෙ
විජ්ජාචරණපරියෙට්ඨිං අචරුං බ්‍රාහ්මණා පුරෙ.

292 න බ්‍රාහ්මණා අඤ්ඤමගමුං නපි භරියං කිණිංසු තෙ
සම්පියෙනෙව සංවාසං සංගන්ත්වා සමරොචයුං.



Free Distribution www.aathaapi.org

භවත් ගෞතමයන් වහන්ස, මෙ කල්හි බමුණෝ පැරණි බමුණන්ගේ බමුණුදම්හි පැණෙත් ද යි?

බ්‍රාහ්මණයෙනි, මෙ කල්හි බමුණෝ පැරණි බමුණන්ගේ බමුණු දම්හි නො පැණෙත් මැ යි.

ඉදින් භවත් ගෞතමයන් වහන්සේට නො බර නම්, භවත් ගෞතමයන් වහන්සේ අපට පැරණි බමුණන්ගේ බමුණු දහම වදරණසේක් නම් මැනැවි.

බමුණනි, එසේනම් අසවු, මොනොවට මෙනෙහි කරවු. දෙසන්නෙමි.

''භවත්නි, එසේය''යි ඒ බමුණු මහසැල්හු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ.

භාග්‍යවතුන් වහන්සේ මෙල කරුණු වදළ සේක:

286. (සීලසංයමයෙන්) සංයත වූ (ඉන්ද්‍රිය සංවරයන්) තපස්වී වූ පැරණි සෘෂිවරු වූහ. ඔහු පස්කම් ගුණ හැර දමා (මන්ත්‍රාධ්‍යයනය-බ්‍රහ්මවිහාර භාවනාදී) ආත්මාර්ථයෙහි හැසුරුණාහ.

287. (පැරණි) බමුණනට සිවුපාවෝ නො වූහ. අමුරන් ද නො වීය. ධාන්‍ය ද නො වී ය. ස්වකීය මන්ත්‍රාධ්‍යයනය ධන ධාන්‍ය කොට ඇති වූහ. (මෛත්‍රී කරුණාදී) බ්‍රහ්මනිධිය රැකියහ.

288. ඔවුන් උදෙසා යම් බතක් පිළියෙළ කරන ලද්දේ දෙරටුවෙහි එළවා තබන ලද වී ද, එය සැදැහැයෙන් පිළියෙළ කරණ ලද. පිඩු සොයනවුනට දීම සඳහා ය යි (මිනිස්සු) සිතූහ.

289. (උපකරණයෙන්) සමෘද්ධ වූ ඒ දනවු වැස්සෝ ද රටවැස්සෝ ද නන් පැහැයෙන් රඳනාලද වතින් ද සයනාසනයන්ගෙන් හා ආවාසයන් ගෙන් ද (පුදමින්) බමුණන් නැමදූහ.

290. බමුණෝ, අවධ්‍ය හා නොදිනිය යුතු හා දහැමින් රක්නාලද්දහු හා වූහ. හැම කුලදෙරටුවෙක්හි කිසිවෙක් කිසි ලෙසෙකිනුදු ඔවුන් නො වැළැක්වූහ.

291. ඔවුහු අටසාළිස්වසක් කුමර බඹසර වුසූහ. පෙර බමුණෝ විද්‍යාධ්‍යයනය හා සිල්රැකීම ද කළහ.

292. බමුණෝ පරඹුන් වෙත නො ගියහ. ඔවුහු අඹුවන් ළට නො ගත්හ. අන්‍යෝන්‍ය ප්‍රේමයෙන් සමඟ සංවාසය මැ කැමැති වූහ.

293 අඤ්ඤත්‍ර තම්හා සමයා උතුවෙරමණිම්පති
අන්තරා මෙථුනං ධම්මං නාස්සු ගච්ඡන්ති බ්‍රාහ්මණා.

294 බ්‍රහ්මචරියඤ්ච සීලඤ්ච අජ්ජවං මද්දවං තපං
සොරච්චං අවිහිංසඤ්ච ඛන්තිඤ්චාපි අවණ්ණයුං.

295 යො නෙසං පරමො ආසි බ්‍රහ්මා දළ්හපරක්කමො
ස වාපි මෙථුනං ධම්මං සුපිනන්තෙපි නාගමා.

296 තස්ස වත්තමනුසික්ඛන්තා ඉධෙකෙ විඤ්ඤූජාතිකා
බ්‍රහ්මචරියඤ්ච සීලඤ්ච ඛන්තිඤ්චාපි අවණ්ණයුං.

297 තණ්ඩුලං සයනං වත්ථං සප්පිතෙලඤ්ච යාචිය
ධම්මෙන සමොධානෙත්වා[1] තතො යඤ්ඤමකප්පයුං
උපට්ඨිතස්මිං යඤ්ඤස්මිං නාස්සු ගාවො හනිංසු තෙ

298 යථා මාතා පිතා භාතා අඤ්ඤෙ වාපි ච ඤාතකා
ගාවො නො පරමා මිත්තා යාසු ජායන්ති ඔසධා.

299 අන්නදා බලදා චෙතා වණ්ණදා සුඛදා තථා
එතමත්ථවසං ඤත්වා නාස්සු ගාවො හනිංසු තෙ.

300 සුඛුමාලා මහාකායා වණ්ණවන්තො යසස්සිනො
බ්‍රාහ්මණා සෙහි ධම්මෙහි කිච්චාකිච්චෙසු උස්සුකා
යාව ලොකෙ අවත්තිංසු සුඛමෙධිත්ථයම්පජා.

301 තෙසං ආසි විපල්ලාසො දිස්වාන අණුතො අණුං
රාජිනො ච වියාකාරං නාරියො සමලඞ්කතා.

302 රථෙ චාජඤ්ඤසංයුත්තෙ සුකතෙ චිත්තසිබ්බනෙ
නිවෙසනෙ නිවෙසෙ ච විභත්තෙ භාගසො මිතෙ.

303 ගොමණ්ඩලපරිබ්බූළ්හං නාරීවරගණායුතං
උළාරං මානුසං භොගං අභිජ්ඣායිංසු බ්‍රාහ්මණා.

---

1. සමුදානෙත්වා – සී.මු 2. පු.



Free Distribution www.aathaapi.org

293. බමුණෝ නියමිත ඍතුකාලයෙහි මුත් ඍතුවෙන් මිදුනු අඹුව වෙත අතරතුර මෙවුන්දමට නො ගියහ.

294. (ඔහු) (මෛථුන විරතිසඞ්ඛ්‍යාත) බඹසර ද (සෙසු සිකපද සතර වූ) ශීලය ද ඍජුබව ද මෘදු බව ද (ඉන්ද්‍රියසංවරසඞ්ඛ්‍යාත) තපස ද (නොපිළිකුල් හැසිරීම වූ) සූරතබව ද (කරුණාපූර්වභාගය වූ) අවිහිංසාව ද (අධිවාසනක්ෂාන්තිය වූ) ඉවසීම ද වැණූහ.

295. ඔවුනට ශ්‍රේෂ්ඨ වූ දෘඪපරාක්‍රම ඇති යම් ඒ බ්‍රහ්මයෙක් වී ද හේත් සිහිනෙනුදු මෙවුන්දමට නො ගියේ ය.

296. මෙලොව්හි ඔහුගේ ව්‍රතය අනුව හික්මෙනනා වූ ඇතැම් නුවණැත්තෝ බඹසර ද ශීලය ද ක්ෂාන්තිය ද වැණූහ.

297. සහල් ද යහන් ද වත් ද ගිතෙල් ද තලතෙල් ද යැද දැහැමින් රැස් කොට එයින් ඔවුහු (දාන සඞ්ඛ්‍යාත) යාග කළහ. යාගයක් එළැඹි කල්හි ඔවුහු ගෙරින් ප්‍රමුඛ ප්‍රාණීන් නො වැනැසූහ.

298. මවු ද පියා ද බෑයා ද අන් නෑයෝ ද යම්බඳු වෙත් නම්, එසෙයින් යමකුන් තුළ ඖෂධ හටගණී නම්, ඒ ගවයෝ අපගේ පරම මිතුරෝ වෙති.

299. මේ ගවයෝ වනාහි ආහාර දෙන්නෝ ද බලදනය කරන්නෝ ද වර්ණය දෙන්නාහු ද එසේ ම සැප දෙන්නාහු ද වෙති. මෙකරුණ දැන ඔහු ගෙරින් නො වැනැසූහ.

300. සිවුමැලි වූ ද (ආරෝහ පරිණාහ සඞ්ඛ්‍යාත) මහ සිරුරු ඇත්තා වූ ද (රන්වන් සටහන් ඇති හෙයින්) පැහැපත් වූ ද, (ලාභ පරිවාර සඞ්ඛ්‍යාත) සම්පත් ඇත්තා වූ ද, කටයුතු නො කටයුතු දෙක්හි උත්සාහවත් වූ ද බමුණෝ සිය (සිරිත්) දහමින් යම්තාක් ලොව්හි පැවැතියාහු නම්, (ඒතාක්) මේ (බ්‍රාහ්මණ) ප්‍රජාව සැපයට පත් වූය.

301. 302. අඩියෙන් සවල්පමාත්‍ර වූ පස්කම්ගුණ ද රජුන්ගේ සම්පත්තිය ද මොනොවට සැරහුනු ස්ත්‍රීන් ද ආජානීය අසුන් යෙදූ මොනොවට කරණලද විසිතුරු මැහුම් ඇති රිය ද කොටස් විසින් මැනැ බෙදූ නිවෙස් ද, දැක ඔවුන්ගේ විපර්යාසය වී ය.

303. ගවරැලින් ගැවසීගත් උතුම් ස්ත්‍රීසමූහයාගෙන් යුක්ත වූ මහත් වූ මනුෂ්‍ය භොගසම්පත් පතමින් බමුණෝ බෙහෙවින් අභිධ්‍යා කළහ.



Free Distribution www.aathaapi.org

304 තෙ තත්ථ මන්තෙ ගන්ථෙත්වා ඔක්කාකං තදුපාගමුං,
පහූතධනධඤ්ඤොසි
යජස්සු බහු තෙ විත්තං යජස්සු බහු තෙ ධනං.

305 තතො ච රාජා සඤ්ඤත්තො බ්‍රාහ්මණෙහි රථෙසභො
අස්සමෙධං පුරිසමෙධං සම්මාපාසං වාජපෙය්‍යං නිරග්ගළං
එතෙ යාගෙ යජිත්වාන බ්‍රාහ්මණානං අදා ධනං.

306 ගාවො සයනඤ්ච වත්ථඤ්ච නාරියො සමලඞ්කතා
රථෙ චාජඤ්ඤසංයුත්තෙ සුකතෙ චිත්තසිබ්බනෙ.

307 නිවෙසනානි රම්මානි සුවිභත්තානි භාගසො
නානාධඤ්ඤස්ස පූරෙත්වා බ්‍රාහ්මණානං අදා ධනං.

308 තෙ ච තත්ථ ධනං ලද්ධා සන්නිධිං සමරොචයුං
තෙසං ඉච්ඡාවතිණ්ණානං භිය්‍යො තණ්හා පවඩ්ඪථ.
තෙ තත්ථ මන්තෙ ගන්ථෙත්වා ඔක්කාකං පුනුපාගමුං.

309 යථා ආපො ච පඨවී හිරඤ්ඤං ධනධානියං
එවං ගාවො මනුස්සානං පරික්ඛාරො සො හි පාණිනං
යජස්සු බහු තෙ විත්තං යජස්සු බහු තෙ ධනං.

310 තතො ච රාජා සඤ්ඤත්තො බ්‍රාහ්මණෙහි රථෙසභො
නෙකසතසහස්සියො ගාවො යඤ්ඤෙ[1] අඝාතයි.

311 න පාදා න විසාණෙන නාස්සු හිංසන්ති කෙනචි
ගාවො එළකසමානා සොරතා කුම්භදූහනා
තා විසාණෙ ගහෙත්වාන රාජා සත්ථෙන ඝාතයි.

312 තතො ච දෙවා පිතරො ඉන්දො අසුරරක්ඛසා
අධම්මො ඉති පක්කන්දුං යං සත්ථං නිපතී ගවෙ.

313 තයො රොගා පුරෙ ආසුං ඉච්ඡා අනසනං ජරා
පසූනඤ්ච සමාරම්භා[2] අට්ඨානවුතිමාගමුං.

314 එසො අධම්මො දණ්ඩානං ඔක්කන්තො පුරාණො අහු
අදූසිකායො හඤ්ඤන්ති ධම්මා ධංසන්ති යාජකා.

1. අඤ්ඤෙ - සිමු. 2
2. සමාරම්භා - සිමු.



Free Distribution    www.aathaapi.org

304. ඒ නිමිති කොට ඔහු (ඒ බමුණෝ) වෙදමන්ත්‍ර ගොතා ඒ ඔක්කාක රජු වෙත එළැඹියහ. (යුෂ්මතා අනාගතයෙහි) බොහෝ ධනධාන්‍ය ඇත්තෙක් වන්නෙහි, යුෂ්මත්හුගේ බොහෝ වූ වස්තුව දනවිෂයෙහි යොදන්න. යුෂ්මත්හුගේ මහත්වූ ධනය දන විෂයෙහි යොදන්න.

305. ඉන්පසු බමුණන් විසින් කරුණු ගන්වන ලද මහාරථී වූ රජ අශ්වමෙධය ද පුරුෂමෙධය ද සම්මාපාසය ද, වාජපෙය්‍යය ද නිරග්ගලය දැ යන මේ යාගයන් යැද බමුණනට ධනය දුන්නේ ය.

306. 307. ගවයන් ද යහන් ද වත් ද මොනොවට සරසන ලද ස්ත්‍රීන් ද මොනොවට පිළියෙළ කරනලද විසිතුරු පලස් අතුළ ආජානීය අසුන් යෙදූ රිය ද මොනොවට කොටස් විසින් බෙදන ලද මනරම් නිවෙස් ද නොයෙක් ධාන්‍යයෙන් පුරවා බමුණනට වස්තුව දින.

308. එහිදී ඔහු ධන ද ලැබ වස්තු සන්නිධිය (රැස්කොට තැබීම) රුචිකළාහු ය. ආශාවට බටුවාවූ ඔවුනට තෘෂ්ණාව බෙහෙවින් වැඩුනී ය. ඔවුහු එහිදී මතුරු ගොතා ඔකාවස් රජු වෙත යළිදු එළැඹියහ.

309. ජලය හා පෘථිවිය ද අමුරන් හා ධන ධාන්‍ය ද යම්බඳු වේ නම් මිනිස්නට ගවයෝ ද එබඳු වෙති, ඒ වනාහි ප්‍රාණීනට ජීවනොපකරණයෙකි. යුෂ්මතාගේ බොහෝවූ වස්තුව යාගයෙහි යොදව, යුෂ්මතාගේ බොහෝ වූ ධනය දන් දෙව යි කීහ.

310. එවිට ද බමුණන් විසින් කරුණු ගන්වනලද මහාරථී වූ රජ තවත් නොයෙක් සියදහස්ගණන් ගෙරින් යඥ සඳහා නැසී ය.

311. කළ පුරා දෙවන හීලෑ වූ එළුවන් බඳු වූ ගව දෙන්නු පයිනු දූ අඟිනුදු අන්කිසිවකිනුදු අනුන් නො පෙළත් ම ය. රජ ඔවුන් හඟෙහි ගෙණ සැතින් පැහැර මැරී ය.

312. එ කල්හි දෙවියෝ ද බ්‍රහ්මයෝ ද ඉන්ද්‍රයා ද අසුර රාක්ෂසයෝ ද "යම් හෙයෙකින් ගවයා කෙරෙහි සැත් හෙළී (මැරී) ද එහෙයින් අධර්මය උපනැ"යි හැඬූහ.

313. පූර්වයෙහි ආශා යැ කුසගින්න යැ ජරා යැ යන රොග තිදෙනෙක් ම වූහ, පශුවධය හේතු කොට ගෙණ (ඒ තුණ) අටඅනූවකට පැමිණියේ ය.

314. නිදෙස් ගවදෙනුන් මරත් ය. යන යමෙක් ඇද්ද, යාගකරන්නෝ යමක් හේතු කොට ගෙන දැහැමින් පිරිහෙත් ද ඒ මේ පැරණි අධර්මය දඬුවම්වලට (හෙවත් තුන් කායදුශ්චරිතයනට) ඇතුළත් එකෙක් විය.

315 එවමෙසො අණුධම්මො පොරාණො විඤ්ඤුගරහිතො
යත්ථ එදිසකං පස්සති යාජකං ගරහති ජනො.

316 එවං ධම්මෙ වියාපන්නෙ විභින්නා සුද්දවෙස්සිකා
පුථු විභින්නා ඛත්තියා පතිං හරිය 'වමඤ්ඤථ.

317 ඛත්තියා බ්‍රහ්මබන්ධූ ච යෙ චඤ්ඤෙ ගොත්තරක්ඛිතා
ජාතිවාදං නිරංකත්වා කාමානං වසමන්වගුන්ති.

එවං වුත්තෙ තෙ බ්‍රාහ්මණමහාසාලා භගවන්තං එතදවොචුං: අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම. සෙය්‍යථාපි භො ගොතම, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති, එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො, එතෙ මයං භවන්තං ගොතමං සරණං ගච්ඡාම ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච, උපාසකෙ නො භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතෙ සරණං ගතෙ'ති.

බ්‍රාහ්මණධම්මිකසුත්තං නිට්ඨිතං.

## 2 – 8

## ධම්ම (නාවා)[1] සුත්තං

318 යස්මා හි ධම්මං පුරිසො විජඤ්ඤා
ඉන්දං' ව නං දෙවතා පූජයෙය්‍ය,
සො පූජිතො තස්මිං පසන්නචිත්තො
බහුස්සුතො පාතුකරොති ධම්මං.

319 තදට්ඨිකත්වාන නිසම්ම ධීරො
ධම්මානුධම්මං පටිපජ්ජමානො,
විඤ්ඤූ විභාවී නිපුණො ච හොති
යො තාදිසං භජතෙ අප්පමත්තො.

320 ඛුද්දඤ්ච බාලං උපසෙවමානො
අනාගතත්ථඤ්ච උසූයකඤ්ච,
ඉධෙව ධම්මං අවිභාවයිත්වා
අවිතිණ්ණකඞ්ඛො මරණං උපෙති.

1. නාවාසුත්තං - සු. සිමු. ı



Free Distribution www.aathaapi.org

315. යම් යාගයෙක්හි ජනයා මෙසේ (ගොඝාතක) යාජකයකු දක්නේ ද, ගරහන්නේ ද, මේ පැරණි ලාමකධර්මය මෙසේ නුවණැත්තන් විසින් ගරහන ලද්දේ වේ.

316. 317. මෙසේ බමුණුදහම පෙරළුනු කල්හි ශූද්‍ර- වෛශ්‍යයෝ ද බෙහෙවින් බෙදුනහ. බොහෝ ක්ෂත්‍රියයෝ ද බෙදී ගියහ. බිරිය හිමියා හෙළා දුටුවාය. ක්ෂත්‍රියයෝ ද බ්‍රාහ්මණයෝ ද සෙසු කුලගොත් රක්නාහු ද ජාතිවාදය නො සලකා කාමයන්ගේ වශයට ගියහ.

මෙසේ වදළ කල්හි ඒ බමුණුමහසල්හු භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළකළාහුය: "භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනැවි, භවත් ගෞතමයන් වහන්ස, ඉතා මැනැවි, භවත් ගෞතමයන් වහන්ස, යටිකුරු වූවක් උඩුකුරු කරන්නේ හෝ වසන ලද්දක් විවෘත කරන්නේ හෝ මං- මුළාවූවකුට මග කියන්නේ හෝ "ඇස් ඇත්තෝ රූ දකින්නාහුය"යි අඳුරෙහි තෙල් පහනක් දරන්නෝ හෝ යම්සේ නම් එසෙයින්ම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් ධර්මය ප්‍රකාශ කරණ ලද්දේය, මේ අපි භවත් ගෞතමයන් වහන්සේ ද ධර්මය ද භික්ෂුසඞ්ඝයා ද සරණ යමු. භවත් ගෞතමයන් වහන්සේ අප අද පටන් දිවිහිමියෙන් සරණ ගිය උවසුවන් කොට දරණ සේක්වා!

**බ්‍රාහ්මණධම්මික සූත්‍රය නිමි.**

## 2 – 8
## ධම්ම (නාවා) සූත්‍රය

318. යම් පුද්ගලයකු වෙතින් පුරුෂ (පර්යාප්තිප්‍රතිපත්ති) ධර්මය දැනගන්නේ ද, දෙවියන් ඉන්ද්‍රයා මෙන් හේ ඔහු පුදන්නේය. බහුශ්‍රැත වූ හේ පුදනලද්දේ ඔහු කෙරෙහි පහන් සිත් ඇත්තේ ධර්මය පාළ කෙරෙයි.

319. යමෙක් නොපමාවූයේ එබන්දකු ඇසුරු කෙරේ ද, ධර්මානු- ධර්මය පිළිපදනා ඒ ධීර තෙම අර්ථවත් කොට අසා ප්‍රඥවත් වූයේ පරහට ඉගැන්වීමෙහි සමත් වූයේ සූක්ෂ්මාර්ථ වටහා ගැනීමෙහි නිපුණ ද වේ.

320. ක්ෂුද්‍ර කායකර්මාදියෙන් යුක්ත වූ ප්‍රඥ නැති නොලද පර්යාප්ති ප්‍රතිවේධාර්ථ ඇති (අතවැසියාගේ දියුණුවෙහි) ඊර්ෂ්‍යා කරණ- සුලු ඇදුරකු සෙවුනා තැනැත්තේ (පර්යාප්ති ප්‍රතිපත්ති) ධර්මය නො දැන නො ඉක්මවූ සැක ඇත්තේ මරණයට පැමිණේ.



Free Distribution www.aathaapi.org

321 යථා නරො ආපගං ඔතරිත්වා
මහොදකං[1] සලිලං සීඝසොතං,
සො වුය්හමානො අනුසොතගාමී
කිං සො පරෙ සක්කති තාරයෙතං.

322 තථෙව ධම්මං අවිභාවයිත්වා
බහුස්සුතානං අනිසාමයත්ථ,
සයං අජානං අවිතිණ්ණකඞ්ඛො
කිං සො පරෙ සක්කති නිජ්ඣාපෙතුං.

323 යථාපි නාවං දළ්හමාරුහිත්වා
පියෙන' රිත්තෙන සමඞ්ගිභූතො,
සො තාරයෙ තත්ථ බහූපි අඤ්ඤෙ
තත්‍රූපායඤ්ඤූ කුසලො මුතීමා.

324 එවම්පි යො වෙදගූ භාවිතත්තො
බහුස්සුතො හොති අවෙධධම්මො,
සො ඛො පරෙ නිජ්ඣපයෙ පජානං
සොතාවධානූපනිසූපපන්නෙ.

325 තස්මා හවෙ සප්පුරිසං භජෙථ
මෙධාවිනඤ්චෙව බහුස්සුතඤ්ච,
අඤ්ඤාය අත්ථං පටිපජ්ජමානො
විඤ්ඤාතධම්මො සො සුඛං ලභෙථාති.

ධම්ම[2]සුත්තං නිට්ඨිතං.

## 2 – 9

## කිංසීලසුත්තං

326 කිංසීලො කිංසමාචාරො කානි කම්මානි බ්‍රූහයං
නරො සම්මා නිවිට්ඨස්ස උත්තමත්ථඤ්ච පාපුණෙ.

327 වුද්ධාපචායී අනුසුය්‍යකො සියා
කාලඤ්ඤූ චස්ස ගරූනං දස්සනාය
ධම්මිං කථං එරයිතං ඛණඤ්ඤූ
සුණෙය්‍ය සක්කච්ච සුභාසිතානි.

1. මහොදිකං – සිමු 1.
සරිතං – පු.
2. නාවා – සිමු.



Free Distribution www.aathaapi.org

321. ඒ මිනිස් මහදිය ඇති, ඔබමොබ පැතුරුණු සැඩ දියපහර ඇති, නදියකට බැස ගසාගෙණ යනුලබන්නේ යම්සේ දියවැල අනුව යන සුලු වේ ද, කිම, හේ මෙරමා එතෙර කරවීමට හැකි වේ ද?

322. එලෙසින් ම ධර්මය නො දන බහුශ්‍රැතයන්ගෙන් අර්ථය ද නො අසා පහකළ සැක නැත්තේ, තෙමේත් නො දන්නා හේ කිම, මෙරමාහට අරුත් දක්වන්නට (උගන්වන්නට) හැකි වේ ද?

323. යම්සේ හබලින් හා රිටින් යුත් ඒ නැවි තෙමේ දැඩි ව නැවට නැගී ඒ නාවුකොපායය දන්නේ දක්ෂ වූයේ (උපන් උවදුරට පිළියම් කිරීම) දන්නා නුවණැත්තේ එහි බොහෝ අන් මිනිසුන් ද එතෙර කරවා ද,

324. එසේ ම යමෙක් බහුශ්‍රැත වූයේ සිවුවන නුවණින් තිවනට පැමිණියේ බැවූ සිත් ඇත්තේ (අටලෝ දහමින්) නො සැලෙන සැහැවි ඇත්තේ වේ ද, හෙතෙමේ ම සවන් යොමු කිරීමෙන් හා මාර්ගඵලොප-නිඃශ්‍රයයෙන් යුක්ත වූයේ අන් ජනයා හට දහම් දක්වන්නේ ය.

325. එහෙයින් එකාන්තයෙන් නුවණැත්තාවූ ද බහුශ්‍රැත වූ ද සත්-පුරුෂයකු භජනය කරන්නේ ය. දත්දහම් ඇති හෙ තෙමේ අර්ථය දන පිළි-පදෙන් ලොවුතුරු සැප ලබන්නේ යි.

ධම්ම (නාවා) සූත්‍රය නිමි.

## 2 – 9

## කිංසීල සූත්‍රය

326. කෙබඳු චාරිත්‍රශීලයෙකින් සමන්විත වූයේ කෙබඳු චාරිත්‍රශීල-යක් ඇත්තේ කවර කායකර්මාදියක් වඩන්නේ පුරුෂ තෙමේ මොනොවට සස්නෙහි පිහිටියේ වන්නේ ද උත්තමාර්ථයට (අර්හත්වයට) ද පැමිණෙන්-නේ ද?

327. (ගුණ–ප්‍රඥාදෙකින්) වැඩිසිටියවුන් පුදන්නේ (ඔවුන්ගේ ලාභා-දියෙහි) ඊර්ෂ්‍යා නැත්තෙක් වන්නේ ය. ගුරුන් දකීමට සුදුසු කල් දන්නෙක් ද වන්නේ ය. (ධර්මකථා) ක්ෂණය දන්නේ දෙසන ලද (සමථ විපස්සනාවෙන් යුත්) දැහැමි කථාව ද (අනෙකුදු) සුභාෂිතයන් ද සකසා අසන්නේ ය.



Free Distribution www.aathaapi.org

328 කාලෙන ගච්ඡෙ ගරූනං සකාසං
ථම්භං නිරංකත්වා නිවාතවුත්ති
අත්ථං ධම්මං සංයමං බ්‍රහ්මචරියං
අනුස්සරෙ චෙව සමාචරෙ ච.

329 ධම්මාරාමො ධම්මරතො
ධම්මෙ ඨිතො ධම්මවිනිච්ඡයඤ්ඤූ,
නෙවාචරෙ ධම්මසන්දොසවාදං
නියෙථ තච්ඡෙහි[1] සුභාසිතෙහි.

330 හස්සං ජප්පං පරිදෙවං පදොසං
මායාකතං කුහකං ගිද්ධිමානං,
සාරම්භකක්කස්සකසාව මුච්ඡං[2]
හිත්වා චරෙ වීතමදො ඨිතත්තො

331 විඤ්ඤාතසාරානි සුභාසිතානි
සුතඤ්ච විඤ්ඤාතසමාධිසාරං,
න තස්ස පඤ්ඤා ච සුතඤ්ච වඩ්ඪති
යො සාහසො හොති නරො පමත්තො.

332 ධම්මෙ ච යෙ අරියපවෙදිතෙ රතා
අනුත්තරා තෙ වචසා මනසා කම්මනා ච
තෙ සන්තිසොරච්චසමාධිසණ්ඨිතා
සුතස්ස පඤ්ඤාය ච සාරමජ්ඣගූති.

කිංසීලසුත්තං නිට්ඨිතං.

## 2–10

## උට්ඨාන සුත්තං

333 උට්ඨහථ නිසීදථ කො අත්ථො සුපිතෙන වො,
ආතුරානං හි කා නිද්දා සල්ලවිද්ධාන රුප්පතං.

334 උට්ඨහථ නිසීදථ දළ්හං සික්ඛථ සන්තියා,
මා වො පමත්තෙ විඤ්ඤාය
මච්චුරාජා අමොහයිත්ථ වසානුගෙ.

---

1. තච්ඡෙහි නීයෙථ – සිමු 1. මජසං.
2. කක්කස්ස – සිමු 1.
   කක්කසං – සිමු 2.



Free Distribution www.aathaapi.org

328. තදබව (මානය) වනසා දමා යටහත් පැවතුම් ඇත්තේ සුදුසු කල්හි ගුරුන් වෙත යන්නේ ය. භාෂිතාර්ථය ද පාළිධර්මය ද ශීලය ද ශාසන-බ්‍රහ්මචර්යය ද අනුස්මරණය කරන්නේ ය. පුරුදු ද කරන්නේ ය.

329. (ශමථ විදර්ශනා) ධර්මයෙහි රුදුනේ (එම) ධර්මයෙහි ම නියැලුනේ ධර්මයෙහි පිහිටියේ (උදයඥාණ වයඥාණ විසින්) ධර්ම විනිශ්චය දන්නේ (සමථ විපස්සනා) ධර්මය කිලිටිකරණ කථා නො ම පුරුදු කරන්නේ ය. සත්‍ය වූ සුභාෂිතවලින් කල් ගත කරන්නේ ය.

330. පහකළ (ආරොග්‍යමදදි) මද ඇත්තේ (චිත්ත වික්ෂේප නැති හෙයින්) පිහිටි සිත් ඇත්තේ සිනාව ද නිසරු තෙපුල් ද (ඥතිව්‍යසනාදි-යෙහි) වැලපීම ද මනඃප්‍රදෙෂය ද (රවටනාබව වන) මායාව ද (ත්‍රිවිධ) කොහොන ද (සිවුපසයෙහි) ගිජුබව ද (ජාතිමානාදි) මානය ද කරණොත්ත-රියකරණ සඬ්ඛ්‍යාත) සාරම්භය ද, පරොස්බස් කියන බව ද, (රාගාදි) කසට ද (අධිකතෘෂ්ණා සඬ්ඛ්‍යාත) මූර්ඡාව ද හැරදමා හැසිරෙන්නේ ය.

331. යම් පුරුෂයෙක් (රාගාදියෙන්) සැහැසි වූයේ (කුසල්දම් නො-වඩනා හෙයින්) පමා වූයේ වේ ද, ඔහුට (සමථවිපස්සනා යී කියනලද) සුභාෂිතයෝ දූනීම හර කොට ඇත්තාහු වෙති. ශ්‍රැතමය ඥනය ද දන්නා-ලද සමාධිය සාරය කොට ඇත්තේ වෙයි. ඔහුගේ ශ්‍රැතය ද ප්‍රඥව ද නො වැඩේ.

332. යමෙක් තුමූ බුද්ධාදි ආර්යයන් විසින් දෙසන ලද ශමථ විදර්ශනා ධර්මයෙහි වචසින් මනසින් හා කර්මයෙන් ඇලුනාහු වෙත් ද ඔහු අනුත්තර වෙති. නිර්වාණ නමැති ශාන්තිය අරමුණු කොට ඇති මාර්ග ප්‍රඥවෙහි හා මාර්ගසමාධියෙහි පිහිටියා වූ ඔහු ශ්‍රැතයාගේ හා ප්‍රඥවේ සාරය වූ අර්හත්ඵල විමුක්තිය ලැබුවාහු ය.

**කිංසීල සූත්‍රය නිමි.**

## 2 – 10

## උට්ඨාන සූත්‍රය

333. (අලසබැවින්) නැගී සිටිවු, (පළක් බැඳ කර්මස්ථානානුයොගය සඳහා) හිඳිවු, තොපට නින්දෙන් කවර අර්ථයෙක් ද? හුලින් විදුනා ලදුව පෙළෙන ආතුරයනට කවර නින්දෙක් ද?

334. නැගී සිටිවු, හිඳගණිවු, (නිර්වාණ) ශාන්තිය පිණිස දැඩි ව හික්මෙවු. තොප පමාවූවන් දූන වසගයන් කොට මරරද නහමක් මුළා-කෙරේ වා!

335 යාය දෙවා මනුස්සා ච සිතා තිට්ඨන්ති අත්ථිකා,
තරථෙතං'විසත්තිකං, ඛණො වො[1] මා උපච්චගා;
ඛණාතීතා හි සොචන්ති නිරයම්හි සමප්පිතා.

336 පමාදෙ රජො පමාදෙ[2] පමාදානුපතිතො රජො,
අප්පමත්තෙන විජ්ජාය අබ්බහෙ සල්ලමත්තනොති.

උට්ඨානසුත්තං නිට්ඨිතං.

## 2–11

## රාහුල සුත්තං

337 කච්චි අභිණ්හසංවාසා නාවජානාසි පණ්ඩිතං
උක්කාධාරො මනුස්සානං කච්චි අපචිතො තයා[3]

338 නාහං අභිණ්හසංවාසා අවජානාමි පණ්ඩිතං,
උක්කාධාරො මනුස්සානං නිච්චං අපචිතො මයා.

339 පඤ්චකාමගුණෙ හිත්වා පියරූපෙ මනොරමෙ,
සද්ධාය ඝරා නික්ඛම්ම දුක්ඛස්සන්තකරො භව.

340 මිත්තෙ භජස්සු කල්‍යාණෙ පන්තඤ්ච[4] සයනාසනං,
විවිත්තං අප්පනිග්ඝොසං මත්තඤ්ඤූ හොහි භොජනෙ.

341 චීවරෙ පිණ්ඩපාතෙ ච පච්චයෙ සයනාසනෙ,
එතෙසු තණ්හං මා කාසි මා ලොකං පුනරාගමි.

342 සංවුතො පාතිමොක්ඛස්මිං ඉන්ද්‍රියෙසු ච පඤ්චසු,
සති කායගතාත්‍යත්ථු නිබ්බිද බහුලො භව.

1. වෙ – සිමු I.
2. පමාද – සිමු 1.
3. තව – ස්‍යා.
4. පන්තඤ්ච – සිමු 1.



Free Distribution www.aathaapi.org

**335.** යම තෘෂ්ණාවක් හේතුකොට ගෙණ (රූප ශබ්ද ආදිය) අර්ථකොට ඇති දෙවියෝ ද මිනිස්සු ද, (ඒ රූපාදි) අරමුණු ඇසුරු කොට සිටිද්ද, (නන් අරමුණුවල විසිර පවත්නා හෙයින්) විසත්තිකා නම් වූ ඒ තෘෂ්ණාව තරණය කරවු. (මේ මහණදම් පිරීමේ) මොහොත තොප නහමක් ඉක්ම යේවා! ක්ෂණය ඉක්ම වූවාහු නිරයෙහි පිහිටියාහු ශෝක කෙරෙත් මය.

**336.** (ස්මෘති විප්‍රවාස සඞ්ඛ්‍යාත) ප්‍රමාදය රජසෙකි. ප්‍රමාදයෙන් යලි-යලි උපන් ප්‍රමාදය ද රජසෙකි. අප්‍රමාදයෙන් ද, (ආශ්‍රවක්ෂයඥාන සඞ්ඛ්‍යාත) විද්‍යාවෙන් ද තමාගේ (රාගාදි පඤ්චවිධ) හුල උදුරා ලන්නේ ය.

**උට්ඨාන සූත්‍රය නිමි.**

## 2 – 11

## රාහුල සූත්‍රය

**337.** කිම නිතර සමග විසීම් හේතුයෙන් තෙපි පණ්ඩිත වූ (සැරියුත්) තෙරුනට අවමන් නො කරවු ද? මිනිසුනට නැණ පහන දල්වන්නේ කිම, තොප විසින් පුදන ලදුයේ ද?

**338.** නිතර සමග විසීම හේතුවෙන් (ඒ) පණ්ඩිතයන් වහන්සේට අවමන් නො කරමි, මිනිසුනට නැණපහන දල්වන ඔබ මා විසින් නිතර පුදන ලද්දහු වෙත්.

**වතුප්ගාථා යි.**

**339.** ප්‍රියස්වරූප වූ මනරම් පස්කම් ගුණ හැරපියා සැදැහැයෙන් ගිහි-ගෙන් නික්ම දුක් කෙළවර කරනුයේ වව.

**340.** කලණමිතුරන් ද ජනශූන්‍ය වූ මහජනහඬින් තොර වූ ප්‍රාන්ත-සෙනසුන් ද ඇසුරු කරව.

**341.** සිවුරෙහි ද පිණ්ඩපාතයෙහි ද ගිලන්පසයෙහි ද සෙනසුන්හි ද යන මෙහි නහමක් තෘෂ්ණා කරව, වැලිත් ලොකයට (උපත් විසින්) නහමක් පැමිණෙව.

**342.** ප්‍රාතිමොක්ෂසංවරශීලයෙහි ද පඤ්චෙන්ද්‍රියයන්හි ද සංවෘත වව. තොප සිත්හි කාගියා සී වේවා! නිර්වෙදය බහුල කොට ඇතියෙක් වව.

343 නිමිත්තං පරිවජ්ජෙහි සුභං රාගූපසංහිතං,
අසුභාය චිත්තං භාවෙහි එකග්ගං සුසමාහිතං.

344 අනිමිත්තඤ්ච භාවෙහි මානානුසයමුජ්ජහ,
තතො මානාභිසමයා උපසන්තො චරිස්සසීති.

ඉත්ථං සුදං භගවා ආයස්මන්තං රාහුලං ඉමාහි ගාථාහි අභිණ්හං ඔවදතීති.

රාහුලසුත්තං නිට්ඨිතං.

## 2–12

## නිග්‍රොධකප්ප සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා ආළවියං විහරති අග්ගාළවෙ චෙතියෙ. තෙන ඛො පන සමයෙන ආයස්මතො වඞ්ගීසස්ස උපජ්ඣායො නිග්‍රොධකප්පො නාම ථෙරො අග්ගාළවෙ චෙතියෙ අචිරපරිනිබ්බුතො හොති.

අථ ඛො ආයස්මතො වංගීසස්ස රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: පරිනිබ්බුතො නු ඛො මෙ උපජ්ඣායො උදාහු නො පරිනිබ්බුතොති.

අථ ඛො ආයස්මා වංගීසො සායන්හසමයං[1] පටිසල්ලානා වුට්ඨිතො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා වංගීසො භගවන්තං එතදවොච: ඉධ මය්හං භන්තෙ රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: පරිනිබ්බුතො නු ඛො මෙ උපජ්ඣායො උදාහු නො පරිනිබ්බුතොති.

අථ ඛො ආයස්මා වඞ්ගීසො උට්ඨායාසනා එකංසං චීවරං කත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං ගාථාය අජ්ඣභාසි:

345 පුච්ඡාම සත්ථාරං අනොමපඤ්ඤං
දිට්ඨෙව ධම්මෙ යො විචිකිච්ඡානං ඡෙත්තා,
අග්ගාළවෙ කාලමකාසි භික්ඛු
ඤාතො යසස්සී අභිනිබ්බුතත්තො.

1. සායණ්හ සමයං - සිමු. 1, 2.



Free Distribution                                                            www.aathaapi.org

343. ශුභ වූ, රාගය ඇසුරු කළ නිමිත්ත දුරලව, අශුභ භාවනායෙහි එකඟ වූ මොනොවට පිහිටි සිත වඩව.

344. (නිත්‍ය නිමිති රහිත බැවින්) අනිමිත්ත වූ විදර්ශනා භාවනාව වඩව. මානානුසය රහත්මගින් දුර ලව. ඉක්බිති මානයාගේ ව්‍යපශමයෙන් උපශාන්ත වූයේ හැසිරෙව යනු යි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් රාහුලයනට මේ ගාථාවලින් නිතර අවවාද කරණ සේක.

**රාහුල සූත්‍රය නිමි.**

## 2 – 12
## නිග්‍රොධකප්ප (වඞ්ගීස) සූත්‍රය

මා විසින් මෙසේ අසනලදී: එක්සමයෙක් හි භාග්‍යවතුන් වහන්සේ අළවුරට අග්ගාළව නම් චෛත්‍යයෙහි වැඩවසන සේක. එසමයෙහි ආයුෂ්මත් **වඞ්ගීස** තෙරුන්ගේ **නිග්‍රොධකප්ප** නම් වත් තෙරණුවෝ **අග්ගාලව චෛතියෙහි දී** පිරිනිවි නොබෝකල් ඇති වෙත්.

ඉක්බිති ගණයා කෙරෙන් වෙන්ව විවේකයට ගිය පිළිසලනෙහි යෙදුනු ආයුෂ්මත් **වඞ්ගීස** තෙරුන්ගේ සිත්හි මෙබඳු පරිවිතර්කයෙක් උපන: ''මාගේ උපාධ්‍යාය පිරිනිවියේ දෝ හෝ නො පිරිනිවියේ දෝ හෝ'' යි.

ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිර සවස් කල්හි පිළිසලනින් නැගිටියේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත් පස්ව හුන්නේය. එකත් පසෙක හුන්නේ ම ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිර භාග්‍යවතුන් වහන්සේට මෙල සැලකෙළේ ය: ස්වාමීනි, මෙහි විවේකස්ථානයට ගියා වූ පිළිසලනෙහි ඇළුනු මාගේ සිත්හි මෙබඳු පරිවිතර්කයෙක් උපන: ''මාගේ උපාධ්‍යාය පිරිනිවියේ දෝ නො පිරිනිවියේ දෝ'' යි.

ඉක්බිති ආයුෂ්මත් වඞ්ගීස තෙරණුවෝ හුනස්නෙන් නැගී සිවුර එකස් කොට භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිළි නමා භගවත් හට ගාථායෙන් (මෙසේ) කීහ:

345. යම් භාග්‍යවතුන් වහන්සේ කෙනෙක් ඉහාත්මභාවයෙහි ම සැක දුරලන්නාහු වෙත් ද, මහාප්‍රාඥ ශාස්තෘ වූ මුබවහන්සේ පුළුවුස්මි. ප්‍රකට වූ යශස්වී වූ නිවුනු සිත්ඇති මහණකෙනෙක් අග්ගාලව චෛත්‍යයෙහි කලුරිය කළහ.



Free Distribution www.aathaapi.org

346 නිග්‍රොධකප්පො ඉති තස්ස නාම,
තයා කතං භගවා බ්‍රාහ්මණස්ස,
සො තං නමස්සං අචරි මුත්‍යපෙක්ඛො
ආරද්ධවිරියො දළ්හධම්මදස්සී.

347 තං සාවකං සක්ක[1] මයම්පි සබ්බෙ
අඤ්ඤාතුමිච්ඡාම සමන්තචක්ඛු,
සමවට්ඨිතා නො සවණාය සොතා
තුවං නො සත්ථා තුවං අනුත්තරොසි.

348 ඡින්දෙව නො විචිකිච්ඡං බ්‍රෑහි මෙතං
පරිනිබ්බුතං වෙදය භූරිපඤ්ඤ,
මජ්ඣෙව නො භාස සමන්තචක්ඛු
සක්කොව දෙවානං[2] සහස්සනෙත්තො.

349 යෙ කෙචි ගන්ථා ඉධ මොහමග්ගා,
අඤ්ඤාණපක්ඛා විචිකිච්ඡට්ඨානා,
තථාගතං පත්වා න තෙ භවන්ති
චක්ඛුං හි එතං පරමං නරානං.

350 නො චෙ හි ජාතු පුරිසො කිලෙසෙ
වාතො යථා අබ්භඝනං විහානෙ,
තමො වස්ස නිවුතො සබ්බලොකො
න ජොතිමන්තොපි නරා තපෙය්‍යුං.

351 ධීරා ච පජ්ජොතකරා භවන්ති
තං තං අහං ධීර තථෙව මඤ්ඤෙ,
විපස්සිනං ඤාතමුපාගමම්හ
පරිසාසු නො ආවිකරොහි කප්පං.

352 ඛිප්පං ගිරං එරය වග්ගුවග්ගුං
හංසොව පග්ගය්හ සනිකං නිකූජ[3],
බින්දුස්සරෙන සුවිකප්පිතෙන
සබ්බෙව තෙ උජ්ජුගතා සුණොම.

---

1. සක්‍ය - මජසං,
2. දෙවාන - මජසං,
3. සණිං නිකුඤ්ජ - සිමු. 1.
සණිං නිකූජ - සිමු 2,



Free Distribution www.aathaapi.org

**346.** භාග්‍යවතුන් වහන්ස, එ බ්‍රාහ්මණජාතිකයාහට නිග්‍රොධකප්ප යන නම ඔබවහන්සේ විසින් කරණ ලද. දෘඪ වූ (නිර්වාණ)ධර්මය දක්නා වූ හෙ ඇරයු වැර ඇත්තේ (නිර්වාණ සංඛ්‍යාත) මොක්ෂය පතන්නේ ඔබවහන්සේ නමදිමින් විසී ය.

**347.** ශාක්‍යකුලයෙහි උපන්නාවූ සමතැසානන් වහන්ස, අපි සැවො ම ඒ සව්වානන් දනගණු කැමැත්තෙමු. ඇසීම පිණිස අපගේ සවන් එළඹ සිටියේ ය. මුබවහන්සේ අපගේ ශාස්තෘ වනසේක. මුබවහන්සේ අනුත්තර වනසේක.

**348.** මහාප්‍රාඥයන් වහන්ස, එකාන්තයෙන්ම අපගේ සැකය සිඳලන සේක්වා: මට මෙය වදරණසේක්වා! ඔහු පිරිනිවිහිඳු යි දන්වන සේක්වා! සමතැසානන් වහන්ස, දෙවියන්ගේ දහසක් නෙත් ඇති සක්දෙවිදු මෙන් අපගේ මධ්‍යයෙහි වොරුදෙන සේක් වා!

**349.** මෙ ලොව්හි මෝහමාර්ගී වූ අවිද්‍යාපක්ෂයෙහි වූ, සැකයනට හේතු වූ, යම්කිසි (අභිධ්‍යාදි වූ) ග්‍රන්ථයෝ වෙත් නම්, තථාගතයන් වහන්සේ වෙත පැමිණ ඔහු නො මැ වෙති. යම්හෙයෙකින් තෙල (තථාගත) මනුෂ්‍යයන්ගේ උතුම් පැණැස වේ නම් එහෙයිනි.

**350.** ඉදින් යම් හෙයෙකින් (තථාගත) පුරුෂ එකාන්තයෙන් මාරුතය වලාකුල් රොදක් මෙන් කෙලෙස් නො නසාලන්නේ නම්, (එසේ වත්ම), මුළු ලොව අවිද්‍යාන්ධකාරයෙන් ඇවුරුණේ අඳුරුම වන්නේ ය. (සැරියුත් මහතෙර ආදී වූ) ජ්‍යොතිර්මත් මනුෂ්‍යයෝ ද (ප්‍රකට වීම් වශයෙන්) නො මැ තෙවුනාහ.

**351.** පණ්ඩිතයෝ ම ප්‍රඥප්‍රද්‍යොතකර වෙති. වීරයන් වහන්ස, ඒ ඔබ එසේ ම යයි මම හඟිම්, (අපි) මුබවහන්සේ 'විදර්ශී'යි දන්නමෝ (මෙහි) එළඹියෙමු. පිරිස් මැද අපගේ (නිග්‍රොධ) කප්ප තෙරුන් ප්‍රකටකරණ සේක්වා!

**352.** මොනොවට කල්පිත වූ බින්දුස්වරයෙන් වහා (අරුත් රසින්) ඉතා මනරම් වූ තෙපුල් වදරණසේක්වා! හංසයකු මෙන් ගෙල ඔසොවා නාද කරණ සේක්වා! ඉදුසිත් ඇති අපි හැම මුබවහන්සේ ගේ බස් අසමහ,

353 පහීනජාතිමරණං අසෙසං
නිග්ගය්හ ධොනං වදෙස්සාමි ධම්මං,
න කාමකාරො හි පුථුජ්ජනානං
සඞ්ඛෙය්‍යකාරොච තථාගතානං.

354 සම්පන්නවෙය්‍යාකරණං තවෙදං
සමුජ්ජුපඤ්ඤස්ස සමුග්ගහීතං,
අයමඤ්ජලී පච්ඡිමො සුප්පණාමිතො
මා මොහයී ජාන'මනොමපඤ්ඤ.

355 පරොවරං අරියධම්මං විදිත්වා
මා මොහයී ජාන'මනොමවීර,
වාරිං යථා ඝම්මනි ඝම්මතත්තො
වාචාභිකඞ්ඛාමි සුතං පවස්ස.[1]

356 යදත්ථිකං බ්‍රහ්මචරියං අචාරී[2]
කප්පායනො කච්චිස්ස තං අමොඝං,
නිබ්බායි සො ආදු උපාදිසෙසො
යථා විමුත්තො අහු තං සුණොම.

357 අච්ඡෙච්ඡි තණ්හං ඉධ නාමරූපෙ (ඉති භගවා)
කණ්හස්ස සොතං දීඝරත්තානුසයිතං,
අතාරි ජාතිමරණං අසෙසං
ඉච්චබ්‍රවී භගවා පඤ්චසෙට්ඨො.

358 එස සුත්වා පසීදාමි වචො තෙ ඉසිසත්තම,
අමොඝං කිර මෙ පුට්ඨං න මං වඤ්චෙසි බ්‍රාහ්මණො.

359 යථාවාදී තථාකාරී අහු බුද්ධස්ස සාවකො,
අච්ඡිද මච්චුනො ජාලං තතං මායාවිනො දළ්හං.

360 අද්දස භගවා ආදිං උපාදනස්ස කප්පියො,
අච්චගා වත කප්පායනො මච්චුධෙය්‍යං සුදුත්තරන්ති.

නිග්‍රොධකප්පසුත්තං නිට්ඨිතං.

1. සුතගෙ වස්ස – සු.
2. අචරි – සිමු 2



Free Distribution www.aathaapi.org

353. නිරවශේෂ කොට ප්‍රහීණ කළ ජාතිමරණ ඇති නිගෙණ වැනැසූ පව් ඇති තථාගතයන් ලවා දහම් දෙස්වන්නෙමි, පුහුදුනන් බඳු කැමැතිසේ කිරීමෙක් තථාගතයනට නැත් මැ යි. තථාගතයන් වහන්සේගේ මීමාංසාකාරය ම වේ.

354. මොනොවට සෘජු වූ ප්‍රඥ ඇති මුබවහන්සේ ගේ මේ සම්පූර්ණ වූ ව්‍යාකරණ ඇති බව (අප විසින්) මැනවින් දැනගන්නා ලද්දෙකි. මේ පැසුළු අ දිලි නැමදුම් මොනොවට කරණ ලදී. (නිග්‍රොධකප්ප තෙරුන්ගේ ගතිය) දන්නාසේක් ම, මහාප්‍රාඥයන් වහන්ස, අප නහමක් මුළා කරණ සේක්වා!

355. උත්තම වීරයන් වහන්ස, කුදුමහත් චතුරාර්ය සත්‍ය ධර්මය පිළිවිද දන්නාසේක් ම (අප) මුළා නො කරණ සේක්වා, ග්‍රීෂ්මකාලයෙහි උෂ්ණයෙන් තැවුනකු ජලය පතන්නා සේ (මුබවහන්සේගෙන්) බසක් පතමි, ශ්‍රැතය (ශබ්දයතනය) වස්වන සේක්වා!

356. (නිග්‍රොධ) කප්පායන තෙරණුවෝ යම් රහත් බවක් අර්‍ථ කොට ඇති (මාර්‍ග) බ්‍රහ්මචර්යයක් කොළෝ නම් කිම, ඔහුට එය නොසිස් වීද? හෙතෙමේ විමුක්තයකු (අශෛක්ෂයකු) මෙන් (අනුපාදිසෙසපරිනිබ්බාණ-යෙන්) පිරිනිවියේ ද? නැතහොත් උපාදිසෙස සහිත (ශෛක්ෂ) යෙක් වී ද? එය (අපි) අසම්හ.

357. (හෙ) මේ නාමරූපයෙහි දීර්ඝ රාත්‍රයෙහි අනුශයිත තෘෂ්ණයා (මාරයා) ගේ ස්‍රොතස වූ තෘෂ්ණාව සිඳලීය. නිරවශෙෂ කොට ජාති මරණ දෙක තරණය කෙළේ ය යි (ශ්‍රද්ධාදි) පඤ්චධර්මයෙන් ද පසැස් නුවණින් ද ශ්‍රෙෂ්ඨ වූ භාග්‍යවතුන් වහන්සේ වදළ සේක.

358. උත්තම වූ මහර්ෂීන් වහන්ස, තොපගේ බස අසා තෙල මම ප්‍රසන්නයෙමි. මා විසින් පුළුවුස්නාලද්ද නො සිස් ම වීය. (බාහිතපාප වූ) බ්‍රාහ්මණයෝ මා නො රැවටූහු.

359. බුදුරජහුගේ සවු (නිග්‍රොධකප්ප) යථාවාදී තථාකාරී වීය. මායාවී වූ මාරයාගේ දැඩිව පතළා වූ (තෘෂ්ණා) ජාලය සිඳලීය.

360. භාග්‍යවතුන් වහන්ස, කප්ප තෙරණුවෝ (ත්‍රිවිධ) වෘත්තයා ගේ (අවිද්‍යා තෘෂ්ණා හෙද ඇති) ප්‍රධානකාරණය දුටුහ. ඒකාන්තයෙන් කප්පායනයෝ දුකසේ තරණය කළ යුතු (ත්‍රෛභූමක වෘත්ත සඞ්ඛ්‍යාත) මාරභූමිය ඉක්මැ ගියහ යි.

**නිග්‍රොධකප්ප (වංගීස) සූත්‍රය නිමි.**

## 2–13

## සම්මාපරිබ්බාජනීය සුත්තං

361 පුච්ඡාමි මුනිං පහූතපඤ්ඤං
තිණ්ණං පාරගතං පරිනිබ්බුතං ඨිතත්තං,
නික්ඛම්ම ඝරා පනුජ්ජ කාමෙ
කථං භික්ඛු සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

362 යස්ස මඞ්ගලා සමූහතා (ඉති භගවා)
උප්පාතසුපිනා ච ලක්ඛණා ච,
සො මඞ්ගලදොසවිප්පහීනො භික්ඛු
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

363 රාගං විනයෙථ මානුසෙසු
දිබ්බෙසු කාමෙසු චාපි භික්ඛු,
අතික්කම්ම භවං සමෙච්ච ධම්මං
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

364 විපිට්ඨි කත්වාන පෙසුනානි
කොධං කදරියං ජහෙය්‍ය භික්ඛු,
අනුරොධවිරොධවිප්පහීනො
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

365 හිත්වාන පියඤ්ච අප්පියඤ්ච
අනුපාදය අනිස්සිතො කුහිඤ්චි,
සංයොජනියෙහි විප්පමුත්තො
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

366 න සො උපධීසු සාරමෙති
ආදානෙසු විනෙය්‍ය ඡන්දරාගං,
සො අනිස්සිතො අනඤ්ඤනෙය්‍යො
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

367 වචසා මනසා ච කම්මනා ච
අවිරුද්ධො සම්මා විදිත්වා ධම්මං,
නිබ්බානපදාභිපත්ථයානො
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

1. මහාසමයසුත්තන්තම්පි පු.



Free Distribution www.aathaapi.org

## 2 – 13
## සම්මාපරිබ්බාජනීය සූත්‍රය

361. මහාප්‍රාඥ වූ, චතුරෝඝ තරණය කළා වූ, නිවන් පරතෙර ගියා වූ, කෙලෙස් පිරිනිවියා වූ, (අටලෝ දහමින් නොසැලෙන හෙයින්) අකම්ප්‍ය වූ සිත් ඇති, මුනිහු පුළුවුසුම්හ: ගිහිගෙන් නික්ම වස්තුකාමයන් දුරලා ලොව්හි නොඇලී එ ප්‍රකටමහණ කෙසේ මොනොවට වෙසෙන්නේද හෙවත් ලොවින් නික්ම යේ ද?

362. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදළ සේක:) යමක්හු විසින් (දිට්ඨමඞ්ගලාදී) මඞ්ගලයෝ ද උල්කාපාතාදි උත්පාතාභිනිවෙශයෝ ද ස්වප්නාභිනිවෙශයෝ ද ලක්ෂණාභිනිවෙශයෝ ද මොනොවට සිඳින-ලද්දහු ද, හේ මඞ්ගලදෝෂයන් ප්‍රහීණ කෙළේ වෙයි. හෙ (රහත් මහණ) ලොව්හි නොඇලී මනා සේ වෙසෙයි. (ලොව ඉක්මවා යන්නේය යි සේයි.)

363. මහණ මානුෂික වූ ද, දිව්‍ය වූ ද කාමවිෂයන්හි රාගය (අනාගාමී මගින්) දුරුකරන්නේ ය. (චතුස්සත්‍යභෙද වූ) ධර්මය (අර්හත්) මාර්ගයෙන් `පරිඥාභිසමයාදි වශයෙන්) දැන (ත්‍රිවිධ) භවය ඉක්මවා හෙ ලොව්හි සියල්ල මනා සේ හැරපියා යෙයි.

364. මහණ පෙහෙසුන් ද ක්‍රොධය ද මසුරුබව ද දුරු කොට හැරපියන්නේ ය: (සියලු වස්තූන්හි) ප්‍රහීණ වූ රාග දොෂ ඇතියේ හෙ මොනොවට ලොව්හි සියල්ල හැරපියා යෙයි.

365. (සත්ත්ව සංස්කාර වශයෙන් ද්විවිධ වූ) ප්‍රිය වූ ද අප්‍රිය වූ ද රාග දොෂයන් හැරපියා (සිවු උපාදානයන්ගේ වශයෙන්) කිසිදු ධර්මයක් (නිත්‍යාදි විසින්) නො ගෙණ, (රූපාදි ධර්මයන්හි හෝ භවයන්හි) කිසිදු තැනෙක්හි තෘෂ්ණාදිට්ඨි නිශ්‍රය වශයෙන්) ඇසුරු නො කෙළේ (දශවිධ සංයොජනයට විෂය වූ) ත්‍රෛභූමකධර්මයන් ගෙන් වෙසෙසින් මිදුනේ හෙ මොනොවට ලොව්හි සියල්ල හැරපියා යෙයි.

366. හේ සියලු උපධීන් සාර විසින් නොමැ දකියි. ස්කන්ධාදී ආදානයන් කෙරෙහි පවත්නා ඡන්දරාගය හැරපියා තෘෂ්ණාදෘෂ්ටි දෙක ඇසුරු නො කෙළේ, හෙ කිසිවකු විසිනුදු නොපැමිණෑවිය හෙයි. ලොව්හි සියල්ල මොනොවට හැරපියා යෙයි.

367. වචසින් මනසින් හා කර්මයෙන් (සුචරිතයෙන් හා) විරුද්ධ නො වූයේ (මාර්ගඥානයෙන්) සිවුසස් දහම් මොනොවට දැන (අනුපාදිසෙස වූ) ස්කන්ධනිර්වාණපදය පතන්නේ හේ ලොව්හි සියල්ල සම්‍යක් හෙතුයෙන් හැරපියා යෙයි.

368 යො වන්‍දති මං[1] න උණ්ණමෙය්‍ය
අක්කුට්ඨොපි න සන්ධියෙථ භික්ඛු,
ලද්ධා පරභොජනං න මජ්ජෙ,
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

369 ලොභඤ්ච භවඤ්ච විප්පහාය
විරතො ඡෙදනබන්‍ධනාතො භික්ඛු,
සො තිණ්ණකථංකථො විසල්ලො
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

370 සාරුප්පමත්තනො විදිත්වා
න ච භික්ඛු හිංසෙය්‍ය කඤ්චි ලොකෙ,
යථා තථියං විදිත්වා ධම්මං
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

371 යස්සානුසයා න සන්ති කෙචි
මූලා අකුසලා සමූහතා සෙ,
සො නිරාසයො අනාසයානො
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

372 ආසවඛීණො පහීනමානො
සබ්බං රාගපථං උපාතිවත්තො,
දන්තො පරිනිබ්බුතො ඨිතත්තො
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

373 සද්ධො සුතවා නියාමදස්සී
වග්ගගතෙසු න වග්ගසාරී ධීරො,
ලොභං දොසං විනෙය්‍ය පටිඝං
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

374 සංසුද්ධජිනො විවත්තච්ඡද්දො
ධම්මෙසු වසී පාරගූ අනෙජො,
සඞ්ඛාරනිරොධඤාණකුසලො
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

1. මං (ක) සීමු 1. 2.



Free Distribution www.aathaapi.org

368. යම් මහණෙක් මෙ මා වඳනේ යයි අභිමාන නොකරන්නේ ද (දශවිධාක්‍රොශයෙන්) ආක්‍රොශ කරණ ලදුයේ නමුදු බද්ධවෛර නො කරන්නේ ද, මෙරමා විසින් දුන් බොජුන් ලබා මදයට නො පැමිණෙන්නේ ද, හේ ලොව්හි සියල්ල සම්‍යක් හෙතුයෙන් හැරපියා යෙයි.

369. ඒ (රහත්) මහණ විෂයලොභය ද (කාමභවාදී) භවයද වෙසෙසින් ප්‍රහීණ කොට (මෙරමා) සිදුම්බැඳුම්වලින් වෙන් වූයේ තරණය කළ කථංකථීභාව (සැක) ඇත්තේ, එහෙයින් ම විගත ශල්‍ය ඇත්තේ වෙයි. හෙ ලොව්හි සියල්ල සම්‍යක්හෙතුයෙන් හැර පියා යෙයි.

370. තමාගේ සරුප් පිළිවෙත දන මහණ ලොව්හි කිසිවකු නො ද පෙළන්නේ ය. යථාභූතය වන (ස්කන්ධාදි භෙද ඇති) සිවුසස් දහම් දන ඒ භික්ෂු ලොව්හි සියල්ල මැනැවින් හැර පියා යෙයි.

371. යම් මහණකු හට කිසිදු අනුශය කෙනෙක් නැත් ද, අකුශල මූලයෝ ද සමූහනනය කරණ ලද්දහු ද, හෙ තෘෂ්ණා රහිත වූයේ (කිසිවක්) නොපතන්නේ වෙයි. හේ ලොව්හි සියල්ල මොනොවට හැර පියා යෙයි.

372. ක්ෂීණාස්‍රව වූයේ ප්‍රහීණ කළ (නවවිධ) මාන ඇතියේ රාගයට විෂය වූ (ත්‍රෛභූමක) ධර්මසමූහය (පරිඥප්‍රහාණ වශයෙන්) ඉක්ම වූයේ (ආර්ය දමථයෙන්) දමුනේ (කෙලෙස් ගිනි) පිරිනිවීමෙන් පිරිනිවියේ (අටලෝදමින් නොසැලෙන හෙයින්) ස්ථිතාත්ම වූ ඒ මහණ ලොව්හි සියල්ල හැරපියා යෙයි.

373. (බුද්ධාදි ගුණයන්හි) අවෙත්‍යප්‍රසාදයෙන් ශ්‍රද්ධා ඇත්තේ, පාරමාර්ථික ශ්‍රැත ඇත්තේ, නියාම සඞ්ඛ්‍යාත මාර්ගය දක්නා සුලු වූයේ, (දෙසැට මිසදිටු නැමැති වර්ගයනට ගියවුන් අතර) වර්ගසාරී නො වූ ඒ ධීර තෙමේ ලොභ ද්වෙෂ ප්‍රතිඝයන් නසා ලොව්හි සියල්ල මැනැවින් හැරපියා යෙයි.

374. පිරිසිදු රහත් මගින් දිනූ කෙලෙස් ඇති, විවෘත කළ (රාග ද්වෙෂ මොහ සඞ්ඛ්‍යාත) සෙවෙණි ඇති, සිවුසස් දහම්හි වශිප්‍රාප්ත වූ, නිවන් පරතෙර ගියා වූ, පහකළ තෘෂ්ණා චලනයන් ඇති, (නිර්වාණ සඞ්ඛ්‍යාත) සංස්කාර නිරොධය විෂය කොට ඇති, (ආර්යමාර්ග) ඥනයෙහි කුශල වූ ඒ (රහත්) මහණ ලොව්හි සියල්ල මොනොවට හැර පියා යෙයි.

375 අතීතෙසු අනාගතෙසු චාපි
කප්පාතීතො අතිච්ච සුද්ධිපඤ්ඤො,
සබ්බායතනෙහි විප්පමුත්තො
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

376 අඤ්ඤාය පදං සමෙච්ච ධම්මං
විවටං දිස්වාන පහානමාසවානං,
සබ්බූපධීනං පරික්ඛයානො
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍ය.

377 අද්ධා හි භගවා තථෙව එතං
යො සො එවං විහාරී දන්තො භික්ඛු,
සබ්බසංයොජනියෙ[1] ච වීතිවත්තො
සම්මා සො ලොකෙ පරිබ්බජෙය්‍යා’ති.

**සම්මාපරිබ්බාජනියසුත්තං නිට්ඨිතං.**

## 1–14

## ධම්මික සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. අථ ඛො ධම්මිකො උපාසකො පඤ්චහි උපාසකසතෙහි සද්ධිං යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ධම්මිකො උපාසකො භගවන්තං ගාථාය අජ්ඣභාසි.

378 පුච්ඡාමි තං ගොතම භූරිපඤ්ඤ
කථංකරො සාවකො සාධු හොති,
යො වා අගාරා අනගාරමෙති
අගාරිනො වා පනුපාසකාසෙ.

379 තුවං හි ලොකස්ස සදෙවකස්ස
ගතිං පජානාසි පරායනඤ්ච,
න චත්ථි තුල්‍යො නිපුණත්ථදස්සී
තුවං හි බුද්ධං පවරං වදන්ති.

1. සබ්බසංයොජනයොග- (මජසං).



Free Distribution www.aathaapi.org

375. අතීත පඤ්චස්කන්ධයන්හි ද අනාගත පඤ්චස්කන්ධයන්හි ද (මම, මාගේ යන) කල්පනයන ඉක්මවූයේ, (අතීත වර්තමාන අනාගත අධ්වත්‍රයය පිළිබඳ සැක) ඉක්මවා අතිශයින් පිරිසිදු වූ ප්‍රඥ ඇත්තේ, සියලු ද්වාදශායතනයන්ගෙන මිදුනු හේ ලොව්හි සියල්ල මනාසේ හැරපියා යෙයි.

376. (චතුස්සත්‍ය) ධර්මපදය (පූර්වභාග ප්‍රඥාවෙන්) දන (එම) සිවුසස් දහම් (අරිමගනැණින්) ප්‍රත්‍යක්ෂ කොට දන, ආශ්‍රවයන්ගේ ප්‍රහාණය (නිර්වාණය) ප්‍රකට කොට දක, සියලු ම උපධීන්ගේ පරික්ෂයයෙන් ඒ මහණ ලොව්හි සියල්ල මොනොවට හැරපියා යෙයි.

377. (නිර්මිත බුද්ධ) භාග්‍යවතුන් වහන්ස, තෙල නිශ්චයෙන එසේ මැයි. යම් ඒ මහණෙක් දමුනේ මෙබඳු විහාර ඇත්තේ වේ ද, සියලුම සංයෝජනීය ධර්මයන් ඉක්මවූයේ වේ ද, හේ ලොව්හි සියල්ල මොනොවට හැරපියා යේ යැ යි.

**සම්මාපරිබ්බාජනීය සූත්‍රය නිමි.**

## 2 – 14

## ධම්මික සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් වූ අනේපිඩු සිටුහුගේ ආරාමයෙහි වැඩවසන සේක. එකල්හි ධම්මික නම් උවසු පන්සියක් උවසුවන් හා සමග භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙකැ හින. එකත්පස් වැ හුන් ධම්මික උපාසක භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් දන්වී ය.

378. මහාප්‍රාඥ වූ ගෞතමයන් වහන්ස, මුඹ වහන්සේ පුළුවුස්මි: යමෙක් ගෙන් නික්මැ සසුන් වදනේ හෝ වේ නම්, ගිහිගෙවැසි උවසුවෝ මැ හෝ වෙත් නම්, (මොවුනතුරෙහි) කිසෙයින් කරනුයේ (පිළිපදනේ) අනවද්‍ය ශ්‍රාවක වේ ද?

379. මුඹ වහන්සේ ම සදේවක ලෝකයාගේ අධ්‍යාශය ගති (නොහොත් නිරයාදි පඤ්චගති) හා, නිෂ්පත්ති (නෝහොත් පරිනිර්වාණය) හා දන්නාසේක. නිපුණාර්ථදර්ශී වූ (මුඹවහන්සේ හා) සදෘශයෙක් නො ද ඇත. මුඹ වහන්සේ මැ ප්‍රවර බුද්ධයහ'යි කියත්.



Free Distribution www.aathaapi.org

380 සබ්බං තුවං ඤාණමවෙච්ච ධම්මං
පකාසෙසි සත්තෙ අනුකම්පමානො,
විවත්තච්ඡද්දාසි සමන්තචක්ඛු
විරොචසි විමලො සබ්බලොකෙ.

381 ආගඤ්ඡි තෙ සන්තිකෙ නාගරාජා
එරාවණො නාම ජිනොති සුත්වා,
සො පි තයා මන්තයිත්වා අජ්ඣගමා
සාධූති සුත්වාන පතීතරූපො.

382 රාජාපි තං වෙස්සවණො කුවෙරො
උපෙති ධම්මං පරිපුච්ඡමානො,
තස්සාපි ත්වං පුච්ඡිතො බ්‍රෑසි ධීර
සො චාපි සුත්වාන පතීතරූපො.

383 යෙ කෙචිමෙ තිත්ථියා වාදසීලා
ආජීවකා වා යදි වා නිගණ්ඨා,
පඤ්ඤාය තං නාතිතරන්ති සබ්බෙ
ඨිතො වජන්තං විය සීඝගාමිං.

384 යෙ කෙචිමෙ බ්‍රාහ්මණා වාදසීලා
වුද්ධා චාපි බ්‍රාහ්මණා සන්ති කෙචි,
සබ්බෙ තයි අත්ථබද්ධා භවන්ති
යෙ චාපි අඤ්ඤෙ වාදිනො මඤ්ඤමානා.

385 අයං හි ධම්මො නිපුණො සුඛො ච
යොයං තයා භගවා සුප්පවුත්තො,
තමෙව සබ්බෙ[1] සුස්සූසමානා
තං නො වද පුච්ඡිතො බුද්ධසෙට්ඨ.

386 සබ්බෙපි මෙ භික්ඛවො සන්නිසින්නා
උපාසකා චාපි තථෙව සොතුං,
සුණන්තු ධම්මං විමලෙනානුබුද්ධං
සුභාසිතං වාසවස්සෙව දෙවා.

387 සුණාථ මෙ භික්ඛවො සාවයාමි වො
ධම්මං ධුතං තඤ්ච චරාථ සබ්බෙ,
ඉරියාපථං පබ්බජිතානුලොමිකං
සෙවෙථ නං අත්ථදස්සී මුතිමා.

1. සබ්බෙ මයං--ස්‍යා.



Free Distribution www.aathaapi.org

380. සව්සත්නට අනුකම්පා කෙරෙමින් මුඹ වහන්සේ ම හැම ඥෙයධර්ම පිළිවිද දන්න හැම නැණ හා සිවුසස්දම් වදහළසේක. සමතැස් මුනිඳුනි, පෙරළු කෙලෙස් සෙවෙණි ඇතියාව, සව්ලොව්හි (රාගාදී මලාභාවයෙන්) විමල වූවහු බබළන්නහු යැ.

381. (මුඹ) කෙලෙස් දිනූහ'යි අසා එරාවණ නම් ඇත්දෙව් රජ ද මුඹ වහන්සේ වෙත ආයේ යැ. හෙ ද මුඹ වහන්සේ හා මන්ත්‍රණ කොට ප්‍රශ්නව්‍යාකරණ අසා මැනැව වහන්සැ'යි සතුටු සැහැවි ඇති වැ ගියේ යැ.

382. කුවෙර නම් වෙසවුණු මහරජ දහම් පුළුවුස්මින් මුඹ වහන්සේ කරා එළඹෙයි. ධීරයන් වහන්ස, ඔහු විසිනුදු පැන පුළුවුස්නාලදුව මුඹ වහන්සේ දහම් දෙසන්නහු යැ. හෙ ද ධර්මව්‍යාකරණ අසා තුටුසැහැවි ඇති විය.

383. ආජීවිකයෝ වෙත්වයි, වැලිත් නිර්ග්‍රන්ථයෝ වෙත්වයි වාද කරණසුලු යම් මැ තීර්ථකයෝ වෙත් නම්, එ හැම ගතිවිකලත්වයෙන් සිටිවනසිටි පුද්ගලයෙක් ශීඝ්‍රගාමී වැ යන්නකු (ඉක්මැනොයේ ද) එමෙන් ප්‍රඥගතියෙන් තුඹ වහන්සේ ඉක්මැ නො යෙත්.

384. වාද කරණසුලු (වඞ්කී ආදී) කිසි බ්‍රාහ්මණයෝ වෙත්වයි (ආශ්වලායනාදී) යම්කිසි වෘද්ධ බ්‍රාහ්මණයෝ වෙත්වයි, (අපි) වාදියම්හ යි හඟනා වූ අන්‍ය වූත් යම් කෙනෙක් වෙත් නම් උහු හැම මුඹ වහන්සේ කෙරෙහි මැ අර්ථ විසින් බැඳුනාහු වෙත්.

385. භාග්‍යවතුන්වහන්ස, මුඹ වහන්සේ විසින් යම් බඳු මෙ සත්තිස් බොධිපාක්ෂිකධර්මයෙක් සුදේශිත වෙ නම්, සියුම් වූ මෙ දහම ලොවී ලොවුතුරු සුව එළවනුයේත් වෙයි. අපි හැම දෙනමෝ එදහම් මැ අසනු කැමැත්තම්හ. බුද්ධශ්‍රේෂ්ඨයන් වහන්ස, (අප විසින්) පුළුවුස්නාලදසේක් එ දහම අපට වදරණසේක්වා.

386. වැඩැහුන් මෙ හැම භික්ෂූහු ද එසෙයින් මැ ධර්මශ්‍රවණයට හුන් උපාසකයෝ ද සක්දෙව්රජහුගේ සුභාෂිතය දෙවියන් (අසනු) සෙයින් විමලයන් වහන්සේ විසින් අනුබුද්ධ වූ ධර්මය අසත්වා.

387. මහණෙනි, ක්ලෙශධූනනය කරන්නා වූ මාගේ ප්‍රතිපත්තිධර්මය තොපට අස්වමි. හැමදෙන එය ධරව. හිතානුදර්ශී ප්‍රාඥ තෙමේ පැවිද්දනට අනුලොම් වූ එ චතුර්විධ ඊර්යාපථය සෙවුනේ ය.

388 න වෙ විකාලෙ විචරෙය්‍ය භික්ඛු
ගාමඤ්ච[1] පිණ්ඩාය චරෙය්‍ය කාලෙ,
අකාලචාරිං හි සජන්ති සඞ්ගා
තස්මා විකාලෙ න චරන්ති බුද්ධා.

389 රූපා ච සද්දා ච රසා ච ගන්ධා
ඵස්සා ච යෙ සම්මදයන්ති සත්තෙ,
එතෙසු ධම්මෙසු විනෙය්‍ය ඡන්දං
කාලෙන සො පවිසෙ පාතරාසං.

390 පිණ්ඩඤ්ච භික්ඛු සමයෙන ලද්ධා
එකො පටික්කම්ම රහො නිසීදෙ,
අජ්ඣත්තචින්තී න මනො බහිද්ධා
නිච්ඡාරයෙ සඞ්ගහිතත්තභාවො.

391 සචෙ පි සො සල්ලපෙ සාවකෙන
අඤ්ඤෙන වා කෙනචි භික්ඛුනා වා,
ධම්මං පණීතං තමුදහරෙය්‍ය
න පෙසුනං නොපි පරුපවාදං.

392 වාදං හි එකෙ පටිසෙනියන්ති
න තෙ පසංසාම පරිත්තපඤ්ඤෙ,
තතො තතො නෙ පසජන්ති සඞ්ගා
චිත්තං හි තෙ තත්ථ ගමෙන්ති දූරෙ.

393 පිණ්ඩං විහාරං සයනාසනඤ්ච
ආපඤ්ච සඞ්ඝාටිරජූපවාහනං,
සුත්වාන ධම්මං සුගතෙන දෙසිතං
සඞ්ඛාය සෙවෙ වරපඤ්ඤසාවකො.

394 තස්මා හි පිණ්ඩෙ සයනාසනෙ ච
ආපෙ ච සඞ්ඝාටිරජූපවාහනෙ,
එතෙසු ධම්මෙසු අනූපලිත්තො
භික්ඛු යථා පොක්ඛරෙ වාරිබින්දු.

1. ගාමෙ ච (මජසං)



Free Distribution www.aathaapi.org

388. මහණ නොකල්හි ගම නොවදනේ ය. සුදුසුකල්හි ම පිඩු සිඟා-යන්නේය.රාගාදි නොයෙක් සඞ්ගයෝ අකාලචාරී මහණ වැළැදගන්නාහ. එහෙයින් චතුසත්‍යබුද්ධ වූ ආර්‍ය්‍යපුද්ගලයෝ නොකල්හි ගම් නො වදනාහ.

389. රූප හා ශබ්ද හා රස හා ගන්ධ හා ස්පර්ශ යන යම් බාහිරායතන කෙනෙක් සත්ත්වයන් මදයට පමුණුවත් නම්, තෙල ධර්මයන්හි ඡන්දරාගය දුරු කොට හේ ප්‍රාතරාසස්ථානයට සුදුසු කල්හි වදනේය.

390. මහණ පෙරවරුයෙහි පිඩු ලබා හුදෙකලා වූයේ පෙර ලා අවුත් ස්කන්ධසන්තානය (ත්‍රිලක්ෂණයට නංවා) සිතනසුලුයේ රහොගත ව හිඳිනේ ය. (රූපාදි) බැහැරි අරමුණෙහි සිත් නොයොදනේ ය. භාවනා-රම්මණය කෙරෙහි මොනොවට ගිය සිත් ඇතිවන්නේ ය.

391. ඉදින් එ යෝගාවචර අන්තොටු සවවකු හා වේවයි මෙ සස්නෙහි කිසියම මහණකු හා සමග වේවයි සංලාප කෙරේ නම්, එ ප්‍රණීත වූ ධර්මය ම කියන්නේ ය. පෙහෙසුන් නො කියන්නේ ය. පරෝපවාද නො කියන්නේ ය.

392. ඇතැම් කෙනෙක් පරෝපවාද සඞ්ඛ්‍යාත විග්‍රාහික කථාවාදය විරුද්ධ කොට ගණිත්. අල්පප්‍රාඥ ඔවුන් නො පසසම්හ. (කවර හෙයින් යත්:) එ එ වාදමාර්ගහෙතුයෙන් වාදසඞ්ගයෝ එ වාදීන් වැළැද-ගනිත් ද එ හෙයිනි, (කමටහනින්) චිත්තය දුරෙහි වෙ ද එපරිදි ඔහු සිත පරෝපවාදයෙහි ලා මෙහෙයත්.

393. උත්තමප්‍රඥ ඇති ශ්‍රාවක නොහොත් වරප්‍රාඥවූ බුද්ධන්ගේ ශ්‍රාවක තෙම සුගතයන් වහන්සේ විසින් දෙසනලද ධර්මය අසා පිණ්ඩ-පාත යැ, වෙහෙර යැ, හැඳපුටු යැ සඟලසිවුරෙහි රජස් දුරු කරණ ජලය යැ යන මේ දැ ප්‍රත්‍යවෙක්ෂා කොට සෙවුනේ ය.

394. එහෙයින් මැ පිඩුවායෙහි ද සෙනසුන්හි ද සඟළ සිවුරෙහි රජස් දෝනා දියෙහි ද යන තෙල චතුස්ප්‍රත්‍යයධර්මයන්හි පොකුරු පත්හි දියබිඳු සෙයින් මහණ නො ඇලුනේ වේ.



Free Distribution www.aathaapi.org

395 ගහට්ඨවත්තං පන වො වදාමි
යථාකරො සාවකො සාධු හොති,
න හෙසො[1] ලබ්භා සපරිග්ගහෙන
ඵස්සෙතුං යො කෙවලො භික්ඛු ධම්මො

396 පාණං න හානෙ න ච ඝාතයෙය්‍ය
න චානුජඤ්ඤා හනතං පරෙසං,
සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං
යෙ ථාවරා යෙ ච තසා සන්ති[2] ලොකෙ.

397 තතො අදින්නං පරිවජ්ජයෙය්‍ය
කිඤ්චි ක්වචි සාවකො බුජ්ඣමානො,
න හාරයෙ හරතං නානුජඤ්ඤා
සබ්බං අදින්නං පරිවජ්ජයෙය්‍ය.

398 අබ්‍රහ්මචරියං පරිවජ්ජයෙය්‍ය
අඞ්ගාරකාසුං ජලිතං ව විඤ්ඤූ,
අසම්භුණන්තො පන බ්‍රහ්මචරියං
පරස්ස දාරං නාතික්කමෙය්‍ය.

399 සභග්ගතො වා පරිසග්ගතො වා
එකස්ස වෙකො න මුසා භණෙය්‍ය,
න භාණයෙ භණතං නානුජඤ්ඤා
සබ්බං අභූතං පරිවජ්ජයෙය්‍ය.

400 මජ්ජඤ්ච පානං න සමාචරෙය්‍ය
ධම්මං ඉමං රොචයෙ යො ගහට්ඨො,
න පායයෙ පිබතං නානුජඤ්ඤා
උම්මාදනන්තං ඉති නං විදිත්වා.

401 මදා හි පාපානි කරොන්ති බාලා
කරොන්ති චඤ්ඤෙපි ජනෙ පමත්තෙ,
එතං අපුඤ්ඤායතනං විවජ්ජයෙ
උම්මාදනං මොහනං බාලකන්තං

1. න හෙසො - සිමු 1, 2.
2. තසන්ති - මු.



Free Distribution www.aathaapi.org

ගිහිවත:

395. යථාකාරී ගෘහස්ථශ්‍රාවක සත්පුරුෂ වේ නම්, එ ගිහිවත තොපට කියමි. තෙල පිරිපුන් මහණදම් (කෙත්වත් ආ) පරිග්‍රහයෙන් යුත් ගිහියා විසින් ලබන්නට නොහැකි වෙයි.

396. ලොව්හි ස්ථාවර වූ යම් සත්ත්ව කෙනෙක් වෙත් නම්, යම් බඳු ජඞ්ගම සත්ත්ව කෙනෙක් වෙත් නම්, එ හැම සත්ත්වයන් කෙරෙහි දඬු බහාතබා පරපණ නො නසන්නේ ය, නො ද නස්වන්නේ ය, පරපණ නසන මෙරමාහට ද නො අනුදන්නේ ය.

397. ඉක්බිති 'මෙ පරාසතු දෑයෙකැ'යි දන්නා ගිහි සවු (ගම්හි වෙවයි, වලැ වෙවයි) කිසිදු 'තැනෙක්හි වූ ස්වල්ප වූ හෝ බොහෝ වූ හෝ නුදුන් කිසිවක් නොගෙණ හරණේ ය. නො ද හැරගන්වන්නේ ය. පැහැරගණුවනට නො ද අනුදන්නේ ය. එබදු හැම අයිනාදන් හැරලන්නේ ය.

398. විඥශ්‍රාවක දිලියෙන අඟුරුවළක්සෙයින් අබ්‍රහ්මචර්‍ය්‍යාව දුරු කරන්නේ ය. (උචිත් පිරිසෙයින්) බ්‍රම්සර රැකිය නොහෙනුයේ පරදරයන් කරා නොයන්නේ ය.

399. සභාවකට ගියේ වෙවයි පිරිස්මැදට ගියේ හෝ වෙවයි එකලා වූයේ ම එකකුහට මුසවා නො කියන්නේ ය. නො ද බණවන්නේ ය. බණනවුනට ද නො ද අනුදන්නේ ය. හැම අභූතය දුරලන්නේ ය.

400. ගෘහස්ථ තෙම මත්පැන් ද නො සෙවුනේ ය. යම් ගෘහස්ථයෙක් මෙ මද්‍යපානවිරති ධර්මය රුස්නේ නම් මෙය උන්මාදනය ඇති කරවන්නෙකැයි දැන (අනුන් ලවා) නො ද පානය කරවන්නේ ය. බොනවුන්හට නො ද අනුදන්නේ ය.

401. මද හේතුයෙන් අඥයෝ පව කෙරෙත්. අන් දනන් ද ප්‍රමත්ත කෙරෙත්. පරලොව්හි උමතු බව ඇති කරණ මෙලොව්හි මුළාව දනවන බාලයනට කාන්ත වූ තෙල අපුණ්‍යායතනය හැරලන්නේ ය.

402 පාණං න හානෙ න චදින්නමාදියෙ
මුසා න භාසෙ න ච මජ්ජපො සියා,
අබ්‍රහ්මචරියා විරමෙය්‍ය මෙථුනා
රත්තිං න භුඤ්ජෙය්‍ය විකාලභොජනං.

403 මාලං න ධාරෙ න ච ගන්ධමාචරෙ
මඤ්චෙ ඡමායං ව සයෙථ සන්ථතෙ,
එතං හි අට්ඨඞ්ගිකමාහු පොසථං
බුද්ධෙන දුක්ඛන්තගුනා පකාසිතං

404 තතො ච පක්ඛස්සුපවස්සුපොසථං
චාතුද්දසිං පඤ්චදසිඤ්ච අට්ඨමිං,
පාටිහාරියපක්ඛඤ්ච පසන්නමානසො
අට්ඨඞ්ගුපෙතං සුසමත්තරූපං.

405 තතො ච පාතො උපවුත්ථුපොසථො
අන්නෙන පානෙන ච භික්ඛු සඞ්ඝං,
පසන්න චිත්තො අනුමොදමානො
යථාරහං සංවිභජෙථ විඤ්ඤූ.

406 ධම්මෙන මාතා පිතරො භරෙය්‍ය
පයොජයෙ ධම්මිකං සො වණිජ්ජං,
එතං ගිහී වත්තයං අප්පමත්තො[1]
සයං පභෙ නාම උපෙති දෙවෙති.

ධම්මික සුත්තං නිට්ඨිතං.

## චූලවග්ගො දුතියො.

**තස්සුද්දානං:**

රතනං ආමගන්ධඤ්ච හිරිං මඞ්ගලමුත්තමං,
සූචිලොමො කපිලංච පුන බ්‍රාහ්මණධම්මිකං.
ධම්මසුත්තං කිංසීලං උට්ඨානං අථ රාහුලො,
කප්පො ච පරිබ්බාජඤ්ච ධම්මිකො ච පුනාපරං;
චුද්දසෙතානි සුත්තානි චූලවග්ගොති වුච්චති.

1. වත්තයමප්පමත්තො - (මජසං)



Free Distribution www.aathaapi.org

**අට්ඨඞ්ගුපොසථය:**

402. ප්‍රාණඝාත නොකරන්නේ ය, අයිනාදන් නොගන්නේ ය, මුසවා නො බණන්නේ ය, මද්‍යප ද නො වන්නේ ය, මෛථුනසඞ්ඛ්‍යාත අබ්‍රම්සරින් වෙන් වන්නේ ය, විකාලභොජන සඞ්ඛ්‍යාත රාත්‍රිභොජන නො වළඳනේ ය.

403 මල්දම් නො දරන්නේ ය, සුවඳවිලෙවුන් ගැල්වීම් නොද කරන්නේ ය, කැපසරුප් පරිදි අතුළ කැප හැඳෙහි හෝ බිම්හි හෝ හෝනේ ය, වර්තනදුඃඛයාගේ අන්තයට ගිය බුදුරදුන් විසින් ප්‍රකාශිත වූ මෙල අෂ්ටාඞ්ගික වූ උපොසථ යයි කියත්.

404. ඉක්බිති පහන් සිතැතියේ පක්ෂය පිළිබඳ චාතුද්දසී උපොසථය ද පඤ්චදසී උපොසථය ද අටසමී උපොසථය ද පාටිහාරිය පක්‍ඛ උපොසථය ද සුපිරිපුන් කොට අටඟින් යුත් පෙහෙවස් වසවූ.

405. ඉක්බිති විඥ ගිහිසවු විසූ පෙහෙවස් ඇතියේ පසුදින පූර්භාග- යෙහි පහන් සිතැත්තේ නරතුරු මොදමාන වූයේ සුදුසුපරිද්දෙන් අහර පැනින් බික්සඟුන් වළඳවන්නේ ය.

406 ධර්මයෙන් ලත් භෝගයෙන් මාපියන් පුස්නේය. මෙ දැහැමි වණික්කර්ම කරන්නේ ය. අප්‍රමත්ත වූ ගිහිගේ වැසි තෙම මෙල වත පවත්නේ ස්වයම්ප්‍රභ නම් වූ (කාමාවචර සදෙව්ලෝ වැසි) දෙවියන් කරා (උපත් විසින්) එළඹෙන්නේ යයි

තුදුස්වැනි ධම්මික සූත්‍රය නිමි.

## දෙවැනි චුල්ල වග්ගයයි.

**එහි උද්දානය:**

රතන සූත්‍ර යැ, ආමගන්ධ සූත්‍ර යැ, හිරි සූත්‍ර යැ, සූචිලොම සූත්‍ර යැ, කපිල සූත්‍ර යැ, යළි බ්‍රාහමණ ධම්මික් සූත්‍ර යැ, ධම්ම (නාවා) සූත්‍ර යැ, කිංසීල සූත්‍ර යැ, උට්ඨාන සූත්‍ර යැ, යළි රාහුල සූත්‍ර යැ, නිග්‍රොධකප්ප (වඞ්ගීස) සූත්‍ර යැ, සම්මාපරිබ්බාජනීය සූත්‍ර යැ, යළි අන්‍ය වූ ධම්මික සූත්‍ර යැ මෙල තුදුස් සූත්‍රයෝ 'චූලවග්ග' යී කියනු ලැබෙ.



Free Distribution www.aathaapi.org

# 3. මහාවග්ගො

## 3–1

### පබ්බජ්ජා සුත්තං

407 පබ්බජ්ජං කිත්තයිස්සාමි යථා පබ්බජි චක්ඛුමා,
යථා වීමංසමානො සො පබ්බජ්ජං සමරොචයි.

408 සම්බාධො'යං ඝරාවාසො රජස්සායතනං ඉති,
අබ්භොකාසො ච පබ්බජ්ජා ඉති දිස්වාන පබ්බජි.

409 පබ්බජිත්වාන කායෙන පාපං කම්මං විවජ්ජයි,
වචීදුච්චරිතං හිත්වා ආජීවං පරිසොධයි.

410 අගමා රාජගහං බුද්ධො මගධානං ගිරිබ්බජං,
පිණ්ඩාය අභිහාරෙසි ආකිණ්ණවරලක්ඛණො.

411 තමද්දසා බිම්බිසාරො පාසාදස්මිං පතිට්ඨිතො,
දිස්වා ලක්ඛණසම්පන්නං ඉමමත්ථං අභාසථ.

412 ඉමං භොන්තො නිසාමෙථ අභිරූපො බ්‍රහා සුචි,
චරණෙන චෙව සම්පන්නො යුගමත්තං ච පෙක්ඛති.

413 ඔක්ඛිත්තචක්ඛු සතිමා නායං නීචා කුලාමිව,
රාජදූතා විධාවන්තු කුහිං භික්ඛු ගමිස්සති.

414 තෙ පෙසිතා රාජදූතා පිට්ඨිතො අනුබන්ධිසුං,
කුහිං ගමිස්සති භික්ඛු කත්ථ වාසො භවිස්සති.

415 සපදානං චරමානො ගුත්තද්වාරො සුසංවුතො,
ඛිප්පං පත්තං අපූරෙසි සම්පජානො පතිස්සතො.



Free Distribution www.aathaapi.org

# 3. මහා වග්ගය

## 3 – 1

## පබ්බජ්ජා සූත්‍රය

407. ඒ පසැස් ඇති සම්බුදුරජානන් වහන්සේ ගෘහවාසයෙහි ආදීනව හා ප්‍රව්‍රජ්‍යායෙහි අනුසස් විමසන ලෙස් යම්පරිදි පැවිද්දක් කැමැති වූසේක් නම් යම් පරිද්දෙකින් පැවිදිවූසේක් නම් ඒ ප්‍රව්‍රජ්‍යාව කීර්තනය කරන්නෙමි

408. "මෙ ගෘහවාසය (කුශල ක්‍රියාවට) සම්බාධ යැ. රාගාදි ක්ලෙශයනට උත්පත්ති දේශයෙකැ" යි ද ප්‍රව්‍රජ්‍යාවඅවකාශය"යි ද මෙසෙ-යින් දුන පැවිද වූහ.

409. පැවිද්ද ලෙණ කයින් ත්‍රිවිධ දුශ්චරිත දුරලූහ. චතුර්විධ වාග්දුශ්චරිතය හැරපියා ආජීවපාරිශුද්ධිය පැවැත් වූහ.

410. බුදුහු මගධයන්ගේ ගිරිවුජ නම් වූ රාජගෘහ නගරයට වැඩියහ. ආකීර්ණ වූ උත්තම මහාපුරුෂ ලක්ෂණයෙන් සමන්වාගත වූසේක් පිඩුවා සඳහා සැරිසැරූහ.

411. බිම්බිසාර රජ පහයෙහි සිටියේ උන්වහන්සේ දිටී. මහපුරිස් ලකුණින් සමන්වාගත ඔවුන් දැක මෙ අරුත් කීණිය.

412. භවත්නි, මෙ පුහුල් බලවූ (හෙ දැකුම් කලු අඟ පසඟ ඇති හෙයින්) අභිරූප වූයේ ආරොහපරිණාහ සම්පන්න වූයේ පිවිතුරු සිවිපැහැ ඇතියේ යැ. වරණයෙනුදු යුතු වූයේ යුගමාත්‍රයක් මැ බලනු වෙයි.

413 යටැ හෙලූ ඇස් ඇතියේ ස්මෘතිමත් මෙතෙම නීචකුලෙන් නික්මැ පැවිදිවූවකු බඳු නො වේ. රාජදූතයෝ වෙළෙව්වැ යෙත්වා, මහණ කොහි යේ ද?

414 අණවනලද ඒ රාජදූතයෝ 'මහණ කොහි යේ ද? කොහි උහුගේ වාසය වන්නේදැ'යි පිටුපසින් ලුහුබැඳියහ.

415 පියූ දෙර ඇතියේ (ඉන්ද්‍රියසංවරයෙන් මොනොවට සංවෘත වූයේ ගෙපිළිවෙළ නොකඩ කොටැ සැරිසරමින් මනා තුවණැතියේ එළඹ සිටි සිහි ඇතියේ වහා පාත්‍රය පිරවියැ.

416 පිණ්ඩචාරං චරිත්වාන[1] නික්ඛම්ම නගරා මුනි,
පණ්ඩවං අභිහාරෙසි එත්ථ වාසො භවිස්සති.

417 දිස්වාන වාසූපගතං තතො[2] දූතා උපාවිසුං,
එකොව දූතො[3] ආගන්ත්වා රාජිනො පටිවෙදයි.

418 එස භික්ඛු මහාරාජ පණ්ඩවස්ස පුරක්ඛතො,
නිසින්නො ව්‍යග්ඝුසභොව සීහොව ගිරිගබ්භරෙ.

419 සුත්වාන දූතවචනං භද්දයානෙන ඛත්තියො,
තරමානරූපො නිය්‍යාසි යෙන පණ්ඩවපබ්බතො.

420 ස යානභූමිං යායිත්වා යානා ඔරුය්හ ඛත්තියො,
පත්තිකො උපසඞ්කම්ම ආසජ්ජ තං උපාවිසි.

421 නිසජ්ජ රාජා සම්මොදි කථං සාරාණියං තතො,
කථං සො වීතිසාරෙත්වා ඉමමත්ථං අභාසථ.

422 යුවා ච දහරො චාසි පඨමුප්පත්තිකො සුසු,
වණ්ණාරොහෙන සම්පන්නො ජාතිමා විය ඛත්තියො.

423 සොභයන්තො අනීකග්ගං නාගසංඝපුරක්ඛතො,
දදාමි භොගෙ භුඤ්ජස්සු ජාතිං චක්ඛාහි පුච්ඡිතො,

424 උජුං ජානපදො රාජා හිමවන්තස්ස පස්සතො,
ධනවිරියෙන සම්පන්නො කොසලෙසු නිකෙතිනො.

425 ආදිච්චා නාම ගොත්තෙන සාකියා නාම ජාතියා,
තම්හා කුලා පබ්බජිතොම්හි රාජ න කාමෙ අභිපත්ථයං.

426 කාමෙස්වාදීනවං දිස්වා නෙක්ඛම්මං දට්ඨු ඛෙමතො,
පධානාය ගමිස්සාමි එත්ථ මෙ රජ්ජති[5] මනොති.

පබ්බජ්ජාසුත්තං නිට්ඨිතං.

---

1. සපිණ්ඩචාරං චරිත්වා-මු
2. තයො- මු 2.
3. තෙසු එකොව - මු 2.
4. කොසලස්සාඃ
5. රඤ්ජිතො- මු 1
රඤ්ජති-මු 2.



Free Distribution www.aathaapi.org

416. එ මුනි පිණ්ඩචාරය කොට නුවරින් නික්මැ 'මෙහි වාසය වන්නේ'යි පාණ්ඩව පර්වතය කරා ගියේයැ.

417. එක්බිති වාසොපගත වූවහු දැකැ රාජදූතයෝ වෙතැ පැමිණියහ. එක්දූතයෙක් පැමිණ රජුට දැන්වීයැ.

418. මහරජාණනි, තෙල මහණ පාණ්ඩව පර්වතයාගේ පැදුන්දික්හි ගිරිගුහායෙහි ව්‍යාඝ්‍රයකු හා වෘෂභරාජයකු හා සිංහරාජයකු හා බඳු ව හිත.

419. රාජදූතයන් ගේ බස් අසා රජතෙමේ භද්‍රයානයෙන් අනලස් සැහැවි ඇතියේ පාණ්ඩව පර්වතය කරා නික්මැ ගියේයැ.

420. ඒ රජතෙමේ යානභූමිය තාක් ගොස් යානායෙන් බැසැ පිය-ගමන් ඇතියේ එළැඹැ එ තවුසන් වෙතැ එළඹැ හිත.

421. එක්බිති රජ (උන් හා) සතුටු වියැ. හේ සිහි කළමනා කථා කොට නිමවා මෙ පවත් කීයැ.

422. නවයොවුනෙහි උපතින් තුරුණුයෙහි පළමු උපතින් ලදරුයෙහි වර්ණයෙන් හා අරොහසම්පත්තියෙන් සපන්හි ක්ෂත්‍රිය ජාතිඇතියකු බන්දෙහි,

423. කැමැති තාක් භොග දෙමි. බලකාය හොබවමින් ඇත්සෙනඟින් පිරිවරණලදුයේ භොගසුඛ වලඳව. (මාවිසින්) විචාරණ ලදුයෙහි ජාතිය ද කියව''යි.

424 මහරජ, ඉදිරි හිමවත් පස්හි ධනයෙන් හා වීර්‍ය්‍යයෙන් සපන් වූ කොසල ජනපදයෙහි ආදිකාලයෙහි සිටැ අන්වයාගත මහරජහුගේ ජනපද යෙක් වෙයි.

425. ඔහු ගොත්‍ර විසින් ආදිත්‍ය නම් ද ජාතියෙන් ශාක්‍ය නම් ද වෙති. මහරජ, මම් එ කුලෙන් පැවිදි වූයෙම් කාමයන් පතනුයෙම් නොවෙමි.

426. වස්තුකාමක්ලේශකාමයන්හි ආදීනව දැකැ පැවිද්ද (හෝ නිවණ) ක්ෂේම විසින් දැකැ ප්‍රධන් වීර්‍ය්‍යය සඳහා යන්නෙමි. මෙ ප්‍රධන් වීර්‍ය්‍යයෙහි මාගේ සිත රඳුනේ යි.

පබ්බජ්ජා සූත්‍රය නිමි.



Free Distribution www.aathaapi.org

## 3 – 2

## පධාන සුත්තං

427 තං මං පධානපහිතත්තං නදිං නෙරඤ්ජරං පති,
විපරක්කම්ම ඣායන්තං යොගක්ඛෙමස්ස පත්තියා.

428 නමුචී කරුණං වාචං භාසමානො උපාගමී,
කිසො ත්වමසි දුබ්බණ්ණො සන්තිකෙ මරණං තව.

429 සහස්සභාගො මරණස්ස එකංසො තව ජීවිතං,
ජීව භො[1] ජීවිතං සෙය්‍යො ජීවං පුඤ්ඤානි කාහසි.

430 චරතො ච තෙ බ්‍රහ්මචරියං අග්ගිහුත්තඤ්ච ජුහතො,
පහූතං චීයතෙ පුඤ්ඤං කිම්පධානෙන කාහසි.

431 දුග්ගො මග්ගො පධානාය දුක්කරො දුරභිසම්භවො,
ඉමා ගාථා භණං මාරො අට්ඨා බුද්ධස්ස සන්තිකෙ.

432 තං තථාවාදිනං මාරං භගවා එතදබ්‍රවි,
පමත්තබන්ධු පාපිම යෙනත්ථෙන ඉධාගතො.

433 අණුමත්තෙනපි පුඤ්ඤෙන අත්ථො මය්හං න විජ්ජති,
යෙසං ච අත්ථො පුඤ්ඤානං තෙ මාරො වත්තුමරහති.

434 අත්ථි සද්ධා තථා විරියං පඤ්ඤා ච මම විජ්ජති,
එවං මං පහිතත්තම්පි කිං ජීව මම පුච්ඡසි.

435 නදීනමපි සොතානි අයං වාතො විසොසයෙ,
කිඤ්ච මෙ පහිතත්තස්ස ලොහිතං නූපසුස්සයෙ.

436 ලොහිතෙ සුස්සමානම්හි පිත්තං සෙම්හඤ්ච සුස්සති,
මංසෙසු ඛීයමානෙසු භිය්‍යො චිත්තං පසීදති,
භිය්‍යො සති ච පඤ්ඤා ච සමාධි මම තිට්ඨති.

---

1. ජීවමෙහො-මු 1.



Free Distribution www.aathaapi.org

# 3 – 2

## පධාන සූත්‍රය

427. නිල්දලා හෝ තෙරැ (නිර්වාණ සඞ්ඛ්‍යාත) යොගක්ෂෙමාධිගමය සඳහා විශෙෂපරාක්‍රම කොට අප්‍රාණකධ්‍යානයෙහි යෙදුනු (නිර්වාණ සඞ්ඛ්‍යාත) ප්‍රධානයෙහි මෙහෙයූ සිත් හෙවත් පරිත්‍යක්ත ආත්මභාවය ඇති මා කරා

428. වසවත්මරදෙව්පිත් කුළුණුබර තෙපුල් කියමින් එළැඹියේ යැ: තෙපි වැහැරි වවු, දුර්වර්ණ වවු, දූත් මරණය තොප හමුයෙහි වෙ.

429. තොප ගේ මරණයට සහස්‍රභාගයෙන් යුත් ප්‍රත්‍යය වෙයි. තොපගේ ජීවිතය එකාංශ ඇතියෙකි. භවත්නි, ජිවත්වවු, ජීවිතය උතුම්. ජිවත්වනුවෝ පින් කරත්නහු.

430. (මෛථුන විරති සඞ්ඛ්‍යාත) බ්‍රහ්මචර්‍ය්‍යය රක්නා අග්නිහොම හා කරණ තොපට බොහෝ පින් රැස් වෙ. ප්‍රධන්වීර්‍ය්‍යයෙන් කුම් කරනු වහු?

431. ප්‍රධාන (නිර්වාණ) ය සඳහා වූ මාර්ගය දුර්ගම යැ, දුෂ්කර යැ, නො ලැබිය හෙයි. මෙ ගාථා කියමින් මරදෙව්පිත්, බුදුරදුන් හමුයෙහි සිටියේ යැ.

432. එසෙයින් කියන එ මරහට භාග්‍යවත්හු තෙල වදන් කීහු. ප්‍රමත්තයන් ගේ යහළු වූ පාපිෂ්ඨය, යම් අර්ථයෙකින් මෙහි ආයෙහි ද (එය මම දනිමි.)

433. අණුමාත්‍ර වූ ද, (වර්තගාමී) පුණ්‍යයකින් මට අර්ථයෙක් නැත. යමකුන් හට පුණ්‍යයන් පිළිබඳ අර්ථයෙක් වෙ නම් මරදෙව් ඔවුනට කියනට නිස්සේ යැ.

434. මට (ශාන්තිවරපදය කෙරෙහි ඔකප්පන) ශ්‍රද්ධා ඇත, එසෙයින් ම (පරාක්‍රම සඞ්ඛ්‍යාත) වැර ද ඇත. මට වජ්‍රෝපම ප්‍රඥ ද ඇත. මෙසෙයින් නිවන් කරා යොමු කළ සිත් ඇති මා කවර හෙයින් "දිවි රකුවයි" අනුපාවිඡා කෙරෙහි ද?

435. (අප්‍රාණකධ්‍යානයෙන් සමුත්ථිත වූ) මාගේ, මෙ ශරීරවාතය නදීස්‍රොතස් නමුදු වියළන්නේ යැ, ප්‍රහිතාත්ම වූ මාගේ ලෙහෙ කිම නො වියළන්නේ ද?

436. ලෙහෙ වියැළෙත් මැ පිත් හා සෙමුදු වියැළෙයි. මාංසය ක්ෂීණ වත් මැ බෙහෙවින් සිත් පහන් වත්නෙයැ. බෙහෙවින් මාගේ ස්මෘති හා ප්‍රඥ හා සමාධි හා සිටුනේ යි.



Free Distribution www.aathaapi.org

437 තස්ස මෙවං විහරතො පත්තස්සුත්තමවෙදනං,
කාමෙ නාපෙක්ඛතෙ චිත්තං පස්ස සත්තස්ස සුද්ධතං,

438 කාමා තෙ පඨමා සෙනා දුතියා අරති වුච්චති,
තතියා ඛුප්පිපාසා තෙ චතුත්ථී තණ්හා පවුච්චති.

439 පඤ්චමී ථීනමිද්ධං තෙ ඡට්ඨා භීරූ පවුච්චති,
සත්තමී විචිකිච්ඡා තෙ මක්ඛො ථම්භො තෙ අට්ඨමී.[1]

440 ලාභො සිලොකො සක්කාරො මිච්ඡා ලද්ධො ච යො යසො,
යො චත්තානං සමුක්කංසෙ පරෙ ච අවජානති.

441 එසා නමුචි තෙ සෙනා කණ්හස්සාභිප්පහාරිණී,
න තං අසූරො ජිනාති ජෙත්වා ච ලභතෙ සුඛං.

442 එස මුඤ්ජං පරිහරෙ ධිරත්ථු මම ජීවිතං,
සඞ්ගාමෙ මෙ මතං සෙය්‍යො යඤ්චෙ ජීවෙ පරාජිතො.

443 පගාළ්හා එත්ථ[2] න දිස්සන්ති එකෙ සමණබ්‍රාහ්මණා,
තඤ්ච මග්ගං න ජානන්ති යෙන ගච්ඡන්ති සුබ්බතා.

444 සමන්තා ධජිනිං දිස්වා යුත්තං මාරං සවාහිනිං,
යුද්ධාය පච්චුග්ගච්ඡාමි මා මං ඨානා අචාවයි.

445 යන්තෙතං නප්පසහති සෙනං ලොකො සදෙවකො,
තන්තෙ පඤ්ඤාය ගච්ඡාමි ආමං පත්තංව අස්මනා.

446 වසිං කරිත්වා සංකප්පං සතිඤ්ච සුප්පතිට්ඨිතං,
රට්ඨා රට්ඨං විචරිස්සං[3] සාවකෙ විනයං පුථු.

447 තෙ අප්පමත්තා පහිතත්තා මම සාසනකාරකා,
අකාමස්ස තෙ ගමිස්සන්ති යත්ථ ගන්ත්වා න සොචරෙ.

---

1. අට්ඨමා - මු 1.
2. පගාළ්හෙත්ථ - මු 2
3. විචරියසං - මු 2.



Free Distribution www.aathaapi.org

437. මෙ නයින් වෙසෙන උත්තම වේදනාවට පත් ඒ මාගේ චිත්තය උභය කාමයන් අපේක්ෂා නො කෙරෙයි. සත්ත්වයකු ගේ පරිශුද්ධත්වය බලව.

438. ක්ලෙශකාමයෝ තාගේ ප්‍රථමසෙනා යැ (අධිකුශලධර්මයන්හි) අරතිය ද්විතීයසෙනා යි කියනුලැබෙ. ක්ෂුත්පිපාසා දෙක තාගේ තෘතීය සෙනා යැ පර්‍යෙෂණ තෘෂ්ණාව තාගේ සතරවන සෙනා යයි කියනුලැබෙ.

439. තාගේ පස්වන සෙනඟ ථිනමිද්ධය වෙයි. සවන සෙනඟ (උත්‍රාසසඞ්ඛ්‍යාත) බියයි කියනුලැබෙ. තාගේ සප්තම සෙනාව විචිකිත්සා නමු, තාගේ අටවැනි සෙනඟ මකුබව හා තදබව යි.

440. ලාභ යැ ප්‍රශංසා යැ සත්කාර යැ යි කියනලද යම් යශසෙක් වේ නම් එ ද, යමෙකුත් තමා හුවා දක්වා නම්, මෙරමාත් හෙලා දක්නේ නම්,

441. නමුචිය, කෘෂ්ණ වූ තාගේ (මහණ බමුණනට) අන්තරායකර වූ තෙල සෙනා වෙයි. අශූර පුරුෂ ඒ සෙනාව නො දිනයි (ශූරපුරුෂ වැලින් මරයෙන්) දිනා (මාර්ගඵල සඞ්ඛ්‍යාත) සුවයට පැමිණෙයි.

442. යුදෙහි නොපසු බස්නා බව හඟවනු විසින් තෙල මම මුදුතණ පරිහරණ කරන්නෙමි. (තාගේ සෙනාව විසින් පරදවන ලද හොත්) ඒ මාගේ දිවියට නින්ද වේවා, යම් හෙයෙකින් පරාජිත වැ ජීවත් වෙම් නම් (එයට වඩා) සමර බිම්හි මට මරණ උතුම්.

443. මෙ ලොව්හි ඇතැම් ශ්‍රමණබ්‍රාහ්මණයෝ (අත්මොත්කර්ෂණ පරවම්භන පර්‍යවසාන කොට ඇති තාගේ සෙනායෙහි) ගිමිගිග්න වූවාහු (ශීලාදි ගුණයෙන්) අප්‍රකට වෙත්. යම් මඟෙකින් (බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධාදි) සුව්‍රතයෝ නිවන් යෙත් නම්, එ නිවන්මඟ ද නො දනිත්.

444. උද්‍යුක්ත වූ හාත්පසින් සේනාසහිත වූ (ගිරි මෙවුල්) ඇත්රජු සහිත වූ මාරයා දැක යුද පිණිස ඉදිරි බලා යෙමි. (එමරදෙව්) මා අපරාජිත පර්‍යඞ්කස්ථානයෙන් නහමක් සලාවා.

445. සදෙව් ලොව යම්බඳු තෙල මරසෙන් නො මැඩලිය හේ නම් තාගේ එ මරසෙන් පහණින් අමුමැටිපසක් සෙයින් මාගේ ප්‍රඥයෙන් මැඩගෙණ යමි.

446. සම්‍යක්සංකල්පය වශී කොට සම්‍යක්ස්මෘතිය ද සුප්‍රතිෂ්ඨිත කොට බොහෝ සව්වන් හික්මවමින් රටින් රට සරණෙම්.

447. අප්‍රමත්ත වූවාහු නිවන් සඳහා මෙහෙයු සිත්ඇත්තාහු මාගේ අනුශාසනය පිළිපදනා එසව්වෝ තා නො කැමැතිවත් මැ යම් නිර්වාණතට පැමිණ ශෝක නො කෙරෙත් නම්, එනිවන් කරා යන්නාහ.



Free Distribution www.aathaapi.org

448 සත්තවස්සානි භගවන්තං අනුබන්ධිං පදා පදං,
ඔතාරං නාධිගච්ඡිස්සං සම්බුද්ධස්ස සතීමතො.

449 මෙදවණ්ණංව පාසාණං වායසො අනුපරියගා,
අපෙත්ථ මුදු වින්දෙම අපි අස්සාදනා සියා.

450 අලද්ධා තත්ථ අස්සාදං වායසෙත්තො අපක්කමි,
කාකොව සෙලං ආසජ්ජ නිබ්බිජ්ජාපෙම ගොතමං.

451 තස්ස සොකපරෙතස්ස වීණා කච්ඡා අභස්සථ,
තතො සො දුම්මනො යක්ඛො තත්ථෙවන්තරධායථාති.

පධානසුත්තං නිට්ඨිතං.

## 3 – 3

## සුභාසිත සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ -පෙ- භගවා එතදවොච: චතූහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතා වාචා සුභාසිතා හොති න දුබ්භාසිතා, අනවජ්ජා ච අනනුවජ්ජා ච විඤ්ඤූනං, කතමෙහි චතූහි: ඉධ භික්ඛවෙ භික්ඛු සුභාසිතං යෙව භාසති නො දුබ්භාසිතං ධම්මං යෙව භාසති නො අධම්මං, පියං යෙව භාසති නො අප්පියං, සච්ච යෙව භාසති නො අලිකං. ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි අඞ්ගෙහි සමන්නාගතා වාචා සුභාසිතා හොති න දුබ්භාසිතා, අනවජ්ජා ච අනනුවජ්ජා ච විඤ්ඤූනන්ති. ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා;

452 සුභාසිතං උත්තමමාහු සන්තො
ධම්මං භණෙ නාධම්මං තං දුතියං,
පියං භණෙ නාප්පියං තං තතියං
සච්චං භණෙ නාලිකං තං චතුත්ථන්ති.



Free Distribution www.aathaapi.org

448. සත්වසක් භාග්‍යවතුන් පියෙන් පිය නුහු බැඳීයෙමි. ස්මෘතිමත් සම්බුදුන් ගේ විවරයක් නො ලද්මි.

449. "මෙහි මෘදු බව විඳුනමෝ නම්, මැනව. ආස්වාදනයෙක් වන්නේ නම් මැනැවැ''යි කවුඩු මෙදවර්ණපාෂාණයක් වටා ගියේ යම් සේ නම්,

450. කවුඩු එහි ආස්වාද නො ලැබ එතැනින් පලා ගියේ යම්සේ ද, සෙල් ගටා යන කවුඩු සෙයින් ගොයුම් හා ගැටී පැරැද පලායම්හ.

451. සොවින් මඩනාලද උහු කැසින් වෙණ ගිලිහිනි. එයින් දුටුසිත්ඇති එ යක් එහි මැ නො පැණී ගියේයි.

පධාන සූත්‍රය නිමි.

## 3 – 3
## සුභාසිත සූත්‍රය

මාවිසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අසළැ අනේපිඩුහු ගේ ජේතවන නම් අරම්හි වැඩවසනසේක -පෙ- භාග්‍යවතුන් වහන්සේ මෙල කරුණ වදළ සේක.

මහණෙනි, කරුණු සතරෙකින් සමන්වාගත වාක් සුභාෂිත වෙයි දුර්භාෂිත නොවෙයි. අනවද්‍ය ද වෙයි. විඥයන් විසින් අනුවාද නො කටයුතු ද වෙ. කවර සතරෙකින යත්:

මහණෙනි, මෙසස්නෙහි මහණ සුභාෂිතය මැ කියයි, දුර්භාෂිත නො කියයි. ධර්මය මැ කියයි, අධර්ම නො කියයි. ප්‍රියතෙපුල් මැ කියයි, අප්‍රියවචන නො කියයි. සත්‍යය මැ කියයි, අලීක නොකියයි. මහණෙනි, මෙ කරුණු සතරින් සමන්වාගත වාක් සුභාෂිත වෙයි, දුර්භාෂිත නො වෙයි. අනවද්‍ය ද වෙයි. විඥයන් විසින් නො ගැරැහියයුතු වෙ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදළසේක. මෙය වදරා සුගතශාස්තෘන් වහන්සේ ඉක්බිති මෙල ගාථා ද වදළසේක.

452. බුද්ධාදි සත්පුරුෂයෝ සුභාෂිතය උතුමැයි කීහු: (පළමු අඞ්ගය) ධර්මය මැ කියනේය, අධර්මය නො කියන්නේය යන එය දෙවන අඞ්ගය. ප්‍රියවචන මැ කියන්නේය, අප්‍රියවචන නො කියන්නේය යන එය තෙවන අඞ්ගය. සත්‍යය කියන්නේය, අලීක (බොරු) නො කියන්නේය යන එය සතරවන අඞ්ග ය.



Free Distribution www.aathaapi.org

අථ ඛො ආයස්මා වංගීසො උට්ඨායාසනා එකංසං චීවරං කත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං එතදවොච: පටිභාති මං භගවා පටිභාති මං භගවාති.

පටිභාතු තං වංගීසා'ති භගවා අවොච. අථ ඛො ආයස්මා වංගීසො භගවන්තං සම්මුඛා සාරුප්පාහි ගාථාහි අභිත්ථවි.

453 තමෙව භාසං භාසෙය්‍ය යායත්තානං න තාපයෙ,
පරෙ ච න විහිංසෙය්‍ය සා වෙ වාචා සුභාසිතා.

454 පියවාචමෙව භාසෙය්‍ය යා වාචා පටිනන්දිතා.
යං අනාදය පාපානි පරෙසං භාසතෙ පියං.

455 සච්චං වෙ අමතා වාචා එස ධම්මො සනන්තනො,
සච්චෙ අත්ථෙ ච ධම්මෙ ච ආහු සන්තො පතිට්ඨිතා,

456 යං බුද්ධො භාසති වාචං ඛෙමං නිබ්බානපත්තියා,
දුක්ඛස්සන්තකිරියාය සා වෙ වාචානමුත්තමාති.

සුභාසිතසුත්තං නිට්ඨිතං.

## 3-4

## සුන්දරිකභාරද්වාජ සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා කොසලෙසු විහරති සුන්දරිකාය නදියා තීරෙ. තෙන ඛො පන සමයෙන සුන්දරිකභාරද්වාජො බ්‍රාහ්මණො සුන්දරිකාය නදියා තීරෙ අග්ගිං ජුහති, අග්ගිහුත්තං පරිචරති, අථ ඛො සුන්දරිකභාරද්වාජො බ්‍රාහ්මණො අග්ගිං ජුහිත්වා අග්ගිහුත්තං පරිචරිත්වා උට්ඨායාසනා සමන්තා චතුද්දිසා අනුවිලොකෙසි කො නු ඛො ඉමං හව්‍යසෙසං භුඤ්ජෙය්‍යාති. අද්දසා ඛො සුන්දරිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං අවිදූරෙ අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ සසීසං පාරුතං නිසින්නං දිස්වාන වාමෙන හත්ථෙන හව්‍යසෙසං ගහෙත්වා දක්ඛිණෙන හත්ථෙන කමණ්ඩලං ගහෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි,



Free Distribution www.aathaapi.org

එක්බිති ආයුෂ්මත් **වඞ්ගීස** තෙරණුවෝ හුනස්නෙන් නැගී සිවුර එකස්හි ලා භාග්‍යවතුන් වහන්සේ වෙතැ ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. භාග්‍යවතුන් වහන්ස, මට වැටැහෙයි, සුගතයන් වහන්ස, මට වැටැහෙයි.

''වඞ්ගීසයෙනි, ඒ තට වැටැහේවා'' යි භාග්‍යවතුන් වහන්සේ වදාළ- සේක.

එක්බිති ආයුෂ්මත් **වඞ්ගීස** තෙරණුවෝ භාග්‍යවතුන්වහන්සේ හමුයෙහි සාරූප්‍ය ගාථායෙන් පැවසූහ.

453. යම් බසෙකින් තමා නො තවන්නේ නම්, මෙරමාත් නො පෙළන්නේ නම්, එ බස් ම කියන්නේය. ඒකාන්තයෙන් ඒ වචන මැ සුභාෂිත වේ.

454. යම් බසෙක් අභිනන්දිත වේ නම්, අප්‍රියවචන නො ගෙණ මෙරමාහට යම් ප්‍රිය වචනයක් කියා නම්, එබඳු ප්‍රියවචන ම කියන්නේය.

455. ''ඒකාන්තයෙන් සත්‍යය අමෘතසදෘශවචනයි යන මෙල පෞරා- ණික ධර්මය''යි සත්‍යයෙහි හා අර්ථයෙහි හා ධර්මයෙහි පිහිටි සත්පුරුෂයෝ කීහ.

456. ක්ලේශපරිනිර්වාණප්‍රාප්තිය සඳහා සංසාරදුඃඛයා ගේ අන්ත- කරණය සඳහා ද යම් නිරුපද්‍රව වචනයක් බුදුරජානන්වහන්සේ වදරත් නම්, එකාන්තයෙන් එය වචනයන් අතුරෙහි උත්තම වේ යි.

**සුභාසිත සූත්‍රය නිමි.**

## 3 – 4
## සුන්දරිකභාරද්වාජ සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදි: එක්සමයෙක්හි භාග්‍යවතුන්වහන්සේ **කොශල** ජනපදයෙහි **සුන්දරිකා** නදීතීරයෙහි වැඩ වසනසේක. එකල්හි **සුන්දරිකභාරද්වාජ බ්‍රාහ්මණ** සුන්දරිකා හෝ තෙර ගිනි පුදයි. අග්න්‍යායතන පරිචරණ කෙරෙයි. ඉක්බිති සුන්දරිකභාරද්වාජබ්‍රාහ්මණ ගිනි පුද අග්න්‍යායතන **පරිචරණ** කොට හුනස්නෙන් නැග කවරෙක් මෙ හුතාව- ශෙෂය බුදුනේය යි වටා **සිව්දික්** බැලීය. සුන්දරිකභාරද්වාජබ්‍රාහ්මණ නුදුරෙහි එක්තරා රුක්මුලෙක්හි හිස වටා පෙර වූ කහවත් ඇතිවැ වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ දිටී. දැක වමතින් හව්‍යශෙෂය ගෙණ දකුණතින් **කමණ්ඩලාව** (කෙංඩිය) ගෙණ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේය.

අථ ඛො භගවා සුන්දරික භාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස පදසංදෙන සීසං විවරි, අථ ඛො සුන්දරිකභාරද්වාජො බ්‍රාහ්මණො "මුණ්ඩො අයං භවං මුණ්ඩකො අයං භවන්ති" තතො ච පුන නිවත්තිතුකාමො අහොසි, අථ ඛො සුන්දරිකභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස එතදහොසි,

මුණ්ඩාපි හි ඉධෙකච්චෙ බ්‍රාහ්මණා භවන්ති යන්නූනාහං උපසඞ්කමිත්වා ජාතිං පුච්ඡෙය්‍යන්ති, අථ ඛො සුන්දරිකභාරද්වාජො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං එතදවොච කිංජච්චො භවන්ති, අථ ඛො භගවා සුන්දරිකභාරද්වාජං බ්‍රාහ්මණං ගාථාහි අජ්ඣභාසි.

457. න බ්‍රාහ්මණො නො'ම්හි න රාජපුත්තො
න වෙස්සායනො උද කොචි නො'ම්හි,
ගොත්තං පරිඤ්ඤාය පුථුජ්ජනානං
අකිඤ්චනො මන්ත චරාමි ලොකෙ.

458 සඞ්ඝාටිවාසී අගහො චරාමි
නිවුත්තකෙසො අභිනිබ්බුතත්තො,
අලිප්පමානො ඉධ මානවෙහි
අකල්ලං මං බ්‍රාහ්මණ පුච්ඡසි ගොත්තපඤ්හං.

459 පුච්ඡන්ති වෙ භො බ්‍රාහ්මණා බ්‍රාහ්මණෙහි
සහ බ්‍රාහ්මණො නො භවන්ති බ්‍රාහ්මණො,
වෙ ත්වං බ්‍රූසි මඤ්ච බ්‍රූසි අබ්‍රාහ්මණන්තං
සාවිත්තිං පුච්ඡාමි තිපදං චතුවීසතක්ඛරං.

460 කිං නිස්සිතා ඉසයො මනුජා ඛත්තියා බ්‍රාහ්මණා
දෙවතානං යඤ්ඤමකප්පයිංසු පුථූ ඉධ ලොකෙ,
යදන්තගූ වෙදගූ යඤ්ඤකාලෙ,
යස්සාහුතිං තස්සිජ්ඣෙති බ්‍රෑමි.

461 අද්ධා හි තස්ස හුතමිජ්ඣෙ (ඉති බ්‍රාහ්මණො)
යං තාදිසං වෙදගුං අද්දසාමි,
තුම්හාදිසානං හි අදස්සනෙන
අඤ්ඤො ජනො භුඤ්ජති පුරළාසං.

එකල්හි භාග්‍යවතුන්වහන්සේ සුන්දරිකභාරද්වාජබ්‍රාහ්මණයාගේ පියාහඩින් හිස විවර කළසේක. එක්බිති මෙ භවත් මුඩෙක, මෙ භවත් මුණ්ඩකයෙකැයි එතැනින් මැ පෙර ලා නවතිනු කැමැතියේ වියැ. එකල්හි සුන්දරිකභාරද්වාජබමුණුහට මෙබඳු සිත විය:

''මෙ ලොවිහි ඇතැම් මුඩුබමුණෝත් ඇත. මම තුලුන් වෙනැ ගොස් දැ පුළුවුස්නෙම් මනාය''යි. එක්බිති සුන්දරිකභාරද්වාජබ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේය. එළඹ භාග්‍යවතුන්වහන්සේට මෙබඳු බස් කීය: භවත් කිනම් ජාති ඇතියේ''දැ?යි. එකල්හි භාග්‍යවතුන්වහන්සේ සුන්දරික භාරද්වාජ බමුණුහට ගාථායෙන් කරුණුගන්වා වදළහ.

457. බ්‍රාහ්මණයෙම් නො වෙම්මැ යැ. රාජපුත්‍රයෙම් ද නො වෙමි, වෛශ්‍යගොත්‍රඇතියෙම් ද නො වෙමි. වැලිත් (ශුද්‍රාදි) අන්කිසිවෙකිම් ද නො වෙමි. පුහුදුනන් ගේ ගොත්‍ර (ත්‍රිවිධපරිඥායෙන්) පිරිසිඳ දැන රාගාදිකිඤ්චන නැතියෙම් ප්‍රඥයෙන් ලොවිහි හැසිරෙම්.

458. සඟළසිවුරු දරුයෙම් (තෘෂ්ණාසඞ්ඛ්‍යාත) ගෘහ නැතියෙම්, බහාලූ කෙස්රවුළු ඇතියෙම්, අතිශයින් නිවුනු සිතැතියෙම්, මෙලොවිහි මනුෂ්‍යයන් හා නො ඇලෙන්නෙම් හැසිරෙමි. බමුණ, (එහෙයින් තෝ) මා අතින් අකල්‍ය ගොත්‍රප්‍රශ්න පුළුවුස්හි.

459. භවත්නි, බ්‍රාහ්මණයෝ බමුණන් හා සමග භවත් බ්‍රාහ්මණයෙහි-තුයි ? එකැතින් පුළුවුස්නාහ. ඉදින් තො ද 'මා අබ්‍රාහ්මණ'යි කියහි නම් සුවිසි අකුරු ඇති (බුද්ධං සරණං ගච්ඡාමි, ධම්මං සරණං ගච්ඡාමි, සඞ්ඝං සරණං ගච්ඡාමි යන) ත්‍රිපදයුක්ත වූ ආර්‍ය සාවිත්‍රිය තා පුළුවුස්මි.

460. මෙ ලොවිහි ඍෂිහුත් බ්‍රාහ්මණයෝත් තදන්‍ය බොහෝ මනුෂ්‍යයෝත් දෙවියනට කවර නම් අදිප්‍රාය ඇතිව යඥකළාහු ද? යමෙක් (ත්‍රිවිධ පරිඥයෙන්) වර්තනයාගේ අන්තයට ගියේ (සිවුමගනැණ නම්වූ) වෙදයෙහි කෙළ පැමිණියේ යඥකාලයෙහි යමකුගේ (දෙයධර්ම සඞ්ඛ්‍යාත) ආහුතියක් ලබා නම්, ඔහුගේ එ යඥකර්මය සමෘද්ධ වන්නේයයි කියමි.

461. යම්හෙයෙකින් තොප බඳු වේදසඞ්ඛ්‍යාත චතුර්මාර්ගඥනයේ කෙළ පැමිණියකු දක්නමෝ නම්, ඒකාන්තයෙන් මැ එ මාගේ (දෙයධර්මසඞ්ඛ්‍යාත) මෙ හූතය සමෘද්ධවන්නේය. (මහත් ඵල වෙයි) තොප වැන්නවුන්ගේ අදර්ශනහෙතුයෙන් මැ අන් දෙනෝ (වරුක හා පූවසඞ්ඛ්‍යාත) හව්‍යශෙෂය (පුරොඩාශය) වළඳනේය යි (බ්‍රාහ්මණ කීය.)

462 තස්මාතිහ ත්වං බ්‍රාහ්මණ අත්ථෙන
අත්ථිකො උපසඞ්කම්ම පුච්ඡ,
සන්තං විධූමං අනීඝං නිරාසං
අප්පෙවිධ අභිවින්දෙ සුමෙධං.

463 යඤ්ඤෙ රතාහං භො ගොතම
යඤ්ඤං යට්ඨු කාමො
නාහං පජානාමි අනුසාසතු මං භවං
යත්ථ හුතං ඉජ්ඣෙ බ්‍රෑහි මෙතං.

464 තෙන හි ත්වං බ්‍රාහ්මණ ඔදහස්සු සොතං
ධම්මං තෙ දෙසිස්සාමි,

465 මා ජාතිං පුච්ඡී චරණඤ්ච පුච්ඡ
කට්ඨා හවෙ ජායති ජාතවෙදො,
නීචා කුලීනොපි මුනී ධිතිමා
ආජානියො හොති හිරීනිසෙධො.

466 සච්චෙන දන්තො දමසා උපෙතො
වෙදන්තගූ වුසිතබ්‍රහ්මචරියො,
කාලෙන තම්හි හව්‍යං පවෙච්ඡෙ
යො බ්‍රාහ්මණො පුඤ්ඤපෙඛො[1] යජෙථ.

467 යෙ කාමෙ හිත්වා අගහා චරන්ති
සුසඤ්ඤතත්තා තසරංව උජ්ජුං,
කාලෙන තෙසු හව්‍යං පවෙච්ඡෙ
යො බ්‍රාහ්මණො පුඤ්ඤපෙඛො යජෙථ.

468 යෙ වීතරාගා සුසමාහිතින්ද්‍රියා
චන්දෙ'ව රාහුග්ගහණා පමුත්තා,
කාලෙන තෙසු හව්‍යං පවෙච්ඡෙ
යො බ්‍රාහ්මණො පුඤ්ඤපෙඛො යජෙථ.

469 අසජ්ජමානා විචරන්ති ලොකෙ
සදා සතා හිත්වා මමායිතානි,
කාලෙන තෙසු හව්‍යං පවෙච්ඡෙ
යො බ්‍රාහ්මණො පුඤ්ඤපෙඛො යජෙථ.

---
1. පුඤ්ඤපෙක්ඛො - මජසං.



Free Distribution www.aathaapi.org

462. බමුණ, එකරුණින් මැ (මා කෙරෙහි පහන් වූ හෙයින් මැ) තෝ මෙ වියාහි අර්ථයෙන් අර්ථී වෙහි නම්, (කෙලෙස් ගිනි සන්හුන්හෙයින්) ශාන්ත වූ (ක්‍රොධධූම විගමනයෙන්) විධූම වූ (දුඃඛාභාවයෙන්) අනීඝ වූ (ආශාභාවයෙන්) නිරාශ වූ මා කරා එළැඹ පුළුවුස්ව. මෙ සස්නෙහි පිහිටියේ මැ ඒකාන්තයෙන් උත්තම ප්‍රාඥ (ත්‍රීක්ෂණසුව) යකු ලබනෙහිය.

463. (භවත් ගෞතමයන්වහන්ස,) මම (යඥසඞ්ඛ්‍යාත) දනයෙහි නියැලියෙම් දන් දෙනු කැමැතියෙමි මම දක්ෂිණාර්හයා නො දන්මි. යම් පුහුලකු කෙරෙහි පුදනලද (දනසඞ්ඛ්‍යාත) හූතය මහත් ඵල වෙ නම්, එපරිද්දෙන් භවත් මට අනුශාසනා කෙරේවා. තෙල කරුණ මට වදරන්න.

464. බ්‍රාහ්මණය, එකරුණින් මැ කන් රුකොට ගණුව, තහට දහම් දෙසන්නෙමි යි.

465. (ඉදින් මහත්ඵල කැමැතියෙහි නම්) දක්ෂිණාර්හයාගේ ජාතිය නහමක් පුළුවුස ශීලාදි චරණ ම පුළුවුස. කාෂ්ඨයෙන් ඒකාන්තයෙන් ගිනි උපදනේය. නීච වූයේත් අකුලීන වූයේත් ධෘතිසම්පන්න වූ හ්‍රීයෙන් ලදුස් වළහන මුනිතෙම ආජානෙය වේ.

466. පරමාර්ථ සත්‍යයෙන් දමූනේ ඉන්ද්‍රියදමනයෙන් සමන්වාගත-වූයේ සිවුමගනැණින් කෙලෙසුන්ගේ අන්තයට ගියේ වැසැ නිමවූ මගබඹසර ඇති යම් දක්ෂිණාර්හයෙක් වේ නම්, නිසි කල්හි යම් බ්‍රාහ්මණයෙක් පුණ්‍යාපෙක්ෂා ඇතියේ යාග ද කෙරේ නම්, ඔහු කෙරෙහි දෙයධර්ම සඞ්ඛ්‍යාත හව්‍යය පිරිනමන්නේය.

467. යම් කෙනෙක් වස්තුකාමක්ලෙශකාමයන් හැරපියා තෘෂ්ණා නැතියාහු මොනවට සංයත සිත් ඇත්තාහු සෘජු ත්‍රසරයක් සෙයින් හැසිරෙත් නම්, යම් බ්‍රාහ්මණයෙක් පින්කැමැතියේ යාග ද කෙරේ නම්, සුදුසු කල්හි ඔවුනට පුරොඩාශය පිරිනමන්නේය.

468. යම් කෙනෙක් පහවූ රාගඇත්තාහු මනාකොට සන්හුන් ඉඳුරන් ඇත්තාහු රාහුග්‍රහණයෙන් මුත් සඳ මෙන් කෙලෙසුන්කෙරෙන් මිදුනාහු ද, යම් බමුණෙක් පින්කැමැතිව යාග කෙරේ නම්, උන් කෙරෙහි හව්‍යය පිරිනමන්නේය,

469. පඤ්චස්කන්ධසඞ්ඛ්‍යාත ලෝකයෙහි නො ලගනාහු තෘෂ්ණාදෘෂ්ටි මමායිතයන් හැරපියා හැමකල්හි ස්මෘතිමත්වූවාහු හැසිරෙත් නම්, යම් බ්‍රාහ්මණයෙක් පුණ්‍යාපෙක්ෂා ඇතියේ යාග කෙරේ නම් නිසිකල්හි ඔවුන් කෙරෙහි හව්‍යය පිරිනමන්නේය.



Free Distribution www.aathaapi.org

470 යෙ කාමෙ හිත්වා අභිභුය්‍යචාරී
යො වෙදි ජාතිමරණස්ස අන්තං.
පරිනිබ්බුතො උදකරහදොව සීතො
තථාගතො අරහති පූරළාසං.

471 සමො සමෙහි විසමෙහි දූරෙ
තථාගතො හොති අනන්තපඤ්ඤො,
අනූපලිත්තො ඉධ වා හුරං වා
තථාගතො අරහති පූරළාසං.

472 යම්හි න මායා වසතී න මානො
යො වීතලොභො අමමො නිරාසො,
පනුණ්ණකොධො අභිනිබ්බුතත්තො
යො බ්‍රාහ්මණො සොකමලං අහාසි
තථාගතො අරහති පූරළාසං.

473 නිවෙසනං යො මනසො අහාසි
පරිග්ගහා යස්ස න සන්ති කෙචි,
අනුපාදියානො ඉධ වා හුරං වා
තථාගතො අරහති පූරළාසං.

474 සමාහිතො යො උදතාරි ඔඝං
ධම්මං චඤ්ඤාසි පරමාය දිට්ඨියා,
ඛීණාසවො අන්තිමදෙහධාරී
තථාගතො අරහති පූරළාසං.

475 භවාසවා යස්ස වචීඛරා ච
විධූපිතා අත්ථගතා න සන්ති,
ස වෙදගූ සබ්බධි විප්පමුත්තො
තථාගතො අරහති පූරළාසං.

476 සඞ්ගාතිගො යස්ස න සන්ති සඞ්ගා
සො මානසත්තෙසු අමානසත්තො,
දුක්ඛං පරිඤ්ඤාය සඛෙත්තවත්ථුං
තථාගතො අරහති පූරළාසං.



Free Distribution www.aathaapi.org

470. යමෙක් ක්ලෙශකාමයන් හැරපියා වස්තුකාමයන් මැඩැගෙණ හැසිරෙන්නේ ද, යමෙක් ජාතිමරණයන්ගේ අන්තය වන නිර්වාණය ප්‍රඥාබලයෙන් දත්තේ ද දියවිලක් සෙයින් සිහිල්වූයේ කෙලෙස් පිරිනිවියේ නම් ඒ තථාගත පුරොඩාශයට නිසි වෙයි.

471. විපස්සිබුද්ධාදි සමපුද්ගලයන් හා සමවූයේ විෂමපුද්ගලයන් කෙරෙන් දුරු වෙසෙන තථාගත තෙමේ අනන්තප්‍රඥා ඇතියේ වෙයි. මෙලොවහි හෝ පරලොවහි හෝ ක්ලෙශවශයෙන් නො ලැගී ඒ තථාගත පුරොඩාශයට නිසි වේ.

472. යම් පුද්ගලයකු කෙරෙහි මායාව නො වේ ද, මාන නැතියේ ද යමෙක් පහකළ ලෝභඇතියේ මමත්ව නැතියේ ආශාරහිත වූයේ ක්ෂීණක්‍රෝධ-ඇත්තේ මොනොවට කෙලෙස්පිරිනිවුමෙන් යුත් සිත් ඇත්තේ ද, යම් (බාහිතපාපී) බ්‍රාහ්මණයෙක් ශොකමලදුරුහීණ කෙළේ ද, ඒ තථාගත හව්‍යද්‍රව්‍යයට සුදුසු වෙයි.

473. යමෙක් සිත පිළිබඳ තෘෂ්ණාමානදෘෂ්ටිනිවෙසන දුරු කෙළේ ද, යමකුට නිසි පරිග්‍රහයෝ නැත් ද, මෙලොවහි හෝ පරලොවහි හෝ කිසිවක් උපාදාන විසින් නො ගන්නේද, එබඳු තථාගත පූරලාසයට සුදුසු වෙයි.

474. මාර්ගසමාධියෙන් සමාහිත වූ යමෙක් චතුරොඝ තරණය කෙළේද, උත්තම සර්වඥතාඥානයෙන් පඤ්චවිධඥෙයධර්මය ද දත්තේ ද, ක්ෂීණාශ්‍රව වූයේ අන්තිම දේහය ධරණ සුලු ඒ තථාගත යඥද්‍රව්‍යයට සුදුසු වෙයි.

475. යමකු විසින් භවතෘෂ්ණා, ධ්‍යානනිකාන්ති, ශාශ්වතදෘෂ්ටිසහගත රාගයෝ ද කැකුළුබස් ද දවනලදහු නම්, අස්තයට ගියාහු විද්‍යමාන නො වෙත් ද, (චතුර්මාර්ගඥානසඞ්ඛ්‍යාත) වෙදයාගේ අන්තයට ගියේ හැම ස්කන්ධා-යතනයන්හි විප්‍රමුක්ත වූයේ නම් ඒ තථාගත යඥයට නිසි වෙයි.

476. යමෙක් රාගාදි හැම සඞ්ගයන් ඉක්මැගියේ ද යමකුහට මානයෙන් ලැඟුනු සත්ත්වයන් කෙරෙහි සඞ්ගයෝ විද්‍යමාන නොවෙත් ද, යමෙක් හේතුප්‍රත්‍යයන් සහිත වර්තදුඃඛය පිරිසිඳ දන මානයෙන් නො ලැගියේ ද, ඒ තථාගත පුරොඩාශයට සුදුසු වෙයි:

477 ආසං අනිස්සාය විවෙකදස්සී
පරවෙදියං දිට්ඨිමුපාතිවත්තො,
ආරම්මණා යස්ස න සන්ති කෙචි
තථාගතො අරහති පූරළාසං.

478 පරොවරා යස්ස සමෙච්ච ධම්මා
විධූපිතා අත්ථගතා න සන්ති,
සන්තො උපාදානඛයෙ විමුත්තො
තථාගතො අරහති පූරළාසං.

479 සංයොජනං ජාතිඛයන්තදස්සී
යොපානුදි රාගපථං අසෙසං,
සුද්ධො නිද්දොසො විමලො අකාචො[1]
තථාගතො අරහති පූරළාසං.

480 යො අත්තනාත්තානං නානුපස්සති
සමාහිතො උජ්ජුගතො ඨිතත්තො,
ස වෙ අනෙජො අඛිලො අකඞ්ඛො
තථාගතො අරහති පූරළාසං.

481 මොහන්තරා යස්ස න සන්ති කෙචි
සබ්බෙසු ධම්මෙසු ච ඤාණදස්සී,
සරීරඤ්ච අන්තිමං ධාරෙති
පත්තො ච සම්බොධිමනුත්තරං සිවං
එත්තාවතා යක්ඛස්ස සුද්ධි
තථාගතො අරහති පූරළාසං.

482 හුතං ච මය්හං හුතමත්ථු සච්චං
යං තාදිසං වෙදගුනං අලත්ථං,
බ්‍රහ්මා හි සක්ඛි පතිගණ්හාතු මෙ භගවා
භුඤ්ජතු මෙ භගවා පූරළාසං.

---

1. අකාමො – මුස්‍යා.

477. තෘෂ්ණාව නිඃශ්‍රය නො කොට නිර්වාණසඞ්ඛ්‍යාත උපධිවිවෙකය දක්නා සුල්ලේ (අන්‍යතීර්ථක වූ) පරා විසින් දතයුතු දෙසැටමිසදිටු ඉක්මැ ගියේ ද, පුනර්භවකාරණ නම් වූ ආලම්බනප්‍රත්‍යයයෝ කිසිත් යමකුට නැත් ද, එ තථාගත පුරොඩාශයට අර්හ වෙයි.

478. යමකුට (බාහිර ආධ්‍යාත්මික) පරඅවර ස්කන්ධාදි ධර්මයෝ නැණින් පිරිසිඳ දූන දවනලද්දහු අස්තයට ගියාහු නො මැත්තාහු ද ශාන්තවූයේ උපාදනක්ෂය නම් වූ නිර්වාණය නිමිති කොට විමුක්ත වූයේ ද එ තථාගත පුරොඩාශයට අර්හ වෙයි.

479. සංයොජනක්ෂය හා ජාතික්ෂය දක්නා සුලු යමෙක් (දුගතියට පථ වන) රාගාරම්මණපථය නිරවශෙෂ කොට දුරු කෙළේ ද, (පරිශුද්ධ කාය සමාචාරාදිය ඇති බැවින් ශුද්ධවූයේ (රාග දෙස, දෙස දෙස, මොහදෙසන්යගේ අභාවයෙන්) නිර්දෙෂවූයේ (රාගමලාදීයෙන් දුරු හෙයින්) විමලවූයේ (ආගුසඞ්ඛ්‍යාත අපරාධ නො කරණ හෙයින්) කාම රහිත වූයේ ද, එ තථාගත හව්‍යයට නිසි වෙයි.

480. යමෙක් (ඥනසම්ප්‍රයුක්තචිත්තයෙන්) තෙමේ (ස්කන්ධයන්හි) නිත්‍යාත්මයක් නො දක්නේ මාර්ග සමාධියෙන් යුක්තවූයේ, (කායවඞ්කාදීන් ගේ අභාවයෙන්) සෘජු වූයේ (ලොකධර්මයන්හි අකම්පනියභාවයෙන් ස්ථිතාත්මවූයේ ද, තෘෂ්ණාසඞ්ඛ්‍යාත එජා නැති, පඤ්චචෙතොඛිලාභාව යෙන් අඛිල වූ අටතන්හි සැකනැතියෙන් අකඞ්ඛවූ තථාගත පූරළාසයට අර්හ වෙයි.

481. යමකුහට කිසිදු (ක්ලෙශසඞ්ඛ්‍යාත) මෝහකාරණයෝ නැත් ද සකලඥෙයධර්මයන්හිත් සාක්ෂාත්කෘත සර්වඥතාඥන ඇත්තේ ද, (පුනර්භවනිරොධයෙන්) අන්තිමශරීරය දරන්නේ ද, ප්‍රත්‍යෙකබුද්ධශ්‍රාවකයන් හා අසාධාරණහෙයින් අනුත්තරවූ ක්ෂෙමවූ(අර්හත්වසඞ්ඛ්‍යාත)සම්බොධියට ද පැමිණියේ ද, එපමණෙකින් (පුරුෂසඞ්ඛ්‍යාතයක්හුගේ ව්‍යවදනතා සඞ්ඛ්‍යාත) ශුද්ධිය වේ. එබඳු තථාගත පූරළාසයට නිසි වේ.

482. යම්හෙයෙකින් භවතුන් වැනි වෙදපාරගතයක්හු ලදින් නම් එමාගේ හුතය සත්‍ය වූ ම හුතයෙක් වේවා ප්‍රත්‍යක්ෂබ්‍රහ්ම වූ ම භාග්‍යවතුන්-වහන්සේ මාගේ හව්‍යය පිළිගන්නා සේක්වා. භාග්‍යවතුන්වහන්සේ මාගේ හව්‍යය වළඳනසේක්වා.

483 ගාථාභිගීතං මෙ අභොජනෙය්‍යං
සම්පස්සතං බ්‍රාහ්මණ නෙස ධම්මො
ගාථාභිගීතං පනුදන්ති බුද්ධා
ධම්මෙ සති බ්‍රාහ්මණ වුත්තිරෙසා.

484 අඤ්ඤෙන ච කෙවලිනං මහෙසිං
ඛීණාසවං කුක්කුච්චවූපසන්තං,
අන්නෙන පානෙන උපට්ඨහස්සු
ඛෙත්තං හි තං පුඤ්ඤපෙඛස්ස හොති.

485 සාධාහං භගවා තථා විජඤ්ඤං
යො දක්ඛිණං භුඤ්ජෙය්‍ය මාදිසස්ස,
යං යඤ්ඤකාලෙ පරියෙසමානො
පප්පුය්‍ය තව සාසනං.

486 සාරම්භා යස්ස විගතා චිත්තං යස්ස අනාවිලං,
විප්පමුත්තො ච කාමෙහි ථීනං යස්ස පනූදිතං.

487 සීමන්තානං විනෙතාරං ජාතිමරණකොවිදං,
මුනිං මොනෙය්‍යසම්පන්නං තාදිසං යඤ්ඤමාගතං

488 භකුටිං විනයිත්වාන පඤ්ජලිකා නමස්සථ,
පූජෙථ අන්නපානෙන එවං ඉජ්ඣන්ති දක්ඛිණා.

489 බුද්ධො භවං අරහති පුරළාසං
පුඤ්ඤක්ඛෙත්තමනුත්තරං,
ආයාගො සබ්බලොකස්ස
භොතො දින්නං මහප්ඵලන්ති.

අථ ඛො සුන්දරිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම, සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති, එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. ලභෙය්‍යාහං භොතො ගොතමස්ස සන්තිකෙ පබ්බජ්ජං ලභෙය්‍යං උපසම්පදන්ති, අලත්ථ ඛො සුන්දරිකභාරද්වාජො බ්‍රාහ්මණො –පෙ– අරහතං අහොසීති.

සුන්දරිකභාරද්වාජසුත්තං නිට්ඨිතං.



Free Distribution www.aathaapi.org

483. ගාථාභිගීතය මා විසින් නොවැළඳියයුතු වෙයි. බ්‍රාහ්මණය, සම්‍යගාජීවශුද්ධිය දක්නා සම්බුදුන්ගේ තෙල චාරිත්‍ර නොවේ. සම්බුද්ධයෝ ගාථාභිගීත (පිණ්ඩපාතය) පිළිකෙවූ කරත්. බ්‍රාහ්මණය, සුචරිතධර්මය නොහොත් චාරිත්‍රධර්මය (ලොවුතු) ඇතිකල්හි තෙල ජීවිතවෘත්තිය වේ.

484. අන්‍යතර ආහාර පානයෙකින් මැ සර්වගුණ පරිපූර්ණවූ, ක්ෂීණාස්‍රව වූ, සන්සුන් කුකුස් ඇති, මහර්ෂිහු වටව. පුණ්‍යාපෙක්ෂකහට එ පුණ්‍යක්ෂෙත්‍ර ම වෙයි.

485. භාග්‍යවතුන් වහන්ස, මුඹවහන්සේගේ අවවාදශාසනයට පැමිණ යඥකාලයෙහි යම්බඳු දක්ෂිණාර්හයකු සොයනුයෙම් වටනෙම් නම්, යම්, දක්ෂිණාර්හයෙක් මාගේ දන් වළඳා නම්, එපුඟුල්හු මම එලෙසින් දතුම් නම් මැනැවි.

486. යම් පුඟුලක්හුගේ සාරම්භයෝ පහවූහු ද, යමකුගේ චිත්තයත් නො කැලැඹිනි ද, වස්තුකාමක්ලෙශකාමයෙන් විප්‍රමුක්ත හා වේ ද, යමකුන්ගේ ථිනමිද්ධයත් ප්‍රහීණ වී ද,

487. සීමාන්තයන් (ක්ලෙශමියරත්) මඩනා, ජාතිමරණ දෙක්හි දක්ෂ වූ, මෞනෙය්‍යසඞ්ඛ්‍යාත ප්‍රඥයෙන් සමන්වාගත වූ යඥයට සම්ප්‍රාප්ත එ බඳු මුනිහු-

488. භ්‍රකුටි (බැමහැකිළීම්) හැරපියා බඳැදිලි වැ නමස්කාර කරව. ආහාරපානයෙන් පූජා කරව, මෙසෙයින් දක්ෂිණාවෝ සමෘද්ධ වෙත්.

489. අනුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ පුරොඩාශයට නිසි වෙති. සව්ලොවන් විසින් වෙත පැමිණ පිදියයුතු වෙත්. භවතුන්වහන්සේට දෙනලද දෑ මහත්ඵල ඇතියේ යයි.

ඉක්බිති සුන්දරික භාරද්වාජබ්‍රාහ්මණ භාග්‍යවතුන්වහන්සේට තෙල කරුණ දැන්විය: භවත් ගෞතමයන්වහන්ස, ඉතා කාන්ත වෙයි. භවත් ගෞතමයන්වහන්ස, ඉතා කාන්ත වෙයි, භවත් ගෞතමයන්වහන්ස, යම්පරිදි යටිහුරු වූවක් උඩුහුරු කරණලද නම්, පිළිසන් වූවක් විවර කෙරේ නම්, මංමුළාවූවකුහට මාර්ගය හෝ කියා නම් ,ඇස්ඇතියහු රූ දකිත්වා''යි අඳුරෙහි තෙල් පහනක් දරන්නේ හෝ වේ නම් එ පරිද්දෙන් ම භවත් ගෞතමයන්වහන්සේ විසින් අනෙකපර්‍යායයෙන් ධර්මය ප්‍රකට කරණලද, තෙල මම -පෙ- සරණ යෙමි -පෙ- රහතුන් අතුරෙහි වීයයි.

සුන්දරිකභාරද්වාජ (පූරළාස) සූත්‍රය නිමි.



Free Distribution www.aathaapi.org

# 3 – 5

## මාඝසුත්තං

එවං මෙ සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ. අථ ඛො මාඝො මාණවො යෙන භගවා තෙනුපසඞ්කමි උපසංකමිත්වා භගවතා සද්ධිං සම්මෝදි, සම්මෝදනීයං කථං සාරාණීයං[1] වීතිසාරෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො මාඝො මාණවො භගවන්තං එතදවොච:

අහං හි භො ගොතම, දායකො දානපති වදඤ්ඤූ යාචයොගො ධම්මේන භොගෙ පරියෙසාමි, ධම්මේන භොගෙ පරියෙසිත්වා ධම්මලද්ධෙහි භොගෙහි ධම්මාධිගතෙහි එකස්සාපි දදාමි ද්වින්නම්පි දදාමි තිණ්ණම්පි දදාමි චතුන්නම්පි දදාමි පඤ්චන්නම්පි දදාමි ඡන්නම්පි දදාමි සත්තන්නම්පි දදාමි අට්ඨන්නම්පි දදාමි නවන්නම්පි දදාමි දසන්නම්පි දදාමි වීසායපි දදාමි තිංසායපි දදාමි චත්තාරීසායපි දදාමි පඤ්ඤාසායපි දදාමි සතස්සපි දදාමි භීය්‍යොපි දදාමි. කච්චාහං ගොතම එවං දදන්තො එවං යජන්තො බහුං පුඤ්ඤං පසවාමීති,

තග්ඝ ත්වං මාණව, එවං දදන්තො එවං යජන්තො පරියෙසිත්වා ධම්මලද්ධෙහි භොගෙහි ධම්මාධිගතෙහි එකස්සපි දදාති –පෙ– සතස්සපි දදාති භීය්‍යොපි දදාති බහුං පුඤ්ඤං පසවතීති.

අථ ඛො මාඝො මාණවො භගවන්තං ගාථාය අජ්ඣභාසි.

490 පුච්ඡාමහං ගොතමං වදඤ්ඤුං (ඉති මාඝො මාණවො)
කාසායවාසිං අගිහං[2] චරන්තං
යො යාචයොගො දානපතී ගහට්ඨො,
පුඤ්ඤත්ථිකො යජති පුඤ්ඤපෙඛො
දදං පරෙසං ඉධ අන්නපානං
කථං හුතං යජමානස්ස සුජ්ඣෙ.

491 යො යාචයොගො දානපතී ගහට්ඨො (මාඝාති භගවා)
පුඤ්ඤත්ථිකො යජති පුඤ්ඤපෙඛො
දදං පරෙසං ඉධ අන්නපානං
ආරාධයෙ දක්ඛිණෙය්‍යෙ හි තාදී.

---

1. සාරණීයං – මජසං, මු 2
2. අගහං – මු 2.

## 3 – 5

## මාඝ සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ගිජ්ඣකූට පවුයෙහි වැඩවසන සෙයෙක. එකල්හි මාඝ නම් බමුණු මණෙවු භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ භාග්‍ය-වතුන් වහන්සේ පමග සතුටු විය. සතුටුවියයුතු සිහිකටයුතු කථා කොට නිමවා එකත්පසෙක හිත. එකත් පසෙක හුන් මාඝ මණෙවු භාග්‍යවතුන් වහන්සේට මෙල කරුණ දන්වීය.

භවත් ගෞතමයන් වහන්ස, මම වනාහි දනපති දයකයෙමි යදියන්ගේ බස් දන්නෙමි යදනට නිසි වූයෙමි ධර්මයෙන් භෝග සොයමි. දැහැමින් භෝග සොයා ධර්මයෙන් ලද, ධර්මාධිගත භෝගයෙන් එකක්හට ද දෙමි, දෙදෙනකුන්හට ද දෙමි, තිදෙනකුන්ට ද දෙමි, සතර දෙනකුන්ට ද දෙමි, පස්දෙනකුන්ට ද දෙමි, සදෙනකුන්ට ද දෙමි, සත්දෙනකුන්ට ද දෙමි, අට දෙනකුන්ට ද දෙමි, නව දෙනකුන්ට ද දෙමි, දසදෙනකුන්ට ද දෙමි, විසිදෙනකුන්ට ද දෙමි, තිස්දෙනකුන්ට ද දෙමි, සාලිස් දෙනාන්-හට ද දෙමි, පණස් දෙනකුන්ට ද දෙමි, සියදෙනකුන්ට ද දෙමි, ඉන් වැඩි බොහෝ දෙනකුන්ට ද දෙමි. භවත් ගෞතමයන් වහන්ස, කිම මම මෙසේ දන්දෙනුයෙමි මෙ සෙයින් යාග කරනෙමි බොහෝ පින් රැස් කරම් දැයි?

මාණවය, ඒකාන්‍යයෙන් මැ (තෝ මෙසෙයින් දන් දෙන්නෙහි මෙසෙයින් යාගකරන්නෙහි බොහෝ පින් රැස් කෙරෙහි. මාණවය, යම් දයකයෙක් දනපතිවූයේ යදියන්ගේ බස් දන්නේ යාවයොග වූයේ ධර්මයෙන් භොගපයෙෂණා කෙරේ නම්, ධර්මයෙන් භොගපයෙෂණා කොට ධර්මලබ්ධ වූ ධර්මාධිගත වූ භොගයෙන් එකකුහට ද දන් දේ නම් – පෙ – සිය දෙනකුන්හට ද දේ නම්, එයින් වැඩි දෙනකුන්ට ද දේ නම්, බොහෝ පින් රැස් කෙරේ යයි,

ඉක්බිති මාඝ මාණව භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් මෙසේ කීය.

490. ''මම වදන් දන්නා, කාෂායවස්ත්‍රධාරී වූ තෘෂ්ණායෙන් තොර ව හැසිරෙණ භවත් ගෞතමයන් වහන්සේ පුළුවුස්මි. යදනට නිසි, දනපති වූ පුණ්‍යාර්ථී යම් ගෘහස්ථයෙක් පින් කැමැතියේ යාග කෙරේ නම්, මෙ ලොවහි මෙරමාහට අහර පැන් දෙන්නේ නම්, කෝතන්හි යාගකරන්නහුගේ යාගය ශුද්ධවන්නේද?''යි මෙසේ මාඝ ඇසීය.

491. ''මෙ ලොවහි පින් කැමැති මෙරමාහට ආහාරපාන දෙන දනපති වූ පුණ්‍යාර්ථී ගෘහස්ථයෙක් යදනට නිසි වූයේ යාග කෙරේ නම්, හේ තාදී වූ ම දක්ෂිණාර්හයන් අරියන්නේය''යි මෙසේ භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

492 යො යාචයොගො දානපති ගහට්ඨො (ඉති මාඝො මාණවො)
පුඤ්ඤත්ථිකො යජති පුඤ්ඤපෙක්ඛො,
දදං පරෙසං ඉධ අන්නපානං
අක්ඛාහි මෙ භගවා දක්ඛිණෙය්‍යෙ.

493 යෙ වෙ අසත්තා විචරන්ති ලොකෙ
අකිඤ්චනා කෙවලිනො යතත්තා,
කාලෙන තෙසං හව්‍යං පවෙච්ඡෙ
යො බ්‍රාහ්මණො පුඤ්ඤපෙක්ඛො යජෙථ.

494 යෙ සබ්බසංයොජනබන්ධනච්ඡිදා
දන්තා විමුත්තා අනීඝා නිරාසා,
කාලෙන තෙසු හව්‍යං පවෙච්ඡෙ
යො බ්‍රාහ්මණො පුඤ්ඤපෙක්ඛො යජෙථ.

495 යෙ සබ්බසංයොජනවිප්පමුත්තා
දන්තා විමුත්තා අනීඝා නිරාසා
කාලෙන තෙසු හව්‍යං පවෙච්ඡෙ
යො බ්‍රාහ්මණො පුඤ්ඤපෙක්ඛො යජෙථ.

496 රාගඤ්ච දොසඤ්ච පහාය මොහං
ඛීණාසවා වුසිතබ්‍රහ්මචරියා,
කාලෙන තෙසු හව්‍යං පවෙච්ඡෙ
යො බ්‍රාහ්මණො පුඤ්ඤපෙක්ඛො යජෙථ.

497 යෙසු න මායා වසති න මානො
යෙ වීතලොභා අමමා නිරසා,
කාලෙන තෙසු හව්‍යං පවෙච්ඡෙ
යො බ්‍රාහ්මණො පුඤ්ඤපෙක්ඛො යජෙථ.

498 යෙ වෙ න තණ්හාසු උපාතිපන්නා
විතරෙය්‍ය ඔඝං අමමා චරන්ති.
කාලෙන තෙසු හව්‍යං පවෙච්ඡෙ
යො බ්‍රාහ්මණො පුඤ්ඤපෙක්ඛො යජෙථ.

499 යෙසං තණ්හා නත්ථි කුහිඤ්චි ලොකෙ
භවාභවාය ඉධ වා හුරං වා,
කාලෙන තෙසු හව්‍යං පවෙච්ඡෙ
යො බ්‍රාහ්මණො පුඤ්ඤපෙක්ඛො යජෙථ.



Free Distribution www.aathaapi.org

492. මෙලොවෙහි යදනට නිසි, දනපති වූ පුණ්‍යාර්ථී වූ යම් ගැහැවියෙක් පින් කැමැතියේ මෙරමාහට දන් දෙමින් යාග කෙරේ ද, භාග්‍යවතුන් වහන්ස, එබඳු මාහට දක්ෂිණාර්හයන් වදළ මැනැවි.

493. ලෝකයෙහි යම් කෙනෙක් (රාගසඞ්ගාදී විසින්) නො ලැගියාහු පරිනිෂ්ඨිතකෘත්‍ය ඇතියාහු කිඤ්චන රහිත වූවාහු යතාත්ම වූවාහු හැසිරෙත් නම්, යම් බ්‍රාහ්මණයෙක් පින් කැමැතියේ යාග කෙරේ නම් නිසි කල්හි ඒ පුහුලන් කෙරෙහි හව්‍යසඞ්ඛ්‍යාත දන් පිරිනමන්නේ ය.

494. යම් බමුණෙක් පින් කැමැතියේ යාග කෙරේ ද, හේ, යම් කෙනෙක් හැම සංයෝජනබන්ධනයන් සිඳලූවාහු අනුත්තර දමථයෙන් දැමුනාහු ප්‍රඥා – චෙතොවිමුක්ති දෙකින් විමුක්තවූවාහු (ආයතිවර්ත දුඃඛාභාවයෙන්) ඊසරහිත වූවාහු (ක්ලෙශාභාවයෙන්) ආශා රහිත වූවාහු වෙත් නම්, ඒ පුහුලන් කෙරෙහි සුදුසු කල්හි හව්‍යය දනය කරන්නේය.

495. යම් බමුණෙක් පින් කැමැතියේ යාග කෙරේ නම් හේ, යම් කෙනෙක් සර්ව සංයෝජනයෙන් වෙසෙසින් මිදුනු දන්තවූ විමුක්ත වූ අනීඝ වූ නිරාස වුහු නම් ඔවුන් කෙරෙහි නිසි කල්හි යඥශේෂය පවරන්නේ ය.

496. යම් බමුණෙක් පුණ්‍යාපෙක්ෂා ඇතියේ යාගකරන්නේ නම් රාග දෙස, මෝහ හැර පියා ක්ෂීණාශ්‍රව වූ වැසනිම කළ මහබඹසර ඇති යම් කෙනෙක් වෙත් නම් නිසි කල්හි ඔවුන් කෙරෙහි හව්‍යය දෙන්නේ ය.

497. යම් බමුණෙක් පුණ්‍යාපේක්ෂා ඇතියේ යාගකෙරේ නම්, හෙ, යම් කෙනෙකුන් කෙරෙහි මායා නැද්ද, මාන නැද්ද, යම් කෙනෙක් පහ කළ ලොභ ඇත්තාහු ද මමත්‍වයෙන් තොරවූවාහු ආශාරහිත වෙත් ද, ඔවුන් කෙරෙහි නිසි කල්හි දන් දෙන්නේ ය.

498. යම් බමුණෙක් පින්කැමැතියේ යාග කෙරේ නම් හෙ, යම් කෙනෙක් ඒකාන්තයෙන් කාම තෘෂ්ණාදියෙහි නො වැටුණාහු, චතුරොඝය තරණය කොට මමත්‍වයෙන් තොරව හැසිරෙත් ද, ඔවුන් කෙරෙහි නිසි කල්හි දන්දෙන්නේ ය.

499. යම් බ්‍රාහ්මණයෙක් පින්කැමැතියේ යාග කෙරේ නම් හේ, යමකුන්හට මෙලොවෙහි වේවයි, පරලොවෙහි වේවයි කිසිදු ලොවෙක්හි ශාශ්වත උච්ඡෙද විසින් නොහොත් පුනර්භවයාගේ අනභිනිර්වෘතිය සඳහා තෘෂ්ණා නැත් ද, ඔවුන් කෙරෙහි නිසි කල්හි හව්‍යය දෙන්නේ ය.



Free Distribution www.aathaapi.org

500 යෙ කාමෙ හිත්වා අගිහා[1] චරන්ති
සුසඤ්ඤතත්තා තසරංව උජ්ජුං.
කාලෙන තෙසු හව්‍යං පවෙච්ඡෙ
යො බ්‍රාහ්මණො පුඤ්ඤපෙක්ඛො යජෙථ.

501 යෙ වීතරාගා සුසමාහිතින්ද්‍රියා
චන්දෙව රාහුග්ගහණා පමුත්තා,
කාලෙන තෙසු හව්‍යං පවෙච්ඡෙ
යො බ්‍රාහ්මණො පුඤ්ඤපෙක්ඛො යජෙථ.

502 සමිතාවිනො වීතරාගා අකොපා
යෙසං ගතී නත්ථි ඉධ විප්පහාය,
කාලෙන තෙසු හව්‍යං පවෙච්ඡෙ
යො බ්‍රාහ්මණො පුඤ්ඤපෙක්ඛො යජෙථ.

503 ජහිත්වා ජාතිමරණං අසෙසං
කථංකථං සබ්බමුපාතිවත්තා,
කාලෙන තෙසු හව්‍යං පවෙච්ඡෙ
යො බ්‍රාහ්මණො පුඤ්ඤපෙක්ඛො යජෙථ.

504 යෙ අත්තදීපා විචරන්ති ලොකෙ
අකිඤ්චනා සබ්බධි විප්පමුත්තා,
කාලෙන තෙසු හව්‍යං පවෙච්ඡෙ
යො බ්‍රාහ්මණො පුඤ්ඤපෙක්ඛො යජෙථ.

505 යෙ හෙත්ථ ජානන්ති යථා යථා ඉදං
අයමන්තිමා නත්ථි පුනබ්භවොති,
කාලෙන තෙසු හව්‍යං පවෙච්ඡෙ
යො බ්‍රාහ්මණො පුඤ්ඤපෙක්ඛො යජෙථ.

506 යො වෙදගූ ඣානරතො සතීමා
සම්බොධිපත්තො සරණං බහුන්නං,
කාලෙන තම්හි හව්‍යං පවෙච්ඡෙ
යො බ්‍රාහ්මණො පුඤ්ඤපෙක්ඛො යජෙථ.

1. අගහා - මු 2



Free Distribution www.aathaapi.org

500. යම් බමුණෙක් පින්කැමැතියේ යාග කෙරේ නම් හේ, යම් කෙනෙක් කාමයන් හැරපියා තෘෂ්ණා රහිත වූවාහු (අනගාරව) මොනොවට සංයතආත්ම ඇත්තාහු සෘජු නැඩාවක් සෙයින් හැසිරෙත් ද, නිසි කල්හි එ පුහුලන් කෙරෙහි දන් දෙන්නේ ය.

501. පුණ්‍යාපෙක්ෂා ඇති යම් බමුණෙක් යාග කෙරේ නම් හේ, පහ කළ රාග ඇති යම් කෙනෙක් මොනොවට සමාහිත වූ ඉඳුරන් ඇත්තාහු රාහු ග්‍රහණයෙන් ප්‍රමුක්ත වූ චන්ද්‍රයා සෙයින් ප්‍රමුක්ත වෙත් ද, එපුහුලන් කෙරෙහි නිසි කල්හි දන් දෙන්නේ ය.

502. යම් බමුණෙක් පින් කැමැතියේ යාග කෙරේ නම් හේ, යම් කෙනෙක් කෙලෙස් සන්හිඳුවන්නාහු පහ කළ රාග ඇත්තාහු කෝප රහිත වූවාහු ද, යමකුන්ට මෙලොව්හි ස්කන්ධ හැරපියා ලීමෙන් පුනර්භව ගමනෙක් නැත් ද, එ පුහුලන් කෙරෙහි සුදුසු කල්හි යඥ දෙන්නේ ය.

503. යම් බමුණෙක් පුණ්‍යාපෙක්ෂා ඇත්තේ යාග කෙරේ නම් හේ, යම් කෙනෙක් ජාති මරණ නිරවශේෂයෙන් හැරපියා හැම කථංකථී භාවය ඉක්ම ගියාහු වෙත් ද, ඔවුන් කෙරෙහි නිසි කල්හි දක්ෂිණා පිරිණමන්නේ ය.

504. යම් බමුණෙක් පින් කැමැති ව යාග කෙරේ නම් හේ, යම් කෙනෙක් රාගාදි කිලුවනයෙන් තොර වූවාහු හැම ස්කන්ධයන්හි මිදුනාහු ආත්මගුණම, පිහිට කොට ඇත්තාහු ලොව්හි හැසිරෙත් ද එ පුහුලන් කෙරෙහි නිසි කල්හි දක්ෂිණා පිරිණමන්නේ ය.

505. යම් බමුණෙක් පින් කැමැතියේ යාග කෙරේ නම් හේ, යම් කෙනෙක් තෙල ස්කන්ධාදි ආයතනයෙහි මෙ ස්කන්ධායතනාදිය යම් පරිදි නම්, ඒ සවභාව එසේ ම යයි ද මේ අන්තිම ජාතිය වේ පුනර්භවයෙක් දුන් නැතැයි ද දනිත් නම්, ඔවුන් කෙරෙහි නිසි කල්හි දක්ෂිණා දෙන්නේ ය.

506. යම් බමුණෙක් පින් පතන්නේ යාග කෙරේ නම් හේ, යමෙක් (සිවුමග නැණ නම් වූ) වෙදයෙහි කෙළ පැමිණියේ (සවැදෑරුම් සතත විහාර ස්මෘතියෙන්) ස්මෘතිමත් වූයේ ධ්‍යානාභිරත වූයේ සර්වඥතාඥනයට පැමිණියේ බොහෝ දෙනාට සරණ වේ ද, එ පුහුලා කෙරෙහි නිසි කල්හි දක්ෂිණා දෙන්නේ ය.

507. අද්ධා අමොඝා මම පුච්ඡනා අහු (ඉති මාඝො මාණවො)
අක්ඛාසි මෙ භගවා දක්ඛිණෙය්‍යෙ,
ත්වං හෙත්ථ ජානාසි යථා තථා ඉදං
තථා හි තෙ විදිතො එස ධම්මො.

508. යො යාචයොගො දනපති ගහට්ඨො
පුඤ්ඤත්ථිකො යජති පුඤ්ඤපෙඛො,
දදං පරෙසං ඉධ අන්නපානං
අක්ඛාහි මෙ භගවා යඤ්ඤසම්පදං.

509. යජස්සු යජමානො මාඝාති (භගවා)
සබ්බත්ථ ච විප්පසාදෙහි චිත්තං,
ආරම්මණං යජමානස්ස යඤ්ඤං
එත්ථ පතිට්ඨාය ජහාති දොසං.

510. සො වීතරාගො පවිනෙය්‍ය දොසං
මෙත්තං චිත්තං භාවයං අප්පමාණං,[1]
රත්තින්දිවං සතතං අප්පමත්තො
සබ්බාදිසා ඵරතෙ අප්පමඤ්ඤං.

511. කො සුජ්ඣති මුච්චති බජ්ඣති ච
කෙනත්තනා ගච්ඡති බ්‍රහ්මලොකං,
අජානතො මෙ මුනි බ්‍රෑහි පුට්ඨො
භගවා හි මෙ සක්ඛි බ්‍රහ්මජ්ජ දිට්ඨො
තුවං හි නො බ්‍රහ්මසමොසි සච්චං
කථං උපපජ්ජති බ්‍රහ්මලොකං ජුතිමා.

512. යො යජති තිවිධං පුඤ්ඤසම්පදං (මාඝාති භගවා)
ආරාධයෙ දක්ඛිණෙය්‍යෙහි තාදී,
එවං යජිත්වා සම්මා යාචයොගො
උපපජ්ජති බ්‍රහ්මලොකන්ති බ්‍රෑමී.

එවං වුත්තෙ මාඝො මාණවො භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම -පෙ- අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

මාඝසුත්තං නිට්ඨිතං.

1. භාවයමප්පමාණං - මජසං,



Free Distribution www.aathaapi.org

507. (මාඝ මානව මෙසේ විචාරයි:) එකැතින් මාගේ පැන පිළිවිසුම නො සිස් මැ වීය. භාග්‍යවතුන් වහන්සේ මට දක්ෂිණාර්හයන් දෙසූ සේක. නුඹ වහන්සේ එකාන්තයෙන් මෙ ලොවිහි මෙ ධර්‍මය යථාතථයෙන් දන්නා සේක. තෙල ධර්‍මධාතුව නුඹ වහන්සේ විසින් එ් ඇති සැටියෙන් දන්නා ලද වෙයි.

508. යදනට යෝග්‍ය වූ දනපති වූ පුණ්‍යාර්ථී වූ යම් ගැහැවියෙක් පින් කැමැතියේ යාග කෙරේ නම් මෙලොවිහි මෙරමා හට ආහාර පාන දෙනුයේ නම්, එබඳු මට භාග්‍යවතුන් වහන්ස යඥ සම්පත්තිය වදාළ මැනැව.

509. (බුදුහු මෙසේ වදාළහ:) මාඝය, යජමාන වූයෙහි යාග කරව, සියලු තන්හි තෙකල්හි සිත් පහන් කරව, යාග කරන්නා හට යඥය ආලම්බන වෙයි. එ යඥාලම්බනයෙහි පිහිටා රාගාදි ත්‍රිවිධ දෝෂය හැරපියන්නේ ය.

510. මෙසෙයින් භෝගයන්හි වීතරාග වූ හේ, සත්ත්වයන් නිමිති කොට උපදනා ද්වෙෂය මැඩැ අප්‍රමාණ මෛත්‍රීචිත්තය වඩන්නේ රාත්‍රින්දිවයෙහි නිරතුරු අප්‍රමත්ත වූයේ මෙත්දැහැන් නම් වූ අප්‍රාමාණ්‍යය හැම දික්හි පතුරන්නේ යි.

511. කවරෙක් ශුද්ධ වේ ද? මිදේ ද? බැඳේ ද? කවර කරුණෙකින් තෙමේ බඹලොව යේ ද? මුනීන්ද්‍රයන් වහන්ස, මෙ කරුණ නො දත් මට වදාළ මැනැව, භාග්‍යවතුන් වහන්ස, ම විසින් අද බ්‍රහ්ම සියැසින් දක්නා ලද ය. නුඹ වහන්සේ අපට සත්‍ය විසින් බ්‍රහ්මසම වෙති. ජ්‍යොතිෂ්මත් වූ භාග්‍යවතුන් වහන්ස, කෙසේ නම් බඹලොවට පිළිසඳ විසින් පැමිණේ දැයි (මාඝ බුදුරදුන් පිළිවිසි.)

512. මාඝ, යමෙක් (පූර්‍ව මුඤ්චන අපරචෙතනා ප්‍රසාද සඞ්ඛ්‍යාත) ත්‍රිකාල ප්‍රසාදයෙන් යුත් යඥසම්පත්තිය සපයා ද තාදීගුණ යුත් දක්ෂිණාර්හයන් ආරාධනා කෙරේ නම්, යදනට යොග්‍ය වූයේ මෙසේ මැනැවින් යඥ කොට බඹලොවට පැමිණේ යයි කියමි'' යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

මෙසේ වදාරත් ම මාඝමාණව භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ දැන්වීය: භවත් ගෞතමයන් වහන්ස, ඉතා කාන්ත ය – පෙ – අද පටන් දිවිහිමියෙන් සරණ ගිය උවසුවකු කොට මා ධරණ සේක්වයි.

**මාඝ සූත්‍රය නිමි.**

## 3–6

# සභිය සුත්තං

එවං මෙ සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන සභියස්ස පරිබ්බාජකස්ස පුරාණසාලොහිතාය දෙවතාය පඤ්හා උද්දිට්ඨා හොන්ති, යො තෙ සභිය සමණො වා බ්‍රාහ්මණො වා ඉමෙ පඤ්හෙ පුට්ඨො ව්‍යාකරොති, තස්ස සන්තිකෙ බ්‍රහ්මචරියං චරෙය්‍යාසීති.

අථ ඛො සභියො පරිබ්බාජකො තස්සා දෙවතාය සන්තිකෙ තෙ පඤ්හෙ උග්ගහෙත්වා යෙ තෙ සමණබ්‍රාහ්මණා සඞ්ඝිනො ගණිනො ගණාචරියා ඤාතා යසස්සිනො තිත්ථකරා සාධුසම්මතා බහුජනස්ස, සෙය්‍යථීදං: පූරණො කස්සපො[1] මක්ඛලි ගොසාලො අජිතො කෙසකම්බලො පකුධො කච්චායනො සඤ්ජයො බෙලට්ඨිපුත්තො නිගණ්ඨො නාතපුත්තො. තෙ උපසඞ්කමිත්වා තෙ පඤ්හෙ පුච්ඡති, තෙ සභියෙන පරිබ්බාජකෙන පඤ්හෙ පුට්ඨා න සම්පායන්ති, අසම්පායන්තා කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොන්ති, අපි ච සභියඤ්ඤෙව පරිබ්බාජකං පටිපුච්ඡන්ති, අථ ඛො සභියස්ස පරිබ්බාජකස්ස එතදහොසි: යෙ ඛො තෙ හොන්තො සමණබ්‍රාහ්මණා සඞ්ඝිනො ගණිනො ගණාචරියා ඤාතා යසස්සිනො තිත්ථකරා සාධුසම්මතා බහුජනස්ස, සෙය්‍යථීදං: පූරණො කස්සපො – පෙ – නිගණ්ඨො නාතපුත්තො. තෙ මයා පඤ්හෙ පුට්ඨා න සම්පායන්ති අසම්පායන්තා කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොන්ති, අපි ච මමඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡන්ති, යන්නූනාහං හීනායාවත්තිත්වා කාමෙ පරිභුඤ්ජෙය්‍යන්ති.

අථ ඛො සභියස්ස පරිබ්බාජකස්ස එතදහොසි: අයම්පි සමණො ගොතමො සඞ්ඝී චෙව ගණී ච ගණාචරියො ච ඤාතො යසස්සී තිත්ථකරො සාධුසම්මතො බහුජනස්ස, යන්නූනාහං සමණං ගොතමං උපසඞ්කමිත්වා ඉමෙ පඤ්හෙ පුච්ඡෙය්‍යන්ති.

1. පූරණකස්සපො – මු. 2.



Free Distribution www.aathaapi.org

## 3 – 6

## සභිය සූත්‍රය

මා විසින් මෙසේ අසන ලද: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහි කලන්දකනිවාප නම් වේළුවනයෙහි වැඩ වසන සේක. එකල්හි සභිය නම් පරිබ්‍රාජකයාගේ පැරණි සහලේ නෑවූ දෙවියකු විසින් පැන උදෙසන ලද වෙයි. "සභිය, යම් මහණෙක් වේවයි බමුණෙක් වේවයි තා විසින් මෙ පැන පුළුවුස්නා ලදුයේ විවරණ කෙරේ නම්, උහු හමුයෙහි බඹසර වස"යි.

එක්බිති සභිය පිරිවැජි ඒ දෙවි වෙතැ පැන උගෙන පූරණ කස්සපය, මක්ඛලි ගෝසාලය, අජිත කේසකම්බලය, පකුධ කච්චායනය, සඤ්ජය බෙලලට්ඨිපුත්තුය, නිගණ්ඨ නාතපුත්තුය යන මෙබඳු ශිෂ්‍ය සඞ්ඝයාගෙන් යුක්ත වූ ගණයා ඇති ගණාචාර්‍ය වූ අභිඥාත වූ යශස්වී වූ දෘෂ්ටිතීර්ථකර වූ බහුජනයා විසින් සත්පුරුෂය යි සම්මත වූ යම් මහණ බමුණෝ වෙත් නම්, ඔවුන් වෙත ගොස් එ පැන පුළුවුස්සි. සභිය පිරිවැජි විසින් පැන පුළුවුස්නා ලද ඔහු නො සපයත්. නො සපයන්නාහු කෝප හා ද්වේෂ හා දෝමනස් හා පාළකරත්. වැලිත් සභිය පිරිවැජි ම ප්‍රතිප්‍රශ්න කරත්. එක්බිති සභිය පිරිවැජි හට මෙල සිත් විය: "පූරණ කස්සපය –පෙ– නිගණ්ඨනාත පුත්‍රය යන යම් ශිෂ්‍ය සඞ්ඝයාගෙන් සපන් වූ ගණයා ඇති ගණාදුරු වූ විශ්‍රැත වූ යශස්වී වූ තීර්ථකර වූ බොහෝ දෙනා විසින් සාධුසම්මත වූ භවත් මහණ බමුණෝ ඇත් නම්, ඔහු මා විසින් පැන පුළුවුස්නා ලද්දහු පිළිතුරු නො සපයත්. නො සපයන්නාහු කෝප හා ද්වේෂ හා අප්‍රත්‍යය හා පාළ කෙරෙත්. වැලිදු මා මැ පුළුවුස්ති. මම ගිහී භාවයට පෙරළී කාම්සුව වළඳනෙම් මැනැවැ"යි.

එක්බිති සභිය පිරිවැජිහට මෙල සිත් විය: "මෙ ශ්‍රමණ භවත් ගෞතමයෝත් ශිෂ්‍ය සඞ්ඝයා ඇතියාහු ගණයා ඇත්තාහු ගණාදුරු වූවාහු විශ්‍රැත වූවාහු යශස්වී වූවාහු තීර්ථකර වූවාහු බොහෝ ජනයා විසින් සාධු සම්මතයහ. මම ශ්‍රමණ ගෞතමයන් කරාත් ගොස් මෙ පැන පුළුවුස්නෙම් මැනැවැ"යි.



Free Distribution www.aathaapi.org

අථ ඛො සභියස්ස පරිබ්බාජකස්ස එතදහොසි: යෙපි ඛො තෙ භොන්තො සමණබ්‍රාහ්මණා ජිණ්ණා වුද්ධා මහල්ලකා අද්ධගතා වයො අනුප්පත්තා ථෙරා රත්තඤ්ඤූ චිරපබ්බජිතා සඞ්ඝිනො ගණිනො ගණාචරියා ඤාතා යසස්සිනො තිත්ථකරා සාධුසම්මතා බහුජනස්ස, සෙය්‍යථීදං: පූරණො කස්සපො – පෙ – නිගණ්ඨො නාතපුත්තො තෙපි මයා පඤ්හෙ පුට්ඨා න සම්පායන්ති අසම්පායන්තා කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොන්ති, අපි ච මඤ්ඤෙවෙත්ථ පටිපුච්ඡන්ති, කිං පන මෙ සමණො ගොතමො ඉමෙ පඤ්හෙ පුට්ඨො ව්‍යාකරිස්සති, සමණො හි ගොතමො දහරො චෙව ජාතියා නවො ච පබ්බජ්ජායාති. අථ ඛො සභියස්ස පරිබ්බාජකස්ස එතදහොසි: සමණො ඛො දහරොති න පරිභොතබ්බො දහරොපි චෙස සමණො ගොතමො මහිද්ධිකො හොති මහානුභාවො, යන්නූනාහං සමණං ගොතමං උපසඞ්කමිත්වා ඉමෙ පඤ්හෙ පුච්ඡෙය්‍යන්ති,

අථ ඛො සභියො පරිබ්බාජකො යෙන රාජගහං තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන රාජගහං වෙළුවනං කලන්දකනිවාපො, යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං[1] වීතිසාරෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො සභියො පරිබ්බාජකො භගවන්තං ගාථාය අජ්ඣභාසි:

513. කඞ්ඛී වෙචිකිච්ඡී ආගමං (ඉති සභියො)
පඤ්හෙ පුච්ඡිතුං අභිකඞ්ඛමානො,
තෙසන්තකරො භවාහි පඤ්හෙ මෙ පුට්ඨො
අනුපුබ්බං අනුධම්මං ව්‍යාකරොහි මෙ.

514. දූරතො ආගතො සි සභියා (ති භගවා)
පඤ්හෙ පුච්ඡිතුං අභිකඞ්ඛමානො,
තෙසන්තකරො භවාමි පුට්ඨො
අනුපුබ්බං අනුධම්මං ව්‍යාකරොමි තෙ.

515. පුච්ඡ මං සභිය පඤ්හං යං කිඤ්චි මනසිච්ඡසි,
තස්ස තස්සෙව පඤ්හස්ස අහං අන්තං කරොමි තෙ'ති.

අථ ඛො සභියස්ස පරිබ්බාජකස්ස එතදහොසි, අච්ඡරියං වත භො අබ්භුතං වත භො යං වතාහං අඤ්ඤෙසු සමණබ්‍රාහ්මණෙසු ඔකාසකම්ම-මත්තම්පි නාලත්ථං, තං මෙ ඉදං සමණෙන ගොතමෙන ඔකාසකම්මං කතන්ති අත්තමනො පමොදිතො උදග්ගො පීතිසොමනස්සජාතො භගවන්තං පඤ්හං පුච්ඡි:

1. සාරණීයං – මජසං මු. 1

ඉක්බිති සභිය පරිව්‍රාජකහට මෙසේ සිත් විය: පූරණ කස්සප යෑ – පෙ – නිගණ්ඨනාථ පුත්‍රය යන මෙ බඳු යම් ඒ ජරාජීර්ණ වූ අද්ධප්‍රාප්ත වෘද්ධිමයපාදවට පත්, ජාතිමහල්ලකභාවයෙන් සමන්වාගත, දෙතුන් රාජපරිවෘත්තයක් ඉක්මගිය, පැසුළු වියපත්, ස්වකීය ශ්‍රමණධර්මයෙහි තෙර බවට පත්, චිරරාත්‍රඥ වූ, පැවිදියෙන් බොහෝ කල්ගිය, ශිෂ්‍යගණයා ඇති, ගණයා ඇති කරණ, ගණාදුරු වූ, ඥාත වූ, යශස්වී වූ, තීර්ථකර වූ බහුජනයා විසින් සාධු සම්මත වූ මහණ බමුණෝ වෙත් නම්, ඔහුදු මා විසින් පැන පුළුවුස්නාලද්දහු පිළිතුරු නොසපයත්. නොසපයන්නාහු කෝප හා ද්වේෂ හා අප්‍රත්‍යය හා පළ කෙරෙත්. වැලිත් මා මැ එකරුණෙහි ප්‍රතිපෘච්ඡා කරත්. මා විසින් මෙ පැනපුළුවුස්නා ලද ශ්‍රමණ ගෞතමයෝ කවර නම් විසැඳුමක් කරත් ද? ශ්‍රමණගෞතමයෝ ජාතියෙන් දහරයහ. පැවිද්දෙන් නවකයහ''යි. එකල්හි සභිය පරිව්‍රාජකහට මෙසිත් විය: ''මහණ දහර වුව, හේ මහ ඉදු ඇතියේ මහානුභාව ඇතියේ යැ, මහණ වනාහි දහර යයි පරිභව නො කටයුතුයේ වෙයි. මම මහණ ගොයුම් කරා ගොස් මෙ පැන පුළුවුස්නෙම් මැනැවැ''යි.

එක්බිති සභිය පිරිවැජි රජගහ බලා චාරිකාවට නික්ම ගියේය. අනුපිළිවෙළින් සැරිසරන්නේ රජගහ නුවර කලන්දක නිවාප නම් වේළුවනය කරා ගොස් භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ හා සමග සතුටු විය. සතුටුවියයුතු සිහිකටයුතු කථා කොට නිමවා එකත්පසෙක හින. එකත්පසෙක හුන් සභිය පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කරුණු ගන්වා කීය:

513. ප්‍රශ්නව්‍යාකරණකාංක්ෂා ඇතියෙම්, ප්‍රශ්නාර්ථයෙහි විචිකිත්සා ඇතියෙම්, පැන පුළුවුස්නට කැමැතියෙම් පැමිණියෙම්. පුළුවුස්නාලද භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ගේ අන්තය කරණසේක් මැ මට අනුපිළිවෙළින් අර්ථානුරූප පාළිය විවරණ කළමැනැවැයි සභිය කීය.

514. ''සභිය, දුරැ සිට (තෝ) පැන පුළුවුස්නට කැමැති ව ආයෙහි ය. (තාවිසින්) පුළුවුස්නාලද්දෙම් ඒ ප්‍රශ්නයන්ගේ පර්‍යවසාන කරම්. පැන පිළිවෙළින් අනුරූප ධර්මය තොපට විවරණ කරන්නෙමි''යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

515. සභිය, සිතින් යම් මැ කිසිවක් කැමැතියෙහි නම්, එ පැන මා පුළුවුස්ව, මම තොපට එ එ ප්‍රශ්නයාගේ පර්‍යවසානය කරන්නෙම්.

එකල්හි සභිය පිරිවැජිහට මෙසේ සිත් විය: ''භවත්නි, එකැතියන් අසිරියෙකි. භවත්නි, එකැති යෙන් නො වූ විරුයෙකි. අන් මහණ බමුණන් වෙත මම එකැතින් යම්බඳු අවකාශමාත්‍රයකුදු නොලදිම් ද, මට ඒ අවසරය ශ්‍රමණ ගෞතමයන් වහන්සේ විසින් දෙන ලද වේ ය''යි ආරාධිත සිත් ඇත්තේ ප්‍රමුදිත වූයේ ඔද වැඩි සිතැතියේ හටගත් ප්‍රීතිසොමනස් ඇත්තේ භාග්‍යවතුන් වහන්සේ ගෙන් පැන පිළිවිසී.



Free Distribution www.aathaapi.org

516 කිං පත්තිනමාහු භික්ඛුනං (ඉති සභියො)
සොරතං කෙන කථඤ්ච දන්තමාහු,
බුද්ධොති කථං පවුච්චති
පුට්ඨො මෙ භගවා ව්‍යාකරොහි[1]

517 පජ්ජෙන කතෙන අත්තනා (සභියාති භගවා)
පරිනිබ්බානගතො විතිණ්ණකඞ්ඛො,
විභවඤ්ච භවඤ්ච විප්පහාය
වුසිතවා ඛීණපුනබ්භවො ස භික්ඛු

518 සබ්බත්ථ උපෙක්ඛකො[2] සතිමා
න සො හිංසති කඤ්චි සබ්බලොකෙ,
තිණ්ණො සමණො අනාවිලො
උස්සදා යස්ස න සන්ති සොරතො සො.

519 යස්සින්ද්‍රියානි භාවිතානි
අජ්ඣත්තං බහිද්ධා ච සබ්බලොකෙ,
නිබ්බිජ්ඣ[3] ඉමං පරඤ්ච ලොකං
කාලං කඞ්ඛති භාවිතො ස දන්තො.

520 කප්පානි විචෙය්‍ය කෙවලානි
සංසාරං උභයං චුතූපපාතං,
විගතරජමනඞ්ගණං විසුද්ධං
පත්තං ජාතික්ඛයං තමාහු බුද්ධන්ති.

අථ ඛො සභියො පරිබ්බාජකො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා අත්තමනො පමොදිතො උදග්ගො පීතිසොමනස්සජාතො භගවන්තං උත්තරිං පඤ්හං පුච්ඡි:

521 කිං පත්තිනමාහු බ්‍රාහ්මණං (ඉති සභියො)
සමණං කෙන කථඤ්ච නහාතකොති,
නාගොති කථං පවුච්චති
පුට්ඨො මෙ භගවා ව්‍යාකරොහි.

1. බ්‍යාකරොහි - මජසං
2. උපෙක්ඛකො - මු 2.
3. නිබ්බිජ්ජ මු.1.



Free Distribution www.aathaapi.org

516. (සභිය මෙසේ විචාරයි) කවර ප්‍රාප්තියක් (අධිගමයක්) ඇතියහු මහණැයි කියත් ද? කවර කරුණෙකින් (මහණ) **සොරත** (මොනවට සන්හුන්) යයි කියත් ද? කිසෙයින් (මහණ) **දන්තයි** කියත් ද? කිසෙයින් බුද්ධ යයි කියනු ලැබේ ද? භාග්‍යවතුන් වහන්ස, මා විසින් පුළුවුස්නා ලද ඔබ වහන්සේ විවරණ කරන සේක්ව යි.

517. (බුදුහු සභිය යි අමතා) තමා (භාවනා විසින්) කළ මාර්ගයෙන් ක්ලෙශපරිනිර්වාණයට ගිය, වෙසෙසින් තුණු සැක ඇති (විපත්ති සම්පත්ති, හානි – වෘද්ධි, උච්ඡෙද – ශාශ්වත, අපුණ්‍ය – පුණ්‍ය සඞ්ඛ්‍යාත) විභව හා භව හැර පියා වැස නිමවූ මහ බඹසර ඇති, ක්ෂීණ වූ පුනර්භව ඇති එ පුද්ගල භික්ෂු වෙයි.

518. යමෙක් රූපාදි හැම අරමුණුහි (ෂඩඞ්ගොපෙක්ෂායෙන්) උපෙක්ෂිතවූ ස්මෘතිමත් වූ හේ හැම ලොවිහි කිසිදු ප්‍රාණියකු නොපෙළන්නේද චතුරොඝ තරණය කෙළේ ද (සන්හුන් පව් ඇති හෙයින්) ශ්‍රමණ වූයේ ද, (ඇවිළගත් මිථ්‍යා සඞකල්ප නැති හෙයින්) අනාවිල වූයේ ද, යමකුහට ඖදරික වේවයි සූක්ෂම වේවයි රාග, ද්වේෂ, මෝහ, මාන, දෘෂ්ටි, ක්ලේශ, දුශ්චරිත සඞ්ඛ්‍යාතා සප්තොත්සදයෝ නොමැත්තාහු ද, හෙ සෝරත නම් වෙයි.

519. යමකු විසින් අධ්‍යාත්මයෙහි හා බාහිරයෙහිදුයි හැම ස්කන්ධලෝකයෙහි වූ චක්ෂුරාදි ෂඩින්ද්‍රියයෝ (ගොචරභාවනා වාසනාභාවනා විසින්) වඩනාලදහු ද, මෙ ස්වසන්තතිස්කන්ධලෝකය හා පරසන්තතිස්කන්ධලෝකය හා පිළිවිද (දැන) වැඩූ සිතැතියේ ජීවිතක්ෂය කාලය සාපෙක්ෂ ව වෙසේ ද, හෙ දන්ත වෙයි.

520. තෘෂ්ණා දෘෂ්ටිකල්පයන් ද, සසර ද, ච්‍යුති උපපත්ති දෙක ද, යන මෙ හැම අනිත්‍යාදි විසින් දැන කෙලෙස් රජස් දුරු ලූ, රාගාදි අඞ්ගණ රහිත වූ, රාගාදිමලවිගමයෙන් විශුද්ධ වූ, නිර්වාණ සඞ්ඛ්‍යාත ජාතික්ෂයට පැමිණි එ පුහුල් බුද්ධ යී කියත් යැයි (වදළහ.)

එකල්හි සභිය පිරිවැජි භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගෙණැ අනුමෝදන් වැ සතුටුසිත් ඇතියේ ප්‍රමුදිත වූයේ ඔදපත්සිතැත්තේ හටගත් ප්‍රීති සොම්නස් ඇතියේ භාග්‍යවතුන් වහන්සේගෙන් මත්තෙහිදු පැන පිළිවිසී:

521. (සභිය මෙසේ පිළිවිසියි:) කවර ප්‍රාප්ති ඇතියක්හු බ්‍රාහ්මණයැයි කියත් ද? කවර කරුණෙකින් ශ්‍රමණයැයි කියත් ද? කිසෙයින් ස්නාතකයයි කියත් ද? කිසෙයින් 'නාග'යි කියනු ලැබේ ද? භාග්‍යවතුන් වහන්ස, මා විසින් පුළුවුස්නාලදහු විවරණ කළ මැනව.

522 බාහිත්වා සබ්බපාපානි (සභියාති භගවා)
විමලො සාධු සමාහිතො, ඨිතත්තො,
සංසාරමතිච්ච කෙවලී සො
අසිතො තාදී පවුච්චතෙ බ්‍රාහ්මා.

523 සමිතාවී පහාය පුඤ්ඤපාපං
විරජො ඤත්වා ඉමං පරඤ්ච ලොකං,
ජාතිමරණං උපාතිවත්තො
සමණො තාදී පවුච්චතෙ තථත්තා.

524 නිනහාය[1] සබ්බපාපකානි
අජ්ඣත්තං බහිද්ධා ච සබ්බලොකෙ,
දෙවමනුස්සෙසු කප්පියෙසු
කප්පං නෙති තමාහු නහාතකොති.

525 ආගුං න කරොති කිඤ්චි ලොකෙ
සබ්බසංයොගෙ විසජ්ජ බන්ධනානි;
සබ්බත්ථ න සජ්ජති විමුත්තො
නාගො තාදී පවුච්චතෙ[2] තථත්තාති.

අථ ඛො සභියො පරිබ්බාජකො – පෙ – භගවන්තං උත්තරිං පඤ්හං අපුච්ඡි.

526 කං ඛෙත්තජිනං වදන්ති බුද්ධා (ඉති සභියො)
කුසලං කෙන කථඤ්ච පණ්ඩිතොති,
මුනි නාම කථං පවුච්චති
පුට්ඨො මෙ භගවා ව්‍යාකරොහි.

527 ඛෙත්තානි විචෙය්‍ය කෙවලානි (සභියාති භගවා)
දිබ්බං මානුසකඤ්ච බ්‍රහ්මඛෙත්තං,
සබ්බඛෙත්තමූලබන්ධනා පමුත්තො
ඛෙත්තජිනො තාදී පවුච්චතෙ තථත්තා.

528 කොසානි විචෙය්‍ය කෙවලානි
දිබ්බං මානුසකඤ්ච බ්‍රහ්මකොසං,
සබ්බකොසමූලබන්ධනා පමුත්තො
කුසලො තාදී පවුච්චතෙ තථත්තා.

1. නිත්තනහාය මු. 1. 2. පවුච්චති – මු 1, 2.



Free Distribution www.aathaapi.org

522. ('සභිය' යි අමතා බුදුහු මෙසේ වදළහ:) හැම පව් බැහැර ලා (විගතමල භාවයෙන්) විමල වූ, අග්‍රඵල සමාධියෙන් මොනොවට සමාහිත වූ, ස්ථිතාත්ම ඇති, සංසාරහේතු සමතික්‍රමණයෙන් සසර ඉක්මැ සිටි, (වැසනිම වූ කිස ඇති හෙයින්) කේවලී වූ, තෘෂ්ණා දෘෂ්ටියෙන් අනිඃශ්‍රිත වූ, (ලොකධර්මයෙන් නිර්විකාර හෙයින්) තාදී වූ එ ක්ෂීණාස්‍රව තෙම 'බ්‍රාහමණ' යි කියනු ලැබෙ.

523. අරිමගින් කෙලෙස් සන්හිඳ වූ, පින් පව් නසා පියා එහෙයින්ම රාගාදි රජස් නැති, මෙ ආධ්‍යාත්මික ස්කන්ධාදි ලෝකය හා බාහිර ස්කන්ධාදි ලෝකය හා අනිත්‍යාදි විසින් දැන, ජාති හා මරණ හා ඉක්ම ගිය තථාත්ම වූ තාදි පුද්ගල 'ශ්‍රමණ'යි කියනු ලැබෙ යි.

524. ආධ්‍යාත්මික වූත් බාහිර වූත් හැම ස්කන්ධාදි ලෝකයෙහි හැම පව් දෙවා පියා (තණ්හාමානදිට්ඨියන) කල්පන කටයුතු දේවමනුෂ්‍යයන් කෙරෙහි යමෙක් තෘෂ්ණාදි කල්පනයට නොයේ ද, ඔහු 'ස්නාතක' යි කියත්.

525. (යමෙක්) ලොවැ සර්වසංයොජන සඞ්ඛ්‍යාත බන්ධන හැරපියා කිසිදු ආගු සඞ්ඛ්‍යාත පාපයක් නොකෙරේ ද, උභය විමුක්තියෙන් මිදුනේ හැම ස්කන්ධාදියෙහි සඞ්ගවශයෙන් නොලැගේ ද, තථාත්ම වූ එ තාදී පුද්ගල 'නාග' යි කියනු ලැබෙ.

ඉක්බිති සභිය පරිව්‍රාජක... මත්තෙහිදු භාග්‍යවතුන් වහන්සේ වෙතින් පැන පිළිවිසී.

526. (සභිය මෙසේ පිළිවිසියි:) බුදුහු කවරකු 'ක්ෂෙත්‍රජින' යි කියත් ද? කවර කරුණෙකින් 'කුශල'යි කියත් ද? කිසෙයින් 'පණ්ඩිත'යි කියත් ද? කිසෙයින් 'මුනි' නමැයි කියනු ලැබෙ ද? භාග්‍යවතුන් වහන්ස, මා විසින් පුළුවුස්නා ලදහු විවරණ කළ මැනව.

527. (බුදුහු සභිය අමතා මෙසේ වදරති:) දිව්‍ය ක්ෂේත්‍ර, මානුෂක ක්ෂේත්‍ර, බ්‍රහම ක්ෂේත්‍ර වූ, චක්ෂුරාදි ආයතන සඞ්ඛ්‍යාත සකල ක්ෂේත්‍රයන් අනිත්‍යාදි විසින් විමසා දැන සකල ක්ෂේත්‍රයනට මූලබන්ධන වූ අවිද්‍යා භව තෘෂ්ණාදියෙන් ප්‍රමුක්ත වූ තථාත්ම වූ තාදී පුද්ගල 'ක්ෂෙත්‍රජින'යි කියනු ලැබෙයි.

528. දිව්‍ය කෝෂ, මානුෂක කෝෂ, බ්‍රාහම වූ සකල කර්ම කෝෂයන් (අනිත්‍යාදි විසින්) පිරිසිඳ දැන සර්ව කර්මකෝෂයනට මූලබන්ධන සඞ්ඛ්‍යාත අවිද්‍යා භව තෘෂ්ණාදියෙන් ප්‍රමුක්ත වූයේ තථාත්ම තාදී පුද්ගල 'කුසල'යි කියනු ලැබෙ යි.

529 තදුභයානි විචෙය්‍ය පණ්ඩරානි
අජ්ඣත්තං බහිද්ධා ච සුද්ධිපඤ්ඤො,
කණ්හං සුක්කමුපාතිවත්තො
පණ්ඩිතො තාදි පවුච්චතෙ තථත්තා.

530 අසතඤ්ච සතඤ්ච ඤත්වා ධම්මං
අජ්ඣත්තං බහිද්ධා ච සබ්බලොකෙ,
දෙවමනුස්සෙහි පූජනීයො
සඞ්ගං ජාලමතිච්ච[1] සො මුනීති.

අථ ඛො සභියො පරිබ්බාජකො – පෙ – භගවන්තං උත්තරිං පඤ්හං අපුච්ඡි.

531 කිං පත්තිනමාහු වෙදගුං (ඉති සභියො)
අනුවිදිතං කෙන කථඤ්ච විරියවාති,
ආජානියො කින්ති නාම හොති
පුට්ඨො මෙ භගවා ව්‍යාකරොහි.

532 වෙදානි විචෙය්‍ය කෙවලානි (සභියාති භගවා)
සමණානං යානිධත්ථි[2] බ්‍රාහ්මණානං,
සබ්බ වෙදනාසු වීතරාගො
සබ්බං වෙද මතිච්ච වෙදගූ සො.

533 අනුවිච්ච පපඤ්චනාමරූපං
අජ්ඣත්තං බහිද්ධා ච රොගමූලං,
සබ්බරොගමූලබන්ධනා පමුත්තො
අනුවිදිතො තාදි පවුච්චතෙ තථත්තා.

534 විරතො ඉධ සබ්බපාපකෙහි
නිරයදුක්ඛමතිච්ච විරියවා සො,
සො විරියවා පධානවා
ධීරො තාදී පවුච්චතෙ තථත්තා.

535 යස්සස්සු ලුතානි බන්ධනානි
අජ්ඣත්තං බහිද්ධා ච සඞ්ගමූලං,
සබ්බසඞ්ගමූලබන්ධනා පමුත්තො
ආජානීයො තාදි පවුච්චතෙ තථත්තා'ති.

---

1. සඞ්ගජාලමතිච්ච – මු. 2
2. යානි පත්ථි – මු.

529. ආධ්‍යාත්මික වූත් බාහිර වූත් චක්ෂුරාදි උභය පණ්ඩරයන් (ආයතනයන්) අනිත්‍යාදි විසින් විමසා දුන ශුද්ධ ප්‍රඥ ඇතියේ පාපපුණ්‍ය සඞ්ඛ්‍යාත කෘෂ්ණ ශුක්ල ධර්මයන් ඉක්ම ගියේ තථාත්ම තාදී පුද්ගල 'පණ්ඩිත'යි කියනු ලැබෙයි.

530. ආධ්‍යාත්මික වූ ද බාහිර වූ ද සියලු ලෙවිහි අසත් පුරුෂයන්ගේ හා සත්පුරුෂයන්ගේ ධර්මය (ප්‍රවිචයඥානයෙන්) දුන සිටි යමෙක් දෙව් මිනිසුන් විසින් පිදියයුතුවේ ද, සප්තවිධ සඞ්ග හා තෘෂ්ණා දෘෂ්ටි යන ද්විවිධ ජාලය ද ඉක්මැ සිටි හෙ 'මුනි' යි කියනු ලැබෙ.

එකල්හි සභිය පිරිවැජි ... මතුයෙහිදු භාග්‍යවතුන් වහන්සේ ගෙන් පැන පිළිවිසී:

531. (සභිය මෙසේ පිළිවිසියි:) කුමකට පැමිණියහු 'වෙදගු' යි කියත්ද? කවර කරුණෙකින් 'අනුවිදිත' යි කියත් ද? කිසෙයින් 'වීය්‍ය්‍යවත්'යි කියත් ද? කවර හෙයින් 'ආජානෙය' නම් වේ ද? භාග්‍යවතුන් වහන්ස, ම විසින් පුළුස්වුස්නා ලදහු විවරණ කරණු මැනව.

532. (බුදුහු සභිය අමතා මෙසේ වදරති) මෙලොවැ මහණ බමුණන්ගේ යම් වෙදයෝ ඇත්ද? එ හැම වෙද ශාස්ත්‍ර (අනිස ඇ විසින්) පිරිසිඳ දුන (එ වෙද ප්‍රත්‍යයෙන් උපදනා) සියලු වෙදනාවන්හි වීතරාග වූයේ එ හැම වෙද ඉක්මවා සිටි හෙ 'වෙදගු' යි කියනු ලැබෙයි.

533. ආධ්‍යාත්මික සන්තානයෙහි හා බාහිර සන්තානයෙහි රොගයනට කරුණු වූ (තණ්හා දිට්ඨිමාන යන) ප්‍රපඤ්චයන් හා (එයින් උපදනා) නාම-රූප ද (අනිත්‍යාදි විසින්) දුන, හැම නාමරූප රොගයන්ගේ මූලබන්ධනයෙන් ප්‍රමුක්ත වූ තථාත්ම තාදී පුද්ගල 'අනුවිදිත' යි කියනු ලැබෙයි.

534. යමෙක් මෙලොවැ හැම පව් දහමින් වෙන් වූයේ නිරාදුක් ඉක්මැ සිටි හෙ වීය්‍ය්‍ය ඇත්තේ වෙයි. (චතුරඞ්ග සමන්වාගත) වීය්‍ය්‍ය ඇති ප්‍රධන් ඇති තථාත්ම වූ තාදී එ පුද්ගල ධීර යි කියනු ලැබෙයි.

535. යමකුගේ ආධ්‍යාත්මික සන්තානයෙහිත් බාහිර සන්තානයෙහිත් වූ සංයොජන සඞ්ඛ්‍යාත බන්ධනයෝ ද රාගාදි සඞ්ගමූලය ද සිඳලන ලද්දහු වෙත් ද, හැම සඞ්ගමූලයෙන් හා බන්ධනයෙන් මුත් තථාත්ම වූ තාදී පුද්ගල 'ආජානෙය' යි කියනු ලැබෙ.

අථ ඛො සභියො පරිබ්බාජකො – පෙ – භගවන්තං උත්තරිං පඤ්හං අපුච්ඡි.

536 කිං පත්තිනමාහු සොත්තියං (ඉති සභියො)
අරියං කෙන කථඤ්ච චරණවාති,
පරිබ්බාජකො කින්ති නාම හොති
පුට්ඨො මෙ භගවා ව්‍යාකරොහි.

537 සුත්වා සබ්බධම්මං අභිඤ්ඤාය ලොකෙ (සභියාති භගවා)
සාවජ්ජානවජ්ජං යදත්ථි කිඤ්චි,
අභිභුං අකථංකථිං විමුත්තං
අනීඝං සබ්බධිමාහු සොත්තියොති.

538 ඡෙත්වා ආසවානි ආලයානි
විද්වා සො න උපෙති ගබ්භසෙය්‍යං
සඤ්ඤං තිවිධං පනුජ්ජ පඞ්කං
කප්පං නෙති තමාහු අරියොති.

539 යො ඉධ චරණෙසු පත්තිපත්තො
කුසලො සබ්බදා ආජානි ධම්මං,
සබ්බත්ථ න සජ්ජති විමුත්තො[1]
පටිඝා යස්ස න සන්ති චරණවා සො.

540 දුක්ඛවෙපක්කං යදත්ථි කම්මං
උද්ධමධො තිරියඤ්චාපි මජ්ඣෙ,
පරිබ්බාජයිත්වා පරිඤ්ඤචාරී
මායං මානමථොපි ලොභකොධං
පරියන්තමකාසි නාමරූපං
තං පරිබ්බාජකමාහු පත්තිපත්තන්ති.

අථ ඛො සභියො පරිබ්බාජකො භගවතො භාසිතං අභිනන්දිත්වා අනුමොදිත්වා අත්තමනො පමුදිතො උදග්ගො පීතිසොමනස්සජාතො උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං සම්මුඛා සාරුප්පාහි ගාථාහි අභිත්ථවි:

1. විමුත්තචිත්තො – මජය.



Free Distribution www.aathaapi.org

ඉක්බිති සභිය පිරිවැජි ... මතුයෙහිදු භාග්‍යවතුන් වහන්සේගෙන් පැන පිළිවිසී

**536.** (සභිය මෙසේ පිළිවිසියි:) ''කුමකට පැමිණියහු 'සොත්තිය' යි කියත් ද? කවර කරුණෙකින් යුක්ත වූවහු 'අරිය' යී කියත් ද? කිසෙයින් 'චරණ සම්පන්න' යි කියත් ද? කවර හෙයෙකින් පරිබ්‍රාජක නම් වේද? භාග්‍යවතුන් වහන්ස, මා විසින් පුළුවුස්නා ලදහු විවරණ කරණු මැනව.

**537.** (බුදුහු මෙසේ වදළහ, සභිය:) (ශ්‍රැතමය ප්‍රඥකෘත්‍ය වශයෙන් හෝ කර්තව්‍යකෘත්‍ය වශයෙන් හෝ) විදර්ශනෝපග වූ සාවද්‍ය වූත් අනවද්‍ය වූත් යම් මැ කිසි ධර්මයෙක් ඇත් නම් එ හැම ධර්මය අසා අනිත්‍යාදි වශයෙන් දැන ක්ලේශ හා ක්ලේශස්ථානීය ධර්ම මැඩ සිටි, කථංකථී භාව නැති, කෙලෙස් බැඳුමින් මිදුනු සියලු ස්කන්ධාදියෙහි රාගාදි ඊස නැතියහු 'සොත්තිය යි කියත්.

**538.** චතුරාශ්‍රවයන් හා උභයාලයන් ප්‍රඥශස්ත්‍රයෙන් සිඳ (සිවුමග-නැණින්) විඅවද් වූ හේ කිසිදු යොනිගර්භශය්‍යාවකට (පුනර්භවයට) නො එයි. කාමාදි ත්‍රිවිධසංඥවන් හා කාමගුණ පඞ්කය හා හැරපියා තෘෂ්ණා දෘෂ්ටි කල්පයට නො එයි. ඔහු 'අරිය' යි කියත්.

**539.** මෙ සස්නෙහි යම් මහණෙක් පසළොස්චරණධර්ම හේතුයෙන් (අර්හත්ව සඞ්ඛ්‍යාත) ප්‍රාප්තව්‍යයට පැමිණියේ චරණධර්මකුශල වූයේ හැමවිට නිර්වාණධර්මය දතුයේ ද, සියලු ස්කන්ධාදි ධර්මයන්හි නො ලැගේද, උභය විමුක්තියෙන් මිදුනේ ද, යමකුහට ප්‍රතිඝයෝ නැද්ද, හෙ 'චරණ-සම්පන්න'යි කියත්.

**540.** (අතීතාධව සඞ්ඛ්‍යාත) උඩ හා (අනාගතාධව සඞ්ඛ්‍යාත) යට හා (ප්‍රත්‍යුත්පන්නාධව සඞ්ඛ්‍යාත සරස හා මැද වූ දුඃඛ විපාක ඇති යම් කිසි කර්මයෙක් ඇත් නම් එ ද, මායා මාන ලොභ ක්‍රොධ යන ධර්මයන් (අප්‍රති සන්ධිජනකභාවයෙන්) ආර්‍ය්‍යමාර්ගයෙන් දුරු කොට පියා පහාණ පරිඥා වශයෙන් පිරිසිඳ දැන හැසිරෙන්නේ නාමරූපය අවසන් කෙළේ ද, ප්‍රාප්තව්‍යයටපත් එ මහණ පරිබ්‍රාජකැ යි කියත්.

ඉක්බිති සභිය පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගෙණ අනුමෙවෙණි කොට තුටුසිත් ඇත්තේ ප්‍රමුදිත වූයේ ඔදවැඩි සිතැතියේ හටගත් ප්‍රීති සොම්නස් ඇතියේ හුනස්නෙන් නැඟී සිට උතුරුසළුව එකස්හි කොට ලා භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ හමුයෙහි සිට *සාරුප්‍ය ගාථායෙන්* භාග්‍යවතුන් වහන්සේ පැසැසීය.



Free Distribution www.aathaapi.org

541 යානි ච තීණි යානි ච සට්ඨි
සමණප්පවාදසිතානි භූරිපඤ්ඤ,
සඤ්ඤක්ඛරසඤ්ඤනිස්සිතානි
ඔසරණානි විනෙය්‍ය ඔඝන්තමගා.

542 අන්තගූ'සි පාරගූ දුක්ඛස්ස
අරහාසි සම්මාසම්බුද්ධො ඛීණාසවං තං මඤ්ඤෙ,
ජුතිමා මුතිමා පහූතපඤ්ඤ
දුක්ඛස්සන්තකර අතාරෙසි මං.

543 යං මෙ කංඛිතමඤ්ඤාසි
විචිකිච්ඡා මං තාරයි නමො තෙ
මුනි මොනපථෙසු පත්තිපත්ත
අඛිලආදිච්චබන්ධු සොරතොසි.

544 යා මෙ කංඛා පුරෙ ආසි තං මෙ ව්‍යාකාසි චක්ඛුමා,
අද්ධා මුනීසි සම්බුද්ධො නත්ථි නීවරණා තව.

545 උපායාසා ච තෙ සබ්බෙ විද්ධස්තා විනළීකතා,
සීතිභූතො දමප්පත්තො ධිතිමා සච්චනික්කමො.

546 තස්ස තෙ නාග නාගස්ස මහාවීරස්ස භාසතො,
සබ්බෙ දෙවානුමොදන්ති උභො නාරදපබ්බතා.

547 නමො තෙ පුරිසාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම,
සදෙවකස්මිං ලොකස්මිං නත්ථි තෙ පටිපුග්ගලො.

548 තුවං බුද්ධො තුවං සත්ථා තුවං මාරාභිභූ මුනි,
තුවං අනුසයෙ ඡෙත්වා තිණ්ණො තාරෙසි'මං පජං

549 උපධී තෙ සමතික්කන්තා ආසවා තෙ පදළිතා,
සීහොසි අනුපාදනො පහීනභයභෙරවො.

550 පුණ්ඩරීකං යථා වග්ගු තොයෙ න උපලිප්පති,
එවං පුඤ්ඤෙ ච පාපෙ ච උභයෙ ත්වං න ලිප්පසි,
පාදෙ වීර පසාරෙහි සභියො වන්දති සත්ථුනො'ති.



Free Distribution www.aathaapi.org

541. මහාප්‍රාඥයෙනි, (අන්‍යතීර්ථක) ශ්‍රමණයන්ගේ ප්‍රවාදශාස්ත්‍රයන් ඇසුරු කළ යම් තෙසැට මිසදිටු කෙනෙක් ද, ව්‍යවහාරනාමයන් හා විපරීත සංඥාවන් ඇසුරු කළ යම් තීර්ථායතනයෝත් වෙත් නම්, ඒ තීර්ථයන් මැඩ පියා ඔඝසඞ්ඛ්‍යාත තමස ඉක්මගියහ නොහොත් ඔඝයාගේ අන්තයට ගියහ.

542. නිවන් කරා ගියා ව, (එහෙයින්) දුඃඛයාගේ පරතෙර කරා ගියාව, අර්හත් වහු, සම්‍යක්සම්බුද්ධවහු, ඔබ ක්ෂීණාශ්‍රව කොට හඟිමි. ධෘතිමත් වව, ද්‍යුතිමත් වව, ප්‍රභූතප්‍රඥ ඇති වව, දුක් කෙළවර කළ නිදුකානනි, මා තරණය කළාව,

543. මාගේ යම් සැකයෙක් දන්නා ලද ද, විචිකිච්ඡාවක් වීද, එයිනුදු මා තරණය කළහු ය. ඔබට නමස්කාර වේවා! මොනපථයෙහි අර්හත්වයට පැමිණි මුනිවරයානනි, ආදිත්‍යබන්ධු වූ ඔබ සොරත වහු යැ.

544. මට පෙර යම් සැකයෙක් වීනම්, පසැස්හු එය දුරුලූහ. ඒකාන්තයෙන් සම්බුද්ධ මුනි වූවහු ය. ඔබට නීවරණයෝ නැත.

545. ඔබ විසින් සියලු උපායාසයෝ වෙසෙසින් නසන ලද්දහ, එහෙයින් විනලීකෘත වෙති. සිහිල් වූවහු දන්ත වූවහු ධෘතිසම්පන්න වූවහු සත්‍යනිෂ්ක්‍රම ඇත්තහුය.

546. නිෂ්පාපී උතුමාණනි, නාග වූ මහාවීර වූ දම් දෙසන ඒ ඔබගේ භාෂිතය, සියලු දෙවියෝ ද, නාරදපබ්බත දෙපවු වැසි උභය දේවගණයෝද අනුමෙවෙනි කෙරෙත්.

547. පුරුෂ ශ්‍රේෂ්ඨයෙනි, ඔබට නමස්කාරවේවා, පුරුෂෝත්තමයෙනි, ඔබට නමස්කාරවේවා, දෙවියන් සහිත ලෝකයෙහි ඔබට ප්‍රතිපුද්ගලයෙක් නැත.

548. මුබ වහන්සේ බුද්ධ වන සේක, මුබ වහන්සේ ශාස්තෘ වන සේක මුබ වහන්සේ මරුන්මැඩලූ මුනි වන සේක මුබ වහන්සේ සප්තානුශය සිඳපියා ඕඝතරණ කළ සේක. මේ සත්ත්වාබ්‍ය ප්‍රජාව එතෙර කළ සේකි.

549. මුබ වහන්සේ විසින් උපධීහු මොනොවට ඉක්මවනලද්දහ. මුබ වහන්සේ විසින් ආස්‍රවයෝ ප්‍රදලිත වෙත්. මුබ වහන්සේ සිංහ වනසේක, උපාදන රහිත වනසේක ප්‍රහීණභය ගෛරව ඇති සේකි.

550. යම්සේ මනරම් පඩෙර දියෙහි නො තැවරේද, එසෙයින් පින් හා පව් හා යන දෙක්හි මුබ වහන්සේ නො තැවරෙන සේක. වීරයන් වහන්ස, පා සහළ දිගු කළ මැනව, සභිය ශාස්තෘන්ගේ පා සහළ වඳනේයි.

අථ ඛො සභියො පරිබ්බාජකො භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවන්තං එතදවොච: අභික්කන්තං භො ගොතම - පෙ - ධම්මඤ්ච භික්ඛු සඞ්ඝඤ්ච, ලභෙය්‍යාහං භන්තෙ, භගවතො සන්තිකෙ පබ්බජ්ජං ලභෙය්‍යං උපසම්පදන්ති.

යො ඛො සභිය, අඤ්ඤතිත්ථියපුබ්බො ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛති පබ්බජ්ජං ආකඞ්ඛති උපසම්පදං සො චත්තාරො මාසෙ පරිවසති, චතුන්නං මාසානං අච්චයෙන ආරද්ධචිත්තා භික්ඛු පබ්බාජෙන්ති උපසම්පාදෙන්ති භික්ඛු භාවාය, අපිච මෙත්ථ පුග්ගලවෙමත්තතා විදිතාති.

සචෙ භන්තෙ, අඤ්ඤතිත්ථියපුබ්බා ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛන්තා පබ්බජ්ජං ආකඞ්ඛන්තා උපසම්පදං චත්තාරො මාසෙ පරිවසන්ති, චතුන්නං මාසානං අච්චයෙන ආරද්ධචිත්තා භික්ඛුපබ්බාජෙන්ති උපසම්පාදෙන්ති භික්ඛුභාවාය, අහං චත්තාරි වස්සානි පරිවසිස්සාමි, චතුන්නං වස්සානං අච්චයෙන ආරද්ධචිත්තා භික්ඛු පබ්බාජෙන්තු උපසම්පාදෙන්තු භික්ඛු-භාවායාති. අලත්ථ ඛො සභියො පරිබ්බාජකො භගවතො සන්තිකෙ පබ්බජ්ජං අලත්ථ උපසම්පදං - පෙ - අඤ්ඤතරො ච ඛො පනායස්මා සභියො අරහතං අහොසීති.

සභියසුත්තං නිට්ඨිතං.

## 3-7

## සෙල සුත්තං

එවං මෙ සුතං එකං සමයං භගවා අඞ්ගුත්තරාපෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං අඩ්ඪතෙළසෙහි භික්ඛුසතෙහි යෙන ආපණං නාම අඞ්ගුත්තරාපානං නිගමො තදවසරි, අස්සොසි ඛො කෙණියො ජටිලො සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො අඞ්ගුත්තරාපෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං අඩ්ඪතෙළසෙහි භික්ඛුසතෙහි ආපණං අනුප්පත්තො, තං ඛො පන භවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො "ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා"ති සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති, සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති, සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතී'ති.

එක්බිති සභිය පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේගේ පාමුල්හි හිඳින් හෙවැ භාග්‍යවතුන් වහන්සේට මෙල කීය: භවත් ගෞතමයන්වහන්ස, ඉතා කාන්තය, ... ධර්මය හා භික්සඟුන් හා සරණ කොටයෙමියි. වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ වෙතැ පැවිදි ලබම්වා උපසම්පත් ලබම්වා යි.

සභිය අන්තොටුවිරූ යමෙක් මෙ ධර්මවිනයෙහි පැවිදි කැමති වේ ද, උපසම්පදව කැමැති වේ ද, හේ සාරමසක් පිරිවෙස් වසයි. සිවුමස් ඇවෑමෙන් ඇරයූ සිත් ඇති මහණහු ඔහු භික්ෂුභාවය සඳහා පැවිදි උපසපන් කරවත්. තවද මෙ අන්තොටු පිරිවෙස්හි ලා මා විසින් පුද්ගල නානාත්වය දන්නා ලද වේය යි.

වහන්ස, ඉදින් අන්තොටු විරූහු මෙ සස්නෙහි පැවිදි පතන්නාහු උපසපුව පතන්නාහු සාරමසක් පිරිවෙස් පුරත් නම්, සාරමස් ඇවෑමෙන් ආරාධිත චිත්තයෙන් යුත් මහණහු පැවිදි කරවත් නම් භික්ෂු භාවය සඳහා උපසම්පන්න කරවත් නම්, මම් සතර වසරක් පිරිවෙස් පුරන්නෙමි, සිව්වස ඇවෑමෙන් ආරාධිතචිත්ත භික්ෂුහු (මා) පැවිදි කෙරෙත්වා, භික්ෂු භාවය සඳහා උපසපන් කෙරෙත්වා යි.

සභිය පරිව්‍රාජක භාග්‍යවතුන් වහන්සේ වෙතැ පැවිද්ද ලැබීය, උපසම්පද ලැබීය –පෙ– ආයුෂ්මත් සභිය රහතුන් අතර අන්‍යතරයෙක් වීය යි.

**සභිය සූත්‍රය නිමි.**

## 3 – 7

## සේල සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදැ: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ අඞ්ගුත්තරාප දනවුයෙහි . සැරිසරණ සේක් අඩ තෙළෙස් යල් සියක් මහණුන් ඇති මහ බික් සඟුන් සමග අඞ්ගුත්තරාපයන්ගේ ආපණ නම් නියම් ගමට වැඩි සේක. කෙණිය ජටිල මෙ බස් ඇසී: ''ශාක්‍ය කුල-යෙන් (නික්මැ) පැවිදි වූ ගෞතම ශ්‍රමණශාක්‍ය පුත්‍රයෝ අඞ්ගුත්තරාප දනවුයෙහි සැරිසරන්නාහු අඩ තෙළෙස් යල් සියක් බික්මහසඟුන් හා කැටිව ආපණයට පැමිණියහ. ඒ භවත් ගෞතමයන් වහන්සේගේ මෙබඳු කලණ කිත් ගොස මෙසේ පැන නැංග: 'ඒ භගවත්හු මෙ කරුණෙන් ද අර්හත්හ, සම්‍යක් සම්බුද්ධයහ, විද්‍යාචරණ සම්පන්නයහ, සුගත්හ, ලොකවිදුහ, අනුත්තර පුරුෂදම්‍යසාරථීහ. දෙවමනුෂ්‍යයනට ශාස්තෲහ, බුද්ධහ. භාග්‍යවත්හ 'යි මෙසේ උස්ව නැංගේය. හේ දෙවියන් සහිත මරුන් සහිත, බඹුන් සහිත මේ ලෝකය, මහණ බමුණන් සහිත දෙව් මිනිසුන් සහිත සත්ත්වාබ්‍යප්‍රජාව තෙමේ විශිෂ්ට ඥානයෙන් සාක්ෂාත් කොට ප්‍රකාශ කෙරෙයි. හේ ආදි කල්‍යාණ වූ මධ්‍ය කල්‍යාණ වූ පර්‍ය්‍ය-වසාන කල්‍යාණ වූ සාර්ථ කොට සව්‍යඤ්ජන කොට ධර්මය දේශනා කරයි. කේවල පරිපූර්ණ පරිශුද්ධ බ්‍රහ්මචර්‍ය්‍යය පවසයි. එබඳු වූ රහතුන් ගේ දර්ශනය මනාවේ මැ''යි.

අථ ඛො කෙණියො ජටිලො යෙන භගවා තෙනුපසඞ්කමි, උප-සඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණියං වීතිසාරෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නං ඛො කෙණියං ජටිලං භගවා ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි.

අථ ඛො කෙණියො ජටිලො භගවතා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො භගවන්තං එතදවොච: අධිවාසෙතු මෙ භවං ගොතමො ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනාති, එවං වුත්තෙ භගවා කෙණියං ජටිලං එතදවොච: මහා ඛො කෙණිය, භික්ඛුසඞ්ඝො අඩ්ඪතෙළසානි භික්ඛුසතානි, ත්වඤ්ච ඛො බ්‍රාහ්මණෙසු අභිප්පසන්නොති. දුතියම්පි ඛො කෙණියො ජටිලො භගවන්තං එතදවොච: කිඤ්චාපි භො ගොතම, මහා භික්ඛුසඞ්ඝො අඩ්ඪතෙළසානි භික්ඛුසතානි, අහඤ්ච බ්‍රාහ්මණෙසු අභිප්පසන්නො, අධිවාසෙතු මෙ භවං ගොතමො ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනාති, තතියම්පි ඛො භගවා කෙණියං ජටිලං එතදවොච: මහා ඛො කෙණිය, භික්ඛුසඞ්ඝො අඩ්ඪතෙළසානි භික්ඛුසතානි, ත්වඤ්ච ඛො බ්‍රාහ්මණෙසු අභිප්පසන්නොති, තතියම්පි ඛො කෙණියො ජටිලො භගවන්තං එතදවොච: කිඤ්චාපි භො ගොතම, මහා භික්ඛුසඞ්ඝො අඩ්ඪතෙළසානි භික්ඛුසතානි, අහඤ්ච ඛො බ්‍රාහ්මණෙසු අභිප්පසන්නො, අධිවාසෙතෙව මෙ භවං ගොතමො ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛු-සඞ්ඝෙනාති.

අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

අථ ඛො කෙණියො ජටිලො භගවතො අධිවාසනං විදිත්වා උට්ඨා-යාසනා යෙන සකො අස්සමො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා මිත්තා-මච්චෙ ඤාතිසාලොහිතෙ ආමන්තෙසි: සුණන්තු මෙ භවන්තො මිත්තා-මච්චා ඤාතිසාලොහිතා සමණො මෙ ගොතමො නිමන්තිතො ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙන. යෙන මෙ කායවෙය්‍යාවටිකං කරෙය්‍යාථාති.

එවං භොති ඛො කෙණියස්ස ජටිලස්ස මිත්තාමච්චා ඤාතිසාලොහිතා කෙණියස්ස ජටිලස්ස පටිස්සුත්වා අප්පෙකච්චෙ උද්ධනානි ඛණන්ති, අප්පෙකච්චෙ කට්ඨානි ඵාලෙන්ති, අප්පෙකච්චෙ භාජනානි ධොවන්ති, අප්පෙකච්චෙ උදකමණිකං පතිට්ඨාපෙන්ති, අප්පෙකච්චෙ ආසනානි පඤ්ඤාපෙන්ති. කෙණියො පන ජටිලො සාමංයෙව මණ්ඩලමාළං පටියාදෙති.



Free Distribution www.aathaapi.org

ඉක්බිති කේණියජටිල භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු විය යුතු, සිහිකට යුතු කථාව කොට නිමවා එකත්පසෙක හින. එකත් පසෙක්හි හුන් කේණිය ජටිලයන් භාග්‍යවතුන් වහන්සේ දැහැමි කථායෙන් මොනොවට දක්වූහ. සමාදන් කරවූහ. මැනවින් උත්තෙජිත කරවූහ, සම්ප්‍රහර්ෂිත කරවූහ.

එක්බිති කේණිය ජටිල භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කථායෙන් සන්දර්ශිත වූයේ සමාදන් කරවන ලදුයේ සමුත්තෙජිත වූයේ සම්ප්‍රහර්ෂිත වූයේ භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැළ කෙළේය: භවත් ගෞතමයෝ සෙට දවසට බික්සඟුන් හා සමග මාගේ බත ඉවසත්වා යි. මෙසේ කියන ලද භාග්‍යවතුන් වහන්සේ කේණිය ජටිලයන් හට තෙල කරුණ වදළ සේක: කේණියෙනි, බික්සඟහු මහත් වෙති. අඩ තෙළෙස් යල් සියක් මහණහු වෙත්, තො ද වනාහි බ්‍රාහ්මණයන් කෙරෙහි අභිප්‍රසන්නයෙහි'යි. දෙවන වටත් කේණිය ජටිල භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ දැන්වීය: භවත් ගෞතමයන් වහන්ය, බික් සඟුන් මහත් වුව, අඩ තෙළෙස් යල් සියක් මහණුන් වුවද, මා ද බ්‍රාහ්මණයන් කෙරෙහි අභිප්‍රසන්න වුව ද, භවත් ගෞතමයන් වහන්සේ සෙට දවසව බික්සඟුන් සමග ම ගේ බත ඉවසත්වා'' යි තෙවන වටත් භාග්‍යවතුන් වහන්සේ කේණිය ජටිලයන් හට තෙල කරුණ වදළ සේක: කේණියනි, ඩික්සඟහු මහත් වෙති, අඩ තෙළෙස්යල්සියක් මහණහු වෙත්, තෙපද වනාහි බ්‍රාහ්මණයන් කෙරෙහි අභිප්‍රසන්නයෙහි 'යි. තෙවන වටත් කේණිය ජටිල භාග්‍යවතුන් වහන්සේට තෙල කීය: භවද් ගෞතමයන් වහන්ය, බික්සඟුන් මහත් වුව, අඩ තෙළෙස්යල්සියක් මහණුන් වුව, මා ද බ්‍රාහ්මණයන් කෙරෙහි අභිප්‍රසන්න වුව භවද් ගෞතමයන් වහන්සේ සෙටදස් සඳහා බික් සඟුන් හා සමග මාගේ බත ඉවසත් වා''යි.

භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණිම්භාවයෙන් ඉවසා වදළ සේක.

ඉක්බිති කේණිය ජටිල භාග්‍යවතුන් වහන්සේගේ අධිවාසනය දැන හුනස්නෙන් නැඟී සිය අසපුව කරා ගියේය. ගොස් මිත්‍රාමාත්‍යයන් හා නෑසාලේ නෑයන් ඇමතීය: භවත් මිත්‍රාමාත්‍යයෙනි, නෑසාලේ නෑයෙනි, මබස් අසව. මා විසින් බික්සඟුන් හා ශ්‍රමණ භවද් ගෞතමයෝ සෙට බතට නිමන්ත්‍රණය කරණ ලදහ. මට කයින් වතාවත් කරව''යි

භවත්නි, එසේය යි කේණිය ජටිලගේ මිත්‍රාමාත්‍යයෝ ද නෑ සාලේ නෑයෝ ද කේණිය ජටිලයන් හට පිළිවදන් දී ඇතැම් හු ගිනි උදුන් වළ කණති, ඇතැම් හු දර පලති, ඇතැම් හු බඳුන් දෙවති, ඇතැම් හූ දිය සැළ තබති, ඇතැම් හු අසුන් පණවත්. කේණිය ජටිල තෙමෙ මැ මණ්ඩල මාලය පිළියෙල කරයි.

තෙන ඛො පන සමයෙන සෙලො බ්‍රාහ්මණො ආපණෙ පටිවසති තිණ්ණං වෙදානං පාරගූ සනිඝණ්ඩුකෙටුභානං සාක්ඛරප්පභෙදානං ඉතිහාසපඤ්චමානං පදකො වෙය්‍යාකරණො ලොකායතමහාපුරිසලක්ඛණෙසු අනවයො තීණි මාණවකසතානි මන්තෙ වාචෙති, තෙන ඛො සමයෙන කෙණියෙ ජටිලෙ සෙලො බ්‍රාහ්මණො අභිප්පසන්නො හොති.

අථ ඛො සෙලො බ්‍රාහ්මණො තීහි මාණවකසතෙහි පරිවුතො ජඞ්ඝාවිහාරං අනුචඞ්කමමානො අනුවිචරමානො යෙන කෙණියස්ස ජටිලස්ස අස්සමො තෙනුපසඞ්කමි. අද්දසා ඛො සෙලො බ්‍රාහ්මණො කෙණියස්මිං ජටිලෙ අප්පෙකච්චෙ උද්ධනානි ඛණන්තෙ -පෙ- අප්පෙකච්චෙ ආසනානි පඤ්ඤපෙන්තෙ කෙණියං පන ජටිලං සාමංයෙව මණ්ඩලමාලං පටියාදෙන්තං, දිස්වාන කෙණියං ජටිලං එතදවොච:

කිං නු හොතො කෙණියස්ස ආවාහො වා භවිස්සති, විවාහො වා භවිස්සති, මහායඤ්ඤො වා පච්චුපට්ඨිතො, රාජා වා මාගධො සෙනියො බිම්බිසාරො නිමන්තිතො ස්වාතනාය සද්ධිං බලකායෙනාති.

න මෙ සෙල, ආවාහො භවිස්සති, නපි විවාහො භවිස්සති නපි රාජා මාගධො සෙනියො බිම්බිසාරො නිමන්තිතො ස්වාතනාය සද්ධිං බලකායෙන, අපි ච ඛො මෙ මහායඤ්ඤො පච්චුපට්ඨිතො අත්‍ථි. සමණො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො අඞ්ගුත්තරාපෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං අඩ්ඪතෙළසෙහි භික්ඛුසතෙහි ආපණං අනුප්පත්තො, තං ඛො පන භවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො -පෙ- බුද්ධො භගවාති. සො මෙ නිමන්තිතො ස්වාතනාය සද්ධිං භික්ඛුසඞ්ඝෙනාති.

බුද්ධොති ඛො භො කෙණිය, වදෙසි? බුද්ධොති භො සෙල, වදාමි, බුද්ධොති භො කෙණිය, වදෙසි? බුද්ධොති භො සෙල වදාමීති.



Free Distribution www.aathaapi.org

එසමයෙහි සේල බ්‍රාහ්මණ නිඝණ්ඩු ශාස්ත්‍ර හා ක්‍රියාකල්ප විකල්ප ශාස්ත්‍රය සහිත (ශික්ෂා, නිරුක්ති සඞ්ඛ්‍යාත) අක්ෂර ප්‍රභෙද ඇති (අර්ථව වෙද සතරවන කොට) පුරාණ කථා සඞ්ඛ්‍යාත ඉතිහාසය පස්වනු කොට ඇති වෙදත්‍රයෙහි කෙළ පැමිණියේ පද හා ව්‍යාකරණ දතුයේ (විතණ්ඩ-වාද ශාස්ත්‍ර සඞ්ඛ්‍යාත) ලෝකායත ශාස්ත්‍රයෙහි හා මහා පුරුෂ ලක්ෂණා-ධිකාරයෙහි) පරිපූර්ණ වූයේ ආපණයෙහි වෙසෙයි. ශිෂ්‍ය මාණවකයන් තුන්සියකට වේද මන්ත්‍ර හදරවයි. එසමයෙහි කේණිය ජටිල කෙරෙහි සේලබ්‍රාහ්මණ මොනොවට පැහැදුනේ වෙයි.

එකල්හි සේල බ්‍රාහ්මණ තුන්සියක් මාණවකයන් විසින් පිරිවරණ ලදුයේ ජඞ්ඝා විහාර කරණුයේ කේණිය ජටිලයන් ගේ අසපුව කරා එළැඹියේයැ. සේල බ්‍රාහ්මණ කේණිය ජටිල වෙතැ උදුන් කණනුවන් අසුන් පනවනුවන් ද කේණිය ජටිලයන් තමා මැ මණ්ඩලමාල ය පිළියෙල කරණුවන් ද දිටී. දැක කේණිය ජටිල හට තෙල කීය:

කිම භවත් කේණියගේ ආවාහයෙක් හෝ වන්නේ ද? විවාහයෙක් හෝ වන්නේ ද? මහායාගයෙක් හෝ එළඹ සිටියේ ද? සෙට දවස් සඳහා බලකායයෙන් යුත් මගධාධිපති සේනිය බිම්බිසාර රජ හෝ බතින් පවරණ ලදුයේ ද?යි.

සේලයෙනි, මාගේ ආවාහයෙක් හෝ නො වන්නේ යැ, විවාහයෙක් හෝ නො වන්නේ යැ, බල සෙන් හා මගධපති සේනිය බිම්බිසාර රජ හෝ සෙට දවස් සඳහා නිමන්ත්‍රිත නො වෙයි, වැලිදු මට එළඹ සිටි මහා යඥයෙක් ඇත. සැහැකුලෙන් නික්ම පැවිදි වූ ශ්‍රමණ ශාක්‍ය පුත්‍ර ගෞතමයෝ අඞ්ගුත්තරාප ජනපදයෙහි සැරිසරන්නාහු අඩ තෙළෙස් යල් සියක් බික්මහසඟන හා කැටිව ආපණයට පැමිණියහ, එ භවත් ගෞතම්යන්ගේ මෙවින් කල්‍යාණ කීර්තිඝොෂයෙක් උස්වැ නැංගේ යැ. -පෙ- බුද්ධයහ, භගවත්හ''යි. ඔබ බික් සඟුන් හා සමග මා විසින් සෙට දවසට නිමන්ත්‍රණ කරණ ලදහ.

භවත් කේණියෙනි, බුද්ධයහ'යි කියහි? භවත් සේලයෙනි, 'බුද්ධයහ' යි කියමි. භවත් කේණියෙනි, 'බුද්ධයහ' යි කියහි? භවත් සේලයිනි, 'බුද්ධයහ' යි කියමියි.



Free Distribution www.aathaapi.org

අථ ඛො සෙලස්ස බ්‍රාහ්මණස්ස එතදහොසි: ඝොසොපි ඛො එසො දුල්ලභො ලොකස්මිං යදිදං බුද්ධො'ති. ආගතානි ඛො පන අස්මාකං මන්තෙසු ද්වත්තිංස මහාපුරිසලක්ඛණානි යෙහි සමන්නාගතස්ස මහාපුරිසස්ස ද්වෙව ගතියො භවන්ති අනඤ්ඤා. සචෙ අගාරං අජ්ඣාවසති, රාජා හොති චක්කවත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවි ජනපදත්ථාවරියප්පත්තො සත්තරතනසමන්නාගතො. තස්සිමානි සත්තරතනානි භවන්ති, සෙය්‍යථීදං: චක්කරතනං හත්ථිරතනං අස්සරතනං මණිරතනං ඉත්ථිරතනං ගහපතිරතනං පරිණායකරතනමෙව සත්තමං, පරොසහස්සං ඛො පනස්ස පුත්තා භවන්ති සූරා වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා, සො ඉමං පඨවිං සාගරපරියන්තං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන අභිවිජිය අජ්ඣාවසති. සචෙ ඛො පනාගාරස්මා අනගාරියං පබ්බජති අරහං හොති සම්මාසම්බුද්ධො ලොකෙ විවත්තච්ඡද්දො.

කහං පන භො කෙණිය, එතරහි සො භවං ගොතමො විහරති අරහං සම්මා සම්බුද්ධො'ති.

එවං වුත්තෙ කෙණියො ජටිලො දක්ඛිණං බාහං පග්ගහෙත්වා සෙලං බ්‍රාහ්මණං එතදවොච: යෙනෙසා භො සෙල නීලවනරාජීති,

අථ ඛො සෙලො බ්‍රාහ්මණො තීහි මාණවකසතෙහි සද්ධිං යෙන භගවා තෙනුපසඞ්කමි, අථඛො සෙලො බ්‍රාහ්මණො තෙ මාණවකෙ ආමන්තෙසි: අප්පසද්දා භොන්තො ආගච්ඡන්තු පදෙ පදං නික්ඛිපන්තා, දුරාසදා හි තෙ භගවන්තො සීහාව එකචරා, යදා චාහං භොන්තො, සමණෙන ගොතමෙන සද්ධිං මන්තෙය්‍යං මා මෙ භොන්තො, අන්තරන්තරා කථං ඔපාතෙථ, කථාපරියොසානං මෙ භවන්තො ආගමෙන්තූති.

අථ ඛො සෙලො බ්‍රාහ්මණො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං[1] වීතිසාරෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො සෙලො බ්‍රාහ්මණො භගවතො කායෙ ද්වත්තිංසමහාපුරිසලක්ඛණානි සමන්නෙසි[2], අද්දසා ඛො සෙලො බ්‍රාහ්මණො භගවතො කායෙ ද්වත්තිංස මහාපුරිසලක්ඛණානි යෙභුය්‍යෙන ඨපෙත්වා ද්වෙ, ද්වීසු මහාපුරිසලක්ඛණෙසු කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති, කොසොහිතෙ ච වත්ථගුය්හෙ පහූතජිව්හතාය ච,

1. සාරණීයං - මජසං, මු-2.
2. සමන්නෙසි - මජසං, මු 2.



Free Distribution www.aathaapi.org

එකල්හි සේල බමුණු හට මෙලෙස සිත විය: 'බුද්ධයන' යන යම් මේ නෙපුලෙක් වේ නම් මෙලෙ හඬ ද ලොව්හි දුර්ලභ වේ ය''යි අපගේ වේද මන්ත්‍රයෙහි දෙතිස් මහා පුරුෂ ලක්ෂණ කෙනෙක් ඇත. යම් බඳු ලක්ෂණයෙන් සමන්වාගත මහාපුරුෂයකු හට දෑ ගතියෙක් මැ වේ ද අන්‍ය ගතියෙක් නො වේ ද එබඳු ලක්ෂණයෝ'ය. ඉදින් ගෙහි ඉසුරුව වෙසේ නම් ධාර්මික වූ ධර්මරාජ වූ සිව්සයුරු හිමි කොට ඉසුරු වූයේ සතුරන් දිනන සුලු වූයේ දනවුහි තහවුරු බවට පැමිණියේ සප්ත-රත්නයෙන් සමන්වාගත වූයේ සක්විති රජ වෙයි. ඔ හට මෙ සප්තරත්-නයෝ වෙති, ඔහු කවරහ යත්: චක්‍ර රත්නය, හස්ති රත්නය, අශ්ව රත්නය, මණි රත්නය, ස්ත්‍රීරත්නය, ගෘහපතිරත්නය, සත් වැනි වූ පරිණායක රත්නය. ඔ හට වනාහි ශූර වූ වීරාඞ්ගස්වරූප වූ සතුරු සෙන් මඩනා, අසීරා දහස් පුත්‍රයෝ වෙත්, හේ සයුරු පිරියත් කොට ඇති මෙ මුළු පොළොව අදණ්ඩයෙන් අශස්ත්‍රයෙන් ධර්මයෙන් දිනා ගෙණ ඉසුරු ව වෙසෙයි. ඉදින් ගෙන් නික්මැ අනගාරිය සඞ්ඛ්‍යාත ශාසනයට වදී නම්, අර්හත් සම්‍යක් සම්බුද්ධ වූයේ ලොව්හි පෙරළු ක්ලෙශච්ඡදන ඇතියේ වේ'යි.

භවත් කේණියෙනි, දැන් එ භවත් ගෞතම සම්‍යක් සම්බුද්ධයෝ කොහි වෙසෙත් ද?

මෙසේ අසත් මැ කේණිය ජටිල දක්ෂිණ බාහුව නඟා සෙල බමුණු හට මෙලෙ කීය: භවත් සෙලෙයනි, යම් දිගෙකින් මෙලෙ නිල් වන පෙත වේ නම් (එහි යයි).

ඉක්බිති සෙල බ්‍රාහ්මණ මාණවකයන් තුන්සිය කැටිව ලා ගෙණ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේය. එක්බිති සේල බමුණු මාණවක-යන් තුන්සිය ඇමැතීය: භවත්නි, අල්පශබ්දව පියෙහි පිය තබන්නා හු එව, සිංහයන් සෙයින් ඒකචර වූ එ භාග්‍යවත්හු දුරාසද වෙත් මැයි: (ලංවිය නොහෙත් මැයි) භවත්නි, යම් විටෙක ශ්‍රමණ ගෞතමයන් සමග මන්ත්‍රණ කෙරෙම් නම්, භවත්හු මාගේ කථායෙහි නහමක් අතුරු කථා හෙළවයි, භවත්හු මාගේ කථා පර්‍යවසානය අපෙක්ෂා කෙරෙත්වා යි.

එක්බිති සේල බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේ කරා ගියේය. ගොස් භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු වියයුතු, සිහි කට යුතු කථා කොට නිමවා එකත් පස් හි හින. එකත් පස් හි හුන් සෙල බ්‍රාහ්ම-ණ භාග්‍යවතුන් වහන්සේගේ රූපකායයෙහි දෙතිස් මහපුරිස් ලකුණු සෙවීය. සෙල බමුණු භාග්‍යවතුන් වහන්සේගේ සිරුරෙහි දෙකක් තබා බොහෝ කොට දෙතිස් මහපුරිස් ලකුණු දිටී. දෙමහපුරිස් ලකුණෙකැ සැක දනවයි, විචිකිත්සා කෙරෙයි, අධිමොක්ෂ නො කෙරෙයි, ප්‍රසන්න භාව-යට නො යෙයි: කොෂාවහිත වස්ත්‍රගුහ්‍යයෙහි ද ප්‍රභූත ජිහ්වතායෙහි දූ යි.



Free Distribution www.aathaapi.org

අථ ඛො භගවතො එතදහොසි: පස්සති ඛො මෙ අයං සෙලො බ්‍රාහ්මණො ද්වත්තිංසමහාපුරිසලක්ඛණානි යෙභුය්‍යෙන ඨපෙත්වා ද්වෙ, ද්වීසු මහාපුරිසලක්ඛණෙසු කඞ්ඛති විචිකිච්ඡති නාධිමුච්චති න සම්පසීදති, කොසොහිතෙ ච වත්ථගුය්හෙ පහූතජිව්හතාය චාති. අථ ඛො භගවා තථාරූපං ඉද්ධාභිසඞ්ඛාරං අභිසඞ්ඛාසි යථා අද්දස සෙලො බ්‍රාහ්මණො භගවතො කොසොහිතං වත්ථගුය්හං, අථ ඛො භගවා ජිව්හං නින්නාමෙත්වා උභොපි කණ්ණසොතානි අනුමසි පටිමසි, උභොපි නාසිකසොතානි අනුමසි පිරිමසි, කෙවලම්පි ලළාටමණ්ඩලං ජිව්හාය ඡාදෙසි.

අථ ඛො සෙලස්ස බ්‍රාහ්මණස්ස එතදහොසි සමන්නාගතො ඛො සමණො ගොතමො ද්වත්තිංසමහාපුරිසලක්ඛණෙහි පරිපුණ්ණෙහි නො අපරිපුණ්ණෙහි නො ච ඛො නං ජානාමි බුද්ධො වා නො වා, සුතං ඛො පන මෙතං බ්‍රාහ්මණානං වුද්ධානං මහල්ලකානං ආචරියපාචරියානං භාසමානානං, යෙ තෙ භවන්ති අරහන්තො සම්මාසම්බුද්ධා තෙ සකෙ වණ්ණෙ භඤ්ඤමානෙ අත්තානං පාතුකරොන්තීති, යන්නූනාහං සමණං ගොතමං සම්මුඛා සාරුප්පාහි ගාථාහි අභිත්ථවෙය්‍යන්ති, අථ ඛො සෙලො බ්‍රාහ්මණො භගවන්තං සම්මුඛා සාරුප්පාහි ගාථාහි අභිත්ථවි.

551. පරිපුණ්ණකායො සුරුචි සුජාතො චාරුදස්සනො,
සුවණ්ණවණ්ණොසි[1] භගවා සුසුක්කදාඨොසි විරියවා.

552. නරස්ස හි සුජාතස්ස යෙ භවන්ති වියඤ්ජනා
සබ්බෙ තෙ තව කායස්මිං මහාපුරිසලක්ඛණා.

553. පසන්නනෙත්තො සුමුඛො බ්‍රහා උජු පතාපවා,
මජ්ඣෙ සමණසඞ්ඝස්ස ආදිච්චො’ ව විරොචසි.

554. කල්‍යාණදස්සනො භික්ඛු කඤ්චනසන්නිභත්තචො,
කිං තෙ සමණභාවෙන එවං උත්තමවණ්ණිනො.

1. සුවණ්ණවණ්ණෙසි - සිමු 2.



Free Distribution www.aathaapi.org

එකල්හි භාග්‍යවතුන් වහන්සේට මෙබඳු සිත විය: මේ සේල බ්‍රාහ්මණ දෙකක් හැර මාගේ දෙතිස් මහපුරිස් ලකුණු බොහෝ කොට දක්නේය, දෙමහපුරිස් ලකුණෙක් හි සැක දනවයි, විචිකිත්සා කෙරෙයි, අධිමොක්ෂ නො කෙරෙයි, පහන් නොවෙයි: කොෂොවහිත වස්ත්‍රගුහ්‍යයෙහි හා ප්‍රභූත ජිහ්වතායෙහි හායි. එක්බිති භාග්‍යවතුන් වහන්සේ යම් පරිදි-යෙකින් සෙල බ්‍රාහ්මණ භාග්‍යවතුන් වහන්සේගේ කොෂොවහිත වස්ත්‍ර ගුහ්‍යය දිටී නම්, එපරිද්දෙන් සෘද්ධ්‍යභිසංස්කාරයක් කළසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ දිව බැහැරි කොට ලා දෙකන් සිළ අනුමර්ශන කළහ, පරාමර්ශන කළහ, දෙනාසාසිදුරුදු අනුමර්ශන කළහ, පරාමර්ශන කළහ, හැම නළල් මඩුලු දිවෙන් වැසූහ.

එක්බිති සෙල බමුණු හට මෙබඳු සිත විය: අපරිපූර්ණ නො ව පරි-පූර්ණ වූ ම දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් ශ්‍රමණ භවත් ගෞතමයෝ සමන්වාගත වෙති. උහු බුදුහ හෝයි නො බුදුහ හෝයි නො ද දනිමි.

"යම් මැ අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ වෙත් නම්, උන් වහන්සේ තමන් ගුණ වණනු ලබත් ම තමන් පාළ කෙරෙතැ"යි වෘද්ධ වූ ජාති මහල්ලක වූ ආචාර්ය ප්‍රාචාර්යයන්ගේ මෙබඳු බස මා විසින් අසන ලද මැයි. මම ශ්‍රමණ ගෞතමයන් වහන්සේ අබිමුවෙහි සාරුප්‍ය ගාථායෙන් තෙමන්නෙම් නම් මැනවයි. එක්බිති සෙල බ්‍රාහ්මණ භාග්‍ය-වතුන් වහන්සේ අභිමුවෙහි සාරුප්‍ය ගාථාවෙන් පැසැසීය.

551. භාග්‍යවතුන් වහන්ස, (මහ පුරිස් ලකුණින් පිරිපුන් හෙයිනුදු නො හුනු අඟ පසඟ ඇති බැවිනුදු) පිරිපුන් සිරිරු ඇතියව, සොඳුරු සිරිරු පැහැ ඇතියව, (ආරොහ පරිණාහ සම්පත්ති යෙනුදු සංස්ථාන සම්-පත්ති යෙනුදු) සුජාතයව, සිත්කලු දශීන (හෙවත් නෙත්) ඇතියව, රන්වන් පැහැ ඇත්තව, ඉතා සුදු දළ ඇත්තව, දැඩන් වීය ඇත්තව.

552. සුජාත වූ පුරුෂයකුහට යම් බඳු වියදුන්හ වෙත් නම්, ඒ හැම මහා පුරුෂ ලක්ෂණයෝ බුඹවහන්සේගේ සිරුරෙහි වෙති.

553. (පණවර්ණ ප්‍රසාද සම්පත්තියෙන්) පහන් නෙත් ඇත්ත ව, (පිරිපුන් සඳ මඩල බඳු හෙයින්) සුමුඛ ව, (ආරෝහ පරිණාහ සම්පත්ති හෙයින්) වෑහත් වව. (බඹහුගේ මෙන් ඍජු ගාත්‍ර ඇති හෙයින්) ඍජුවව, (ජ්‍යොතිර්මද් භාවයෙන්) ප්‍රතාප ඇතිය ව, ශ්‍රමණ සඞ්ඝයාගේ මධ්‍යයෙහි ආදිත්‍ය සෙයින් වොරදහු.

554. කලණ දසුන් ඇති මහණ ව, කසුන් බඳු සිවි ඇත්ත ව, මෙ සෙයින් උත්තම වර්ණ ඇති තොපගේ ශ්‍රමණ භාවයෙන් කවර අර්ථයෙක?



Free Distribution www.aathaapi.org

555. රාජා අරහසි භවිතුං චක්කවත්තී රථෙසභො,
චාතුරන්තො විජිතාවී ජම්බුසණ්ඩස්ස ඉස්සරො.

556. ඛත්තියා භොජරාජානො අනුයුත්තා භවන්ති තෙ,
රාජාභිරාජා මනුජින්දො රජ්ජං කාරෙහි ගොතම.

557. රාජාහමස්මි[1] සෙල (ඉති භගවා) ධම්මරාජා අනුත්තරො,
ධම්මෙන චක්කං වත්තෙමි චක්කං අප්පතිවත්තියං.

558. සම්බුද්ධො පටිජානාසි (ඉතිසෙලො බ්‍රාහ්මණො) ධම්මරාජා
අනුත්තරො,
ධම්මෙන චක්කං වත්තෙමි ඉති භාසසි ගොතම.

559. කො නු සෙනාපති භොතො සාවකො සත්ථුදන්වයො,
කො තෙ ඉමං අනුවත්තෙති ධම්මචක්කං පවත්තිතං.

560. මයා පවත්තිතං චක්කං (සෙලාති භගවා) ධම්මචක්කං අනුත්තරං,
සාරිපුත්තො අනුවත්තෙති අනුජාතො තථාගතං.

561. අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං භාවෙතබ්බඤ්ච භාවිතං,
පහාතබ්බං පහීනං මෙ තස්මා බුද්ධොස්මි බ්‍රාහ්මණ.

562. විනයස්සු මයි කඞ්ඛං අධිමුච්චස්සු බ්‍රාහ්මණ,
දුල්ලභං දස්සනං හොති සම්බුද්ධානං අභිණ්හසො.

563. යෙසං වො දුල්ලභො ලොකෙ පාතුභාවො අභිණ්හසො,
සො'හං බ්‍රාහ්මණ සම්බුද්ධො සල්ලකත්තො අනුත්තරො.

564. බ්‍රහ්මභූතො අතිතුලො මාරසෙනප්පමද්දනො,
සබ්බාමිත්තෙ වසීකත්වා මොදාමි අකුතොභයො.

565. ඉමං භොන්තො නිසාමෙථ යථා භාසති චක්ඛුමා,
සල්ලකත්තො මහාවීරො සීහො ව නදතී වනෙ.

1. රාජාහමස්මි - සිමු 2.



Free Distribution www.aathaapi.org

555. දඹදිවට ඉසුරු වූ සිව්සයුරු හිම කොට සතුරන් දිනන සුලු රාජශ්‍රෙෂ්ඨ වූ සක්විති රජ වන්නට නිස්සෙහි.

556. භවත් ගෞතමයන් වහන්ස, භෝග යුක්ත ක්ෂත්‍රියයෝ ද රජහු ද තොපට අනුයුක්ත වෙත්. මනුජේන්ද්‍ර රාජාධිරාජ වූයෙහි රජය කරව.

557. සේලයෙනි, මම අනුත්තර ධර්ම රාජන් වූ රජෙමි. (කිසිවකු විසිනුදු) නො පැවැත් විය හැකි චක්‍රය වන ආඥාචක්‍රය (සත්තිස් බොධි පාක්ෂික) ධර්මයෙන් පවත් වන්නෙමි'යි (භාග්‍යවතුන් වහන්සේ වදාළහ.)

558. (සෙල බ්‍රාහමණ මෙසේ කියයි) ගෞතමයන් වහන්ස, 'අනුත්තර ධර්ම රාජ වූ සම්බුද්ධ යෙමි'යි පිළින කර වූ ද? දැහැමින් අණසක් පවත්ව මැයි කියයි නො:

559. ශාස්තෘ වූ භවත්හු ගේ අන්වයාගත ශ්‍රාවක වූ දම් සෙනෙවි කවරේ ද? තොප විසින් පවත්වන ලද මෙ ධර්ම චක්‍රය කවරෙක් අනුවර්තන කෙරේ ද?

560. (සෙල බමුණු අමතා බුදුහු මෙසේ වදළහ:) "තථාගතයනට අනුජාත වූ ශාරිපුත්‍ර මා විසින් පවත්වන ලද චක්‍රය වූ අනුත්තර ධර්ම චක්‍රය පවත්වයි."

561. (විද්‍යා, විමුක්ති සඞ්ඛ්‍යාත) අභිඥෙය ධර්මය මා විසින් අභිඥාත වෙයි. (මාර්ග සත්‍යය සඞ්ඛ්‍යාත) වැඩිය යුතු ධර්මය වඩන ලද, සමුදය සත්‍ය සඞ්ඛ්‍යාත ප්‍රහාතව්‍ය ධර්මය ප්‍රහීණ වෙයි. බමුණ, එහෙයින් බුද්ධ යෙමි.

562. බ්‍රාහමණය, මා කෙරෙහි සැක හැර පියව, අධිමොක්ෂය පිහිටු ව, සම්බුදුන්ගේ එක්වන් දර්ශනය දුර්ලභ වේ.

563. යම් සම්බුදු වරුන් ගේ නිරතුරු පහළවීම ලෝකයෙහි දුර්ලභ වෙයි, බ්‍රාහමණය. එබඳු මම අනුත්තර වූ (රාගාදිශල්‍යයන් උදුරණ හෙයින්) ශල්‍යවෛද්‍ය වූ සම්‍යක් සම්බුද්ධ යෙමි.

564. බ්‍රහම (ශ්‍රෙෂ්ඨ) භූත යෙම උපමා ඉක්ම වූ යෙම, මර සෙන් මඩනෙම (පඤ්චමාර සඞ්ඛ්‍යාත) හැම සතුරන් වශයෙහි කොට (මැඩ) කිසිවකුගෙනුදු නොබානෙම තුටු වෙමි."යි

565. භවත්නි, පසැස් ඇතියේ යම සේ බෙණේ නම්; මෙය අසවු. ශල්‍යවෛද්‍ය වූ මහා වීර තෙමේ වෙනෙහි සිහරදකු සෙයින් නාද කෙරෙයි.



Free Distribution www.aathaapi.org

566. බ්‍රහ්මභූතං අතිතුලං මාරසෙනප්පමද්දනං,
කො දිස්වා නප්පසීදෙය්‍ය අපි කණ්හාභිජාතිකො.

567. යො මං ඉච්ඡති අන්වෙතු යො වා නිච්ඡති ගච්ඡතු,
ඉධාහං පබ්බජිස්සාමි වරපඤ්ඤස්ස සන්තිකෙ.

568. එතඤ්චෙ රුච්චති භොතො සම්මාසම්බුද්ධසාසනං,
මයම්පි පබ්බජිස්සාම වරපඤ්ඤස්ස සන්තිකෙ.

569. බ්‍රාහ්මණා තිසතා ඉමෙ යාචන්ති පඤ්ජලීකතා,
බ්‍රහ්මචරියං චරිස්සාම භගවා තව සන්තිකෙ.

570. ස්වාක්ඛාතං බ්‍රහ්මචරියං (සෙලාති භගවා) සන්දිට්ඨිකමකාලිකං,
යත්ථ අමොඝා පබ්බජ්ජා අප්පමත්තස්ස සික්ඛතොති.

අලත්ථ ඛො සෙලො බ්‍රාහ්මණො සපරිසො භගවතො සන්තිකෙ පබ්බජ්ජං අලත්ථ උපසම්පදං. අථ ඛො කෙණියො ජටිලො තස්සා රත්තියා අච්චයෙන සකෙ අස්සමෙ පණීතං ඛාදනීයං භොජනීයං පටියාදාපෙත්වා භගවතො කාලං ආරොචාපෙසි, කාලො භො ගොතම නිට්ඨිතං භත්තන්ති.

අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන කෙණියස්ස ජටිලස්ස අස්සමො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි, සද්ධිං භික්ඛුසඞ්ඝෙන. අථ ඛො කෙණියො ජටිලො බුද්ධප්පමුඛං භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි සම්පවාරෙසි. අථ ඛො කෙණියො ජටිලො භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො කෙණියං ජටිලං භගවා ඉමාහි ගාථාහි අනුමොදි.

571. අග්ගිහුත්තමුඛා යඤ්ඤා සාවිත්ති ඡන්දසො මුඛං,
රාජා මුඛං මනුස්සානං නදීනං සාගරො මුඛං.

572. නක්ඛත්තානං මුඛං චන්දො ආදිච්චො තපතං මුඛං,
පුඤ්ඤං ආකඞ්ඛමානානං සඞ්ඝො වෙ යජතං මුඛන්ති.



Free Distribution www.aathaapi.org

566. ශ්‍රේෂ්ඨ වූ උපමාතික්‍රාන්ත වූ මර සෙන් මඩනා සම්බුදුන් දැක නීච ජාතික වූ ද කවරෙක් නම් නො පහද නේ ද?

567. යමෙක් රුස්නේ නම් මා අනුගමන කෙරේ වා, යමෙක් නො කැමැතියේ නම්, (හෙ) යේවා, උත්තම ප්‍රඥා ඇති බුදුන්ගේ හමුයෙහි මැ මම පැවිදි වන්නෙමි' යි,

568. ඉදින් භවත් හට තෙල සම්‍යක් සම්බුද්ධ ශාසනය රුස්නේ නම් වරප්‍රාඥ වූ බුදුන් ගේ හමුයෙහි අපිදු පැවිදි වන්නෙමු.

569. භාග්‍යවතුන් වහන්ස, ඇදිලි බැඳි මෙ තුන්සියක් බමුණෝ, මුබ වහන්සේ හමුයෙහි බඹසර සරම්හයි යැනාහ.

570. සේලයෙනි, යම් ශාසනයෙක් හි අප්‍රමත්තව හික්මෙන්නහු ගේ ප්‍රව්‍රජ්‍යාව නො සිස් වේ නම්, මෙ ශාසනබ්‍රහ්මචය්‍ර්‍යය සාන්‍දෘෂ්ටික වෙයි. අකාලික වෙයි. ස්වාඛ්‍යාත ද වේ යයි භාග්‍යවතුන් වහන්සේ වදළහ.

සෙල බ්‍රාහ්මණ පිරිස් සහිත වූයේ භාග්‍යවතුන් වහන්සේ වෙතැ පැවිදි ලද්දේය. උපසම්පද ලැබීය. එක්බිති කේණිය ජටිල ඒ රෑ ඇවෑමෙන් සිය අසපුයෙහි ප්‍රණීත ඛාද්‍ය භොජ්‍යයන් පිළියෙල කරවා භාග්‍යවතුන් වහන්සේට භවත් ගෞතමයන් වහන්ස, (මෙ දනට) කල් වෙයි, බත් නිමැවිනැයි කල් දැන්වීය.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙර වරුයෙහි හැඳැ පෙරවැ පා සිවුරු ගෙණ කේණිය ජටිලයාගේ අසපුව කරා එළැඹිසේක. එළැඹ පනවන ලද අස්නෙහි බික් සඟුන් සමග හුන් සේක: ඉක්බිති කේණිය ජටිල බුදු පාමොක් බික් සඟුන් ප්‍රණීත ඛාද්‍ය භොජ්‍යයෙන් සියතින් සන්තර්පණ කෙළේය. මොනොවට පැවරිය. ඉක්බිති කේණිය ජටිල දන් වැලඳු පාත්‍රයෙන් ඉවත් කළ අත් ඇති භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණ අන්‍යතර නීචාසනයක් ගෙණ එකත් පසෙක හින. එකත් පසෙක හුන් කේණිය ජටිල හට භාග්‍යවතුන් වහන්සේ මෙ ගාථායෙන් අනුමෙවෙනි කළ සේක:

571. යඥයෝ අග්නි හොත්‍රය ප්‍රමුඛ කොට ඇත්තාහ. වෙදයට සාවිත්‍රිය ප්‍රමුඛ වෙයි, මිනිස්නට රජ ප්‍රමුඛ වෙයි. නදීනට සයුර ප්‍රමුඛ වෙයි.

572. (යොග වශයෙන්) නැකැත් තරුනට සඳ පාමොක් වෙයි. තවන වුනට ආදිත්‍ය (හිරු) ප්‍රමුඛ වෙයි. පින් කැමතිව යාග කරණ වුනට එකාන්තයෙන් සඞ්ඝයා ප්‍රමුඛ වෙ,

අථ ඛො භගවා කෙණියං ජටිලං ඉමාහි ගාථාහි අනුමොදිත්වා උට්ඨායාසනා පක්කාමි. අථ ඛො ආයස්මා සෙලො පසරිසො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති. තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි.

ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති. අබ්භඤ්ඤාසි අඤ්ඤතරො ච ඛො පනායස්මා සෙලො සපරිසො අරහතං අහොසි.

අථ ඛො ආයස්මා සෙලො සපරිසො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා එකංසං චීවරං කත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං ගාථාහි අජ්ඣභාසි.

573. යං තං සරණමාගම්ම ඉතො අට්ඨමී චක්ඛුම,
සත්තරත්තෙන භගවා දන්තම්හ තව සාසනෙ.

574. තුවං බුද්ධො තුවං සත්ථා තුවං මාරාභිභූ මුනි,
තුවං අනුසයෙ ඡෙත්වා තිණ්ණො තාරෙසි'මං පජං.

575. උපධී තෙ සමතික්කන්තා ආසවා තෙ පදලිතා,
සීහොසි අනුපාදනො පහීණභයභෙරවො.

576. භික්ඛවො තිසතා ඉමෙ තිට්ඨන්ති පඤ්ජලීකතා,
පාදෙ වීර පසාරෙහි නාගා වන්දන්තු සත්ථුනොති.

සෙලසුත්තං නිට්ඨිතං.



Free Distribution www.aathaapi.org

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙ ගාථායෙන් කෙණිය ජටිල හට අනුමෙවෙනි කොට හුනස්නෙන් නැඟී වැඩි සේක. එකල්හි ආයුෂ්මත් සෙල තෙරහු පිරිස් සහිත ව එකලා වූයේ ගණසඞ්ගණිකායෙන් වියෝ වූයේ අප්‍රමත්තව කෙලෙස් තවන වැර ඇතියේ නිවන් කෙරෙහි මෙහෙ යූ සිත් ඇතිව වසනුයේ යම් රහත් බවක් සඳහා ආචාර කුලපුත්‍රයෝ මොනොවට ගෙන් නික්ම අනගාරිය සස්නට වදිත් නම්, මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යයෙහි අවසානය වූ ඒ උතුම් අර්හත් ඵලය ඉහාත්මයෙහි ම තෙමෙ විශිෂ්ටඥානයෙන් දැන සාක්ෂාත් කොට එයට එළඹ වාස කෙළේය.

(ප්‍රතිසන්ධි ජනක කර්මක්ෂයයෙන්) පුනර්භව සඞ්ඛ්‍යාත ජාතිය ක්ෂීණ වූය, මග බඹසර වැස නිමවන ලද, සිවු මග කරණී කරණ ලද මෙ රහත්බව පිණිස අනෙකෙක් නැතැයි මොනොවට පසක් කොට දති. ආයුෂ්මත් සෙල තෙරහු පිරිස් සහිත ව රහතුන් අතුරෙහි අන්‍යතර ද වූහ.

ඉක්බිති පිරිස් සහිත ආයුෂ්මත් සේල තෙරහු භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ සිවුරු එකස් හි කොට ලා භාග්‍යවතුන් වහන්සේ වෙතැ ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් මෙසේ කීහ:

573. පසැසුන් වහන්ස, මෙයින් අටවැනි දිනෙහි යම් බඳු තොප වෙත ආවමෝ නම්, භාග්‍යවතුන් වහන්ස, තොප ගේ සස්නෙහි සත් රැයෙකින් දැමුනමෝ වම්හ.

574. මුනිවරයන් වහන්ස, තෙපි බුද්ධවව, තෙපි ශාස්තෘවව. තෙපි මාරාභිභූවව. තෙපි සත්අනුශයන් සිඳ සසර තරණය කළහු මා හා මාගේ ප්‍රජාව හා එතර ලූවහු.

575. තොප විසින් උපධීහු සමතික්‍රාන්ත වෙති. තොපගේ ආස්‍රවයෝ පළන ලදහ. ප්‍රහීණ භය භෛරව ඇති, උපාදන විසින් නොගන්නා තෙපි සිංහවව.

576. මෙ තුන්සිය මහණහු බඳැදිලිව මෙහි සිටිත්, මහාවීරයෙනි, පා විදහුව මැනව. (නිෂ්පාප හෙයින්) නාගයෝ ශාස්තෘහුගේ පා වඳනාහයි.

සේල සූත්‍රය නිමි.

## 3–8

## සල්ලසුත්තං

577. අනිමිත්තමනඤ්ඤාතං මච්චානං ඉධ ජීවිතං,
කසිරඤ්ච පරිත්තඤ්ච තඤ්ච දුක්ඛෙන සඤ්ඤුතං.

578. නහි සො උපක්කමො අත්ථි යෙන ජාතා න මීයරෙ,
ජරම්පි පත්වා මරණං එවංධම්මා හි පාණිනො.

579. ඵලානමිව පක්කානං පාතො පතනතො භයං,
එවං ජාතානමච්චානං නිච්චං මරණතො භයං.

580. යථාපි කුම්භකාරස්ස කතා මත්තිකභාජනා,
සබ්බෙ භෙදනපරියන්තා[1] එවං මච්චාන ජීවිතං.

581. දහරා ච මහන්තා ච යෙ බාලා යෙ ච පණ්ඩිතා,
සබ්බෙ මච්චුවසං යන්ති සබ්බෙ මච්චුපරායනා.

582. තෙසං මච්චුපරෙතානං ගච්ඡතං පරලොකතො,
න පිතා තායතෙ පුත්තං ඤාතී වා පන ඤාතකෙ.

583. පෙක්ඛතං යෙව ඤාතීනං පස්ස ලාලපතං පුථු,
එකමෙකො ව මච්චානං ගොවජ්ඣො විය නීයති.

584. එවමබ්භාහතො ලොකො මච්චුනා ච ජරාය ච,
තස්මා ධීරා න සොචන්ති විදිත්වා ලොකපරියායං.

585. යස්ස මග්ගං න ජානාසි ආගතස්ස ගතස්ස වා,
උභො අන්තෙ අසම්පස්සං නිරත්ථං පරිදෙවසි.

586. පරිදෙවයමානො චෙ කඤ්චි අත්ථං උදබ්බහෙ,
සම්මූළ්හො හිංසමත්තානං කයිරා චෙනං විචක්ඛණො.

1. භෙදපරියන්තා-මජසං



Free Distribution www.aathaapi.org

## 3 – 8

## සලල සූත්‍රය

577. මෙලොවහි මනුෂ්‍යයන් ගේ ජීවිතය (මරණය හඟවන) නිමිති නැතියෙක. එහෙයින් මැ අඥත යැ. සුඛ යාපනීය නොවෙයි. අල්පද වෙයි. එද දුකින් යුක්තය.

578. යම් උපක්‍රමයෙකින් උපන් සත්ත්වයෝ නොමියෙත් නම්, එබඳු උපක්‍රමයෙක් නැත, ජරාවට පැමිණ ද (නො පැමිණ ද) මරණය වෙයි, ප්‍රාණීහු මෙබඳු සැහැවි ඇතියහ.

579. පරිපක්ව (ඉදුනු) ඵලයනට ප්‍රාතඃකාලයෙහි (අලුයම) පතන යෙන් වන බිය සෙයින් උපන් සත්නට නරතුරු මරණින් බිය උපදනේ ය.

580. යම් සේයෙකින් කුඹලු විසින් කරණ ලද මැටිමුවා බඳුන් හැම බිඳුම් හිම් කොට ඇතියේ ද, මිනිසුන්ගේ ජීවිතයත් එබඳු වෙයි.

581. ලදරු කෙනෙක් වෙත්වයි මහලු කෙනෙක් වෙත්වයි යම් අඥන කෙනෙක් වෙත්වයි පණ්ඩිත කෙනෙක් වෙත්වයි, උහු හැම මරවසට යෙති හැම මෘත්‍යුපරායණ වෙත්.

582. මරහු විසින් මඩනා ලද උන් පරලොව යන් මැ පියා සිය පුතු පරලොවින් නො රක් නේය. ඥතිහු හෝ සිය නෑයන් නො රක්නාහ.

583. බලව, ඥතීන් බලාසිටුන්මැ බොහෝ දෙන නන් දෙඩත්මැ එකලාවූ මැ මර මිනිසුන් අතුරෙන් එකඑකා ගෝඝාතකයා සෙයින් ගෙණ-යනු ලැබෙයි.

584. මෙසේ ලොව මෘත්‍යුහු විසිනුදු ජරාව විසිනුදු මැඩුනෙන් වෙයි. එහෙයින් ලෝකස්වභාවය දන ධීරයෝ නො සොවිති.

585. මවු කුසට පැමිණියා වූත් මියගියාවූත් යමකුගේ ගතාගතමාර්ගය නොදනුයෙහි නම්, උභයාන්තයන් නොදක්මින් නිරර්ථකව වලප්නෙහි.

586. ඉදින් වලප්නා තැනැත්තේ කිසි අර්ථයක් දරා නම් විචක්-ෂණ තැනැත්තේ ද සම්මූඪ වැ තමා පෙළමින් තෙල මැ කරන්නේය.



Free Distribution www.aathaapi.org

587. නහි රුණ්ණෙන සොකෙන සන්තිං පප්පොති චෙතසො,
භීයස්සුප්පජ්ජතෙ දුක්ඛං සරීරං උපහඤ්ඤති.

588. කිසො විවණ්ණො භවති හිංසමත්තානමත්තනා,
න තෙන පෙතා පාලෙන්ති නිරත්ථා පරිදෙවනා.

589. සොකමප්පජහං ජන්තු භීයො දුක්ඛං නිගච්ඡති,
අනුත්ථුනන්තො කාලකතං සොකස්ස වසමන්වගූ.

590. අඤ්ඤෙපි පස්ස ගමිනෙ යථාකම්මූපගෙ නරෙ,
මච්චුනො වසමාගම්ම ඵන්දන්තෙ විධ පාණිනො.

591. යෙන යෙන හි මඤ්ඤන්ති තතො තං හොති අඤ්ඤථා,
එතාදිසො විනාභාවො පස්ස ලොකස්ස පරියායං.

592. අපි චෙ වස්සසතං ජීවෙ භීයො වා පන මානවො,
ඤාතිසඞ්ඝා විනා හොති ජහාති ඉධ ජීවිතං.

593. තස්මා අරහතො සුත්වා විනෙය්‍ය පරිදෙවිතං[1],
පෙතං කාලකතං දිස්වා න සො ලබ්භා මයා ඉති.

594. යථා සරණමාදිත්තං වාරිනා පරිනිබ්බුතෙ,
එවම්පි ධීරො සප්පඤ්ඤො පණ්ඩිතො කුසලො නරො
ඛිප්පමුප්පතිතං සොකං වාතො තූලංව ධංසයෙ.

595. පරිදෙවං පජ්ජප්පඤ්ච දොමනස්සඤ්ච අත්තනො,
අත්තනො සුඛමෙසානො අබ්බහෙ සල්ලමත්තනො.

596. අබ්බුළ්හසල්ලො අසිතො සන්තිං පප්පුය්‍ය චෙතසො,
සබ්බසොකං අතික්කන්තො අසොකො හොති නිබ්බුතොති.

සල්ලසුත්තං නිට්ඨිතං.

1. පරිදෙවිතං--මු 2



Free Distribution www.aathaapi.org

587. රෝදනයෙන් හෝ ශෝකයෙන් හෝ චිත්තශාන්තිය නො ලබයි. ඔහට අධිකමාත්‍රායෙන් දුක් උපදනේ ය. සිරිරු ද වැනැසෙයි.

588. කෘශවූයේත් දුර්වර්ණවූයේත් වෙයි. තෙමේ තමා නසන්නේ ද වෙයි. එ පරිදේවනායෙන් මිය ගියාහු ද තමන් නොරක්නාහ. එ හෙයින් පරිදේවනා නිරර්ථක වෙයි.

589. ඥාතිව්‍යසනශෝක නොහරනා නරතෙම බෙහෙවින් දුකට පැමිණෙයි. කලුරිය කළහු අනුව සොවින්නේ ශෝකවශයට ම ගියේ වෙයි.

590. පරලොව ගමනට සැදි සිටුනා, කම්වූ පරිදි මියන, මාරවශයට පැමිණ සසලන, මෙලොවහි අන්‍ය ප්‍රාණීන් ද බලව.

591. යම්මැ අයුරෙකින් සත්ත්වයෝ හඟිත් නම්, එය එයින් අන් පරිදි වෙයි. මෙබඳු විනාභාවයෙක් ඇත. ලෝකස්වභාවය බලව.

592. ඉදින් මිනිස් තෙමේ සිය වසක් හෝ ඉන් වැඩියක් හෝ ජීවත් වේ නම්, නෑ ගණයාගෙන් (මරණ විසින්) වියෝ වේ මැයි. මෙලොවහි දිවි මෙසේ දන්නේ ය.

593. එකරුණින් මැ රහත්හුගේ (සම්බුදුන්ගේ) මෙබඳු ධර්මදේශනා අසා පරිදේවනා හැරපියා කලුරිය කළ පරලොව ගියහු දැක තෙල ප්‍රෙත මා විසින් යලි නොලද හැක්කේ"යි පරිදේවනා හැර පියන්නේය.

594. ගින්නෙන් ඇවිළැගත් ගෙයක් දියෙන් යම් සෙයින් නිවන ලදු යේ ද එ සෙයින් කෙලෙස් පිරිනිවි ධෘතිසම්පන්න ස්වාභාවික ප්‍රඥා ඇති (බහුශ්‍රැත ප්‍රඥායෙන්) පණ්ඩිත වූ චින්තාමය ප්‍රඥායෙන් දක්ෂ වූ නර තෙම උපන් ශෝකය මාරුතය පුළුන් පෙදක් සෙයින් වහා පිඹ හරනේ ය,

595. තම හට සුව පතනුයේ තමාගේ පරිදේව යැ තෘෂ්ණා යැ, දෙම්-නස යැ යන ශල්‍යයන් උදුරා ලන්නේය.

596. උදුරාලූ සෝහුල් ඇතියේ තෘෂ්ණාදෘෂ්ටි නිඃශ්‍රිත නොවූයේ චිත්තශාන්තියට පැමිණ සර්වශෝකයන් ඉක්මැවූයේ කෙලෙස් පිරිනිවියේ අශෝක වේ යයි.

සල්ල සූත්‍රය නිමි.



Free Distribution www.aathaapi.org

## 3–9

## වාසෙට්ඨසුත්තං

එවං මෙ සුතං ඒකං සමයං භගවා ඉච්ඡානඞ්ගලෙ විහරති ඉච්ඡානඞ්ගලවනසණ්ඩෙ, තෙන ඛො පන සමයෙන සම්බහුලා අභිඤ්ඤාතා බ්‍රාහ්මණමහාසාලා ඉච්ඡානඞ්ගලෙ පටිවසන්ති, සෙය්‍යථීදං: චඞ්කී බ්‍රාහ්මණො තාරුක්ඛො බ්‍රාහ්මණො, පොක්ඛරසාති බ්‍රාහ්මණො ජානුස්සොනි බ්‍රාහ්මණො තොදෙය්‍යො බ්‍රාහ්මණො අඤ්ඤෙ ච අභිඤ්ඤාතා අභිඤ්ඤාතා බ්‍රාහ්මණමහාසාලා. අථ ඛො වාසෙට්ඨභාරද්වාජානං මාණවානං ජඞ්ඝාවිහාරං අනුචඞ්කමමානානං[1] අනුවිචරමානානං[2] අයමන්තරා කථා උදපාදි, කථං භො බ්‍රාහ්මණො හොතීති.

භාරද්වාජො මාණවො එව මාහ: යතො ඛො භො උභතො සුජාතො හොති මාතිතො ච පිතිතො ච සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන එත්තාවතා ඛො බ්‍රාහ්මණො හොතීති.

වාසෙට්ඨො මාණවො එව මාහ: යතො ඛො භො සීලවා ච හොති වත්තසම්පන්නො ච එත්තාවතා ඛො බ්‍රාහ්මණො හොතීති. නෙව ඛො අසක්ඛි භාරද්වාජො මාණවො වාසෙට්ඨං මාණවං සඤ්ඤාපෙතුං, න පන අසක්ඛි වාසෙට්ඨො මාණවො භාරද්වාජං මාණවඤ්ච සඤ්ඤාපෙතුං.

අථ ඛො වාසෙට්ඨො මාණවො භාරද්වාජං මාණවං ආමන්තෙසි: අයං ඛො භාරද්වාජ සමණො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො ඉච්ඡානඞ්ගලෙ විහරති ඉච්ඡානඞ්ගලවනසණ්ඩෙ, තං ඛො පන භවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: ඉතිපි -පෙ- බුද්ධො භගවාති. ආයාම භො භාරද්වාජ, යෙන සමණො ගොතමො තෙනුපසඞ්කමිස්සාම, උපසඞ්කමිත්වා සමණං ගොතමං එතමත්ථං පුච්ඡිස්සාම, යථා නො සමණො ගොතමො ව්‍යාකරිස්සති තථා නං ධාරෙස්සාමාති. එවං භොති ඛො භාරද්වාජො මාණවො වාසෙට්ඨස්ස මාණවස්ස පච්චස්සොසි.

අථ ඛො වාසෙට්ඨභාරද්වාජා මාණවා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු, එකමන්තං නිසින්නො ඛො වාසෙට්ඨො මාණවො භගවන්තං ගාථාය අජ්ඣභාසි.

1. අනුචඞ්කයන්තානං-මජසං
අනුචඞ්කමමානානං-මු 2

2. අනුවිචරන්තානං-මජසං

# 3 – 9

## වාසෙට්ඨ සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ඉච්ඡානඞ්ගල නම් ගම්හි ඉච්ඡානඞ්ගල වන ලැහැබ්හි වැඩ වසන සේක, එ සමයෙහි බොහෝ අභිඥාත වූ බ්‍රාහ්මණමහාසාරයෝ ඉච්ඡානඞ්ගලයෙහි වාසය කරති. උහු කවරහ යත්: චඞ්කී බ්‍රාහ්මණය, තාරුක්ඛ බ්‍රාහ්මණය පොක්ඛරසාති බ්‍රාහ්මණය, ජානුස්සෝණි බ්‍රාහ්මණය, තොදෙය්‍ය බ්‍රාහ්මණය, අන්‍යවූත් අභිඥාත බ්‍රාහ්මණ මහා සාරයෝය යන මොහු යි. එකල්හි ජඞ්ඝාවිහාර සඳහා ඔබ මොබ අනුචඞ්ක්‍රමණ කරණ අනුවිචරණ කරණ වාසෙට්ඨ, භාරද්වාජ බ්‍රාහ්මණ මාණවකයන් අතර මෙ අතුරු කථාව පහළ විය. "භවත්නි කෙසේ බ්‍රාහ්මණ වේය"යි?

භාරද්වාජ මාණව මෙසේ කීය: යම් කරුණෙකින් මවුපසින් හා පිය පසින් හා දෙපසින් සුජාත වේද, සුපිරිසිදු මවුකුස් ඇතියේ ද, සත් මුතු පරපුර තෙක් (ජාතිගොත්‍ර විසින්) අවඥාත නොවූයේ ද, ජාතිවාදයෙන් අනුපක්‍රෘෂ්ට වූයේ ද මෙ තෙක් කරුණින් බ්‍රාහ්මණ වේය"යි,

වාසෙට්ඨ මාණව මෙසේ කීය: "භවත්නි, යම් කරුණෙකින් සිල් වත් වේ ද, වත්සපන්වේ ද මෙතෙක් කරුණෙන් බ්‍රාහ්මණ වේය"යි. භාරද්වාජමාණව වාසෙට්ඨ මාණවයාට කරුණු ගන්වන්නට නො මැ හැකි විය. වාසෙට්ඨමාණවයාත් භාරද්වාජ මාණව හට කරුණු හැඟැ විය නො හැකි මැ විය.

එකල්හි වාසෙට්ඨ මාණව භාරද්වාජ මාණවයා ඇමැතීය: "භාරද්වාජයෙනි, ශාක්‍යකුලයෙන් පැවිදිවූ මේ ශ්‍රමණ ගෞතම ශාක්‍ය පුත්‍ර ඉච්ඡානඞ්ගල ගම්හි ඉච්ඡානඞ්ගල වනලැහැබ්හි වැඩැ වෙසෙයි. එ භවත් ගෞතමයන්ගේ මෙවන් කලණ කිත් ගොසෙක් උස්ව නැංගේය. එ භගවත් -පෙ- බුද්ධය, භාග්‍යවත්"හයි. භවත් භාරද්වාජයෙනි, යම්හ, ශ්‍රමණ ගෞතමයන් කරා එළැඹෙම්හ. එළැඹ මහණ ගොයුම්හුවෙතින් තෙල කරුණ අසා දනුම්හ, ශ්‍රමණ ගෞතමයෝ යම් ලෙසෙකින් අපට විවරණ කරන්නාහු නම්, එසෙයින් එය අසා ධරම්හ"යි. "භවත්නි, එසේය"යි භාරද්වාජ මාණව වාසෙට්ඨ මාණව හට පිළිවදන් ඇස් විය.

එක්බිති වාසෙට්ඨ;භාරද්වාජ මාණවයෝ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ හා සමග සතුටු වූහ. සතුටු විය යුතු සිහිකටයුතු කථා කොට නිමවා එකත් පස්හි හුන්හ. එකත්පස්හි හුන් වාසෙට්ඨ මාණව භාග්‍යවතුන් වහන්සේට ගාථායෙන් කරුණු සැල කළේයැ:



Free Distribution www.aathaapi.org

597. අනුඤ්ඤාතපටිඤ්ඤාතා තෙවිජ්ජා මයමස්ම භො,
අහං පොක්ඛරසාතිස්ස තාරුක්ඛස්සා'යං මාණවො.

598. තෙවිජ්ජානං යදක්ඛාතං තත්‍ර කෙවලිනො'ස්ම සෙ,
පදකා'ස්ම ව්‍යෙයාකරණා ජප්පෙ ආචරියසාදිසා.

599. තෙසං නො ජාතිවාදස්මිං විවාදෙ අත්ථි ගොතම,
ජාතියා බ්‍රාහ්මණො හොති භාරද්වාජො ඉති භාසති.
අහඤ්ච කම්මනා බ්‍රෑමි එවං ජානාහි චක්ඛුම.

600. තෙ න සක්කොම සඤ්ඤාපෙතුං අඤ්ඤමඤ්ඤං මයං උභො,
භගවන්තං පුට්ඨුමාගම්ම සම්බුද්ධං ඉති විස්සුතං.

601. චන්දං යථා ඛයාතීතං පෙච්ච පඤ්ජලිකා ජනා,
වන්දමානා නමස්සන්ති එවං ලොකස්මිං ගොතමං.

602. චක්ඛුං ලොකෙ සමුප්පන්නං මයං පුච්ඡාම ගොතමං,
ජාතියා බ්‍රාහ්මණො හොති උදාහු භවති කම්මනා;
අජානතං නො පබ්‍රෑහි යථා ජානෙමු බ්‍රාහ්මණං.

603. තෙසං වොහං ව්‍යක්ඛිස්සං (වාසෙට්ඨාති භගවා) අනුපුබ්බං යථාතථං
ජාතිවිභාගං පාණානං අඤ්ඤමඤ්ඤා හි ජාතියො.

604. තිණරුක්ඛෙපි ජානාථ න චාපි පටිජානරෙ,
ලිඞ්ගං ජාතිමයං තෙසං අඤ්ඤමඤ්ඤා හි ජාතියො.

605. තතො කීටෙ පටඞ්ගෙ ච යාව කුන්තකිපිල්ලිකෙ,
ලිඞ්ගං ජාතිමයං තෙසං අඤ්ඤමඤ්ඤා හි ජාතියො.

606. චතුප්පදෙ පි ජානාථ ඛුද්දකෙ ච මහල්ලකෙ,
ලිඞ්ගං ජාතිමයං තෙසං අඤ්ඤමඤ්ඤා හි ජාතියො.



Free Distribution www.aathaapi.org

597. අපි දෙදෙන (ගුරුන් විසිනුදු අප විසිනුදු) අනුඥාත ප්‍රතිඥාත ත්‍රිවිද්‍යා ඇතියම්හ. මම පොක්ඛරසාති ඇදුරුහුගේ දෙටු අතැවැසි යෙමි. මෙ මාණව තාරුක්ඛ ඇදුරුහුගේ දෙටු අතැවැසි වෙයි.

598. ත්‍රිවේදයන් පිළිබඳ යමක් උගන්වන ලද නම්, අපි එහි නිෂ්ඨාගතයම්හ. පදහදරන්නමෝ වියරණ දතුවමෝ (වෙද සඞ්ඛ්‍යාත) ජල්පයෙහි ආචාර්‍ය්‍ය සදෘශයම්හ.

599. ගෞතමයන් වහන්ස, එ අප දෙදෙන අතර ජාතිවාද නිමිත්ත යෙන් විවාදයෙක් ඇත. ඒ ජාතියෙන් බ්‍රාහ්මණ වේ යයි භාරද්වාජ බෙණෙයි, කර්මයෙන් බ්‍රාහ්මණ වෙති මම කියමි, චක්ෂුර්මතුන්වහන්ස, තෙල කරුණ මෙසෙයින් දනගන්නා සේක්වා.

600. එ අපි දෙදෙන උනුන් ගිවිස්වන්නට නො හැකියම්හ. (එහෙයින්) 'සම්බුද්ධහ'යි විශ්‍රැත භාග්‍යවතුන් පුළුවුස්නට පැමිණියම්හ.

601. යම්සේ ජනයෝ (ක්ෂයාතීතවූ) පිරිපුන් සඳ දක බඳුදිලි වෙත්ද; එසෙයින් ලොවිහි ගෞතමයන් ද වෙතැ පැමිණ වඳනාහු නමදිත්.

602. අපි ලොවිහි උපන් නුවණැසවූ ගෞතමයන් පුළුවුසුම්හ: "ජාතිමාත්‍රයෙන් බ්‍රාහ්මණවේ ද? නැතහොත් කර්ම හේතුයෙන් බ්‍රාහ්මණ වේ? ද"යි. යම් පරිද්දෙකින් අපි බ්‍රාහ්මණයා හඳුනමෝ නම්, එ පරිද්දෙන් නොදන්නා අපට දන්වා වදළ මැනැවි.

603. වාසෙට්ඨයෙනි, එ තොපට මම අනුපිළිවෙළින් ජාතිවිභාගය ඇති සැටියෙන් විවරණ කරන්නෙමි. ඒ ඒ ප්‍රාණීන්ගේ ජාතිහු අන්‍ය අන්‍ය (නානාප්‍රකාර වූවාහු) මැ වෙත් යි භාග්‍යවතුන් වහන්සේ වදළහ.

604. (පළමු මැ) තෘණ වෘක්ෂයන් (අනුපාදින්නක වස්තූන්) දනුව. ඔහු (අපි තෘණයම්හ, අපි වෘක්ෂයම්හ'යි) ප්‍රතිඥා නොකෙරෙති. ඔවුන් ගේ ලිඞ්ගය (සංස්ථානය) ජාතිමය වෙයි, (ඔවුන්ගේ) ජාතිහු නානාප්‍රකාර මැ වෙත්.

605. අනතුරුවැ සිනි කිහිඹින් හිම්කොට ඇති කෘමි පලහැටියනු දු දනිවු. ඔවුන්ගේ ලිඞ්ගය ජාතිමය වෙයි, ජාතිහු අන්‍යොන්‍ය මැ වෙති.

606. කුඩු මහත් සිවුපා සතුනුදු දනුව, ඔවුන්ගේ ලිඞ්ගය මැ ජාතිමය වෙයි, ජාතිහු නානාප්‍රකාර වෙත්මැයි.

607. පාදූදරෙ'පි ජානාථ උරගෙ දීඝපිට්ඨිකෙ,
ලිඞ්ගං ජාතිමයං තෙසං අඤ්ඤමඤ්ඤා හි ජාතියො.

608. තතො මච්ඡෙ'පි ජානාථ ඔදකෙ වාරිගොචරෙ,
ලිඞ්ගං ජාතිමයං තෙසං අඤ්ඤමඤ්ඤා හි ජාතියො.

609. තතො පක්ඛීපි ජානාථ පත්තයානෙ විහඞ්ගමෙ,
ලිඞ්ගං ජාතිමයං තෙසං අඤ්ඤමඤ්ඤා හි ජාතියො.

610. යථා එතාසු ජාතීසු ලිඞ්ගං ජාතිමයං පුථු,
එවං නත්ථි මනුස්සෙසු ලිඞ්ගං ජාතිමයං පුථු.

611. න කෙසෙහි න සීසෙන න කණ්ණෙහි න අක්ඛීහි
න මුඛෙන න නාසාය න ඔට්ඨෙහි භමූහි වා.

612. න ගීවාය න අංසෙහි න උදරෙන න පිට්ඨියා,
න සොණියා න උරසා න සම්බාධෙ න මෙථුනෙ.

613. න හත්ථෙහි න පාදෙහි නාඞ්ගුලීහි නඛෙහි වා,
න ජඞ්ඝාහි න ඌරූහි න වණ්ණෙන සරෙන වා.
ලිඞ්ගං ජාතිමයං නෙව යථා අඤ්ඤාසු ජාතිසු.

614. පච්චත්තං ච සරීරෙසු මනුස්සෙස්වෙතං න විජ්ජති,
වොහාරඤ්ච මනුස්සෙසු සමඤ්ඤාය පවුච්චති.

615. යො හි කොචි මනුස්සෙසු ගොරක්ඛං උපජීවති,
එවං වාසෙට්ඨ ජානාහි කස්සකො සො න බ්‍රාහ්මණො.

616. යො හි කොචි මනුස්සෙසු පුථු සිප්පෙන ජීවති,
එවං වාසෙට්ඨ ජානාහි සිප්පිකො සො න බ්‍රාහ්මණො.

617. යො හි කොචි මනුස්සෙසු වොහාරං උපජීවති,
එවං වාසෙට්ඨ ජානාහි වාණිජො සො න බ්‍රාහ්මණො.

607. දික් පිටු ඇති උදරය මැ පාකොට ඇති උරගුන්ද දනුව. ඔවුන්ගේ ලිඩ්ගය ජාතිමය වේ. ජාතිහු නානාප්‍රකාර මැ වෙත්.

608. තවද, දිය මැ වාසභූමි කොට ඇති ජලජ මත්ස්‍යයනුදු දනුව, ඔවුන්ගේ ලිඞ්ගය ජාතිමය වෙයි, ජාතිහු අන්‍යොන්‍ය මැ වෙත්.

609. තවද, පියාපත් යාන කොටගත්, ආකාශචාරී පක්ෂීහු දු දනුව, ඔවුන්ගේ ලිඞ්ගය ජාතිමය වෙයි. ජාතිහු නානාප්‍රකාර වෙත්.

610. යම් සෙයෙකින් තෙල ජාතීන් කෙරෙහි පෘථක් ලිඞ්ගය ජාතිමය වේ ද, එසෙයින් මනුෂ්‍යයන් කෙරෙහි ජාතිමය වූ පෘථග් ලිඞ්ගයෙක් නැති.

611. කෙස් හෙයිනුදු පෘථග් ජාතිමය ලිඞ්ගයෙක් නැත. ශීර්ෂයෙනුදු නැත. කර්ණයෙනුදු නැත. නෙත්‍ර හෙතුයෙනුදු නැත. මුඛයෙනුදු නැත, නාසායෙනුදු නැත, තොලිනුදු නැත, බැමිනුදු නැත.

612. ග්‍රීවායෙනුදු (පෘථක් ජාතිමය ලිඞ්ගයෙක්) නැත. අංසයෙනුදු නැත, උදරයෙනුදු නැත. පෘෂ්ඨයෙනුදු නැත, යොනියෙනුදු නැත, හෘදයෙනුදු නැත, සම්බාධස්ථාන යෙහි දු නැත. මෛථුන යෙහිදු නැත.

613. අතිනුදු නැත, පයිනුදු නැත, ඇඟිලියෙනුදු නැත, නියෙනුදු නැත, ජඞ්ඝායෙනුදු නැත, ඌරුයෙනුදු නැත, පැහැයෙනුදු නැත, ස්වර යෙනුදු නැත, අන්‍ය (පශුපක්ෂී ආදි) ජාතීන්හි සෙයින් (මිනිසුන් කෙරෙහි) ජාතිමය පෘථක් ලිඞ්ගයෙක් නො මැති.

614. මිනිස් සිරුරෙහි (අන්‍ය ජාතීන් කෙරෙහි මෙන්) තෙල (පෘථග් ජාතිමය) ලිඞ්ගයෙක් විද්‍යමාන නොවෙයි, මනුෂ්‍යයන් කෙරෙහි (නානාත්ව විධාන පර්‍ය්‍යාය සඞ්ඛ්‍යාත) වෙනස ව්‍යවහාරමාත්‍රයෙන් කියනු ලැබෙ.

615. මනුෂ්‍යයන් අතුරෙහි යම් මැ කිසිවෙක් ගෝරක්ෂායෙන් (කෘෂිකර්මයෙන්) දිවි වටා නම්, වාසෙට්ඨය, හෙ කෘෂක (ගොවි) හයි මෙසේ දනුව, බ්‍රාහ්මණ නොවේ.

616. මිනිසුන් අතුරෙහි යම් මැ කියිවෙක් නානා ශිල්පයෙන් දිවි වටා ද, වාසෙට්ඨය, හෙ ශිල්පියෙකැ යි මෙසේ දනුව, බ්‍රාහ්මණ නොවේ.

617. මනුෂ්‍යයන් අතුරෙහි යම් මැ කිසිවෙක් ව්‍යවහාරයෙන් (වණික්කර්මයෙන්) දිවි වටා නම්, වාසෙට්ඨයෙනි, හෙ වෙළෙඳෙකැයි මෙසේ දනුව බ්‍රාහ්මණ නොවේ.



Free Distribution www.aathaapi.org

618. යො හි කොචි මනුස්සෙසු පරපෙස්සෙන ජීවති,
එවං වාසෙට්ඨ ජානාහි පෙස්සිකො සො න බ්‍රාහ්මණො.

619. යො හි කොචි මනුස්සෙසු අදින්නං උපජීවති,
එවං වාසෙට්ඨ ජානාහි චොරො එසො න බ්‍රාහ්මණො.

620. යො හි කොචි මනුස්සෙසු ඉස්සත්ථං උපජීවති,
එවං වාසෙට්ඨ ජානාහි යොධාජීවො[1] න බ්‍රාහ්මණො.

621. යො හි කොචි මනුස්සෙසු පොරොහිච්චෙන ජීවති,
එවං වාසෙට්ඨ ජානාහි යාජකො සො න බ්‍රාහ්මණො.

622. යො හි කොචි මනුස්සෙසු ගාමං රට්ඨඤ්ච භුඤ්ජති,
එවං වාසෙට්ඨ ජානාහි රාජා එසො න බ්‍රාහ්මණො.

623. නචා' හං බ්‍රාහ්මණං බ්‍රෑමි යොනිජං මත්තිසම්භවං,
භොවාදි නාම සො හොති සචෙ හොති සකිඤ්චනො.

624. සබ්බසංයොජනං ඡෙත්වා යො වෙ න පරිතස්සති,
සඞ්ගාතිගං විසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

625. ඡෙත්වා නද්ධිං වරත්තඤ්ච සන්දානං සහනුක්කමං,
උක්ඛිත්තපලිඝං බුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

626. අක්කොසං වධබන්ධඤ්ච අදුට්ඨො යො තිතික්ඛති,
ඛන්තීබලං බලානීකං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං

627. අක්කොධනං වතවන්තං සීලවන්තං අනුස්සදං,
දන්තං අන්තිමසාරීරං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

1. සොවාජීවො – සිමු 2



Free Distribution www.aathaapi.org

618. මනුෂ්‍යයන් අතුරෙහි යම් මැ කිසිවෙක් පරහට මෙහෙවරින් දිවිවටා නම්, වාසෙට්ඨය හෙ මෙහෙකරුවෙකැ යි මෙසේ දනුව, බ්‍රාහ්මණ නොවේ.

619. මනුෂ්‍යයන් අතුරෙහි යම් මැ කිසිවෙක් අයිනාදනින් දිවිවටා නම්, වාසෙට්ඨය, හෙ සොරෙකැයි මෙසේ දනුව, බ්‍රාහ්මණ නොවේ.

620. මනුෂ්‍යයන් අතුරෙහි යම්මැ කිසිවෙක් ආයුධ ශිල්පයෙන් දිවි-වටා නම් වාසෙට්ඨය, හේ යොධාජීවයෙකැයි මෙසේ දනුව, බ්‍රාහ්මණ නොවේ.

621. මනුෂ්‍යයන් අතුරෙහි යම්මැ කිසිවෙක් පෙරෙවි කැමින් දිවිවටා නම්, වාසෙට්ඨය, හේ යාජකයෙකැයි මෙසේ දනුව, බ්‍රාහ්මණ නොවේ.

622. මනුෂ්‍යයන් අතුරෙහි යම්මැ කිසිවෙක් ගමත් රටත් විලද කෙරේ නම්, වාසෙට්ඨයෙනි, තෙල බ්‍රාහ්මණ නොව රජෙකැ මෙසෙ-යින් දනුව.

623. මවුකුස උපන්, යොනිජවූ පුඟුලකු බ්‍රාහ්මණ යි මම නො කියමි. හෙ 'භොවාදි' නම් වේ. හෙ එකාන්තයෙන් (රාගාදිකිඤ්චනයෙන් යුක්ත වන හෙයින්) සකිඤ්චන වේ. රාගාදි කිඤ්චන නැති, ආදන රහිත එ රහත් ම බ්‍රාහ්මණ යි මම කියමි.

624. හැම දස සංයොජනයන් සිඳපියා යමෙක් එකැතියෙන් තෘෂ්ණායෙන් නොබා නම්, රාගාදි සඞ්ගයන් ඉක්මැ ගිය, චතුර්විධ යොග-යෙන් නො බැඳුනු එ රහත් බ්‍රාහ්මණ යි මම කියමි.

625. (බද්ධ වෛර සඞ්ඛ්‍යාත) ක්‍රොධය ද (බන්ධන භාව සඞ්ඛ්‍යාත) තෘෂ්ණාවරත්‍රය ද (අනුශය සඞ්ඛ්‍යාත) අනුක්‍රම සහිත දෙසැට මිසදිටු හැකිල්ල ද සිඳපියා උත්ක්ෂිප්ත වූ අවිද්‍යා සඞ්ඛ්‍යාත පලිඝ ඇති සිවුසස්දම් පිළිවිදි හෙයින් බුද්ධ නම් වූ එ රහත් බ්‍රාහ්මණ යී මම කියමි.

626. යමෙක් නො කිපි සිත් ඇත්තේ දශවිධ ආක්‍රෝශය ද (පාණි ආදියෙන්) පෙළුම් ද අන්දුබඤනාදියෙන් බැඳුම් ද ඉවසා නම්, ක්ෂාන්ති බල ඇති ක්ෂාන්ති බලය අනීක (ඇනි) කොට වැටෙන එ රහත් බ්‍රාහ්මණ යි මම කියමි.

627. ක්‍රොධ නොකරණ, ධූතව්‍රත ඇති, චතුපාරිශුද්ධි ශීලයෙන් යුත් තෘෂ්ණොත්සද රහිත වූ, ෂඩින්ද්‍රිය දමනයෙන් දමුනු, (පශ්චිම ස්කන්ධ සඞ්ඛ්‍යාත) අන්තිම ශරීර ධරණ එ රහත් බ්‍රාහ්මණ යි මම කියමි.



Free Distribution www.aathaapi.org

628 වාරි පොක්ඛරපත්තෙව ආරග්ගෙරිව සාසපො,
යො න ලිප්පති[1] කාමෙසු තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

629 යො දුක්ඛස්ස පජානාති ඉධෙ'ව ඛයමත්තනො,
පන්නභාරං විසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

630 ගම්භීරපඤ්ඤං මෙධාවිං මග්ගාමග්ගස්ස කොවිදං,
උත්තමත්ථං අනුප්පත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

631 අසංසට්ඨං ගහට්ඨෙහි අනාගාරෙහි චූභයං,
අනොකසාරිං අප්පිච්ඡං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

632 නිධාය දණ්ඩං භූතෙසු තසෙසු ථාවරෙසු ච,
යො න හන්ති න ඝාතෙති තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

633 අවිරුද්ධං විරුද්ධෙසු අත්තදණ්ඩෙසු නිබ්බුතං,
ආදානෙසු අනාදානං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

634 යස්ස රාගො ච දොසො ච මානො මක්ඛො ච පාතිතො,
සාසපොරිව ආරග්ගා තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

635 අකක්කසං විඤ්ඤාපනිං ගිරං සච්චං උදීරයෙ,
යාය නාභිසජෙ කඤ්චි තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

636 යො'ධ දීඝං ව රස්සං වා අණුං ථූලං සුභාසුභං,
ලොකෙ අදින්නං නාදියති තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

1. ලිම්පති– සිමු 2



Free Distribution www.aathaapi.org

628. පොකුරු පත්හි දිය සෙයිනුදු හිදි අගෙහි අබ ඇට සෙයිනුදු වස්තුකාම ක්ලේශකාමයන්හි යමෙක් නොලැගේ නම්, ඒ රහත් බ්‍රාහ්මණ යි මම කියමි.

629. යමෙක් තමාගේ පඤ්චස්කන්ධය පිළිබඳ ක්ෂය මෙ අත්බව්හි ම දන්නේ ද, බහාලූ ස්කන්ධභාරය ඇති චතුර්යෝගයෙන් හෝ සියලු කෙලෙසුන්ගෙන් වියෝ වූ ඒ රහත් බ්‍රාහ්මණ යි මම කියමි.

630. (පඤ්චස්කන්ධාදියෙහි) ගැඹුර පැණ ඇති, ධම්මොජප ඤාණ-යෙන් ප්‍රඥවත් වූ (මෙ දුගතිමඟය, මෙ සුගතිමඟය, මෙ නිවනට මගයි) මඟ නොමඟෙහි දක්ෂ වූ (අර්හත්‍වසංඛ්‍යාත) උත්තමාර්ථයට පිළිවෙළින් පත් ඒ රහත් බ්‍රාහ්මණ යි මම කියමි.

631. ගිහීන් හා පැවිද්දන් හාත් (දර්ශන ශ්‍රවණ සමුල්ලාප පරිභොග කාය යන) උභයසංසර්ගයෙන් නො හැනුනු (ආලය සඞ්ඛ්‍යාත) පඤ්චකාම-යන්හි නො හැසිරෙනසුලු අලෙපවස වූ ඒ රහත් බ්‍රාහ්මණ යි මම කියමි.

632. යමෙක් ත්‍රස්තවූත් ස්ථාවරවූත් (නොරහත්-රහත්) සත්වයන් කෙරෙහි, දඬු බහා තබා පරපණ නො නසා නම්, නො ද මරවා නම්, ඒ රහත් බ්‍රාහ්මණ යි මම කියමි.

633. (ආඝාත වශයෙන් , තමහට) විරුද්ධ වූ ලෞකික මහජනයා කෙරෙහි (ආඝාතාභාවයෙන්) අවිරුද්ධ වූ, තමහට ප්‍රහාරදනයෙහි නියුතු මහදනා කෙරෙහි (නික්ෂිප්ත වූ දඬු ඇති බැවින්) නිවුනු (පඤ්චස්කන්ධයන් පිළිබඳ මමය, මාගේ යයි) ආදන සහිත පුද්ගලයන් කෙරෙහි (ග්‍රහණ නැති හෙයින්) අනාදන වූ ඒ රහත් බ්‍රාහ්මණ යි මම කියමි.

634. යමකුගේ පඤ්චකාමගුණික රාගය ද ද්වෙෂය ද නව විධ මානය ද පරගුණ මැකුම ද හිදිඅගින් අබැටක්, සෙයින් ගිලිහිනි නම්, ඒ රහත් බ්‍රාහ්මණ යි මම කියමි.

635. යම් වචනයෙකින් නො ලැගේ නම්, එබඳු නො කැකුළ වූ අර්ථ විඥපනයෙන් යුත් කිසියම් සත්‍ය වචන ම කියනෝ නම් ඒ රහත් බ්‍රාහ්මණ යි මම කියමි.

636. යමෙකුන් (ශාටකාදි) දික් වූ හෝ (ආභරණාදි) ලුහු වූ හෝ කුදු වූ හෝ මහත් වූ හෝ ශුභ වූ හෝ අශුභ වූ හෝ මෙලොවැ නුදුන් දය නොගන්නේ නම්, ඒ රහත් බ්‍රාහ්මණ යි මම කියමි.

637 ආසා යස්ස න විජ්ජන්ති අස්මිං ලොකෙ පරම්හි ච,
නිරාසසං විසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

638 යස්සාලයා න විජ්ජන්ති අඤ්ඤාය අකථංකථී,
අමතොගධං අනුප්පත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

639 යොධ පුඤ්ඤං ච පාපඤ්ච උභො සඞ්ගං උපච්චගා,
අසොකං විරජං සුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

640 චන්දං ව විමලං සුද්ධං විප්පසන්නමනාවිලං,
නන්දීභවපරික්ඛීණං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

641 යො ඉමං පලිපථං දුග්ගං සංසාරං මොහමච්චගා,
තිණ්ණො පාරගතො ඣායී අනෙජො අකථංකථී.
අනුපාදය නිබ්බුතො තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

642 යොධ කාමෙ පහන්ත්වාන අනාගාරො පරිබ්බජෙ,
කාමභවපරික්ඛීණං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

643 යොධ තණ්හං පහන්ත්වාන අනාගාරො පරිබ්බජෙ,
තණ්හාභවපරික්ඛීණං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

644 හිත්වා මානුසකං යොගං දිබ්බං යොගං උපච්චගා,
සබ්බයොගවිසංයුත්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

645 හිත්වා රතිඤ්ච අරතිඤ්ච සීතිභූතං නිරූපධිං,
සබ්බලොකාභිභුං වීරං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.



Free Distribution www.aathaapi.org

637. යමකුහට මෙලොවැ හා පරලොවැ හා තෘෂ්ණාවෝ විද්‍යමාන නො වෙත් නම්, එ නිස්තෘෂ්ණ වූ විසංයුක්ත වූ රහත් බ්‍රාහ්මණ යි මම කියමි.

638. යමකුහට (පඤ්චකාම ගුණික තෘෂ්ණා සඞ්ඛ්‍යාත) ආලයයෝ විද්‍යමාන නො වෙත් ද (බුද්ධාදි අෂ්ට වස්තූන්) දැන (අෂ්ටවස්තුක විචිකිත්සා සඞ්ඛ්‍යාත) කථංකථී භාවය නැත්තේ ද, අමෘත වූ නිර්වාණයට අනුක්‍රමයෙන් ප්‍රාප්ත වූ එ රහත් බ්‍රාහ්මණ යි මම කියමි.

639. යමෙක් මෙලොවැ පින් හා පව් හා යන දෙක හා රාගාදි සඞ්ගය හා ඉක්ම ගියේ ද, වර්තමූලක ශෝක රහිත වූ රාගාදි ක්ලේශ රජස් නැති නිරුපක්ලේශ හෙයින් ශුද්ධ වූ ඒ රහත් බ්‍රාහ්මණ යි මම කියමි.

640. මල රහිත හෙයින් විමල වූ චන්ද්‍රයා සෙයින් පරිශුද්ධ වූ වෙසෙසින් පහන් සිත් ඇති, කෙලෙස් විසින් නො කැලැති සිත් ඇති ත්‍රිභවයෙහි ක්ෂය වූ නන්දි සඞ්ඛ්‍යාත තෘෂ්ණා ඇති එ රහත් බ්‍රාහ්මණ යි මම කියමි.

641. යම් මහණෙක් මේ රාග පරිපථය හා ක්ලේශ දුර්ගය හා සංසාර වර්තය හා චතුස්සත්‍යය නො පිළි විදුනා මෝහය හා ඉක්මැ ගියේ ද, චතුරෞඝ තරණය කෙළේ නිර්වාණ පාරයට ගියේ උභයධ්‍යාන කරණ සුලුයේ (තෘෂ්ණා සංඛ්‍යාත) එජා නැතියේ කථංකථී භාව (සැක) නැතියේ උපාදාන විසින් නොගෙණ කෙලෙස් පිරිනිවුමෙන් නිවියේ ද, එ රහත් බ්‍රාහ්මණ යි මම කියමි.

642. මෙලොවැ යමෙක් උභය කාමයන් හැරපියා අගාර නැතියේ නික්මයේ ද, කාම භවය පරික්ෂීණ කළ එ රහත් බ්‍රාහ්මණ යි මම කියමි.

643. මෙලොවැ යමෙක් සදෙර පවත්නා තෘෂ්ණා ප්‍රහීණ කොට අනාගාර වූයේ නික්මයේ නම්, තෘෂ්ණා හා කර්මභවය පරික්ෂීණ කළ එ රහත් බ්‍රාහ්මණ යි මම කියමි.

644. මානුෂක ආයුෂ හා කාම ගුණ ද හැරපියා දිව්‍යායුෂ හා කාම ගුණ හැර පියා ගියේ නම්, හැම චතුර්යොගයෙන් විසංයුක්ත වූ එ රහත් බ්‍රාහ්මණ යි මම කියමි.

645. පඤ්ච කාමගුණ රතිය ද අරණ්‍ය වාසයෙහි උකටලී බවයි කියූ අරතිය ද හැර පියා කෙලෙස් පිරිනිවුමෙන් සිහිල් වූ නිරුපක්ලේශ වූ හැම ස්කන්ධලොකය මැඩ සිටිනා සම්‍යක් ප්‍රධන් වීර්‍ය්‍ය ඇති එ රහත් බ්‍රාහ්මණ යි මම කියමි.

646 චුතිං යො වෙදි සත්තානං උපපත්තිඤ්ච සබ්බසො,
අසත්තං සුගතං බුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

647 යස්ස ගතිං න ජානන්ති දෙවා ගන්ධබ්බමානුසා,
ඛීණාසවං අරහන්තං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

648 යස්ස පුරෙ ච පච්ඡා ච මජ්ඣෙ ච නත්ථි කිඤ්චනං,
අකිඤ්චනං අනාදානං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

649 උසභං පවරං වීරං මහෙසිං විජිතාවිනං,
අනෙජං නහාතකං බුද්ධං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

650 පුබ්බෙ නිවාසං යො වෙදි සග්ගාපායඤ්ච පස්සති,
අථො ජාතික්ඛයං පත්තො තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං.

651 සමඤ්ඤා හෙසා ලොකස්මිං නාමගොත්තං පකප්පිතං[1]
සම්මුච්චා සමුදාගතං තත්ථ තත්ථ පකප්පිතං[2]

652 දීඝරත්තමනුසයිතං දිට්ඨිගතමජානතං,
අජානන්තා නො[3] පබ්‍රුවන්ති ජාතියා හොති බ්‍රාහ්මණො.

653 න ජච්චා බ්‍රාහ්මණො හොති න ජච්චා හොති අබ්‍රාහ්මණො
කම්මනා බ්‍රාහ්මණො හොති කම්මනා හොති අබ්‍රාහ්මණො.

654 කස්සකො කම්මනා හොති සිප්පිකො හොති කම්මනා,
වාණිජො කම්මනා හොති පෙස්සිකො හොති කම්මනා,

655 චොරොපි කම්මනා හොති යොධාජීවොපි කම්මනා,
යාජකො කම්මනා හොති රාජාපි හොති කම්මනා.

---

1. තපස්සිනං-සිමු
2. පකප්පිතං තමහං බ්‍රෑමි බ්‍රාහ්මණං-සිමු
3. තො-සිමු

646. යම් මහණෙක් සත්ත්වයන්ගේ ච්‍යුතිය හා ප්‍රති සන්ධිය සර්ව-ප්‍රකාරයෙන් දන්නේ වේ ද, පඤ්චකාම ගුණෙහි නො ලැගුනු (මනා පිළි-වෙතින් නිවන් වන් හෙයින්) සුගත වූ සිව්සස් දම් පිළිවිදි එ රහත් බ්‍රාහ්මණ යි මම කියමි,

647. දෙව, ගන්ධර්ව මනුෂ්‍යයෝ යම් රහත් මහණක්හුගේ (උත්පත්ති) ගතියක් නො දන්නාහු නම් එ ක්ෂීණාශ්‍රව රහත්හු මම බ්‍රාහ්මණ යි කියමි.

648. යම් මහණකු හට අතීත පඤ්චස්කන්ධ කෙරෙහිදු අනාගත පඤ්චස්කන්ධ කෙරෙහිදු වාර්තමාන පඤ්චස්කන්ධ සඞ්ඛ්‍යාත මධයෙහිදු තෘෂ්ණාග්‍රාහ සඞ්ඛ්‍යාත කිඤ්චන නැද්ද, රාගාදි කිඤ්චන නැති ආදාන රහිත එ රහත් මහණ බ්‍රාහ්මණ යි මම කියමි.

619. (නැති නො ගන්නා හෙයින්) වැහැප් වූ උත්තම වූ වීර වූ (මහත් වූ ශීලස්කන්ධාදිය සෙවී හෙයින්) මහර්ෂි වූ තුන් මරුන් දිනූ තෘෂ්ණා සඞ්ඛ්‍යාත එජා රහිත වූ දෙවි කෙලෙස් ඇති හෙයින් නාහාතක වූ බුද්ධ වූ ඒ රහත් බ්‍රාහ්මණ යි මම කියමි.

650. යම් මහණෙක් පූර්වේ නිවාසය දන්නේ ද, (කාම රූප අරූප යන සවිසි දෙව්ලෝ නම් වූ) සවර්ගය හා සිවුඅපා හා දක්නේ ද, වැලිත් ජාතික්ෂය සඞ්ඛ්‍යාත අර්හත්වයට පැමිණියේත් වේ ද, ඒ රහත් බ්‍රාහ්මණ යි මම කියමි.

651. ලොවැ (ක්ෂත්‍රිය, බ්‍රාහ්මණාදි විසිනුදු භාරද්වාජ, වාසෙට්ඨ ආදි විසිනුදු) යම් නාමගොත්‍රයෙක් ප්‍රකල්පිත වේ නම්, තෙල ප්‍රඥප්ති-ව්‍යවහාරමාත්‍රයෙක් මැයි. ඒ ඒ කාලයෙහි ඔහට ප්‍රකල්පිත වූ එ නම් ගොත්වහර සමමුතියෙන් පැමිණියේ ය.

652. තෙල නාම ගොත්‍රය (ප්‍රඥප්තිමාත්‍රයෙකැයි) නො දන්නවුන්ගේ දීර්ඝරාත්‍රයෙහි අනුශයිත වූ දෘෂ්ටිගතයෙකි. (ජාති හෙයින් බ්‍රාහ්මණ නො-වේ යයි) නො දන්නා වූ ඔහු (ජාතියෙන් බ්‍රාහ්මණ වේ යයි) කියන්නාහ.

653. ජාති හේතුයෙන් බ්‍රාහ්මණ නො වේ. ජාති හේතුයෙන් අබ්‍රාහ්මණ ද නො වේ. කර්ම හේතුයෙන් බ්‍රාහ්මණ වෙයි. කර්ම හේතුයෙන් අබ්‍රාහ්මණ වේ.

654. කර්මයෙන් ගොවි වෙයි. කර්මයෙන් ශිල්පි වෙයි. කර්මයෙන් වෙළෙණ ද වෙයි. කර්මයෙන් මෙහෙකරු වේ.

655. කර්මයෙන් සොර ද වෙයි. කර්මයෙන් යොධාජීව ද වෙයි. කර්මයෙන් යාජක ද වෙයි. කර්මයෙන් රජ ද වෙයි.



Free Distribution www.aathaapi.org

656 එවමෙතං යථාභූතං කම්මං පස්සන්ති පණ්ඩිතා,
පටිච්ච සමුප්පාදදසා[1] කම්මවිපාකකොවිද.

657 කම්මනා වත්තති ලොකො කම්මනා වත්තති පජා,
කම්මනිබන්ධනා සත්තා රථස්සාණීව යායතො.

658 තපෙන බ්‍රහ්මචරියෙන සංයමෙන දමෙන ච,
එතෙන බ්‍රාහ්මණො හොති එතං බ්‍රාහ්මණමුත්තමං.

659 තීහි විජ්ජාහි සම්පන්නො සන්තො ඛීණපුනබ්භවො,
එවං වාසෙට්ඨ ජානාහි බ්‍රහ්මා සක්කො විජානතන්ති.

එවං වුත්තෙ වාසෙට්ඨභාරද්වාජා මාණවා භගවන්තං එතදවොචුං; අභික්කන්තං භො ගොතම –පෙ– එතෙ මයං භවන්තං ගොතමං සරණං ගච්ඡාම ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච, උපාසකෙ නො භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං[2] සරණං ගතෙති.

වාසෙට්ඨසුත්තං නිට්ඨිතං.

## 3–10

## කොකාලික සුත්තං

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ අථ ඛො කොකාලිකො භික්ඛු යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො කොකාලිකො[3] භික්ඛු භගවන්තං එතදවොච:

පාපිච්ඡා භන්තෙ සාරිපුත්තමොග්ගල්ලානා පාපිකානං ඉච්ඡානං වසං ගතාති. එවං වුත්තෙ භගවා කොකාලිකං භික්ඛුං එතදවොච:

1. පටිච්චසමුප්පාද දස්සා–මජසං.
2. පාණුපෙතෙ–මජසං.
3. කොකාලියො–මු.



Free Distribution www.aathaapi.org

656. ප්‍රතීත්‍ය සමුත්පාදය දක්නා වූ කර්ම විපාක දෙක්හි දක්ෂ වූ පණ්ඩිතයෝ මෙසෙයින් මෙල කර්මය යථා භූතයෙන් දක්නාහ.

657. කර්මයෙන් ලෝකය පවතී. කර්මයෙන් ප්‍රජාව පවතී. සත්ත්වයෝ යන්නා වූ රථයාගේ අකුර මෙන් කර්මය නිබන්ධන කොට ඇත්තාහුය.

658. ඉන්ද්‍රිය සංවරයෙන් ද ශ්‍රේෂ්ඨචර්‍ය්‍යාවෙන් ද ශීලයෙන් ද ප්‍රඥයෙන් ද යන මෙල කර්මයෙන් බ්‍රාහ්මණ වෙයි. මේ උතුම් බ්‍රාහ්මණ භාවය යි.

659. ත්‍රිවිද්‍යායෙන් යුක්ත වූ ශාන්ත වූ ක්ෂය කළ පුනර්භව ඇති බ්‍රාහ්මණ පණ්ඩිතයන් විසින් බ්‍රහ්ම යයි ද ශක්‍ර යයි ද කියන ලදැයි වාසෙට්ඨ ය, මෙසේ දනුව.

මෙසේ වදළ කල්හි වාසෙට්ඨ, භාරද්වාජ යන මාණවයෝ භාග්‍ය-වතුන් වහන්සේට මෙ කරුණ සැල කළහ: භවත් ගෞතමයන් වහන්ස, ඉතා කාන්තය, ..... මෙල අපි භවත් ගෞතමයන් හා ධර්මය හා භික්ෂු සඞ්ඝයා හා සරණ කොට යම්හ. භවත් ගෞතමයන් වහන්සේ අදින් මත්තෙහි අප දිවිහිම් කොට සරණ ගිය උපාසකයන් කොට ධරණ සේක්වා යි.

වාසෙට්ඨ සූත්‍රය නිමි.

## 3 – 10

## කෝකාලික සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අසළ අනේපිඩු සිටුහුගේ ජේතවන නම් ආරාමයෙහි වැඩ වසන සේක. එ කල්හි කෝකාලික මහණ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළැඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්හි හින. එකත්පස්හි හුන් කොකාලික මහණ භාග්‍යවතුන් වහන්සේට මෙල පවත් සැළ කෙළේ ය.

"වහන්ස, සැරියුත් මුගලන්හු ලාමක ඉච්ඡා ඇත්තාහු ලාමක ඉච්ඡාවන්ගේ වශයට ගියහ" යි. මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ කෝකාලික මහණ හට මෙල වදළහ.

මාහෙවං කොකාලික මාහෙවං කොකාලික, පසාදෙහි කොකාලික සාරිපුත්තමොග්ගල්ලානෙසු චිත්තං, පෙසලා සාරිපුත්තමොග්ගල්ලානාති-

දුතියම්පි ඛො කොකාලිකො භික්ඛු භගවන්තං එතදවොච: කිඤ්චාපි මෙ භන්තෙ භගවා සද්ධායිකො පච්චයිකො, අථ ඛො පාපිච්ඡාව සාරිපුත්ත මොග්ගල්ලානා පාපිකානං ඉච්ඡානං වසං ගතාති

දුතියම්පි ඛො භගවා කොකාලිකං භික්ඛුං එතදවොච: මාහෙවං කොකාලික මාහෙවං කොකාලික පසාදෙහි කොකාලික සාරිපුත්ත මොග්ගල්ලානෙසු චිත්තං, පෙසලා සාරිපුත්ත මොග්ගල්ලානාති.

තතියම්පි ඛො කොකාලිකො භික්ඛු භගවන්තං එතදවොච: කිඤ්චාපි මෙ භන්තෙ භගවා සද්ධායිකො පච්චයිකො, අථ ඛො පාපිච්ඡාව සාරිපුත්තමොග්ගල්ලානා පාපිකානං ඉච්ඡානං වසංගතාති.

තතියම්පි ඛො භගවා කොකාලිකං භික්ඛුං එතදවොච: මාහෙවං කොකාලික මා හෙවං කොකාලික. පසාදෙහි කොකාලික සාරිපුත්ත මොග්ගල්ලානෙසු චිත්තං, පෙසලා සාරිපුත්තමොග්ගල්ලානාති.

අථ ඛො කොකාලිකො භික්ඛු උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අචිරපක්කන්තස්ස ච කොකාලිකස්ස භික්ඛුනො සාසපමත්තීහි පිළකාහි සබ්බො කායො ඵුටො[1] අහොසි. සාසපමත්තියො හුත්වා මුග්ගමත්තියො අහෙසුං. මුග්ගමත්තියො හුත්වා කළායමත්තියො අහෙසුං. කළායමත්තියො හුත්වා කොලට්ඨි මත්තියො අහෙසුං. කොලට්ඨිමත්තියො හුත්වා කොල මත්තියො අහෙසුං. කොල මත්තියො හුත්වා ආමලකමත්තියො අහෙසුං. ආමලකමත්තියො හුත්වා බෙලුවසලාටුකමත්තියො අහෙසුං බෙලුවසලාටුකමත්තියො හුත්වා බිල්ලමත්තියො අහෙසුං. බිල්ලමත්තියො හුත්වා පභිජ්ජිංසු, පුබ්බඤ්ච ලොහිතඤ්ච පග්ඝරිංසු.

1. ඵුටො-සී.මු.



Free Distribution www.aathaapi.org

"කොකාලිකය, නහමක් එසේ කියව, කොකාලිකය, නහමක් එසේ කියව, කෝකාලිකය, සැරියුත්මුගලනුන් කෙරෙහි සිත් පහදුව" "ශාරිපුත්‍ර මෞද්ගල්‍යායනයෝ ප්‍රියශීලයහ" යි.

දෙවන වටත් කෝකාලික මහණ භාග්‍යවතුන් වහන්සේට තෙල බස් කීය: "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට ශ්‍රද්ධාවහ නමුදු ප්‍රත්‍යයකර නමුදු ශාරිපුත්‍ර මෞද්ගල්‍යායනයෝ පාපේච්ඡ ම වූවාහු ලාමක ඉච්ඡාවන්ගේ වශයට ගියාහු ම වෙතැ" යි.

දෙවනවටත් භාග්‍යවතුන් වහන්සේ කෝකාලික මහණහට තෙල කරුණ වදාළ සේක. "කෝකාලිකය, නහමක් එසේ කියව, කොකාලිකය, නහමක් එසේ කියව, කොකාලිකය, "ශාරිපුත්‍ර මෞද්ගල්‍යායනයෝ ප්‍රියශීලයහ" යි සැරියුත් මුගලනුන් කෙරෙහි සිත් පහන් කරව" යි.

තෙවනවටත් කෝකාලික මහණ භාග්‍යවතුන් වහන්සේට තෙල කීය: වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට ශ්‍රද්ධය, විශ්වාසාර්හවන සේක් නමුදු සැරියුත්මුගලන්හු පාපේච්ඡ ම වූවාහු ලාමක ඉච්ඡාවන්ගේ වශයට ගියහු මැ"යි.

තෙවනවටත් භාග්‍යවතුන් වහන්සේ කෝකාලික මහණහට තෙල වදාළහ: "කෝකාලිකය, නහමක් එසේ කියව, කොකාලිකය, නහමක් එසේ කියව, කෝකාලිකය, "ශාරිපුත්‍ර මෞද්ගල්‍යායනයෝ ප්‍රියශීලයහ" සැරියුත්මුගලනුන් කෙරෙහි සිත පහදව"යි.

ඉක්බිති කොකාලික මහණ හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට නික්ම ගියේ ය. කොකාලික මහණ නික්ම ගිය නොබෝ කල් වත්ම හැම කය හබැට සා පොළින් මැඩැසිටියේ විය. හබැට සා වැ මුං ඇට සා විය. මුඟුඇට සා වැ කඩලැට සා විය. කඩලැට සා වැ ඩෙබර ඇට සා විය. ඩෙබර ඇට සා වැ ඩෙබර පල සා විය. ඩෙබරපල සා වැ ඇඹුල්පල සා විය. ඇඹුල පල සා වැ බෙලි සලාටු (ගැට) සා විය. බෙලිසලාටු සා වැ බෙලිපල සා විය. බෙලිපල සා වැ බිඳිනි. පූයා හා ලෙහෙ වගුළේ ය.

අථ ඛො කොකාලිකො භික්ඛු තෙනෙව ආබාධෙන කාලමකාසි, කාලකතො ච ඛො කොකාලිකො භික්ඛු පදුම නිරයං උපපජ්ජි[1] සාරිපුත්ත මොග්ගල්ලානෙසු චිත්තං ආඝාතෙත්වා.

අථ ඛො බ්‍රහ්මා සහම්පති අභික්කන්තාය රත්තියා අභික්කන්ත වණ්ණො කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො බ්‍රහ්මා සහම්පති භගවන්තං එතදවොච: කොකාලිකො භන්තෙ භික්ඛු කාලකතො. කාලකතො ච භන්තෙ කොකාලිකො භික්ඛු පදුමනිරයං උපපන්නො සාරිපුත්ත මොග්ගල්ලානෙසු චිත්තං ආඝාතෙත්වාති. ඉදමවොච බ්‍රහ්මා සහම්පති, ඉදං වත්වා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායි.

අථ ඛො භගවා තස්සා රත්තියා අච්චයෙන භික්ඛූ ආමන්තෙසි: ඉදං භික්ඛවෙ රත්තිං බ්‍රහ්මා සහම්පති අභික්කන්තාය රත්තියා -පෙ- ඉදමවොච භික්ඛවෙ බ්‍රහ්මා සහම්පති. ඉදං වත්වා මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායීති.

එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොච: කීවදීඝං නු ඛො භන්තෙ පදුමෙ නිරයෙ ආයුප්පමාණන්ති,

දීඝං ඛො භික්ඛු පදුමෙ නිරයෙ ආයුප්පමාණං, තං න සුකරං සඞ්ඛාතුං එත්තකානි වස්සානි ඉති වා එත්තකානි වස්සසතානි ඉති වා එත්තකානි වස්සසහස්සානි ඉති වා එත්තකානි වස්සසතසහස්සානි ඉතිවාති.

සක්කා පන භන්තෙ උපමං කාතුන්ති.

සක්කා භික්ඛූති භගවා අවොච: සෙය්‍යථාපි භික්ඛු වීසති ඛාරිකො කොසලකො තිලවාහො තතො පුරිසො වස්සසතස්ස වස්සසහස්සස්ස අච්චයෙන එකමෙකං තිලං උද්ධරෙය්‍ය ඛිප්පතරං ඛො සො භික්ඛු වීසති ඛාරිකො කොසලකො තිලවාහො ඉමිනා උපක්කමෙන පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය, නත්වෙව එකො අබ්බුදො නිරයො. සෙය්‍යථාපි භික්ඛු වීසති අබ්බුද නිරයා එවමෙකො නිරබ්බුදො නිරයො, සෙය්‍යථාපි භික්ඛු වීසති නිරබ්බුද නිරයා එවමෙකො අබබො නිරයො, සෙය්‍යථාපි භික්ඛු වීසති අබබා නිරයා එවමෙකො අහහො නිරයො,

1. උපපජ්ජි-සි.මු



Free Distribution www.aathaapi.org

එ කල්හි කෝකාලික මහණ ඒ ආබාධයෙන් මැ කළුරිය කෙළේ ය. කළුරිය කළ කොකාලික මහණ ශාරිපුත්‍ර මෞද්ගල්‍යායනයන් කෙරෙහි සිත් සටා පදුම නිරයට උත්පත්ති විසින් පැමිණියේ ය.

එක්බිති සහම්පති බ්‍රහ්ම විසිතුරු පැහැ ඇතියේ මනහර මැදියම් රෑ හි මුළු ජේතවනය බබුලුවා භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පස්හි සිටියේ ය. එකත්පස්හි සිටි සහම්පති බ්‍රහ්ම භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ පැවැසී ය: "වහන්ස, කොකාලික මහණ සැරියුත්මුගලනුන් කෙරෙහි සිත් සටා කලුරිය කෙළේ ය. වහන්ස, කලුරිය කළ කොකාලික මහණ පදුම නිරයෙහි උපනැ"යි සහම්පති බ්‍රහ්ම මෙය කීය. මෙය කියා භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට එහි මැ නොපැණී ගියේ ය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එ රෑ ඇවෑමෙන් භික්ෂූන් ඇමැතූ සේක: මහණෙනි, මෙ රෑ සහම්පති බ්‍රහ්ම මැදියම් රෑ හි .... මහණෙනි, සහම්පති බ්‍රහ්ම මෙය කීය. මෙය කියා මා වැඳ පැදකුණු කොට එහි මැ නො පැණී ගියේය" යි.

මෙසේ වදළ කල්හි අන්‍යතර මහණෙක් භාග්‍යවතුන් වහන්සේට තෙල පවත් සැල කෙළේ ය. "වහන්ස, පදුම නිරයෙහි ආයුෂප්‍රමාණය කොතෙක් දිග දැ?" යි

"මහණ, පදුම නිරයෙහි ආයුෂප්‍රමාණය දීර්ඝය, මෙතෙක් හවුරුදු ය යි හෝ මෙතෙක් සිය හවුරුදු ය යි හෝ මෙතෙක් දහස් හවුරුදු ය යි හෝ මෙතෙක් සූවහස් හවුරුදු ය යි හෝ සඞ්ඛ්‍යා කරණට සුකර නො වේ ය"යි.

"වහන්ස, උපමාවක් කළ හැකි දැ? යි,"

'මහණ, හැකියැ'යි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක. මහණ කොසොල් රට වහරට පත් විසි කිරියකින් යුත් තල ගැළක් යම් පරිදි වේ නම්, පුරුෂයෙක් වර්ෂ ශතයක්හුගේ හෝ වර්ෂ සහස්‍රයක්හුගේ ඇවෑමෙන් එයින් එක් එක් තලැටක් නහාලා නම්, මහණ, එ විසි-කිරියක් ගන්නා කොශලක තල ගැල මෙ උපක්‍රමයෙන් වහා මැ පරික්ෂයයට සිස්වීමට යේ. එක් මැ අබ්බුද නිරය අවසනට නො යේ මැයි. මහණ, අබ්බුද නිරය විස්සෙක් යම් පරිදි වේ නම්, එක් නිරබ්බුද නිරයෙක් එ පරිදි මැ වේ. මහණ නිරබ්බුද නිරය විස්සෙක් යම් පරිදි වේ නම් එක් අබබ නිරයෙක් එ පරිදි ම වේ. මහණ, අබබ නිරය විස්සෙක් යම් පරිදි වේ නම්, එක් අහහ නිරයෙක් එ පරිදි මැ වේ.



Free Distribution www.aathaapi.org

සෙය්‍යථාපි භික්ඛු වීසති අහහා නිරයා එවමෙකො අටටො නිරයො, සෙය්‍යථාපි භික්ඛු වීසති අටටා නිරයා එවමෙකො කුමුදො නිරයො, සෙය්‍යථාපි භික්ඛු වීසති කුමුද නිරයා එවමෙකො සොගන්ධිකො නිරයො, සෙය්‍යථාපි භික්ඛු වීසති සොගන්ධිකා නිරයා එවමෙකො උප්පලකො නිරයො, සෙය්‍යථාපි භික්ඛු වීසති උප්පලකා නිරයා එවමෙකො පුණ්ඩරීකො නිරයො, සෙය්‍යථාපි භික්ඛු වීසති පුණ්ඩරීකා නිරයා එවමෙකො පදුමො නිරයො. පදුමං ඛො පන භික්ඛු නිරයං කොකාලිකො භික්ඛු උපපන්නො සාරිපුත්තමොග්ගල්ලානෙසු චිත්තං ආඝාතෙත්වාති. ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

660 පුරිසස්ස හි ජාතස්ස කුඨාරී ජායතෙ මුඛෙ,
යාය ඡින්දති අත්තානං බාලො දුබ්භාසිතං භණං.

661 යො නින්දියං පසංසති තං වා නින්දති යො පසංසියො,
විචිනාති මුඛෙන සො කලිං කලිනා තෙන සුඛං න වින්දති.

662 අප්පමත්තො අයං කලි යො අක්ඛෙසු ධන පරාජයො,
සබ්බස්සාපි සහාපි අත්තනා අයමෙව මහන්තතරො කලි,
යො සුගතෙසු මනං පදොසයෙ.

663 සතං සහස්සානං නිරබ්බුදානං
ඡත්තිංසති පඤ්ච ච අබ්බුදානි,
යමරියගරහී නිරයං උපෙති
වාචං මනඤ්ච පණිධාය පාපකං.

664 අභූතවාදී නිරයං උපෙති
යො වාපි කත්වා න කරොමීති චාහ,
උභොපි තෙ පෙච්ච සමා භවන්ති
නිහීනකම්මා මනුජා පරත්ථ.

665 යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති
සුද්ධස්ස පොසස්ස අනඞ්ගණස්ස,
තමෙව බාලං පච්චෙති පාපං
සුඛුමො රජො පටිවාතංව ඛිත්තො.



Free Distribution www.aathaapi.org

මහණ අහහ නිරය විස්සෙක් යම් පරිදි වේ නම්, එක් අටට නිරයෙක් එ පරිදි මැ වේ. මහණ, අටට නිරය විස්සෙක් යම් පරිදි වේ නම්, එක් කුමුද නිරයෙක් එ පරිදි මැ වේ. මහණ, කුමුද නිරය විස්සෙක් යම් පරිදි වේ නම්, එක් සොගන්ධික නිරයෙක් එ පරිදි මැ වේ. මහණ, සොගන්ධික නිරය විස්සෙක් යම් පරිදි වේ නම්, එක් උප්පලක නිරයෙක් එ පරිදි වේ. මහණ උප්පලක නිරය විස්සෙක් යම් පරිදි වේ නම්, එක් පුණ්ඩරීක නිරයෙක් එ පරිදි වේ. මහණ, පුණ්ඩරීක නිරය විස්සෙක් යම් පරිදි වේ නම්, එක් පදුම නිරයෙක් එ පරිදි මැ වේ. මහණ, කොකාලික මහණ සැරියුත්මුගලනුන් කෙරේ සිත් සටා පදුම නිරයෙහි උපන්නේ යි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. ශාස්තෘ වූ සුගතයන් වහන්සේ මෙය වදරා අනතුරු තෙල වදාළ සේක:

660. යම් පරොස් බසෙකින් තමා සිඳුනේ ද, එසේ උපන් දුර්භාෂිත කියන බාල වූ, පුරුෂයාගේ මුවෙහි කෙටෙරියක් බඳු පරොස් බස් උපදනේ ය.

661. යමෙක් නිගා කළ යුතු පුද්ගලයා පසසා ද, යමෙක් පැසසිය යුතු යමෙක් වේ නම් ඔහුට නිගා කෙරේ ද, හෙතෙම මුවින් අපරාධ (පව්) රැස් කෙරෙයි. ඒ අපරාධයෙන් හේ සුව නො විඳියි.

662. දූ කෙළියෙහි ලා යම් ධන පරාජයෙක් වේ නම් මෙ පරාජය අල්පමාත්‍ර එකෙකි. යමෙක් සම්‍යග්ගත පුද්ගලයන් කෙරෙහි සිත ප්‍රදූෂිත කෙරේ ද, මෙය ම මහත්තර පරාජයය වේ.

663. යම් කලෙක ලාමක වූ වචනය හා සිත ද පිහිටුවා ආර්‍යයන් ගරහනුයේ නිරයට වැදේ ද, (එහි ආයුඃ ප්‍රමාණය) නිරර්බුද සිය දහස් සතිසෙකි. අර්බුද පසෙකි.

664. යමෙක් ආර්‍යොපවාද වශයෙන් අභූත (මුසවා) කියන්නේ ද යමෙකුත් පව්කම් කොට "නො කෙළෙමැ" යි කියා ද, හෙ ද පදුමාදි නිරයට උප්පත්ති වශයෙන් පැමිණේ. නිහීන කම් ඇති එ පුහුල්හු දෙදෙන ම මෙයින් සැව ගොස් පරලොවැ දී (නිරයොපපත්තියෙන්) සම වෙත්.

665. යමෙක් අප්‍රදුෂ්ට වූ අවිදුමල නැති හෙයින් ශුද්ධ වූ ලාමක ඉච්ඡාවචර නැති හෙයින් අනඞ්ගණ වූ මිනිස් පුරුෂයකුහට ද්‍රොහ කෙරේ නම්, උඩු සුළඟට හෙලූ සියුම් රජස් සෙයින් පාපය එ බාලයා කරා පෙරළා එයි.

666 යො ලොභගුණෙ අනුයුත්තො
සො වචසා පරිභාසති අඤ්ඤෙ,
අස්සද්ධො කදරියො අවදඤ්ඤූ
මච්ඡරී පෙසුනියස්මිං අනුයුත්තො.

667 මුඛදුග්ගවිභූත අනරිය
භූනහු පාපක දුක්කතකාරි,
පුරිසන්ත කලි අවජාත
මා බහුභාණිධ නෙරයිකොසි.

668 රජමාකිරසි අහිතාය
සන්තෙ ගරහසි කිබ්බිසකාරි,
බහූනි ච දුච්චරිතානි චරිත්වා
ගච්ඡසි[1] ඛො පපතං චිරරත්තං.

669 නහි නස්සති කස්සචි කම්මං
එති හ තං ලභතෙ ව සුවාමි,
දුක්ඛං මන්දො පරලොකෙ
අත්තනි පස්සති කිබ්බිසකාරී.

670 අයොසඞ්කුසමාහතට්ඨානං
තිණ්හධාරං අයසූලමුපෙති,
අථ තත්තඅයොගුළසන්නිභං
භොජනමත්ථි තථා පතිරූපං.

671 න හි වග්ගු වදන්ති වදන්තා
නාභිජවන්ති න තාණමුපෙන්ති,
අඞ්ගාරෙ සන්ථතෙ සෙන්ති[2]
අග්ගිනිසමං ජලිතං පවිසන්ති.

672 ජාලෙන ච ඔනහියානා
තත්ථ හනන්ති අයොමයකූටෙහි,
අන්ධංව තිමිසමායන්ති
තං විතතං හි යථා මහිකායො.

1. ගච්ඡසි-මජසං
2. සයන්ති-මජසං



Free Distribution www.aathaapi.org

666. යමෙක් ලොභ ගුණ (තෘෂ්ණා) යෙහි අනුයුක්ත ද, හේ ශ්‍රද්ධා නැතියේ තද මසුරු ඇතියේ, බුදු වදන් පවා නො දන්නේ, පඤ්චවිධ මාත්සර්‍ය්‍යයෙන් යුක්ත වූයේ පෙහෙසුන්හි නියැලියේ වචනයෙන් මෙරමාහට පරිභව කෙරෙයි.

667. විෂම මුඛ ඇත්තව, අලිකවාදිය, අනාර්‍ය්‍යය, වෘද්ධිනාශකය, පවිට, දුෂ්කෘතකාරිය, නිච පුරුෂය, නිඃශ්‍රීක පුරුෂය, (බුද්ධ පුත්‍ර නොවන හෙයින්) අවජාතය, මෙ අත්බවෙහි නහමක් බහුභාණිවව, නහමක් නිරයෙහි උපදනේ වෙහි.

668. පාපකාරිය, අහිත සඳහා තමා කෙරෙහි කෙලෙස් දූහුලි වගුරුවහි, ශාන්ත පුද්ගලයන් හට ගර්හා කෙරෙහි, බොහෝ දුසිරිත් කොට ප්‍රපාත සංඛ්‍යාත නිරාවළට යෙහි චිරරාත්‍රයෙහි එහි දුක් විඳුනෙහි.

669. කිසිවකුගේ කුශලාකුශලකර්මය විපාක නොදී නො මැ නස්නේ ය, කම්පල ඔහු කරා මැ එයි. කර්මයට හිමි වූයේ එ කර්ම-විපාක ලබාම ය. පාපකාරී බාල තෙමේ පරලොවහි දී තමා කෙරෙහි ලා දුක දක්නේය.

670. (හේ) යහුල් පිහිටුවන ලද තියුණු මුවත ඇති යහුල් ඇති නිරයට එළැඹෙයි. යළි එ කර්මානුරූප වූ ම රත් වූ යගුලි බඳු භොජන ද ඇත.

671. (ගණිවූ, පහරිවූ යනාදි) බස් බණන්නාහු මියුරු බස් නො කියත් මැ යි. (නිරාපල්ලෝ) සුමුඛව පෙරට නො දිවෙති. රැකවරණට ද නො පැමිණෙති. අතුළ ගිනි අඟුරෙහි වැදහෙති. හාත්පසින් දිලෙන ගින්නට ද වදිති.

672. ලොහොදලින්නුදු වෙළන්නාහු එහි යමුවා කුළුයෙන් පෙළති. අඳ වූ ම ඔහු තිමිස නම් රොරුව නිරයට පැමිණෙති. එ අන්ධකාරය මහිකා (මීහිදුම්) සෙයින් වතළේ මැ යැ.

673 අථ ලොහමයං පන කුම්භිං
අග්ගිනිසමං ජලිතං පවිසන්ති,
පච්චන්ති හි තාසු චිරරත්තං
අග්ගිනිසමාසු සමුප්පිලවාසො.

674 අථ පුබ්බලොහිතමිස්සෙ
තත්ථ කිං පච්චති කිබ්බිසකාරි,
යං යං දිසතං අධිසෙති
තත්ථ කිලිස්සති සම්ඵුසමානො.

675 පුළවාවසථෙ සලිලස්මිං
තත්ථ කිං පච්චති කිබ්බිසකාරි,
ගන්තුං න හි තීරමපත්ථි
සබ්බසමාහි සමන්තකපල්ලා.

676 අසිපත්තවනං පන තිණ්හං
තං පවිසන්ති සමච්ඡිදගත්තා,
ජිව්හං බළිසෙන ගහෙත්වා
ආරජයා රජයා විහනන්ති.

677 අථ වෙතරණිං පන දුග්ගං
තිණ්හධාර ඛුරධාර මුපෙන්ති,
තත්ථ මන්දා පපතන්ති
පාපකරා පාපානි කරිත්වා.

678 ඛාදන්ති හි තත්ථ රුදන්තෙ
සාමා සබලා කාකොලගණා ච,
සොණා සිගාලා පටිගිජ්ඣා
කුලලා වායසා ච විතුදන්ති.

679 කිච්ඡා වතායං ඉධ වුත්ති
යං ජනො පස්සති කිබ්බිසකාරි,
තස්මා ඉධ ජීවිතසෙසෙ
කිච්චකරො සියා නරො න පමජ්ජෙ.



Free Distribution www.aathaapi.org

673. ඉක්බිති ගිනි සෙයින් දිලෙන ලෝකුඹු නිරයට වදනාහ. ගිනිසම වූ එ ලෝකුඹු නිරැහි ඉල්පෙන්නාහු චිරරාත්‍රයෙහි පැසෙත් මැ යි.

674. ඉක්බිති පව්කම් කරණුයේ පූයායෙන් හා ලෙයින් මුසු එනිරයෙහි කිසෙයින් පැසේය යත්: යම මැ දිශායෙක්හි ඉයේ නම්, එහි එ ලෙහෙපූයායෙන් පහස්නා ලදුයේ පෙළෙන්නේ ය.

675. පණුවනට නිවෙස් වූ ඒ නියෙ දියෙහි (ලෝ දියෙහි) පාපකාරී කිසෙයින් පැසෙයි යත්: නික්ම යනුවට කොටෙකුදු නො මැත. හැම දික්හි හාත්පසැ යකබල ම යැ.

676. ඉක්බිති තියුණු අසිපත්‍ර වනය වෙයි. මොනොවට සිඳින ලද ගාත්‍ර ඇති නිරියත්තු එයට වදනාහ. (යමපල්ලෝ) දිව බිලියෙන් ගෙණ හැදැ හැදැ පෙළති.

677. ඉක්බිති තියුණු ක්ෂුර ධාරා ඇති වෙතරණි නම් දුර්ගයට වදිති. පාපකාරී අඥබාලයෝ පව් කොට එහි වැටෙති.

678. එහි සමවන් වූත් කබරවන් වූත් වනකවුඩෝ ද, බලු කැණ-හිල්ලු ද, මහගිජුලිහිණියෝ ද, උකුස්සෝ ද, කවුඩෝ ද, හඬනවුන් කා-දමති. තුඩින්දු බිඳිති.

679. මෙ නිරැහි පාපකාරි ජනයා යම දිවිපෙවෙතක් දක්නේ ද, එ දිවිවැටුම එකැතියෙන් දුක් මැ වෙයි, එ හෙයින් මිනිස් තෙමෙ මෙලො වැ ජීවිත ශේෂයෙහිලා කෘත්‍යකරී වන්නේ ය. නො ද පමා වන්නේ යැ.

680 තෙ ගණිතා විදූහි තිලවාහා
යෙ පදුමෙ නිරයෙ උපනීතා,
නහුතානි හි කොටියො පඤ්ච භවන්ති
ද්වාදස කොටි සතානි පුනඤ්ඤා.

681 යාව දුක්ඛා නිරයා ඉධ වුත්තා
තත්ථාපි තාව චිරං වසිතබ්බං,
තස්මා සුචි පෙසල සාධු ගුණෙසු
වාචං මනං සතතං පරිරක්ඛෙති.

කොකාලිකසුත්තං නිට්ඨිතං.

## 3 – 11

## නාලක සුත්තං

682 ආනන්දජාතෙ තිදසගණෙ පතීතෙ
සක්කංච ඉන්දං සුචිවසනෙ ච දෙවෙ,
දුස්සං ගහෙත්වා අතිරිව ථොමයන්තෙ
අසිතො ඉසි අද්දස දිවාවිහාරෙ.

683 දිස්වාන දෙවෙ මුදිතමනෙ උදග්ගෙ
චිත්තිං කරිත්වා ඉදමවොචාසි තත්ථ,
කිං දෙවසඞ්ඝො අතිරිව කල්‍යරූපො
දුස්සං ගහෙත්වා හමයථ කිං පටිච්ච.

684 යදපි ආසි අසුරෙහි සඞ්ගාමො
ජයො සුරානං අසුරා පරාජිතා,
තදපි නෙතාදිසො ලොමහංසනො
කිං අබ්භුතං දට්ඨු මරූ පමොදිතා.

685 සෙලෙන්ති ගායන්ති ච වාදයන්ති ච
භුජානි පොඨෙන්ති ච නච්චයන්ති ච,
පුච්ඡාමි වොහං මෙරුමුද්ධවාසිනෙ
ධුනාථ මෙ සංසයං ඛිප්පමාරිසා.



Free Distribution www.aathaapi.org

680. යම් පාපකාරීහු පදුම නිරයෙහි උපන්හු නම්, ඔවුන්ගේ ආයුෂ්ප්‍රමාණ ප්‍රාඥයන් විසින් තල ගැල් බිරින් ගණන ලද: පස්කෙළනුහුවක් හා අනෙකුදු දෙළොස්කෙළ සියෙක් වේ.

681. ඉමහත් දුක් ඇති නිරයෝ කියන ලදහු නම්, එහි එතෙක් බොහෝ කල් විසිය යුතු වෙයි. එහෙයින් පිවිතුරු පෙශල සාධු ගුණ ඇතියන් කෙරෙහි හැම කල්හි වචනය හා සිත හා මොනොවට රක්නේ යි.

**කෝකාලික සූත්‍රය නිමි.**

## 8 – 11

## නාලක සූත්‍රය

682. අසිත සෘෂි හටගත් සමෘද්ධි ඇති හෙවත් උපන් ප්‍රමෝද ඇති (එහෙයින් මැ) සොම්නස් සහගිය නොකිලිටි දිවසළු හැඳි තිදස්පුරවැසි දේවගණයා සක්දෙවිඳුහට ද සත්කාර කොට දිවසළු ගෙණ සිසාරා අධිමාත්‍ර කොට ස්තුතිකරනුවන් දිවා විහාරයෙහි දී දිටී ය.

683. එහි දී සෘෂි, ප්‍රමුදිත වූ සිත් ඇති ඔදවැඩිගිය දෙවියන් දක ආදර කොට මෙය කී ය: "දෙවිගණා අතිශයින් තුටු සැහැවි ඇතියේ කුමක් පිණිස දිවසළු සිසාරාගෙණ කුමට බමවු ද?" යි.

684. යම් කාලයෙක්හි අසුරයන් හා සමග සඞ්ග්‍රාමයෙක් වී නම්, සුරනට ජය වී නම්, අසුරයෝ පරාජිත වූහු නම් එකල්හි දු මෙබඳු රොමොද්ගමයෙක් නො වී ය. කවර නම් අද්භූතයක් දක දෙවියෝ ප්‍රමුදිත වූහුද ? යි.

685. සීරුැසන් නහන්ද? ගී ගයත් ද? පසඟතුරු වයත් ද? අත් පොළත් ද? නටත් දැයි? මම මේරුමස්තකවාසී තොප (දෙවියන්) පුළුවුස්මි. නිදුක්වරිනි, වහා මාගේ සංශය දුරලවු යි.

686 සො බොධිසත්තො රතනවරො අතුල්‍යො
මනුස්සලොකෙ හිතසුඛතාය[1] ජාතො,
සක්‍යාන ගාමෙ ජනපදෙ ලුම්බිනෙය්‍යෙ
තෙනම්හ තුට්ඨා අතිරිව කල්‍යරූපා.

687 සො සබ්බසත්තුත්තමො අග්ගපුග්ගලො
නරාසභො සබ්බපජානමුත්තමො,
වත්තෙස්සති චක්කං ඉසිව්හයෙ වනෙ
නදං ව සීහො බලවා මිගාභිභූ.

688 තං සද්දං සුත්වා තුරිතමවංසරී සො
සුද්ධොදනස්ස තද භවනං උපාගමි,
නිසජ්ජ තත්ථ ඉදමවොචාසි සක්‍යෙ
කුහිං කුමාරො අහමපි දට්ඨුකාමො.

689 තතො කුමාරං ජලිතමිව සුවණ්ණං
උක්කාමුඛෙ'ව සුකුසලසම්පහට්ඨං,
දද්දල්ලමානං සිරියා අනොමවණ්ණං
දස්සෙසු පුත්තං අසිතව්හයස්ස සක්‍යා.

690 දිස්වා කුමාරං සිඛිමිව පජ්ජලන්තං
තාරාසභං ව නභසිගමං විසුද්ධං,
සුරියං තපන්තං සරදරිවබ්භමුත්තං
ආනන්දජාතො විපුලමලත්ථ පීතිං.

691 අනෙකසාඛඤ්ච සහස්සමණ්ඩලං
ඡත්තං මරූ ධාරයුමන්තලික්ඛෙ,
සුවණ්ණදණ්ඩා වීතිපතන්ති චාමරා
න දිස්සරෙ චාමරඡත්තගාහකා.

692 දිස්වා ජටී කණ්හසිරිව්හයො ඉසි
සුවණ්ණනෙක්ඛං විය පණ්ඩුකම්බලෙ,
සෙතඤ්ච ඡත්තං ධරියන්තමුද්ධනි
උදග්ගචිත්තො සුමනො පටිග්ගහෙ.

---

1. සුඛත්ථාය-මජසං



Free Distribution www.aathaapi.org

686. (සම්‍යක් සම්බොධිසමධිගමයට හිසි) උත්තම රත්න වූ (තමහට තුල්‍යයකු නැතියෙන් අතුල්‍යවූ ඒ බොධිසත්ව තෙමේ දෙවිමිනිස්නට හිතසුව පිණිස මිනිස් ලොවැ ශාක්‍යයන්ගේ ජනපදයෙහි වූ **ලුම්බිනී** නම් ගම්හි උපන. එහෙයින් අතිශයින් කල්‍යරූප වූවමෝ තුටු වම්හ.

687. සර්වසත්වොත්තම ඒ අග්‍ර පුද්ගල නරශ්‍රෙෂ්ඨ වූයේ හැම සත්නට උතුම් වූයේ සිවුපාවුන් අභිභවා සිටුනා බලවත් සිහරදකු අභීතනාද කරණු සෙයින් ඉසිපතන නම් මෘගදවයෙහි ධර්මචක්‍රය පවත්වන්නේ ය.

688. එකල්හි ඒ දේවවාක්‍යය අසා එ (අසිත) තෙම ත්වරිතව (දෙවපුරයෙන්) බටුයේ ය. සුදෙවුන් රජුගේ භවනයට එළැඹියේ ය. එහි නිෂණ්ණ වූයේ "කුමර කොහි යැ? මම් ද දක්නා කැමැතියෙමි"යි යන මෙ බස් ශාක්‍යයනට කී.

689. ඉක්බිති දක්ෂ වූ රන්කරුවකු විසින් කෝවා මුවෙහි ලා මොනොවට සටා තවනලද වූ ම දිලියෙන රණක් වන් ශෝභායෙන් බබලන නො ලමු රූසපුයෙන් යුත් පුත්කුමරු ශාක්‍යයෝ අසිත නම් තවුස්හට දක්වූහ.

690. දිලෙන ගින්නක් බඳු වූ ද අහස්හි සරන පිරිසුදු තාරාපති බඳු වූ ද සරාකල්හි අභ්‍රමුක්ත වූ දිලියෙන හිරු බඳු වූ ද කුමරු දැක උපන් සතුටු ඇතියේ විපුල ප්‍රීතිය ලැබී.

691. අහස්වැසි දෙවියෝ අනෙක සලාක ඇති දහස් මඩුලු ඇති සත් දැරූහ. රන්යටි ඇති සෙමරවල්විදුනා සැලෙයි. සෙමර හා සත්ගතුවෝ නොපැණෙත්.

692. දළමඩුලු යුත් අසිත නම් සෘෂි පඬුඇඹුලෙක්හි තැබූ රන් නිකක් බඳු කුමරු ද මුදුනෙහි දැරූ සේ සත් ද දැක ඔදවැඩි සිතැති වැ සොම්නස් ඇති වැ පිළිගති.



Free Distribution www.aathaapi.org

693 පටිග්ගහෙත්වා පන සක්‍යපුඞ්ගවං
ජිගිංසකො[1] ලක්ඛණමන්තපාරගූ,
පසන්නචිත්තො ගිරමබ්භුදීරයි
අනුත්තරායං දිපදනමුත්තමො.

694 අථත්තනො ගමනමනුස්සරන්තො
අකල්‍යරූපො ගලයති අස්සුකානි,
දිස්වාන සක්‍යා ඉසිමවොචුං රුදන්තං
නො චෙ කුමාරෙ භවිස්සති අන්තරායො.

695 දිස්වාන සක්‍යෙ ඉසිමවොච අකල්‍යෙ
නාහං කුමාරෙ අහිතමනුස්සරාමි,
න චාපි මස්ස භවිස්සති අන්තරායො
න ඔරකොයං අධිමානසා භවාථ.

696 සම්බොධියග්ගං ඵුසිස්සතායං කුමාරො
සො ධම්මචක්කං පරමවිසුද්ධදස්සී,
වත්තෙස්සතායං බහුජනහිතානුකම්පී
විත්ථාරිකස්ස භවිස්සති බ්‍රහ්මචරියං.

697 මමඤ්ච ආයු න චිරමිධාවසෙසො
අථන්තරා මෙ භවිස්සති කාලකිරියා,
සොහං න සොස්සං[1] අසමධුරස්ස ධම්මං
තෙනම්හි අට්ටො ව්‍යසනගතො අඝාවී.

698 සො සාකියානං විපුලං ජනෙත්වා පීතිං
අන්තෙපුරම්හා නිරගමා බ්‍රහ්මචාරී,
සො භාගිනෙය්‍යං සයමනුකම්පමානො
සමාදපෙසි අසමධුරස්ස ධම්මෙ.

699 බුද්ධොති ඝොසං යදපරතො සුණාසි
සම්බොධිපත්තො විවරති ධම්මමග්ගං,
ගන්ත්වාන තත්ථ සමයං පරිපුච්ඡියානො
චරස්සු තස්මිං භගවති බ්‍රහ්මචරියං.

---

1. ජිගීසකො—මජසං
2. සුණං - සිමු. 1

693. ලක්ෂණ ශාස්ත්‍රයෙහිත් වේදමන්ත්‍රයන්හිත් කෙළ පැමිණි ඒ තවුස් ශාක්‍ය ශ්‍රේෂ්ඨයා පිළිගෙන පිරික්සනුයේ පහන්සිත් ඇතියේ "ද්විපදෙත්තම මේ කුමර අනුත්තරය" යන බස් පාළ කෙළේය.

694. එක්බිති තමාගේ අරුතලගමන් සමරමින් නොසතුටු සිත් ඇත්තේ කඳුළු හෙලයි. ශාක්‍යයෝ වලප්නා තවුස් දැක "කුමරු කෙරෙහි අනතුරෙක් නොවේදෝ හො"යි කීහ.

695. නොසතුටු සැහැවි ඇති ශාක්‍යයන් දැක "මම කුමර කෙරෙහි අහිතයක් නො සම්රමි, මොහුට අනතුරෙකුදු නො වෙයි. මෙකුමර ලාමකයෙක් නො වෙයි. (තෙපි) තුටුසිතැති වව"යි තවුස් පැවැසීය.

696. මෙ කුමර (සර්වඥතාඥනසඞ්ඛ්‍යාත) අනුත්තර සම්බොධියට පැමිණෙයි. පරම විශුද්ධ නිර්වාණය දක්නාසුලු මෙතෙම බහුජන හිතානුකම්පා ඇතියේ ධම්සක් පවත්වන්නේ ය. මොහුගේ ශාසනය පතළ වන්නේ යි.

697. මාගේ ආයුෂත් මෙ මිනිස් ලොවිහි දිගුකල් අවශෙෂ නො වේ. මෙ අතුරෙහි මාගේ කාලක්‍රියා වන්නේය. එවන් මම අසම වීර්යය ඇති බුදුන්ගේ දහම් නො අසන්නෙමි. එකරුණින් ආතුරයෙම් සුඛනාශයට පැමිණියෙම් දුක් ඇතියෙමි.

698. ඒ බ්‍රහ්මචාරි ශාක්‍යයනට විපුල ප්‍රීති දනවා ඇතොවුරින් නික්මැ ගියේය. හෙතෙම අනුකම්පා කෙරෙමින් බෑනා අසම් වීර්යධුර ඇති සම්බුදුන්ගේ සස්නෙහි සමාදන් කරවිය.

699. යම් මැ කලෙක්හි මෙරමා වෙතින් සම්බුදුහු සම්බොධිප්‍රාප්ත වූවාහු අග්‍ර වූ නිර්වාණය හෝ නිර්වාණ මාර්ගය විවරණ කරති යන ඝොෂය අසවු නම් එහි ගොස් ධර්මසමය පුළුවුස්මින් ඒ භාග්‍යවතුන් හමුයෙහි බඹසර (මහණදම්) කරව.

700 තෙනානුසිට්ඨො හිතමනෙන තාදිනා
අනාගතෙ පරමවිසුද්ධදස්සිනා,
සො නාළකො උපචිතපුඤ්ඤසඤ්චයො
ජිනං පතික්ඛං පරිවසි රක්ඛිතින්ද්‍රියො.

701 සුත්වාන ඝොසං ජිනවරචක්කවත්තනෙ
ගන්ත්වාන දිස්වා ඉසිනිසභං පසන්නො,
මොනෙය්‍යසෙට්ඨං මුනිපවරං අපුච්ඡි
සමාගතෙ අසිතව්හයස්ස සාසනෙති.

## වත්ථුගාථා.

702 අඤ්ඤාතමෙතං වචනං අසිතස්ස යථාතථං
තං තං ගොතම පුච්ඡාම සබ්බධම්මානපාරගුං.

703 අනගාරියුපෙතස්ස භික්ඛාචරියං ජිගිංසතො,[1]
මුනි පබ්‍රෑහි මෙ පුට්ඨො මොනෙය්‍යං උත්තමං පදං.

704 මොනෙය්‍යං තෙ උපඤ්ඤිස්සං (ඉති භගවා)
දුක්කරං දුරභිසම්භවං,
හන්ද තෙ නං පවක්ඛාමි සන්ථම්භස්සු දළ්හො භව.

705 සමානභාගං[2] කුබ්බෙථ ගාමෙ අක්කුට්ඨවන්දිතං,
මනොපදොසං රක්ඛෙය්‍ය සන්තො අනුන්නතො චරෙ.

706 උච්චාවචා නිච්ඡරන්ති දායෙ අග්ගිසිඛූපමා,
නාරියො මුනිං පලොභෙන්ති තා සු තං මා පලොභයුං.

707 විරතො මෙථුනා ධම්මා හිත්වා කාමෙ පරොවරෙ.
අවිරුද්ධො අසාරත්තො පාණෙසු තසථාවරෙ.

1. ජිගීසතො – මජසං.
2. භාවං – සිමු. 1.



Free Distribution www.aathaapi.org

700. හිත කැමැති සිත් ඇති සමාධිගතචිත්ත ඇති අනාගතයෙහි (නාලක) පරම විශුද්ධ වූ නිර්වාණය සාක්ෂාත් කරන්නේ යයි දක්නාසුළු ඒ අසිත තවුස් විසින් අනුසස්නාලද (පියුමතුරා බුදුන්කලැ පටන්) රැස් කළ පින්රැස් ඇති ඒ නාලක ජින වූ සර්වඥයන් වහන්සේ ප්‍රතීක්ෂා කෙරෙමින් රක්නාලද ඉඳුරන් ඇතියේ වාස කෙළේ ය. (තවුස්දම් රැකීය.)

701. ඒ නාලක තාපස ජිනවරයන්ගේ ධර්මචක්‍රප්‍රවර්තනයෙහි දී දෙවතා නාදය අසා (ඉසිපතන්) ගොස් සෑම්ගිෂභ වූ භාග්‍යවතුන් දැක පහන්වූයේ අසිත නම් තවුස්හුගේ අනුශාසනයට කල් එළැඹෙත් ම ප්‍රවරමුනිහු වෙතින් ශ්‍රෙෂ්ඨඥනය (මාර්ගඥනය) පිළිවිසීය යි.

වත්ථුගාථා යි.

702. ගෞතමයන්වහන්ස, අසිත තවුස්හුගේ අවිපරීත වූ (සම්බොධිමග්ගං වුසිස්සතාය කුමාරො යන) තෙල වචනය මා විසින් දන්නා ලදී. එහෙයින් මැ (ෂඩංකාරයෙන්) සර්වධර්මයන්ගේ කොටිප්‍රාප්ත වූ මුබ වහන්සේ පුළුස්මි.

703. (ප්‍රව්‍රජ්‍යාසඞ්ඛ්‍යාත) අනගාරියට පත්, භික්ෂාචර්යය සොයන මට පුළුවුස්නාලද මුනිහු උත්තම වූ මොනෙයප්‍රතිපද් පවසත්වා.

704. "තොපට දුෂ්කර වූත් දුරධිගමවූත් මෞනෙයප්‍රතිපද් පනවන්නෙමි. එකාන්තයෙන් එය තොපට පවසන්නෙමි. වීර්යොපස්තම්භයෙන් සිත් පිහිටුව, අශිථිල පරාක්‍රමයෙන් දෘඪ (සථිර) වව"යි භාග්‍යවතුන් වහන්සේ වදළහ.

705. ගම්හිදී ආක්‍රොශය හා වන්‍දනාව හා යන දෙක සමාන භාග ඇති කරව. (සමව සලකව) (ආක්‍රොශ ලදුයෙහි) චිත්තප්‍රදොෂය රක්ව. (රජුන් විසිනුදු වදනා ලදුයෙහි) මානයෙන් උන්නත නොවැ ශාන්ත වැ හැසිරෙව.

706. අරණ්‍යෙහි දු ගිනිසිළු බඳු කුදුමහත් (නානාප්‍රකාර වූ) ආලම්බනයෝ ඉඳුරනට හමුවෙත්. ස්ත්‍රීහු ද පැවිද්දහු පොලොබවති. ඔහු තා නහමක් පොලොබවත්වා.

707. මෙවුන්දම්න් වැළැකියේ සුන්‍දරාසුන්‍දර කාමයන් හැරපියා ස තෘෂ්ණ වූ හා නිෂ්තෘෂ්ණ වූ හා ප්‍රාණීන් කෙරෙහි (පරපාක්ෂික හෙයින්) විරුඬ නොවූයේ (ස්වපාක්ෂික හෙයින්) නො ඇලුනේ වෙයි,

708 යථා අහං තථා එතෙ යථා එතෙ තථා අහං,
අත්තානං උපමං කත්වා න හනෙය්‍ය න ඝාතයෙ.

709 හිත්වා ඉච්ඡඤ්ච ලොභඤ්ච යත්ථ සත්තො පුථුජ්ජනො,
චක්ඛුමා පටිපජ්ජෙය්‍ය තරෙය්‍ය නරකං ඉමං.

710 ඌනූදරො මිතාහාරො අප්පිච්ඡස්ස අලොලුපො,
සදා ඉච්ඡාය නිච්ඡාතො අනිච්ඡො හොති නිබ්බුතො.

711 සපිණ්ඩචාරං චරිත්වා වනන්තමභිහාරයෙ,
උපට්ඨිතො රුක්ඛමූලස්මිං ආසනූපගතො මුනි.

712 ස ඣානපසුතො ධීරො වනන්තෙ රමිතො සියා,
ඣායෙථ රුක්ඛමූලස්මිං අත්තානමභිතොසයං.

713 තතො රත්‍යා විවසනෙ ගාමන්තමභිහාරයෙ,
අව්හානං නාභිනන්දෙය්‍ය අභිහාරඤ්ච ගාමතො.

714 න මුනී ගාමමාගම්ම කුලෙසු සහසා චරෙ,
ඝාසෙසනං ඡින්නකථො න වාචං පයුතං භණෙ.

715 අලත්ථං යදිදං සාධු නාලත්ථං කුසලං ඉති,
උභයෙනෙව සො තාදි රුක්ඛංව උපනිවත්තති.

716 ස පත්තපාණී විචරන්තො අමූගො මූගසම්මතො,
අප්පං දානං න හීළෙය්‍ය දාතාරං නාවජානිය.



Free Distribution                                        www.aathaapi.org

708. මම් යම්බඳු (සුවකැමැති) යෙම් නම්, මොහුදු එබඳු (සුවකැමැති) වෙත් මොහු යම්බඳු (දුක් නොකැමැති) වෙත් නම්, මම ද එබඳු (දුක් නො කැමැති) වෙමි. මෙසේ තමා උවම් කොට ගෙණ පරපණ නො නසන්නේ ය, නොද නස්වන්නේ ය.

709. යම් සිවුපසෙක්හි පෘථග්ජන (ඉච්ඡා ලොභ විසින්) ආසක්ත වූයේ නම්, එ ඉච්ඡා හා ලෝභය හා හැරපියා ඥනචක්ෂුස් ඇති වැ (මොනෙය්‍යවත) පිළිපදනේ ය. (දුෂ්පූරාර්ථයෙන්) මේ ප්‍රත්‍යය තෘෂ්ණා නරකය තරණය කරන්නේ ය..

710. (සතර පස් පිඩුවකට ඉඩ දී පැන් බොනුයෙන්) ඌනෝදර වූයේ මැ, (භොජනයෙහි මාත්‍රඥතායෙන්) මිතාහාර වන්නේ ය. (චතුර්විධ අල්පෙච්ඡතායෙන්) අල්පෙච්ඡ වූයේ මැ රහත් මගින් තෘෂ්ණාලොලුප්‍යය දුරු කිරීමෙන් ලොලුප නො වන්නේ ය. හෙ එකාන්තයෙන් සාදුක් නැති-යේ ඉච්ඡාරහිත වූයේ (කෙලෙස් සන්හුන් හෙයින්) නිවියේ වෙයි.

711. වනවැසි එ මහණ පිණ්ඩචාරය කොට නිමවා වනයට යන්නේ ය. මුනි තෙම රුක්මුල්හි එළැඹ සිටියේ ආසනොපගත වන්නේ ය.

712. උභයධ්‍යානයන්හි අනුයුක්ත වූ එ ධීර අරනෙහි අභිරත වන්නේ ය. චිත්තය මොනොවට තුටු කරවමින් රුක්මුල්හි ලොකොත්-තර ධ්‍යාන කරන්නේ ය.

713. පිණ්ඩචාරයෙන් නික්ම වනයාත්‍රායෙන් මත්තෙහි රෑ අවසන්හි ග්‍රාමාන්තය කරා (පිඩුසඳහා) යන්නේ ය. එහි දී නිමන්ත්‍රණ නො ඉවසන්-නේ ය. ගමින් වෙතැ එළැවූ පිණ්ඩපාත ද නො ඉවසන්නේ ය.

714. මුනිතෙම ගමට වැද කුලයෙහි (සහශොකිතාදි විසින්) සැහැසි ව ආහාරාන්වෙෂණ නො කරන්නේ ය. සුන්බස් ඇතියේ පිඩුවා පිළිබැදී ඔභාසාදියෙන් ප්‍රයුක්ත වූ වචන නො බණන්නේ ය.

715. යම් මැ පිණ්ඩයක් ලදිම් නම්, මෙය මැ මනා යැ, යම් මැ භික්ෂාවක් නොලදිම් නම්, එ ද මනා යැ යි හේ ලාභ අලාභ දෙකින් මැ නිර්-විකාර වෙයි. එලාන්වෙෂී පුද්ගලයකු රුක හැරපියා මැදහත් ව යතු මෙනි.

716. හේ පාත්‍ර ගත් අත් ඇති වැ නොගොළු වූයේ මැ ගොළුවෙකැයි සම්මත වැ හැසිරෙන්නේ දනය සුළු ය යි හෙළා නො දක්නේ ය. දන් දෙන්නහුට ද අවමන් නො කරන්නේ ය.



Free Distribution www.aathaapi.org

717 උච්චාවචා හි පටිපදා සමණෙන පකාසිතා,
න පාරං දිගුණං යන්ති න ඉදං එකගුණං මුතං.

718 යස්ස ච විසතා නත්ථි ඡින්නසොතස්ස භික්ඛුනො,
කිච්චාකිච්චප්පහීනස්ස පරිළාහො න විජ්ජති.

719 මොනෙය්‍යං තෙ උපඤ්ඤිස්සං (ඉති භගවා)
ඛුරධාරූපමො භවෙ,
ජිව්හාය තාලුං ආහච්ච උදරෙ සඤ්ඤතො සියා.

720 අලීනචිත්තො ච සියා න චාපි බහු චින්තයෙ,
නිරාමගන්ධො අසිතො බ්‍රහ්මචරියපරායනො.

721 එකාසනස්ස සික්ඛෙථ සමණූපාසනස්ස ච,
එකත්තං මොනමක්ඛාතං එකො වෙ අභිරමිස්සති.

722 අථ භාසිහි දසදිසා
සුත්වා ධීරානං නිග්ඝොසං ඣායීනං කාමචාගිනං,
තතො හිරිඤ්ච සද්ධඤ්ච භිය්‍යො කුබ්බෙථ මාමකො.

723 තං නදීහි විජානාථ සොබ්භෙසු පදරෙසු ච,
සණන්තා යන්ති කුසොබ්භා තුණ්හී යාති මහොදධි.

724 යදූනකං තං සණති යං පූරං සන්තමෙව තං,
අඩ්ඪකුම්භූපමො බාලො රහදො පූරොව පණ්ඩිතො.

725 යං සමණො බහු භාසති උපෙතං අත්ථසංහිතං,
ජානං සො ධම්මං දෙසෙති ජානං සො බහු භාසති.

726 යො ච ජානං යමං යුත්තො ජානං න බහු භාසති,
ස මුනි මොනමරහති ස මුනි මොනමජ්ඣගාති.

නාලකසුත්තං නිට්ඨිතං.



Free Distribution www.aathaapi.org

717. උත්තම වූත් නිහීන වූත් පිළිවෙත බුද්ධශ්‍රමණයන් වහන්සේ විසින් වදරණ ලදී. (යොගිහු) එ ප්‍රතිපදායෙන් දෙවරක් (නිර්වාණ සඞ්ඛ්‍යාත) පාරයට නොයෙත්. එ නිර්වාණපාරය එක් මැ මඟින් පහස්නට නිසි ය යි ද නො දන්නා ලදී.

718. සුන්කෙලෙස් හෝ ඇති යම් මැ මහණකුහට අටෝරාසියක් වූ තෘෂ්ණා නැද්ද, (කුශලාකුශල සඞ්ඛ්‍යාත) කෘත්‍යාකෘත්‍යයන් ප්‍රහීණ කළ ඔහට රාගයෙන් උපන් චේවයි ද්වේෂයෙන් උපන් චේවයි පරිදහ නැත.

719. තොපට මෞනෙයව්‍රතය පණවන්නෙමි කරමුවහත උවම් කොට ඇතියේ වන්නේ ය. දිව්තලු සටා (රසතෘෂ්ණා) දුරු කොට උදරයෙහි සංයත වන්නේ ය.

720. තිරතුරු නොලස් සිත් ඇතියේ ද වන්නේ ය. ඥාති ජනපද, අමරවිතර්කවශයෙන් බොහොවක් ද නො සිතන්නේ ය. නික්ලේශී වූයේත් තෘෂ්ණාදෘෂ්ටියෙන් එක ද භවයක් ඇසුරු නො කෙළේ ශික්ෂාත්‍රය සඞ්ගෘහීත සකලබ්‍රහ්මචර්යය පරායණ කොට ඇතියේ ද වන්නේ ය.

721. ඉදින් මහණ එකලා වූයේ ම සිත් අලවා වෙසෙන්නේ නම්, මහණුන් විසින් උපාසනා කටයුතු විවික්තාසන සඞ්ඛ්‍යාත ඉරියව්වට හා අටතිස්කමටහන් අරමුණට හා හික්මෙන්නේය. කාය චිත්ත විවේක සඞ්ඛ්‍යාත ඒකත්වය මෞන යයි කියනලදී,

722. ඉදින් දසදිගුන් කීර්තියෙන් හොබවවූ නම් වස්තුකාම ක්ලේශකාමයන් හැරපියනසුලු උභයධ්‍යානයන් ලත් ධීරයන්ගේ කීර්ති ඝොෂය අසා අනතුරුව ශ්‍රී හා ශ්‍රද්ධා බෙහෙවින් වඩනුයේ මාගේ ශ්‍රාවක වන්නේ ය.

723. එය නදීන්ගෙනුදු ජලමාතෘකාහි ද දියකඩුරුහි ද ලා දනුව. ක්ෂුද්‍ර ජලමාතෘකාවෝ හඬනංවමින් ගලායෙත්. මහානදීහු නිහඬ වැ ගලාබස්නාහ.

724. යමක් ඌන ද එ හඬයි. යමක් පූර්ණ ද එ ශාන්ත මැ වෙයි. බාල අර්ධකුම්භොපම වෙයි. පණ්ඩිත පුද්ගල පිරිපුන් දියවිලක් බඳු වෙයි.

725. බුද්ධශ්‍රමණ අර්ථයෙන් යුක්ත වූත් ධර්මයෙන් යුක්ත වූත් අර්ථසංහිත වූත් යම් මැ ධර්මයක් බොහෝ කොට දෙසා නම්, හෙ දන්නේ ම එ ධර්මය දෙසයි. හෙ දන්මින් මැ බොහෝ කොට දෙසයි.

726. යමෙක් සංයත සිත් ඇත්තේ ම දන්නේත් වේ ද, දන්නේත් බොහෝ ධර්මය නො දෙසා ද, එ මුනි (මොනෙය්‍යපටිපද සඞ්ඛ්‍යාත) මෞනයට නිසි වෙයි. එ මුනි (අර්හත්මාර්ගඥාන සඞ්ඛ්‍යාත) මොනයට පැමිණියේ ය යි.

නාලක සූත්‍රය නිමි.

## 3 – 12

# ද්වයතානුපස්සනා සුත්තං

එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති පුබ්බාරාමෙ මිගාරමාතු පාසාදෙ, තෙන ඛො පන සමයෙන භගවා තදහුපොසථෙ පන්නරසෙ පුණ්ණාය පුණ්ණමාය රත්තියා භික්ඛුසඞ්ඝපරිවුතො අබ්භොකාසෙ නිසින්නො හොති. අථ ඛො භගවා තුණ්හීභූතං තුණ්හීභූතං භික්ඛුසඞ්ඝං අනුවිලොකෙත්වා භික්ඛූ ආමන්තෙසි.

යෙ තෙ භික්ඛවෙ, කුසලා ධම්මා අරියා නිය්‍යානිකා සම්බොධ ගාමිනො, තෙසං වො භික්ඛවෙ, කුසලානං ධම්මානං අරියානං නිය්‍යානිකානං සම්බොධ-ගාමීනං කා උපනිසා සවණායාති. ඉති චෙ භික්ඛවෙ, පුච්ඡිතාරො අස්සු තෙ එවමස්සු වචනීයා: යාවදෙව ද්වයතානං ධම්මානං යථාභූතං ඤාණායාති,

කිඤ්ච ද්වයතං වදෙථ:

ඉදං දුක්ඛං, අයං දුක්ඛසමුදයො'ති අයමෙකානුපස්සනා, අයං දුක්ඛ-නිරොධො, අයං දුක්ඛනිරොධගාමිනීපටිපද'ති අයං දුතියානුපස්සනා. එවං සම්මා ද්වයතානුපස්සිනො ඛො භික්ඛවෙ, භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතාති. ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

727 යෙ දුක්ඛං නප්පජානන්ති අථො දුක්ඛස්ස සම්භවං
යත්ථ ච සබ්බසො දුක්ඛං අසෙසං උපරුජ්ඣති,
තඤ්ච මග්ගං න ජානන්ති දුක්ඛූපසමගාමිනං.



Free Distribution www.aathaapi.org

# 3 – 12

## ද්වයතානුපස්සනා සූත්‍රය

මා විසින් මෙසේ අසනලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර **පූර්වාරාම** නම් **මිගාරමාතුපාසාදයෙහි** වැඩවසනසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සඳපිරුණු පුණුරසී පොහෝලත් එදවස රාත්‍රියෙහි භික්සඟුන් විසින් පිරිවරණලද්දහු අබවස්හි වැඩහුන්සේක. එසඳ භාග්‍යවතුන් වහන්සේ අතිශයින් තුෂ්ණීම්භූත වූ භික්ෂුසඞ්ඝයා අනුවිලොකන කොට මහණුන් ඇමැතූහ:

මහණෙනි, අනවද්‍ය වූ ආර්‍ය්‍ය වූ නිර්යාණයට හිතවැ වැටෙන (අර්හත්ව සඞ්ඛ්‍යාත) සම්බොධිය එළවනසුලු යම් (සප්තත්‍රිංශද්බොධිපාක්ෂික නොහොත් පර්‍ය්‍යාප්ති සඞ්ඛ්‍යාත) ධර්ම කෙනෙක් වෙත් ද, අනවද්‍ය වූ ආර්‍ය්‍ය වූ නෛර්‍ය්‍යාණික වූ සම්බොධියට පමුණුවනසුලු එ ධර්මය අසනු තොපට කවර ප්‍රයෝජනයෙක් ඇද්ද'යි (කුමට තෙපි ඒ දහම් අසවු ද යි) මහණෙනි, මෙසේ පුළුවුස්නාහු වෙත් නම්, ඔහු මෙසේ (ප්‍රත්‍යුත්තරමුඛයෙන්) කියැයුතු වන්නාහ: (ලෞකික-ලොකොත්තර විසින්) ද්විවිධ කොට දක්වනලද ධර්මයන්ගේ ම යථාභූත (අවිපරීත) ඥානය සඳහාය''යි.

කවරක් නම් ද්වයත යි කියවු ද යත්:

මෙ පඤ්චස්කන්ධය දුක යැ, මේ අෂ්ටශතතෘෂ්ණාවිචරිතය දුඃඛසමුදය යැ යන මෙ එක් අනුපස්සනායෙකැ. මෙ දුඃඛනිරොධය යැ, මෙ දුඃඛ-නිරොධගාමිනීපටිපද යැ යන මෙ දෙවන අනුපස්සනා යි. මහණෙනි, මෙසේ මනා කොට ද්වයධර්මයන් පුනපුනා දක්නාසුලු අප්‍රමත්ත වූ කෙලෙස්තවන වැර ඇති කාය ජීවිත දෙක්හි නිරපෙක්ෂක වැ වාසකරණ භික්ෂුහු විසින් ඉහාත්මයෙහි ම අර්හත්වය හෝ (පුනර්භව වශයෙන් ගතයුතු) ස්කන්ධශෙෂයක් ඇතිවත් ම අනාගාමිභාවය හෝ යැ යන ද්විධඵලයන්ගෙන් අන්‍යතර ඵලයෙක් කැමැතිවිය යුතු ය යි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සුගත වූ ශාස්තෘන් වහන්සේ මෙය වදරා යළිත් අන්‍ය වූ මෙල ගාථා ද වදාළසේක:

727. යම් මහණ කෙනෙක් පඤ්චස්කන්ධදුඃඛය නො දනිත් ද, වැලිත් එ දුඃඛයාගේ සමුදයත් නොදනිත් ද, යම් නිර්වාණයෙක්හි සර්වප්‍රකාරයෙන් නිරවශෙෂ කොට දුඃඛ නිරොධය වේ නම් එ නිවන හා දුඃඛොපශමයට යන එ මාර්ගයත් නො දනිත් ද,



Free Distribution www.aathaapi.org

728 චෙතොවිමුත්තිහීනා තෙ අථො පඤ්ඤාවිමුත්තියා,
අභබ්බා තෙ අන්තකිරියාය තෙ වෙ ජාතිජරූපගා·

729 යෙ ච දුක්ඛං පජානන්ති අථො දුක්ඛස්ස සම්භවං,
යත්ථ ච සබ්බසො දුක්ඛං අසෙසං උපරුජ්ඣති,
තඤ්ච මග්ගං පජානන්ති දුක්ඛූපසමගාමිනං.

730 චෙතොවිමුත්තිසම්පන්නා අථො පඤ්ඤාවිමුත්තියා,
භබ්බා තෙ අන්තකිරියාය න තෙ ජාතිජරූපගාති.

සියා අඤ්ඤෙන'පි පරියායෙන සම්මා ද්වයතානුපස්සනාති ඉති චෙ භික්ඛවෙ, පුච්ඡිතාරො අස්සු, සියාතිස්සු වචනීයා, කථඤ්ච සියා: යං කිඤ්චි දුක්ඛං සම්භොති. සබ්බං උපධිපච්චයාති, අයමෙකානුපස්සනා. උපධීනං ත්වෙව අසෙසවිරාගනිරොධා නත්ථි දුක්ඛස්ස සම්භවොති අයං දුතියානුපස්සනා. එවං සම්මා - පෙ- අථාපරං එතදවොච සත්ථා:

731 උපධිනිදානා පභවන්ති දුක්ඛා
යෙකෙචි ලොකස්මිං අනෙකරූපා,
යො වෙ අවිද්වා උපධිං කරොති,
පුනප්පුනං දුක්ඛමුපෙති මන්දො,
තස්මා පජානං උපධිං න කයිරා
දුක්ඛස්ස ජාතිප්පභවානුපස්සී'ති.

සියා අඤ්ඤෙනපි පරියායෙන සම්මා ද්වයතානුපස්සනාති, ඉති චෙ භික්ඛවෙ, පුච්ඡිතාරො අස්සු සියාතිස්සු වචනීයා. කථඤ්ච සියා: යං කිඤ්චි දුක්ඛං සම්භොති, සබ්බං අවිජ්ජාපච්චයාති අයමෙකානුපස්සනා. අවිජ්ජාය ත්වෙව අසෙසවිරාගනිරොධා නත්ථි දුක්ඛස්ස සම්භවොති අයං දුතියානු-පස්සනා. එවං සම්මා -පෙ- අථා පරං එතදවොච සත්ථා:



Free Distribution www.aathaapi.org

728. (අර්හත්වඵලසමාධිසඞ්ඛ්‍යාත) චෙතොවිමුක්තියෙන් පිරිහුනු වැලි ප්‍රඥාවිමුක්තියෙනුදු හීන වූ ඔහු දුක් කෙළවර කිරීමට අභව්‍ය වෙති, ඒකාන්තයෙන් ඔහු ජාතියට හා ජරාවට පැමිණියාහුය. (ජාතිජරායෙන් නො මිදුනාහු වෙති සේ යි.)

729. යම් මහණ කෙනෙකුත් පඤ්චස්කන්ධදුඃඛය තත්වූ පරිදි දනිත් ද වැලි ඒ දුඃඛයාගේ සමුදයත් දනිත් ද, යම් නිවනෙක්හි සර්වප්‍රකාරයෙන් අශෙෂ කොට දුඃඛය නිරොධයට යේ නම් එය ද, දුඃඛව්‍යුපශමයට යන ඒ මාර්ගසත්‍යයත් තත්වූ පරිදි දනිත් ද,

730. (අර්හත්වඵලසමාධි) චිත්තවිමුක්තියෙන් සමන්වාගත වූ ද, වැලි (අර්හත්වඵල) ප්‍රඥාවිමුක්තියෙන් සමන්වාගත වූ ද ඔහු වර්තදුඃඛය කෙළවර කරණු සඳහා භව්‍ය වෙති, ඔහු ඒකාන්තයෙන් ජාතිජරාවට නො යන්නාහු වෙතැ'යි.

ඉදින් මහණෙනි, "අන්‍ය පර්‍යායෙකිනුදු සම්‍යග්ද්වයතානුදර්ශනායෙක් වන්නේ ද"යි මෙසෙයින් පුළුවුස්නාහු වෙත් නම්, 'වන්නේය'යි කියයුතු වෙත්, කිසෙයින් වේය යත්: යම් කිසි වර්තදුඃඛයෙක් උපදනේ නම්, ඒ හැම දුක (සාස්‍රවකර්මසඞ්ඛ්‍යාත) උපධිප්‍රත්‍යයෙන් වේ යන මේ එක් අනුදර්ශනායෙක, ඒ උපධීන්ගේ ම අශෙෂවිරාගනිරොධයෙන් වර්තදුඃඛයාගේ සම්භවයෙක් නැතැ'යි යන මෙ ද්විතීයානුදර්ශනා වෙයි, මෙසෙයින් සම්‍යග්ද්වයතානුදර්ශනා වේ යයි... වැලි ශාස්තෲන් වහන්සේ අන්‍ය වූ ද මෙල ගාථා වදළහ:

731. ලොවැ අනෙකස්වරූප වූ යම් දුඃඛයෝ වෙත් නම්, ඔහු සාස්‍රවකර්ම සඞ්ඛ්‍යාත උපධිනිදානයෙන් උපදනාහ. යම් අවිද්‍යාගතයෙක් එකැතින් සාස්‍රවකර්ම කෙරේ නම්, ඒ මන්දප්‍රාඥ පුනපුනා සසරදුකට මැ එයි. එහෙයින් සම්‍යක්ප්‍රඥායෙන් දන්නේ වර්තදුඃඛය ජාතිප්‍රභව යයි දක්නේ සාස්‍රවකර්ම නො කරන්නේ ය යි.

ඉදින් මහණෙනි, 'අන්‍යවූත් පර්‍යායෙකින් සම්‍යගද්වයතානුදර්ශනා වේ ද"යි මෙසේ තොප පුළුවුස්නාහු වෙත් නම්, 'වන්නේය'යි කියැ යුතු වෙත්. කෙසේයින් වන්නේයැ යත්: යම් මැ කිසි වර්තදුඃඛයෙක් උපදනේ නම්, ඒ හැම (භවගාමී කර්මසම්භාරය පිළිබැඳි) අවිද්‍යාප්‍රත්‍යයෙනැයි යන මෙ එක් අනුපස්සනායෙක. අවිද්‍යාවගේ මැ අශෙෂවිරාගනිරොධයෙන් වර්තදුඃඛයාගේ සම්භවයෙක් නැතැයි යන මෙ ද්විතීය වූ අනුපස්සනා යි. මෙසේ සම්‍යග්ද්වයතානුදර්ශනය වේ ... වැලි ශාස්තෲහු අනෙකුදු මෙල ගාථා වදළහ:



Free Distribution www.aathaapi.org

732 ජාතිමරණසංසාරං යෙ වජන්ති පුනප්පුනං,
ඉත්ථභාවඤ්ඤථාභාවං අවිජ්ජායෙව සා ගති.

733 අවිජ්ජා හයං මහාමොහො යෙනිදං සංසිතං චිරං,
විජ්ජාගතා ච යෙ සත්තා නාගච්ඡන්ති[1] පුනබ්භවන්ති.

සියා අඤ්ඤෙනපි -පෙ- කථඤ්ච සියා: යං කිඤ්චි දුක්ඛං සම්භොති සබ්බං සඞ්ඛාරපච්චයාති අයමෙකානුපස්සනා. සඞ්ඛාරානංත්වෙව අසෙස විරාගනිරොධා නත්ථි දුක්ඛස්ස සම්භවොති අයං දුතියානුපස්සනා. එවං සම්මා -පෙ- අථාපරං එතදවොච සත්ථා:

734 යං කිඤ්චි දුක්ඛං සම්භොති සබ්බං සඞ්ඛාරපච්චයා,
සඞ්ඛාරානං නිරොධෙන නත්ථි දුක්ඛස්ස සම්භවොති.

735 එතමාදීනවං ඤත්වා දුක්ඛං සඞ්ඛාරපච්චයා,
සබ්බසඞ්ඛාරසමථා සඤ්ඤාය උපරොධනා,
එවං දුක්ඛක්ඛයො හොති එතං ඤත්වා යථාතථං.

736 සම්මද්දසා වෙදගුනො සම්මදඤ්ඤාය පණ්ඩිතා,
අභිභුය්‍ය මාරසංයොගං නාගච්ඡන්ති පුනබ්භවන්ති.

සියා අඤ්ඤෙනපි -පෙ- කථඤ්ච සියා: යං කිඤ්චි දුක්ඛං සම්භොති සබ්බං විඤ්ඤාණපච්චයාති අයමෙකානුපස්සනා, විඤ්ඤාණස්ස ත්වෙව අසෙසවිරාගනිරොධා නත්ථි දුක්ඛස්ස සම්භවොති අයං දුතියානුපස්සනා. එවං සම්මා -පෙ- අථාපරං එතදවොච සත්ථා:

737 යං කිඤ්චි දුක්ඛං සම්භොති සබ්බං විඤ්ඤාණපච්චයා,
විඤ්ඤාණස්ස නිරොධෙන නත්ථි දුක්ඛස්ස සම්භවො.

1. නාගෙ ගච්ඡන්ති පුනබ්භවං මජසං



Free Distribution www.aathaapi.org

732. යම් කෙනෙක් (ස්කන්ධනිර්වෘත්ති නම් වූ) ජාතියට ද ස්කන්ධභෙද නම් වූ මරණයට ද ස්කන්ධපරිපාටි නම් වූ සංසාරයට ද පුනපුනා යෙත් නම්, මෙ මනුෂ්‍යභාවයට හා අවශේෂ නිකායභාවයට ද යෙත් නම්, ඒ අවිද්‍යාව ගේ ම ප්‍රත්‍යයභාවය යි.

733. යම් මෝහයක් කරණකොටගෙණ මෙ වර්තදුඃඛය බොහෝ කලක් විළඳනා ලද, මෙ මොහය මැ අවිද්‍යා යි. අර්හත්වමාර්ගවිද්‍යායෙන් යම් සත්ත්ව කෙනෙක් කෙලෙස් විනිවිද ගියාහු නම්, ඔහු පුනර්භවයට නො එත්.

අන්‍ය වූ ද පර්‍යායෙකින් ... වන්නේ ද ?යි...කෙසේ වන්නේ ය යත්: යම් කිසි වර්තදුඃඛයෙක් උපදනේ නම්, එ හැම දුක් ත්‍රිවිධාභිසංස්කාර-ප්‍රත්‍යයෙන් වෙයි යන මෙ එක් අනුදර්ශනායෙක. සංස්කාරයන් ගේ ම අශෙෂවිරාගනිරොධයෙන් වර්තදුඃඛයාගේ සම්භවයෙක් නැත යන මෙ දෙවන අනුපස්සනා යි. මෙසේ මනාකොට ...වැලි අන්‍ය වූත් මෙ ගාථා ශාස්තෘහු වදළහ:

734. යම් කිසි සසරදුකෙක් උපදනේ නම්, එ හැම දුක් සංස්කාරප්‍රත්‍යය යෙන් වේ. සංස්කාරයන්ගේ නිරොධහේතුයෙන් දුඃඛයාගේ සම්භවයෙක් නැත යි.

735. සංස්කාරප්‍රත්‍යයෙන් වර්තදුඃඛ වෙයි යන මෙ ආදීනව දන මාර්ගඥනයෙන් සර්වසංස්කාරයන්ගේ ශමථයෙන් ද මාර්ගඥනයෙන් ම කාමසඥාදීන්ගේ උපරොධනයෙන් ද මෙසේ දුඃඛක්ෂය වේ යයි මෙ දුඃඛක්ෂය අවිපරීත කොට දන,

736. සම්‍යග්දර්ශන ඇති අර්හත්වමාර්ගඥනවෙදයට පත් පණ්ඩිතයෝ මනාකොට දන (ත්‍රෛභූමකවර්තත සඞ්ඛ්‍යාත) මාරසංයොගය මැඩ පුනර්භවයට නො එත්.

අන්‍යපර්‍යායෙකිනුදු වේ ද ?යි ... කිසෙයින් වේය යත්: යම් කිසි දුඃඛයෙක් උපදනේ නම්, එ හැම දුක් (කර්මසහජාතාභිසංස්කාර) විඥන ප්‍රත්‍යයෙන් වෙයි යන මෙ එක් අනුපස්සනායෙක. විඥනයාගේ මැ අශෙෂවිරාගනිරොධයෙන් වර්තදුඃඛයාගේ සම්භවයෙක් නැතැයි මෙ දෙවන අනුපස්සනා යි. මෙසේ මනාකොට ... වැලි ශාස්තෘහු අන්‍යවූත් මෙ ගාථා වදළහ:

737. යම් කිසි සසර දුකෙක් උපදනේ නම් එ හැම දුක් අභිසංස්කාර-විඥනප්‍රත්‍යයෙනි. අභිසංස්කාරවිඥනයාගේ නිරොධහෙතුයෙන් ම වර්තදුඃඛයාගේ සම්භවයෙක් නැත.



Free Distribution www.aathaapi.org

738 එතමාදීනවං ඤත්වා දුක්ඛං විඤ්ඤාණපච්චයා,
විඤ්ඤාණූපසමා භික්ඛු නිච්ඡාතො පරිනිබ්බුතො'ති.

සියා අඤ්ඤෙනපි -පෙ- කථඤ්ච සියා: යං කිඤ්චි දුක්ඛං සම්භොති සබ්බං ඵස්සපච්චයාති. අයමෙකානුපස්සනා, ඵස්සස්ස ත්වෙව අසෙසවිරාගනිරොධා නත්ථි දුක්ඛස්ස සම්භවොති අයං දුතියානුපස්සනා. එවං සම්මා -පෙ- අථාපරං එතදවොච සත්ථා:

739 තෙසං ඵස්සපරෙතානං භවසොතානුසාරිනං,
කුම්මග්ගපටිපන්නානං ආරා සංයොජනක්ඛයො.

740 යෙ ච ඵස්සං පරිඤ්ඤාය අඤ්ඤාය උපසමෙ රතා[1],
තෙ වෙ ඵස්සාභිසමයා නිච්ඡාතා පරිනිබ්බුතා'ති.

සියා අඤ්ඤෙනපි -පෙ- කථඤ්ච සියා: යං කිඤ්චි දුක්ඛං සම්භොති සබ්බං වෙදනාපච්චයාති අයමෙකානුපස්සනා, වෙදනානං ත්වෙව අසෙස-විරාගනිරොධා නත්ථි දුක්ඛස්ස සම්භවොති අයං දුතියානුපස්සනා. එවං සම්මා -පෙ- අථාපරං එතදවොච සත්ථා:

741 සුඛං වා යදි වා දුක්ඛං අදුක්ඛමසුඛං සහ
අජ්ඣත්තඤ්ච බහිද්ධා ච යං කිඤ්චි අත්ථි වෙදිතං.

742 එවං දුක්ඛන්ති ඤත්වාන මොසධම්මං පලොකිතං[2]
ඵුස්ස ඵුස්ස වයං පස්සං එවං තත්ථ විජානාති[3]
වෙදනානං ඛයා භික්ඛු නිච්ඡාතො පරිනිබ්බුතො'ති.

සියා අඤ්ඤෙනපි -පෙ- කථඤ්ච සියා: යං කිඤ්චි දුක්ඛං සම්භොති සබ්බං තණ්හාපච්චයාති අයමෙකානුපස්සනා, තණ්හාය ත්වෙව අසෙස විරාගනිරොධා නත්ථි දුක්ඛස්ස සම්භවොති අයං දුතියානුපස්සනා. එවං සම්මා -පෙ- අථාපරං එතදවොච සත්ථා:

---

1. අඤ්ඤායූපසමෙ - ම ඡ සං    2. පලොකිනං - මජ සං
3. විරජ්ජති - සී මු 2



Free Distribution www.aathaapi.org

738. සසරදුක විඤ්ඤාණප්‍රත්‍යයෙන් වෙයි යන මෙල කරුණ ආදීනව යි දැන අභිසංස්කාරවිඤ්ඤාණයාගේ ව්‍යුපශමයෙන් තෘෂ්ණා රහිත මහණ ක්ලේශපරිනිර්වාණයෙන් පිරිනිවියේ යි.

අන්‍ය පර්‍යායෙකිනුදු වේද?යි ... කෙසේ වන්නේ ද'යි යම් කිසි දුකෙක් උපදනේ නම් එහැම දුක් අභිසංස්කාරවිඤ්ඤාණසම්ප්‍රයුක්තස්පර්ශප්‍රත්‍යයෙන් වෙයි යන මෙ එක් අනුපස්සනායෙක. ස්පර්ශයාගේ මැ ම අශෙෂ-විරාගනිරොධහෙතුයෙන් දුඃඛයාගේ සම්භවයෙක් නැත යන මෙ දෙවන අනුපස්සනා යි. මෙසේ මනාකොට ... ශාස්තෘහු වැලි අනෙකුදු මෙල ගාථා වදළහ:

739. ස්පර්ශයෙන් මැඩීගිය, තෘෂ්ණාසඞ්ඛ්‍යාත භවස්‍රොතස (තෘෂ්ණාව) අනුව යන සුලු, කුමගට පිළිපන් ඔවුනට සංයොජනක්ෂය දුරෙහි වේ.

740. යම් කෙනෙකුත් ස්පර්ශය ත්‍රිවිධපරිඥා විසින් පිරිසිඳ දැන අර්හත්මාර්ගඥානයෙන් පිළිවිද දැන ඵලසමාපත්ති විසින් නිර්වාණව්‍යුපශම-යෙහි ඇලුනාහු නම් ස්පර්ශාභිසමයහෙතුයෙන් ඔහු එකැතියෙන් තෘෂ්ණා රහිත වූවාහු කෙලෙස් පිරිනිවතින් පිරිනිවුනාහු යයි.

අන්‍යපර්‍යායෙකිනුදු වන්නේය ... කෙසේ වන්නේ ය යත්: යම මැ කිසි පඤ්චස්කන්ධදුඃඛයෙක් උපදනේ නම්, එ හැම දුක් කර්මසම්ප්‍රයුක්ත වෙදනාප්‍රත්‍යයෙන් වන්නේ ය යන මෙ එක් අනුපස්සනායෙක. කර්මසම්ප්‍රයුක්ත වෙදනාවන්ගේ ම අශේෂවිරාගනිරොධහේතුයෙන් දුඃඛයාගේ සම්භවයෙක් නැතැයි යන මෙ දෙවන අනුපස්සනා යි. මෙසේ මැනැවින් ... ඉක්බිති ශාස්තෘහු අන්‍යවූත් මෙල ගාථා වදළහ:

741. සුඛ වූ හෝ වැලිත් දුඃඛ වූ හෝ අදුඃඛාසුඛ වූ හෝ ආධ්‍යාත්මික වේවයි බාහිර වේවයි යම් මැ කිසි වෙදයිතයෙක් ඇත් නම්,

742. නස්නා සැහැවි ඇති, ජාතිමරණයෙන් බිඳෙනසුලු මෙ හැම-වෙදයිතයෙක් ම දුඃඛකාරණ යයි දැන, උදයව්‍යයඥානයෙන් ස්පර්ශ කෙරෙමින්, අන්තයෙහි භඞ්ගානුදර්ශනයෙන් ව්‍යය දක්මින් මෙසේ එ වෙදයිතය දුකැයි දන්නේ ද, එ මහණ මාර්ගඥානයෙන් කර්මසම්ප්‍රයුක්ත වෙදනාවන්ගේ ක්ෂයයෙන් තෘෂ්ණා නැත්තේ පිරිනිවුනේ වේ යයි.

තවත් පර්‍යායෙකින් ... කෙසේ වන්නේ ය යත්: යම් මැ කිසි දුකෙක් සම්භූත වේ නම්, එ හැම දුක කර්මසම්භාරතෘෂ්ණාප්‍රත්‍යයෙන් වෙයි යන මෙ එක් අනුපස්සනායෙක. එ තෘෂ්ණාවගේ මැ අශෙෂවිරාග-නිරොධයෙන් දුඃඛයාගේ සම්භවයෙක් නැතැ''යි යන මෙ දෙවන අනුපස්සනා යි ... ඉක්බිති ශාස්තෘහු අන්‍ය වූත් මෙල ගාථා වදළහ:

743 තණ්හා දුතියො පුරිසො දීඝමද්ධාන සංසරං,
ඉත්ථභාවඤ්ඤථාභාවං සංසාරං නාතිවත්තති.

744 එතමාදීනවං ඤත්වා තණ්හාදුක්ඛස්ස සම්භවං;
වීතතණ්හා අනාදනො සතො භික්ඛු පරිබ්බජේ'ති.

සියා අඤ්ඤෙනපි -පෙ- කථඤ්ච සියා: යං කිඤ්චි දුක්ඛං සම්භොති සබ්බං උපාදනපච්චයාති අයමෙකානුපස්සනා. උපාදනානං ත්වෙව අසෙස-විරාගනිරොධා නත්ථි දුක්ඛස්ස සම්භවොති අයං දුතියානුපස්සනා. එවං සම්මා -පෙ- අථාපරං එතදවොච සත්ථා:

745 උපාදන පච්චයා භවො භූතො දුක්ඛං නිගච්ඡති,
ජාතස්ස මරණං හොති එසො දුක්ඛස්ස සම්භවො.

746 තස්මා උපාදනක්ඛයා සම්මදඤ්ඤාය පණ්ඩිතා,
ජාතික්ඛයං අභිඤ්ඤාය නාගච්ඡන්ති පුනබ්භවන්ති,[1]

සියා අඤ්ඤෙනපි -පෙ- කථඤ්ච සියා: යං කිඤ්චි දුක්ඛං සම්භොති සබ්බං ආරම්භපච්චයාති අයමෙකානුපස්සනා, ආරම්භානං ත්වෙව අසෙසවිරාගනිරොධා නත්ථි දුක්ඛස්ස සම්භවොති අයං දුතියානු පස්සනා. එවං සම්මා -පෙ- අථාපරං එතදවොච සත්ථා:

747 යං කිඤ්චි දුක්ඛං සම්භොති සබ්බං ආරම්භපච්චයා,
ආරම්භානං නිරොධෙන නත්ථි දුක්ඛස්ස සම්භවො.

748 එතමාදීනවං ඤත්වා දුක්ඛං ආරම්භපච්චයා,
සබ්බාරම්භං පටිනිස්සජ්ජ අනාරම්භවිමුත්තිනො.[2]

749 උච්ඡින්නභවතණ්හස්ස සන්තචිත්තස්ස භික්ඛුනො,
විතිණ්ණො ජාතිසංසාරො නත්ථි තස්ස පුනබ්භවොති.

1. න ගච්ඡන්ති පුනබ්භවං - මජසං.
2. අනාරම්භෙ විමුත්තිනො - මජුපු



Free Distribution                    www.aathaapi.org

743. තෘෂ්ණා දෙවැනි කොට ඇති පුරුෂ දිගුකල් ච්‍යුති–උත්පත්ති වශයෙන් සැරිසරන්නේ ඉහාත්මභාව අන්‍යාත්මභාව දෙකින් යුත් (ස්කන්ධ-පරිපාටි සඞ්ඛ්‍යාත) සංසාරය ඉක්මැ නො යෙයි.

744. තෘෂ්ණාව වර්තදුඃඛයාගේ සම්භවයට කාරණ යයි මෙලෙ තෘෂ්ණාවගේ ආදීනව දැන විගත වූ තෘෂ්ණා ඇතියේ ආදාන නැතියේ ස්මෘතිමත් මහණ නික්ම යන්නේ යයි.

තවත් පර්‍ය්‍යායෙකින් වන්නේ යයි ... කෙසේ වන්නේය යත්: යම් මැ කිසි වර්තදුඃඛයෙක් සම්භූත වේ නම්, එහැම කර්මසම්භාරඋපාදනප්‍රත්‍යය-යෙන් වෙයි යන මේ එක් අනුපස්සනායෙක, උපාදනයන්ගේ මැ නිරවශෙෂවිරාගනිරොධයෙන් දුඃඛයාගේ සම්භවයෙක් නැතැ''යි යන මෙ දෙවන අනුපස්සනා යි. මෙසේ මැනැවින් ... ඉක්බිති ශාස්තෘහු අන්‍යවූත් මෙලෙ ගාථා වදළහ:

745. උපාදනප්‍රත්‍යයයෙන් විපාකභව වෙයි, සම්භූත වූයේ වර්ත-දුඃඛයට පැමිණෙයි, ජාතයාහට මරණ වෙයි, මෙලෙ භවය දුඃඛයාගේ සම්භවකාරණ වේ.

746. එහෙයින් උපාදනයන්ගේ ක්ෂයයෙන් අනිත්‍යාදි විසින් මනා කොට දැන් (නිර්වාණසඞ්ඛ්‍යාත) ජාතික්ෂය විශිෂ්ටඥනයෙන් දැන, පුනර්භවයට නො එත් යි.

අන්‍යවූත් පර්‍ය්‍යායෙකින් වන්නේය ... කිසෙයින් වේය යත්: යම් මැ කිසි දුකෙක් උපදනේ නම්, එ හැමදුක් කර්මසම්ප්‍රයුක්තවීර්‍ය්‍යප්‍රත්‍යයයෙන් වේ යන මෙ එක් අනුපස්සනායෙක, ආරම්භසඞ්ඛ්‍යාත වීර්‍ය්‍යයාගේ ම නිරවශෙෂ විරාග නිරොධයෙන් දුඃඛයාගේ සම්භවයෙක් නැතැයි යන මෙ දෙවන අනුපස්සනා යි. මෙසේ මොනොවට ... ඉක්බිති ශාස්තෘහු අන්‍යවූත් මෙලෙ ගාථා වදළහ:

747. යම් මැ කිසි වර්තදුඃඛයෙක් උපදනේ නම්, එ හැම දුක් ආරම්භප්‍රත්‍යයයෙන් වෙයි, ආරම්භප්‍රත්‍යයන්ගේ ම නිරොධයෙන් එ වර්තදුඃඛයාගේ සම්භවයෙක් නැති.

748. ආරම්භප්‍රත්‍යයයෙන් උපදනා මෙලෙ දුක ආදීනව යි දැන හැම ආරම්භයන් හැරපියා (නිර්වාණසඞ්ඛ්‍යාත) අනාරම්භයෙහි මුක්ත වූ,

749. මගනැණින් උපුන් කළ භවතෘෂ්ණා ඇති කෙලෙස් සන් සිඳුමෙන් සන්හුන් සිත්ඇති එ මහණහට පුනර්භව නැත. ජාතිසඞ්ඛ්‍යාත සංසාරය තරණය කෙළේ යි.

සියා අඤ්ඤෙනපි -පෙ- කථඤ්ච සියා. යංකිඤ්චි දුක්ඛං සම්භොති සබ්බං ආහාරපච්චයාති අයමෙකානුපස්සනා, ආහාරානං ත්වෙව අසෙසවිරාගනිරොධා නත්ථි දුක්ඛස්ස සම්භවොති අයං දුතියානුපස්සනා. එවං සම්මා -පෙ- අථාපරං එතදවොච සත්ථා:

750 යං කිඤ්චි දුක්ඛං සම්භොති සබ්බං ආහාරපච්චයා,
ආහාරානං නිරොධෙන නත්ථි දුක්ඛස්ස සම්භවො.

751 එතමාදීනවං ඤත්වා දුක්ඛං ආහාරපච්චයා,
සබ්බාහාරං පරිඤ්ඤාය සබ්බාහාරමනිස්සිතො.

752 ආරොග්‍යං සම්මදඤ්ඤාය ආසවානං පරික්ඛයා,
සඞ්ඛාය සෙවී ධම්මට්ඨො සඞ්ඛං නොපෙති වෙදගූති.

සියා අඤ්ඤෙනපි -පෙ- කථඤ්ච සියා: යං කිඤ්චි දුක්ඛං සම්භොති සබ්බං ඉඤ්ජිතපච්චයාති අයමෙකානුපස්සනා, ඉඤ්ජිතානං ත්වෙව අසෙසවිරාගනිරොධා නත්ථි දුක්ඛස්ස සම්භවොති අයං දුතියානුපස්සනා එවං සම්මා -පෙ- අථාපරං එතදවොච සත්ථා:

753 යං කිඤ්චි දුක්ඛං සම්භොති සබ්බං ඉඤ්ජිතපච්චයා,
ඉඤ්ජිතානං නිරොධෙන නත්ථි දුක්ඛස්ස සම්භවො,

754 එතමාදීනවං ඤත්වා දුක්ඛං ඉඤ්ජිතපච්චයා,
තස්මා හි එජං වොස්සජ්ජ සඞ්ඛාරෙ උපරුන්ධිය,
අනෙජො අනුපාදනො සතො භික්ඛු පරිබ්බජෙති.

සියා අඤ්ඤෙනපි -පෙ- කථඤ්ච සියා: නිස්සිතස්ස චලිතං හොතීති අයමෙකානුපස්සනා, අනිස්සිතො න චලතීති අයං දුතියානුපස්සනා. එවං සම්මා -පෙ- අථාපරං එතදවොච සත්ථා:

755 අනිස්සිතො න චලති නිස්සිතො ච උපාදියං,
ඉත්ථභාවඤ්ඤථාභාවං සංසාරං නාතිවත්තති.



Free Distribution www.aathaapi.org

අන්‍ය පර්‍යායෙකිනුදු වන්නේය ... කෙසේ වන්නේය යත්: යම් මැ කිසි දුකෙක් උපදනේ නම්, එ හැම කර්මසම්ප්‍රයුක්ත ආහාරප්‍රත්‍යයෙන් වෙයි යන මෙ එක් අනුපස්සනාවෙක, ආහාරයන්ගේ ම අශෙෂ විරාග නිරොධයෙන් දුඃඛයාගේ සම්භවයෙක් නැත යන මෙ දෙවන අනුපස්සනා යි. මෙසේ මනාකොට ... එක්බිති ශාස්තෘහු අන්‍යවූත් තෙල ගාථා වදළහ:

750. යම් මැ කිසි දුඃඛයෙක් සම්භූත වේ නම්, එ හැම ආහාරප්‍රත්‍යය- යෙන් වෙයි, ආහාරයන්ගේ නිරොධයෙන් දුඃඛයාගේ සම්භවයෙක් නැත.

751. ආහාරප්‍රත්‍යයෙන් දුඃඛය වේ යන තෙල කරුණ ආදීනව යි දැන හැම ආහාරය පිරිසිඳ දැන සර්වාහාර තෘෂ්ණා විසින් ඇසිරි නො කෙළේ වෙයි.

752. (නිර්වාණසඞ්ඛ්‍යාත) ආරොග්‍යය මනාකොට දැන ආශ්‍රවයන්ගේ පරික්ෂයයෙන් සිවුපස ප්‍රත්‍යවෙක්ෂා කොට සෙවුනේ සිවුසස්දහම්හි පිහිටියේ සිවුමගනැණට පැමිණියේ දෙව මනුෂ්‍යාදි සඞ්ඛ්‍යාවට නො යේ යයි.

අනෙකුදු පර්‍යායෙකින් වන්නේය ... කෙසේ වන්නේය යත්: යම් මැ කිසි දුකෙක් සම්භූත වේ නම්, එ හැම දුක (තණ්හා මාන දිට්ඨි කම්ම කිලෙස) ඉඤ්ජිතයන්ගේ ප්‍රත්‍යයෙන් වේය යන මෙ එක් අනුපස්සනා- යෙක. ඉඤ්ජිතයන්ගේ මැ අශේෂවිරාගනිරෝධයෙන් දුඃඛයාගේ සම්භවයෙක් නැත යන මෙ දෙවන අනුපස්සනා යි. මෙසේ මනාකොට ... එක්බිති ශාස්තෘහු අනෙකුදු තෙල ගාථා වදළහ:

753. යම් මැ කිසි දුකෙක් පාළ වේ නම්, එ හැම දුක ඉඤ්ජිතප්‍රත්‍ය- යෙන් වෙයි. ඉඤ්ජිතයන්ගේ මැ නිරොධයෙන් දුඃඛයාගේ සම්භවයෙක් නැති.

754. වර්තදුඃඛය ඉඤ්ජිතප්‍රත්‍යයෙන් වේ යන තෙල කරුණ ආදීනව යි දැන එහෙයින් මැ තෘෂ්ණාසඞ්ඛ්‍යාත එජාව හැරපියා කර්ම, කර්මසම්ප්‍රයුක්ත සංස්කාරයනුදු නිරුද්ධ කොට එජා රහිත වූයේ උපාදන නැතියේ මහණ සමෘතිමත් ව නික්මැයේ යයි.

අනෙකුදු පර්‍යායෙකින් වන්නේ ය ... කෙසේ වන්නේ ය යත්: තෘෂ්ණාමානදෘෂ්ටි විසින් ස්කන්ධයන් ඇසිරි කළහුට භයවලන වෙයි යන මෙ එක් අනුපස්සනාවෙක, එසෙයින් ස්කන්ධයන් ඇසිරි නො කෙළේ නො සැලේ යන මෙ දෙවන අනුපස්සනා යි. මෙසේ මනාකොට ...එක්බිති ශාස්තෘහු අනෙකුදු තෙල ගාථා වදළහ:

755. අනිඃශ්‍රිතවූයේ නො සැලේ. නිශ්‍රිත ම උපාදන විසින් ස්කන්ධයන් ගන්නේ ඉහාත්මභාව, අන්‍යථාභාව සඞ්ඛ්‍යාත සංසාරය ඉක්මැ නො වැටෙයි.



Free Distribution www.aathaapi.org

756 එතමාදීනවං ඤත්වා නිස්සයෙසු මහබ්භයං,
අනිස්සිතො අනුපාදනො සතො භික්ඛු පරිබ්බජෙති.

සියා අඤ්ඤෙනපි -පෙ- කථඤ්ච සියා: රූපෙහි භික්ඛවෙ ආරුප්පා[1] සන්තතරාති අයමෙකානුපස්සනා, ආරුප්පෙහි[2] නිරොධො සන්තතරොති අයං දුතියානුපස්සනා. එවං සම්මා -පෙ- අථාපරං එතදවොච සත්ථා:

757 යෙ ච රූපූපගා සත්තා යෙ ච ආරුප්පවාසිනො[3]
නිරොධං අප්පජානන්තා ආගන්තාරො පුනබ්භවං.

758 යෙ ච රූපෙ පරිඤ්ඤාය අරූපෙසු සුසණ්ඨිතා,
නිරොධෙ යෙ විමුච්චන්ති තෙ ජනා මච්චු හායිනොති.

සියා අඤ්ඤෙනපි -පෙ- කථඤ්ච සියා: යං භික්ඛවෙ සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය ඉදං සච්චන්ති උපනිජ්ඣායිතං තද' මරියානං එතං මුසාති යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨං අයමෙකානුපස්සනා, යං භික්ඛවෙ සදෙවකස්ස -පෙ- සදෙවමනුස්සාය ඉදං මුසාති උපනිජ්ඣායිතං තදමරියානං එතං සච්චන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨං, අයං දුතියානුපස්සනා. එවං සම්මා -පෙ- අථාපරං එතදවොච සත්ථා:

759 අනත්තනි අත්තමානිං පස්ස ලොකං සදෙවකං,
නිවිට්ඨං නාමරූපස්මිං ඉදං සච්චන්ති මඤ්ඤති.

760 යෙන යෙන හි මඤ්ඤන්ති තතො තං හොති අඤ්ඤථා.
තං හි තස්ස මුසා හොති මොසධම්මං හි ඉත්තරං.

1. අරූපා -මජසං
2. අරූපෙහි-මජසං
3. අරූපට්ඨායිනො- ම.ඡ.ස.



Free Distribution www.aathaapi.org

756. නිඃශ්‍රයන්හි මහත් භය වේ යන මෙල ආදීනවය දැන අනිශ්‍රිත වූයේ උපාදාන නැතියේ මහණ සිහි ඇතියේ නික්මැ යේ යි.

අන්පර්යායෙකිනුදු වන්නේ ය ... කෙසේ වන්නේ ය යත්: මහණෙනි, රූපභව කෙරෙන් නොහොත් රූපසමාපත්ති කෙරෙන් අරූපභවයෝ නොහොත් අරූපසමාපත්තිහු ශාන්තතර වෙති යන මෙ එක් අනුපස්සනායෙක, අරූපසමාපත්ති කෙරෙන් නිරොධය (නිර්වාණය) ශාන්තතර වේ ය යන මෙ දෙවන අනුපස්සනා යි. මෙසේ මනාකොට ... ඉක්බිති ශාස්තෘහු අනාවූන් මෙල ගාථා වදාළහ:

757. යම් මැ රූපොපග සත්ත්වයෝත් යම් මැ අරූපභවවාසී සත්ත්වයෝත් වෙත් නම් නිර්වාණසඞ්ඛ්‍යාත නිරොධය නො දන්නාහු පුනර්භවයට එනසුලු වෙත්.

758. යම් කෙනෙක් රූපභවයන් පිරිසිඳ දැන අරූපසමාපත්තීන්හි මොනොවට පිහිටියාහු ද, යම් කෙනෙක් නිරොධයෙහිදු මුක්තවෙත් ද, එ ජනයෝ ත්‍රිවිධමාරයන් හැරයන්නාහු වෙති යි.

අන්‍යපර්යායෙකිනුදු ... කෙසේ වන්නේය යත්: මහණෙනි, යම් නාම රූපයෙක් දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකය විසින්ද ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජාව විසින් (ධ්‍රැව ශුභ සුඛ ආත්ම වශයෙන්) “මෙ සත්‍යය”යි දක්නාලද නම්, එ නාමරූපය බුද්ධාදි ආර්‍ය්‍යයන් විසින්‘මෙල මෘෂායෙකැ’යි සම්‍යක් ප්‍රඥාවෙන් යථාභූත කොට දක්නාලද ය යන මෙ එක් අනුපස්සනා-යෙක. මහණෙනි, යම් නිර්වාණයක් සදෙවක ... දෙව්මිනිසුන් ඇතුළු ප්‍රජාව විසින් “මෙල මෘෂායෙකැ”යි දක්නාලද නම්, එ නිර්වාණ ආර්‍ය්‍යයන් විසින් “මෙල නිර්වාණ සත්‍යය”යි යථාභූත කොට සම්‍යක්ප්‍රඥායෙන් මොනොවට දක්නාලද ය යන මෙ දෙවන අනුපස්සනා යි. මෙසේ මනා-කොට ... ඉක්බිති ශාස්තෘහු මෙල අනෙක් ගාථා ද වදාළහ:

759. අනාත්ම වූ නාමරූපයෙහි තෘෂ්ණාදි විසින් බැසගත් සදෙවක ලොකයා ආත්ම යන මාන ඇති (එහි) බලව ධ්‍රැව ශුභාදි විසින් දක්මින් මෙ සත්‍යය යි හඟනේ ය.

760. (රූප වෙදනායෙහි) යම් යම් මැ අයුරෙකින් පෘථග්ජනයෝ තෘෂ්ණාදි විසින් හඟනාහු ද, ඒ නාමරූපය ඒ හැඟි අයුරින් අන්පරිදි වෙයි, ඔහුගේ එ මඤ්ඤිතය මෘෂා මැ වෙයි. ඉත්වර වූ එ නාමරූපය නස්නා සැහැවි ඇති හෙයිනි.

761 අමොසධම්මං නිබ්බානං තදරියා සච්චතො විදූ,
තෙ වෙ සච්චාභිසමයා නිච්ඡාතා පරිනිබ්බුතාති.

සියා අඤ්ඤෙනපි පරියායෙන සම්මා ද්වයතානුපස්සනාති, ඉති චෙ භික්ඛවෙ පුච්ඡිතාරො අස්සු, සියාතිස්සු වචනීයා. කථඤ්ච සියා: යං භික්ඛවෙ සදෙවකස්ස -පෙ- සදෙවමනුස්සාය ඉදං දුක්ඛන්ති උපනිජ්ඣායිතං තදමරියානං එතං දුක්ඛන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨං අයමෙකානුපස්සනා, යං භික්ඛවෙ සදෙවකස්ස -පෙ- සදෙවමනුස්සාය ඉදං දුක්ඛන්ති උපනිජ්ඣායිතං තදමරියානං එතං සුඛන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨං, අයං දුතියානුපස්සනා.

එවං සම්මා ද්වයතානුපස්සිනො ඛො භික්ඛවෙ, භික්ඛුනො අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතාති. ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

762 රූපා සද්දා රසා ගන්ධා ඵස්සා ධම්මා ච කෙවලා,
ඉට්ඨා කන්තා මනාපා ච යාවතත්ථීති වුච්චති.

763 සදෙවකස්ස ලොකස්ස එතෙ වො සුඛසම්මතා,
යත්ථ චෙ තෙ නිරුජ්ඣන්ති තං තෙසං දුක්ඛසම්මතං.

764 සුඛන්ති දිට්ඨමරියෙහි සක්කායස්සුපරොධනං,
පච්චනීකමිදං හොති සබ්බලොකෙන පස්සතං.

765 යං පරෙ සුඛතො ආහු තදරියා ආහු දුක්ඛතො,
යං පරෙ දුක්ඛතො ආහු තදරියා සුඛතො විදූ.



Free Distribution www.aathaapi.org

761. ආර්‍යයෝ නො නස්නා සැබෑවී ඇති ඒ නිර්වාණ සත්‍යවිසින් දත්හ, සත්‍යාවබොධයෙන් ඒ අරිහූ ඒකාන්තයෙන් තෘෂ්ණා රහිත වූවාහු පිරිනිවියාහු වෙති යි.

මහණෙනි, අන් පර්‍යායයෙකිනුදු මනාකොට ද්වයතනානුපස්සනාව වන්නේ ද යි මෙසේ පුළුවුස්නාහු වෙත් නම්, වන්නේ ය යි ඔහුට කිවයුතු වේ. කෙසේ වන්නේ ය යත්: මහණෙනි, යම් මැ සවැදෑරුම් ඉෂ්ටා-ලම්බනයක් සදෙවක ... දෙවිමිනිසුන් සහිත ප්‍රජාව විසින් මෙ සුඛයෙකැයි දක්නාලද නම්, ඒ ආර්‍යයන් විසින් තෙල දුකැ යි තත්වූ පරිදි සම්‍යක්-ප්‍රඥයෙන් මොනොවට දක්නාලද ය යන මෙ එක් අනුපස්සනායෙක. මහණෙනි, යම් මැ නිර්වාණයක් සදෙවක වූ ... දෙවිමිනිසුන් සහිත ප්‍රජාව විසින් මෙ දුකැයි දක්නාලද නම්, ඒ ආර්‍යයන් විසින් තෙල සුඛ යයි සම්‍යක්ප්‍රඥයෙන් මොනොවට දක්නාලද ය යන මෙ දෙවන අනුපස්සනා යි.

මහණෙනි, මෙසෙයින් මොනොවට ද්වයතානුදර්ශී වැ අප්‍රමත්ත වැ කෙලෙස් තවන වැර ඇති වැ, ප්‍රහිතාත්ම වැ වසන මහණහට ඉහාත්ම-භාවයෙහි මැ අර්හත්වය හෝ උපාදිශේෂය ඇතිවත් මැ අනාගාමිත්වය හෝ යි උභයශ්‍රාමණ්‍ය ඵලයන් අතුරෙන් අන්‍යතර ඵලයෙක් කැමැතිවිය යුතු, භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සුගත වූ ශාස්තෲන් වහන්සේ මෙය වදරා ඉක්බිති තෙල අන්‍ය වූ ගාථා ද වදළහ:

762. ඉෂ්ටවූත් ප්‍රියවූත් මනවඩන්නාවූත් රූපයෝ ය ශබ්දයෝ ය රසයෝ ය ගන්ධයෝ ය ස්ප්‍රෂ්ටව්‍යයෝ ය ධර්මාලම්බනයෝ ය යන යම්තාක් අනවශේෂ අරමුණු ඇතැයි කියනු ලැබේ ද,

763. සදේවක ලෝකයා විසින් තෙල ආලම්බනයෝ සුඛභ යි සම්මත වෙත්. යම් මැ නිර්වාණයෙක්හි තෙල ආලම්බනයෝ නිරුද්ධ වෙත් නම්, ඒ නිර්වාණය ඔවුන් විසින් දුකැයි සම්මත වේ.

764. සත්කාය සඞ්ඛ්‍යාත පඤ්චස්කන්ධයා ගේ නිරොධය (නිර්වාණය) සුඛ ය යි ආර්‍යයන් විසින් දක්නා ලදී, නුවණින් දක්නවුන්ගේ මේ දර්ශනය සියලු ලොකයා හා ප්‍රත්‍යනීක (පිළිලොම්) වෙයි.

765. අනාර්‍ය පෘථග්ජනයෝ යම් වස්තුකාමයක් සුඛවශයෙන් කීහු නම්, ඒ වස්තුකාමය ආර්‍යයෝ දුක් විසින් දෙසූහ. යම් නිර්වාණයක් අනාර්‍ය-පෘථග්ජනයෝ දුක් විසින් කීහු නම්, ආර්‍යයෝ ඒ නිර්වාන සුඛ විසින් දත්හ.

766 පස්ස ධම්මං දුරාජානං සම්පමූළ්හෙත්ථ අවිද්දසු,
නිවුතානං තමො හොති අන්ධකාරො අපස්සතං.

767 සතඤ්ච විවටං හොති ආලොකො පස්සතාමිව,
සන්තිකෙ න විජානන්ති මගා ධම්මස්ස'කොවිදා,

768 භවරාගපරෙතෙහි භවසොතානුසාරිහි,
මාරධෙය්‍යානුපන්නෙහි නායං ධම්මො සුසම්බුධො.

769 කො නු අඤ්ඤත්‍ර මරියෙහි පදං සම්බුද්ධුමරහති,
යං පදං සම්මදඤ්ඤාය පරිනිබ්බන්ති අනාසවා'ති.

ඉදමවොච භගවා, අත්තමනා තෙ භික්ඛු භගවතො භාසිතං අභිනන්දුන්ති - ඉමස්මිං ඛො පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ සට්ඨිමත්තානං භික්ඛූනං අනුපාදාය ආසවෙහි චිත්තානි විමුච්චිංසූති.

ද්වයතානුපස්සනා සුත්තං නිට්ඨිතං.

තස්සුද්දානං :

සච්චං උපධි අවිජ්ජා ච සඞ්ඛාර විඤ්ඤාණ පඤ්චමං,
ඵස්සවෙදනියා තණ්හා උපාදනාරම්භා ආහාරා;
ඉඤ්ජිතං චලිතං රූපං සච්චං දුක්ඛේන සොළසාති.

මහාවග්ගො තතියො.

තස්සවග්ගස්සුද්දානං :

පබ්බජ්ජා ච පධානඤ්ච සුභාසිතඤ්ච පූරළාසං.
මාඝසුත්තඤ්ච සභියො ච සෙලො සල්ලං ච වුච්චති,
වාසෙට්ඨොචාපි කොකාලි නාලකො ද්වයතානුපස්සනා,
ද්වාදසෙතානි සුත්තානි මහාවග්ගොති වුච්චතීති.

766. ශ්‍රාවකයෙනි, දුර්විඥෙයය වූ නිර්වාණධර්මය නැණැසින් දකිවු. එ නිවන්හි අඥයෝ සම්ප්‍රමූඪ වෙත්. කුමක් හෙයිනැ යත්: අවිද්‍යායෙන් වැලැඳුනු ඇතිසැටිය නොදන්නවුනට අන්ධකාර වූ තමස වෙයි.

767. ප්‍රඥදර්ශනයෙන් දක්නාවූ සත්පුරුෂයනට ආලොක සෙයින් නිර්වාණය විවෘත වෙයි. (තචපඤ්චකය හෝ ස්කන්ධයන් හෝ පිරිසිඳ දත යුතුවන හෙයින්) තමා හමුයෙහි වූ ද නිර්වාණය මාර්ගාමාර්ගධර්මයෙහි අකොවිද වූ මෘගභූත ජනයෝ නො දන්නාහ.

768–769. භවරාගයෙන් මඩනාලද, භවස්‍රොතස අනුව යන්නවුන් විසින් මෙ නිර්වාණධර්මය සුවසේ අවබොධ කටහැකි නො වේ. යම් නිර්වාණපදයක් මාර්ගඥනයෙන් දැන අනාස්‍රව වූවාහු පිරිනිවෙත් නම් එ නිවන් පිය දැනගන්නට ත්‍රෛභූමක වර්තයට නොපැමිණි ආර්‍යයන් මුත් අන් කවරෙක් සමත් වේ ද යි.

භාග්‍යවතුන් වහන්සේ මෙ ද්වයතානුපස්සනා සූත්‍රය වදළ සේක. සතුටු සිත් ඇති එ මහණහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගත්හ. වැලි මෙ වෙය්‍යාකරණය දෙසනු ලබත් ම සැටක් පමණ මහණුන්ගේ සිත් උපාදන විසින් නො ගෙණ ආස්‍රවයන්ගෙන් මිදුනාහ යි.

**ද්වයතානුපස්සනා සූත්‍රය නිමි.**

**එහි උද්දනය:**

චතුස්සත්‍යය, උපධිය, අවිජ්ජාය, සඞ්ඛාරය, පස්වැනි විඤ්ඤණය, ඵස්සය, වෙදනියය, තණ්හාය, උපාදනය, ආරම්භය, ආහාරය, ඉඤ්ජිතය, චලිතය, රූපය, සච්චය, දුක්ඛය යි මෙ සූත්‍රයෙහි විෂය සොළොසෙකි.

**තුන්වැනි මහාවර්ග යි.**

**එ වර්ගයාගේ උද්දනය:**

පබ්බජ්ජාසූත්‍රය, පධානසූත්‍රය, සුභාසිතසූත්‍රය, සුන්දරිකභාරද්වාජහට දෙසූ පූරළාසසූත්‍රය, මාඝසූත්‍රය, සභියසූත්‍රය, සෙලසූත්‍රය, සල්ලසූත්‍රය, වාසෙට්ඨසූත්‍රය, කොකාලිකසූත්‍රය, නාලකසූත්‍රය, ද්වයතානුපස්සනා සූත්‍රය දැයි මෙ මහාවර්ගය දෙළොස් සූත්‍රයෙකින් උපලක්ෂිතය.



Free Distribution www.aathaapi.org

# 4. අට්ඨකවග්ගො

## 4 – 1

### කාමසුත්තං

770 කාමං කාමයමානස්ස තස්ස චෙතං සමිජ්ඣති,
අද්ධා පීතිමනො හොති ලද්ධා මච්චො යදිච්ඡති.

771 තස්ස චෙ කාමයානස්ස[1] ඡන්දජාතස්ස ජන්තුනො,
තෙ කාමා පරිහායන්ති සල්ලවිද්ධොව රුප්පති.

772 යො කාමෙ පරිවජ්ජෙති සප්පස්සෙව පදා සිරො,
සො'මං[2] විසත්තිකං ලොකෙ සතො සමතිවත්තති.

773 ඛෙත්තං වත්ථුං හිරඤ්ඤං වා ගවාස්සං[3] දාසපොරිසං,
ථීයො බන්ධූ පුථුකාමෙ යො නරො අනුගිජ්ඣති.

774 අබලා නං බලීයන්ති මද්දන්තෙ නං පරිස්සයා,
තතො නං දුක්ඛමන්වෙති නාවං භින්නමිවොදකං.

775 තස්මා ජන්තු සදා සතො කාමානි පරිවජ්ජයෙ,
තෙ පහාය තරෙ ඔඝං නාවං සිත්වාව[4] පාරගූති.

කාමසුත්තං නිට්ඨිතං.

---

1. කාමයමානස්ස–සීමු 2.
2. සොඉමං– සීමු 2.
3. ගවස්සං–මජසං.
4. සිඤ්චිත්වා–සීමු 2.



Free Distribution www.aathaapi.org

# 4. අට්ඨක වග්ගය

## 4 – 1

## කාම සූත්‍රය

770 (ත්‍රෛභූමකධර්ම නම් වූ) වස්තුකාමය කැමැති වන ඒ පුද්ගලහට ඉදින් තෙල කාමය සමෘද්ධ වේ නම් එකල්හි ඒ සත්ත්‍ව තෙම යමක් කැමැති වේ නම් ඒ වස්තුව ලැබ ඒකාන්තයෙන් තුටු සිත් ඇතියේ වෙයි.

771 කාමවස්තු කැමැති වන, උපන් තෘෂ්ණා ඇති ඒ පුද්ගලයාගේ ඒ කාමයෝ ඉදින්, පිරිහෙත් නම් (ඒ කල්හි) හෙතෙම විෂපීත ශල්‍යයෙකින් විදිනා ලද්දකු සෙයින් පෙළෙයි.

772 යමෙක් වස්තුකාම ක්ලේශකාමයන් එහි ඡන්දරාගය විෂ්කම්භණ වශයෙන් හෝ සමුච්ඡේද වශයෙන් හෝ තමාගේ පයින් සර්පයකුගේ හිස මෙන් දුරු කෙරේ නම් ඒ මහණ ලොව් හි විසත්තිකා නම් මේ තෘෂ්ණාව ස්මෘතිමත් ව ඉක්මවයි.

773 යම් මිනිසෙක් හැල් කෙත් ආදිය ගෙවතු ආදිය හෝ අමුරන් හෝ ගෙරින් හා අසුන් හෝ දස් කම්කරු පුරුෂයන් හෝ මාගමුන් හෝ නෑ සබඳුන් හෝ අන් බොහෝ කාමයන් පුන පුනා පතා නම්,

774 අබල නම් වූ ක්ලේශයෝ ඒ පුහුල්හු මැඩලති. යළි ප්‍රකට වූ හා අප්‍රකට වූ උපද්‍රවයෝ ඒ කාමගිද්ධයා මඩනාහ. ඒ හෙතුයෙන්, බුන් නැවකට ජලය වදනා සෙයින් ජාත්‍යාදි දුඃඛය ඕහු නුහුබදනේ ය.

775 එහෙයින් මිනිසා හැම සඳ (කායගතාසති ආදී භාවනායෙන්) ස්මෘතිමත් වූයේ වස්තුකාම ක්ලේශකාමයන් දුරු කරන්නේය. ඒ කාම යන් හැරපියා බුන් නැව දිය ඉසපියා පරතෙර යනුවකු සෙයින් චතුරොඝ තරණය කරන්නේයි.

**කාම සූත්‍රය නිමි.**

## 4 – 2

## ගුහට්ඨකසුත්තං

776 සත්තො ගුහායං බහුනාභිච්ඡන්නො
තිට්ඨං නරො මොහනස්මිං පගාළ්හො,
දූරෙ විවෙකා හි තථාවිධො සො
කාමා හි ලොකෙ න හි සුප්පහායා.

777 ඉච්ඡානිදානා භවසාතබද්ධා
තෙ දුප්පමුඤ්චා න හි අඤ්ඤමොක්ඛා,
පච්ඡා පුරෙ වාපි අපෙක්ඛමානා
ඉමෙ ව කාමෙ පුරිමෙ ව ජප්පං.

778 කාමෙසු ගිද්ධා පසුතා පමූළ්හා
අවදානියා තෙ විසමෙ නිවිට්ඨා,
දුක්ඛූපනීතා පරිදෙවයන්ති
කිං සු භවිස්සාම ඉතො චුතාසෙ.

779 තස්මා හි සික්ඛෙථ ඉධෙව ජන්තු
යං කිඤ්චි ජඤ්ඤා විසමන්ති ලොකෙ,
න තස්ස හෙතු විසමං චරෙය්‍ය
අප්පං හිදං ජීවිතං ආහු ධීරා.

780 පස්සාමි ලොකෙ පරිඵන්දමානං
පජං ඉමං තණ්හාගතං භවෙසු,
හීනා නරා මච්චුමුඛෙ ලපන්ති
අවීතතණ්හාසෙ භවාභවෙසු.

781 මමායිතෙ පස්සථ ඵන්දමානෙ
මච්ඡෙව අප්පොදකෙ ඛීණසොතෙ,
එතම්පි දිස්වා අමමො චරෙය්‍ය
භවෙසු ආසත්තිමකුබ්බමානො.



Free Distribution www.aathaapi.org

# 4 – 2

## ගුහට්ඨක සූත්‍රය

776 මනුෂ්‍යයෙක් ගුහා සංඛ්‍යාත ශරීරයෙහි රාගාදි විසින් ඇලුනේ බොහෝවූ රාගාදි ක්ලේශ ජාතයෙන් වැසුනේ රාගාදි වශයෙන් සිටුනේ මෝහන සංඛ්‍යාත පස්කම් ගුණයෙහි දැඩි වැ බැසගත්තේ වේ ද, එබඳු වූ හේ ත්‍රිවිධ විවේකයෙන් දුර මැ වේ. යම්හෙයෙකින් සත් ලොවිහි කාමයෝ සුවයෙන් හළ නො හැකියාහු ද එහෙයිනි.

777 කාම තෘෂ්ණාව නිදන කොට ඇති, (සුඛවෙදනාදි) භවසුඛයෙහි බැඳුනු, අතීත වූ හෝ අනාගත වූ කාමයන් අපෙක්ෂා කරණ වර්තමාන කාමයන් හෝ පෙර කී අතීතානාගත කාමයන් පතන, එ සත්ත්‍වයෝ දුකසේ මිදිය යුත්තාහු වෙති, ඔහු සෙස්සනුදු මුදු ලිය නො හෙත්.

778 ඔහු ක්ලේශ කාමයෙන් වස්තු කාමයෙහි ගිජු වූවාහු කාම වස්තු පර්යෙෂණාදීයෙහි නියැලියාහු සම්මොහයට පැමිණියාහු (අවංගමනතායෙන් හෝ මසුරු බැවින් හෝ බුද්ධාදීන්ගේ වචන නොගන්නා හෙයින් හෝ) අවදනිය වූවා හු, විෂමකාය කර්මාදියෙහි බැස ගත්තාහු එ සත්ත්‍වයෝ මරණ දුකට පැමිණියාහු, මෙ අත්බැවින් සැව ගියමෝ කුමක් වනුමෝ හෝ' යි පරිදේවනා කෙරෙත්.

779 එහෙයින් මැ සත්ත්‍වතෙමේ ලෙවිහි යම්කිසි කාය දුශ්චරිතාදියක් විෂම යැයි දන්නේ නම් ඒ විෂම කායකර්මාදියට හේතු වූ විෂමයෙහි නො හැසිරෙන්නේ ය. යම් හෙයෙකින් (බුද්ධාදී) ධීරයෝ මේ ජීවිතය අල්ප යයි දෙසූහු ද, එහෙයින් මැ මෙ බුදු සස්නෙහි ම ත්‍රිවිධ ශික්ෂාහි හික්මෙන්නේ ය.

780 කාමභවාදියෙහි නොහොත් පුනපුනා භවයෙහි අවිගත තෘෂ්ණා ඇති, හීන වූ කායකර්මාදිය ඇති සත්ත්‍වයෝ මරුමුවෙහි හෙවැ වැලැපෙත්. ලොව හි කාමාදිභවයන්හි තෘෂ්ණායෙන් මඩනා ලද තෘෂ්ණාදි ස්පන්‍දනයෙන් පොපියන මෙ සත්ත්‍වසමූහයා මසැස් ඇ පසැසින් දක්මි.

781 සිඳී ගිය දියත්තෙක්හි පොපියන මසුන් මෙන් මාගේ යැයි ගන්නාලද කාමවස්තුයෙහි, පොපියන සත්ත්‍වයන් බලවු, (මමායිත වස්තුයෙහි) තෙල ආදිනව දැක, මමායන නැතියේ කාමාදිභවයන්හි ඇලුම් නො කෙරෙමින් හැසිරෙන්නේ ය.



Free Distribution www.aathaapi.org

782 උභොසු අන්තෙසු විනෙය්‍ය ඡන්දං
ඵස්සං පරිඤ්ඤාය අනානුගිද්ධො,
යදත්තගරහී තදකුබ්බමානො
න ලිප්පති[1] දිට්ඨසුතෙසු ධීරො.

783 සඤ්ඤං පරිඤ්ඤා විතරෙය්‍ය ඔඝං
පරිග්ගහෙසු මුනි නොපලිත්තො,
අබ්බූළ්හසල්ලො චරං අප්පමත්තො
නාසිංසති ලොකමිමං පරඤ්චාති.

ගුහට්ඨකසුත්තං නිට්ඨිතං

## 4 – 3

## දුට්ඨට්ඨක සුත්තං

784 වදන්ති වෙ දුට්ඨමනාපි එකෙ
අථොපි වෙ සච්චමනා වදන්ති,
වාදඤ්ච ජාතං මුනි නො උපෙති
තස්මා මුනි නත්ථි ඛිලො කුහිඤ්චි.

785 සකං හි දිට්ඨිං කථමච්චයෙය්‍ය
ඡන්දානුනීතො රුචියා නිවිට්ඨො,
සයංසමත්තානි පකුබ්බමානො
යථා හි ජානෙය්‍ය තථා වදෙය්‍ය.

786 යො අත්තනො සීලවතානි ජන්තු
අනානුපුට්ඨො ච පරෙස[2] පාවා,[3]
අනරියධම්මං කුසලා තමාහු
යො ආතුමානං සයමෙව පාවා[3]

787 සන්තො ච භික්ඛු අභිනිබ්බුතත්තො
ඉති'හන්ති සීලෙසු අකත්ථමානො,
තමරියධම්මං කුසලා වදන්ති
යස්සුස්සදා නත්ථි කුහිඤ්චි ලොකෙ

---

1. ලිම්පති-ස්‍යා: 2. පරස්ස-සිමු 1. 3. පාව-මජසං:



Free Distribution www.aathaapi.org

782 ඵස්ස-ඵස්ස සමුදයාදි දෙ දෙ අන්තයන්හි ඡන්දරාගය දුරු කොට චක්ඛු සම්ඵස්සාදි ස්පර්ශය ත්‍රිවිධපරිඥයෙන් දැන, රූපශබ්දදියෙහි නො ගිජු වූයේ කළ නොකළ හෙයින් තම හට ගරහ උපදවන කාය-දුශ්චරිත කායසුචරිතාදිය නොකරන ප්‍රාඥයා (රූප ශබ්දදී) දෘෂ්ට ශ්‍රැතාලම්බනයන්හි තෘෂ්ණාදෘෂ්ටි විසින් නො ඇලෙයි.

783 කාම සංඥාදි සංඥාව නොහොත් සංඥානුසාරයෙන් නාමරූපය ත්‍රිවිධපරිඥයෙන් දැන, චතුරොඝ තරණය කරන්නේ ය. තෘෂ්ණා දෘෂ්ටි පරිග්‍රහයන්හි නො ඇළුනු ක්ෂීණාශ්‍රව මුනි උපුටාලූ රාගාදි ශල්‍ය ඇතියේ අප්‍රමත්ත ව හැසිරෙන්නේ (ස්වාත්මභාව සංඛ්‍යාත) මෙ ලොවත්, (පරාත්මභාව සංඛ්‍යාත) පරලොවත් නොපතන්නේ යි.

ගුහට්ඨක සූත්‍රය නිමි.

## 4 – 3

## දුට්ඨට්ඨක සූත්‍රය

784 ඇතැම් (අන්‍ය තීර්ථක) කෙනෙක් එකාන්තයෙන් දුෂ්ට චිත්ත ඇත්තාහු (බුදුපාමොක් සඟනට) උපවාද බෙණෙත්. වැලි (අන්‍යතීර්ථක-කථා ඇසූ) තව කෙනෙක් 'ඒකාන්තයෙන් සත්‍යයෙකැ' යන සිත් ඇත්තාහු උපවාද බෙණෙත්. තථාගත මුනි අභූතයෙන් උපන් (එ ආක්‍රොශවාදයට) නො පැමිණේ. එහෙයින් බුද්ධමුනි කිසිදු කරුණෙක්හි රාගාදි කීල නැත්තේ යි.

785 දෘෂ්ටිච්ඡන්දයෙන් මෙහෙයන ලදුයේ දෘෂ්ටි රුචියෙහි බැසගත් තීර්ථක ජනයා කිසෙයින් ස්වකීය දෘෂ්ටිය හරනේ ද තමා විසින් පූරණ-ලද එ දෘෂ්ටිගතයන් මැ කරනුයේ යම් පරිද්දෙකින් දන්නේ නම් එ පරිද්දෙන් බණන්නේ යි.

786 යම් පුද්ගලයෙක් නො පුළුවුස්නා ලදුයේ මැ තමාගේ ප්‍රාති-මොක්ෂාදි ශීලයන් හා ධුතඞ්ගාදි ව්‍රතයන් හා මෙරමාහට කියාපා නම්, යමෙක් තෙමේත් තමා (සිල්වතැයි) කියාපා නම් ආර්‍ය්‍යධර්ම කුශලයෝ ඔහුගේ එ කථනය අනාර්‍ය්‍ය ධර්මයෙකැයි කීහු.

787 යම් රහත් මහණෙක් රාගාදි ක්ලේශ ව්‍යපශමයෙන් ශාන්ත වූයේ රාගාදි ගිනි නිවීමෙන්, නිවුනු සිත් ඇත්තේ ත්, 'මෙසෙයින් මම සිල් සපන්මි'යි ශීලයන්හි තමා එළවා නො කියන්නේ ද, යම් ක්ෂීණාශ්‍රව-යකු හට ස්කන්ධාදි කිසිදු ලෝකයෙක්හි රාගාදී උත්සදයෝ නැත් ද, ස්කන්ධාදි ආර්‍ය්‍යධර්මයෙහි නිපුණයෝ ඒ සිය ගුණ පාළ නො කිරීම අරිදහමැ යි කියත්.

788 පකප්පිතා සඞ්ඛතා යස්ස ධම්මා
පුරක්ඛතා සන්ති අවීවදාතා,
යදත්තනී පස්සති ආනිසංසං
තං නිස්සිතො කුප්පපටිච්චසන්තිං.

789 දිට්ඨිනිවෙසා න හි ස්වාතිවත්තා
ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං,
තස්මා නරො තෙසු නිවෙසනෙසු
නිරස්සතී ආදියතිච[1] ධම්මං.

790 ධොනස්ස හි නත්ථි කුහිඤ්චි ලොකෙ
පකප්පිතා දිට්ඨි භවාභවෙසු,
මායඤ්ච මානඤ්ච පහාය ධොනො
සකෙන ගච්ඡෙය්‍ය අනූපයො සො.

791 උපයො හි ධම්මෙසු උපෙති වාදං
අනූපයං[2] කෙන කථං වදෙය්‍ය,
අත්තා නිරත්තා න හි තස්ස අත්ථි
අධොසි සො දිට්ඨිමිධෙව සබ්බන්ති.

දුට්ඨට්ඨකසුත්තං නිට්ඨිතං.

## 4 – 4

## සුද්ධට්ඨකසුත්තං

792 පස්සාමි සුද්ධං පරමං අරොගං
දිට්ඨෙන සංසුද්ධි නරස්ස හොති,
එතාභිජානං[3] පරමන්ති ඤත්වා
සුද්ධානුපස්සීති පච්චෙති ඤාණං.

1. ආදියතී ච–සීමු 1, 2, PTS
2. අනුපායං–සීමු 1, 2,
3. එවාභිජානං–මජසං



Free Distribution www.aathaapi.org

788 යම් දෘෂ්ටිගතිකයක්හුගේ තෘෂ්ණා දෘෂ්ටි විසින් පරිකල්පිත වූ ප්‍රත්‍යයෙන් සකසන ලද, තෘෂ්ණාදෘෂ්ටියෙන් පෙරටු කරනලද, අශුධ වූ දෘෂ්ටිධර්ම කෙනෙක් වෙත් ද, හෙතෙම යම් හෙයකින් තමා කෙරෙහි එ දෘෂ්ටීන් ගේ (දෘෂ්ට ධාර්මික සාම්පරායික) ආනිසංසයක් දක්නේ ද, එහෙයින් ම විපාකජනක ද පරිවර්තනශීලී ද වන හෙයින් කොප්‍ය වූත් ප්‍රතීත්‍යසමුත්පන්න වූත් සංවෘතිශාන්ති නම් වූ දෘෂ්ටිය ඇසිරිකොට පවත්නේ ය,

789 ඉදං සච්චාභිනිවෙස යි කියූ දෘෂ්ටිනිවෙශනයෝ සුව සේ ඉක්මැවිය නොහෙත්, දෙසැට මිසදිටු දම් අතුරෙහි මොනොවට බැස ගත් එ එ ධර්මය නිශ්චය කොට පවත්නේ ය. එහෙයින් සත්ත්ව තෙමේ එ දෘෂ්ටිනිවෙශනයන් හි අජශීල ගොශීලාදි ධර්මය හරනේත් ගන්නේත් වෙයි.

790 යම් හෙයෙකින් පැහූ හැම පව් ඇති රහත්හට කිසිදු ලොවෙක එ එ භවයන් නිමිත්ත කොට ප්‍රකල්පිත දෘෂ්ටියක් නැත් ද, එ හෙයින් ධූතපාප එ ක්ෂීණාස්‍රව මායා හා මාන හා පහා තෘෂ්ණා දෘෂ්ටි යන උපය නැති යේ මැ (මේ අත්බැව්හි හා පරලොව්හි හෝ නිරයාදි ගති විශෙෂයන්හි) කවර හෙයෙකින් නෙරයිකාදි සංඛ්‍යාවට යේ ද? (නොයේ මැයි)

791 තෘෂ්ණාදි උපය (නිඃශ්‍රය) ඇතියේ ම එ එ ධර්මයන්හි (රාග-රක්ත ය, ද්වෙෂ දුෂ්ටය යන) වාදයට නො එළඹෙයි, තණ්හා, දිට්ඨි, උපය නැතියහු රාග, දෙෂ යන කවර කරුණෙකින් (රක්තයෙක, දුෂ්ට යෙකැයි) කිසෙයින් කියන්නේ ද, ඔහුට (ආත්මදෘෂ්ටි සංඛ්‍යාත) ආත්මවාදය වේවයි (උච්ඡේදදෘෂ්ටි සංඛ්‍යාත) නිරාත්මවාදය හෝ නැත් මැයි. එ ක්ෂීණාස්‍රව මහණ ඉහාත්මභාවයෙහි මැ සර්වදෘෂ්ටිගතය ප්‍රහීණ කෙළේ යි.

දුට්ඨට්ඨක සූත්‍රය නිමි.

## 4 – 4

## සුද්ධට්ඨක සූත්‍රය

792 දෘෂ්ටිගතික අඥපුද්ගල කෙලෙස් කිලුටින් අශුද්ධ වූ කෙලෙස් රොචින් යරොග වූ පුහුලකු දැක "පරම ශුද්ධියට පත් අරොග පුද්ගලයකු දක්මි"යි ද දෘෂ්ටි සංඛ්‍යාත දර්‍ශනයෙන් මිනිසාගේ මන ශුද්ධිය වෙය"යි ද මෙසේ වෙසෙසින් දන්නේ එ දර්‍ශනය පරම යයි දැන එ දර්‍ශනයෙහි ශුද්ධිය දක්නාසුලු වූයේ, ඒ දර්‍ශනය "මාර්‍ගඥානය" යි හඟයි. (එනෙකුදු වත් එ මාර්‍ගඥානය නො වේ.)

793 දිට්ඨෙන චෙ සුද්ධි නරස්ස හොති
ඤාණෙන වා සො පජහාති දුක්ඛං,
අඤ්ඤෙන සො සුජ්ඣති සොපධීකො
දිට්ඨී හි නං පාව තථාවදානං.

794 න බ්‍රාහ්මණො අඤ්ඤතො සුද්ධිමාහ
දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා,
පුඤ්ඤෙ ච පාපෙ ච අනූපලිත්තො
අත්තඤ්ජහො නයිධ පකුබ්බමානො.

795 පුරිමං පහාය අපරං සිතාසෙ
එජානුගා තෙ න තරන්ති සඞ්ගං,
තෙ උග්ගහායන්ති නිරස්සජන්ති
කපීව සාඛං පමුඛං ගහාය.[1]

796 සයං සමාදය වතානි ජන්තු
උච්චාවචං ගච්ඡති සඤ්ඤසත්තො,
විද්වා ච වෙදෙහි සමෙච්ච ධම්මං
න උච්චාවචං ගච්ඡති භූරිපඤ්ඤො

797 ස සබ්බධම්මෙසු විසෙනිභූතො
යං කිඤ්චි දිට්ඨං ව සුතං මුතං වා,
තමෙව දස්සිං විවටං චරන්තං
කෙනීධ ලොකස්මිං විකප්පයෙය්‍ය.

1. පමුඤ්චං ගහායං--සී.මු 2.



Free Distribution www.aathaapi.org

793 රූපදර්ශන සංඛ්‍යාත එ දර්ශනයෙන් ඉදින් සත්ත්වයාගේ ශුද්ධිය වේ නම් නොහොත් චක්ෂුර්විඥාන නම් වූ එ ඥානයෙන් හෙතෙම ජාත්‍යාදි දුඃඛය දුරු කෙරේ නම්, එසේ වත්ම ආර්යමාර්ගයෙන් අන්‍ය වූ අශුද්ධිමාර්ගයකින් කාමාදි උපධි සහිත වූයේ මැ හෙ ශුද්ධ වේ යැ යි කියයුතු බවට පැමිණෙයි, දෘෂ්ටිය මැ එසේ කියන ඔහු මෙ මිසදිටුවෙකැ'යි පවසන හෙයිනි.

794 ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණ ආර්යමාර්ගඥානයෙන් අන්‍යවූ අභිමංගල සම්මත රූප සංඛ්‍යාත රූපායතනයෙහි දු එබඳු මැ වූ ශබ්දායතනයෙහි දු අව්‍යතික්‍රම සංඛ්‍යාත ශීලයෙහි හා (හස්ති ව්‍රතාදී) ව්‍රතයෙහි දු මුතයයි කියන ලද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යායතනයෙහි දු උපන් මිථ්‍යාඥානයෙන් ශුද්ධිය වේ යයි නො කියයි. යම්හෙයකින් හෙ ත්‍රෛධාතුකපුණ්‍යයෙහිත්, සියලු පාපයෙහිත් නො ඇලුනේ වේ ද, එ හෙයින් ම ආත්මදෘෂ්ටිය ප්‍රහීණ කෙළේ මේ ත්‍රෛභූමක ලෝකයෙහි පුණ්‍යාභිසංස්කාරාදිය නො කරන්නේ වේ.

795 ඔහු පූර්ව ශාස්තෘ ආදීන් හැර පියා අපර ශාස්තෘ ආදීන් ඇසිරි කරන්නාහු එජා සංඛ්‍යාත තෘෂ්ණාව අනුව ගියාහු රාගාදි සඞ්ගය තරණය නො කෙරෙති. යළි ඔහු පූර්වශාඛාව හැරපියා අපරශාඛාව ගන්නා වඳුරකු සෙයින් එ එ ධර්මයන් හැරපියන්නාහු ද ගන්නාහු ද වෙත්.

796 කාමාදි සංඥායෙහි ලැගුනු සත්ත්ව (හස්තිව්‍රතාදී) ව්‍රතයන් තෙමේ මැ සමාදන් වැ එකෙකින් එකකට යෙයි, පරමාර්ථයෙන් විද්වත් වූ මහාප්‍රඥ ඇති රහත් මහණ සිවුමග නැණින් සිවුසස්දම් පිළිවිද උච්චාවච බවට නො පැමිණේ.

797 ඒ භූරිප්‍රාඥ වූ ක්ෂීණාස්‍රව මහණ, යම්කිසි රූපාලම්බනයක් වෙවයි, ශබ්දාලම්බනයක් වෙවහි, ගන්ධ- රස- ඵොට්ඨබ්බාලම්භනයක් වෙවයි, එ සියලු ධර්මයන්හි අකුසලාභිසංස්කාර නම් වූ මාර සේනාව විධමා සිටි බැවින් විසෙනි වූයේ වෙයි. මෙසේ විශුද්ධ දර්ශන ඇති තෘෂ්ණාච්ඡදනාදි විගමයෙන් විවෘතව හැසිරෙන එ රහත්හු තෘෂ්ණාදි කවර කල්පනයෙකින් විකල්පනය කෙරේ ද?



Free Distribution www.aathaapi.org

798 න කප්පයන්ති න පුරෙක්ඛරොන්ති
අච්චන්තසුද්ධීති න තෙ වදන්ති,
ආදානගන්ථං ගථිතං විසජ්ජ
ආසං න කුබ්බන්ති කුහිඤ්චි ලොකෙ.

799 සීමාතිගො බ්‍රාහ්මණො තස්ස නත්ථි
ඤත්වා ච දිස්වා ච සමුග්ගහීතං,
න රාගරාගී න විරාගරත්තො
තස්සීධ නත්ථි පරමුග්ගහීතන්ති.

සුද්ධට්ඨකසුත්තං නිට්ඨිතං.

## 4 – 5

## පරමට්ඨක සුත්තං

800 පරමන්ති දිට්ඨීසු පරිබ්බසානො
යදුත්තරිං කුරුතෙ ජන්තු ලොකෙ,
හීනාති අඤ්ඤෙ තතො සබ්බමාහ
තස්මා විවාදානි අවීතිවත්තො.

801 යදත්තනී පස්සති ආනිසංසං
දිට්ඨෙ සුතෙ සීලවතෙ[1] මුතෙ වා,
තදෙව සො තත්ථ සමුග්ගහාය
නිහීනතො පස්සති සබ්බමඤ්ඤං.

802 තං වාපි ගන්ථං කුසලා වදන්ති
යං නිස්සිතො පස්සති හීනමඤ්ඤං,
තස්මා හි දිට්ඨං ව සුතං මුතං වා
සීලබ්බතං භික්ඛු න නිස්සයෙය්‍ය.

1. සීලබ්බතෙ-සී.මු



Free Distribution www.aathaapi.org

798. ඒ ක්ෂීණාසුවයෝ තෘෂ්ණාදි කල්පනයන් ද නො කෙරෙති. තෘෂ්ණාදෘෂ්ටි පුරස්කාරයනුදු පෙරටු නො කෙරෙති. (පරමාර්ථ අත්‍යන්ත-ශුද්ධිය අධිගත වන හෙයින්) අක්‍රිය-ශාශ්වත දෘෂ්ටි දෙක අත්‍යන්ත ශුද්ධි යි ද නො කියති. ස්වකීය චිත්තසන්තානයෙහි ගෙතුනු ආදනග්‍රන්ථ යි කියන ලද අභිධ්‍යාකායග්‍රන්ථාදි චතුර්විධකාය ග්‍රන්ථ සිඳපියා කිසිදු ලොවෙක්හි තෘෂ්ණා නො කෙරෙත්.

799. ඒ භූරිප්‍රාඥ රහත් තෙමේ චතුර්විධ ක්ලේශසීමා ඉක්ම වූයේ ය. බාහිතපාපී හෙයින් බ්‍රාහ්මණ වෙයි. ඔහට පරචිත්ත විජානන -පූර්වේනිවාස යන උභය ඥනයෙන් දැන හෝ මසැස්– දිවැස් දෙකින් දැක හෝ මොනොවට බැසගන්නා ලද්දෙක් නැත. හෙ කාමරාග-යෙන් රාගවත් නො වෙයි. රූපාරූපරාග සංඛ්‍යාත විරාගයෙන් රක්ත වූයේ ද නො වෙයි. ඔහට මෙ ලොව්හි උතුමැ යි දැඩි වැ ගන්නා ලද කිසිවක් නැත්තේ යි.

**සුද්ධට්ඨක සූත්‍රය නිමි.**

## 4 – 5
## පරමට්ඨක සූත්‍රය

800. ලොව්හි යම් සත්ත්වයෙක් දෙසැටම්සදිටු අතුරෙන් 'මෙ උතුමැ'යි එක්තරා දෘෂ්ටියක් ගෙණ ඒ තමන් ගත් දෘෂ්ටියෙහි ඇතුළත් වැ වසනුයේ යම් හෙයෙකින් තමාගේ ශාස්තෘ ආදිය 'උතුමැ'යි කියා ද, එයින් අන්‍ය වූ හැම 'හීනය'යි කියාද, එහෙයින් හෙ දෘෂ්ටිවාදයන් නො ඉක්මැ-වූයේ වේ.

801. මෙසේ දෘෂ්ටිකලහයන් නො ඉක්මැ වූයේ රූපාලම්බන-සඞ්ඛ්‍යාත දෘෂ්ටායතනයෙහි දු, ශබ්දලම්බනසඞ්ඛ්‍යාත ශ්‍රැතායතනයෙහි දු, ශීලව්‍රතයන්හි දු, ගන්‍ධ– රස– ස්ප්‍රෂ්ටව්‍යාලම්බනසඞ්ඛ්‍යාත මුතායතනයෙහි දු, උපන් දෘෂ්ටිසඞ්ඛ්‍යාත ආත්මයෙහි යම් අනුසසක් දක්නේ නම්, හෙ ස්වකීයදෘෂ්ටියෙහි ඒ අනුසස මැ ශ්‍රෙෂ්ඨයයි දැඩිවැ ගෙණ පරශාස්තෘ ආදි අන් හැම නිහීන හෙයින් දක්නේ යි.

802. මෙසේ දක්නේ තමාගේ ශාස්තෘ ආදියක් ඇසිරි කරණ ලදුයේ නම් එයින් අන්‍ය වූ පරශාස්තෘආදිය හීන කොට දක්නේය. ස්කන්‍ධාදිය දැනීමෙහි නිපුණයෝ ඔහුගේ ඒ දර්ශනය බන්‍ධනයෙකැයි කියති. එහෙයින් මැ මහණ රූපාලම්බන වේවයි ශබ්දලම්බන වේවයි ගන්‍ධරස-ස්ප්‍රෂ්ටව්‍යාලම්බන වේවයි ශීලව්‍රතසඞ්ඛ්‍යාතධර්මාලම්බන වේවයි තෘෂ්ණා-දෘෂ්ටි විසින් ඇසිරි නො කරන්නේ යි.

803 දිට්ඨිම්පි ලොකස්මිං න කප්පයෙය්‍ය
ඤාණෙන වා සීලවර්තන වාපි,
සමොති අත්තානමනූපනෙය්‍ය
හීනො න මඤ්ඤෙථ විසෙසි වාපි.

804 අත්තං පහාය අනුපාදියානො
ඤාණෙපි සො නිස්සයං නො කරොති,
ස වෙ වියත්තෙසු න වග්ගසාරී
දිට්ඨිම්පි සො න පච්චෙති කිඤ්චි.

805 යස්සූභයන්තෙ පණිධීධ නත්ථි
භවාභවාය ඉධ වා හුරං වා,
නිවෙසනා තස්ස න සන්ති කෙචි
ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං.

806 තස්සීධ දිට්ඨෙ ව සුතෙ මුතෙ වා
පකප්පිතා නත්ථි අණූපි සඤ්ඤා,
තං බ්‍රාහ්මණං දිට්ඨිමනාදියානං
කෙනීධ ලොකස්මිං විකප්පයෙය්‍ය.

807 න කප්පයන්ති න පුරෙක්ඛරොන්ති
ධම්මාපි තෙසං න පටිච්ඡිතාසෙ
න බ්‍රාහ්මණො සීලවතෙන නෙය්‍යො
පාරංගතො න පච්චෙති තාදීති.

පරමට්ඨකසුත්තං නිට්ඨිතං.

## 4 – 6

## ජරා සුත්තං

808 අප්පං වත ජීවිතං ඉදං
ඔරං වස්සසතාපි මීයති,
යො චෙපි අතිච්ච ජීවති
අථ ඛො සො ජරසාපි මීයති.



Free Distribution www.aathaapi.org

803. ඒ මහණ හුදෙක් දෘෂ්ට ශ්‍රැතාදිය මතු නො ගන්නේ වෙයි. යළි ලොකයෙහි නූපන්දෘෂ්ටිය ද සමාපත්‍යාදිඥනයෙන් හෝ ශීලව්‍රත-යෙන් හෝ නූපදවන්නේය. තවද ජාත්‍යාදිවස්තුකරණකොට 'මම සදෘශයෙමි'යි තමා (මානවශයෙන්) නො හඟනේය, 'හීනයෙමි' යි ද නො හඟනේ ය, 'විශෙෂ යෙමි'යි ද නො හඟනේ යි.

804. හේ පළමු ගත් ආත්මදෘෂ්ටිය හැරපියා චතුර්උපාදානයෙන් කිසි-වක් නො ගන්නේ ඥනයෙහි දු තෘෂ්ණාදෘෂ්ටිනිඃශ්‍රය නො කෙරෙයි. හෙතෙම ඒකාන්තයෙන් දෘෂ්ටි විසින් භින්න සත්ත්වයන් කෙරෙහි ඡන්‍දාදි විසින් අගතියට නො යන සැහැවි ඇතියේ වෙයි. හෙ කිසි දෘෂ්ටියකට නො එන්නේ වේ.

805. යම් රහත්මහණක්හට ඵස්ස– ඵස්සසමුදයාදි හෙද වූ උභයාන්ත-යෙහිත් පුනපුනාභවය පිණිසත් ස්වාත්මභාවයෙහි හෝ පරාත්මභාවයෙහි හෝ තෘෂ්ණා ප්‍රණිධි නැත් ද, ඒ රහත්හට කිසි තෘෂ්ණාදෘෂ්ටිනිවෙසන කෙනෙක් නො වෙති. දෙසැටමිසදිටුදම්හි නිශ්චය කොට දැඩි වැ ගන්නා-ලද්දෙක් ද නැත්තේ යි.

806. එ රහත් මහණහට රූපායතනසඞ්ඛ්‍යාත දෘෂ්ටශුද්ධියෙහි හෝ ශ්‍රැතශුද්ධියෙහි හෝ මුතශුද්ධියෙහි හෝ තෘෂ්ණාදෘෂ්ටි විසින් ප්‍රකල්පිත වූ අණුමාත්‍ර වූත් සංඥසමුට්ඨාපිකදෘෂ්ටියෙක් නැත. මෙ සත්ත්වලොකයෙහි දෙසැටමිසදිටු නො ගන්නා එ බාහිතපාපී බ්‍රාහ්මණයා රාගාදි වූ කවර-හෙතුයෙකින් විකල්පනය කරන්නේ ද?

807. එ රහත්මහණහු තෘෂ්ණාදෘෂ්ටිකල්පයන් නො කෙරෙති. ඔවුන් පෙරටු කොට නො හැසිරෙති. දෙසැටමිසදිටු දහම්හු ද ඔවුන් විසින් නො පිළිගන්නාලදහ. ක්ෂීණාස්‍රවබ්‍රාහ්මණ ශීලව්‍රතයෙන් යළි කෙලෙසුන්කරා පැමිණවිය නො හැකි වෙයි. තාදීවූ රහත්තෙම නිර්වාණපාරයට ගියේ මහනැණින් නැසූ කෙලෙසුනට යළි නො එන්නේ යි.

**පරමට්ඨක සූත්‍රය නිමි.**

## 4 – 6

## ජරා සූත්‍රය

808. මෙ මනුෂ්‍ය ජීවිතය ඒකාන්තයෙන් අල්ප වෙයි. හවුරුදු සිය-යෙකින් මෙපිට (කලලාදි අවස්ථායෙහි) දු මියෙයි. ඉදින් යමෙක් සියක් වස් ඉක්මැ ජීවත් වේ නම්, එකල හේ ජරායෙනුදු මියන්නේ යි.



Free Distribution www.aathaapi.org

809 සොචන්ති ජනා මමායිතෙ
න හි සන්ති නිච්චා පරිග්ගහා,
විනාභාවං[1] සන්තමෙවිදං
ඉති දිස්වා නාගාරමාවසෙ.

810 මරණෙනපි තං පහීයති
යං පුරිසො මමිදන්ති[2] මඤ්ඤති,
එතං දිස්වාන[3] පණ්ඩිතො
න මමත්තාය නමෙථ මාමකො.

811 සුපිනෙන යථාපි සඞ්ගතං
පටිබුද්ධො පුරිසො න පස්සති,
එවම්පි පියායිතං ජනං
පෙතං කාලකතං න පස්සති.

812 දිට්ඨාපි සුතාපි තෙ ජනා
යෙසං නාමමිදං පවුච්චති,
නාම මෙවාවසිස්සති
අක්ඛෙය්‍යං පෙතස්ස ජන්තුනො.

813 සොකපරිදෙව මච්ඡරං
න ජහන්ති ගිද්ධා මමායිතෙ,
තස්මා මුනයො පරිග්ගහං
හිත්වා අචරිංසු ඛෙමදස්සිනො.

814 පතිලීනචරස්ස භික්ඛුනො
භජමානස්ස විවිත්තමාසනං,
සාමග්ගියමාහු තස්ස තං
යො අත්තානං භවනෙ න දස්සයෙ.

815 සබ්බත්ථ මුනී අනිස්සිතො
න පියං කුබ්බති නොපි අප්පියං,
තස්මිං පරිදෙව මච්ඡරං
පණ්ණෙ වාරි යථා න ලිප්පති.

---

1. විනාභාව-සීමු 2,
2. මමයිදන්ති-සීමු 2,
3. එවමෙ, විදිත්වා-සීමු 2, එවං දිස්වාන- (නිද්දෙස)



Free Distribution www.aathaapi.org

809. සත්ත්වයෝ තෘෂ්ණාදෘෂ්ටි විසින් මමත්වයෙන් ගත් වස්තුයෙහි ශෝක කෙරෙති. එතෙකුදු වුව නිත්‍ය වූ පරිග්‍රහයෝ නො මැ වෙති. මෙ විනාභාවය විද්‍යමාන මැ වේ යයි මෙසේ නුවණින් දැකැ විඥපුරුෂ ගිහි-ගෙයි නො වසන්නේ යි.

810. පුරුෂ යම් රූපාදියක් 'මේ මාගේ' යයි මඤ්ඤනා වශයෙන් හඟනේ නම්, එය මරණිනුදු දුරුකරණු ලැබෙයි. බුද්ධාදීන් කෙරෙහි මාමක වූ පණ්ඩිත තෙමේ රූපාදියෙහි තෙල ආදීනවය දැකැ මමත්වයට නො නැමෙන්නේ යි.

811. පුරුෂ සිහිනෙන් දක්නා ලද චන්ද්‍රාදි කිසිවක් පිබිදියේ යම්සේ නො දක්නේ ද, එසෙයින් පරලොව ගිය, කලුරිය කළාවූ ප්‍රිය කළ සත්ත්වයා නො දක්නේ යි.

812. ක්ෂත්‍රියාදි යම් කෙනකුන් ගේ මේ නාමප්‍රඥප්තියයැ යි කියනු ලැබේ නම්, එ සත්ත්වයෝ වනාහි චක්ඛු විඤ්ඤාණාභිසම්භූත වූ චතුසමුට්ඨානිකරූපයෝත් සොතවිඤ්ඤාණාභිසම්භූත වූ ද්විසමුට්ඨානික ශබ්දයෝත් වෙති. මියැ පරලොව ගිය සත්ත්වයාගේ නාමමාත්‍රය මැ කියන්නට ඉතිරි වේ.

813. මමායන කළ වස්තුයෙහි ගිජු වූවාහු ශෝකපරිදේවමාත්සර්යය යම් හෙයකින් නො හරිත් ද, එහෙයින් මැ මුනිහු තෘෂ්ණාදෘෂ්ටිපරිග්‍රහය හැරපියා ක්ෂෙමසඞ්ඛ්‍යාත නිර්වාණය දක්මින් වාස කළහ.

814. ඒ ඒ අරමුණෙන් වැළැහු සිත්හසර ඇති, විවේක සෙනසුන් සෙවනා වූ කල්‍යාණ පුහුදුන් වූ හෝ ශෛක්ෂ වූ හෝ මහණහට ද, නිරයාදි භවයෙහි (ප්‍රතිසන්ධි විසින්) තමා නො දක්වන එ රහත්මහණහට ද නිර්වාණසාමග්‍රියෙහි ලා (නිරයාදි භවනෙහි තමා නො දක්වීම) අනුරූප යයි කියත්.

815. ද්වාදශායතන නම් වූ හැම තන්හි තෘෂ්ණා- දෘෂ්ටි නිඃශ්‍රය රහිත වූ රහත් මුනිතෙම (සත්ත්ව සංස්කාර කෙරෙහි) ප්‍රිය නො කෙරෙයි, අප්‍රිය ද නො කෙරෙයි. එ රහත්මුනිහු කෙරෙහි පරිදේව හා මාත්සර්යය පියුම්පත්හි දිය සෙයින් නො ඇලේ.



Free Distribution www.aathaapi.org

816 උදබින්දු යථාපි පොක්ඛරෙ
පදුමෙ වාරි යථා න ලිප්පති,
එවං මුනි නොපලිප්පති
යදිදං දිට්ඨසුතං මුතෙසු වා.

817 ධොනො න හි තෙන මඤ්ඤති
යදිදං දිට්ඨසුතං මුතෙසු වා,
නාඤ්ඤෙන විසුද්ධිමිච්ඡති
න හි සො රජ්ජති නො විරජ්ජතීති.

**ජරාසුත්තං නිට්ඨිතං.**

## 4–7

## තිස්සමෙත්තෙය්‍ය සුත්තං

818 මෙථුනමනුයුත්තස්ස (ඉච්චායස්මා– තිස්සොමෙත්තෙය්‍යො)
විඝාතං බ්‍රෑහි මාරිස,
සුත්වාන තව සාසනං
විවෙකෙ සික්ඛිස්සාම සෙ.

819 මෙථුනමනුයුත්තස්ස (මෙත්තෙය්‍යාති භගවා)
මුස්සතෙවාපි සාසනං,
මිච්ඡා ච පටිපජ්ජති
එතං තස්මිං අනාරියං.

820 එකො පුබ්බෙ චරිත්වාන
මෙථුනං යො නිසෙවති,
යානං භන්තං ව තං ලොකෙ
හීනමාහු පුථුජ්ජනං.

821 යසො කිත්ති ච යා පුබ්බෙ
හායතෙ වා පි තස්ස සා,
එතම්පි දිස්වා සික්ඛෙථ
මෙථුනං විප්පහාතවෙ.

822 සංකප්පෙහි පරෙතො සො
කපණො විය ඣායති,
සුත්වා පරෙසං නිග්ඝොසං
මඞ්කු හොති තථාවිධො.



Free Distribution www.aathaapi.org

816. පොකුරුපත්හි යම්සේ දිය බිඳු නො ඇලේ ද, පියුම්පෙතෙහි යම්සේ දිය නො රැඳේ ද, එසෙයින් ක්ෂීණාසුව මහණ දිට්ඨ සුතයෙහි හෝ මුතයෙහි හෝ නො ඇලේ.

817. ධූතපාප වූ ක්ෂීණාසුව තෙම යම්බඳු මෙ දිට්ඨ- සුත- මුත යන ආලම්බන වේ නම් එ වස්තුයෙන් මඤ්ඤනා විසින් නො සිතයි, හෙ අනෙක් අශුද්ධමාර්ගයකිනුදු ශුද්ධිය නො පතයි. හේ එහි (බාල පෘථුජ්ජනයන් මෙන්) නො ඇලෙයි, කල්‍යාණ පෘථජ්ජනයන් හා ක්ශෛක්ෂයන් මෙන් විරාග ද නො වේ.

**ජරා සූත්‍රය නිමි.**

## 4 – 7

## තිස්සමෙත්තෙය්‍ය සූත්‍රය

818. නිදුකානන්වහන්ස, මෙවුන්දම්හි අනුයුක්තහට වන උවදුරු මෙයයි වදළ මැනැව, මුඹවහන්සේ ගේ අනුශාසනය අසා ත්‍රිවිධ විවෙකයෙහි හික්මෙනුවම්හ (ආයුෂ්මත් තිෂ්‍ය මෛත්‍රෙය මෙසේ විචාළේයි.)

819. (මෙසේ බුදුරජානන්වහන්සේ වදළසේක,) මෙත්තෙය්‍යයෙනි, මෙවුන්දම්හි නියුක්තයාහට පර්යාප්ති ප්‍රතිපත්තිශාසනය පිරිහේ මැයි, හෙ වරදවා සසුන් පිළිපදනේ ද වෙයි. ඔහුකෙරෙහි නෙල මිථ්‍යාප්‍රතිපද් අනාර්යධර්මයෙකි.

820. යමෙක් පෙර (පැවිද්දෙන්) එකලා වැ ලොවැ හැසිර පසු කල්හි මෙවුන්දම් සෙවුනේ නම් අදන්ත (හස්ත්‍යශ්වාදි) යානයක් සෙයින් එ (සිවුරලූ) පුහුදුනා හීන යයි කියත්.

821. පෙර මහණ බැවිහිදී ඔහුගේ යම් යශසෙක් ද කීර්තියෙක් ද වී නම්, එ යශය හා කීර්තිය පිරිහේ මැයි. මෙ යශස් කීර්ති හානිය දැක මෙවුන්දම් දුරලනු සඳහා ත්‍රිවිධශික්ෂායෙහි හික්මෙන්නේ යි.

822. කාමාදිසංකල්පයෙන් මැඩුනු එ සිවුරලූ දිළින්දකු සෙයින් සිත යි. එබඳු පුහුල් උපාධ්‍යායාදි අන්‍යයන්ගේ වදන් අසා මකු වන්නේ යි.

823 අථ සත්ථානි කුරුතෙ
පරවාදෙහි චොදිතො,
එස ඛ්වස්ස මහාගෙධො
මොසවජ්ජං පගාහති.

824 පණ්ඩිතොති සමඤ්ඤාතො
එකචරියං අධිට්ඨිතො,
අථාපි මෙථුනෙ යුත්තො
මන්දොව පරිකිස්සති.

825 එතමාදීනවං ඤත්වා
මුනි පුබ්බාපරෙ ඉධ,
එකචරියං දළ්හං කයිරා
න නිසෙවෙථ මෙථුනං.

826 විවෙකං යෙව සික්ඛෙථ
එතදරියානමුත්තමං,
න තෙන සෙට්ඨො මඤ්ඤෙථ
ස වෙ නිබ්බානසන්තිකෙ.

827 රිත්තස්ස මුනිනො චරතො
කාමෙසු අනපෙක්ඛිනො
ඔඝතිණ්ණස්ස පිහයන්ති
කාමෙසු ගථිතා[1] පජා.

**තිස්සමෙත්තෙය්‍යසුත්තං නිට්ඨිතං.**

## 4 – 8

## පසූර සුත්තං

828 ඉධෙව සුද්ධි ඉති වාදියන්ති[2]
නාඤ්ඤෙසු ධම්මෙසු විසුද්ධිමාහු,
යං නිස්සිතා තත්ථ සුභං වදානා
පච්චෙකසච්චෙසු පුථූ නිවිට්ඨා.

1. ගධිතා–මජසං.
2. වාදියන්ති–සීමු 2, PTS



Free Distribution www.aathaapi.org

823. ඉක්බිති පරවාදයෙන් චෝදිතවූ හේ දුශ්චරිත නැමැති ශස්ත්‍රයන් කෙරෙයි, මෘෂාවාදයට බැස ගණියි, එ වූකලි ඔහට මහා බන්ධනයෙකි.

824. පළමු 'පණ්ඩිතයෙකැ'යි ප්‍රසිද්ධ වූ එකලා වාසයෙහි පිහිටි හෙ (පසුකල්හි) මෙවුන්දම්හි නියැළියේ මූඪයකු සෙයින් කෙලෙසෙන්නේ යි.

825. මෙ සස්නෙහි මුනිතෙම පෙර මහණදම්හි සැපත් හා පසු (ගිහි-කල) විපත් හා යන තෙල ආදීනව දැක එකලා වාසය දැඩි කරන්නේ ය, මෙවුන්දම් නො සෙවුනේ යි.

826. බුද්ධාදි ආර්යයන්ගේ උත්තම වූ තෙල ත්‍රිවිධවිවෙකයෙහි මැ හික්මෙන්නේ ය. ඒ විවෙකය හේතු කොට ගෙණ 'මම ශ්‍රේෂ්ඨ යෙමි'යි ද නො හඟනේ ය. හෙ එකාන්තයෙන් නිවන සමීපයෙහි වන්නේ යි.

827. කායදුශ්චරිතාදියට නිමිත්ත වූ කෙලෙසුන් කෙරෙන් සිස් වූ හුදෙකලාව හැසිරෙන, කාමයන්හි අපේක්ෂා නැති, චතුරොඝතරණය කළ රහත් මුනිහට කාමයන්හි ගිජුවූ සත්ත්වයෝ කැමැති වෙත්.

**තිස්සමෙත්තෙය්‍ය සූත්‍රය නිමි.**

## 4 – 8

## පසූර සූත්‍රය

828. යම් ශාස්තෘ– ශාසනාදියක් ඇසුරුකළා වූ (තමන් විසින් පිළි-ගත්) එ දෘෂ්ටියෙහි ම ශුභවාද ඇති, ප්‍රත්‍යෙකදෘෂ්ටි සත්‍යයන්හි බැසගත් බොහෝ මහණබමුණෝ වෙත් නම්, ඔහු "මෙහි මැ ශුද්ධිය වේ ය"යි වාද කෙරෙති. "අන්‍ය ධර්මයන්හි විශුද්ධිය නැතැ"යි කියත්.

829 තෙ වාදකාමා පරිසං විගය්හ
බාලං දහන්ති මිථු අඤ්ඤමඤ්ඤං,
වදන්ති තෙ අඤ්ඤසිතා කථොජ්ජං
පසංසකාමා කුසලා වදානා.

830 යුත්තො කථායං පරිසාය මජ්ඣෙ
පසංසමිච්ඡං විනිඝාති හොති,
අපාහතස්මිං පන මඞ්කු හොති
නින්දාය සො කුප්පති රන්ධමෙසී.

831 යමස්ස වාදං පරිහීනමාහු
අපාහතං පඤ්හවීමංසකා සෙ,
පරිදෙවති සොචති හීනවාදො
උපච්චගා මන්ති අනුත්ථුනාති.

832 එතෙ විවාදා සමණෙසු ජාතා
එතෙසු උග්ඝාති නිඝාති හොති,
එතම්පි දිස්වා විරමෙ කථොජ්ජං
න හඤ්ඤදත්ථත්ථි පසංසලාභා.

833 පසංසිතො වා පන තත්ථ හොති
අක්ඛාය වාදං පරිසාය මජ්ඣෙ,
සො තං හසති උන්නමතිච[1] තෙන
පප්පුය්‍ය තමත්ථං[2] යථාමනො අහු.

834 යා උන්නති සාස්ස විඝාතභූමි
මානාතිමානං වදතෙ පනෙසො,
එතම්පි දිස්වා න විවාදයෙථ
න හි තෙන සුද්ධිං කුසලා වදන්ති.

835 සූරො යථා රාජඛාදය පුට්ඨො
අභිගජ්ජමෙති පටිසූරමිච්ඡං,
යෙනෙව සො තෙන පලෙහි සූර
පුබ්බෙව නත්ථි යදිදං යුධාය.

1. සො හසති උන්නමති ච - සිමු 2,
2. තං අත්ථං - සිමු 2.



Free Distribution www.aathaapi.org

829. වාද කැමැති ඔහු පිරිස් මැදට වැද උනුන් බාල යයි දක්නාහ. අන්‍ය ශාස්තෘ ආදීන් ඇසුරු කළ ඔහු ප්‍රශංසා කැමැත්තාහු "අපි පණ්ඩිතවාද ඇතියම්හ"යි විවාද කථා බෙණෙත්.

830. පිරිස්මැද වාදකථායෙහි නියුතුයේ තමහට පැසැසුම් කැමැතියේ කෙසේ පිළිමල්හු නිගන්නෙම් දැයි සැක ඇතියේ වෙයි. විමංසකයන් විසින් ඔහුගේ වාදය බැහැර කරත් මැ මකු වෙයි. පිළිමල්හු ගේ සිදුරු සොයන හෙ තින්දයෙන් කෝපයට පැමිණේ.

831. ප්‍රශ්න විමංසකයෝ යම්හෙයෙකින් ඔහුගේ වාදය හීනවූයේ බැහැර කරණලදැයි කියත් නම්, පිරිහුනු වාද ඇති හෙතෙම මා වාදයෙන් ඉක්ම ගියේ ය''යි වැලැපෙයි, ශොක කෙරෙයි, තතනයි.

832. මෙල විවාදයෝ අන්‍යතීර්ථක පරිව්‍රාජකයන් කෙරෙහි උපන්-නාහු වෙති. මෙල වාදයන්හිදී අනුග්‍රහ නිග්‍රහ ද වෙයි. මෙල ආදීනව දැකැ කලහය හැරපියන්නේ ය. යම්හෙයෙකින් මෙ විවාදයෙහි ප්‍රශංසාලාභයෙන් අන්‍ය වූ අර්ථයෙක් නැත් ද, එ හෙයිනි.

833. යමෙක් තමා විසින් ගන්නාලද එ දෘෂ්ටියෙහි පසස්නාලදූයේ හෝ වේ නම්, පිරිස් මැද එ දෘෂ්ටිවාදය පවසා එ ජයාර්ථය ලැබ සිත් සේ හේ එ ජයහේතුයෙන් සිනා සෙයි. යළි උඩඟු ද වේ.

834. යම් චිත්තෝන්නතියෙක් (උඩඟු බවෙක්) වේ නම් එය ඔහට උපද්‍රව භූමි වෙයි. මෙල පුහුල් මානය හා අතිමානය කියයි, මෙල දෙෂය දැකැ, නො මැ විවාද කරන්නේ ය, ස්කන්ධායතනාදියෙහි කුශලයෝ එ දෘෂ්ටිවාදයෙන් ශුද්ධිය (වේ යයි) නො මැ කියත්.

835. යම පරිදි රාජභොජනයෙන් පුස්නාලද ශූරයෙක් පිළිමල්හු පතමින් අභිගර්ජනය කරමින් එළඹෙයි ද, ශූරය, තාගේ එ පිළිමල් තෙමේ යම් තැනෙක්හි වෙයි නම්, තෝ එහි පලායා. කලහ සඳහා (මාතුළ) යම් කෙලෙස් කෙනෙක් වෙත්නම් ඔහු පළමු මැ (බෝ මුල්හිදී නැසූ හෙයින් මට) නැති.

836 යෙ දිට්ඨිමුග්ගය්හ විවාදයන්ති[1]
ඉදමෙව සච්චන්ති ච වාදයන්ති,[2]
තෙ ත්වං වදස්සු න හි තෙධ අත්ථි
වාදම්හි ජාතෙ පටිසෙනිකත්තා.

837 විසෙනිකත්වා පන යෙ චරන්ති
දිට්ඨීහි දිට්ඨිං අවිරුජ්ඣමානා,
තෙසු ත්වං කිං ලභෙථො පසූර
යෙසීධ නත්ථි පරමුග්ගහීතං.

838 අථ ත්වං පවිතක්කමාගමා
මනසා දිට්ඨිගතානි චින්තයන්තො,
ධොනෙන යුගං සමාගමා
න හි ත්වං සක්ඛසි සම්පයාතවෙ.

පසූරසුත්තං නිට්ඨිතං.

## 4 – 9

## මාගන්දිය සුත්තං

839 දිස්වාන තණ්හං අරතිං රගඤ්ච[3]
නාහොසි ඡන්දො අපි මෙථුනස්මිං,
කිමෙවිදං මුත්තකරීසපුණ්ණං
පාදපි නං සම්ඵුසිතුං න ඉච්ඡෙ.

840 එතාදිසං චෙ රතනං න ඉච්ඡසි
නාරිං නරින්දෙහි බහූහි පත්ථිතං,
දිට්ඨිගතං[4] සීලවතානුජීවිතං[5]
භවූපපත්තිඤ්ච වදෙසි කීදිසං.

841 ඉදං වදාමීති න තස්ස හොති (මාගන්දියාති භගවා)
ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං,
පස්සඤ්ච දිට්ඨීසු අනුග්ගහාය
අජ්ඣත්තසන්තිං පචිනං අදස්සං.

---

1. විවාදියන්ති – සිමු 2
2. වාදියන්ති – සිමු 2
3. අරතිං ච රාගං–සයා,
4. දිට්ඨිගතං–මජසං–සිමු 2
5. සීලවතං නු ජීවිතං–මජසං, සීලබ්බතානුජීවිතං–සිමු 2



Free Distribution www.aathaapi.org

836. යම් කෙනෙක් මිසදිටු දැඩිව, ගෙණ විවාද කෙරෙත් ද, යළි මෙය මැ සත්‍යයයි කියත් නම්, තෝ ඔවුනට කියව. වාදයක් උපන්කල්හි පිළිලොම් කරණ ඕහු මෙ සස්නෙහි නැති හෙයිනි.

837. යම් කෙනෙක් කෙලෙස් මරසෙන් වනසා දෘෂ්ටියෙන් දෘෂ්ටියකට විරුද්ධ නොවෙමින් වෙසෙත් නම්, මෙ සස්නෙහි යම් කෙනකුන්ට මෙ උත්තම යයි දැඩි වැ ගන්නාලද්දක් නැත් ද, පසූරය, එබඳු රහතුන් කෙරෙහි තෝ කවරකු ප්‍රතිමල්ල කොට ලබනෙහි ද?

838. වැලිත් තෝ සිතින් දෘෂ්ටිගතයන් සිතමින් (මට මින් ජයවේ-දෝහෝ යි) විතර්ක කරමින් ආයෙහි, ධූතක්ලේශ වූ බුදුන් සමග යුගග්‍රාහයට ආයෙහි, එහෙත් තෝ (බුදුන් කරා වාදයෙන්) එළඹෙන්නට නො මැ හැකියෙහි.

පසූර සූත්‍රය නිමි.

## 4 – 9

## මාගන්දිය සූත්‍රය

839. තෘෂ්ණා යැ, අරති යැ, රගා යැ (යන තුන්මරදූන්) දක මෙවුන් දම්හි ඡන්දයෙකුදු නො වී ය. මලමූයෙන් පුන් මෙ සිරුර දක කවර හෙයින් ඡන්දයෙක් විය හේ ද? (නො හේ මැයි) එ සිරුර පයිනුදු පහස්නට නො කැමතියෙමි.

840. බොහෝ නිරිඳුන් විසිනුදු පතන ලද මෙබඳු ස්ත්‍රී රත්නයක් නො කැමැත්තහු නම්, තොපගේ දෘෂ්ටි ගතයත් ශීලව්‍රතයත් ජීවිතයත් භවොත්පත්තියත් කෙබඳු දැයි කියව.

841. මාගන්දියෙනි, "දෙසැට මිසදිටු දම්හි නිශ්චය කොට 'මෙ මැ සැබැවයි කියමියි'' යි දැඩි කොට ගන්නාලද්දෙක් කෙලෙසුන් දිනූ එ මට නො වෙයි. වැළිදු දෙසැට දිටු දහම්හි ආදීනව දක්නෙම් කිසිදු දෘෂ්ටියක් සත්‍ය සේ නො ගෙණ සිවුසස්දම් සොයනුයෙම් අධ්‍යාත්මශාන්තිය වන නිවන දිටිමි'' යි බුදුහු මෙසේ වදළහ.

842 විනිච්ඡයා යානි පකප්පිතානි (ඉති මාගන්දියො)
තෙ වෙ මුනි බ්‍රෑසි අනුග්ගහාය,
අජ්ඣත්තසන්තීති යමෙතමත්ථං
කථං නු ධීරෙහි පවෙදිතං තං.

843 න දිට්ඨියා න සුතියා න ඤාණෙන (මාගන්දියාති භගවා)
සීලබ්බතෙනාපි න සුද්ධිමාහ,
අදිට්ඨියා අස්සුතියා අඤාණා[1]
අසීලතා අබ්බතා නොපි තෙන
එතෙ ච නිස්සජ්ජ අනුග්ගහාය
සන්තො අනිස්සාය භවං න ජප්පෙ.

844 නො චෙ කිර දිට්ඨියා න සුතියා න ඤාණෙන
(ඉති මාගන්දියො)
සීලබ්බතෙනාපි විසුද්ධිමාහ
අදිට්ඨියා අස්සුතියා අඤාණා,
අසීලතා අබ්බතා නොපි තෙන
මඤ්ඤාමහං මොමුහමෙව ධම්මං
දිට්ඨියා එකෙ පච්චෙන්ති සුද්ධිං.

845 දිට්ඨිඤ්ච නිස්සාය අනුපුච්ඡමානො (මාගන්දියාති භගවා)
සමුග්ගහීතෙසු පමොහමාග
ඉතො ච නාද්දක්ඛි අණුම්පි සඤ්ඤං,
තස්මා තුවං මොමුහතො දහාසි.

846 සමො විහෙසි උද වා නිහීනො
යො මඤ්ඤති සො විවදෙථ තෙන,
තීසු විධාසු අවිකම්පමානො
සමො විසෙසීති න තස්ස හොති.

847 සච්චන්ති සො බ්‍රාහ්මණො කිං වදෙය්‍ය
මුසාති වා සො විවදෙථ කෙන,
යස්මිං සමං විසමං වාපි නත්ථි
ස කෙන වාදං පටිසංයුජෙය්‍ය.

1. අඤ්ඤාණා-සිමු 2.



Free Distribution  www.aathaapi.org

842. විනිශ්චය කොට ගත් යම ප්‍රකල්පිත දෙසැට දෘෂ්ටිහු වෙත් ද, එ දෘෂ්ටි ධර්මයන් සර්වඥමුනි වූ තෙපි ඒකාන්තයෙන් නො ගණ්ණ, තෙල අධ්‍යාත්මශාන්තිය යි යමක් වදළහු නම් ධීරයන් විසින් එ පරමාර්ථය කෙසේ ප්‍රකාශ කරන ලදද යි (මාගන්දිය බ්‍රාහ්මණ මෙසේ ඇසීය.)

843. මම දෘෂ්ටියෙනුදු ශුද්ධිය නො කියමි. ශ්‍රැති යෙනුදු, සමාපත්ති ඥනයෙනුදු ශීලව්‍රතයෙනුදු ශුද්ධිය නොකියමි. දශවස්තුක සම්‍යග්දෘෂ්ටි යෙන් තොර වැ නවාඞ්ගශ්‍රැතියෙන් තොර වැ කර්මස්වකතා සත්‍යානු ලොමිකඥනයෙන් තොර වැ ප්‍රාතිමොක්ෂ සංවරශීලයෙන් තොර වැ ධුතාඞ්ගව්‍රතයෙන් තොර වැ ශුද්ධිය නො කියමි. තෙල සම්‍යග්දෘෂ්ටි ආදිමාත්‍රයෙකිනුදු නො කියමි. තෙල දෘෂ්ටි ආදි ධර්මයන් හැරපියා අදෘෂ්ටි ආදි ධර්මයන් ග්‍රහණ කොට ශාන්ත පුද්ගල චක්ෂුරාදිය නිඃශ්‍රය නො කොට කාමාදි භවය නො පතන්නට සමර්ථ වන්නේය යි බුදුහු වදළ සේක.

844. ඉදින් දෘෂ්ටියෙන් ශුද්ධිය නො කියවු නම්, ශ්‍රැතියෙන් සමාපත්ති ඥනයෙන් ශීලව්‍රතයෙන් ද නො කියවු නම් යළි දෘෂ්ටියෙන් වෙන් වැ ශ්‍රැතියෙන් වෙන් වැ ඥනයෙන් වෙන් වැ ශීලයෙන් හා ව්‍රතයෙන් ද වෙන් වැ ශුද්ධිය නො කියවු නම්, එ දෘෂ්ට්‍යාදී මාත්‍රයෙනුදු නො කියවු නම්, මම තොපගේ මෙ දහම අතිශයින් මුළා වූවක් මැ කොට හඟනෙමි. ඇතැම් කෙනෙක් දෘෂ්ට්‍යාදිමාත්‍රයෙන් ශුද්ධිය කැමැති වෙත් යයි (මාගන්දිය කී යැ.)

845. "මාගන්දියෙනි, දෘෂ්ටිය ම ඇසුරු කොට පුන පුනා විචාරන්නෙහි දැඩි වැ ගන්නාලද දෘෂ්ටීන් කෙරෙහි ප්‍රකර්ෂ මොහයට පැමිණියෙහි, යම්හෙයෙකින් මෙ දහමින් මදවූ සංඥවකුදු නුදුටු යෙහි ද, එහෙයින් තෝ අති මුළා සෙයින් දක්නෙහි යයි (භාග්‍යවතුන්වහන්සේ වදළහ.)

846. "මම සම වෙමි, විශිෂ්ට වෙමි, නොහොත් හීනවෙමි"යි යමෙක් මාන කෙරේ නම්, හෙතෙම එ මානයෙන් හෝ දෘෂ්ටියෙන් හෝ පුද්ගලයා සමග හෝ විවාද කෙරෙයි. යමෙක් එ ත්‍රිවිධමානයෙහි නො සැලේ නම් 'සම වෙමි, විශිෂ්ට වෙමි,' යන මානය ඔහට නො වේ."

847. එ රහත් බමුණු 'මෙ මැ සැබවැයි' කවර නම් වස්තුවක් හෝ කරුණක් නිසා කියන්නේ ද? තා කියන්නේ මුසවා යයි හෝ හෙතෙම කවරකු හා විවාද කරන්නේ ද? යම් පුහුලකු කෙරෙහි සමමානය හෝ විෂමමානය හෝ නැද්ද, හෙතෙම කවර මානයෙකින් වාදයෙහි යෙදේ ද?

848 ඔකම්පහාය අනිකෙතසාරී
ගාමෙ අකුබ්බං මුනි සන්ථවානි,
කාමෙහි රිත්තො අපුරෙක්ඛරානො
කථං න විග්ගය්හ ජනෙන කයිරා.

849 යෙහි විවිත්තො විචරෙය්‍ය ලොකෙ
න තානි උග්ගය්හ වදෙය්‍ය නාගො,
එලම්බුජං[1] කණ්ටකං වාරිජං යථා
ජලෙන පඞ්කෙන චනූපලිත්තං,
එවං මුනී සන්තිවාදෙ අගිද්ධො
කාමෙ ච ලොකෙ ච අනූපලිත්තො.

850 න වෙදගූ දිට්ඨියා න මුතියා
ස මානමෙති න හි තම්මයො සො,
න කම්මුනා නොපි සුතෙන නෙය්‍යො
අනූපනීතො ස[2] නිවෙසනෙසු.

851 සඤ්ඤාවිරත්තස්ස න සන්ති ගන්ථා
පඤ්ඤාවිමුත්තස්ස න සන්ති මොහා,
සඤ්ඤඤ්ච දිට්ඨිඤ්ච යෙ අග්ගහෙසුං
තෙ ඝට්ටයන්තා[3] විචරන්ති ලොකෙති.

මාගන්දියසුත්තං නිට්ඨිතං.

## 4-10

## පුරාභෙද සුත්තං

852 කථංදස්සී කථංසීලො උපසන්තොති වුච්චති,
තං මෙ ගොතම පබ්‍රූහි පුච්ඡිතො උත්තමං නරං.

853 වීතතණ්හො පුරා භෙදා (ඉති භගවා) පුබ්බමන්තමනිස්සිතො,
වෙමජ්ඣෙනුපසඞ්ඛෙය්‍යො තස්ස නත්ථි පුරෙක්ඛතං.

1. ජලම්බුජං - සිමු 2
2. සො - සිමු 2.
3. ඝට්ටමානා - ස්‍යා.



Free Distribution www.aathaapi.org

848. (රූපනිමිත්තාදි නිකෙතයෙහි නො හැසිරෙන හෙයින්) අනිකෙත සාරි වූ ක්ෂීණාශ්‍රව මුනි තෙම රූපචක්ෂුරාදි විඥාන ගොචරය වූ ඔකය හැරපියා ගම්හි ගිහී සන්ථවයන් නො කරමින් කාමයන් කෙරෙන් විරක්ත වූයේ තෘෂ්ණා වශයෙක් වට්ටය පෙරටු නො කරන්නේ ජනයා හා සමග විග්‍රාහික කථාව නො කරන්නේ යි.

849. ක්ෂීණාශ්‍රව නාග තෙම යම් දෘෂ්ටිගතාදියෙකින් වෙන් වූයේ ලොකයෙහි හැසිරේ නම්, (හෙ) එ දෘෂ්ටිගතයන් දැඩි වැ ගෙන නො කියන්නේ ය. එල සඞ්ඛ්‍යාත ජලයෙහි උපන් කටු සහිත දඬු ඇති පියුමාදියෙන් හා කලලින් යම් පරිදි නො තැවරේ ද, එ සෙයින් මුනි තෙම ශාන්ති වාද ඇතියේ තෘෂ්ණා රහිත වූයේ කාමයෙහි ද ලොකයෙහි ද නො ඇලුනේයි.

850. (මා වැනි) සිවුමග නුවණට පැමිණියෙක් දෘෂ්ටියට නො යන්නේ ය. හෙ (මුත රූපාදි භෙද ඇති) මුතියෙනුදු මානයට නො එයි. හෙතෙම තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් නො මූ තම්මය ය වෙයි. නො ද කර්මයෙන් නො ද ශ්‍රුතයෙන් පැමිණැ විය යුත්තේ වෙයි, හෙ හැම තෘෂ්ණාදෘෂ්ටිනිවෙශනයන්හි අනුපනීත වේ.

851. ප්‍රහීන කළ කාමාදි සංඥා ඇත්තහුට (අභිධ්‍යාකායාදි) ග්‍රන්ථයෝ නො වෙති. විදර්ශනා ප්‍රඥාවෙන් කෙලෙසුන් කෙරෙන් මිදුනහුට මොහයෝ නො වෙති. යම් කෙනෙක් කාමාදි සංඥාවත් දෙසැට මිසදිටුත් දැඩි කොට ගත්හු නම් ඔහු උනුන් ගටමින් ලොවැ හැසිරෙත් යයි.

මාගන්දිය සූත්‍රය නිමි.

## 4 – 10

## පුරාභෙද සූත්‍රය

**(නිර්මිත බුද්ධ:)**

852. කෙබඳු දර්ශන ඇතියේ කෙබඳු සිල් ඇතියේ උපශාන්ත ය යි' කියනු ලැබෙ ද? ගොයුම් ගොතුව, මා විසින් පුළුවුස්නාලදුවහු එ උත්තම පුරුෂයා වදළ මැනැ ව.

853. (බුදුහු මෙසේ වදරති :) ශරීර භේදයෙන් පෙර මැ යමෙක් ප්‍රහීණ වූ තෘෂ්ණා ඇත්තේ පූර්වාන්තය (පෙර අත්බව) තෘෂ්ණා දෘෂ්ටි විසින් ඇසිරි නො කෙළේ ඉහාත්මභාව සඞ්ඛ්‍යාත ප්‍රත්‍යුත්පන්න පඤ්චස්කන්ධයෙහි (රාගරක්තයෙයයනාදීන්) නො ගිණිය යුතුවූයේ ද එ රහත්මහණ හට අනාගතාත්මභාවයෙහි (තෘෂ්ණාදි වශයෙන්) පෙරටු කරණලදුයෙක් නැති.



Free Distribution www.aathaapi.org

854 අක්කොධනො අසන්තාසී අවිකත්ථී අකුක්කුචො,
මන්තභාණී[1] අනුද්ධතො ස වෙ වාචායතො මුනි.

855 නිරාසත්ති අනාගතෙ අතීතං නානුසොචති,
විවෙකදස්සී ඵස්සෙසු දිට්ඨීසු ච න නීයති.[2]

856 පතිලීනො අකුහකො අපිහාලු අමච්ඡරී,
අප්පගබ්භො අජෙගුච්ඡො පෙසුණෙය්‍යෙ ච නො යුතො.

857 සාතියෙසු අනස්සාවී අතිමානෙ ච නො යුතො,
සණ්හො ච පටිභානවා න සද්ධො න විරජ්ජති.

858 ලාභකම්‍යා න සික්ඛති අලාභෙ න ච කුප්පති,
අවිරුද්ධො ච තණ්හාය රසෙසු නානුගිජ්ඣති.

859 උපෙක්ඛකො සදා සතො න ලොකෙ මඤ්ඤතෙ සමං,
න විසෙසී න නීචෙය්‍යො තස්ස නො සන්ති උස්සදා.

860 යස්ස නිස්සයතා නත්ථි ඤත්වා ධම්මං අනිස්සිතො,
භවාය විභවාය වා තණ්හා යස්ස න විජ්ජති.

861 තං බ්‍රෑමි උපසන්තොති කාමෙසු අනපෙක්ඛිනං,
ගන්ථා තස්ස න විජ්ජන්ති අතාරි සො විසත්තිකං.

862 න තස්ස පුත්තා පසවො ඛෙත්තං වත්ථුං ච විජ්ජති[3]
අත්තා වාපි නිරත්තා වා[4] න තස්මිං උපලබ්භති

1. මන්තාභාණී - සයා, PTS
2. නියාති - සිමු 2
3. වත්ථු න විජ්ජති - සිමු 2,
4. අත්තං වාපි නිරත්තං වා - සිමු 2.



Free Distribution www.aathaapi.org

854. නො කිපෙන පියවි ඇති (ඒ ඒ අලාභයෙන්) නො සැලෙන සුලු වූ, (ශීලාදියෙන්) තමා හුවා නො දක්වන සුලු, අත්පා කුකුස් නැති නුවණින් විමසා බණන සුලු වූ, උඩඟු නො වූ ඒ රහත් මහණ ඒකාන්තයෙන් වාග්ද්වාරයෙන් සංයත වේ.

855. අනාගත භවයෙහි තෘෂ්ණා රහිත වූයේ වේ ද අතීතපඤ්චස්කන්ධයට ශෝක නො කෙරේ ද, ප්‍රත්‍යුත්පන්න චක්ෂුස්පර්ශාදියෙහි ආත්මභාවාදි විවෙකය දක්නා සුලු වේ ද, දෙසැට මිසදිටුහි නො වැටේ ද,

856. රාගාදි අකුශලයන් ප්‍රහීණ කෙළේ කුහක නො වූයේ තෘෂ්ණා රහිත වූයේ, මසුරු නො වූයේ කායාදි ප්‍රගල්භතා නැතියේ සිල්සපත් හෙයින් ජුගුප්සා නො කටයුතු වූයේ පිසුනුබස් කීමෙහි නො යෙදුනේ ද,

857. කාමගුණ සඞ්ඛ්‍යාත සාතවස්තූන්හි තෘෂ්ණා රහිත වූයේ අතිමානයෙහි යුක්ත නො වූයේ සිනිඳු කායාදි කර්මයෙන් සපත් වූයේ ප්‍රතිභාන ඇතියේ (තමා විසින් මැ අධිගත වන බැවින්) ධර්මය පරප්‍රත්‍යයෙන් නො හදහන්නේ විතරාග වන හෙයින් දූන් විරාග නො කෙරේ ද, (ඔහු 'උපශාන්ත'යයි කියමි,)

858. ලාභප්‍රාර්ථනායෙන් සූත්‍රාන්තාදිය නො හදරා ද, අලාභයෙහි දු නො කිපේ ද විරොධයෙන් යුක්ත නො වූයේ ද තෘෂ්ණායෙන් රසයෙහිත් ගිජු නො වේ ද (ඔහු 'උපශාන්ත' යයි කියමි.)

859. ෂඩඞ්ගොපෙක්ෂායෙන් යුක්ත වූයේ හැම කල්හි ස්මෘතිමත් වූයේ ලොවිහි කිසිවකු හාත් තමා සම කොට නො සිතා ද, මම විශිෂ්ට වෙමි' යන මාන නැතියේ, හීන වෙමි යන මානත් නැතියේ ද, ඔහට උත්සදයෝ නැත. (ඔහු 'උපශාන්ත' යයි කියමි.)

860. යම් රහත් මහණකුහට තෘෂ්ණාදෘෂ්ටි නිඃශ්‍රයභාවය නැත් ද, යමකුහට භවදෘෂ්ටියෙහි දු විභවදෘෂ්ටියෙහි දු තෘෂ්ණා විද්‍යමාන නො වේ ද, හෙ අනිත්‍යාදි විසින් ධර්මය දූන අනිඃශ්‍රිත වේ.

861. වස්තුකාම ක්ලේශ කාමයන්හි අපේක්ෂා නැති ඒ රහත් මහණ උපශාන්ත යයි කියමි. ඔහට අභිධ්‍යාකායාදි ග්‍රන්ථයෝ නැත. හෙ තෘෂ්ණ නම් වූ විසත්තිකා තරණය කෙළේ යි.

862. ඒ ක්ෂීණාසුව මහණහට පුත්‍රයෝත් නැත. පශුවර්ගයෝ ද නැත. කෙත්වත් ද නැති. ඒ මහණ කෙරෙහි ශාශ්වතදෘෂ්ටි හෝ උච්ඡෙද දෘෂ්ටි හෝ නො ලැබේ.



Free Distribution www.aathaapi.org

863 යෙන නං වජ්ජු පුථුජ්ජනා අථො සමණබ්‍රාහ්මණා,
තං තස්ස අපුරෙක්ඛතං තස්මා වාදෙසු නෙ'ජති.

864 වීතගෙධො අමච්ඡරී න උස්සෙසු වදතෙ මුනි,
න සමෙසු න ඔමෙසු කප්පං නෙති අකප්පියො.

865 යස්ස ලොකෙ සකං නත්‍ථි අසතා ච න සොචති,
ධම්මෙසු ච න ගච්ඡති ස වෙ සන්තොති වුච්චතීති.

පුරාභෙදසුත්තං නිට්ඨිතං.

## 4 – 11

## කලහවිවාද සුත්තං

866 කුතො පහූතා කලහා විවාද
පරිදෙවසොකා සහමච්ඡරා ච,
මානාතිමානා සහපෙසුනා ච
කුතො පහූතා තෙ තදිඞ්ඝ බ්‍රෑහි.

867 පියා පහූතා කලහා විවාද
පරිදෙවසොකා සහමච්ඡරා ච,
මානාතිමානා සහපෙසුනා ච
මච්ඡරියයුත්තා කලහා විවාද
විවාදජාතෙසු ච පෙසුනානි.

868 පියාසු ලොකස්මිං කුතොනිදනා
යෙ වාපි ලොභා විචරන්ති ලොකෙ,
ආසා ච නිට්ඨා ච කුතොනිදනා
යෙ සම්පරායාය නරස්ස හොන්ති.

863. යම් රාගාදි දෙෂයකින් දේවමනුෂ්‍යාදි පෘථග්ජනයෝ ද බාහිර ශාසනික මහණ බමුණෝ ද (රහත්මහණ රාග රක්ත ය යන ආදීන්) කියත් නම්, එ දෙෂය ඔහු විසින් පෙරටු නො කරණ ලද වෙයි, එහෙයින් හේ නින්‍දා වචනයන්හි කම්පිත නො වේ.

864. පහ වූ තෘෂ්ණා ඇති මසුරු නො වූ රහත් මුනි තෙම විශිෂ්ට යන් කෙරෙහි (තමා ඇතුළත් කොට අතිමානයෙන්) නො කියයි. තමා සම පුද්ගලයන් කෙරෙහි ද ලා නො කියයි. හීනයන් කෙරෙහි ද ලා නො කියයි. තෘෂ්ණාදෘෂ්ටි කල්ප නැත්තේ කල්පයනට නො එයි.

865. ලොව්හි යම් ක්ෂීණාස්‍රවයක්හට මාගේ යයි ගන්නා ලද්දෙක් නැත් ද යළි අවිද්‍යමාන වන හෙයින් ම ශොක නො කෙරේ ද, හැම ධර්මයන්හි ඡන්‍දාදි වශයෙන් අගතියට නො යේ ද, එ ක්ෂීණාස්‍රව තෙම ඒකාන්තයෙන් උපශාන්තයෙකැයි කියනු ලැබේ.

**පුරාභෙද සූත්‍රය නිමි.**

## 4 - 11

## කලහවිවාද සූත්‍රය

**පෘච්ඡා:**

866. කලහයෝත් විවාදයෝත් කොතැනින් උපන්හු ද? පරිදෙව ශොකයෝත් මාත්සර්‍ය්‍යයෝත් මානඅතිමානයෝත් පිසුනුබසුත් යන මොහු අටදෙන කොතැනින් ප්‍රභූත වූහු ද? එඅරුත විදළ මැනැව.

**විසර්ජන:**

867. කලහයෝත් විවාදයෝත් පරිදේව ශෝකයෝත් මාත්සර්‍ය්‍යයෝත් මාන-අතිමානයෝත් පෛශුන්‍යයෝත් (යන මොහු අටදෙනා ප්‍රියවස්තූහු කෙරෙන් උපන්හ. කලහවිවාදයෝ ද (පරිදෙව-ශොක-මාන අතිමාන පෛශුන්‍ය යෝ ද) මාත්සර්‍ය්‍යය හා යෙදුනාහු වෙත්, විවාද උපදුත් ම පිසුනු බස් උපදනේ ය.

**පෘච්ඡා:**

868. ලෝකයෙහි ප්‍රියවස්තූහු කොයින් උපන්නාහු ද? නොහොත් කුමක් නිදන කොට ඇත්තාහු ද? ලොව්හි ක්ෂත්‍රියාදි යම් කෙනෙක් ලෝභයෙන් හැසිරෙත් නම් එ ලොභය කුමක් හෝ නිදන කොට ඇත් ද? ආශාවත් එහි සමෘද්ධියත් කුමක් නිදන කොට ඇත්තාහු ද? මනුෂ්‍යයාට යම් ධර්ම කෙනෙක් පරලොව්හි පිහිට පිණිස වෙත් නම්, එ ධර්මයෝ කොයින් උපන්හු ද?



Free Distribution www.aathaapi.org

869 ඡන්දනිදානානි පියානි ලොකෙ
යෙ වාපි ලොභා විචරන්ති ලොකෙ,
ආසා ච නිට්ඨා ච ඉතොනිදානා
යෙ සම්පරායාය නරස්ස හොන්ති.

870 ඡන්දො නු ලොකස්මිං කුතොනිදානො
විනිච්ඡයා වාපි කුතොපහූතා,
කොධො මොසවජ්ජඤ්ච කථංකථා ච
යෙ වාපි ධම්මා සමණෙන වුත්තා.

871 සාතං අසාතන්ති යමාහු ලොකෙ
තමූපනිස්සාය පහොති ඡන්දො,
රූපෙසු දිස්වා විභවං භවඤ්ච
විනිච්ඡයං කුරුතෙ[1] ජන්තු ලොකෙ.

872 කොධො මොසවජ්ජඤ්ච කථංකථා ච
එතෙපි ධම්මා ද්වයමෙව සන්තෙ,
කථංකථී ඤාණපථාය සික්ඛෙ
ඤත්වා පවුත්තා සමණෙන ධම්මා.

873 සාතං අසාතඤ්ච කුතොනිදානා
කිස්මිං අසන්තෙ න භවන්ති හෙතෙ,
විභවං භවඤ්චාපි යමෙතමත්ථං
එතං මෙ පබ්‍රෑහි යතොනිදානං.

874 ඵස්සනිදානං සාතං අසාතං
ඵස්සෙ අසන්තෙ න භවන්ති හෙතෙ,
විභවං භවඤ්චාපි යමෙතමත්ථං
එතං තෙ පබ්‍රෑමි ඉතොනිදානං.

1. කුබ්බති – මජසං.



Free Distribution www.aathaapi.org

**විසර්ජන:**

869. ලෝකයෙහි ප්‍රියවස්තු හු කාමච්ඡන්දය නිදන කොට ඇත, යම් ක්ෂත්‍රියාදි කෙනෙක් හෝ ලෝභය හේතු කොට ලොව්හි හැසිරෙත් නම් ඔවුන්ගේ එ ලෝභයත් කාමච්ඡන්දය නිදන කොට ඇත, ආශාවත් ආශාසමෘද්ධියත්මෙ කාමච්ඡන්දය ම නිදන කොට ඇත යම් ධර්ම කෙනෙක් මිනිසාට පරලොව්හි හිත පිණිස වෙත් නම් උහු ද කාමච්ඡන්දය නිදන කොට ඇති.

**පෘච්ඡා:**

870. ලෝකයෙහි කාමච්ඡන්දය කුමක් නිදන කොට ඇතියේ ද? තෘෂ්ණා–දෘෂ්ටි විනිශ්චයයෝ හෝ කොතැනින් උපන්නාහුද ? ක්‍රොධයත් මෘෂාවාදයත් විචිකිච්ඡාවත් බුද්ධශ්‍රමණයන් වහන්සේ විසින් දෙසනලද යම් අකුශල ධර්මයෝ හෝ වෙත් නම් ඔහු කොතැනින් උපන්නාහු ද?

**විසර්ජන:**

871. ලොව්හි සුව යයි ද දුකැයි ද යමක් කියත් නම් එ සාත–අසාත වෙදනා නිසා කාමච්ඡන්දය උපදනේ ය. ලොකයෙහි සත්ත්ව තෙමේ භූතොපාදය රූපයන්හි විනාශයත් උදයත් දක තෘෂ්ණා–දෘෂ්ටි විනිශ්චය කරන්නේ යි.

872. ක්‍රෝධය හා මෘෂාවාදය හා විචිකිච්ඡා හා යන මෙ ධර්මයෝත් සාතාසාතවෙදනා දෙක ඇතිවත් ම වෙත්. විචිකිච්ඡායෙන් යුක්ත පුද්ගල තෙමේ ඥානදර්ශනඥානාධිගමය සඳහා ත්‍රිවිධශික්ෂාහි හික්මෙන්නේ ය. බුද්ධශ්‍රමණයන් වහන්සේ විසින් අනිත්‍යාදි විසින් දන ධර්මයෝ දෙසන ලදහ.

**පෘච්ඡා:**

873. සුඛවෙදනා දුඃඛවෙදනා යන මොහු කුමකින් උපදනාහුද? කුමක් නැතිවත්ම මොහු නූපදනාහු ද? යළි ඒ සාතාසාතයන්ගේ විනාශය හා උපත යන යම් අර්ථයෙක් යමෙකින් වේ නම්, ඔවුන්ගේ තෙල කාරණය මට ප්‍රකාශ කළ මැනැව.

**විසර්ජන:**

874. සුඛවෙදනා හා දුඃඛවෙදනා හා ස්පර්ශය නිදන කොට ඇත. ස්පර්ශය නැති වත් ම තෙල සාතාසාතයෝ නූපදනාහ. සාතාසාතයන්ගේ විනාශය හා උදය හා යන යම් අර්ථයෙක් මෙ පහස කරුණු කොට උපදනේ නම් තෙල අරුත් තොපට කියමි.

875 ඵස්සො නු ලොකස්මිං කුතොනිදානො
පරිග්ගහා චාපි කුතොපහූතා,
කිස්මිං අසන්තෙ න මමත්තමත්ථි
කිස්මිං විභූතෙ න ඵුසන්ති ඵස්සා,

876 නාමඤ්ච රූපඤ්ච පටිච්ච ඵස්සො
ඉච්ඡානිදානානි පරිග්ගහානි,
ඉච්ඡාය'සන්ත්‍යා[1] න මමත්ත මත්ථි[2]
රූපෙ විභූතෙ න ඵුසන්ති ඵස්සා.

877 කථං සමෙතස්ස විභොති රූපං
සුඛං දුඛං වාපි කථං විභොති,
එතං මෙ බ්‍රූහි යථා විභොති
තං ජානිස්සාම[3] ඉති මෙ මනො අහු.

878 න සඤ්ඤසඤ්ඤී න විසඤ්ඤසඤ්ඤී
නොපි අසඤ්ඤී න විභූතසඤ්ඤී,
එවං සමෙතස්ස විභොති රූපං
සඤ්ඤානිදානා හි පපඤ්චසඞ්ඛා,

879 යං තං අපුච්ඡිම්හ අකිත්තයී නො
අඤ්ඤං තං පුච්ඡාම තදිඞ්ඝ බ්‍රූහි,
එත්තාවතග්ගං නු වදන්ති හෙකෙ
යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතා සෙ
උදාහු අඤ්ඤම්පි වදන්ති එත්තො.

880 එත්තාවතග්ගම්පි වදන්ති හෙකෙ
යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතා සෙ,
තෙසං පුනෙකෙ සමයං වදන්ති
අනුපාදිසෙසෙ කුසලා වදනා.

881 එතෙ ච ඤත්වා උපනිස්සිතාති
ඤත්වා මුනී නිස්සයෙ සො විමංසී,
ඤත්වා විමුත්තො න විවාදමෙති
භවාභවාය න සමෙති ධීරොති.

කලහවිවාදසුත්තං නිට්ඨිතං.

---

1. ඉච්ඡා න සන්ත්‍යා – සිමු 2
2. මමත්තමත්ථි – සිමු 2
3. තං ජානියාම – සිමු 2



Free Distribution www.aathaapi.org

**පෘච්ඡා:**

875. ලොවෙහි ස්පර්ශය කුමක් නිදන කොට ඇත් ද? තෘෂ්ණාදෘෂ්ටි පරිග්‍රහයෝත් කොයින් ප්‍රභූත වූ හු ද? කුමක් අවිද්‍යමාන කල්හි මමත්‍වය නැත් ද? කුමක් ඉක්මැ යත් ම ස්පර්ශයෝ නො පහස්නාහු ද?

**විසර්ජන:**

876. සම්ප්‍රයුක්ත නාමය හා වස්ත්‍වාලම්බනරූපය හා නිසා ස්පර්ශයෝ උපදනාහ. තෘෂ්ණාදෘෂ්ටිපරිග්‍රහයෝ ඉච්ඡාව නිදන කොට ඇත්තාහ. ඉච්ඡාව නැති වත් ම මමත්‍වය නැත රූපය ඉක්මැ යත්ම ස්පර්ශයෝ නො පහස්නාහ.

**පෘච්ඡා:**

877. කිසෙයින් පිළිපන්නහුට රූපය නො වේ ද? සුඛදුඃඛ හෝ කෙසේ නොවේ ද? තෙල රූප–සුඛ දුඃඛ යන තුණ යම්සේ නොවේ නම් එ පරිදි මට වදළ මැනැව. එය දනුම්හ'යි මට සිතෙක් වී.

**විසර්ජන:**

878. හේ ප්‍රකෘතිසංඥයෙන් සංඥ ඇතියේ නො වෙයි. විකෘතසංඥයෙන් විසංඥ ද නො වෙයි. සංඥ විරහිත ද නො වෙයි. ඉක්මැ වූ සංඥ ඇතියේ ද නො වෙයි. මෙසෙයින් පිළිපන්නහුට රූපය නො වෙයි. තෘෂ්ණාදි ප්‍රපඤ්ච සංඥ නිදන කොට ඇති හෙයිනි.

**පෘච්ඡා:**

879. අපි යමක් විචාළමෝ නම් එය අපට දෙසුහ. ඔබ ගෙන් අනෙක් කරුණකුදු විචාරම්හ. එ ද ඒකාන්තයෙන් වදළ මැනැව. මෙ ලොවෙහි පණ්ඩිතමානී ඇතැම් මහණබමුණු කෙනෙක් මෙ අරූප සමාපත්තිමාත්‍රයෙන් මැ සත්‍වයාගේ අග්‍ර ශුද්ධිය කියත් ද? නොහොත් තෙල අරූපසමාපත්තියෙන් අනෙකුත් ශුද්ධියක් කියත් ද?යි.

**විසර්ජන:**

880. මෙ ලෝකයෙහි පණ්ඩිතමානී ඇතැම් මහණ බමුණු කෙනෙක් මෙ අරූපසමාපත්ති මාත්‍රයෙනුදු සත්වයාගේ අග්‍ර වූ ශුද්ධිය කියත් මැ යි ඔවුනතුරෙන් ඇතැමෙක් අනුපාදිශේෂයෙහි පණ්ඩිතවාද ඇත්තාහු උච්ඡෙද ශුද්ධිය කියත්.

881. තවද තෙල දෘෂ්ටිගතිකයන් ශාශ්වතොච්ඡෙදදෘෂ්ටි ඇසුරුකළාහු'යි දන පණ්ඩිත බුද්ධමුනි තෙම තෘෂ්ණාදෘෂ්ටිනිඃශ්‍රයන් දන දුඃඛ අනිත්‍යාදි විසින් ධර්මයත් දන අනුපාදවිමොක්ෂයෙන් මිදුනේ විරුද්ධවාදයට නො එළඹෙයි, එ ධීර තෙම පුන පුනා භවයට නො පැමිණේ යි.

**කලහවිවාද සූත්‍රය නිමි.**

## 4 - 12

## චූලවියූහ සුත්තං

882 සකං සකං දිට්ඨිපරිබ්බසානා
විග්ගය්හ නානා කුසලා වදන්ති,
යො එවං ජානාති ස වෙදි ධම්මං
ඉදං පටික්කොස'මකෙවලී සො.

883 එවම්පි විග්ගය්හ විවාදියන්ති
බාලො පරො අක්කුසලොති[1] චාහු,
සච්චො නු වාදො කතමො ඉමෙසං
සබ්බෙව හීමෙ කුසලාවදානා;

884 පරස්ස චෙ ධම්මමනානුජානං
බාලො මගො[2] හොති නිහීනපඤ්ඤො,
සබ්බෙව බාලා සුනිහීනපඤ්ඤා
සබ්බෙවිමෙ දිට්ඨිපරිබ්බසානා.

885 සන්දිට්ඨියා චෙව න වීවදාතා[3]
සංසුද්ධපඤ්ඤා කුසලා මුතීමා.
න තෙසං කොචි පරිහීනපඤ්ඤො
දිට්ඨී හි තෙසම්පි තථා සමත්තා.

886 න වාහමෙතං තථියන්ති[4] බ්‍රෑමි
යමාහු බාලා මිථු අඤ්ඤමඤ්ඤං,
සකං සකං දිට්ඨිමකංසු සච්චං
තස්මා හි බාලොති පරං දහන්ති.

887 යමාහු සච්චං තථියන්ති එකෙ
තමාහු අඤ්ඤෙ තුච්ඡං මුසාති,
එවම්පි විග්ගය්හ විවාදියන්ති,
තස්මා න එකං සමණා වදන්ති.

888 එකං හි සච්චං න දුතියමත්ථි
යස්මිං පජා නො විවදෙ පජානං,
නානා තෙ සච්චානි සයං ථුනන්ති
තස්මා න එකං සමණා වදන්ති.

---

1. අක්කුසලොති - සිමු 2.
2. බාලොමකො - මජසං.
3. විවදතා - මු 2.
4. තච්ඡන්ති - ස්‍යා.



Free Distribution www.aathaapi.org

# 4 – 12

## චූලවියූහ සූත්‍රය

882. තම තමාගේ දෘෂ්ටියෙහි වසන්නාහු (ඒ දෘෂ්ටිය) දැඩිව ගෙණ (ඇපි ම එහි) දක්ෂයම්හ'යි වෙන වෙන මැ කියති. ''(යමෙක්) මෙසේ දනී නම් හේ දැනගත්තේ ය. යමෙක් මෙය ගරහනුයේ නම්, හේ හීනයෙකැ''යි ද කියත්.

883. මෙසේත් (ස්වලබ්ධිය) දැඩිව ගෙණ විවාද කෙරෙති. මෙරමා-බාල යයි ද අදක්ෂ යයි ද කියති, මෙ මහණබමුණන්ගේ කවර වාදයෙක් සත්‍ය වේ ද? මෙ හැම මහණබමුණෝ පණ්ඩිතවාද ඇත්තාහු ද?

884. ඉදින් අන්‍යදෘෂ්ටිකයාගේ ධර්මය නො අනුදන්නේ බැලයෙක් මෘග (සදෘශ) යෙක් ලාමකප්‍රඥඇතියෙක් වේ නම්, (එකල්හි) හැම දෘෂ්ටිගතික වූ මෙ මහණබමුණෝ බාල වෙති. අතිශයින් නිහීනප්‍රඥ ඇතියාහු වෙති. (යම්හෙයෙකින්) මේ හැම මහණබමුණෝ ස්වකීයදෘෂ්ටියෙහි වෙසෙත් ද එහෙයිනි.

885. ඉදින් ස්වකීයදෘෂ්ටියෙන් පිරිසිදු නො වූවාහු සංශුද්ධප්‍රඥ ඇත්තාහු දක්ෂ වූවාහු බුද්ධිමත් වූවාහු වෙත් නම්, ඒ මහණ බමුණන් අතුරෙහි කිසිවෙක් පිරිහුණු නුවණැතියේ නො වෙයි. යම් හෙයෙකින් දෘෂ්ටිය ඔවුන් විසින් එසෙයින් සමාදන්වනලද ද එහෙයිනි.

886. තෙල දෙසැට මිසදිටු කැල මම සත්‍යයයි ද නො කියම්, යම් හෙයෙකින් කලහකාරි දෙදෙනෙක් ඔවුනොවුන් බාල යයි කියත් ද, ස්වකීය දෘෂ්ටිය සත්‍යය යයි වාදකළාහු ද, එහෙයින් ම වාදකාරක වූ අන්‍යයා බාලයෙකැයි හඟිත්.

887. ඇතැම් මහණබමුණෝ යම් දෘෂ්ටිසත්‍යයක් සැබැවැයි කියත් නම්, එයින් අන්‍ය වූ මහණ බමුණෝ ඒ දෘෂ්ටිසත්‍යය හිස් මුසාවෙකැ යි කියත්, මෙසේ ද ස්වලබ්ධිය දැඩිව ගෙණ විරුද්ධව වාද කෙරෙත්. කවරහෙයින් ශ්‍රමණයෝ එක්සත්‍යයක් නො කියත් ද?

888. සත්‍යය (නිරොධ හෝ මාර්ග හෝ) එකෙක් මැ වෙයි. දෙවැනි සත්‍යයෙක් නැත. යම් සත්‍යයක් දන්නා පුද්ගල තෙමේ විවාද නො කෙරේ නම් එයයි. ඒ මිසදිටුගත්තාහු තුමූ මැ නානාසත්‍යයන් කියත්. එකරුණෙන් මහණබමුණෝ එක් සත්‍යයක් නො කියත්.

889 කස්මා නු සච්චානි වදන්ති නානා
පවාදියාසෙ කුසලා වදානා,
සච්චානි සුතානි බහූනි නානා
උදාහු තෙ තක්කමනුස්සරන්ති.

890 න හෙව සච්චානි බහූනි නානා
අඤ්ඤත්‍ර සඤ්ඤාය නිච්චානි ලොකෙ,
තක්කඤ්ච දිට්ඨීසු පකප්පයිත්වා
සච්චං මුසාති ද්වයධම්මමාහු.

891 දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා
එතෙ ච නිස්සාය විමානදස්සී,
විනිච්ඡයෙ ඨත්වා පහස්සමානො
බාලො පරො අක්කුසලොති[1]චාහ.

892 යෙනෙව බාලොති පරං දහාති
තෙනාතුමානං කුසලොති චාහ,
සයමත්තනා සො කුසලාවදානො[2]
අඤ්ඤං විමානෙති තදෙව පාවා.[3]

893 අතිසාරදිට්ඨියා[4] සො සමත්තො
මානෙන මත්තො පරිපුණ්ණමානී,
සයමෙව සාමං මනසාභිසිත්තො
දිට්ඨී හි සා තස්ස තථා සමත්තා.

894 පරස්ස චෙ හි වචසා නිහීනො
තුමො සහා හොති නිහීනපඤ්ඤො,
අථ චෙ සයං වෙදගූ හොති ධීරො
න කොචි බාලො සමණෙසු අත්ථි.

895 අඤ්ඤං ඉතො යාභිවදන්ති ධම්මං
අපරද්ධා සුද්ධිමකෙවලී තෙ[5]
එවම්පි තිත්ථ්‍යා පුථුසො වදන්ති
සන්දිට්ඨිරාගෙන හි තෙභිරත්තා.[6]

1. අකුසලොති - සීමු 2.
2. කුසලො වදානො - සීමු 2.
3. පාව - මජසං.
4. අතිසරං දිට්ඨියා - සීමු 2.
5. සුද්ධිමකෙවලිනො - සීමු 2.
6. ත්‍යාභිරත්තා - ස්‍යා.



Free Distribution www.aathaapi.org

889. විරුද්ධවාද ඇති (ස්වලබ්ධියෙහි) ඇපි මැ දක්ෂයම්හයි කියන ඔහු කවරහෙයින් නානාසත්‍යවාදයන් කියත් ද? ඔවුන් විසින් නානාවිධ බොහෝ සත්‍යයෝ අසනලද්දහු ද? නොහොත් ඔහු තර්කමාත්‍රය අනුව යෙත් ද?

890. ලෝකයෙහි සංඥමාත්‍රයෙන් නිත්‍ය යයි ගන්නා ලද ග්‍රහණයන් තබා නානාවිධ වූ බොහෝ සත්‍යයෝ නො මැත. දෘෂ්ටීන් කෙරෙහි මිථ්‍යාසංකල්පමාත්‍රය ද උපදවා (මාගේ වචනය) සැබව, (තාගේ වචනය) බොරුය යන යුග්මධර්මය කියත්.

891. (රූපාලම්බන සඞ්ඛ්‍යාත) දෘෂ්ටශුද්ධිය ද (ශබ්දලම්බනසඞ්ඛ්‍යාත) ශ්‍රැතශුද්ධිය ද ශීලව්‍රතශුද්ධිය ද (ගන්ධරසස්ප්‍රෂ්ටව්‍යාලම්බන සඞ්ඛ්‍යාත) මුතශුද්ධිය ද යන මොවුන් නිසා අසම්මානය දක්නේ නොහොත් දෙම්නස් උපදවනුයේ දෘෂ්ටි නිශ්චයෙහි සිට පහටුවනුයේ මෙරමා හීන ය යි ද අදක්ෂ යයි ද කියයි.

892. යම්කරුණෙකින් මෙරමා බාලයෙකැයි හඟී නම්, යළි එකරුණෙන් මැ තමා පණ්ඩිත වෙමි යි කියයි, තෙම මැ තමහට (මම) පණ්ඩිතයෙමි යි කියන හෙතෙම එය මැ කියනුයේ අනෙකක්හු අවමන් කෙරෙයි.

893. හෙතෙම අතිසාර (දෙසැට) දෘෂ්ටියෙන් සම්පූර්ණ වූයේ දෘෂ්ටි මානයෙන් මත්වූයේ පරිපූර්ණයෙමි යන මාන ඇතියේ තමා මැ තෙමේ සිතින් අභිෂෙකකරණ ලදුයේ වෙයි. යම් හෙයෙකින් ඔහු විසින් එ දෘෂ්ටිය එපරිද්දෙන් ගන්නාලද ද එහෙයිනි-

894. ඉදින් යමෙක් අන්‍යයාගේ නින්ද වචනයෙන් නිහීනයෙක් වේ නම් තෙමේත් ඔහු සමග නිහීන ප්‍රඥ ඇත්තේ වෙයි. යළි තෙමෙ මැ වෙදන්තයට ගියා වූ ධීරයෙක් වේ නම්, ශ්‍රමණයන් කෙරෙහි බාල වූ කිසිවෙක් නැත්තේ ය.

895. යම් කෙනෙක් මෙයින් අන්‍ය වූ දෘෂ්ටිධර්මයක් කියත් නම්, අපරිපූර්ණ වූ ඔහු ශුද්ධිය වරදවාගත්තාහු ය. මෙසේත් තීර්ථකයෝ බොහෝ දෘෂ්ටිවශයෙන් කියති. යම්හෙයෙකින් ස්වකීය දෘෂ්ටි රාගයෙන් ඇලුනාහු ද එහෙයිනි.



Free Distribution www.aathaapi.org

896 ඉධෙව සුද්ධිං ඉතිවාදියන්ති
නාඤ්ඤෙසු ධම්මෙසු විසුද්ධිමාහු,
එවම්පි තිත්ථ්‍යා පුථුසො නිවිට්ඨා
සකායනෙ තත්ථ දළ්හං වදනා.

897 සකායනෙ වාපි දළ්හං වදනො
කමෙත්ථ බාලොති පරං දහෙය්‍ය,
සයමෙව සො මෙධගං ආවහෙය්‍ය
පරං වදං බාලමසුද්ධිධම්මං.

898 විනිච්ඡයෙ ඨත්වා සයං පමාය
උද්ධං සො[1] ලොකස්මිං විවාදමෙති,
හිත්වාන සබ්බානි විනිච්ඡයානි
න මෙධගං කුරුතෙ ජන්තු ලොකෙති.

චූළවියූහසුත්තං නිට්ඨිතං.

## 4 – 13

## මහාවියූහ සුත්තං

899 යෙ කෙචි ‘මෙ දිට්ඨී පරිබ්බසානා
ඉදමෙව සච්චන්ති විවාදයන්ති,[2]
සබ්බෙව තෙ නින්දමන්වානයන්ති
අථො පසංසම්පි ලභන්ති තත්ථ.

900 අප්පං හි එතං න අලං සමාය
දුවෙ විවාදස්ස ඵලානි බ්‍රූමි,
එවම්පි දිස්වා න විවාදයෙථ[3]
ඛෙමාභිපස්සං අවිවාදභූමිං.

901 යා කාචිමා සම්මුතියො පුථුජ්ජා
සබ්බා'ව එතා න උපෙති විද්වා,
අනූපයො සො උපයං කිමෙය්‍ය
දිට්ඨෙ සුතෙ ඛන්තිමකුබ්බමානො.

1. උද්ධංස - මජසං.
2. විවාදියන්ති - සිමු.
3. විවාදියෙථ - සී.මු.



Free Distribution www.aathaapi.org

896. මෙසේ දෘෂ්ටියෙහි අභිරක්තවූවෝ මෙහි මැ ශුද්ධිය කියති. අන්‍යධර්මයන්හි විශුද්ධිය නොකියත්. මෙසේ ද ස්වකීයදෘෂ්ටිමාර්ගයෙහි බැසගත් තීර්ථකයෝ එ ස්වලබ්ධියෙහි දෘඪවාද ඇත්තාහු වෙත්.

897. තවද ස්වකීයදෘෂ්ටිමාර්ගයෙහි මැ දෘඪව කියන්නාවූ තීර්ථකතෙම එ ස්වකීය මාර්ගයෙහිලා අන්‍යකවරක්හු බාලය යි දක්වන්නේ ද හෙතෙම අන්‍යයා බාලයක්හු කොට අශුද්ධිධර්ම ඇත්තාහු කොට කියනුයේ තෙමේ මැ කලහය එළවන්නේ යි.

898. හෙතෙම ලබ්ධිවිනිශ්වයෙහි සිට තෙමේ මැ (ශාස්තෘආදිය) ප්‍රමාණ කොට ගෙණ ලෝකයෙහි බොහෝ සෙයින් විවාදයට පැමිණෙයි. ප්‍රාඥසත්ව තෙමේ හැම දෘෂ්ටිවිනිශ්වයන් හැරපියා ලෝකයෙහි කලහ නො කරන්නේ යයි.

**චූලවියූහ සූත්‍රය නිමි.**

## 4 – 13

## මහාවියූහ සූත්‍රය

899. ස්වකීය දෘෂ්ටිය දෘඪ වැ ගෙණ වසන කිසි මහණබමුණු කෙනෙක් මෙ (අපගේ ලබ්ධිය) මැ සත්‍යය, අන්‍යලබ්ධිය තුච්ඡ යයි ද කියත් නම්, ඔහු සිල්ලෝ මැ (තමන් වෙත) පුන පුනා නින්‍දා එළවත් ද? නොහොත් එ දෘෂ්ටිය නිමිති කොට ගෙණ ප්‍රශංසාත් ලබත් ද?

900. තෙල ප්‍රශංසා සඞ්ඛ්‍යාත වාදඵලය අල්ප මැයි රාගාදීන්ගේ ව්‍යපශමය පිණිස අසමර්ථ වේ. විවාදයාගේ (ජය–පරාජයාදි විසින්) ඵල දෙකක් කියමි. විවාදයෙහි තෙල ආදීනවය ද දැක අවිවාදභූමි සඞ්ඛ්‍යාත නිවන ක්ෂේම යයි දක්මින් විවාද නො තකන්නේ යි.

901. පුහුදුනන් කෙරෙන් උපන වූ යම් කිසි දෘෂ්ටිකෙනෙක් වෙත් නම් විද්වද් තෙමේ තෙල හැම දෘෂ්ටීන්ට නො පැමිණෙයි. තෘෂ්ණා දෘෂ්ටි සඞ්ඛ්‍යාත උපයරහිත වූ හේ දෘෂ්ට ශ්‍රැත මුතශුද්ධියෙහි රුචි නො කරන්නේ රූපාදී උපයකට කිම පැමිණෙන්නේ ද?



Free Distribution www.aathaapi.org

902 සීලුත්තමා සඤ්ඤමෙනාහු සුද්ධිං
වතං සමාදය උපට්ඨිතා සෙ,
ඉධෙ'ව සික්ඛෙම අත්ථස්ස සුද්ධිං
භවූපනීතා කුසලා වදානා.

903 සචෙ චුතො සීලවතතො[1] හොති
ස වෙධති[2] කම්මං විරාධයිත්වා,
ස ජප්පති[3] පත්ථයතීධ සුද්ධිං
සත්ථා ව හීනො පවසං ඝරම්හා.

904 සීලබ්බතං වාපි පහාය සබ්බං
කම්මඤ්ච සාවජ්ජනවජ්ජමෙතං,
සුද්ධිං අසුද්ධින්ති අපත්ථයානො
විරතො චරෙ සන්තිමනුග්ගහාය.

905 තමූපනිස්සාය ජිගුච්ඡිතං වා
අථවාපි දිට්ඨං ව සුතං මුතං වා,
උද්ධංසරා සුද්ධිමනුත්ථුනන්ති
අවීතතණ්හාසෙ භවාභවෙසු.

906 පත්ථයමානස්ස හි ජප්පිතානි
පවෙධිතං[4] වාපි පකප්පිතෙසු,
චුතූපපාතො ඉධ යස්ස නත්ථි
ස කෙන වෙධෙය්‍ය කුහිංව[5] ජප්පෙ.

907 යමාහු ධම්මං පරමන්ති එකෙ
තමෙව හීනන්ති පනාහු අඤ්ඤෙ,
සච්චො නු වාදො කතමො ඉමෙසං
සබ්බෙව හි මෙ කුසලා වදානා.

908 සකං හි ධම්මං පරිපුණ්ණමාහු
අඤ්ඤස්ස ධම්මං පන හීනමාහු,
එවම්පි විග්ගය්හ විවාදයන්ති
සකං සකං සම්මුතිමාහු සච්චං.

---

1. සීලබ්බතතො - සිමු.
2. පවෙධති - මජසං
3. පජප්පති - මජසං
4. පවෙදිතං - මජසං
සංවෙදිතං - මු 1, 2
5. කුහිඤ්චි - මු 1, 2



Free Distribution www.aathaapi.org

902. ශීලය මැ උත්තම යැයි ගත් ඇතැම් මහණබමුණු කෙනෙක් සංයම මාත්‍රයෙන් ශුද්ධිය කියත්. හස්ති–අශ්වාදි ව්‍රත සමාදන් වැ එළැඹ සිටියාහු 'මෙ දෘෂ්ටියෙහි මැ හික්මෙනුවම්හ, එ කල්හි මෙ සත්වයා හේ ශුද්ධිය වේ යයි භවයට පැමිණියාහු මැ කියති. (එහෙත් ඔහු) කුසලවාද ඇත්තාහු වෙත්.

903. ඉදින් හේ ශීලව්‍රතයෙන් හිලිහුනේ වේ නම් හේ ශීලව්‍රතකර්මය වරදවා ගෙණ සැලෙයි, තවද හෙතෙම ගෙන් නික්මැ ගොස්, නොරට වසන පුරුෂයෙක් සාර්ථයෙන් ගිලිහුනේ (එ ගෙය හෝ සාර්ථය) පතන්නාක් මෙන් ඒ ශීලව්‍රතශුද්ධිය ජල්පනය කරන්නේ ද පතන්නේ ද වේ.

904. අරිසවු හැම ශීලව්‍රතය ද සාවද්‍ය–අනවද්‍ය (අකුශල හා ලෞකික කුශල) කර්ම ද හැරපියා තෙල (පඤ්චකාමගුණාදි) ශුද්ධිය ද (අකුශලාදි-භෙද වූ) අශුද්ධිය ද මෙසේ නොපතනුයේ දෘෂ්ටිශාන්තිය දැඩිවැ නො ගෙණ (ශුද්ධි-අශුද්ධි දෙකින්) වෙන් වූයේ හැසිරෙන්නේ යි.

905. තවද (ඇතැම්. මහණ බමුණු කෙනෙක් බුද්ධාදීන් විසින්) ජුගුප්සිත වූ එ අමරතපස් හෝ දෘෂ්ටිශුද්ධිය හෝ ශ්‍රැතශුද්ධිය හෝ මුත ශුද්ධිය හෝ ඇසුරු කොට අක්‍රියවාදදි උද්ධංසරවාද ඇත්තාහු පුන පුනා භවයෙහි නො හළ තෘෂ්ණා ඇත්තාහු ශුද්ධිය කියත්.

906. (මෙසේ) ප්‍රාර්ථනා කරන්නහුට මැ තෘෂ්ණාජල්පිතයෝ වෙති. තෘෂ්ණාදෘෂ්ටීන් ප්‍රකල්පිත වූ වස්තූන් කොට අතිශයින් සැලීම ද වෙයි. මෙලොව යම් ක්ෂීණාසුවයක්හට ච්‍යුති උත්පත්ති නැත් ද හෙතෙම කිනම් රාගාදියකින් සැලෙන්නේ ද, කොහි ජල්පනය කරන්නේ ද?

907. ඇතැම් මහණබමුණු කෙනෙක් යම් දහමක් උතුමැයි කියත් නම්, අන්‍යයෝ එ මැ දහම හීන යයි කියත්. මෙ මහණබමුණන්ගේ කවර වාදයෙක් සත්‍ය වූයේ ද? මොහු සියල්ලෝ මැ කුශලවාද ඇත්තාහු මැ වෙත් ද?

908. (ඇතැම්) මහණබමුණෝ තමන් තමන්ගේ මැ ධර්මය පරිපූර්ණය යි කියති. අන්‍යයන්ගේ ධර්මය හීන යයි කියත්. මෙසේත් දැඩි කොට ගෙණ විවාද කෙරෙති. තමන් තමන්ගේ මැ දෘෂ්ටිසම්මතිය සත්‍ය යයි කියත්.

909 පරස්ස චෙ වම්භයිතෙන හීනො
න කොචි ධම්මෙසු විසෙසි අස්ස,
පුථූ හි අඤ්ඤස්ස වදන්ති ධම්මං
නිහීනතො සම්හි දළ්හං වදනා.

910 සද්ධම්මපූජා ච[1] පනා තථෙව
යථා පසංසන්ති[2] සකායනානි,
සබ්බෙව වාද[3] තථියා[4] භවෙය්‍යුං
සුද්ධී හි තෙසං පච්චත්තමෙව.

911 න බ්‍රාහ්මණස්ස පරනෙය්‍යමත්ථි
ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං,
තස්මා විවාදනි උපාතිවත්තො
න හි සෙට්ඨතො පස්සති ධම්මමඤ්ඤං.

912 ජානාමි පස්සාමි තථෙව එතං
දිට්ඨියා එකෙ පච්චෙන්ති සුද්ධිං
අද්දක්ඛි චෙ කිඤ්හි තුමස්ස තෙන
අතිසිත්වා අඤ්ඤෙන වදන්ති සුද්ධිං.

913 පස්සං නරො දක්ඛිති[5] නාමරූපං
දිස්වාන වා ඤස්සති තානිමෙව,
කාමං බහුං පස්සතු අප්පකං වා
න හි තෙන සුද්ධිං කුසලා වදන්ති.

914 නිවිස්සවාදී න හි සුබ්බිනායො[6]
පකප්පිතං දිට්ඨි පුරෙක්ඛරානො,
යං නිස්සිතො තත්ථ සුභං වදනො,
සුද්ධිං වදෙ තත්ථ තථද්දසා සො.

915 න බ්‍රාහ්මණො කප්පමුපෙති සඞ්ඛං
න දිට්ඨිසාරී නපි ඤාණබන්ධු
ඤත්වා ච සො සම්මතියො[7] පුථුජ්ජා
උපෙක්ඛති උග්ගණ්හන්ති මඤ්ඤෙ.[8]

---

1. සද්ධම්මපූජාපි - මජසං
   සද්ධම්ම පූජාව - මු 2
2. නෙසං - මජසං
3. සබ්බ පවාද - මු 1, 2
4. තථී වා - මු 1, 2
5. දක්ඛති - මජසං
6. සුද්ධිනායො - මු 1
   සුබ්බනායො - මු 2
7. සම්මුතියො - මජසං
8. උග්ගහණං තමඤ්ඤෙ - මු 1, 2



Free Distribution www.aathaapi.org

909. ඉදින් මෙරමා විසින් අවමන් කරණලද හෙයින් හීන වේ නම්, දෘෂ්ටිධර්මයන් අතුරෙහි කිසිවෙක් විශිෂ්ට නො වන්නේ ය. යම් හෙයෙකින් බොහෝ මහණබමුණෝ මෙරමාගේ ධර්මය නිහීන හෙයින් කියත් ද ස්වකීය ධර්මයෙහි දැඩි කොට ගෙණ සත්‍ය යයි කියන්නාහු ද එහෙයිනි.

910. තවද එ තීර්ථකයෝ ස්වකීය ලබ්ධිමාර්ගයනට යම්සේ පසසත් නම් ස්වකීය ශාස්තෘආදීන්ට පූජා ද එසේ ම පවත්නේ ය. ඉදින් (ඔහු එහි ප්‍රමාණ වෙත් නම්) හැම වාදයෝ සත්‍යවන්නාහු ය. (කවර හෙයින යත්:) යම් හෙයෙකින් ඔවුන්ගේ ශුද්ධිය තමන් තමන් කෙරෙහි ම පිහිටියේ ද එහෙයිනි.

911. යම් හෙයෙකින් බාහිතපාපී බ්‍රාහ්මණයාට මෙරමා විසින් එළැවියයුතු ඥානයෙක් නැත් ද, දෙසැටම්සදිටු දහම්හි මෙ මැ සත්‍ය ය යි ද නිශ්චය කොට දැඩිව ගන්නාලද්දෙකුත් නැත් ද, එහෙයින් දෙසැට-ම්සදිටු නමැති වාදයන් ඉක්මවූ හෙතෙම අන්‍යධර්මයක් ශ්‍රෙෂ්ඨ වශයෙන් නො මැ දක්නේ යි.

912. ඇතැම් මහණබමුණු කෙනෙක් තෙල කරුණ එ පරිද්දෙන් මැ දන්මි, දක්මි (කියන්නාහු) දෘෂ්ටියෙන් ශුද්ධිය හදහති. ඉදින් (යම් හෙයෙකින් ඔවුන්ගෙන එකෙකුත්) යථාභූතාර්ථය දුටුයේ නමුදු තමාගේ එ දර්ශනයෙන් (දුඃඛපරිඥනාදි) කුමක් කරණලදද ද, ඔහු (ආර්යමාර්ගය) ඉක්මවා අන්‍ය මාර්ගයෙකින් ශුද්ධිය වේ යයි කියත් නම් (නොහොත් බුද්ධාදිහු) ඔවුන් ඉක්මවා අන්මගෙකින් ශුද්ධිය කියත් ද එ හෙයිනි.

913. සත්‍වතෙමේ (පරචිත්තවිජානඥනාදියෙන්) බලනුයේ නාමරූ-පය (නිත්‍යාදි විසින්) දක්නේ ය. දැක එ නාමරූපයන් ම නිත්‍යාදි විසින් දැනගන්නේ ය. හෙ එකාන්තයෙන් බොහෝ කොට හෝ මඳ කොට හෝ දක්නේ ය. බුද්ධාදි කුශලයෝ එ දර්ශනයෙන් සංසාරශුද්ධිය (වේ යයි) නො මැ කියත්.

914. දෘෂ්ටියෙහි පිහිටා (මෙ ය මැ සත්‍යයි) කියන්නේ වේ ද හෙතෙම සුවසේ හික්මිය නොහැකියේ මැ යි. සිතින් කල්පනය කරණලද දෘෂ්ටිය පෙරටු කොට හැසිරෙන්නේ යම් ශාස්තෘ ආදියක් ඇසුරුකරන්නේ එහි මැ ශුභවාද ඇතියේ එ ස්වකීය දෘෂ්ටිශුද්ධිය කියන්නේ නම් හෙතෙම එ දෘෂ්ටිය එ සෙයින් මැ දුටුයේ වෙයි.

915. ක්ෂීණාසුව බ්‍රාහ්මණ නුවණින් දැන තෘෂ්ණාදෘෂ්ටිකල්පයට නො යෙයි. දෘෂ්ටියෙහි හැසිරෙන්නේත් නො වෙයි. සමාපත්තිඥනා-දියෙන් ද කළ තෘෂ්ණා දෘෂ්ටිබන්ධ ඇතියේත් නො වෙයි. හෙතෙම පෘථග්ජනයන්ගෙන් උපන් දෙසැට ම්සදිටු දැන උපෙක්ෂා කෙරෙයි. අන්‍යයෝ එ දෘෂ්ටීන් දැඩි කොට ගණිත්.



Free Distribution www.aathaapi.org

916 විසජ්ජ ගන්ථානි මුනීධ ලොකෙ
විවාදජාතෙසු න වග්ගසාරී,
සන්තො අසන්තෙසු උපෙක්ඛකො සො
අනුග්ගහො උග්ගණ්හන්තිමඤ්ඤෙ.[1]

917 පුබ්බාසවෙ හිත්වා නවෙ අකුබ්බං
න ඡන්දගූ නොපි නිවිස්සවාදී,
ස විප්පමුත්තො දිට්ඨිගතෙහි ධීරො
න ලිප්පති[2] ලොකෙ අනත්තගරහී.

918 ස සබ්බධම්මෙසු විසෙනිභූතො
යං කිඤ්චි දිට්ඨං ව සුතං මුතං වා,
ස පන්නභාරො මුනි විප්පයුත්තො
න කප්පියො නූපරතො න පත්ථියොති.

**මහාවියූහසුත්තං නිට්ඨිතං**

## 4 – 14

## තුවටක සුත්තං

919 පුච්ඡාමි තං ආදිච්චබන්ධුං[3],
විවෙකං සන්තිපදඤ්ච මහෙසි,
කථං දිස්වා නිබ්බාති භික්ඛු
අනුපාදියානො ලොකස්මිං කිඤ්චි.

920 මූලං පපඤ්චසඞ්ඛාය (ඉති භගවා)
මන්තා අස්මීති සබ්බමුපරුන්ධෙ,[4]
යා කාචි තණ්හා අජ්ඣත්තං
තාසං විනයා සදා සතො සික්ඛෙ.

921 යං කිඤ්චි ධම්මමභිජඤ්ඤා
අජ්ඣත්තං අථවාපි බහිද්ධා,
න තෙන මානං[5] කුබ්බෙථ
න හි සා නිබ්බුති සතං වුත්තා.

1. උග්ගණ්හං තමඤ්ඤෙ-මු 1,2
උග්ගණ්හන්තිමඤ්ඤෙ-මජසං
2. ලිම්පති-මජසං
3. ආදිච්චබන්ධු-මජසං
4. සබ්බමුපරුද්ධෙ-සයා, PTS
5. ථාම--මජසං



Free Distribution    www.aathaapi.org

916. රහත් මුනි තෙම මෙ ලොවහි චතුර්විධ ග්‍රන්‍ථයන් හැරපියා හටගත් විවාද ඇත්තවුන් අතුරෙහි (ඡන්‍දාදි විසින්) වශී ව නො හැසිරෙන්නේ අශාන්‍තයන් අතුරෙහි ශාන්‍ත වූයේ උපෙක්ෂා ඇත්තේ වෙයි. හේ දෘෂ්ටිග්‍රහණ නැත්තේ වෙයි. අන්‍යයෝ තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් දැඩිව ගන්නාහ.

917. අතීත රූපාදිය ඇරැබ උපන් ආස්‍රවයන් හැරපියා වර්තමාන රූපාදියෙහි ආස්‍රවයන් නො කරන්නේ ඡන්‍දාදියෙන් අගතියට නොයන්නේ දෘෂ්ටියෙහි පිහිටා නොද කියන්නේ දෘෂ්ටිගතයන් කෙරෙන් වෙසෙසින් මුක්ත වූ ඒ ධීර තෙම තමහට නො ගරහන්නේ ලොවහි (තෘෂ්ණාදෘෂ්ටි විසින් නොලැගේ.

918. ඒ ක්ෂීණාස්‍රව තෙම යම් කිසි රූපාලම්බන වේවයි. ශබ්දාලම්බන වේවයි, ගන්‍ධ රස ස්ප්‍රෂ්ටව්‍යාලම්බන වේවයි (ධර්මාලම්බන වේවයි) ඒ සර්වධර්මයන්හි මරසෙන් වනසා සිටියේ වෙයි. බහා තැබූ බර ඇති ඒ රහත් මහණ (කෙලෙසුන් කෙරෙන්) වෙසෙසින් මුක්ත වූයේ තෘෂ්ණාදෘෂ්ටි කල්ප නොකරන්නේ උපරති නැතියේ තෘෂ්ණා ප්‍රාර්ථනා නැතියේත් වේ යයි (භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.)

**මහාවියුහ සූත්‍රය නිමි.**

## 4 – 14

## තුවටක සූත්‍රය

919. සූර්‍ය්‍යබන්‍ධු වූ මහර්ෂි වූ මුබ පුඑවුස්මි: (කල්‍යාණ පෘථග්ජන-වූ හෝ ශෛක්ෂ) යොගාවචර මහණ ත්‍රිවිධ විවෙකය හා ශාන්තිපද සංඛ්‍යාත සත්තිස් බොධිපාක්ෂික ධර්ම හා කවර කරුණෙකින් දැක (කායාදි) ලොකයෙහි රූපාදී කිසි ධර්මයකුත් උපාදාන විසින් නො ගණිමින් රාගාදි කෙලෙසුන් සන්හිඳුවන්නේ ද?

920. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක: තෘෂ්ණාදෘෂ්ටිප්‍රපඤ්ච-යාගේ අවිද්‍යාදි ක්ලේශමූලය ද දෘෂ්ටිමානය ද ප්‍රඥයෙන් දැන සියල්ල වළහන්නේ ය. අධ්‍යාත්මයෙහි යම් කිසි තෘෂ්ණා කෙනෙක් වෙත් ද ඔවුන්ගේ ප්‍රහාණය සඳහා හැම කල්හි එළඹසිටි සිහි ඇති වැ හික්මෙන්නේ යි.

921. තමා කෙරෙහි වූ හෝ (උපාධ්‍යායාදි) බාහිර පුද්ගලයකු කෙරෙහි වූ කුලීනත්‍වාදි ගුණයක් හෝ දන්නේ නම් ඒ කරුණෙන් මානය නොකරන්නේ ය බුද්ධාදි සත්පුරුෂයන් විසින් ඒ මානොපශාන්තිය නිර්වෘතිය යි නො කියනලද මැ යි.



Free Distribution www.aathaapi.org

922 සෙය්‍යා න තෙන මඤ්ඤෙය්‍ය
නීචෙය්‍යො අථ වාපි සරික්ඛො,
ඵුට්ඨො අනෙකරූපෙහි
නාතුමානං විකප්පයං තිට්ඨෙ.

923 අජ්ඣත්තමෙව උපසමෙ
න අඤ්ඤතො භික්ඛු සන්තිමෙසෙය්‍ය,
අජ්ඣත්තං උපසන්තස්ස
නත්ථි අත්තා[1] කුතො නිරත්තා[2] වා.

924 මජ්ඣෙ යථා සමුද්දස්ස
ඌමි නො ජායති ඨිතො හොති,
එවං ඨිතො අනෙජස්ස
උස්සදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි.

925 අකිත්තයී විවටචක්ඛු
සක්ඛිධම්මං පරිස්සයවිනයං,
පටිපදං වදෙහි භද්දන්තෙ
පාතිමොක්ඛං අථවාපි සමාධිං.

926 චක්ඛූහි නෙව ලොලස්ස
ගාමකථාය ආවරෙය්‍ය සොතං,
රසෙ ච නානුගිජ්ඣෙය්‍ය
න ච මමායෙථ කිඤ්චි ලොකස්මිං.

927 ඵස්සෙන යදා ඵුට්ඨස්ස
පරිදෙවං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි
භවං ච නාභිජප්පෙය්‍ය
භෙරවෙසු ච න සම්පවෙධෙය්‍ය.

928 අන්නානමථො පානානං
ඛාදනීයානං අථොපි වත්ථානං,
ලද්ධා න සන්නිධිං කයිරා
න ච පරිත්තසෙ තානි අලභමානො.

929 ඣායී න පාදලොලස්ස
විරමෙ කුක්කුච්චා[3] නප්පමජ්ජෙය්‍ය,
අථ ආසනෙසු සයනෙසු
අප්පසද්දෙසු භික්ඛු විහරෙය්‍ය.

1. අත්තං-මු1, 2
2. නිරත්තං-මු1, 2
3. කුක්කුච්චං-මු1, 2



Free Distribution www.aathaapi.org

922 එ මානයෙන් මම ශ්‍රෙෂ්ඨයෙමි යි ද නීචයෙමි යි ද නැතහොත් සදෘශයෙමි යි ද නොහඟනේ ය. කුලීනත්‍වාදි අනෙකස්වරූපයෙන් යුක්ත වූයේ තමා විකල්පනය කරමින් නො සිටුනේ යි.

923 මහණ, අධ්‍යාත්මයෙහි මැ රාගාදිය සන්හිඳුවන්නේ ය. සතිපට්ඨානාදිය හැර අන්‍ය වූ අශුද්ධිමාර්ගයෙන් ශාන්තිය නොසොයන්නේ ය. අධ්‍යාත්මයෙහි රාගාදිය සන්හිඳුනු මහණහට ආත්මදෘෂ්ටි නැත. උච්ඡෙද දෘෂ්ටිය හෝ කොයින් වේ ද?

924 මහාසාගරයගේ (සාරදහසක් පමණ යොදුන් ඇති) මධ්‍යභාගයෙහි යම් සේ රළ නො හටගනී ද නිශ්චලව සිටියේ වේ ද, එසෙයින් ක්ෂීණාශ්‍රව මහණ තෙම අටලෝදහමින් නොසැලී සිටියේ තෘෂ්ණා රහිත වන්නේ ය. එ මහණ කිසිවෙක්හි දු උත්සද නොකරන්නේ ය.

925 අණාවරණ වූ පසැස් ඇති බුදුහු උපද්‍රවයන් දුරුකරන තමන් හට ප්‍රත්‍යක්ෂවූ ධර්මය වදළහ. පින්වතුන්වහන්ස, ඔබගේ සොඳුරු වූ පිළිවෙත වදළ මැනව. වැලිදු පාමොක් හා සමාධියත් වදළ මැනව.

926 ඇසින් (රූ දක්මට) නො මැ ලොල් වන්නේ ය. ග්‍රාම්‍ය (තිරශ්චීන) කථායෙන් කන් වළහන්නේ ය. මූලරසාදියෙහි දු නොගිජු වන්නේ ය. ලොවැ (රූපාදි) කිසිවක් (තෘෂ්ණාදෘෂ්ටි) මමත්‍වයෙන් නො ගන්නේ යි.

927 රොගස්පර්ශයෙන් යම් කලෙක්හි පහස්නා ලද වේ නම් මහණ කිසිවක් නිමිති කොට පරිදෙවනා නො කරන්නේ ය. කාමභවාදිය ද නො පතන්නේ ය. බිය දනවන අරමුණු නිමිති කොට ද නො සැලෙන්නේ යි.

928 තවද මහණ ආහාර–පානයන් හා ඛාද්‍යයන් සම්බන්ධි වූත් වස්ත්‍රයන් සම්බන්ධි වූත් (කිසිවක්) ලැබ සන්නිධිය (රැස්කිරීම) නොකරන්නේ ය. එ වස්තූන් නො ලබනුයේ නො ද තැවෙන්නේ යි.

929 ප්‍රථමාදී ධ්‍යාන වඩන්නේ පාද ලොලයෙක් නො වන්නේ ය. කුකුසින් දුරුවන්නේ ය. නොපමා වන්නේ ය. යලිදු මහණ නිහඬ වූ සයනාසනයන්හි දු වාසය කරන්නේ යි.

930 නිද්දං න බහුලීකරෙය්‍ය
ජාගරියං භජෙය්‍ය ආතාපී,
තන්දිං මායං හස්සං ඛිඩ්ඩං
මෙථුනං විප්පජහෙ සවිභූසං.

931 ආථබ්බණං[1] සුපිනං ලක්ඛණං
නො විදහෙ අථොපි නක්ඛත්තං,
විරුතඤ්ච ගබ්භකරණං
තිකිච්ඡං මාමකො න සෙවෙය්‍ය.

932 නින්දාය නප්පවෙධෙය්‍ය
න උණ්ණමෙය්‍ය පසංසිතො භික්ඛු,
ලොභං සහ මච්ඡරියෙන
කොධං පෙසුනියඤ්ච පනුදෙය්‍ය.

933 කයවික්කයෙ න තිට්ඨෙය්‍ය
උපවාදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි,
ගාමෙ ච නාභිසජ්ජෙය්‍ය
ලාභකම්‍යා ජනං න ලපයෙය්‍ය.

934 න ච කත්ථිකො[2] සියා භික්ඛු
න ච වාචං පයුතං භාසෙය්‍ය,
පාගබ්භියං න සික්ඛෙය්‍ය
කථං විග්ගාහිකං න කථයෙය්‍ය.

935 මොසවජ්ජෙ න නියෙථ[3]
සම්පජානො සඨානි න කයිරා,
අථ ජීවිතෙන පඤ්ඤාය
සීලබ්බතෙන නාඤ්ඤමතිමඤ්ඤෙ.

936 සුත්වා රුසිතො[4] බහුං වාචං
සමණානං පුථුවචනානං,[5]
ඵරුසෙන නෙ න පටිවජ්ජා
න හි සන්තො පටිසෙනිං කරොන්ති.

1. අථබ්බණං-මු
2. කත්ථිතා-මු 1, 2
3. නීයෙථ-මු i
4. දූසිතො - පුනි
5. සමණානං වා පුථුජනානං-මජසං



Free Distribution www.aathaapi.org

930 කෙලෙස් තවන වැර ඇතියේ නිදි බහුල නොකරන්නේ ය. නිදි වැරීම සෙවුනේ ය. තන්ද්‍රාව (අලසබව) මායා ය, හාස්‍ය ය, ක්‍රීඩාය, විභූෂණ සහිත මෙවුන්දම් ය යන මොවුන් වෙසෙසින් දුරු කරන්නේ යි.

931 රත්නත්‍රයමාමක මහණ අථර්වනය මන්ත්‍ර ප්‍රයොග හා ස්වප්න ශාස්ත්‍ර හා (මණිලක්ඛණාදි) ලක්ෂණ ශාස්ත්‍ර හා යළිත් නක්ෂත්‍රය හා නො යොදන්නේ ය. (මෘග වාක්‍ය) විරුත ශාස්ත්‍ර ද ගර්භ කරණ ද චිකිත්සා ශාස්ත්‍රය ද නො සෙවුනේ යි.

932 මහණ නින්ද වචනයෙන් නො සැලෙන්නේ ය, පසස්නා ලදුයේ උඩඟු නොවන්නේ ය. මාත්සය්‍යීය සහිත ලෝභ හා ක්‍රෝධ හා පිසුනු බස් හැර පියන්නේ යි.

933 මහණ ක්‍රය-වික්‍රයෙහි නොසිටුනේ ය. (අභ්‍යන්තර-බාහිර) කිසිදු තැනෙක්හි උපවාද නොකරවන්නේ ය. ගම්හි දු නො ලැගෙන්-නේ ය. ලාභාෂාවෙන් ජනයාහට ලපනය නො කරන්නේ යි.

934 මහණ ආත්ම වර්ණනා ද නොකරන්නේ ය. සිවුපසය සඳහා ද යොදන ලද බසුදු නො කියන්නේ ය. බුහුටිබවහි දු නො හික්මෙන්නේ ය, විග්‍රාහික කථා ද නො කියන්නේ යි.

935 සම්‍යක්ප්‍රඥ ඇති මහණ මුසවා බිණීමෙහි නො යෙදෙන්නේ ය. කපටිකම් නො කරන්නේ ය. යළි දිවි පැවැත්මෙන් ප්‍රඥයෙන් හා ශීල ව්‍රතයෙන් අන්‍යයන් ඉක්මවා නො සිතන්නේ යි.

936 බැහැරි මහණුන්ගේ හෝ ක්ෂත්‍රියාදීන්ගේ අනිටු වූ බොහෝ බස් අසා ගැටුනේ රළුබසින් ඔවුන්ට පෙරලා නො කියන්නේ ය. රාගාදි කෙලෙස් සන්හිඳුවූවෝ ප්‍රතිපක්ෂ භාවය නො කෙරෙත් මැ යි.

937 එතඤ්ච ධම්මමඤ්ඤාය
විචිනං භික්ඛු සදා සතො සික්ඛෙ,
සන්තීති නිබ්බුතිං ඤත්වා
සාසනෙ ගොතමස්ස නප්පමජ්ජෙය්‍ය.

938 අභිභූ හි සො අනභිභූතො
සක්ඛිධම්මං අනීතිහමදස්සී,[1]
තස්මා හි තස්ස භගවතො සාසනෙ
අප්පමත්තො සදා නමස්සමනුසික්ඛෙති.

තුවටකසුත්තං නිට්ඨිතං.

## 4–15

## අත්තදණ්ඩ සුත්තං

939 අත්තදණ්ඩා භයං ජාතං ජනං පස්සථ මෙධගං[2]
සංවෙගං කිත්තයිස්සාමි යථා සංවිජිතං මයා.

940 ඵන්දමානං පජං දිස්වා මච්ඡෙ අප්පොදකෙ යථා,
අඤ්ඤමඤ්ඤෙහි ව්‍යාරුද්ධෙ දිස්වා මං භයමාවිසි.

941 සමන්තමසාරො ලොකො දිසා සබ්බා සමෙරිතා,
ඉච්ඡං භවනමත්තනො නාද්දසාසිං අනොසිතං.

942 ඔසානෙත්වෙව ව්‍යාරුද්ධෙ දිස්වා මෙ අරතී අහු,
අථෙත්ථ සල්ලං අද්දක්ඛිං දුද්දසං හදයනිස්සිතං.

943 යෙන සල්ලෙන ඔතිණ්ණො දිසා සබ්බා විධාවති,
තමෙව සල්ලං අබ්බුය්හ න ධාවති න සීදති.

1. සක්ඛිධම්මමනීතිහමදස්සී–මජසං
2. මෙධකං–මු 1



Free Distribution www.aathaapi.org

937 මහණ තෙල දහම දැන අනිත්‍ය ලක්ෂණාදිය විමසමින් හැමකල්හි එළඹ සිටි සිහි ඇතියේ ත්‍රිවිධ ශික්ෂායෙහි හික්මෙන්නේ ය. **රාගාදි කෙලෙසුන්ගේ සන්හිඳීම** නිවණැයි දැන ගෞතම බුද්ධ සාසනයෙහි පමා නොවන්නේ ය.

938 රූපාදිය මැඬැලූ ඒ බුදුහු (කෙලෙසුන් විසින්) නොමැඩුනාහු මෙසේ වී ලැ යි නො තකනලද ආත්ම ප්‍රත්‍යක්ෂ වූ ධර්මය දුටු. සේක. එ හෙයින් මැ ඒ භාග්‍යවතුන්වහන්සේගේ ශාසනයෙහි අප්‍රමත්ත වූයේ හැම කල්හි තුන්දෙරින් බුදුන් වඳිමින් ත්‍රිශික්ෂායෙහි හික්මෙන්නේ ය''යි (වදළ සේක)

**තුවටක සූත්‍රය නිමි.**

## 4 – 15

## අත්තදණ්ඩ සූත්‍රය

939 (කායාදි දුශ්චරිත සංඛ්‍යාත) ආත්මදණ්ඩය හේතු කොට ගෙන දිට්ඨධම්මික හෝ සාම්පරායික වූ භය උපන. (එසේ වත්ම) ප්‍රතිපක්ෂ වූ තෙල කලහකාරී ජනයා බලවු. මා විසින් (බොධිසත්ත්ව භූමියෙහි දී) යම් පරිදි තමා මැ තමහට සංවෙග දනවන ලද නම් ඒ පරිදි සංවෙගය පවසන්නෙමි.

940 දියත්තෙක මසුන් මෙන් තෘෂ්ණාදියෙන් සැලෙන සත්ත්වයා දැක උනුන් හා පිළිමල්වූවන් දැක බිය මා කරා පැමිණියේ යැ (මට බිය උපන.)

941 ලොකය (නිත්‍යත්වාදියෙන් තොර හෙයින) හාත්පසින් නිසරුය. හැම දික්හු අනිච්චතාදියෙන් සැලූනාහ. (එහෙයින්) තමහට ත්‍රාණය පතනුයෙම් ජාතිජරාදියෙන් නොමැඩුනු තැනක් නුදුටිමි.

942. යළි (යෞවනාදීන්ගේ) අවසන්හි මැ (ජරාදිය සමග) ප්‍රතිවිරුද්ධ වූ සත්ත්වයන් දැක මට අරති ය උපන, අනතුරුව ඒ සත්ත්වයන් කෙරෙහි වූ දුකසේ දැක්කයුතු සිත ඇසුරු කළ රාගානුශයාදි (සප්තවිධ) ශල්‍යයන් දිටිමි.

943. රාගාදි යම් ශල්‍යයෙකින් විදුනා ලද සත්ත්ව (දුසිරිත්, පැදුන් දික් ආදී) හැම දිගට දිවේ නම් ඒ මැ ශල්‍යය උදුරාපියා හැම දිගට හා ගති ආදියට නො දිවෙයි. (වතුරොසයෙහිත්) නො ගැලේ.

944 තත්ථ සික්ඛානුගීයන්ති
යානි ලොකෙ ගධිතානි න තෙසු පසුතො සියා.
නිබ්බිජ්ඣ සබ්බසො කාමෙ
සික්ඛෙ නිබ්බාන මත්තනො.

945 සච්චො සියා අප්පගබ්භො අමායො රිත්තපෙසුනො,
අක්කොධනො ලොභපාපං වෙවිච්ඡං විතරෙ මුනි.

946 නිද්දං තන්දිං සහෙ ථීනං පමාදෙන න සංවසෙ,
අතිමානෙ න තිට්ඨෙය්‍ය නිබ්බානමනසො නරො.

947 මොසවජ්ජෙ න නියෙය්‍ථ රූපෙ සෙනහං න කුබ්බයෙ,
මානඤ්ච පරිජානෙය්‍ය සාහසා විරතො චරෙ.

948 පුරාණං නාභිනන්දෙය්‍ය නවෙ ඛන්තිං න කුබ්බයෙ,
හීයමානෙ න සොචෙය්‍ය ආකාසං න සිතො සියා.

949 ගෙධං බ්‍රෑමි මහොඝොති ආජවං බ්‍රෑමි ජප්පනං,
ආරම්මණං පකප්පනං කාමපඞ්කො දුරච්චයො.

950 සච්චා අවොක්කම්ම[1] මුනි ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො,
සබ්බං සො[2] පටිනිස්සජ්ජ ස වෙ සන්තොති වුච්චති.

951 සවෙ විද්වා ස වෙදගූ ඤත්වා ධම්මං අනිස්සිතො,
සම්මා සො ලොකෙ ඉරියානො න පිහෙතී'ධ කස්සචි.

---

1. අවොක්කම්මං-නිද්දෙස
2. සබ්බසො-ස්‍යා



Free Distribution www.aathaapi.org

944. සත්ත්වලෝකයෙහි යම් පස් කම් ගුණ කෙනෙක් වෙත් නම් ඔවුන් නිමිති කොට හස්ති ශික්ෂාදි අනෙක ශික්ෂාවෝ උගන්නා ලැබෙත්. (නුවණැති කුලපුත්) ඒ පස්කම්ගුණයෙහි හෝ හස්ති ශික්ෂාදියෙහි ප්‍රයුක්ත නො වන්නේ ය. වස්තුකාම ක්ලේශකාමයන් අනිත්‍යාදි දර්ශනයෙන් පිළිවිද තමාගේ කෙලෙස් පිරිනිවීමට හික්මෙන්නේ යි.

945. (නිවන් සඳහා හික්මෙන) මුනි තෙමේ සත්‍යයෙන් යුක්ත වන්නේ ය. ප්‍රාගල්භ්‍ය නැතියේ වන්නේ ය. මායා නැතියේ වන්නේ ය. ප්‍රහීණ කළ පෛශුන්‍ය ඇත්තේ වන්නේ ය. ක්‍රොධ නො කරණ සුළුයේ ලෝභ පාපය ද මාත්සර්‍ය්‍යය ද ඉක්මවන්නේ යි.

946. නිවනෙහි නැමුනු සිත් ඇති සත්ත්ව තෙමේ (වේදනාදි-ස්කන්ධත්‍රය සඞ්ඛ්‍යාත නාම කායයාගේ අකර්මණ්‍ය භාවය (මිද්ධය) - කායාලස්‍ය ය ද (චිත්තයාගේ අකර්මණ්‍යභාව සඞ්ඛ්‍යාත) ථිනය ද මැඩ ලන්නේ ය. (ස්මෘති විප්‍රවාස සඞ්ඛ්‍යාත) ප්‍රමාදයෙන් නො වසන්නේ ය, අතිමානයෙහි නො සිටුනේ යි.

947. මුසවායෙහි නො යෙදෙන්නේ ය. (භූතොපාදය භෙදභින්න) රූපස්කන්ධයෙහි සත්‍ය නො කරන්නේ ය. මානය ද ත්‍රිවිධ පරිඥයෙන් පිරිසිඳ දන්නේ ය. රාගාදිභෙද ඇති සාහසචර්‍ය්‍යාවෙන් වෙන් ව හැසිරෙන්නේ යි.

948. අතීත රූපාදි අරමුණට සතුටු නො වන්නේ ය. වර්තමාන රූපාදීයෙහි දු රුචිය නො කරන්නේ ය, රූපාදි අරමුණු නැසෙත් ම ශෝක නො කරන්නේ ය. තෘෂ්ණා සඞ්ඛ්‍යාත ආකාශ ය ද ඇසුරු කෙළේ නො වන්නේ යි.

949. (මම තෘෂ්ණාව රූපාදීයෙහි ගිජුවන හෙයින්) ගෙධ යයි ද මහ වතුරෙකැ යි ද කියමි. (අරමුණෙහි දිවෙන හෙයින්) ආජවයෙකැ යි ද ජල්පනයෙකැ යි ද ආලම්බනයෙකැ යි ද ප්‍රකම්පනයෙකැ යි ද කියමි. තෙල කාමපඞ්කය දුරතික්‍රමණී ය වේ.

950. ක්ෂීණාශ්‍රව වූ මුනි තෙම සත්‍යයෙන් නො ඉක් මැ නිවන් තෙලෙහි සිටී. හෙ ඒකාන්තයෙන් සියලු ආයතනයන් දුරලා ශාන්ත වූයේ යයි කියනු ලැබේ.

951. සංස්කෘත ධර්මයන් අනිත්‍යාදි විසින් දැන තෘෂ්ණා දෘෂ්ටි-නිඃශ්‍රය රහිත හෙතෙම ඒකාන්තයෙන් පණ්ඩිත වූයේ වෙයි. හෙතෙම චතුර්මාර්ගඥානයට පැමිණියේ වෙයි. හෙතෙම සත්ත්වලොක යෙහි මොනොවට ඉරියවු පවත්වනුයේ මෙ ලොව කිසිවකුටත් තෘෂ්ණා නො කෙරෙයි.

952 යොධ කාමෙ අච්චතරි සඞ්ගං ලොකෙ දුරච්චයං,
න සො සොචති නාජ්ඣෙති ඡින්නසොතො අබන්ධනො.

953 යං පුබ්බෙ තං විසොසෙහි පච්ඡා තෙ මාහු කිඤ්චනං,
මජ්ඣෙ චෙ නො ගහෙස්සසි උපසන්තො චරිස්සසි.

954 සබ්බසො නාමරූපස්මිං යස්ස නත්ථි මමායිතං,
අසතා ච න සොචති ස වෙ ලොකෙ න ජීයති[1].

955 යස්ස නත්ථි ඉදං මෙති පරෙසං වාපි කිඤ්චනං,
මමත්තං සො අසංවින්දං නත්ථි මෙති න සොචති.

956 අනිට්ඨුරී අනනුගිද්ධො අනෙජො සබ්බධී සමො,
තමානිසංසං පබ්‍රූමි පුච්ඡිතො අවිකම්පිනං[2].

957 අනෙජස්ස විජානතො නත්ථි කාචි නිසඞ්ඛිති,
විරතො සො වියාරම්භා ඛෙමං පස්සති සබ්බධි.

958 න සමෙසු න ඔමෙසු න උස්සෙසු වදතෙ මුනි,
සන්තො සො වීතමච්ඡරො නාදෙති න නිරස්සතීති.

අත්තදණ්ඩසුත්තං නිට්ඨිතං.

1. ජීයති-මජසං.
2. අවිකම්පිතං-මු 1



Free Distribution www.aathaapi.org

952. මෙ සත්ත්වලෝකයෙහි යමෙක් වස්තුකාම කෙලෙශකාමයන් හා ඉක්මැවීමට දුෂ්කර වූ රාගාදි සඞ්ගය ද ඉක්මැවී ද සිඳින ලද තෘෂ්ණා-ස්‍රොතස ඇති, රාගාදි බන්ධන නැති හේ ශොක නො කෙරෙයි නො සිතයි.

953. අතීතයෙහි වූ සංස්කාරයන් ඇරැබැ උපදනා යම් කෙලෙස් වේ නම්, එය වියළව, අනාගතයෙහි වන සංස්කාරයන් ඇරැබ උපදනා රාගාදි කිඤ්චන තට නහමක් වේවා, ඉදින් වර්තමානයෙහි රූපාදි සංස්කාරයන් තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් නො ගන්නෙහි නම් උපශාන්ත වැ හැසිරෙන්නෙහි.

954. යම් ක්ෂීණාස්‍රවයකුට නාම-රූප දෙක නිමිති කොට තෘෂ්ණා දෘෂ්ටි මමත්වයෙක් නැද්ද, මමත්වය නැති බැවින් ම ශොක නො කෙරේ ද හෙතෙම එකාන්තයෙන් ලොවැ නො පිරිහේ.

955. යම් ක්ෂීණාස්‍රවයකුට 'මෙ මාගේ යැ' යි හෝ වැලි අනුන්ගේ යැ යි හෝ රාගාදි කිඤ්චනයෙක් නැත් ද, හෙතෙම තෘෂ්ණාදෘෂ්ටි මමත්වය නො ලබනුයේ 'මට මෙය නැතැ'යි ශොක නො කෙරේ.

956. එ කම්පිත නො වන සුලු පුද්ගලයා පුළුවුස්නා ලද මම "(හෙ) ඊර්ෂ්‍යා නැතියෙක, (රූපාදියෙහි) නො ගිජු වූයෙක, තෘෂ්ණා රහිතයෙක හැම තන්හි සම පැවැතුම් ඇත්තෙක" යන මෙ අනුසස් සතර කියමි.

957. තෘෂ්ණා රහිත වූ සංස්කාරයන් දුඃඛාදි වශයෙන් දන්නහුට (පුණ්‍යාභිසංස්කාරාදි) කිසි සංස්කාරයෙක් නැත. සංස්කාරයෙන් තොර වූ හේ හැම තන්හි ක්ෂෙමය දක්නේ යි.

958. රහත් මුනි තෙම (මාන විසින් තමා) සම වූවන් කෙරෙහි දු ලා නො කියයි. හීනයන් කෙරෙහි ලාත් නො කියයි. ශ්‍රෙෂ්ඨයන් කෙරෙහි ලාත් නො කියයි. සන්හුන් කෙලෙස් ඇති පහව ගිය මසුරුමල ඇති, හෙතෙම රූපාදි කිසි ධර්මයක් නිත්‍ය, ශුභාදි විසින් නො ගන්නේ ය. බැහැර ද නො කෙරේ යයි (මෙසේ බුදුහු වදළහ.)

**අත්තදණ්ඩ සූත්‍රය නිමි.**



Free Distribution www.aathaapi.org

## 4–16

# සාරිපුත්ත සුත්තං

959 න මෙ දිට්ඨො ඉතො පුබ්බෙ
නස්සුතො[1] උද කස්සචි,
(ඉච්චායස්මා සාරිපුත්තො)
එවං වග්ගුවදො සත්ථා
තුසිතා ගණිමාගතො.

960 සදෙවකස්ස ලොකස්ස යථා දිස්සති චක්ඛුමා,
සබ්බං තමං විනොදෙත්වා එකොව රතිමජ්ඣගා.

961 තං බුද්ධං අසිතං තාදිං අකුහං ගණිමාගතං,
බහුන්නමිධ[2] බද්ධානං අත්ථි පඤ්හෙන ආගමං.

962 භික්ඛුනො විජිගුච්ඡතො භජතො රිත්තමාසනං,
රුක්ඛමූලං සුසානං වා පබ්බතානං ගුහාසු වා.

963 උච්චාවචෙසු සයනෙසු කීවන්තො තත්ථ භෙරවා,
යෙහි භික්ඛු න වෙධෙය්‍ය නිග්ඝොසෙ සයනාසනෙ.

964 කතී පරිස්සයා ලොකෙ ගච්ඡතො අගතං[3] දිසං,
යෙ භික්ඛු අභිසම්භවෙ පන්තම්හි සයනාසනෙ.

965 ක්‍යාස්ස ව්‍යප්පථයො[4] අස්සු ක්‍යාස්සස්සු ඉධ ගොචරා,
කානි සීලබ්බතානස්සු පහිතත්තස්ස භික්ඛුනො.

---

1. නස්සුතො–මු 2
2. බහූනමිධ–මජ්ස.
3. අමතං–මු 2
4. බ්‍යප්පථයො–මජ්ස.



Free Distribution www.aathaapi.org

## 4 – 16

## සාරිපුත්‍ර සූත්‍රය

959. (ආයුෂ්මත් සාරිපුත්‍ත තෙරනුවෝ මෙසේ වදාළහ :) මෙසේ මිහිරි තෙපුල් ඇති තුසී දෙව් ලොවින් සැව මවුකුසට පැමිණි, නො හොත් දෙව්ලොවින් නික්ම ගණ මැදට පැමිණි, හෝ රහත් ගණ මැදට පැමිණි නොහොත් රහතුන්ගේ ගණාචාර්‍ය්‍ය භාවයට පැමිණි ශාස්තෲහු මෙයින් පෙර (මෙවන් පෙළහර ඇති වැ) මා විසින් නො දක්නා ලදහු වෙත් නොහොත් කිසිවකුහුගේ බසින් නො ද අසන ලදහු වෙත්.

960. පසැස් ඇති බුදුහු සදෙව් ලොවට යම් සේ පැණෙත් නම්, මිනිස්නට ද එසේ මැ පැණෙත්. නොහොත් සදේවක ලෝකයට අවිපරීත කොට පැණෙත් එකලා වූවාහු මැ (රාගාදි කෙලෙස් අඳුරු දුරු කොට නෛෂ්ක්‍රම්‍යාදි) රතියට පැමිණි සේක.

961. මෙ සස්නෙහි ක්ෂත්‍රියාදි බොහෝ ශිෂ්‍යයන් අතුරෙන් අර්ථී වූ මම තෘෂ්ණා-දෘෂ්ටි රහිත වූ ලාභාලාභාදියෙහි තාදි වූ කොහොන් වතින් තොර වූ ගණාචාර්‍ය්‍ය වූ සකස් පුරදෙරට වැඩි එ බුදුන් කරා ප්‍රශ්න හේතුයෙන් පැමිණියෙමි.

962. ජාති ආදියෙන් ජුගුප්සා කරණ රුක්මුල හෝ සොහොන හෝ පර්වතයන් සම්බන්‍ධි ගුහාවන්හි හෝ පස්කම් ගුණෙන් විවික්ත වූ ආසනය සෙවුනා මහණහට--

963. මහණතෙම නිර්ඝෝෂ වූ සෙනස්නෙහි යම් භෛරවයන් ගෙන් නො සැලේ නම්, එ කුදු මහත් සෙනසුන්හි කීපමණ භෛරවයෝ වෙත් ද, එහි නාද කරණ භයානක අරමුණු වෙත්.

964. ප්‍රාන්ත ශයනාසනයෙහි වසන මහණ යම් උවදුරු කෙනකුන් මැඩ පවත්වාලන්නේ නම්, නො ගියවිරු අමාමහනිවන් දෙසට යන ඒ මහණහට ලොවැ එබඳු උපද්‍රවයෝ කොතෙක් වෙත් ද.

965. ප්‍රාරබ්ධ වීර්‍ය්‍ය ඇති ඒ මහණහට කෙබඳු වචනයෝ වෙත් ද? ඔ හට මෙ ලෙ වහි කෙබඳු ගොචරයෝ වෙත් ද? ඔ හට කෙබඳු වූ ශීලව්‍රත කෙනෙක් වෙත් ද?



Free Distribution www.aathaapi.org

966 කං සො සික්ඛං සමාදාය එකොදි නිපකො සතො,
කම්මාරො රජතස්සෙව නිද්ධමෙ මලමත්තනො.

967 විජිගුච්ඡමානස්ස යදිදං ඵාසු
(සාරිපුත්තාති භගවා)
රිත්තාසනං සයනං සෙවතො චෙ,
සම්බොධිකාමස්ස යථානුධම්මං
තං තෙ පවක්ඛාමි යථා පජානං.

968 පඤ්චන්නං ධීරො භයානං න භායෙ
භික්ඛු සතො සප්පරියන්තචාරිං,[1]
ඩංසාධිපාතානං සිරිංසපානං[2]
මනුස්සඵස්සානං චතුප්පදානං.

969 පරධම්මිකානම්පි න සන්තසෙය්‍ය
දිස්වාපි තෙසං බහුභෙරවානි,
අථාපරානි අභිසම්භවෙය්‍ය
පරිස්සයානි කුසලානුඑසී.

970 ආතඞ්කඵස්සෙන ඛුදාය ඵුට්ඨො
සීතං අච්චුණ්හං[3] අධිවාසයෙය්‍ය,
සො තෙහි ඵුට්ඨො බහුධා අනොකො
වීරියං පරක්කම්ම දළ්හං කරෙය්‍ය.

971 ථෙය්‍යං න කරෙය්‍ය[4] න මුසා භණෙය්‍ය
මෙත්තාය ඵස්සෙ තසථාවරානි,
යදාවිලත්තං මනසො විජඤ්ඤා
කණ්හස්ස පක්ඛොති විනොදයෙය්‍ය.

972 කොධාතිමානස්ස වසං න ගච්ඡෙ
මූලම්පි තෙසං පලිඛඤ්ඤ තිට්ඨෙ,
අථප්පියං වා පන අප්පියං වා
අද්ධා භවන්තො අභිසම්භවෙය්‍ය.

1. සපරියන්තචාරිං–මජසං, මු 2
2. සරිසපානං–මජසං
3. අතුණ්හං–මජසං
අච්චුණ්හං–මු 2
4. න කාරෙ–මජසං



Free Distribution www.aathaapi.org

966. සමාහිත සිත් ඇති, ප්‍රඥාවත් වූ ස්මෘතිමත් වූ ඒ මහණ තෙම කවර ශික්ෂාවක් සමාදන් වැ කම්බුරකු ජාතරූපයාගේ මලහරණ සේ තමාගේ කෙලෙස් මල පිඹහැර පියන්නේ ද?

967. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදළ සේක: ශාරිපුත්‍රය, ජාත්‍යාදියෙන් පිළිකුල් කරන්නා වූ ඒකාන්තයෙන් විවික්ත වූ ශයනාසනය සෙවන කරණ (සිවුමග නැණ නම් වූ) සම්බෝධිය පතන්නා වූ මහණහට යම් බඳු පහසු විහරණයෙක් වේ නම්, යම් බඳු අනුධර්මයෙකුත් වේ නම්, තොපට එය ප්‍රත්‍යක්ෂයෙන් දතුවකු සෙයින් පවසන්නෙමි.

968. ධීර වූ ස්මෘතිමත් වූ ශීලාදි සතර පර්‍ය්‍යන්තයෙහි හැසිරෙන සුලු වූ මහණ ඇටමැස්සන් හා සෙසු මැස්සන්ට ද දීඝ ජාතීන්ට ද චෞරාදි මනුෂ්‍ය ස්පර්ශයන්ට ද සිංහාදි සිවුපාවුන්ට ද යනාදි පඤ්චභීතීන්ට නො බානේ යි.

669. නො සඟදූම් වූ බාහිරක ශාසනිකයන්ට ද නො බානේ ය, ඔවුන්ගේ බිය දනවන බොහෝ අරමුණු දක ද නැති නො ගන්නේ ය. තවද කුශලධර්මානුධර්මී වූයේ අන් උවදුරු ද මැඩ පවත්වන්නේ යි.

970. රෝගස්පර්ශයෙන් ද කුසගින්නෙන් ද පහස්නාලදුයේ ශීත හා අත්‍යුෂ්ණය ඉවසන්නේ ය. හෙතෙම ඒ රොගාදිස්පර්ශයෙන් නොයෙක් අයුරින් පහස්නාලදුයේ අභිසංස්කාර සහගත විඥනයට හෝ දුශ්චරිතයට අවකාශ නො කරණුයේ චෛතසික වීර්‍ය්‍යාරම්භය දැඩි කොට කරන්නේ යි.

671. සොරකම් නො කරන්නේ ය. මුසවා නො කියන්නේ ය. තෘෂ්ණා සහිත වූත් ස්ථාවර වූත් (පෘථක්ජන-ක්ෂීණාශ්‍රව) පුද්ගලයන් කෙරෙහි මෙත් සිත් පතුරුවන්නේ ය. යම් කලෙක්හි චිත්තයාගේ කැලැඹුනු බවක් දක්නේ නම් එය තෘෂ්ණා වූ මාරයාගේ පක්ෂ යයි (සිතා) දුරුකරන්නේ යි.

972. ක්‍රෝධයාගේත් අතිමානයාගේත් වශයට නො යන්නේ ය. ඒ ක්‍රොධාතිමානයන්ගේ මූලය වූ අවිද්‍යාදිය ද උදුරාපියා සිටුනේ ය. යළිත් ප්‍රියවස්තු හා අප්‍රිය වස්තු හා මැඩලනුයේ ඒකාන්තයෙන් අභිභවනය ද කරන්නේ යි.

973 පඤ්ඤං පුරක්ඛත්වා කල්‍යාණපීති
වික්ඛම්භයෙ තානි පරිස්සයානි,
අරතිං සහෙථ සයනම්හි පන්තෙ
චතුරො සහෙථ පරිදෙවධම්මෙ.

974 කිංසු අසිස්සාමි කුවං වා අසිස්සං
දුක්ඛං වත සෙත්ථ කුවජ්ජ සෙස්සං,
එතෙ විතක්කෙ පරිදෙවනෙය්‍යෙ
විනයෙථ සෙඛො අනිකෙතසාරී.

975 අන්නඤ්ච ලද්ධා වසනඤ්ච කාලෙ
මත්තං සො ජඤ්ඤා ඉධ තොසනත්ථං,
සො තෙසු ගුත්තො යතචාරි ගාමෙ
රුසිතොපි වාචං ඵරුසං න වජ්ජා.

976 ඔක්ඛිත්තචක්ඛු න ච පාදලොලො
ඣානානුයුත්තො බහුජාගරස්ස,
උපෙක්ඛමාරබ්භ සමාහිතත්තො
තක්කාසයං කුක්කුච්චඤ්චුපච්ඡින්දෙ.

977 චුදිතො වචීහි සතිමාභිනන්දෙ
සබ්‍රහ්මචාරීසු ඛිලං පභින්දෙ,
වාචං පමුඤ්චෙ කුසලං නාතිවෙලං
ජනවාදධම්මාය න චෙතයෙය්‍ය.

978 අථාපරං පඤ්චරජානි ලොකෙ
යෙසං සතීමා විනයාය සික්ඛෙ,
රූපෙසු සද්දෙසු අථො රසෙසු
ගන්ධෙසු ඵස්සෙසු සහෙථ රාගං.

979 එතෙසු ධම්මෙසු විනෙය්‍ය ඡන්දං
භික්ඛු සතිමා සුවිමුත්තචිත්තො,
කාලෙන සො සම්මා ධම්මං පරිවීමංසමානො
එකොදිභූතො විහනෙ තමං, සොති.

**සාරිපුත්තසුත්තං නිට්ඨිතං.**

**අට්ඨකවග්ගො චතුත්ථො.**

තස්සුද්දානං:-

කාමගුහට්ඨ දුට්ඨාච සුද්ධට්ඨ පරමා ජරා,
මෙත්තෙය්‍යො ච පසූරො ච මාගන්දි පුරාභෙදනං.
කලහං ද්වෙච ව්‍යූහානි පුනරෙව තුවට්ටකං
අත්තදණ්ඩං ථෙරසුත්තං ථෙරපඤ්හෙන සොළස,
තානි එතානි සුත්තානි සබ්බානට්ඨකවග්ගිකාති.



Free Distribution www.aathaapi.org

973. කල්‍යාණ වූ ප්‍රීතියෙන් යුක්ත වූයේ ප්‍රඥාව පෙරටු කොට ඒ ප්‍රකට වූත් ප්‍රතිච්ඡන්න වූත් උපද්‍රවයන් යටපත් කර ප්‍රාන්ත ශයනාසනයෙහි අරතිය මැඩ පවත්වන්නේ ය. චතුර්විධ පරිදෙව ධර්මයන් අභිභවනය කරන්නේ යි.

974. කුමක් වළඳනෙම් ද? කොහි හෝ වළඳනෙම් ද? මේ රෑ ඒකාන්තයෙන් දුකසේ ශයනය කෙළෙම් අද රෑ කොහි හොවිම් ද? යන මේ වැලැපියයුතු වූ සතර විතර්කයන් පරිබොධ රහිත වැ හැසිරෙන සුලු ශෛක්ෂ තෙමේ දුරු කරන්නේ යි.

975. මේ ශාසනයෙහි එ මහණ නිසි කල්හි පිණ්ඩපාත සඞ්ඛ්‍යාත ආහාර ද චීවර සඞ්ඛ්‍යාත වස්ත්‍ර ද ලැබ ඉතරෙතර ප්‍රත්‍යය සන්තොෂය සඳහා පටිග්ගහණ පරිභොගයෙහි මාත්‍රය දන්නේ ය. හෙතෙම එ ප්‍රත්‍යයන්හි සංයත චිත්ත ඇතියේ ගම්හි සංවරයෙන් යුක්ත වැ හැසිරෙන සුලුයේ මෙරමා විසින් ගටනාලදුයේ නමුදු පරොස්බස් නො කියන්නේ යි.

976. යටැ බලා හෙලූ ඇස් ඇතියේ පාදලොලය නැතියේ උභය-ධ්‍යානයෙහි යෙදුනේ නිදි වැරීමෙන් යුක්ත වන්නේ ය. චතුර්ථ-ධ්‍යානොපෙක්ෂාව උපදවා එකඟ වූ සිත් ඇතියේ කාමාදිවිතර්ක හා විතර්කාශ්‍රය ද කෞකෘත්‍යය ද සිඳින්නේ යි.

977. උපාධ්‍යායාදීන් විසින් වචනයෙන් චොදනා කරණ ලදුයේ සිහි ඇති වැ මැ එය සතුටින් පිළිගන්නේ ය. සබ්‍රම්සරුන් කෙරෙහි ගැටෙන සිත් ඇති බව (ක්‍රොධය) බිඳ පියන්නේ ය. නුවණින් උපදවන ලද තෙපුල් මැ බණන්නේ ය. කාලවෙලා සීලාවෙලා නො ඉක්මැ බණන්නේ ය. ජනයාගේ උපවාද කථායෙහි සිතිවිලි නුපදවන්නේ යි.

978. නැවත අනෙකක් ද කියමි. යම් රජස් කෙනකුන්ගේ ප්‍රහාණය පිණිස ස්මෘතිමත් වූයේ හික්මෙන්නේ නම්, ලෝකයෙහි එබඳු පඤ්ච රජස් කෙනෙක් වෙති: රූපාලම්බනයෙහි දු ශබ්ද ලම්බනයෙහි දු යළි රසාලම්බනයෙහි දු ගන්ධාලම්බනයෙහි දු ස්පර්ශාලම්බනයෙහි දු ඡන්දරාගය මඩනේ යි.

979. එළැඹ සිටි සිහි ඇති කෙලෙසුන් කෙරෙන් මොනොවට මිදුනු සිත් ඇති මහණ තෙම තෙල රූපාදි ධර්මයන් කෙරෙහි කාමච්ඡන්දය දුරු කරන්නේ ය. සුදුසු කාලයෙහි හෙතෙම සියලු සංස්කාරධර්මය අනිත්‍යාදි වශයෙන් මොනොවට විමසනුයේ එකඟ වූ සිත් ඇතියේ මොහාදි හැම අන්ධකාරය නසන්නේ''යි.

**සාරිපුත්ත සූත්‍රය නිමි.**

**සතර වැනි අට්ඨකවග්ග යි.**

**එහි උද්දානය :**

කාම සූත්‍ර ය, ගුහට්ඨක සූත්‍ර ය, දුට්ඨට්ඨක සූත්‍ර ය, සුද්ධට්ඨක සූත්‍ර ය, පරමට්ඨක සූත්‍ර ය, ජරා සූත්‍ර ය, තිස්සමෙත්තෙය්‍ය සූත්‍ර ය, පසූර සූත්‍ර ය, මාගන්දිය සූත්‍ර ය, පුරාභෙද සූත්‍ර ය, කලහ විවාද සූත්‍ර ය, චූල වියූහ සූත්‍ර ය, මහාවියූහ සූත්‍ර ය, තුවට්ක සූත්‍ර ය, අත්තදණ්ඩ සූත්‍ර ය, සාරිපුත්ත සූත්‍ර ය, ද යි තෙල සොළොස් සූත්‍රයෝ අෂ්ටක වර්ගයෙහි වෙති යි.



Free Distribution www.aathaapi.org

# පාරායනවග්ගො

## වත්ථුගාථා

980 කොසලානං පුරා රම්මා ආගමා දක්ඛිණාපථං,
ආකිඤ්චඤ්ඤං පත්ථයානො බ්‍රාහ්මණො මන්තපාරගූ.

981 සො අස්සකස්ස විසයෙ මුළකස්ස සමාසනෙ,
වසී ගොධාවරීකූලෙ උඤ්ඡෙන ච ඵලෙන ච.

982 තස්සෙව උපනිස්සාය ගාමො ච විපුලො අහු,
තතො ජාතෙන ආයෙන මහායඤ්ඤමකප්පයි.

983 මහායඤ්ඤං යජිත්වාන පුන පාවිසි අස්සමං,
තස්මිං පති පවිට්ඨම්හි අඤ්ඤො ආගඤ්ඡි බ්‍රාහ්මණො.

984 උග්ඝට්ටපාදො තසිතො පඞ්කදන්තො රජස්සිරො,
සො ච නං උපසඞ්කම්ම සතානි පඤ්ච යාචති.

985 තමෙනං බාවරී දිස්වා ආසනෙන නිමන්තයී,
සුඛඤ්ච කුසලං පුච්ඡි ඉදං වචනමබ්‍රවි.

986 යං ඛො මමං දෙය්‍යධම්මං සබ්බං විස්සජ්ජිතං මයා,
අනුජානාහි මෙ බ්‍රහ්මෙ නත්ථි පඤ්ච සතානි මෙ.

987 සචෙ මෙ යාචමානස්ස භවං නානුපදස්සති,
සත්තමෙ දිවසෙ තුය්හං මුද්ධා ඵලතු සත්තධා.

988 අභිසඞ්ඛරිත්වා කුහකො භෙරවං සො අකිත්තයි,
තස්ස තං වචනං සුත්වා බාවරී දුක්ඛිතො අහු.

989 උස්සුස්සති අනාහාරො සොකසල්ලසමප්පිතො,
අථොපි එවං චිත්තස්ස ඣානෙ න රමතී මනො.

990 උත්‍රස්තං දුක්ඛිතං දිස්වා දෙවතා අත්ථකාමිනී,
බාවරිං උපසඞ්කම්ම ඉදං වචනමබ්‍රවී.



Free Distribution www.aathaapi.org

# පාරායන වග්ගය

## වත්ථුගාථා

980. වේදමන්ත්‍රයෙහි කෙළ පැමිණි (බාවරී) බ්‍රාහ්මණ අකිඤ්චන-භාවය (පරිග්‍රහොපකරණ විවේකය) පතන්නේ කොසොල් රට රම්‍ය වූ (සැවැත්) නුවරින් නික්මැ දක්ෂිණාපථයට ගියේ ය.

981. එ බමුණු අස්සක රජුගේ ද මූලක රජුගේ දැයි දෙ රජුන්ගේ රාජ්‍යයන් අසල හෙවත් දෙරට අතර ගොදවරී නදී තීරයෙහි වූ අසපු-යෙක්හි කෙණෙසි අහරින් ද වනමූල ඵලාහාරයෙන්ද යැපෙමින් විසී ය.

982. ඒ ගොදවරී නදීතීරය මැ (නොහොත් එබාවරී තවුස් මැ) නිසා මහත් වූ ගමෙක් ද විය. හේ එගමින් උපන් කරවුවරින් මහායාගයක් (මහදනක්) කෙළේ ය.

983. හේ මහදන් දී යළි අසපුවට පිවිසියේ ය. ඔහු එහි පිවිසගත් කල්හි අන් බමුණෙක් එහි ආයේ යැ.

984. ගමන්හි ගැටුනු පා ඇති පිපාසිත වූ මල බැඳි දත් ඇති, දූහිලි-යෙන් වැකුණු හිස් ඇති එබමුණාත් ඔහු කරා එළැඹැ රන්මිල පන්සියක් යැදී යැ.

985. බාවරී තවුස් ඔහු දැක අස්නෙන් පැවරියැ. සුව ද නිරෝ බව ද විචාළේ යැ. මෙ බස් ද කී යැ:

986. මා සතු යම් දෙයධර්මයෙක් වී නම්, එ හැම මා විසින් දනමුඛ-යෙහි දෙන ලදී. බමුණ ම බස් හදහව රන්මිල පන්සියෙක් නැත.

987. ඉදින් භවත් යදනා මට නොදෙන්නේ නම්, අදින් සත්වන දවස්හි තා හිස් සත්කඩ වැ පැළේවා.

988. ඒ කුහක බමුණු කොහොන්වත් සකස් කොට බිය දනවන තෙපුල් කී යැ. ඔහුගේ එවදන් අසා බාවරී දෙමනස් ඇතියේ වී යැ.

989. හේ සෝහුලින් විදුනාලදුයේ නිරාහාර වැ වියැළෙයි. තවද මෙ බඳු සිත් ඇති ඔහුගේ සිත ධ්‍යානයෙහි නො ඇලෙයි.

990. එ අරමහි අරක්ගත් වැඩ කැමැති එක්තරා දේවතාවක් බියපත් වූ දුකට පැමිණි බාවරී බමුණු කරා එළැඹ මෙවදන් කිවුය.

991 න සො මුද්ධං පජානාති කුහකො සො ධනත්ථිකො,
මුද්ධනි මුද්ධපාතෙ වා ඤාණං තස්ස න විජ්ජති.

992 භොතී චරහි ජානාති තං මෙ අක්ඛාහි පුච්ඡිතා,
මුද්ධං මුද්ධාධිපාතඤ්ච තං සුණොම වචො තව.

993 අහං පෙතං න ජානාමි ඤාණං එත්ථ න විජ්ජති,
මුද්ධං මුද්ධාධිපාතෙ වා ජිනානං හෙත්ථ[1] දස්සනං.

994 අථ කො චරහි ජානාති අස්මිං පුථුවි[2] මණ්ඩලෙ,
මුද්ධං මුද්ධාධිපාතඤ්ච තං මෙ අක්ඛාහි දෙවතෙ.

995 පුරා කපිලවත්ථුම්හා නික්ඛන්තො ලොකනායකො,
අපච්චො ඔක්කාකරාජස්ස සක්‍යපුත්තො පභඞ්කරො.

996 සො හි බ්‍රාහ්මණ සම්බුද්ධො සබ්බධම්මාන පාරගූ,
සබ්බාභිඤ්ඤාබලප්පත්තො සබ්බධම්මෙසු චක්ඛුමා.
සබ්බකම්මක්ඛයං පත්තො විමුත්තො උපධික්ඛයෙ.

997 බුද්ධො සො භගවා ලොකෙ ධම්මං දෙසෙති චක්ඛුමා,
තං ත්වං ගන්ත්වාන පුච්ඡස්සු සො තෙ තං ව්‍යාකරිස්සති.

998 සම්බුද්ධොති වචො සුත්වා උදග්ගො බාවරී අහු,
සොකස්ස තනුකො ආසි පීතිඤ්ච විපුලං ලභි.

999 සො බාවරී අත්තමනො උදග්ගො
තං දෙවතං පුච්ඡති වෙදජාතො,
කතමම්හි ගාමෙ නිගමම්හි වා පන
කතමම්හි වා ජනපදෙ ලොකනාථො.
යත්ථ ගන්ත්වා නමස්සෙමු සම්බුද්ධං දිපදුත්තමං.

1000 සාවත්ථියං කොසලමන්දිරෙ ජිනො
පහූතපඤ්ඤො වරභූරිමෙධසො,
සො සක්‍යපුත්තො විධුරො අනාසවො
මුද්ධාධිපාතස්ස විදූ නරාසභො.

1001 තතො ආමන්තයී සිස්සෙ බ්‍රාහ්මණෙ මන්තපාරගෙ,
එථ මාණවා අක්ඛිස්සං සුණාථ වචනං මම.

---

1. මුද්ධා මුද්ධාධිපාතෙ ච ජිනානං හෙත–මු1 ස්‍යා PTS
2. පඨවි–මජසං



Free Distribution www.aathaapi.org

991. හේ මුදුන් (හිස) නො දන්නේ ය. හේ ධන කැමැති කුහකයෙක. මුදුනෙහි හෝ මුදුන් පැළුමෙහි නුවණෙක් ඔහට නැති.

992. ඉදින් භවත් මුදුනුදු මුදුන් පැළුමුදු දනී නම් මා විසින් පුළුවුස්නා ලද්දී එය මට කියව. තීගේ එ වචනය අසම්භ.

993. තෙල කරුණ මම ද නොදන්මි. මට මෙකරුණ කෙරෙහි ඥනයෙක් නැත. මුදුනුදු මුදුන් පැළුමුදු යන මේය ජිනයන්ගේ මැ දශීනයෙකි.

994. එසේ වත් මැ මෙ පොළෝ මඩුලුයෙහි කවරෙක් නම්, මුදුන් හා මුදුන් පැළුම හා දන්නේ ද? දේවතායෙනි, එය මට කියව.

995. පෙර කිඹුල්වත් පුරින් නික්මැ ගිය ලොකනායක වූ ඔක්කාක රජ පරපුරෙහි වූ ලොව හෙළි කරණ ශාක්‍යපුත්‍රයෙක් වේ ද,

996. බ්‍රාහ්මණය, හේ සම්බුද්ධ මැ යි. හැම ධර්මයන්ගේ පරතෙරට ගියේයැ, සියලු අභිඥ බලයනට පැමිණියේ යැ. සියලු ධර්මයන්හි නුවණැස් ඇතියේ යැ, හැම කර්මයන්ගේ ක්ෂයට පැමිණියේ ය. උප ධික්ෂය සඞ්ඛ්‍යාත නිර්වාණාලම්බනයෙහි (භවවිමුක්තියෙන්) මිදුනේ යැ.

997. පසැස් ඇති ඒ භාග්‍යවත් බුදුරජ ලොවිහි දහම් දෙසයි. මුඹ උන්වහන්සේ කරා ගොස් විචාරන්නැ, හේ මුඹට හෙළි කරන්නේ ය.

998. 'සම්බුද්ධ' යන වචනය අසා බාවරී ඔද වැඩිසිත් ඇත්තේ විය. ඔහුගේ ශොකය තුනී විය. විපුල ප්‍රීතිය ද ලැබීය.

999. සතුටු සිත් ඇති ඒ බාවරී තෙම ඔදවැඩි සිතැතියේ උපන් සොම්නස් ඇත්තේ "යම් තැනකට ගොස් අවිපදෙත්තම වූ එ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර කරමෝ නම්, ඒ ලොකනාථයෝ කවර නම් ගමෙක්හි හෝ යළි කිනම් නියම් ගමෙක්හි හෝ දනවුවෙක හෝ වසනසේක්ද? යි එ දෙවියා පිළිවිසී.

1000. පස්මරුන් දිනූ, මහාප්‍රාඥ වූ, උත්තම විපුල ප්‍රඥ ඇති, අප්‍රතිම වූ, අනාශ්‍රව වූ මුදුන් පැළුම දන්නා, නරශ්‍රෙෂ්ඨ වූ එ ශාක්‍යපුත්‍රයන් වහන්සේ කෝශල ජනපදයෙහි සැවැත්නුවර වසනසේක.

1001. එක්බිති බාවරී බමුණු වෙදමන්ත්‍රයෙහි පරතෙරපත් අතැවැස්සන් ඇමතී යැ: මාණවයෙනි, එව මම තොපට කියනෙම්, එ මාගේ වචනය අසව,

1002 යස්සස්සො දුල්ලභො ලොකෙ පාතුභාවො අභිණ්හසො,
ස්වාජ්ජ ලොකම්හි උප්පන්නො සම්බුද්ධො ඉති විස්සුතො
ඛිප්පං ගන්ත්වාන සාවත්ථිං පස්සව්හො දිපදුත්තමං.

1003 කථං චරහි ජානෙමු දිස්වා බුද්ධොති බ්‍රාහ්මණ,
අජානතං නො පබ්‍රෑහි යථා ජානෙමු තං මයං.

1004 ආගතානි හි මන්තෙසු මහාපුරිසලක්ඛණා,
ද්වත්තිංසානි[1] ච ව්‍යාඛ්‍යාතා සමත්තා අනුපුබ්බසො.

1005 යස්සෙතෙ හොන්ති ගත්තෙසු මහාපුරිසලක්ඛණා,
ද්වෙව[2] තස්ස ගතියො තතියා හි න විජ්ජති.

1006 සචෙ අගාරං අජ්ඣාවසති[3] විජෙය්‍ය පඨවිං ඉමං.
අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන මනුසාසති.

1007 සචෙ ච සො පබ්බජති අගාරා අනගාරියං,
විවත්තච්ඡද්දො[4] සම්බුද්ධො අරහා භවති අනුත්තරො.

1008 ජාතිං ගොත්තඤ්ච ලක්ඛණං මන්තෙ සිස්සෙ පුනාපරෙ,
මුද්ධං මුද්ධාධිපාතඤ්ච මනසායෙව පුච්ඡථ.

1009 අනාවරණදස්සාවී යදි බුද්ධො භවිස්සති,
මනසා පුච්ඡිතෙ පඤ්හෙ වාචාය විස්සජෙස්සති.

1010 බාවරිස්ස වචො සුත්වා සිස්සා සොළස බ්‍රාහ්මණා,
අජිතො තිස්සමෙත්තෙය්‍යො පුණ්ණකො අථ මෙත්තගූ.

1011 ධොතකො උපසීවො ච නන්දො ච අථ හෙමකො,
තොදෙය්‍යකප්පා දුභයො ජතුකණ්ණී ච පණ්ඩිතො

1012 භද්‍රාවුධො උදයො ච පොසාලො චාපි බ්‍රාහ්මණො,
මොඝරාජා ච මෙධාවී පිඞ්ගියො ච මහාඉසී.

1013 පච්චෙකගණිනො සබ්බෙ සබ්බලොකස්ස විස්සුතා,
ඣායී ඣානරතා ධීරා පුබ්බවාසනවාසිතා.

1014 බාවරිං අභිවාදෙත්වා කත්වා ච නං පදක්ඛිණං,
ජටාජිනධරා සබ්බෙ පක්කාමුං උත්තරාමුඛා.

1. ද්වත්තිංසා ච – මු
2. දෙවයෙව – මජසං
3. ආවසති – මජසං
4. විවත්තච්ඡදෙ – මජසං



Free Distribution www.aathaapi.org

1002 ලොකයෙහි යමක්හුගේ තෙල එක්වන් උපත දුලබ වේ නම්, 'සම්බුද්ධ'යහයි විශ්‍රැත වූ ඔබ දූත් ලොවහි උපන්හ. වහා සැවතට ගොස් එ ද්විපදෙත්තමයා දකුව.

1003 බ්‍රාහ්මණයෙනි, උත්වහත්සේ දක 'මෙ බුදුහ' යි කිසෙයින් දනුම්හ. අපි ඔවුන් යම්සේ දතහෙන්නමෝ නම්, නොදන්නා අපට එ සෙයින් කිව මැනවැයි (කීහ.)

1004. පිළිවෙළින් විස්තර කරණ ලද පරිපූර්ණ වූ දෙතිස් මහපුරිස් ලකුණු වේදයෙහි ආයේ ය.

1005. යම් පුරුෂයකු ගේ ශරීරාවයවයන්හි තෙල මහපුරිස් ලකුණු වෙත් නම්, ඔහට දෙගතියෙක් මැ එයි. තෙවැන්නෙක් නො වේ.

1006. ඉදින් හේ ගිහිගෙහි වෙසේ නම්, නො දඬින්, නො සැතින් මෙ පොළොව දිනා දැහැමින් අනුසස්නේ යැ. (සක්විති රජ වෙයි.)

1007 තවද ඉදින් හේ ගිහිගෙන් නික්මැ සසුන් වදී නම්, පෙරළ කෙලෙස් සෙවෙණි ඇතියේ අර්හත් අනුත්තර සම්‍යක් සම්බුද්ධ වෙයි.

1008. (තෙපි මාගේ) ජාතිය ද ගොත්‍රය ද ලක්ෂණ ද උගත් වෙදය ද සිසුනු ද යළිත් අන්‍ය වූ මුදුනු ද මුදුන් පැළීමු ද සිතින් මැ පුළුවුස්ව.

1009. ඉදින් හේ අනාවරණ ඥානදර්ශන ඇති බුදු වේ නම්, තොප සිතින් පුළුවුත් පැන වචනයෙන් විසඳන්නේ යි.

1010–12 බාවරීබමුණු ගේ බස් අසා අජිත ය, තිස්සමෙත්තෙය්‍ය ය, පුණ්ණක ය, යළි මෙත්තගු ය, ධොතක ය, උපසීව ය, නන්ද ය, යළි හෙමක ය, තොදෙය්‍ය කප්ප යන දෙදෙන ය, පණ්ඩිත වූ ජතුකණ්ණි ය, භද්‍රායුධ ය, උදය යැ, පොසාල බමුණු යැ ප්‍රාඥ වූ මොඝරාජ ය, මහර්ෂි පිඞ්ගිය යැ යන සොළොස් බමුණු අතවැසියෝ–

1013 හැම දෙන වෙන වෙන ශිෂ්‍යගණයා ඇති වැ හැම ලොව පළට වූවාහු ධ්‍යාන කරන්නාහු ධ්‍යානයෙහි නිරත වූවාහු ධෘතිසම්පන්න වූවාහු පූර්ව පුණ්‍යවාසනා ගුණයෙන් වාසිත සිත් ඇත්තාහු.

1014 බාවරිහු වැඳ ඔහු පැදකුණු ද කොට සියල්ලෝ දළඹුවුලු අඳුන් දිවිසම් දරන්නාහු උතුරු දෙසට මුහුණ ලා ගියහ.



Free Distribution www.aathaapi.org

1015 මූළ්හකස්ස පතිට්ඨානං පුරිමං මාහිස්සතිං[1] තදා,
උජ්ජෙනිඤ්චාපි ගොනද්ධං වෙදිසං වනසව්හයං.

1016 කොසම්බිං චාපි සාකෙතං සාවත්ථිඤ්ච පුරුත්තමං,
සෙතව්‍යං[2] කපිලං වත්ථුං කුසිනාරඤ්ච මන්දිරං.

1017 පාවඤ්ච භොගනගරං වෙසාලිං මාගධං පුරං,
පාසාණකං චෙතියඤ්ච රමණීයං මනොරමං.

1018 තසිතො වුදකං සීතං මහාලාභංව වාණිජො,
ඡායං ඝම්මාභිතත්තොව තුරිතා පබ්බතමාරුහුං.

1019 භගවා තම්හි සමයෙ භික්ඛුසඞ්ඝපුරක්ඛතො,
භික්ඛූනං ධම්මං දෙසෙති සීහොව නදතී වනෙ.

1020 අජිතො අද්දස සම්බුද්ධං සතරංසිංව[3] භානුමං,
චන්දං යථා පණ්ණරසෙ පරිපූරිං උපාගතං.

1021 අථස්ස ගත්තෙ දිස්වාන පරිපූරඤ්ච ව්‍යඤ්ජනං,
එකමන්තං ඨිතො හට්ඨො මනොපඤ්හෙ අපුච්ඡථ.

1022 ආදිස්ස ජම්මනං බ්‍රෑහි ගොත්තං බ්‍රෑහි සලක්ඛණං,
මන්තෙසු පාරමිං බ්‍රෑහි කති වාචෙති බ්‍රාහ්මණො.

1023 වීසං වස්සසතං ආයු සො ච ගොත්තෙන බාවරී,
තීණිස්ස[4] ලක්ඛණා ගත්තෙ තිණ්ණං වෙදාන පාරගූ.

1024 ලක්ඛණෙ ඉතිහාසෙ ච සනිඝණ්ඩුසකෙටුභෙ,
පඤ්ච සතානි වාචෙති සධම්මෙ පාරමිං ගතො.

1025 ලක්ඛණානං පවිචයං බාවරිස්ස නරුත්තම,
තණ්හච්ඡිද[5] පකාසෙහි මා නො කංඛායිතං අහු.

---

1. පුරිමාහිස්සතිං – මජසං. පුරං මාහිසාසතිං – ස්‍යා
2. සෙතබ්‍යං – මජසං.
3. විතරංසිංව – සී.
4. තිණිස්ස – මජසං.
5. කංඛච්ඡිද – මජසං.



Free Distribution www.aathaapi.org

1015. මූලක ජනපදයට අයත් පතිට්ඨාන නගරයට ද මාහිස්සතී නම් පළමු නගරයට ද උජ්ජේනී නගරයට ද එසේම ගොනද්ධ (ගොධ) පුරයට ද, වෙදිස නගරයට ද වල්සැවතට ද,

1016 කොසැඹෑ නුවරට ද වැලිත් සාකේත නගරයට ද උතුම් සැවැත් නුවරට ද සෙතව්‍ය නගරයට ද කපිලවත්‍ථු පුරයට ද කුසිනාරා-නගරයට ද,

1017 පාවා නගරයට ද භොගනගරයට ද විසල් පුරට ද මගධරට අගනුවර වූ රාජගහ නගරයට ද සිත්කලු මනරම් වූ පහණසැවෙහෙරට ද,

1018 පවස් ඇතියකු සිහිල් දියකට මෙන් වෙළෙඳක්හු මහත් ලාභය කට මෙන් ගිම්න් තැවුනක්හු සෙවණකට මෙන් උපන් සොම්නස් ඇත්තාහු පර්වතයට නැංගාහ.

1019 එ සමයෙහි භාග්‍යවතුන්වහන්සේත් බික්සඟුන් විසින් පෙරටු කරණ ලද සේක් වෙනෙහි සිහරදකු නද කරන්නා සේ භික්ෂූන්ට දහම් දෙසන සේක.

1020 අජිතමාණව සිය ගණන් රැස් ඇති හිරුසෙයින් පුණුරැසි පොහෝ දිනෙහි දිළියෙන සොළොස් කලායෙන් පිරි සඳ සෙයින් සම්බුදුන් දිටී.

1021 එක්බිති උන්වහන්සේගේ සිරුරෙහි පිරිපුන් මහපුරිස් ලකුණු දැක සතුටු වූයේ එකත්පස් වැ සිටියේ මනසින් පැන පුළුවුත්.

1022 අප ඇදුරන් ඇරැබැ ජාතිය (වයස්) කිව මැනැවැ පුරිස් ලකුණු සහිත කොට ගොත් ද කියනු මැනැව, වේදයන්හි නිමාවට පැමිණීම ද කිව මැනව, එ බමුණු කෙතෙක් අතවැස්සන් හදරවාද ? යි (විචාළේ ය)

1023. (තොපගේ ඇදුරු) වයසින් එක්සියවිසි හැවිරිදි වෙයි. හෙ ද ගොත්‍ර විසින් බාවරී (ප්‍රාවරී) නම් වේ, ඔහුගේ සිරුරෙහි මහපුරිස්ලකුණු තුනෙකි. ත්‍රිවෙදයෙහි පරතෙරට ගියේ ය.

1024. (මහාපුරුෂ) ලක්ෂණයෙහි ද නිඝණ්ඩු සහිත කෙටුභ ශාස්ත්‍ර සහිත, ඉතිහාසයෙහි ද ස්වකීය බ්‍රාහ්මණ ධර්මයෙහි ද පරතෙරට ගියේ අතැවැස්සන් පන්සියයක් හදරව යි.

1025 තෘෂ්ණාව සිඳ ලූ නරොත්තමයෙනි, බාවරී බමුණුගේ පුරුෂ ලක්ෂණයන් පිළිබඳ විස්තරය පවසන්නැ. අපට නහමක් සැක වේවා: (සිතින් පුළුවුත්)



Free Distribution www.aathaapi.org

1026 මුඛං ජිව්හාය ඡාදෙති උණ්ණස්ස භමුකන්තරෙ,
කොසොහිතං වත්ථගුය්හං එවං ජානාහි මාණව.

1027 පුච්ඡං හි කිඤ්චි අසුණන්තො සුත්වා පඤ්හෙ වියාකතෙ,
විචින්තෙති ජනො සබ්බො වෙදජාතො කතඤ්ජලී.

1028 කො නු දෙවෙ ව බ්‍රහ්මා වා ඉන්දො වාපි සුජම්පති,
මනසා පුච්ඡිතෙ පඤ්හෙ තමෙතං පටිභාසති.

1029 මුද්ධං මුද්ධාධිපාතඤ්ච බාවරී පරිපුච්ඡති,
තං ව්‍යාකරොහි භගවා කඞ්ඛං විනය නො ඉසෙ.

1030 අවිජ්ජා මුද්ධාති ජානාහි විජ්ජා මුද්ධාධිපාතිනී,
සද්ධාසතිසමාධීහි ඡන්දවීරියෙන සංයුතා.

1031 තතො වෙදෙන මහතා සන්ථම්භිත්වාන මාණවො,
එකංසං අජිනං කත්වා පාදෙසු සිරසා පති.

1032 බාවරී බ්‍රාහ්මණො භොතො සහසිස්සෙහි මාරිස,
උදග්ගචිත්තො සුමනො පාදෙ වන්දති චක්ඛුම.

1033 සුඛිතො බාවරී හොතු සහසිස්සෙහි බ්‍රාහ්මණො,
ත්වඤ්චාපි සුඛිතො හොහි චිරං ජීවාහි මාණව.

1034 බාවරිස්ස ච තුය්හං වා සබ්බෙසං සබ්බසංසයං,
කතාවකාසා පුච්ඡව්හො යං කිඤ්චි මනසිච්ඡථ.

1035 සම්බුද්ධෙන කතොකාසො නිසීදිත්වාන පඤ්ජලී,
අජිතො පඨමං පඤ්හං තත්ථ පුච්ඡි තථාගතං.

වත්ථුගාථා නිට්ඨිතා.



Free Distribution www.aathaapi.org

1026 මාණවය, හේ (තමා) දිවින් මුව වසයි. උහුගේ දෙබැම අතුරෙහි උණ්ණලොම වෙයි. වස්ත්‍රගුහ්‍යය කොෂාවහිත වේ. මෙ කරුණ මෙ සේ ද නැ යි (වදළහ.)

1027. හැම ජන තෙමේ, පුළුවුස්නා කිසිදු පැනයක් නො අසනුයේ විසැඳූ පැන අසා උපන් සොම්නස් ඇත්තේ බඳැඳිලි වැ මෙසේ සිතයි.

1028. කවර නම් දෙවියෙක් හෝ බඹෙක් හෝ සුජම්පති වූ ඉන්ද්‍ර හෝ සිතින් විචාළ පැන විසඳා ද? (ඔවුනතුරෙන්) කවරක්හට තෙල පැන වැටහේ දැ' යි

1029. භාග්‍යවතුන් වහන්ස, බාවරී බමුණුතෙම මුදුනුදු මුදුන් පැළුමුදු පුළුවුසී. එය විසඳන්නැ. සෘෂීන් වහන්ස, අපගේ සැකය දුරලන්නැ යි.

1030. අවිද්‍යාව (සසර හිස්වන බැවින්) මුදුනැ, ශ්‍රද්ධා, ස්මෘති, සමාධි ඡන්ද, වීර්‍ය්‍ය යන මොවුන් හා සමග යෙදුනු (අර්හත්මාර්ග) විද්‍යාව මුදුන් පළනයි දනැයි.

1031. එක්බිති අජිතමාණව මහත් ප්‍රීතියෙන් සංස්තබ්ධ වැ අඳුන් දිවි සම් එකස් කොටලා (බුදුන්) පාපිට හිස්තබා වැඳ වැටිනි.

1032. ''නිදුකානන් වහන්ස, පසැඳුන් වහන්ස, බාවරී බ්‍රාහ්මණ ඔද වැඩි සිතැති වැ, සොම්නස් වැ භවත්හුගේ පා වඳනේ ය'යි.

1033. බාවරී බමුණු අතැවැසියන් හා සමග සුවපත් වේවා, මාණවය, තො ද සුවපත් වෙයි, සැරදෙයි, (වදළෝ)

1034. තෙපි කළ අවකාශ ඇතියවූ, යමක් පුළුවුස්නට සිතින් කැමැතියවූ නම්, බාවරීහුගේ වේවයි, තොප හැමගේ වේව යි, එ හැම සංශය පුළුවුස්වයි (වදළසේක)

1035. සම්බුදුන් විසින් කළ අවකාශ ඇති අජිතමාණව බඳැඳිලි වැ හිඳ එහි පළමු පැන බුදුන් පිළිවිත්.

වස්තු ගාථා නිමි.



Free Distribution www.aathaapi.org

## 5–1

## අජිත සුත්තං[1]

1036 කෙනස්සු නිවුතො ලොකො(ඉච්චා යස්මා අජිතො)
කෙනස්සු නප්පකාසති,
කිස්සාභිලෙපනං බ්‍රූසි කිංසු තස්ස මහබ්භයං

1037 අවිජ්ජාය නිවුතො ලොකො (අජිතාති භගවා.)
වෙවිච්ඡා පමාද නප්පකාසති,
ජප්පාභිලෙපනං බ්‍රූමි දුක්ඛමස්ස මහබ්භයං

1038 සවන්ති සබ්බධි සොතා (ඉච්චා යස්මා අජිතො)
සොතානං කිං නිවාරණං
සොතානං සංවරං බ්‍රූහි කෙන සොතා පිථීයරෙ[2]

1039 යානි සොතානි ලොකස්මිං (අජිතාති භගවා)
සති තෙසං නිවාරණං,
සොතානං සංවරං බ්‍රූමි පඤ්ඤායෙතෙ පිථීයරෙ[2]

1040 පඤ්ඤා චෙව සති චෙව (ඉච්චායස්මා අජිතො.)
නාමරූපඤ්ච මාරිස,
එතං මෙ පුට්ඨො පබ්‍රූහි කත්ථෙතං උපරුජ්ඣති

1011 යමෙතං පඤ්හං අපුච්ඡි අජිත තං වදමි තෙ,
යත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති,
විඤ්ඤාණස්ස නිරොධෙන එත්ථෙතං උපරුජ්ඣති.

1042 යෙ ච සඞ්ඛාතධම්මා සෙ යෙ ච සෙඛා පුථූ ඉධ,
තෙසං මෙ නිපකො ඉරියං පුට්ඨො පබ්‍රූහි මාරිස.

1043 කාමෙසු නාභිගිජ්ඣෙය්‍ය මනසා නාවිලො සියා,
කුසලො සබ්බධම්මානං සතො භික්ඛු පරිබ්බජෙති.

1. අජිතසුත්තං පඨමං.[3]

---

1. අජිතමාණව පුච්ඡා – ම. ඡ. සං.
2. පිධියරෙ – ම. ඡ. සං.
3. අජිතමාණව පුච්ඡා ම. ඡ, සං,



Free Distribution www.aathaapi.org

## 5 – 1

## අජිතමාණව පෘච්ඡා

1036. (ආයුෂ්මත් අජිත මෙසේ පිළිවිත්:) ලෝවැසි තෙම කිමෙකින් නිවෘත (වැසුනේ) ද? කවර හෙයින් නො පැණේ ද? ඔහට කිමෙක් අභිලෙපන (ලහටු) වේ'යයි වදරණසේක් ද? කිමෙක් ඔහට මහබිය නම් වේ දැ'යි.

1037. (අජිතයෙනි, යි බුදුහු වදළහ), ලොවැසි තෙම අවිද්‍යායෙන් නිවෘත යැ. මාත්සර්‍ය්‍ය හෙයින් ප්‍රමාද හෙයින් ප්‍රකාශිත නො වෙයි, තෘෂ්ණාව අභිලෙපන යයි කියමි, ඔහට (ජාත්‍යාදි) දුක මහබිය වෙයි.

1038. (ආයුෂ්මත් අජිත මෙසේ පිළිවිත්:) හැම තන්හි (රූපාදි හැම ආයතනයන්හි තෘෂ්ණාදි) ස්‍රොතස්හු ගලායෙති. ස්‍රොතසුන්ගේ ආවරණය කවරැ? ස්‍රොතසුන්ගේ සංවරය වදළමැනැවි. කවර දහමෙකින් ස්‍රොතස්හු පියනු ලැබෙත් ද?

1039. අජිතයෙනි, (යි භාග්‍යවතුන් වහන්සේ වදළසේක:), ලොව යම් ස්‍රොතස් කෙනෙක් වෙත් නම්, ස්මෘතිය ඔවුන්ට ආවරණ යැ. (එ ස්මෘතිය) ස්‍රොතසුන්ගේ සංවර යයි කියමි. (මාර්ග) ප්‍රඥායෙන් තෙල ස්‍රොතස්හු පියනු ලැබෙත්.

1040. (ආයුෂ්මත් අජිත මෙසේ පිළිවිත්:) නිදුකානන් වහන්ස, ප්‍රඥාව ද සම්ෘතිය ද (තදවශෙෂ) නාමරූපය ද යන තෙල සියල්ල කොහි නිරුද්ධ වේ ද? මාවිසින් පුළුවුස්නාලද මුඹ වහන්සේ තෙල කරුණ මට වදළමැනව.

1041. අජිතයෙනි, තෙපි යම් පැනයක් විචාළවු ද, එය තොපට කියමි. යම් තැනෙක්හි නාමයත් රූපයත් නිරවශේෂයෙන් නිරුද්ධ වේ ද, (පශ්චිම) විඥානයාගේ නිරොධය හාමැ (පෙර පසු නැතිව) තෙල විඥාන නිරොධයෙහි මැ තෙල නාමරූපය උපරුද්ධ වෙයි. (විඥානනිරොධය ඉක්මැ නො යෙයි)·

1042. නිදුකානන් වහන්ස, මෙ ලෝකයෙහි (අනිත්‍යාදි විසින්) විමසන ලද දහම් ඇති යම් (අශෛක්ෂ) කෙනෙක් වෙත් නම් යම් බොහෝ වූ ශෛක්ෂ කෙනෙකුත් වෙත් නම්, මා විසින් පුළුවුස්නා ලද සේක් (ශෛක්ෂාශෛක්ෂධර්මයෙහි) පණ්ඩිත වූ මුඹ වහන්සේ ඔවුන්ගේ ප්‍රතිපත්තිය වදළ මැනැව.

1043. කාමයෙහි ගිජු නොවන්නේ ය. සිතින් නොකැළැඹුනෙක් වන්නේ ය. මහණ සකලධර්මයන්හි කුශල වූයේ ස්මෘතිමත් වැ හැසිරෙන්නේ යැ යි.

**අජිත මාණව පෘච්ඡා නිමි.**



Free Distribution www.aathaapi.org

## 5–2

### තිස්සමෙත්තෙය්‍යසුත්තං[1]

1044 කොධ සන්තුසිතො ලොකෙ (ඉච්චායස්මා තිස්ස මෙත්තෙය්‍යො.)
කස්ස නො සන්ති ඉඤ්ජිතා,
කො උභන්තමභිඤ්ඤාය මජ්ඣෙ මන්තා න ලිප්පති,
කං බ්‍රූසි මහාපුරිසොති කො ඉධ සිබ්බිනිමච්චගා?

1045 කාමෙසු බ්‍රහ්මචරියවා (මෙත්තෙය්‍යාති භගවා)
වීතතණ්හො සදා සතො,
සඞ්ඛාය නිබ්බුතො භික්ඛු
තස්ස නො සන්ති ඉඤ්ජිතා.

1406 සො උභන්තමභිඤ්ඤාය මජ්ඣෙ මන්තා න ලිප්පති,
තං බ්‍රූමි මහාපුරිසොති සොධ[3] සිබ්බනිමච්චගාති.

තිස්සමෙත්තෙය්‍යසුත්තං දුතියං[2].

## 5–3

### පුණ්ණකසුත්තං[4]

1047 අනෙජං මූලදස්සාවිං (ඉච්චායස්මා පුණ්ණකො)
අත්ථි පඤ්හෙන ආගමං
කිං නිස්සිතා ඉසයො මනුජා ඛත්තියා බ්‍රාහ්මණා දෙවතානං
යඤ්ඤමකප්පයිංසු පුථූ ඉධ ලොකෙ පුච්ඡාමි තං භගවා
බ්‍රූහිමෙතං.

1048 යෙ කෙචිමෙ ඉසයො මනුජා (පුණ්ණකාති භගවා)
ඛත්තියා බ්‍රාහ්මණා දෙවතානං
යඤ්ඤමකප්පයිංසු පුථූ ඉධ ලොකෙ,
ආසිංසමානා පුණ්ණක ඉත්ථභාවං
ජරං සිතා යඤ්ඤමකප්පයිංසු.

---

1. තිස්සමෙත්තෙය්‍ය මාණවපුච්ඡා - ම. ජ. සං.
2. තිස්ස මෙත්තෙය්‍ය මාණව පුච්ඡා - ම ජ සං.
3. සො ඉධ - ම ජ සං.
4. පුණ්ණක මාණව පුච්ඡා - ම ජ සං.



Free Distribution www.aathaapi.org

## 5 – 2

## තිස්සමෙත්තෙය්‍ය මාණව පෘච්ඡා

1044. (ආයුෂ්මත් තිස්ස මෙත්තෙය්‍ය මෙසේ පිළිවිත්:)

කවරෙක් මෙලොව සන්තුෂ්ට වේ ද? කවරක්හට (තෘෂ්ණා දෘෂ්ටි) ඉඤ්ජනයෝ (කම්පනයෝ) නැද්ද? කවරෙක් අන්තද්වය විශිෂ්ට ඥානයෙන් දැන, මධ්‍යයෙහි ප්‍රඥායෙන් නො ඇලේ ද? කවරක්හු මහාපුරුෂයයි කියන සේක් ද? මෙහි කවරෙක් තෘෂ්ණා සිබ්බනිය ඉක්මැගියේ දැයි?

1045. (මෛත්‍රෙයයයෙනි, යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක:) කාමයෙහි (ආදීනව දැක) මෛථුනසර ඇති, පහ වූ තෘෂ්ණා ඇති හැම කල්හි ස්මෘතිමත් වූ (අනිත්‍යාදි විසින් දහම්) විමසා රාගාදිය (නිවී මෙන්) නිවුනු යම් මහණෙක් වේ නම්, ඔහට ඉඤ්ජිනයෝ නැත්තාහ.

1046. හේ අන්තද්වය විශිෂ්ටඥානයෙන් දැන මධ්‍යයෙහි ප්‍රඥායෙන් නො ඇලෙයි. ඔහු මහාපුරුෂයයි කියමි. හේ මෙ ලොව්හි තෘෂ්ණා සිබ්බනිය ඉක්මැ ගියේ යි.

**තිස්ස මෙත්තෙය්‍යමාණව පෘච්ඡා නිමි.**

## 5 – 3

## පුණ්ණකමාණව පෘච්ඡා

1047. (ආයුෂ්මත් පුණ්ණක මෙසේ විචාරයි;) තෘෂ්ණා රහිත වූ, (එහෙයින්) අටලෝ්හදම්හි කම්පා රහිත වූ අකුශල මූලාදිය දක්නා සුලු වූ භාග්‍යවතුන් වහන්සේ කරා ප්‍රශ්නයෙන් ප්‍රයෝජන ඇත්තමෝ ආම්හ. මෙලොවැ සෘෂිහු ය, මනුෂ්‍යයෝ ය, ක්ෂත්‍රියෝ ය, බ්‍රාහ්මණයෝ ය යන බොහෝ යාගකරුවෝ කුමක් ඇසිරි කළාහු දෙවියනට දෙයධර්මය පයෙෂ්ෂණ කෙරෙත් ද? (යාග කෙරෙත් ද?) භාග්‍යවතුන් වහන්ස, එ කරුණ ඔබවහන්සේ පුළුවුස්මි. තෙල කරුණ වදාළ මැනැවි.

1048. (බුදුහු මෙසේ වදාළහ: පුණ්ණකය,) මෙ ලොකයෙහි සෘෂිහු ය, මනුෂ්‍යයෝ ය, ක්ෂත්‍රියයෝ ය, බ්‍රාහ්මණයෝ ය යන මෙබඳු යම් බොහෝ යාගකරුවෝ දෙවියනට යාග කෙරෙත් ද, පුණ්ණකය, ඔහු ජරාව (සසරදුක්) නිසා මෙ මනුෂ්‍යාදි භාවය පතන්නාහු (දෙවියනට) යාග කෙරෙත්.



Free Distribution www.aathaapi.org

1049 යෙ කෙචි'මෙ ඉසයො මනුජා (ඉච්චායස්මා පුණ්ණකො)
ඛත්තියා බ්‍රාහ්මණා දෙවතානං
යඤ්ඤමකප්පයිංසු පුථූ ඉධ ලොකෙ
කච්චිස්සු තෙ භගවා යඤ්ඤපථෙ අප්පමත්තා
ආතාරු ජාතිඤ්ච ජරං ච මාරිස
පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං.

1050 ආසිංසන්ති[1] ථොමයන්ති
අභිජප්පන්ති ජුහන්ති (පුණ්ණකාති භගවා)
කාමාභිජප්පන්ති පටිච්ච ලාභං,
තෙ යාජයොගා භවරාගරත්තා
නාතරිංසු ජාතිජරන්ති බ්‍රෑමි.

1051 තෙ චෙ නාතරිංසු යාජයොගා (ඉච්චායස්මා පුණ්ණකො)
යඤ්ඤෙහි ජාතිඤ්ච ජරඤ්ච මාරිස,
අථ කො චරහි දෙවමනුස්සලොකෙ
අතාරි ජාතිඤ්ච ජරඤ්ච මාරිස
පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං.

1052 සඞ්ඛාය ලොකස්මිං පරොවරානි[2] (පුණ්ණකාති භගවා)
යස්සිඤ්ජිතං නත්ථි කුහිඤ්චි ලොකෙ,
සන්තො විධූමො අනීඝො නිරාසො
අතාරි සො ජාතිජරන්ති බ්‍රෑමීති.

පුණ්ණකසුත්තං තතියං[3].

## 5-4

## මෙත්තගුසුත්තං[4]

1053 පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං (ඉච්චායස්මා මෙත්තගු)
මඤ්ඤාමි තං වෙදගුං භාවිතත්තං,
කුතො නු දුක්ඛා සමුදගතා ඉමෙ
යෙ කෙචි ලොකස්මිං අනෙකරූපා.

1. ආසීසන්ති - ම ඡ සං
2. පරොපරානි - ම ඡ සං
3. පුණ්ණකමාණවපුච්ඡා තතියා
4. මෙත්තගූමාණවපුච්ඡා - ම ඡ සං



Free Distribution www.aathaapi.org

1049. (ආයුෂ්මත් පුණ්ණක මෙසේ විචාරයි: මෙ ලෝකයෙහි ඍෂීහු ය, මනුෂ්‍යයෝ ය, ක්ෂත්‍රියයෝ ය, බ්‍රාහ්මණයෝ ය, යන මෙබඳු බොහෝ යාගකරුවෝ දෙවියනට යාග කෙරෙත් ද, භාග්‍යවතුන් වහන්ස, කිම, ඔහු යාගයෙහි අප්‍රමත්ත වූවාහු ජාතියත් ජරාවත් තරණය කළාහු ද? නිදුකාණන් වහන්ස එය මුඹවහන්සේ විචාරමි. භාග්‍යවතුන් වහන්ස, තෙල කරුණ මට වදාළ මැනවි,

1050. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ:) පුණ්ණකය, ඔහු රූපප්‍රතිලාභාදිය ප්‍රාර්ථනා කෙරෙති. (යාගාදිය) පසසත්. (රූපාදි) ප්‍රතිලාභය පිණිස වාග්භෙද කෙරෙත්. පූජා කරත්. රූපාදි ප්‍රතිලාභය සඳහා පුනපුනා කාමයන් මැ (අපට වුව මැනවැයි) කියත්. යාගයෙහි යෙදුනු, භවරාගයෙන් රැදුනු ඔහු ජාතිජරාදි (සසර දුක) තරණය නො කළහ යි කියමි.

1051 (ආයුෂ්මත් පුණ්ණක මෙසේ විචාරයි:) නිදුකානන් වහන්ස, යාජයොග වූ ඔහු ඉදින් යාගයන් කරණ කොට ජාතියත් ජරාවත් තරණය නො කළාහු නම්, නිදුකානන් වහන්ස, එකල්හි දෙව්මිනිස් ලොව කවරෙක් ජාතියත් ජරාවත් තරණය කෙළේ ද? එ කරුණ පුළුවුස්මි භාග්‍යවතුන් වහන්ස, තෙල මට වදළමැනැව.

1052. (භාග්‍යවතුන් වහන්සේ මෙසේවදාළහ: පුණ්ණකය,) සත්ත්ව ලෝකයෙහි (පරාත්මභාව ස්වාත්මභාවාදි) පරාවරයන් නුවණින් විමසා (දත්) යම් ක්ෂීණාස්‍රවයක්හට ලොවැ කිසි තැනෙක්හි ඉඤ්ජිතයෙක් නැද්ද, (සන්හුන් කෙලෙස් ඇති හෙයින්) ශාන්ත වූ කායදුශ්චරිතාදි ධූම විරහිත වූ (රාගාදි) උපද්‍රව රහිත වූ ආශා රහිත වූ එ ක්ෂීණාස්‍රව තෙම ජාතිජරා තරණය කෙළේයයි කියමි'.

**පුණ්ණක මාණව පෘච්ඡා නිමි.**

## 5 – 4

## මෙත්තගුමාණව පෘච්ඡා

1053 (ආයුෂ්මත් මෙත්තගු මෙසේ පිළිවිත්:) භාග්‍යවතුන් වහන්ස, මුඹ වහන්සේ තෙල කරුණ පුළුවුස්මි. වදළ මැනව. මුබ වහන්සේ ඥානවෙදයාගේ පරතෙරට පැමිණි කෙනකුන් කොට වැඩූ සිත් ඇති කෙනකුන් කොට හඟිමි. ලෝකයෙහි අනේකස්වභාව වූ යම් කිසි දුක් කෙනෙක් වෙත් ද, මෙ දුඃඛයෝ කොයින් උපන්නාහු ද?

1054 දුක්ඛස්ස වෙ මං පභවං අපුච්ඡසි (මෙත්තගූති භගවා)
තං තෙ පවක්ඛාමි යථා පජානං,
උපධිනිදානා පභවන්ති දුක්ඛා
යෙ කෙචි ලොකස්මිං අනෙකරූපා.

1055 යො වෙ අවිද්වා උපධිං කරොති
පුනප්පුනං දුක්ඛමුපෙති මන්දො,
තස්මා හි ජානං උපධිං න කයිරා
දුක්ඛස්ස ජාතිප්පභවානුපස්සී.

1056 යදත්තං අපුච්ඡිම්හ අකිත්තයී නො (ඉච්චායස්මා මෙත්තගූ)
අඤ්ඤං තං පුච්ඡාමි තදිඞ්ඝ බ්‍රෑහි.
කථන්නු ධීරා විතරන්ති ඔඝං
ජාතිජරං සොකපරිද්දවඤ්ච,
තං මෙ මුනී සාධු වියාකරොහි
තථා හි තෙ විදිතො එස ධම්මො

1057 කිත්තයිස්සාමි තෙ ධම්මං (මෙත්තගූති භගවා)
දිට්ඨෙ ධම්මෙ අනීතිහං,
යං විදිත්වා සතො චරං තරෙ ලොකෙ විසත්තිකං.

1058 තඤ්චාහං අභිනන්දාමි මහෙසි ධම්මමුත්තමං,
යං විදිත්වා සතො චරං තරෙ ලොකෙ විසත්තිකං

1059 යං කිඤ්චි සම්පජානාසි (මෙත්තගූති භගවා)
උද්ධං අධො තිරියඤ්චාපි මජ්ඣෙ,
එතෙසු නන්දිඤ්ච නිවෙසනඤ්ච
පනුජ්ජ විඤ්ඤාණං භවෙ න තිට්ඨෙ.

1060 එවංවිහාරී සතො අප්පමත්තො
භික්ඛු චරං හිත්වා මමායිතානි,
ජාතිං ජරං සොකපරිද්දවඤ්ච
ඉධෙව විද්වා පජහෙය්‍ය දුක්ඛං.



Free Distribution www.aathaapi.org

1054. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ: මෙත්තගූ මාණව-යෙනි,) ඉදින් තෝ ජාත්‍යාදි දුකට කාරණය විචාරහි නම්, එය පසක් කොට දතුවකු සෙයින් තොපට පවසම්හ. ලෝකයෙහි අනෙකස්වරූප වූ යම් දුඃඛයෝ වෙත් නම්, එ හැම දුඃඛයෝ (තෘෂ්ණාදි) උපධි හේතුයෙන් උපදනාහ.

1055. අපණ්ඩිත වූ යමෙක් (තෘෂ්ණාදි) උපධිය කෙරේ ද, මන්දප්‍රාඥ වූ හෙතෙම පුනපුනා සසර දුකට පැමිණෙයි. එහෙයින් (සංස්කාරයන් අනිත්‍යාදි විසින්) දන්නේ සංසාරදුඃඛය ජාතිය ප්‍රභව කොට ඇතැ'යි දක්නේ (තෘෂ්ණාදි) උපාධිය නො කරන්නේ යි.

1056. (ආයුෂ්මත් මෙත්තගූ මෙසේ පිළිවිත්:) අපි යමක් විචාළමෝ නම්, එය මුඹ වහන්සේ අපට වදාළසේක. අනෙක් කරුණකුදු මුඹ වෙතින් විචාරමි. ඒකාන්තයෙන් එය දූත් වදාළමැනව. ධීරයෝ (කාමාදි චතුර්විධ) ඔඝයත් ජාති ජරා ශෝකපරිදේවදුකත් කෙසේ තරණය කෙරෙත් ද? සර්වඥමුනි වූ මුඹ වහන්සේ අයදිමි. එය මට විසඳා වදාළ මැනැවි. යම් හෙයෙකින් මුඹ වහන්සේ විසින් තෙල දහම (සත්ත්වයන් විසින් අව-බොධ කරණ සේ පැනවීම් වශයෙන්) දන්නාලද ද, එහෙයිනි,.

1057 (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ: මෙත්තගූ මානවකය,) ස්මෘතිමත් වැ හැසිරෙනුයේ දක්නා ලද දුඃඛාදිධර්මයෙහි නොහොත් මෙ අත්බැව්හි මැ ආත්මප්‍රත්‍යක්ෂ වූ යම් ධර්‍මයක් දූන ලොවැ විසත්තිකා සඞ්ඛ්‍යාත තෘෂ්ණාව තරණය කෙරේ නම්, එ නිර්වාණ-ධර්‍මයත් (නිර්වාණගාමිනීප්‍රතිපද්ධර්මයත්) තොපට ප්‍රකාශ කරන්නෙමි.

1058. මහර්ෂීන් වහන්ස, ස්මෘතිමත් ව හැසිරෙනුයේ යම් ධර්මයක් දූන ලොව්හි විසත්තිකා නම් වූ තෘෂ්ණාව තරණය කරන්නේ නම් මම මුඹවහන්සේගේ එ (ධර්‍මද්‍යොතක) භාෂිතය ද එ උත්තම ධර්‍මය ද පතමි.

1059. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ: මෙත්තගූ මාණව-කය,) අනාගතකාලාදි උඩ ද අතීතකාලාදි යට ද (වර්තමානකාලාදි) මැද සරස ද වූ යම් කිසි ධර්‍මජාතයක් තෙපි දනිවු නම් තෙල ඌර්ධ-වාදි ධර්මයෙහි තෘෂ්ණා හා දෘෂ්ටිනිවෙසනය ද අභිසංස්කාරවිඥානය ද දුරු කරව, දුරු කොට (උභය) භවයෙහි නො සිටිනේයි.

1060. මෙසේ වසන සුලු ස්මෘතිමත් වූ අප්‍රමත්ත වූ මහණ තෘෂ්ණා-දෘෂ්ටිමමායිතයන් හැරපියා හැසිරෙන්නේ විද්වද් වූයේ මෙ සස්නෙහි මැ නොහොත් මෙ අත්බව්හි මැ ජාතිය ද ජරාව ද, ශොකපරිදේවදුක ද දුරු ලන්නේ යි.



Free Distribution www.aathaapi.org

1061 එතාභිනන්දාමි වචො මහෙසිනො, (ඉච්චායස්මා මෙත්තගූ)
සුකිත්තිතං ගොතම නූපධීකං,
අද්ධා හි භගවා පහාසි දුක්ඛං
තථා හි තෙ විදිතො එස ධම්මො.

1062 තෙ චාපි නූන පජහෙය්‍යු දුක්ඛං
යෙ ත්වං මුනි අට්ඨිතං ඔවදෙය්‍ය,
තං තං නමස්සාමි සමෙච්ච නාග
අප්පෙව මං භගවා අට්ඨිතං ඔවදෙය්‍ය.

1063 යං බ්‍රාහ්මණං වෙදගුං ආභිජඤ්ඤා (මෙත්තගූති භගවා)
අකිඤ්චනං කාමභවෙ අසත්තං,
අද්ධා හි සො ඔඝමිමං අතාරි
තිණ්ණො ච පාරං අඛිලො අකඞ්ඛො.

1064 විද්වා ච සො වෙදගු නරො ඉධ
භවාභවෙ සඞ්ගමිමං විසජ්ජ,
සො වීතතණ්හො අනීඝො නිරාසො
අතාරි සො ජාති ජරන්ති බ්‍රූමීති

**මෙත්තගූමාණවසුත්තං චතුත්ථං[1].**

## 5–5

## ධොතකසුත්තං[2]

1065 පුච්ඡාමි තං භගවා බ්‍රූහි මෙතං (ඉච්චායස්මා ධොතකො)
වාචාභිකඞ්ඛාමි මහෙසි තුය්හං,
තව සුත්වාන නිග්ඝොසං
සික්ඛෙ නිබ්බාන මත්තනො

1066 තෙන හාතප්පං කරොහි (ධොතකාති භගවා)
ඉධෙව නිපකො සතො,
ඉතො සුත්වාන නිග්ඝොසං
සික්ඛෙ නිබ්බානමත්තනො

1 මෙත්තගූ මාණවපුච්ඡා චතුත්ථී – ම: ඡ. සං
2. ධොතකමාණව පුච්ඡා – ම. ඡ. සං

1061 (ආයුෂ්මත් මෙත්තගූ මෙසේ විචාරයි:) මහර්ෂි වූ මුඹවහන්සේගේ තෙල වචනය සතුටින් පිළිගණිමි. ගෞතමයන් වහන්ස, මුඹ වහන්සේ විසින් නිරුපධි වූ නිර්වාණය මොනොවට ප්‍රකට කරණලද. භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් ම වර්තදුඃඛය දුරුලූහු ද. එහෙයින් මැ මුඹ වහන්සේ විසින් තෙල දහම දන්නාලද.

1062 මුනි වූ මුඹවහන්සේ යමකුන්ට සකසා ඕවාදෙනසේක් ද, ඔහුදු ඒකාන්තයෙන් දුක් දුරලන්නාහ'යි හඟිමි. බුද්ධනාගයන් වහන්ස, එහෙයින් වෙත පැමිණ මුඹ වහන්සේ නමදිමි. භාග්‍යවතුන් වහන්සේ මට එක්වන් අවවාද කරණ සේක් නම් මැනැව.

1063. (බුදුහු මෙසේ වදාළහ: මෙත්තගූ මාණවකය,) තෝ බාහිතපාප බ්‍රාහ්මණ වූ යමක්හු, සිවුමග නැණින් නිවනට පැමිණියකු කොට රාගාදි කිඤ්චන රහිතයකු කොට කාමයෙහි දු භවයෙහි දු නො ඇලුනක්හු කොට දනිහි නම්, ඒකාන්තයෙන් හෙ (කාමාදි වූ) මෙ චතුරොඝය තරණය කෙළේ ය. ඔඝතරණ කළ (රාගාදි) ඛිල රහිත වූ (දුඃඛාදියෙහි) කාඞ්ක්ෂා රහිත වූ හේ නිර්වාණ පාරයට ගියේ යි.

1064. තවද මෙ සස්නෙහි (මෙ අත්බැව්හි හෝ) යම් පුද්ගලයෙක් විද්වද් වූ ඥානවෙදයෙන් නිවණට පත්වූයේ කුදුමහත් භවයෙහි රාගාදි වූ සඞ්ගය දුරලා සිටියේ ද, විගතතෘෂ්ණා ඇති හේ උපද්‍රව නැතියේ ආශා රහිත වූයේ ය. හෙ ජාති ජරා (මරණ) තරණය කෙළේ යයි කියමි යි.

මෙත්තගුමාණව පෘච්ඡා නිමි.

## 5 – 5

## ධොතකමාණව පෘච්ඡා

1065. (ආයුෂ්මත් ධොතක මෙසේ විචාරයි:) භාග්‍යවතුන් වහන්ස, මුඹ වහන්සේ පුළුවුස්මි. තෙල කරුණ මට වදාළමැනැව. මුඹ වහන්සේගේ වචනය රුස්නෙමි, මුඹ වහන්සේගේ ධර්මනිර්ඝොෂය අසා රාගාදිය නිවනු සඳහා අධිශීලාදියෙහි හික්මෙන්නෙමි.

1066. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ: ධොතකය,) එසේ වී නම් මෙහි මැ නුවණැති වැ සමෘතිමත් වැ වැර වඩව. මාගේ වදන් අසා මෙ සස්නෙහි තමාගේ නිවන් පිණිස හික්මෙන්නේය.

1067 පස්සාමහං දෙවමනුස්ස ලොකෙ (ඉච්චායස්මා ධොතකො)
අකිඤ්චනං බ්‍රාහ්මණං ඉරියමානං,
තං තං නමස්සාමි සමන්තචක්ඛු
පමුඤ්ච මං සක්ක කථංකථාහි

1068 නාහං ගමිස්සාමි[1] පමොචනාය (ධොතකාති භගවා)
කථංකථිං ධොතක කඤ්චි ලොකෙ,
ධම්මඤ්ච සෙට්ඨං ආජානමානො[2]
එවං තුවං ඔඝමිමං තරෙසි.

1069 අනුසාස බ්‍රහ්මෙ කරුණායමානො (ඉච්චායස්මා ධොතකො)
විවෙකධම්මං යමහං විජඤ්ඤං,
යථාහං ආකාසොව අබ්‍යාපජ්ජමානො
ඉධෙව සන්තො අසිතො චරෙය්‍යං.

1070 කිත්තයිස්සාමි තෙ සන්තිං (ධොතකාති භගවා)
දිට්ඨෙ ධම්මෙ අනීතිහං,
යං විදිත්වා සතො චරං තරෙ ලොකෙ විසත්තිකං.

1071 තං චාහං අභිනන්දාමි (ඉච්චායස්මා ධොතකො)
මහෙසි සන්තිමුත්තමං,
යං විදිත්වා සතො චරං තරෙ ලොකෙ විසත්තිකං.

1072 යං කිඤ්චි සම්පජානාසි (ධොතකාති භගවා)
උද්ධං අධො තිරියඤ්චාපි මජ්ඣෙ:
එතං විදිත්වා සඞ්ගොති ලොකෙ
භවාභවාය මාකාසි තණ්හන්ති.

ධොතකසුත්තං පඤ්චමං[3].

---

1. සමිස්සාමි-ස්‍යා: සමීහාමි-ඉ:
2. අභිජානමානො - ම ඡ සං
3. ධොතක මාණව පුච්ඡා පඤ්චමී - ම ඡ සං



Free Distribution www.aathaapi.org

1067. (ආයුෂ්මත් ධොතක මෙසේ විචාරයි:) මම දෙව්මිනිස්ලොවහි හැසිරෙන, රාගාදිකිඤ්චන රහිත වූ (බාහිතපාප හෙයින් බ්‍රාහ්මණ වූ දේවාතිදේවයන් දුන් දක්මි. සමන්තස් ඇතියානෙනි, එබඳු වූ මුඹ වහන්සේ නමදිමි. ශාක්‍යයන් වහන්ස, විචිකිත්සායෙන් මා මුදනු මැනැව.

1068. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ දෙසූහ: ධොතකය,) මම ලෝකයෙහි විචිකිත්සා ඇති කිසිවකු මුදන්නට නො හැක්කෙමි. (උත්සාහ නො කරමි.) තෙපි ශ්‍රෙෂ්ඨ ධර්මය ද දැන ගණිමින් මෙසේ මේ කාමාදිචතුරෞඝ තරණය කරව.

1069. (ආයුෂ්මත් ධොතක මෙසේ විචාරයි:) ශ්‍රෙෂ්ඨයන් වහන්ස, සියලු සංස්කාරයන්ගෙන් විවික්ත වූ යම් නිර්වාණධර්මයක් මම දැනගන්නෙම් නම්, ආකාශය සෙයින් මම යම්සේ නානා ප්‍රකාරභාවයට නො යන්නෙම් නම්, මෙ අස්නෙහි මැ හුන්නෙම් නොහොත් නිවුණෙම්, (තෘෂ්ණාදෘෂ්ටි) නිඃශ්‍රය රහිත වැ හැසිරෙන්නෙම් නම්, එසෙයින් අනුකම්පා කරණසේක් (මට) අනුශාසනා කළ මැනව.

1070. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක: ධොතකය,) ස්මෘතිමත්ව හැසිරෙනුයේ දක්නාලද දුඃඛාදිධර්මයෙහි නොහොත් මෙ අත්බැව්හි මැ තමාට පසක් වූ යම් දහමක් දැන ලොකයෙහි විසත්තිකා නම් වූ තෘෂ්ණාව තරණය කෙරේ නම්, එ නිර්වාණධර්මය ද (නිර්වාණගාමිනී ප්‍රතිපද්ධර්මය ද) තොපට ප්‍රකාශ කරන්නෙමි.

1071. (ආයුෂ්මත් ධොතක මෙසේ කීය:) මහර්ෂීන් වහන්ස, ස්මෘතිමත් වැ හැසිරෙනුයේ යම් දහමක් දැන ලොකයෙහි විසත්තිකා නම් (තෘෂ්ණාව) තරණය කෙරේ නම් මම මුඹ වහන්සේගේ එ ධර්මද්‍යොතක-වචනය ද රුස්මි. ඒ උත්තම ශාන්තිය ද පිළිගන්මි.

1072. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක: ධොතකය,) (අනාගතාදි) උඩ ය, (අතීතාදි) යට ය (වර්තමානකාලනම් වූ) මධ්‍යය වූ සරස ද'යි යම් කිසි ධර්මජාතයක් තෝ දනිහි නම් තෙල ධර්මජාතය ලෝකයෙහි සඞ්ග යයි දැන කුදුමහත්භවය සඳහා තෘෂ්ණා නො කරව යි.

**ධොතකමාණව පෘච්ඡා නිමි.**

## 5–6

## උපසීවසුත්තං[1]

1073 එකො අහං සක්ක මහන්තමොඝං (ඉච්චායස්මා උපසීවො)
අනිස්සිතො නො විසහාමි තාරිතුං,
ආරම්මණං බ්‍රෑහි සමන්තචක්ඛු
යං නිස්සිතො ඔඝමිමං තරෙය්‍යං.

1074 ආකිඤ්චඤ්ඤං පෙක්ඛමානො සතිමා (උපසීවාති භගවා)
නත්ථීති නිස්සාය තරස්සු ඔඝං,
කාමෙ පහාය විරතො කථාහි
තණ්හක්ඛයං නත්තමහාභිපස්ස[2].

1075 සබ්බෙසු කාමෙසු යො වීතරාගො (ඉච්චායස්මා උපසීවො)
ආකිඤ්චඤ්ඤං නිස්සිතො හිත්වා[3] යඤ්ඤං.
සඤ්ඤා විමොක්ඛෙ පරමෙ විමුත්තො
තිට්ඨෙය්‍ය නු සො තත්ථ අනානුයායී[4].

1076 සබ්බෙසු කාමෙසු යො වීතරාගො (උපසීවාති භගවා)
ආකිඤ්චඤ්ඤං නිස්සිතො හිත්වා[3] මඤ්ඤං
සඤ්ඤා විමොක්ඛෙ පරමෙ ධිමුත්තො
තිට්ඨෙය්‍ය සො තත්ථ අනානුයායී.

1077 තිට්ඨෙ චෙ සො තත්ථ අනානුයායී (ඉච්චායස්මා උපසීවො)
පූගම්පි වස්සානං සමන්තචක්ඛු,
තත්ථෙව සො සීති සියා විමුත්තො
චවෙථ විඤ්ඤාණං තථා විධස්ස.

1078 අච්චි යථා වාතවෙගෙන ඛිත්තා (උපසීවාති භගවා)
අත්ථං පලෙති න උපෙති සඞ්ඛං,
එවං මුනී නාමකායා විමුත්තො
අත්ථං පලෙති න උපෙති සඞ්ඛං.

---

1. උපසීව මාණව පුච්ඡා ම ජ සං
2. රත්තමහාභිපස්ස – ස්‍යා
3. හත්වා – ම ජ සං
4. අනානුයායි ස්‍යා – ක:



Free Distribution www.aathaapi.org

## 5 – 6

## උපසීවමාණව පෘච්ඡා

1073. (ආයුෂ්මත් උපසීව මෙසේ ඇසී:) ශාක්‍යමුනීන්ද්‍රයන් වහන්ස, එකලා වූ මම (කිසි පුහුලකු හෝ දහමක් හෝ) ඇසුරු නො කෙළෙම් (කාමාදි) මහත් ඕඝතරණය කරන්නට නො හැකි වෙමි. සමතැස් ඇති සර්වඥයන් වහන්ස, යම් කිසි දහමක් හෝ පුහුලකු ඇසුරු කෙළෙම් මෙ කෙලෙස්වතුරු තරණය කෙරෙම් නම් එ නිඃශ්‍රය වදරණසේක්වා.

1074. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදළසේක: උපසීවය,) සිහි ඇතියෙහි ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිය (අනිත්‍යාදි විසින්) දක්මින් 'නත්‍ථි කිඤ්චි'යි පැවැති එ සමවත ඇසුරු කොට මෙ චතුරෝඝය තරණය කර වස්තුකාම ක්ලෙශකාමයන් හැරපියා, කථංකථා සඞ්ඛ්‍යාත විචිකිත්සා-යෙන් වෙන් වූයෙහි දවරැහි තෘෂ්ණාක්ෂය සඞ්ඛ්‍යාත නිවන විහූත කොට දක්නෙහි.

1075. (උපසීව ආයුෂ්මත් මෙසේ ඇසී:) යමෙක් සියලු කාමයන්හි පහවූ රාග ඇත්තේ අන්‍ය වූ යට සමවත් හැරපියා ආකිඤ්චඤ්ඤායතන-සමාපත්තිය ඇසුරු කෙළේ උත්තම සංඥවිමොක්ෂයෙහි ඇලුනේ නම්, 'හේ එ ආකිඤ්චඤ්ඤායතන බඹලොවිහි වියොගයට නොයනසුලු වැ සිටිනේ ද?

1076. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදළහ: උපසීවය,) යමෙක් හැම කාමයන්හි වීතරාග වූයේ අන්‍ය වූ යට සමවත් හැරපියා ආකිඤ්චඤ්ඤා-යතනසමාපත්තිය ඇසුරු කෙළේ එ උත්තමසංඥවිමොක්ෂයෙහි ඇලුනේ නම් හෙතෙම (එයින්) නො පිරිහෙමින් එ ආකිඤ්චඤ්ඤායතන-බ්‍රහ්මලොකයෙහි (කප්සැටදහසක්) සිටුනේ යි.

1077. (ආයුෂ්මත් උපසීව මෙසේ විචාරයි:) සමතැස් ඇති සර්වඥයන් වහන්ස, ඉදින් හේ එයින් නොපිරිහෙන සුලු වැ නොයෙක් හවුරුදු සියදහස් ගණන් එ ආකිඤ්චඤ්ඤායතනයෙහි සිටිනේ නම්, හෙතෙම එහි මැ දුකින් මිදුනේ ශීතීභාවයට පැමිණියේ එහි මැ සිටිනේ ද? එ බඳු වූවහුගේ විඥනය එහි ම පිරිනිවෙ ද?

1078. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදළහ: උපසීවය,) වාතවෙගයෙන් බැහැර කරණ (නිවන) ලද ගිනිසිලෙක් යම්සේ අස්තයට යේ නම්, (අසෝ දිගට ගියේ යැයි) ව්‍යවහාරයට නො යේ නම්, එසෙයින් මැ (එහි උපන්) ශෛක්ෂමුනි නෙම නාම කයින් මිදුනේ අස්තයට යෙයි. ක්ෂත්‍රියාදි ව්‍යවහාරයට නො යෙයි.



Free Distribution www.aathaapi.org

1079 අත්ථංගතො සො උද වා සො නත්ථි (ඉච්චායස්මා උපසීවො)
උදාහු වෙ සස්සතියා අරොගො,
තං මෙ මුනී සාධු වියාකරොහි
තථා හි තෙ විදිතො එස ධම්මො

1080 අත්ථංගතස්ස න පමාණමත්ථි (උපසීවාති භගවා)
යෙන නං වජ්ජුං තං තස්ස නත්ථි,
සබ්බෙසු ධම්මෙසු සමූහතෙසු
සමූහතා වාදපථාපි සබ්බෙති

උපසීවසුත්තං[1]

## 5 – 7

## නන්දසුත්තං[2]

1081. සන්ති ලොකෙ මුනයො (ඉච්චායස්මා නන්දො)
ජනා වදන්ති තයිදං කථංසු'
ඤාණූපපන්නං නො මුනිං වදන්ති
උදාහු වෙ ජීවිතෙනූපපන්නං.

1082. න දිට්ඨියා න සුතියා න ඤාණෙන[3] (නන්දාති භගවා)
මුනීධ නන්ද කුසලා වදන්ති,
විසෙනිකත්වා අනීඝා නිරාසා
චරන්ති යෙ තෙ මුනයොති බ්‍රූමි.

1083. යෙ කෙචිමෙ සමණබ්‍රාහ්මණා සෙ (ඉච්චායස්මා නන්දො)
දිට්ඨෙන සුතෙනාපි[3] වදන්ති සුද්ධිං,
සීලබ්බතෙනාපි වදන්ති සුද්ධිං
අනෙකරූපෙන වදන්ති සුද්ධිං
කච්චිස්සු තෙ භගවා තත්ථ යථා චරන්තා
අතාරු ජාතිඤ්ච ජරඤ්ච මාරිස
පුච්ඡාමි තං භගවා බ්‍රූහි මෙතං.

1: උපසීව මාණව පුච්ඡා ඡට්ඨී – මජස.
2. නන්දමාණවපුච්ඡා– මජස.
3. දිට්ඨියා න සුතියා න ඤාණෙන න සීලබ්බතෙන–සී. මු.



Free Distribution www.aathaapi.org

1079. (ආයුෂ්මත් උපසීව මෙසේ ඇසීය:) මුනීන්ද්‍රයන් වහන්ස, එ අරූපී ආයති පුද්ගල අස්තයට ගියේ නොහොත් අවිද්‍යමාන වූයේ ද? නොහොත් හේ ඒකාන්තයෙන් ශාශ්වත භාවයෙන් අරෝග වූයේ (අවිපරිණාම ස්වභාවයෙන්) සිටිනේ ද? මුනීන්ද්‍රයන් වහන්ස, එය මට මැනැවින් ප්‍රකාශ කොට වදාළ මැනැව. යම් හෙයෙකින් මුඹ වහන්සේ විසින් තෙල දන්නාලද ද, එහෙයිනි.

1080. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක: උපසීවය, අනුපාදපරිනිර්වාණයෙන් පිරිනිවියාහට (රූපාදි) ප්‍රමාණයෙක් නැත. රාගාදි යම් ප්‍රමාණයෙකින් ඔහට කියත් නම්, එ ප්‍රමාණය ඔහට නැත (ස්කන්ධාදි) සියලු ධර්මයන් නැසූ කල්හි හැම වාදපථයෝ ද නසනලද වෙතියි.

උපසීවමාණව පෘච්ඡා නිමි.

## 5 – 7

## නන්දමාණව පෘච්ඡා

1081. (ආයුෂ්මත් නන්දමාණවක මෙසේ විචාරයි:) ලොව්හි ක්ෂත්‍රියාදි ජනයෝ ආජීවක නිගණ්ඨාදි) මුනිහු ඇතැයි කියත්. එය කෙසේ ද? (සමාපත්ති, අභිඥා) ඥානයෙන් සමුපෙත වූවහු මුනි යයි කියත් ද? නොහොත් රූක්ෂජීවිතයෙන් සමුපෙත වූවහු මුනි යයි කියත් ද?

1082. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ:) නන්දයෙනි, මෙසස්නෙහි ස්කන්ධාදියෙහි හෝ) දක්ෂයෝ දෘෂ්ටියෙන්, ශ්‍රැතියෙන් ඥානයෙන් මුනි යයි නො කියත්. යම් කෙනෙක් කෙලෙස් සේනාහ නසා (රාගාදි) ව්‍යසන රහිත වැ නිරාශ වැ හැසිරෙත් නම්, ඔහු මුනිහු යයි මම කියමි.

1083. (ආයුෂ්මත් නන්දමාණවක මෙසේ විචාරයි:) භාග්‍යවතුන් වහන්ස, යම් කිසි මහණ බමුණු කෙනෙක් දෘෂ්ටියෙනුදු ශ්‍රැතයෙනුදු ශුද්ධිය (මුක්තිය) කියත් නම්, ශීලව්‍රතයෙනුදු ශුද්ධිය කියත් නම්, අනේකවිධ කොතුහලමඞ්ගලයෙනුදු ශුද්ධිය කියත් නම්, නිදුකානන් වහන්ස කිම, (එ දෘෂ්ටිගතිකයෝ) එ දෘෂ්ටියෙහි ගුප්ත වැ වෙසෙන්නාහු ජාතියත් ජරාවත් තරණය කළාහු ද? භාග්‍යවතුන් වහන්ස, මුඹ වහන්සේ පුළුවුස්මි. තෙල කරුණ වදාළමැනැවි.

1084. යෙ කෙචිමෙ සමණබ්‍රාහ්මණා සේ (නන්දාති භගවා)
දිට්ඨෙන සුතෙනාපි[1] වදන්ති සුද්ධිං
සීලබ්බතෙනාපි වදන්ති සුද්ධිං
අනෙකරූපෙන වදන්ති සුද්ධිං,
කිඤ්චාපි තෙ තත්ථ යථා වදන්ති
නාතරිංසු ජාතිජරන්ති බ්‍රෑමි

1085. යෙ කෙචිමෙ සමණබ්‍රාහ්මණා සෙ (ඉච්චායස්මා නන්දො)
දිට්ඨෙන සුතෙනාපි[1] වදන්ති සුද්ධිං
සීලබ්බතෙනාපි වදන්ති සුද්ධිං
අනෙකරූපෙන වදන්ති සුද්ධිං.

1086. තෙ වෙ[2] මුනි බ්‍රෑසි අනොඝතිණ්ණො
අථ කො චරහි දෙවමනුස්සලොකෙ,
අතාරි ජාතිඤ්ච ජරඤ්ච මාරිස
පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං.

1087. නාහං සබ්බෙ සමණබ්‍රාහ්මණා සෙ (නන්දාති භගවා)
ජාතිජරාය නිවුතාති බ්‍රෑමි
යෙ සුධ දිට්ඨං ච සුතං මුතං වා
සීලබ්බතං වාපි පහාය සබ්බං.
අනෙකරූපම්පි පහාය සබ්බං,
තණ්හං පරිඤ්ඤාය අනාසවා සෙ
තෙ වෙ නරා ඔඝතිණ්ණාති බ්‍රෑමි.

1088. එතාභිනන්දාමි වචො මහෙසිනො (ඉච්චායස්මා නන්දො)
සුකිත්තිතං ගොතම නූපධීකං
යෙ සුධ දිට්ඨං ච සුතං මුතං වා
සීලබ්බතං වාපි පහාය සබ්බං,
අනෙක රූපම්පි පහාය සබ්බං
තණ්හං පරිඤ්ඤාය අනාසවා සෙ
අහම්පි තෙ ඔඝතිණ්ණාති බ්‍රෑමීති.

නන්දසුත්තං සත්තමං[3].

1. දිට්ඨස්සුතෙනාපි-ම.ඡ.සං.
2. ස චෙ - සිමු.
3. නන්දමාණවපුච්ඡා සත්තමී



Free Distribution www.aathaapi.org

1084. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ: නන්දයෙනි,) මෙ යම් කිසි මහණබමුණු කෙනෙක් දෘෂ්ටියෙනුදු ශ්‍රැතයෙනුදු ශුද්ධිය කියත් නම්, ශීලව්‍රතයෙනුදු ශුද්ධිය කියත් නම්, අනේකවිධ කොතුහලමඞ්ගලයෙනුදු ශුද්ධිය කියත් නම්, වැලිත් ඔහු එ දෘෂ්ටියෙහි ගුප්ත වැ වෙසෙත් නම් (ඔහු) ජාතිය හා ජරාව හා තරණය නො කළහ'යි කියමි.

1085. ආයුෂ්මත් නන්දමාණවක මෙසේ විචාරයි: භාග්‍යවතුන් වහන්ස, මෙ යම් කිසි මහණබමුණු කෙනෙක් දෘෂ්ටියෙනුදු ශ්‍රැතයෙනුදු ශුද්ධිය කියත් ද ශීල ව්‍රතයෙනුදු ශුද්ධිය කියත්ද අනෙකවිධ කොතුහල-මඞ්ගලයෙනුදු ශුද්ධිය කියත් ද,

1086. මුනීන්ද්‍රයන් වහන්ස, ඉදින් එ දෘෂ්ටිගතිකයන් ඔඝතරණය නො කළවුනැ'යි වදරණසේක් නම්, නිදුකානන් වහන්ස, එසේවත් මැ දෙව්මිනිස් ලොව්හි කවර කෙනෙක් ජාතියත් ජරාවත් තරණය කළාහු ද? භාග්‍යවතුන් වහන්ස, මුඹ වහන්සේ පුළුවුස්මි. තෙල කරුණ වදළ මැනැවි.

1087. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක: නන්දයෙනි,) මම හැම මහණබමුණෝ ජාතිජරා විසින් අවුරණලදහ'යි නො කියමි. මෙ ලොව්හි යම් කෙනෙක් හැම දෘෂ්ටිශුද්ධිය ද ශ්‍රැතශුද්ධිය ද මුතශුද්ධිය ද ශීලව්‍රතශුද්ධිය ද හැරපියා හැම අනෙකවිධ කොතුහලමඞ්ගලශුද්ධිය ද හැරපියා තෘෂ්ණාව පිරිසිඳ දැන අනාශ්‍රව වූහු ද එ පුද්ගලයෝ එකැතින් ඔඝතරණය කළහු'යි කියමි.

1088. (ආයුෂ්මත් නන්දමාණවක මෙසේ කියයි:) මහර්ෂි වූ මුඹ වහන්සේගේ තෙල භාෂිතය මම සතුටින් පිළිගණිමි. ගෞතමයන් වහන්ස, උපධි රහිත වූ නිවණ මොනොවට ප්‍රකටකරණලදය මෙ ලොව්හි යම් කෙනෙක් හැම දෘෂ්ටශුද්ධිය ද ශ්‍රැතශුද්ධිය ද මුතශුද්ධිය ද ශීලව්‍රතශුද්ධිය ද හැරපියා අනෙකවිධ වූ හැම කොතුහලමඞ්ගලශුද්ධිය ද හැරපියා ත්‍රිවිධ පරිඥයෙන් තෘෂ්ණාව පිරිසිඳ දැන අනාශ්‍රව වූහු නම් මම ද ඔහු ඔඝතරණය කළහ'යි කියමි.

නන්දමාණව පුච්ඡා නිමි.



Free Distribution www.aathaapi.org

## 5 – 8

## හෙමකසුත්තං[1]

1089. යෙ මෙ පුබ්බෙ වියාකංසු (ඉච්චායස්මා හෙමකො)
හුරං ගොතම සාසනං,
ඉච්චාසි ඉති භවිස්සති
සබ්බං තං ඉතිහීතිහං
සබ්බං තං තක්කවඩ්ඪනං
නාහං තත්ථ අභිරමිං.

1090. ත්වඤ්ච මෙ ධම්ම මක්ඛාහි තණ්හා නිග්ඝාතනං මුනි,
යං විදිත්වා සතො චරං තරෙ ලොකෙ විසත්තිකං.

1091. ඉධ දිට්ඨ සුත මුත විඤ්ඤාතෙසු පියරූපෙසු හෙමක,
ඡන්දරාග විනොදනං නිබ්බාණ පද මච්චුතං.

1092. එතදඤ්ඤාය යෙ සතා දිට්ඨධම්මාභිනිබ්බුතා,
උපසන්තා ච තෙ සදා තිණ්ණා ලොකෙ විසත්තිකන්ති.

හෙමකසුත්තං අට්ඨමං[2]

## 5 – 9

## තොදෙය්‍ය සුත්තං[3]

1093. යස්මිං කාමා න වසන්ති (ඉච්චායස්මා තොදෙය්‍යො)
තණ්හා යස්ස න විජ්ජති,
කථංකථා ච යො තිණ්ණො විමොක්ඛො තස්ස කීදිසො.

1094. යස්මිං කාමා න වසන්ති (තොදෙය්‍යාති භගවා)
තණ්හා යස්ස න විජ්ජති,
කථංකථාච යො තිණ්ණො විමොක්ඛො තස්ස නාපරො.

---

1. හෙමකමාණව පුච්ඡා-මජසං.
2. හෙමකමාණව පුච්ඡා අට්ඨමී.-මජසං.
3. තොදෙය්‍යමාණව පුච්ඡා

## 5 – 8

## හෙමක මාණවක පෘච්ඡා

1089. (ආයුෂ්මත් හෙමක මාණවක මෙසේ විචාරයි.) භාග්‍යවතුන් වහන්ස, පෙර (බාවරී බ්‍රාහ්මණ ආදි යම් කෙනෙක් ගෞතම ශාසනයෙන් පළමු ''මෙසේ වී ල, මෙසේ වන්නේ ල''යි (යම් ධර්මයක්) මට දෙසූහු නම්, එ හැම දහම් ''මෙසේ මෙසේ'' යයි උපන් කථා වෙයි. එ හැම (කාම විතර්කාදි) තර්ක වඩන සුලු වෙයි. මම් එහි නො ඇලුනෙමි.

1090. මුනීන්ද්‍රයන් වහන්ස, ස්මෘතිමත් වූයෙම් යම් දහමක් දැන හැසිරෙන්නෙම් ලොවිහි විසත්තිකා නම් වූ තෘෂ්ණාව තරණය කෙරෙම් නම් මුඹ වහන්සේ තෘෂ්ණාව් වනසන එබඳු දහමක් මට වදළ මැනැවි.

1091. හේමකය, මෙ ලොව්හි රූපායතන ශබ්දයතන ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යායතන ධර්මායතන සඞ්ඛ්‍යාත වූ ප්‍රිය ස්වභාවයන්හි ඡන්දරාග-ප්‍රහාණය වූ ච්‍යුති රහිත වූ නිර්වාණ පදය වෙයි.

1092. ස්මෘතිමත් වූ දක්නාලද අනිත්‍යාදි දහම් ඇති යම් රහත් කෙනෙක් මෙලෙ අමාමහනිවණ මඟනැණින් දැන කෙලෙස් පිරිනිවීමෙන් නිවුනාහු සන්හුන් වූවාහු නම්, ඔහු හැම කල්හි ලොකයෙහි විසත්තිකා නම් වූ තෘෂ්ණාව තරණය කළාහු වෙති'යි.

**හෙමක මාණවක පෘච්ඡා නිමි.**

## 5 – 9

## තොදෙය්‍ය මාණවක පෘච්ඡා

1093. (තොදෙය්‍ය මාණවක මෙසේ ඇසීය:) යම් පුඟුලකු කෙරෙහි කාමයෝ නො ලගිත් ද යමකුට තෘෂ්ණාවත් විද්‍යමාන නොවේ ද, යම් පුද්ගලයෙක් කථංකථීභාවයත් තරණය කෙළේ ද, ඔහුගේ විමොක්ෂය කෙබඳු වේ ද?යි.

1094. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදළසේක: තොදෙය්‍යයෙනි,) යම් පුද්ගලයකු කෙරෙහි කාමයෝ නෝ ලග්නාහු ද, යමකුට තෘෂ්ණාත් නැත් ද, විචිකිත්සා සඞ්ඛ්‍යාත කථංකථීභාවයත් යමෙක් තරණය කෙළේ ද, ඔහට අන්‍ය විමොක්ෂයෙක් නො වේ.



Free Distribution www.aathaapi.org

1095. නිරාසසො සො උද ආසසානො
පඤ්ඤාණවා සො උදපඤ්ඤකප්පී,
මුනිං අහං සක්ක යථා විජඤ්ඤං
තං මෙ වියාචික්ඛ සමන්තචක්ඛු.

1096. නිරාසසො සො න සො ආසසානො
පඤ්ඤාණවා සො න ච පඤ්ඤකප්පී,
එවම්පි තොදෙය්‍ය මුනිං විජාන
අකිඤ්චනං කාමභවෙ අසත්තන්ති.

තොදෙය්‍යසුත්තං නවමං[1]

## 5 – 10

## කප්ප සුත්තං

1097. මජ්ඣෙ සරස්මිං තිට්ඨතං (ඉච්චායස්මා කප්පො.)
ඔඝෙ ජාතෙ මහබ්භයෙ,
ජරාමච්චුපරෙතානං දීපං පබ්‍රෑහි මාරිස;
ත්වඤ්ච මෙ දීපමක්ඛාහි යථායිදං නාපරා සියා

1098. මජ්ඣෙ සරස්මිං තිට්ඨතං (කප්පාති භගවා)
ඔඝෙ ජාතෙ මහබ්භයෙ,
ජරාමච්චුපරෙතානං දීපං පබ්‍රෑමි කප්ප තෙ.

1099. අකිඤ්චනං අනාදානං එතං දීපං අනාපරං,
නිබ්බානමිති තං බ්‍රෑමි ජරාමච්චුපරික්ඛයං.

1100. එතදඤ්ඤාය යෙ සතා දිට්ඨධම්මාභිනිබ්බුතා,
න තෙ මාරවසානුගා න තෙ මාරස්ස පද්ධගූති.

කප්පසුත්තං දසමං[2].

1. තොදෙය්‍ය මාණවපුච්ඡා නවමී – ම.ඡ.ස.
2. කප්පමාණව පුච්ඡා



Free Distribution www.aathaapi.org

1095. එ මුනි තෙම තෘෂ්ණා රහිත වූයේ ද නොහොත් තෘෂ්ණා සහිත වූයේ ද? හේ ප්‍රඥ ඇතියේ ද? නොහොත් සමාපත්ති ආදිඥානයෙන් තෘෂ්ණා දෘෂ්ටිකල්ප කරණුයේ ද? ශාක්‍යයන් වහන්ස, යම් පරිද්දෙකින් මම මුනිහු හඳුනාගන්නෙම් නම්, සමතැස් ඇති භාග්‍යවතුන් වහන්ස, එපරිද්දෙන් මට එකරුණ වදාළ මැනැව.

1096. එ මුනි තෙම තෘෂ්ණා රහිත ය, හේ ආශා සහිත නො වේ. හේ ප්‍රඥ ඇතියේ ය. (සමාපත්ති ආදි) ඥානයෙන් නොද තෘෂ්ණා– දෘෂ්ටිකල්ප කරන්නේ වෙයි. තොදෙය්‍යයෙනි, මෙසේ (තෝ) කාමයෙහි ද භවයෙහිද නො ඇලුනු පළිබොධ නැතියහු මුනි යයි දනුව යි.

**තොදෙය්‍ය මාණව පෘච්ඡා නිමි.**

## 5 – 10

## කප්පමාණවක පෘච්ඡා

1097. (ආයුෂ්මත් කප්පමාණවක මෙසේ විචාරයි:) නිදුකානන් වහන්ස, (පූර්ව– අපර කොටින් නො පැණෙන හෙයින්) මධ්‍යවූ සංසාරයෙහි සිටුනා වූ ජරායෙන් හා මරණයෙන් හා මඩනාලද්දවුනට ජාත්‍යාදි මහද්භය ඇති (කාමාදි) ඔඝය උපන් කල්හි ප්‍රතිෂ්ඨාව වදාළ මැනැවි. යම් පරිද්දෙකින් යළි මම දුක නො වන්නේ ද, එපරිද්දෙන් මට ප්‍රතිෂ්ඨාව ද වදාළ මැනැවි.

1098. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක: කප්පමාණවයෙනි,) මධ්‍ය වූ සංසාරයෙහි සිටුනා වූ ජරායෙන් හා මරණයෙන් හා මඩනාලද්දවුනට (ජාත්‍යාදි) මහද්භය ඇති (කාමාදි) ඔඝය උපන් කල්හි කප්පය, තොපට ප්‍රතිෂ්ඨාව දෙසමි.

1099. ප්‍රතිභාග වූ අපර ප්‍රතිෂ්ඨා රහිත වූ තෙල ප්‍රතිෂ්ඨාව රාගාදි කිඤ්චන රහිත ය. තෘෂ්ණාදාන රහිත ය. ජරාමරණව්‍යුපශමය වූ එය නිර්වාණ යයි කියමි.

1100. ස්මෘතිමත් වූ (අනිත්‍යාදි විසින්) දක්නාලද ධර්ම ඇති යම් රහත්හු තෙල නිර්වාණය දැන ක්ලෙශපරිනිර්වාණයෙන් පිරිනිවියාහු වෙද්ද, ඔහු මාරවශයට ගියාහු නො වෙති. ඔහු මාරයාගේ මඟ යන්නාහු (පරිචාරකයෝ) නො වෙති යි.

**කප්පමාණවක පෘච්ඡා නිමි.**



Free Distribution www.aathaapi.org

## 5-11

## ජතුකණ්ණිසුත්තං[1]

1101. සුත්වාන'හං වීරං අකාමකාමිං (ඉච්චායස්මා ජතුකණ්ණි)
ඔඝාතිගං පුට්ඨු මකාමමාගමං,
සන්තිපදං බ්‍රෑහි සහජනෙත්ත
යථාතච්ඡං භගවා බ්‍රෑහි මෙතං.

1102. භගවා හි කාමෙ අභිභුය්‍ය ඉරියති
ආදිච්චොව පඨවිං තෙජී තෙජසා,
පරිත්තපඤ්ඤස්ස මෙ භූරිපඤ්ඤ,
ආචික්ඛ ධම්මං යමහං විජඤ්ඤං
ජාතිජරාය ඉධ විප්පහානං.

1103. කාමෙසු විනය ගෙධං (ජතුකණ්ණීති භගවා)
නෙක්ඛම්මං දට්ඨු ඛෙමතො,
උග්ගහීතං නිරත්තං වා මා තෙ විජ්ජිත්ථ කිඤ්චනං.

1104. යං පුබ්බෙ තං විසොසෙහි පච්ඡා තෙ මාහු කිඤ්චනං,
මජ්ඣෙ චෙ නො ගහෙස්සසි උපසන්තො චරිස්සසි.

1105. සබ්බසො නාම රූපස්මිං වීතගෙධස්ස බ්‍රාහ්මණ,
ආසවාස්ස න විජ්ජන්ති යෙහි මච්චු වසං වජෙති.

ජතුකණ්ණිසුත්තං එකාදසමං[2].

## 5 – 12

## භද්‍රාවුධසුත්තං

1106. ඔකං ජහං තණ්හච්ඡිදං අනෙජං (ඉච්චායස්මා භද්‍රාවුධො)
නන්දිං ජහං ඔඝතිණ්ණං විමුත්තං,
කප්පං ජහං අභියාචෙ සුමෙධං
සුත්වාන නාගස්ස අපනමිස්සන්ති ඉතො.

---

1. කප්පමාණවපුච්ඡා දසමී–මජසං
2. ජතුකණ්ණිමාණවපුච්ඡා–මජසං
3. ජ කණ්ණිමාණවපුච්ඡා එකාදසමී–මජසං



Free Distribution www.aathaapi.org

## 5 – 11

## ජතුකණ්ණිමාණවක පෘච්ඡා

1101. (ආයුෂ්මත් ජතුකණ්ණිමාණවක මෙසේ ඇසීය:) වීරයන් වහන්ස, මම මුඹ වහන්සේ (කාමයන් නොපතන හෙයින්) අකාමකාමී වූ චතුරොඝතරණය කළ කෙනෙකැ'යි අසා නිෂ්කාම වූ භාග්‍යවතුන් පුළුවුස්නට ආයෙමි. සහජාත සර්වඥතා ඥනචක්ෂුස ඇතියානෙනි, ශාන්තිය හා ශාන්තිපදය හා (නිවන) වදාළ මැනැව. භාග්‍යවතුන් වහන්ස, තෙල කරුණ තථ්‍ය වූ පරිදි වදාළ මැනැවි.

1102. යම් හෙයෙකින් භාග්‍යවතුන් වහන්සේ තෙදැති හිරු සියතෙදින් පොළොව සෙයින් කාමයන් මැඩ ලා වෙසෙනසේක් ද, එහෙයින් මහාප්‍රාඥයන් වහන්ස, මෙ අත් බව්හි මැ ජාති- ජරාවන්ගේ ප්‍රහාණය වූ යම් දහමක් දැනගත්නෙම් නම්, එ දහම මනැප්‍රාඥ වූ මට වදරණසේක්වා.

1103. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදළසේක: ජතුකණ්ණියෙනි,) නෛෂ්ක්‍රම්‍යය ක්ෂෙම වශයෙන් දැක වස්තුකාම ක්ලෙශකාමයෙහි තෘෂ්ණාව දුරලව, තෘෂ්ණාදෘෂ්ටි විසින් ගන්නාලද්දෙක් හෝ හළයුත්තෙක් හෝ (රාගාදි) කිඤ්චනයෙක් හෝ තොපට නහමක් වේවා.

1104. අතීත සංස්කාර ඇරැබ යම් ක්ලේශජාතයෙක් වේ නම්, එය මාර්ගඥනාග්නියෙන් වියළව, අනාගත සංස්කාර ඇරැබ ද තට කිඤ්චනයෙක් (පලිබොධයෙක්) නහමක් වේවා. ඉදින් ප්‍රත්‍යුත්පන්න සංස්කාරයන් තෘෂ්ණාදෘෂ්ටි විසින් නොගන්නෙහි නම් උපශාන්ත ව හැසිරෙන්නෙහි.

1105. බ්‍රාහ්මණය, නාමරූපයන් කෙරෙහි සර්වප්‍රකාරයෙන් පහ කළ තෘෂ්ණා ඇති එ රහත්හට යම් ආස්‍රවයන් හේතු කොට ගෙණ මරවසට යේ නම් එ ආස්‍රවයෝ විද්‍යමාන නොවෙති'යි.

ජතුකණ්ණි මාණව පෘච්ඡා නිමි.

## 5 – 12

## භද්‍රාවුධමානවක පෘච්ඡා

1106. (ආයුෂ්මත් භද්‍රාවුධ මෙසේ විචාරයි:) පඤ්චකාමගුණාලය දුරැලූ, ෂඩ්විධ තෘෂ්ණාකාය සිඳැලූ, අටලෝදහම්හි නොසැලෙන, අනාගත රූපාදිප්‍රාර්ථනා සඞ්ඛ්‍යාත නන්දිය හැරපියූ, චතුරොඝතරණය කළ, කෙලෙසුන් කෙරෙන් මිදුනු, තෘෂ්ණා–දෘෂ්ටිකල්පයන් දුරැලූ ශොභනප්‍රඥ ඇති තථාගතයන් වෙසෙසින් අයදිමි. නාගයන් වහන්සේගේ ධර්මය අසා මෙ පහණසැයෙන් බොහෝ ජනයෝ නික්ම යෙති.

1107. නානා ජනා ජනපදෙහි සඞ්ගතා
තව වීර වාක්‍යං අභිකඞ්ඛමානා,
තෙසං තුවං සාධු වියාකරොහි
තථා හි තෙ විදිතො එස ධම්මො.

1108. ආදානතණ්හං විනයෙථ සබ්බං (භද්‍රාවුධාති භගවා)
උද්ධං අධො තිරියඤ්චාපි මජ්ඣෙ,
යං යං හි ලොකස්මිං උපාදියන්ති
තෙනෙව මාරො අන්වෙති ජන්තුං.

1109. තස්මා පජානං න උපාදියෙථ
භික්ඛු සතො කිඤ්චනං සබ්බලොකෙ,
ආදානසත්තෙ ඉති පෙක්ඛමානො
පජං ඉමං මච්චුධෙය්‍යෙ විසත්තන්ති.

භද්‍රාවුධසුත්තං ද්වාදසමං[1].

## 5 – 13

## උදයසුත්තං

1110. ඣායිං විරජමාසීනං (ඉච්චා යස්මා උදයො)
කතකිච්චං අනාසවං,
පාරගුං සබ්බධම්මානං අත්ථි පඤ්හෙන ආගමං,
අඤ්ඤා විමොක්ඛං පබ්‍රෑහි අවිජ්ජාය පභෙදනං.

1111. පහානං කාමච්ඡන්දානං (උදයාති භගවා)
දොමනස්සාන චූභයං,
ථීනස්ස ච පනූදනං කුක්කුච්චානං නිවාරණං.

1112. උපෙඛා සති සංසුද්ධං ධම්මතක්කපුරෙජවං,
අඤ්ඤා විමොක්ඛං පබ්‍රෑමි අවිජ්ජාය පභෙදනං.

1113. කිංසු සංයොජනො ලොකො (ඉච්චායස්මා උදයො)
කිංසු තස්ස විචාරණා,
කිස්සස්ස විප්පහානෙන නිබ්බානමිති වුච්චති.

1. භද්‍රාවුධමාණවපුච්ඡා-මජසං
2. භද්‍රාවුධමාණවපුච්ඡා ද්වාදසී
3. උදය මාණවපුච්ඡා-මජසං



Free Distribution　　www.aathaapi.org

1107. වීරයන් වහන්ස, මුඹ වහන්සේගේ වදන් කැමැති වූ නොයෙක් ජනයෝ අඞ්ගාදි ජනපදයෙන් රැස්වූහු ය. උනට මුඹ වහන්සේ දහම් දෙසුව මැනැවැ'යි යදිමි. යම් හෙයෙකින් මුඹ වහන්සේ විසින් තෙල ලොකොත්තරධර්මය දන්නාලද ද, එහෙයිනි.

1108. (භාගයවතුන් වහන්සේ මෙසේ වදළහ: හද්‍රාවුධයෙනි,) අතීතානාගතවර්තමානයෙහි වූ හැම ආදන තෘෂ්ණාව දුරු කරව. යම් හෙයෙකින් ලොකයෙහි (අතීතරූපාදි) යම් යම් වස්තුවක් දැඩි කොට ගණිත් ද, එහෙයින් මැ ස්කන්ධමාර තෙම සත්ත්වයා නොදන්නේ ය.

1109. එහෙයින් ස්මෘතිමත් වූ (සර්වසංස්කාරයන් අනිත්‍යාදිවශයෙන්) දන්නා වූ මහණ තෙම මෙ ප්‍රජාව මෘත්‍යුධෙයයෙහි ඇලිනැ'යි දක්මින් (රූපාදි) ආදනයෙහි ඇලුනු සියලු ලොවැ (රූපාදි) කිසිවක් ගන්නේ යි.

**හද්‍රාවුධමාණවක පෘච්ඡා නිමි.**

## 5 – 13

## උදයමාණවක පෘච්ඡා

1110 (උදය මානවක මෙසේ ඇසීය) ධ්‍යාන කරනසුලු විගත රජස් ඇති වැ වැඩහුන් සිවුමගින් කළ (සොළොස්) කිස ඇති අනාස්‍රව වූ සර්වධර්මයන්ගේ පරතෙර පත් වූ භාගයවතුන් වහන්සේ වෙත ප්‍රශ්නාර්ථී වැ ආයෙමි, අවිද්‍යාව බිඳුනා වූ අඥාඥ විමොක්ඛ සංඛ්‍යාත නිර්වාණය වදළ මැනැවි.

1111 (භාගයවතුන් වහන්සේ මෙසේ වදළ සේක: උදයමාණව යෙනි,) කාමච්ඡන්දයන්ගේ ද දෙම්නසුන්ගේ ද යන දෙදෙනාගේ ප්‍රහාණය ද ථීන මිද්ධයාගේ දුරැලීම ද කෞකෘත්‍යයාගේ වැළැකීම ද ඇති—

1112 චතුර්ථධ්‍යානොපේක්ෂා ස්මෘති යන දෙකින් සංශුද්ධිය ඇති ධර්මතර්ක සංඛ්‍යාත සම්‍යක් සංකල්පය පෙරටුකොට ඇති අර්හත්ඵල විමොක්ෂය අවිද්‍යාවගේ බිඳුමැයි කියමි.

1113 (ආයුෂ්මත් උදයමාණවක මෙසේ අසයි:) ලොක සත්ත්වයා කුමක් සංයොජන (බන්ධන) කොට ඇත්තේ ද? එ සත්ත්වයාගේ විචාරණය (හැසිරීමට කරුණ) කිම? කවර දහමක් හුගේ විශෙෂ ප්‍රහාණයෙන් නිවනැ'යි කියනු ලැබෙ ද?

1114. නන්දි සංයොජනො ලොකො (උදයාති භගවා)
විතක්කස්ස විචාරණා,
තණ්හාය විප්පහානෙන නිබ්බානමිති වුච්චති.

1115. කථං සතස්ස චරතො (ඉච්චායස්මා උදයං)
විඤ්ඤාණං උපරුජ්ඣති,
භගවන්තං පුට්ඨුමාගම්ම තං සුණොම වචො තව:

1116. අජ්ඣත්තඤ්ච බහිද්ධා ච වෙදනං නාභිනන්දතො,
එවං සතස්ස චරතො විඤ්ඤාණං උපරුජ්ඣතීති.

උදයසුත්තං තෙරසමං[1].

## 5 – 14

### පොසාලසුත්තං[2]

1117. යො අතීතං ආදියති (ඉච්චායස්මා පොසාලො)
අනෙජො ඡින්නසංසයො,
පාරගුං සබ්බධම්මානං අත්ථිපඤ්හෙන ආගමං.

1118. විභූතරූපසඤ්ඤිස්ස සබ්බකායප්පහායිනො
අජ්ඣත්තඤ්ච බහිද්ධා ච නත්ථි කිඤ්චීති පස්සතො,
ඤාණං සක්කානුපුච්ඡාමි කථං නෙය්‍යො තථාවිධො.

1119. විඤ්ඤාණට්ඨිතියො සබ්බා (පොසාලාති භගවා)
අභිජානං තථාගතො
තිට්ඨන්තමෙනං ජානාති විමුත්තං තප්පරායණං.

1120. ආකිඤ්චඤ්ඤසම්භවං ඤත්වා නන්දි සංයොජනං ඉති,
එවමෙතං අභිඤ්ඤාය තතො තත්ථ විපස්සති:
එතං ඤාණං තථං තස්ස බ්‍රාහ්මණස්ස වුසීමතොති.

පොසාලසුත්තං චුද්දසමං[3].

1. උදයමාණවපුච්ඡා තෙරසී–මජසං
2. පොසාලමාණවපුච්ඡා
3. පොසාලමාණවපුච්ඡා චුද්දසී.



Free Distribution www.aathaapi.org

1114 ලොකසත්ත්‍වයා තෘෂ්ණාව සංයෝජන කොට ඇතියේ ය. විතර්කය ඔහට විචාරණය වේ. එ තෘෂ්ණාවගේ විප්‍රහාණයෙන් නිර්වාණ යැ'යි කියනු ලැබේ,

1115 (ආයුෂ්මත් උදයමාණව මෙසේ ඇසීය:) ස්මෘති සම්පන්න ව වාසය කරන්නහුගේ විඥනය කි සෙයින් නිරුද්ධ වේ ද? භාග්‍යවතුන් වහන්සේ පුළුවුස්නට පැමිණියම්හ. මුඹ වහන්සේගේ එ බස් අසම්හ.

1116 අධ්‍යාත්මාලම්බනයෙහි ද බාහිරාලම්බනයෙහි ද උපදනා වේදනාව නො පතන, ස්මෘතිමත් වැ හැසිරෙණුවහුගේ විඥනය මෙසේ නිරුද්ධවේ යයි.

උදයමාණව පෘච්ඡා නිමි.

## 5 – 14

## පොසාලමාණවක පෘච්ඡා

1117 (ආයුෂ්මත් පොසාල මාණවක මෙසේ විචාරයි:) එජා සංඛ්‍යාත තෘෂ්ණා රහිත වූ සිඳුනා ලද සැක ඇති, යම් සර්වඥ කෙනෙක් ස්වකීයවූ ද පරකීය වූ ද අතීතය (පූර්වනිවාසානුස්මෘති ඥණයෙහ) ප්‍රකාශ කෙරෙත් ද, සියලු ධර්මයන්ගේ පාරිමතිරප්‍රාප්ත වූ එ සර්වඥයන් කරා ප්‍රශ්නයෙන් අර්ථීව පැමිණියෙම් වෙමි.

1118 ශාක්‍යමුනීන්ද්‍රයන් වහන්ස, මොනොවට ඉක්මවන ලද රූපසංඥ ඇති, තදංග–වික්ඛම්භණ වශයෙන් හැම රූපකාය ප්‍රහාණය කරනසුලු අධ්‍යාත්මයෙහිත්, බාහිරයෙහිත් කිසිවක් නැතැ'යි දක්නාහු (ආකිඤ්චඤ්ඤායතනලාභීහු) ගේ ඥනය පුලුවුස්මි. එ බඳු වූ පුද්ගල තෙම කිසෙයින් මත්තෙහි ඥනයට පැමිණවිය යුත්තේ ද?

1119 (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදළ සේක: පොසාලයෙනි), තථාගතයෝ හැම විඥනස්ථිතීන් වෙසෙසින් දන්නාහු ආකිඤ්චඤ්ඤ-යතනයෙහි අධිමුක්ත වූ එය මැ පරායණ කොට ඇති මෙ පුඟුලා දන්නාහ.

1120 ආකිඤ්චඤ්ඤයතනයෙහි උපදවන අරූපරාග සංඛ්‍යාත නන්දිය සංයොජනයෙකැ'යි මෙසේ විශිෂ්ට ඥනයෙන් දැන ඉක්බිති එහි අනිත්‍යාදි විසින් විදර්ශනා (භාවනා) කරන්නේය. වැස නිම වූ මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාවාසය ඇති බාහිතපාපී වූ එ රහත්හුගේ තෙල අර්හත්ව ඥනය අවිපරීත වෙ යයි.

පොසාලමාණව පෘච්ඡා නිමි.



Free Distribution                                        www.aathaapi.org

## 5–15

## මොඝරාජ සුත්තං

1121. ද්වාහං සක්ක අපුච්ඡිස්සං (ඉච්චායස්මා මොඝරාජා)[1]
න මෙ ව්‍යාකාසි චක්ඛුමා,
යාව තතියඤ්ච දෙවීසි ව්‍යාකරොතීති මෙ සුතං.

1122. අයං ලොකො පරො ලොකො බ්‍රහ්මලොකො සදෙවකො,
දිට්ඨිං තෙ නාභිජානාති ගොතමස්ස යසස්සිනො.

1123. එතං අභික්කන්තදස්සාවිං අත්ථි පඤ්හෙන ආගමං,
කථං ලොකං අවෙක්ඛන්තං මච්චුරාජා න පස්සති.

1124. සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු මොඝරාජ සදා සතො,
අත්තානුදිට්ඨිං ඌහච්ච එවං මච්චුතරො සියා;
එවං ලොකං අවෙක්ඛන්තං මච්චුරාජා න පස්සතීති.

මොඝරාජසුත්තං පණ්ණරසමං[2].

## 5 – 16

## පිඞ්ගිය සුත්තං

1125. ජිණ්ණොහමස්මි අබලො වීතවණ්ණො (ඉච්චායස්මා පිඞ්ගියො)[3]
නෙත්තා න සුද්ධා සවනං න ඵාසු,
මාහං නස්සං මොමුහො අන්තරාව
ආචික්ඛ ධම්මං යමහං විජඤ්ඤං
ජාතිජරාය ඉධ විප්පහානං.

1126. දිස්වාන රූපෙසු විහඤ්ඤමානෙ (පිඞ්ගියාති භගවා)
රුප්පන්ති රූපෙසු ජනා පමත්තා,
තස්මා තුවං පිඞ්ගිය අප්පමත්තො
ජහස්සු රූපං අපුනබ්භවාය.

---

1. මොඝරාජ මාණව පුච්ඡා
2. මොඝරාජ මාණව පුච්ඡා–පණ්ණරසී–ම. ජ. ස.
3. පිංගියමාණව පුච්ඡා.



Free Distribution www.aathaapi.org

## 5 – 15

## මොසරාජ පෘච්ඡා

1121 (ආයුෂ්මත් මොසරාජ මෙසේ ඇසීය:) මම දෙවටක් ශාක්‍ය මුනිහු විචාළෙමි, පසැස් ඇති මුනිහු මට නො දෙසූහ. දෙවර්ෂීහු තෙවනුවට දක්වා විචාරණ ලද්දහු ප්‍රකාශ කරන්නාහ''යි මා විසින් අසන ලද.

1122 මෙ මිනිස්ලෝ වැසි තෙමේ ද, අන්ලෝ වැසි තෙමේ ද දෙවියන් සහිත බඹලො වැසි තෙමේ ද යශස්වී වූ ගෞතම ගොත්‍ර ඇති මුඹ වහන්සේගේ දෘෂ්ටිය නොදන්නේ ය.

1123 මෙසේ පරමදර්ශී වූ සර්වඥයන් වහන්සේ කරා පැන පුළුවුස්නෙන් අර්ථී ව ආයෙමි. ලොව කිසෙයින් බලන්නහු මෘත්‍යුරාජ තෙමේ නො දක්නේ ද?

1124 මොසරාජය හැමකල්හි ස්මෘතිමත් වැ සත්කාය දෘෂ්ටිය දුරු කොට ලෝකය ශූන්‍ය හෙයින් බලව, මෙ සෙයින් මෘත්‍යුහු ඉක්මවන්නෙහි මෙසෙයින් ලොව දක්නහු මෘත්‍යුරාජ තෙම නොදක්නේ යයි,

**මොසරාජ මාණව පෘච්ඡා නිමි.**

## 5 – 16

## පිඞගියමාණව පෘච්ඡා

1125 (ආයුෂ්මත් පිඞ්ගිය මෙසේ විචාරයි) මම ජීර්ණයෙමි, දුර්වලයෙමි, විවර්ණයෙමි, (මාගේ) නේත්‍රයෝ ශුද්ධ නො වෙති, ශ්‍රවණය ද පහසු නැත, මම (මුඹ වහන්සේගේ දහම් පසක් නොකොට) අතුරෙහි මැ මුළා වූ යෙම් නහමක් මියෙම්වා. මේ පහණසැවෙහෙරෙහි මැ ජාති ජරාවන්ගේ ප්‍රහාණය වූ යම් දහමක් අසා මම දැනගන්නෙම් නම්, එ දහම වදළ මැනැව.

1126 (බුදුහු මෙසේ වදළහ: පිඞ්ගියෙනි,) රූප නිමිතින් නැසෙන වුන් දැක (කුශලධර්මයන්හි) ප්‍රමත්ත වූ ජනයෝ රූපයන් නිමිති කොට පෙළෙති. පිඞ්ගිය, තෙපි (කුශලධර්මයෙහි) අප්‍රමත්තව පුනර්භවය නො වනු පිණිස රූපය දුරු කරව.

1127. දිසා චතස්සො විදිසා චතස්සො
උද්ධං අධො දසදිසා ඉමායො
න තුය්හං අදිට්ඨං අසුතං' මුතං වා,
අථො අවිඤ්ඤාණං කිඤ්චි න මත්ථි ලොකෙ
ආචික්ඛ ධම්මං යමහං විජඤ්ඤං
ජාති ජරාය ඉධ විප්පහානං.

1128. තණ්හාධිපන්නෙ මනුජෙ පෙක්ඛමානො (පිඞ්ගියාති භගවා)
සන්තාපජාතෙ ජරසා පරෙතෙ,
තස්මා තුවං පිඞ්ගිය අප්පමත්තො
ජහස්සු තණ්හං අපුනබ්භවායාති.

පිඞ්ගියසුත්තං සොළසමං[2].

ඉදමවොච භගවා මගධෙසු විහරන්තො පාසාණකෙ චෙතියෙ පරිචාරිකසොළසානං බ්‍රාහ්මණානං අජ්ඣිට්ඨො පුට්ඨො පුට්ඨො පඤ්හෙ ව්‍යාකාසි. එකමෙකස්ස චෙපි පඤ්හස්ස අත්ථමඤ්ඤාය ධම්මමඤ්ඤාය ධම්මානුධම්මං පටිපජ්ජෙය්‍ය ගච්ඡෙය්‍යෙව ජරාමරණස්ස පාරං පාරඞ්ගමනීයා ඉමෙ ධම්මාති. තස්මා ඉමස්ස ධම්මපරියායස්ස පාරායනන්තෙව[2] අධිවචනං:

1129. අජිතො තිස්ස මෙත්තෙය්‍යො පුණ්ණකො අථ මෙත්තගූ,
ධොතකො උපසීවො ච නන්දො ච අථ හෙමකො.

1130. තොදෙය්‍යකප්පා දුභයො ජතුකණ්ණී ච පණ්ඩිතො,
භද්‍රාවුධො උදයො ච පොසාලො චාපි බ්‍රාහ්මණො,
මොඝරාජා ච මෙධාවී පිඞ්ගියො ච මහාඉසි.

1131. එතෙ බුද්ධං උපාගච්ඡුං සම්පන්නචරණං ඉසිං
පුච්ඡන්තා නිපුණෙ පඤ්හෙ බුද්ධසෙට්ඨං උපාගමුං.

1. පිංගියමාණවපුච්ඡා සෙ. සී.
2. පාරායනන්තෙව–ම. ඡ. සං



Free Distribution www.aathaapi.org

1127 සතර දිග ය, සතර අනු දිග ය උඩ ය යට ය යන මේ දස දික් කෙනෙක් වෙත් ද, ලොව් හි මෙ හැම තන් හි මුඹ වහන්සේ විසින් නො දක්නා ලද, නො අසන ලද ආඝ්‍රාණ, ස්වාදන, ස්පර්ශන නොකරන ලද යළි නො දක්නා ලද කිසිවක් නැති මේ පහණසෑ වෙහෙරෙහි දී මැ ජාති ජරාවන්ගේ ප්‍රහාණය වූ යම් (නිර්වාණ) දහමක් මම් දැනගන්නෙම් නම්, එ දහම් වදළ මැනව.

1128 (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදළහ: පිඞ්ගියෙනි, යම් හෙයකින් තෙපි) තෘෂ්ණායෙහි ගැලී සිටි සත්ත්වයන් හටගත් සිත් තැවුලි ඇතියන් ජරායෙන් මඩනා ලද්දවුන් සේ දක්නවූ ද එ හෙයින් පිඞ්ගියෙනි, තෙපි අප්‍රමත්ත වැ පුනර්භවය නො වනු පිණිස තෘෂ්ණාවූ දුරු කරවයි.

**පිඞ්ගියමාණව පෘච්ඡා නිමි.**

භාග්‍යවතුන් වහන්සේ මගධ දනවුයෙහි පාසාණක චෛත්‍ය නම් වෙහෙරෙහි වැඩ වසනසේක්, මෙය දෙසූ සේක. බාවරීහුගේ අතැවැසි සොළොස් බමුණන් විසින් අයදනා ලද්දහු පුළුවුත්පුළුවුත් පැන විසඳූ සේක. ඉදින් යමෙක් එකෙකි පැනයෙකැ පෙළ දැන් අරුත් දැන ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි පිළිපදනේ නම් හේ ජරාමරණයන්ගේ පරතෙරට යන්නේ මැ ය, යම් හෙයෙකින් මේ ධර්මයෝ (නිර්වාණ) පාර ගමනාර්හ වෙත් ද එ හෙයින් මේ ධර්ම පර්‍ය්‍යායට 'පාරායන' යනු මැ නම් වී ය.

1129 අජිතය, තිස්සමෙත්තෙය්‍ය ය, පුණ්ණක ය, යළි මෙත්තගූ ය, ධොතක ය උපසීව ය, නන්ද ය, යළි හෙමක ය,

1130 තොදෙය්‍ය කප්ප යන දෙදෙනා ය, පණ්ඩිත වූ ජතුකණ්ණී ය භද්‍රාවුධ ය, උදය, පොසාල බ්‍රාහ්මණ ය, පණ්ඩිත වූ මොඝරාජ ය, මහර්ෂි වූ පිඞ්ගි ය ද යන.

1131 මොහු සමෘද්ධ වූ පසළොස් චරණධර්ම ඇති මහර්ෂි වූ භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියහ. සියුම් පැන පුළුවුස්නාහු බුද්ධ-ශ්‍රෙෂ්ඨයන් කරා පැමිණියහ.

1132. තෙසං බුද්ධො ව්‍යාකාසි පඤ්හෙ පුට්ඨො යථාතථං,
පඤ්හානං වෙය්‍යාකරණෙන තොසෙසි බ්‍රාහ්මණෙ මුනී,

1133. තෙ තොසිතා චක්ඛුමතා බුද්ධෙනාදිච්චබන්ධුනා,
බ්‍රහ්මචරියමචරිංසු වරපඤ්ඤස්ස සන්තිකෙ.

1134. එකමෙකස්ස පඤ්හස්ස යථා බුද්ධෙන දෙසිතං,
තථා යො පටිපජ්ජෙය්‍ය ගච්ඡෙ පාරං අපාරතො.

1135. අපාරා පාරං ගච්ඡෙය්‍ය භාවෙන්තො මග්ගමුත්තමං,
මග්ගො සො පාරං ගමනාය තස්මා පරායනං ඉති.

## පාරායනානුගීතිගාථා

1136. පරායනමනුගායිස්සං (ඉච්චායස්මා පිඞ්ගියො)
යථාද්දක්ඛි තථා අක්ඛාසි,
විමලො භූරිමෙධසො,
නික්කාමො නිබ්බනො[1] නාගො
කිස්ස හෙතු මුසා භණෙ.

1137. පහීන මල මොහස්ස මානමක්ඛප්පහායිනො,
හන්දාහං කිත්තයිස්සාමි ගිරං වණ්ණූපසංහිතං.

1138. තමොනුදො බුද්ධො සමන්තචක්ඛු
ලොකන්තගූ සබ්බභවාතිවත්තො,
අනාසවො සබ්බදුක්ඛප්පහීනො
සච්චව්හයො බ්‍රහ්මෙ උපාසිතො මෙ.

1139. දිජො යථා කුබ්බනකං පහාය
බහුප්ඵලං කානනං ආවසෙය්‍ය,
එවංපහං අප්පදස්සෙ පහාය
මහොදධිං හංසරිවජ්ඣපත්තො[2]

1140. යෙ මෙ පුබ්බෙ ව්‍යාකංසු
හුරං ගොතමසාසනා,
ඉච්චාසි ඉති භවිස්සති,
සබ්බන්තං ඉතිහීතිහං
සබ්බන්තං තක්කවඩ්ඪනං

1. නිබ්බුතො–මු.
2. හංසොරිවඅජ්ඣපත්තො–ම. ජ. ස.



Free Distribution www.aathaapi.org

1132 පැන පුළුවුස්නා ලද බුදුහු ඔවුනට ඇතිසැටිය ප්‍රකාශ කළහ. සර්වඥ මුනිහු පැන විසඳීමෙන් බමුණන් තුටු කළහ.

1133 පසැස් ඇති ආදිත්‍ය බන්ධු වූ බුදුරජානන් වහන්සේ විසින් තුටු-කරන ලද්දහු ඔහු උත්තම ප්‍රාඥ වූ සර්වඥයන් වහන්සේ වෙත මගබඹ-සරවස් වුසූහ.

1134 එකෙකි, පැනයට යම්සේ බුදුරදුන් විසින් වදාළ විසැඳුම් වේ ද, එසේ යමෙක් පිළිපදනේ නම් හේ අපාර සංඛ්‍යාත සංසාරයෙන් පාරසංඛ්‍යාත නිර්වාණයට යන්නේ ය.

1135 උතුම් වූ ආර්‍යමාර්ගය වඩනුයේ අපාර සංඛ්‍යාත සසරින් පරතෙරට යන්නේ ය. පාරගමනයට හේ මාර්ග වෙයි. එ හෙයින් 'පාරායන' නම් වෙයි.

## පාරායනානුගීතිගාථා

1136. (ආයුෂ්මත් පිඞ්ගිය බාවරීහට මෙසේ පැවැසී:)

බුදුරදුන් විසින් ගැයූ පරිද්දෙන් පාරායනය අනුගායනා කරන්නෙමි. බුදුරජානන් වහන්සේ යම් පරිද්දෙකින් (සත්‍යාභිසම්බොධයෙන්) දුටුසේක් නම්, එ පරිද්දෙන් වදාළසේක. නිර්මල වූ විපුලප්‍රඥ ඇති ප්‍රහීණ කළ කාම ඇති කෙලෙස්වල් හෝ තෘෂ්ණා විරහිත ලෝකනාථයන් වහන්සේ කුමක් හෙයින් මුසවා බණනසේක් ද?

1137. ප්‍රහීණ වූ රාගාදිමල හා මෝහ හා ඇති, මානය හා මකුබව හා දුරැලූ බුදුරජුන්ගේ ගුණොපසංහිත වචනය මම එකත්නෙන් කීර්තනය කරන්නෙමි.

1138. බ්‍රාහ්මණය, අවිදුඅඳුර දුරැලූ, සමතැස් ඇති ලොකාන්තයට ගිය, හැම භවයන් ඉක්ම වූ, ආස්‍රව රහිත වූ, සියලු දුක් ප්‍රහීණ කළ, සත්‍යනාම ඇති බුදුහු මා විසින් උපාශ්‍රිතයහ.

1139. පක්ෂියෙක් කුඩා වනය හැර පියා බොහෝ පලතුරු ඇති වනයකට පැමිණ වසන්නා සේ, මම ද (බාවරී ආදී) මඳ නුවණැතියන් හැරපියා (අනවතප්තාදී) මහවිලකට හංසයකු සෙයින් පැමිණියෙමි.

1140. පෙර (බාවරීආදී) යම් කෙනෙක් ගෞතමබුද්ධශාසනයෙන් පළමු 'මෙසේ වී ල, මෙසේ වන්නේ ල' යි (යම් දහමක්) මට ප්‍රකාශ කළාහු ද, එ හැම 'මෙසේ, මෙසේ යැ'යි උපන් කථායෙක, එ හැම (කාමවිතර්කාදී) තර්ක වඩනා සුලු ය.



Free Distribution www.aathaapi.org

1141. එකො තමනුදසීනො ජුතිමා සො පභංකරො,
ගොතමො භූරිපඤ්ඤාණො ගොතමො භූරිමෙධසො.

1142. යො මෙ ධම්මමදෙසෙසි සන්දිට්ඨිකමකාලිකං,
තණ්හක්ඛයමනීතිකං යස්ස නත්ථි උපමා ක්වචි.

1143. කින්නු තම්හා විප්පවසසි මුහුත්තමපි පිඞ්ගිය,
ගොතමා භූරිපඤ්ඤාණා ගොතමා භූරිමෙධසා.

1144. යො තෙ ධම්මමදෙසෙසි සන්දිට්ඨිකමකාලිකං,
තණ්හක්ඛයමනීතිකං යස්ස නත්ථි උපමා ක්වචි.

1145. නාහං තම්හා* විප්පවසාමි මුහුත්තමපි බ්‍රාහ්මණ,
ගොතමා භූරිපඤ්ඤාණා ගොතමා භූරිමෙධසා.

1146. යො මෙ ධම්මමදෙසෙසි සන්දිට්ඨිකමකාලිකං
තණ්හක්ඛයමනීතිකං යස්ස නත්ථි උපමා ක්වචි.

1147. පස්සාමි නං මනසා චක්ඛුනා ච
රත්තිං දිවං බ්‍රාහ්මණ අප්පමත්තො.
නමස්සමානො විවසෙමි[1] රත්තිං
තෙනෙව මඤ්ඤාමි අවිප්පවාසං.

1148. සද්ධා ච පීතී ච මනො සතී ච
නාපෙන්ති මෙ ගොතමසාසනම්හා,
යං යං දිසං වජති භූරිපඤ්ඤො
ස තෙන තෙනෙව නතො හමස්මි.

1149. ජිණ්ණස්ස මෙ දුබ්බලථාමකස්ස
තෙනෙව කායො න පලෙති තත්ථ,
සඞ්කප්පයත්තාය[2] වජාමි නිච්චං
මනො හි මෙ බ්‍රාහ්මණ තෙන යුත්තො

1150. පඞ්කෙ සයානො පරිඵන්දමානො දීපා දීපං උපප්ලවිං,
අථද්දසාසිං සම්බුද්ධං ඔඝතිණ්ණමනාසවං.

*තණ්හා–මු 1 නමස්සමානො විවි.
2. සත්තාය–මජසං



Free Distribution www.aathaapi.org

1141–1142. යම් සම්බුදු කෙනෙක් මට සාන්දෘෂ්ටිකඵල ඇති කල් නො යා දී දෙන පල ඇති, තෘෂ්ණාක්ෂය වූ කෙලෙස් උවදුරු නැති, දහම් දෙසුසේක් ද, යම් බුදුකෙනෙකුන්ට කිසි තැනෙක්හි දු උපමායෙක් නැත් ද, භූරිප්‍රාඥ වූ එ ගෞතමයන් වහන්සේ අසභාය වැ අවිදූඅදූර දුරලා වැඩහුන් සේක. ජාතිමත්හ. ප්‍රභඞ්කරයහ. ගෞතමසර්වඥයන් වහන්සේ ඥානධ්වජ ඇතිසේක.

1143–1144. පිඞ්ගියබ්‍රාහ්මණයෙනි, තට යම් සම්බුදු කෙනෙක් සාන්දෘෂ්ටික වූ අකාලික වූ තෘෂ්ණාක්ෂය වූ, කෙලෙස් උවදුරු නැති ධර්මය දෙසුසේක් නම්, යම් බුදුකෙනකුහට කිසි තැනෙක්හි දු උපමායෙක් නැත් නම්, විපුල ප්‍රඥාධ්වජ ඇති එ ගෞතමයන් වහන්සේ කෙරෙන් එ මහාප්‍රාඥගෞතමයන් කෙරෙන් කිම, මොහොතකුදු වියෝව වෙසෙවු-ද'යි (බාවරි කී යැ.)

1145–1146. බමුණානෙනි, යම් සම්බුදු කෙනෙක් මට සාන්දෘෂ්ටික වූ අකාලික වූ තෘෂ්ණාක්ෂය වූ කෙලෙස් උවදුරු නැති දහම් දෙසූහු ද, යම් කෙනකුන්ට කිසි තැනෙක්හි දු උපමා නැද්ද, එ ඥානධ්වජ ඇති ගෞතමයන් වහන්සේ කෙරෙන් එ විපුලප්‍රඥ ඇති ගෞතමයන් වහන්සේ කෙරෙන් මම් මොහොතකුදු වෙන් වැ නො වසමි.

1147. බ්‍රාහ්මණයෙනි, අප්‍රමත්ත වූ (මම්) දවරැහී මනසින් හා ඇසින් හා එ ගෞතමබුදුන් දක්මි. නමස්කාර කරමින් මැ රැය ඉක්වමි. එහෙයින් මැ අවිප්‍රවාසය හඟිමි.

1148. මාගේ ශ්‍රද්ධාව හා ප්‍රීතිය හා මනස හා ස්මෘතිය හා ගෞතම ශාසනයෙන් පහ වැ නොයෙයි. මහාප්‍රාඥයන් වහන්සේ යම් මැ දෙසකට වඩනාසේක් නම්, එ මම් එ දික්හි මැ නතුයෙම් වෙමි.

1149. ජීර්ණ වූ (එහෙයින් මැ) අල්පවීර්‍ය්‍ය ඇති මාගේ මේ කය, එ හෙයින් මැ එහි නො යෙයි. සංකල්පගමනින් එක්වන් යෙමි. බ්‍රාහ්මණය, එහෙයින් මැ මාගේ සිත එබුදුන් ඇති තන්හි මැ යෙදුනේ වෙයි.

1150. කාමපඞ්කයෙහි හෝනෙම් හාත්පසින් සැලෙනුයෙම් ශාස්තෘ සඞ්ඛ්‍යාත ද්වීපයෙන් ද්වීපයට පාවැ ගියෙමි. එක්බිති, (පහණසැවෙහෙ-රෙහි දී) චතුරොඝතරණය කළ ආශ්‍රව රහිත වූ සම්බුදුන් දිටිමි.

1151. යථා අහූ වක්කලි මුත්තසද්ධො
භද්‍රාවුධො ආළවි ගොතමො ච,
එවමෙව ත්වම්පි පමුඤ්චස්සු සද්ධං
ගමිස්සසි ත්වං පිඞ්ගිය මච්චුධෙය්‍යස්ස පාරං.

1152. එස භිය්‍යො පසීදමි සුත්වාන මුනිනො වචො,
විවත්තච්ඡද්දො සම්බුද්ධො අඛිලො පටිභානවා.

1153. අධිදෙවෙ අභිඤ්ඤාය සබ්බං වෙදි පරොවරං,
පඤ්හානන්තකරො සත්ථා කඞ්ඛීනං පටිජානතං.

1154. අසංහීරං අසඞ්කුප්පං යස්ස නත්ථි උපමා ක්වචි,
අද්ධා ගමිස්සාමි න මෙත්ථ කඞ්ඛා එවං පධාරෙහි–
අධිමුත්තචිත්තන්ති.

පාරායනවග්ගො නිට්ඨිතො.

සුත්තනිපාතො සමත්තො.



Free Distribution www.aathaapi.org

**1151.** ශ්‍රද්ධාධිමුක්ත **වක්කලී** මහණය, භද්‍රාවුධ ය, **ආළවිගොතම** ය, යන මොහු යම් බඳු වූහු නම්, එ සෙයින් මැ තෙපි ද ශ්‍රද්ධායෙහි අධිමුක්ත වව. පිඞ්ගියෙනි, තො ද මෘත්‍යුධෙය සඞ්ඛ්‍යාත සංසාරයාගේ පාරයට යව.

**1152.** මුනීන්ද්‍රයන් වහන්සේගේ තෙල බස **අසා** මම් බෙහෙවින් පහදිමි. **සම්බුදුහු පෙරළු** (රාගාදි) සියන් ඇතියහ. (රාගාදි) ඛිල රහිතයහ. ප්‍රතිභානප්‍රතිසංවිද් ඇතියහ.

**1153.** අධිදේවකර ධර්‍මයන් ප්‍රත්‍යක්ෂයෙන් දැන, හීන-ප්‍රණීත වූ හෝ (තමාත් මෙරමාත් පිළිබඳ වූ) අධිදෙවත්වකර ධර්මජාතය දතුවහ. ශාස්තෲන් වහන්සේ සැක ඇතිව මැ 'සැක නැතියම්හ'යි පිළින කරණුවන් ගේ ප්‍රශ්න කෙළවර කරන්නාහ.

**1154.** යම් නිවනකට කිසි ද තැනෙක්හි උපමා නැද්ද, (රාගාදියෙන්) ගෙණ යා නො හැකි, අකොප්‍ය වූ නිවන එකත්නෙන් අධිගම කරණෙම් මෙහිලා මට සැකයෙක් නැත. මෙසෙයින් (පිඞ්ගිය තෙපි) මා නිවනෙහි අධිමුක්තචිත්තයකු කොට ධරව''යි.

**පාරායනවග්ගය නිමි.**

## සූත්‍රනිපාතය සමාප්ත යි.



Free Distribution www.aathaapi.org

# සුත්තනිපාතො

## ගාථාදිපාද සූචි

### අ


පිටුඅංකය

අකක්කසං විඤ්ඤාපනිං 194
අකිඤ්චනං අනාදානං 336
අකිත්තයී විවටචක්ඛු 290
අක්කොධනං වතවන්තං 192
අක්කොධනො අසන්තාසී 270
අක්කොධනො විගතඛීලො' හමස්මි 6
අක්කොසං වධබන්ධඤ්ච 192
අක්ඛාතාරං පවත්තාරං 50
අගමා රාජගහං බුද්ධො 122
අග්ගිහුත්තමුඛා යඤ්ඤා 178
අච්චි යථා වාතවෙගෙන ඛිත්තා 328
අච්ඡෙච්ඡි තණ්හං ඉධ නාමරූපෙ 106
අජිතං අද්දස සම්බුද්ධං 312
අජිතො තිස්සමෙත්තෙය්‍යො 346
අජ්ජ පණ්ණරසො උපොසථො 46
අජ්ඣත්තමෙව උපසමෙ 290
අජ්ඣත්තඤ්ච බහිද්ධා ච 342
අඤ්ඤත්‍ර තම්හා සමයා 90
අඤ්ඤං ඉතො යාභිවදන්ති ධම්මං 280
අඤ්ඤාතමෙතං වචනං 218
අඤ්ඤාය පදං සමෙච්ච ධම්මං 112
අඤ්ඤාය ලොකං පරමත්ථදස්සී 66
අඤ්ඤාය සබ්බානි නිවෙසනානි 61
අඤ්ඤෙන ච කෙවලිනං මහෙසිං 26, 142
අඤ්ඤෙනපි පස්ස ගම්මෙන 184
අට්ඨචත්තාරීසං වස්සානි 88


### අ


පිටුඅංකය

අට්ඨානතං සඞ්ගණිකාරතස්ස 16
අට්ඨිනහාරුසංයුත්තො 60
අණුමත්තෙනපි පුඤ්ඤෙන 126
අතිසාරදිට්ඨියා සො සමත්තො 280
අතීතයොබ්බනො පොසො 34
අතීතෙසු අනාගතෙසු චාපි 112
අත්තදණ්ඩා භයං ජාතං 294
අත්තවෙතනභතො'හමස්මි 8
අත්තං පහාය අනුපාදියානො 254
අත්ථංගතස්ස න පමාණමත්ථි 330
අත්ථංගතො සො උදවා සො නත්ථි 330
අත්ථාය වත මෙ බුද්ධො 58
අත්ථි වසා අත්ථි ධෙනුපා 8
අත්ථි සද්ධා තථා විරියං 126
අථ ඛො චරහි ජානාති 308
අථත්තනො ගමනමනුස්සරන්තො 216
අථ ත්වං පවිතක්කමාගමා 264
අථ පුබ්බලොහිතමිස්සෙ 210
අථ භාසිහි දසදිසා 222
අථ ලොහමයං පන කුම්භිං 210
අථ වෙතරණිං පන දුග්ගං 210
අථ සත්ථානි කුරුතෙ 260
අථස්ස ගත්තා දිස්වාන 312
අථස්ස නවහි සොතෙහි 60
අථස්ස සුසිරං සීසං 360
අථා'පරං පඤ්චරජානි ලොකෙ 304
අද්දස භගවා ආදිං 106
අද්ධා අමොසං මම පුච්ඡනා අහු 150

අ

පිටුඅංකය

අද්ධා පසංසා ච සහායසම්පදං 14
අද්ධා හි තස්ස රුතමිච්ඡෙ 134
අද්ධා හි භගවා තමෙව එතං 112
අධිදෙවෙ අභිඤ්ඤාය 352
අනගාරියුපෙතස්ස 118
අනත්තනි අත්තමානී 236
අනණ්වයං පියං වාචං 78
අනාවරණදස්සාවී 310
අනිමිත්තං ච භාවෙහි 102
අනිමිත්තමනඤ්ඤාතං 182
අනිස්සිතො න චලති 234
අනුඤ්ඤාතපටිඤ්ඤාතා 188
අනුවඩ්ඩුරී අනානුගිද්ධො 198
අනුවිච්ච පපඤ්චනාමරූපං 160
අනුසාස බ්‍රහ්ම
කරුණායමානො 326
අනෙකසාඛං ච සහස්සමණ්ඩලං 214
අනෙජස්ස විජානතො 298
අනෙජං මූලදස්සාවිං 318
අනොමනාමං නිපුණත්ථදස්සිං 54
අන්තගූ'සි පාරගූ දුක්ඛස්ස 164
අන්තපූරො දරපූරො 60
අඤ්ඤකම්මකසා න විජ්ජරෙ 6
අන්නං ච ලද්ධා වසනං ච
කාලෙ 304
අන්නද බලද චෙතං 90
අඤ්ඤානමථො පානානං 290
අපාරා පාරං ගවෙජ්ජය 348
අපි චෙ වස්සසතං ජීවෙ 184
අප්පභොගො මහාතණ්හො 36
අප්පමත්තො අයං කලි 206
අප්පං වත ජීවිතං ඉදං 254
අප්පං හි එතං න අලං සමාය 282
අබලානං බලීයන්ති 242

අ

පිටුඅංකය

අබ්බුළ්හසල්ලො අසිතො 184
අබ්‍රහ්මචරියං පරිවජ්ජයෙය්‍ය 118
අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං 176
අභිභූ හි සො අනභිභූතො 294
අභිසඞ්ඛරිත්වා කුහකො 306
අභූතවාදී නිරයං උපෙති 206
අමොසධම්මං නිබ්බානං 238
අයං ලොකො පරො ලොකො 344
අයං හි ධම්මො නිපුණො
සුඛො ච 114
අයොසමපුසමාහතට්ඨානං 208
අලත්ථං යදිදං සාධු 220
අලද්ධා තස්ස අස්සාදං 130
අලීනචිත්තො ච සියා 222
අවජ්ඣා බ්‍රාහ්මණා ආසුං 88
අවිජ්ජාය නිවුතො ලොකො 316
අවිජ්ජා මුද්ධාති ජානාහි 314
අවිජ්ජා හ'යං මහාමොහො 228
අවිරුද්ධං විරුද්ධෙසු 194
අසජ්ජමානා විචරන්ති ලොකෙ 136
අසතං ච සතං ච ඤත්වා 160
අසතං යොධ පබ්‍රූති 40
අසන්තස්ස පියා හොන්ති 32
අසංසට්ඨං ගහට්ඨෙහි 194
අසංහීරං අසංකුප්පං 352
අසිපත්තවනං පන තිණ්හං 210
අසෙවනා ච බාලානං 80
අස්මා චූහො දූරවිභාරවුත්තිනො 66
අහමෙතං න ජානාමි 312
ආකිඤ්චඤ්ඤං පෙක්ඛමානො 328
ආකිඤ්චඤ්ඤසම්භවං ඤත්වා 342
ආගඤ්ජි තෙ සන්තිකෙ
නාගරාජා 114



Free Distribution www.aathaapi.org

# ගාථාදිපාද සූචි


## අ

පිට්ඨඞ්කා

ආගතානි හි මන්තෙසු 310
ආගුං න කරොති කිඤ්චි ලොකෙ 158
ආතඞ්ක එසෙසන බුද්ධය ඵුට්ඨො 302
ආථබ්බණං සුපිනං ලක්ඛණං 292
ආදානතණ්හං විනයෙථ සබ්බං 340
ආදිච්චා නාම ගොත්තෙන 124
ආදිස්ස ජම්මනං බ්‍රෑහි 312
ආනන්දජාතෙ තිදසගණෙ පතීතෙ 212
ආමන්තනා හොති සහායමජ්ඣෙ 12
ආයං අනිස්සාය විවෙකදස්සී 140
ආරති විරති පාපා 80
ආරද්ධවිරියො පරමත්ථපත්තියා 20
ආරොග්‍යං සම්මදඤ්ඤාය 234
ආසවඛීණො පහීනමානො 110
ආසා යස්ස න විජ්ජන්ති 196
ආසිංසන්ති ථොමයන්ති අභිජප්පන්ති 320

## ඉ

ඉඞ්ඝ අඤ්ඤෙපි පුච්ඡස්සු 58
ඉච්චෙතමත්ථං භගවා පුනප්පුනං 78
ඉච්ඡානිදානා භවසාතබද්ධා 244
ඉති හෙතං විජානාම 32, 34, 36
ඉත්ථිධුත්තො සුරාධුත්තො 34
ඉත්ථිසොණ්ඩිං විකරණිං 36
ඉදං වදමීති න තස්ස හොති 264
ඉධ දිට්ඨසුතමුතවිඤ්ඤාතෙසු 334
ඉධෙව සුද්ධිං ඉති වාදියන්ති 260, 282
ඉමං භොන්තො නිසාමෙථ 122,176
ඉමෙ දසසතා යක්ඛා 54
ඉසයො පුබ්බකා ආසුං 88

## උ

පිට්ඨඞ්කා

උග්ඝට්ටපාදෙ තසිතො 306
උච්චාවචා නිච්ඡරන්ති 218
උච්චාවචා හි පටිපද 222
උච්චාවචෙසු සයනෙසු 300
උච්ඡින්නා භවතණ්හස්ස 232
උජුං ජනපදෙ රාජා 124
උට්ඨහථ නිසීදථ 98
උත්‍රස්තං දුක්ඛිතං දිස්වා 306
උදබින්දු යථාපි පොක්ඛරෙ 258
උපධී තෙ සමතික්කන්තා 164, 180
උපධීනිදානා පභවන්ති දුක්ඛා 226
උපයො හි ධම්මෙසු උපෙති වාදං 248
උපාදානපච්චයා භවො 232
උපායාසා ච තෙ සබ්බෙ 164
උපෙක්ඛකො සදා සතො 270
උපෙක්ඛා සති සංසුද්ධං 340
උභොසු අන්තෙසු විනෙය්‍ය ඡන්දං 246
උසභං පවරං ධීරං 198
උසභොරිව ඡෙත්වා බන්ධනානි 10
උස්සුස්සති අනාහාරො 306
ඌනූදරො මිතාහාරො 220

## එ

එකජං වා ද්විජං වා පි 38
එකමෙකස්ස පඤ්හස්ස 348
එකං හි සච්චං න දුතියමත්ථි 278
එකං චරන්තං මුනිං අප්පමත්තං 64
එකාසනස්ස සික්ඛෙථ 222
එකො අහං සක්ක මහන්තමොඝං 328
එකො තමනුදසීනො 350




Free Distribution www.aathaapi.org

## එ

| | පිටුඅංකය |
|---|---|
| එකො පුබ්බෙ චරිත්වාන | 258 |
| එණිජඞ්ඝං කිසං වීරං | 50 |
| එතඤ්ච ධම්මමඤ්ඤාය | 294 |
| එතඤ්චෙ රුච්චති හොතො | 178 |
| එතදඤ්ඤාය යෙ සත්තා | 334, 336 |
| එතමාදීනවං ඤත්වා | 228, 230, 232, 234, 236, 260 |
| එතං අභික්කන්තදස්සාවිං | 344 |
| එතං ලොකස්ස නිය්‍යානං | 52 |
| එතාදිසං වෙ රතනං න ඉච්ඡති | 264 |
| එතාදිසානි කත්වාන | 82 |
| එතාදිසෙන කායෙන | 62 |
| එතාභිනන්දාමි වචො මහෙසිනො | 324, 332 |
| එතාවතග්ගන්ති වදන්ති හෙකෙ | 276 |
| එතෙ ච ඤත්වා උපනිස්සිතාති | 276 |
| එතෙ ච පටිවිජ්ඣි යො ගහට්ඨා | 30 |
| එතෙ පරාභවෙ ලොකෙ | 36 |
| එතෙ බුද්ධං උපාගච්ඡුං | 346 |
| එතෙ විවාද සමණෙසු ජාතා | 262 |
| එතෙසු ගිද්ධා විරුද්ධාතිපාතිනො | 76 |
| එතෙසු ධම්මෙසු විනෙය්‍ය ඡන්දං | 304 |
| එවමබ්භාහතො ලොකො | 182 |
| එවමෙතං යථාභූතං | 200 |
| එවමෙසා කසී කට්ඨා | 24 |
| එවමෙසො අනුධම්මො | 94 |
| එවම්පි විග්ගය්හ විවාදියන්ති | 278 |
| එවම්පි සො වෙදගූ භාවිතත්තො | 96 |
| එවං දුක්ඛන්ති ඤත්වාන | 230 |
| එවං දුතියෙන සහා මමස්ස | 14 |
| එවං ධම්මෙ වියාපන්නෙ | 94 |
| එවංවිහාරී සතො අප්පමත්තො | 322 |

## එ

| | පිටුඅංකය |
|---|---|
| එස භික්ඛු මහාරාජ | 124 |
| එස භීයො පසීදාමි | 352 |
| එසමුඤ්ජං පරිහරෙ | 128 |
| එස සුත්වා පසීදාමි | 106 |
| එසා නමුචි තෙ සෙනා | 128 |
| එසො අධම්මො දණ්ඩානං | 92 |

## ඔ

| | |
|---|---|
| ඔකං ජහං තණ්හච්ඡිදං අනෙජං | 338 |
| ඔකං පහාය අනිකෙතසාරී | 268 |
| ඔක්ඛිත්තචක්ඛු න ච පාදලොලො | 18, 304 |
| ඔක්ඛිත්තචක්ඛු සතිමා | 122 |
| ඔරොපයිත්වා ගිහිබ්‍යඤ්ජනානි | 14 |
| ඔසානෙනෙව ව්‍යාරුද්ධො | 294 |
| ඔහාරයිත්වා ගිහිව්‍යඤ්ජනානි | 18 |

## ක

| | |
|---|---|
| කච්චි වෙවිකිච්ඡී අගමං | 154 |
| කච්චි අදින්නං නාදියති | 48 |
| කච්චි අභිණ්හසංවාසා | 100 |
| කච්චි මනො සුපණිහිතො | 46 |
| කච්චි මුසා න භණති | 48 |
| කච්චි විජ්ජාය සම්පන්නො | 50 |
| කතමං තං උපාදානං | 52 |
| කති පරිස්සයා ලොකෙ | 300 |
| කථං කථං දිට්ඨිපරිබ්බසානා | 278 |
| කථං චරහි ජානෙමු | 310 |
| කථංදස්සී කථංසීලො | 268 |
| කථං නු දන්ති පුච්ඡියාං | 58 |
| කථං සතස්ස චරතො | 342 |
| කථං සමෙතස්ස විභොතිරූපං | 276 |
| කථං සු තරති ඔඝං | 56 |
| කථං සු ලභතෙ පඤ්ඤං | 58 |




Free Distribution www.aathaapi.org

# ගාථාදිපාද සූචි


ක

පිටුඅංකය

කප්පානි විචෙය්‍ය කෙවලානි 156
කම්මනා වත්තති ලොකො 200
කයවික්කමෙ න තිට්ඨෙය්‍ය 292
කරණීය මත්ථ කුසලෙන 44
කලහාභිරතො භික්ඛු 86
කල්‍යාණදස්සනො භික්ඛු 174
කස්මා නු සච්චානි වදන්ති
නානා 280
කස්මා පජානං න උපාදියෙථ 340
කස්සකො කම්මනා හොති 198
කස්සකො පටිජානාසි 24
කං ඛෙත්තජිනං වදන්ති බුද්ධා 158
කං මග්ගජිනං වදන්ති බුද්ධා 28
කං සො සික්ඛං සමාදය 302
කාමං කාමයමානස්ස 242
කාමා තෙ පඨමා සෙනා 128
කාමා හි චිත්‍රා මධුරා මනොරමා 16
කාමෙසු ගිද්ධා පසුතා පමූළ්හා 244
කාමෙසු නාභිගිජ්ඣෙය්‍ය 316
කාමෙසු බ්‍රහ්මචරියවා 318
කාමෙසු විනය ගෙධං 338
කාමෙස්වාදීනවං දිස්වා 124
කායගුත්තො වචීගුත්තො 24
කාලෙන ගච්ඡෙ ගරුනං
සකාසං 98
කිච්ඡා වතායං ඉධ වුත්ති 210
කිඤ්චාපි සො කම්මං කරොති
පාපකං 70
කිත්තයිස්සාමි තෙ ධම්මං 322
කින්නු තම්හා විප්පවසසි 350
කිසො විවණ්ණො භවති 184
කිස්මිං ලොකො සමුප්පන්නො 50

ක

පිටුඅංකය

කිංනිස්සිතා ඉසයො මනුජා
ඛත්තියා 134
කිංපත්තිනමාහු බ්‍රාහ්මණං 156
කිං පත්තිනමාහු භික්ඛුනං 156
කිං පත්තිනමාහු වෙදගුං 160
කිං පත්තිනමාහු සොත්තියං 162
කිං සීලො කිං සමාචාරො 96
කිං සු අසිස්සාමි කුවං වා
අසිස්සං 304
කිං සු සංයොජනො ලොකො 340
කිං සූධ විත්තං පුරිසස්ස සෙට්ඨං
56
කුතො පහූතා කලහා විවාද 272
කෙනස්සු නිවුතො ලොකො 316
කොධනො උපනාහී ච 38
කොධසත්තුසිතො ලොකෙ 318
කොධාතිමානස්ස වසං න
ගච්ඡෙ 302
කොධො මදෙ ථම්භො පච්චුට්ඨ
පනා ච 76
කොධො මොසවජ්ජං ච
කථංකථා ච 274
කො නු අඤ්ඤත්‍ර මරියෙහි 240
කො නු දෙවො ච බ්‍රහ්මා වා 314
කොනු සෙනාපති භොතො 176
කොසම්බිං වාපි සාකෙතං 342
කොසලානං පුරා රම්මා 306
කොසානි විචෙය්‍ය කෙවලානි 158
කො සුජ්ඣති මුච්චති බජ්ඣති ච 150
කොසූධ තරති ඔඝං 52
ක්‍යාස්සු ව්‍යප්පථයො අස්සු 300

ඛ

ඛත්තියා බ්‍රහ්මබන්ධූ ච 94
ඛත්තියා භොජරාජානො 176





Free Distribution www.aathaapi.org

ඛ

පිටුඅංකය

ඛන්ති ච සොවචස්සතා 82
ඛයං විරාගං අමතං පණීතං 68
ඛාදන්ති හං සුවාණා ච 62
ඛාදන්ති හි තස්ස රුදන්තෙන 210
ඛිඩ්ඩං රතිං කාමසුඛං ච
ලොකෙ 18
ඛිඩ්ඩා රතී හොති සහාය
මජ්ඣෙ 12
ඛිප්පං ගිරං එරය වග්ගුවග්ගුං 104
ඛීණං පුරාණං නවං නත්ථි
සම්භවං 72
ඛීලා ඡිබාතා අසම්පවෙධී 8
ඛුද්දං ච බාලං උපසෙවමානො 94
ඛෙත්තං වත්ථුං හිරඤ්ඤං වා 242
ඛෙත්තානි විචෙය්‍ය කෙවලානි 158

ග

ගම්භීරපඤ්ඤං නිපුණත්ථ දස්සිං 52
ගම්භීරපඤ්ඤං මෙධාවිං 194
ගහට්ඨවත්තං පන වො වදාමි 118
ගාථාභිගීතං මෙ අභොජනෙය්‍යං
26, 142
ගාමෙ වා යදි වා රඤ්ඤෙ 38
ගාරවො ච නිවාතො ච 80
ගාවො සයනඤ්ච වත්ථඤ්ච 92
ගුථකූපො යථා අස්ස 86
ගෙධං බ්‍රෑමි මහොඝොති 296
ගොපී ච අහං ච අස්සවා 10
ගොපී මම අස්සවා අලොලා 8
ගොමණ්ඩලපරිබ්බුළ්හං 90

ච

චක්ඛූං ලොකෙ සමුප්පන්නං 188
චක්ඛූහි නෙව ලොලස්ස 290

ච

පිටුඅංකය

චතුප්පදෙ'පි ජානාථ 188
චතුරො සමණා න පඤ්චමත්ථි 28
චන්දං යථා ඛයාතීතං 188
චන්දංව විමලං සුද්ධං 196
චරන්තා ච තෙ බ්‍රහ්මචරියං 126
චරං වා යදි වා තිට්ඨං 60
චාතුද්දිසො අප්පටිඝො ච හොති 14
චිත්තං මම අස්සවං විමුත්තං 8
චීවරෙ පිණ්ඩපාතෙ ච 100
චුතිං යො වෙදි සත්තානං 198
චුදිතො වචීහි සතිමාභිනන්දෙ 304
චෙතොවිමුත්තිසම්පන්නා 226
චෙතොවිමුත්තිහීනා තෙ 226
චොරොපි කම්මනා හොති 198

ඡ

ඡදනං කත්වාන සුබ්බතානං 30
ඡන්දනිදානානි පියානි ලොකෙ 274
ඡන්දරාගවිරත්තො සො 62
ඡන්දො නු ලොකස්මිං කුතො
නිදානො 274
ඡස්සු ලොකො සමුප්පන්නො 52
ඡින්දෙව නො විචිකිච්ඡං බ්‍රෑහි
මෙතං 104
ඡෙත්වා ආසවානි ආලයානි 162
ඡෙත්වා නද්ධිං වරත්තං ච 192

ජ

ජහිත්වා ජාති මරණං අසෙසං 148
ජාතිත්ථද්ධො ධනත්ථද්ධො 34
ජාතිමරණ සංසාරං 228
ජාතිං ගොත්තං ච ලක්ඛණං 310
ජානාමි පස්සාමි තථෙව එතං 286
ජාලෙන ච ඔනහියානා 208




Free Distribution www.aathaapi.org

# ගාථාදිපාද සූචි


**ජ**

පිටඅඞ්කා

ජිණ්ණස්ස මෙ දුබ්බලථාමකස්ස 350
ජිණ්ණොහමස්මි අබලො
වීතවණ්ණො 344

**ඣ**

ඣායිං විරජමාසීනං 340
ඣායී න පාදලොලස්ස 290

**ත**

තං චාහං අභිනන්දාමි 322
තණ්ඩුලං සයනං වත්ථං 90
තණ්හක්ඛයං පත්ථයං අප්පමත්තො
20
තණ්හා දුතියො පුරිසො 232
තණ්හාධිපන්නා මනුජෙ පෙක්ඛ
මානො 346
තතො අදින්නං පරිවජ්ජයෙය්‍ය 118
තතො ආමගන්ධී සිරස්ස 308
තතො කීටෙ පටඞ්ගෙ ච 188
තතො කුමාරං ජලිතංව
සුවණ්ණං 214
තතො ච දෙවා පිතරො 92
තතො ච පක්ඛස්සුපවස්සු
පොසථං 120
තතො ච පාතො උපවුත්ථු
පොසථො 120
තතො ච රාජා සඤ්ඤත්තො 92
තතො පලාපෙ වාහෙථ 86
තතො පක්ඛී පි ජානාථ 190
තතො මච්ඡෙපි ජානාථ 190
තතො රත්‍යා විවසනෙ 220
තතො වෙදෙන මහතා 314
තත්ථ සික්ඛානුගීයන්ති 296
තථෙව ධම්මං අවිභාවයිත්වා 96

**ත**

පිටඅඞ්කා

තදට්ඨී කත්වාන නිසම්ම ධීරො 94
තදමිනාපි විජානාථ 42
තදූභයානි විචෙය්‍ය පණ්ඩරානි 160
තපෙන බ්‍රහ්මචරියෙන 200
තපො ච බ්‍රහ්මචරියං ච 82
තමද්දසා බිම්බිසාරො 122
තමූපනිස්සාය ජිගුච්ඡිතං වා 284
තමෙනං බාවරී දිස්වා 306
තමෙව භාසං භාසෙය්‍ය 132
තමොනුදො බුද්ධො–
සමන්තචක්ඛු 348
තයො රොගා පුරෙ ආසුං 92
තසිතො වුදකං සීතං 312
තස්මා අරහතො සුත්වා 184
තස්මා උපාදානක්ඛයා 232
තස්මා ජන්තු සදා සතො 242
තස්මාතිහ ත්වං–
බ්‍රාහ්මණ අඤ්ඤෙන 136
තස්මා හි පිණ්ඩ–
සයනාසනෙ ච 116
තස්මා භවෙ සප්පුරිසං භජෙථ 96
තස්මා හි භූතා–
නිසාමෙථ සබ්බෙ 68
තස්මා හි සික්ඛෙථ–
ඉධෙව ජන්තු 244
තස්ස චෙ කාමයානස්ස 242
තස්ස මෙවං විහරතො 128
තස්ස සොකපරෙතස්ස 130
තස්ස තෙ නාග නාගස්ස 164
තස්සං ජප්පං පරිදෙවං පදෙසං 98
තස්සීධ දිට්ඨෙව–
සුතෙ මුතෙ වා 254
තස්සෙව උපනිස්සාය 306
තස්සෙසො දුල්ලභො ලොකෙ 310




Free Distribution www.aathaapi.org

# ගාථාදිපාද සූචි


ත

පිට්ඨඞ්කා

තං වාහං අභිනන්දාමි 326
තං තථාවාදිනං මාරං 126
තං නදීහි විජානාථ 222
තං බුද්ධං අසිතං තාදිං 300
තං බ්‍රූමි උපසන්තොති 270
තං මං පධානපහිතත්තං 126
තං වා'පි ගන්ථං කුසලා වදන්ති 252
තං සද්දං සුත්වා—
තුරිතමවාතරි සො 214
තං සාගතං සක්ක මයම්පි
සබ්බෙ 104
තිට්ඨං චරං නිසින්නො වා 46
තිට්ඨෙව සො තත්ථ
අනානුයායී 328
තිණරුක්ඛෙපි ජානාථ 188
තීහි විජ්ජාහි සම්පන්නො 200
තුවං බුද්ධො තුවං සත්ථා 164, 180
තුවං හි ලොකස්ස සදෙවකස්ස 112
තෙ අප්පමත්තා පහිතත්තා 128
තෙ ගණිතා විදූහි තිලවාහා 212
තෙ ච තත්ථ ධනං ලද්ධා 92
තෙ ච පාපෙසු ධම්මෙසු 42
තෙ චාපි නූන පජහෙයු දුක්ඛං 324
තෙ තත්ථ මන්තෙ ගන්ථෙත්වා 92
තෙ තොසිතා චක්ඛුමතා 348
තෙ න සක්කොම සඤ්ඤාපෙතුං 188
තෙන හාතප්පං කරොහි 324
තෙන හි ත්වං බ්‍රාහ්මණ
ඔදහස්සු සොතං 136
තෙනානුසිට්ඨා හිතමනසෙන
තාදිනා 218
තෙ පෙසිතා රාජදූතා 122
තෙ මයං විචරිස්සාම 54
තෙ වාදකාමා පරිසං විගය්හ 262

ත

පිට්ඨඞ්කා

තෙවිජ්ජානං යදක්ඛාතං 188
තෙ වෙ නාතරිංසු යාජයොගා 320
තෙසං ආසි විපල්ලාසො 90
තෙසං නො ජාතිවාදස්මිං 188
තෙසං ඵස්සපරෙතානං 230
තෙසං බුද්ධො වියාකාසි 348
තෙසං මච්චුපරෙතානං 182
තෙසං වොහං වියාක්ඛිස්සං 188
තොදෙය්‍යකප්පා දුභයො 346
ත්වං ච මෙ ධම්මමක්ඛාහි 334

ථ

ථෙය්‍යං න කරෙය්‍ය න මුසා
භණෙය්‍ය 302

ද

දහරා ච මහන්තා ච 182
දානං ච ධම්මචරියා ච 80
දිට්ඨාපි සුතාපි තෙ ජනා 256
දිට්ඨා ච යෙව අදිට්ඨා 44
දිට්ඨිං ච නිස්සාය
අනුපුච්ඡමානො 266
දිට්ඨිනිවෙසා න හි ස්වාතිවත්තා 248
දිට්ඨිම්පි ලොකස්මිං න
කප්පයෙය්‍ය 254
දිට්ඨිවිසූකානි උපාතිවත්තො 16
දිට්ඨිං ච අනුපගම්ම සීලවා 46
දිට්ඨෙන වෙ සුද්ධි නරස්ස
හොති 250
දිට්ඨෙ සුතෙ සීලවතෙ
මුතෙ වා 280
දිපාදකො යං අසුචි 62
දිසා චතස්සො විදිසා චතස්සො 346
දිස්වා කුමාරං සිඛිමිව
පජ්ජලන්තං 214





Free Distribution www.aathaapi.org

## ද

පිටුඅංකය

දිස්වා ජටී කණ්හසිරිව්හයො ඉසි 214
දිස්වාන තණ්හං අරතිං රගං ච 264
දිස්වාන දෙවෙ මුදිතමනෙ උදග්ගෙ 212
දිස්වාන රූපෙසු විහඤ්ඤමානෙ 314
දිස්වාන වාසූපගතං 124
දිස්වාන සඞ්ඛ්‍ය ඉති මච්චොව අකල්ලො 216
දිස්වා සුවණ්ණස්ස පභස්සරානි 14
දීඝරත්තමනුසයිතං 198
දුක්ඛවෙපක්කං යදත්ථි කම්මං 162
දුක්ඛස්ස වෙ මං පභවං අපුච්ඡසි 322
දුග්ගො මග්ගො පධානාය 126
දුස්සඞ්ගහා පබ්බජිතාපි එකෙ 14
දූරතො ආගතොසි සභිය 154
ද්වාහං සක්කං අපුච්ඡිස්සං 344
ද්විජො යථා කුබ්බනකං පහාය 348

## ධ

ධම්මචරියං බ්‍රහ්මචරියං 84
ධම්මාරාමො ධම්මරතො 98
ධම්මෙ ච යෙ අරියප්පවෙදිතෙ රතා 98
ධම්මෙන මාතා පිතරො භරෙය්‍ය 120
ධීරා ච පජ්ජොතකරා භවන්ති 104
ධොතකො උපසීවො ච 310
ධොනස්ස හි නත්ථි කුහිංචි ලොකෙ 248
ධොනො න හි තෙන මඤ්ඤති 258

## න

න ආමගන්ධො මම කප්පමෙති 74
න කප්පයන්ති න පුරෙක්ඛරොන්ති 252, 254

## න

පිටුඅංකය

න කෙසෙහි න සීසෙන 190
නක්ඛත්තානං මුඛං චන්දො 178
න ගීවාය න අංසෙහි 190
න ච කත්ථිකො සියා භික්ඛු 292
න ච ඛුද්දං සමාචරෙ 44
න චාහමෙතං තථියන්ති බ්‍රූමි 278
න චාහං බ්‍රාහ්මණං බ්‍රූමි 192
න ජච්චා බ්‍රාහ්මණො හොති 198
න ජච්චා වසලො හොති 42
න තස්ස පුත්තා පසවො 270
නත්ථි වසා නත්ථි ධෙනුපා 8
න දිට්ඨියා න සුතියා න ඤාණෙන 266, 330
නදීනම්පි සොතානි 126
න නං ජාති නිවාරෙති 42
නන්දති පුත්තෙහි පුත්තිමා 10
නන්දිසංයොජනො ලොකො 342
න පරො පරං නිකුබ්බෙථ 46
න පසූ බ්‍රාහ්මණානාසුං 88
න පාද න විසාණෙන 92
න බ්‍රාහ්මණස්ස පරනෙය්‍යමත්ථි 286
න බ්‍රාහ්මණා අඤ්ඤමගමුං 88
න බ්‍රාහ්මණා කප්පමුපෙති සඞ්ඛං 286
න බ්‍රාහ්මණො අඤ්ඤතො සුද්ධිමාහ 250
න බ්‍රාහ්මණො නොම්හි න රාජපුත්තො 134
න මච්ඡමංසං නානාසකත්තං 76
නමුචී කරුණං වාචං 126
න මුනි ගාමමාගම්ම 220
න මෙ දිට්ඨො ඉතො පුබ්බෙ 300
නමො තෙ පුරිසාජඤ්ඤ 164
නරස්ස හි සුජාතස්ස 174




Free Distribution www.aathaapi.org

න

පිටය්ඞකා

න වෙදගූ දිට්ඨියා න මුතියා 268
න වෙ විකාලෙ විචරෙය්‍ය භික්ඛු 116
න සඤ්ඤසඤ්ඤී න විසඤ්ඤසඤ්ඤී 276
න සමෙසු න ධම්මෙසු 298
න සො අදින්නං ආදියති 48
න සො උපධීසු සාරමෙති 108
න සො මිත්තො යො සදා අප්පමත්තො 78
න සො මුද්ධං පජානාති 308
න සො රජ්ජති කාමෙසු 48
න හත්ථෙහි න පාදෙහි 190
න හි නස්සති කස්සචි කම්මං 208
න හි රුණ්ණෙන සොකෙන 184
න හි වග්ගූ වදන්ති වදන්තා 208
න හි සො උපක්කමො අත්ථි 182
නහෙව සච්චානි බහූනි නානා 280
නාගොව යූථානි විවජ්ජයිත්වා 16
නානා ජනා ජනපදෙහි සඞ්ගතා 340
නානා රත්තෙහි වත්ථෙහි 88
නාමඤ්ච රූපඤ්ච පටිච්ච ඵස්සා 276
නාහං අභිණ්හ සංවාසා 100
නාහං තම්හා විප්පවසාමි 350
නාහං හතකොස්මි කස්සචි 8
නාහං සබ්බෙ සමණබ්‍රාහ්මණාසෙ 332
නාහං සහිස්සාමි පමොචනාය 326
නිග්‍රොධකප්පො ඉති තස්ස නාමං 104
නිද්දං තන්දිං සහෙ ථීනං 296
නිද්දං න බහුලීකරෙය්‍ය 292
නිද්දසීලී සභාසීලී 32
නිධාය දණ්ඩං භූතෙසු 194
නිද්දය නප්පවෙධෙය්‍ය 292
නිහන්තඤ්ච ඵලඤ්ච පූරයන්තා 10

න

පිටය්ඞකා

නිනහාය සබ්බපාපානි 158
නිමිත්තං පරිවජ්ජෙති 102
නිරාසත්ති අනාගතෙ 270
නිරාසසො සො උද ආසසානො 336
නිල්ලොලුප්පො නික්කුහො නිප්පිපාසො 16
නිවිස්සවාදී න හි සුබ්බිනායො 286
නිවෙසනං යො මනසො අහාසි 138
නිවෙසනානි රම්මානි 92
නිසජ්ජ රාජා සම්මොදි 124
නො වෙ කිර දිට්ඨියා න සුතියා න ඤාණෙන 266
නො වෙ ලභෙථ නිපකං සහායං 14
නො වෙ හි ජාතු පුරිසො කිලෙසෙ 104

ප

පකප්පිතා සඞ්ඛතා යස්ස ධම්මා 248
පක්කොදනො දුද්ධඛීරොහමස්මි 6
පඩෙන සයානො පරිළන්ද මානො 350
පගාළ්හා එත්ථ න දිස්සන්ති 128
පච්චත්තං ච සරීරෙසු 190
පච්චෙකගණිනො සබ්බෙ 310
පජ්ජෙන කතෙන අත්තනා 156
පඤ්චකාමගුණා ලොකෙ 52
පඤ්චකාමගුණෙ හිත්වා 100
පඤ්චන්නං ධීරො භයානං න භායෙ 302
පඤ්චමී ථීනමිද්ධං තෙ 128
පඤ්ඤං පුරක්ඛත්වා කල්‍යාණපීති 304

# ගාථාදිපාද සූචි


ප

පිටුඅංකය

පඤ්ඤා චෙව සතී චෙව 316
පඤ්ඤාබලං සීලවතූපපන්නං 64
පටිග්ගහෙත්වා පන සක්‍යපුඞ්ගවං 216
පටිසල්ලානං ඣානමරිඤ්චමානො 20
පණ්ඩිතොති සමඤ්ඤාතො 260
පතිරූපකාරී ධුරවා 58
පතිරූපදෙසවාසො ච 80
පතිලීනචරස්ස භික්ඛුනො 256
පතිලීනො අකුහකො 270
පත්ථයමානස්ස හි ජප්පිතානි 284
පබ්බජ්ජං කිත්තයිස්සාමි 122
පබ්බජිත්වාන කායෙන 122
පමාදෙ රජො පමාදෙ 100
පරධම්මිකානම්පි න සන්තසෙය්‍ය 302
පරමන්ති දිට්ඨීසු පරිබ්බසානො 252
පරමං පරමන්ති යොධ ඤත්වා 30
පරස්ස චෙ වම්භයිතෙන හීනො 286
පරස්ස චෙ හි වචසා නිහීනො 280
පරස්ස චෙ ධම්මමනානුජානං 278
පරාභවන්තං පුරිසං 32
පරිදෙවයමානො චෙ 182
පරිදෙවං පජ්ජපඤ්ච 184
පරිපුණ්ණකායො සුරුචි 174
පරොවරා යස්ස සමෙච්ච ධම්මා 140
පරොවරං අරියධම්මං විදිත්වා 106
පවිවෙකරසං පීත්වා 78
පසන්නනෙත්තො සුමුඛො 174
පසංසිතො වා පන තත්ථ හොති 262
පස්ස ධම්මං දුරාජානං 240
පස්සං නරො දක්ඛිති නාමරූපං 286
පස්සාමහං දෙවමනුස්ස ලොකෙ 326

ප

පිටුඅංකය

පස්සාමි නං මනසා චක්ඛුනා ච 350
පස්සාමි ලොකෙ පරිඵන්දමානං 244
පස්සාමි සුද්ධං පරමං අරොගං 248
පහානං කාමච්ඡන්දානං 340
පහාය පඤ්චාවරණානි චෙතසො 20
පහීන ජාති මරණං අසෙසං 106
පහීන මලමොහස්ස 348
පහූතවිත්තො පුරිසො 34
පාණං න හානෙ න ච ඝාතයෙය්‍ය 118
පාණං න හානෙ න ච දින්නමාදියෙ 120
පාණාතිපාතො වධච්ඡෙද බන්ධනං 74
පාදූදරෙපි ජානාථ 190
පාපං සහායං පරිවජ්ජයෙථ 16
පාමුජ්ජකරණං ඨානං 78
පාරායනමනුගායිස්සං 348
පාවඤ්ච භොගනගරං 312
පිණ්ඩචාරං චරිත්වාන 124
පිණ්ඩඤ්ච භික්ඛු සමයෙන ලද්ධා 116
පිණ්ඩං විහාරං සයනාසනඤ්ච 116
පියවාචමෙව භාසෙය්‍ය 132
පියා පහූතා කලහා විවාද 272
පියා සු ලොකස්මිං කුතො නිදානා 272
පුච්ඡන්ති චෙ භො බ්‍රාහ්මණා බ්‍රාහ්මණෙහි 134
පුච්ඡ මං සභිය පඤ්හං 154
පුච්ඡං හි කිඤ්චි අසුණන්තො 314
පුච්ඡාමහං ගොතමං වදඤ්ඤුං 144
පුච්ඡාමි තං ආදිච්චබන්ධුං 288





Free Distribution www.aathaapi.org

# ගාථාදිපාද සූචි


## ප

පිටඅංකය

පුච්ඡාමි තං ගොතම භූරිපඤ්ඤ 112
පුච්ඡාමි තං භගවා බ්‍රෑහි මෙතං 320
පුච්ඡාමි මුනිං පහූතපඤ්ඤං 28, 108
පුච්ඡාමි සත්ථාරං අනොම
පඤ්ඤං 102
පුණ්ඩරිකං යථා වග්ගු 164
පුත්තඤ්ච දරං පිතරඤ්ච මාතරං 18
පුබ්බාසවෙ හිත්වා නවෙ අකුබ්බං
288
පුබ්බෙ නිවාසං යො වෙදී 198
පුරා කපිලවත්ථුම්හා 308
පුරාණං නාභිනන්දෙය්‍ය 296
පුරිමං පහාය අපරං සිතා සෙ 250
පුරිසස්ස හි ජාතස්ස 206
පුළවාවසිතෙ සලිලස්මිං 210
පෙක්ඛතං යෙව ඤාතීනං 182

## ඵ

ඵන්දමානං පජං දිස්වා 294
ඵලානමිව පක්කානං 182
ඵස්සනිදානං සාතං අසාතං 274
ඵස්සෙන යදා ඵුට්ඨස්ස 290
ඵස්සො නු ලොකස්මිං කුතො
නිදානො 276
ඵුට්ඨස්ස ලොකධම්මෙහි 82

## බ

බද්ධා හි භිසි සුසඞ්ඛතා 6
බහුස්සුතං ධම්මධරං භජෙථ 18
බහූ දෙවා මනුස්සා ච 80
බාවරි බ්‍රාහ්මණො භොතො 314
බාවරිස්ස වචො සුත්වා 310
බාවරිස්ස ච තුය්හං වා 314

## බ

පිටඅංකය

බාවරිං අභිවාදෙත්වා 310
බාහිත්වා සබ්බපාපානි 158
බාහුසච්චං ච සිප්පං ච 80
බුද්ධො භවං අරහති පූරළාසං 142
බුද්ධොති ඝොසං යදපරතො
සුණාසි 216
බුද්ධො සො භගවා ලොකෙ 308
බ්‍රහ්මචරියඤ්ච සීලඤ්ච 90
බ්‍රහ්මභූතං අතිතුලං 178
බ්‍රහ්මභූතො අතිතුලො 176
බ්‍රාහ්මණා නියතා ඉමෙ 178

## භ

භජන්ති සෙවන්ති ච කාරණත්ථා 22
භද්‍රාවුධො උදයො ච 310
භවරාගපරෙතෙහි 240
භගවා තම්හි සමයෙ 312
භගවාහි කාමෙ අභිභුය්‍ය ඉරියති 338
භවාභවෙ යස්ස වචීබරා ච 138
භික්ඛවො තිසතා ඉමෙ 180
භික්ඛුනො විජිගුච්ඡානො 300
භූකුටිං විනයිත්වාන 142
භොති චරහි ජානාති 308

## ම

මජ්ජඤ්ච පානං න සමාචරෙය්‍ය 118
මජ්ඣෙ යථා සමුද්දස්ස 290
මජ්ඣෙ සරස්මිං තිට්ඨතං 336
මද හි පාපානි කරොන්ති බාලා 118
මනො චස්ස සුපණිහිතො 48
මමඤ්ච ආයු න
චිරමිධාවසෙසො 216
මමායිතෙ පස්සථ ඵන්දමානෙ 244
මයා පවත්තිතං චක්කං 176




Free Distribution www.aathaapi.org

# ගාථාදිපාද සූචි


## ම

පිටුඅංකය

මරණෙනපි තං පහීයති 256
මහායඤ්ඤං යජිත්වාන 306
මා ජාතිං පුච්ඡ චරණඤ්ච පුච්ඡ 136
මාතා පිතු උපට්ඨානං 80
මාතා යථා නියං පුත්තං 46
මාලං න ධාරෙ න ච
ගන්ධමාචරෙ 120
මිගා අරඤ්ඤම්හි යථා අබද්ධො 12
මිත්තෙ භජස්සු කල්‍යාණෙ 100
මිත්තෙ සුභජෙජ්
අනුකම්පමානො 12
මුඛදුග්ගවිභූත අනරිය 208
මුඛං ජිව්හාය ඡාදෙති 314
මුද්ධං මුද්ධාධිපාතඤ්ච 314
මුනිං චරන්තං විරතං මෙථුනස්මා 66
මුසා ච සො න භණති 48
මූලං පපඤ්ච සඞ්ඛාය 288
මෙත්තඤ්ච සබ්බලොකස්මිං 46
මෙත්තං උපෙක්ඛං කරුණං
විමුත්තිං 22
මෙථුනමනුයුත්තස්ස 258
මෙදවණ්ණං ච පාසාණං 130
මොනෙය්‍යං තෙ උපඤ්ඤිස්සං 218
222
මොසවජ්ජෙ න නියොථ 292, 296
මොහන්තරා යස්ස න සන්ති
කෙචි 140

## ය

යජස්සු යජමානො මාඝාති 150
යඤ්ඤෙ රතාහං භො ගොතම 136
යථා අහං තථා එතෙ 220
යථා අහූ වක්කලි මුත්තසද්ධො 352
යථා ආපො ච පථවී 92

## ය

පිටුඅංකය

යථා ඉදං තථා එතං 62
යථා එතාසු ජාතිසු 190
යථා නරො ආපගං ඔතරිත්වා 96
යථාපි කුම්භකාරස්ස 182
යථාපි නාවං දළ්හමාරුහිත්වා 96
යථා මාතාපිතා භාතා 90
යථාවාදී තථාකාරී 106
යථා සරණමාදිත්තං 184
යථින්දඛීලො පථවිංසිතො සියා 70
යදග්ගතො මජ්ඣතො
සෙසතො වා 66
යදත්තනි පස්සති ආනිසංසං 252
යදත්ථිකං බ්‍රහ්මචරියං අචාරි 106
යදස්සනමානො සුකතං සුනිට්ඨිතං 74
යදා ච සො මතො සෙති 62
යදාපි ආසි අසුරෙහි සඞ්ගමො 212
යදූනකං තං සණති 222
යනෙත්තං නප්පසහති 128
යමස්ස වාදං පරිහීනමාහු 262
යමාහු ධම්මං පරමන්ති එකෙ 284
යමාහු සච්චං තථියන්ති එකෙ 278
යමෙතං පඤ්හං අපුච්ඡි 316
යම්හි න මායා වසති න මානො 138
යසො කිත්තිඤ්ච යා පුබ්බෙ 258
යස්මා හි ධම්මං පුරිසො විජඤ්ඤා 94
යස්මිං කාමා න වසන්ති 334
යස්ස ගතිං න ජානාති 198
යස්ස ච විසතා නත්ථි 222
යස්ස දරථජා න සන්ති කෙචි 6
යස්ස නත්ථි ඉදං මෙති 298
යස්ස නිස්සයතා නත්ථි 270
යස්සන්තරතො න සන්ති කොපා 4
යස්ස පුරෙ ච පච්ඡා ච 198
යස්ස මග්ගං න ජානාසි 182




Free Distribution www.aathaapi.org

**ය**

පිටුඅංකය

යස්ස මඞ්ගලා සමූහතා 108
යස්ස රාගො ච දොසො ච 194
යස්ස වනථා න සන්ති කෙචි 6
යස්ස විතක්කා විධූපිතා 4
යස්ස ලොකෙ සකං නත්ථි 272
යස්සස්සු ලූනානි බන්ධනානි 160
යස්සානුසයා න සන්ති කෙචි 4,110
යස්සාලයා න විජ්ජන්ති 196
යස්සින්ද්‍රියානි භාවිතානි 156
යස්සුභයන්තෙ පණිධී ධ නත්ථි 254
යස්සෙතෙ චතුරො ධම්මා 58
සස්සෙතෙ හොන්ති ගන්ථෙසු 310
යං එවරූපං ජානාථ 86
යං කිඤ්චි දුක්ඛං සම්භොති 228,232
යං කිඤ්චි ධම්මමභිජඤ්ඤා 288
යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා 68
යං කිඤ්චි සම්පජානාසි 322, 326
යං තං අපුච්ඡිම්හ අකිත්තයී නො 276
යං තං සරණමාගම්ම 178
යං තෙසං පකතං ආසි 88
යං පරෙ සුඛතො ආහු 238
යං පුබ්බෙ තං විසොසෙහි 298, 338
යං බුද්ධසෙට්ඨො පරිවණ්ණයී
සුචිං 68
යං බුද්ධො භාසති වාචං 132
යං බ්‍රාහ්මණං වෙදගුං
ආභිජඤ්ඤා 324
යං මෙ කඞ්ඛිතමඤ්ඤාසි 164
යං සමණො බහු භාසති 222
යා උන්නති සාස්ස විඝාතභූමි 262
යා කාචිමා සම්මුතියො පුථුජ්ජා 282
යානි ච තීණි යානි ච සට්ඨි 164
යානි සොතානි ලොකස්මිං 316
යානීධ භූතානි සමාගතානි 68,72

**ය**

පිටුඅංකය

යා මෙ කඞ්ඛා පුරෙ ආසි 164
යාය දෙවා මනුස්සා ච 100
යාව දුක්ඛා නිරයා ඉධ වුත්තා 212
යුත්තො කථායං පරිසාය
මජ්ඣෙ 262
යුවා ච දහරො චාසි 124
යෙ අත්තදීපා විචරන්ති
ලොකෙ 148
යෙ අරියසච්චානි විභාවයන්ති 70
යෙ ඉධ කාමෙසු අසඤ්ඤතා
ජනා 74
යෙ ඉධ පාණෙසු අසඤ්ඤතා
ජනා 76
යෙ කාමෙ හිත්වා අභිභුය්‍යචාරි 138
යෙ කාමෙ හිත්වා අගහා
චරන්ති 136, 148
යෙ කෙචිගන්ථා ඉධ
මොහමග්ගා 104
යෙ කෙචි පාණභූතත්ථි 44
යෙ කෙචි මෙ ඉසයො
මනුජා 318, 320
යෙ කෙචිමෙ තිත්ථියා වාදසීලා 114
යෙ කෙචිමෙ දිට්ඨි
පරිබ්බසානො 282
යෙ කෙචිමෙ සමණබ්‍රාහ්මණා
සෙ 330, 332
යෙ ච අසන්තා විචරන්ති 146
යෙ ච දුක්ඛං පජානන්ති 226
යෙ ච එස්සං පටිඤ්ඤාය 230
යෙ ච රූපූපගා සත්තා 236
යෙ ච රූපෙ පරිඤ්ඤාය 236
යෙ ච සඞ්ඛාතධම්මාසෙ 316
යෙ දිට්ඨිමුග්ගය්හ විවාදයන්ති 264
යෙ දුක්ඛං නප්පජානන්ති 224



Free Distribution www.aathaapi.org

ය

පිට්ඨඞ්කො

යෙන නං වජ්ජු පුථුජ්ජනා 272
යෙන යෙන හි මඤ්ඤන්ති 184,236
යෙන සල්ලෙන ඔතිණ්ණො 294
යෙ නං පජානන්ති යතො
නිදානං 84
යෙනෙව බාලොති පරං දහාති 280
යෙ පාපසීලා ඉණඝාතසූචකා 76
යෙ පුග්ගලා අට්ඨ සතං පසත්ථා 68
යෙ මෙ පුබ්බෙ ව්‍යාකංසු 334,348
යෙ වීතරාගා සුසමාහිතින්ද්‍රියා 136
148
යෙ ලුද්දකා දාරුණා පිට්ඨිමංසිකා 74
යෙ සබ්බසංයොජන
විප්පමුත්තා 146
යෙ සබ්බසංයොජන
බන්ධනච්ඡිදා 146
යෙසං තණ්හා නත්ථි කුහිඤ්චි
ලොකෙ 146
යෙසං වො දුල්ලභො ලොකෙ 176
යෙසු න මායා වසති න මානො 146
යෙ සුප්පයුත්තා මනසා
දළ්හෙන 70
යෙහි විවිත්තො විචරෙය්‍ය
ලොකෙ 268
යෙ හෙතු ජානන්ති යථා
යථා ඉදං 148
යො අත්තනාත්තානං නානුපස්සී 140
යො අත්තනො සීලවතානි
ජන්තු 246
යො අත්තහෙතු න පරහෙතු 38
යො අතීතං ආදියති 342
යො අත්ථං පුච්ඡිතො සන්තො 40
යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති 206

ය

පිට්ඨඞ්කො

යො ඉධ චරණෙසු
පත්තිපත්තො 162
යො ඉමං පලිපථං දුග්ගං 196
යො උප්පතිතං විනෙති කොධං 2
යො කත්වා පාපකං කම්මං 40
යො කාමෙ පරිවජ්ජෙති 242
යො ගාහණෙ
ථම්භොරිවාභිජායති 61
යො ච ඨානං සමං යුත්තො 222
යො චත්තානං සමුක්කංසෙ 40
යො ජාතමුච්ඡිජ්ජ න
රොපයෙය්‍ය 62
යො ඤාතීනං සඛානං වා 38
යො තණ්හමුච්ඡිද අසෙසං 2
යො තිණ්ණකථංකථො
විසල්ලො 30
යො තෙ ධම්මමදෙසෙසි 350
යො දුක්ඛස්ස පජානාති 194
යොධ කාමෙ අච්චතරි 298
යොධ කාමෙ පහත්වාන 196
යොධ තණ්හං පහත්වාන 196
යොධ දීඝං ව රස්සං වා 194
යොධ පුඤ්ඤං ච පාපං ච 196
යො ධම්මපදෙ සුභාසිතෙ 30
යො නාච්චසාරී න පච්චසාරී 4
යො නාජ්ඣගමා භවෙසු සාරං 2
යො නින්දියං පසංසති 206
යො නීවරණෙ පහාය පඤ්ච 6
යො නෙසං පරමො ආසි 90
යො බුද්ධං පරිභාසති 40
යො බ්‍රාහ්මණං වා
සමණං වා 32, 40
යො මං ඉච්ඡති අඤ්ඤාතු 178




Free Distribution www.aathaapi.org

ය

පිට්ඨඞ්කා

යො මාතරං වා පිතරං වා 32, 38, 40
යො මානමුදබ්බධි අසෙසං 2
යො මෙ ධම්මමදෙසෙසි 350
යො යජති තිවිධං පුඤ්ඤසම්පදං 150
යො යාචයොගො දානපති ගහට්ඨො 144, 146, 150
යො රාගමුදච්ඡිදා අසෙසං 2
යො ලොභගුණෙ අනුයුත්තො 208
යො වන්දති මං න උත්තමෙය්‍ය 110
යො වීතරාගො පවිනෙය්‍ය දොසං 150
යො වෙ අනරහා සන්තො 40
යො වෙ අවිද්වා උපධිං කරොති 322
යො වෙ කිඤ්චික්ඛකම්‍යතා 38
යො වෙ ඨිතත්තො තසරං ව උජ්ජුං 66
යො වෙදගූ ඤාණරතො සතීමා 148
යො වෙ න තණ්හාසු උපාතිවත්තො 146
යො වෙ පරකුලං ගන්ත්වා 40
යො වෙ මුඛරජාතිකො 84
යො සඤ්ඤතත්තො න කරොති පාපං 66
යො හත්ථී පරිරුන්ධති 38
යො හවෙ ඉණමාදාය 38
යො හි කොචි මනුස්සෙසු 190, 192

ර

රජමාකිරසි අහිතාය 208
රතී ච ගණ්ඩා ච උපද්දවා ච 16
රට්ඨෙ වා ජඤ්ඤසංයුත්තෙ 90
රාගඤ්ච දොසඤ්ච පහාය මොහං 22, 146

ර

පිට්ඨඞ්කා

රාගං විනයෙථ මානුසෙසු 108
රාගො ච දොසො ච ඉතොනිදානා 84
රාගො ච දොසො ච කුතොනිදානා 84
රාජා අරහසි භවිතුං 176
රාජාපි තං වෙස්සවණො කුවෙරො 114
රාජාහමස්මි සෙල 176
රිත්තස්ස මුනිනො චරතො 260
රූපා ච සද්ද ච රසා ච ගන්ධා 116
රූපා සද්ද රසා ගන්ධා 238
රූපෙසු ගෙධං අකරං අලොලො 20
රොසකො කදරියො ච 40

ල

ලක්ඛණානං පවිචයං 312
ලක්ඛණෙ ඉතිහාසෙ ච 312
ලාභකම්‍යා න සික්ඛති 270
ලාභො වත නො අනප්පකො 10
ලාභො සිලොකො සක්කාරො 128
ලොභඤ්ච භවඤ්ච විප්පහාය 110
ලොහිතෙ සුස්සමානම්හි 126

ව

වචසා මනසා කම්මුනා ච 108
වදන්ති වෙ දුට්ඨමනාපි එකෙ 246
වනප්පගුම්බෙ යථා ඵුස්සිතග්ගෙ 72
වරො වරඤ්ඤූ වරදො වරාහරො 72
වසිං කරිත්වා සඞ්කප්පං 128
වංසො විසාලොව යථා විසත්තො 12
වාදං හි එකෙ පටිසෙනියන්ති 116




Free Distribution www.aathaapi.org

ව

පිට්ඨඞ්කා

වාරි පොක්ඛරපත්තෙව 194
විජිගුච්ඡමානස්ස යදිදං ඵාසු 302
විජ්ජාය චෙව සම්පන්නො 50
විඤ්ඤාණට්ඨිතියො සබ්බා 342
විඤ්ඤාතසාරානි සුභාසිතානි 98
විද්වා ච යො වෙදගූ නරො ඉධ 324
විනයස්සු මයි කඞ්ඛං 176
විනිච්ඡයෙ ඨත්වා සයං පමාය 282
විනිච්ඡයා යානි පකප්පිතානි 266
විනිපාතං සමාපන්නා 86
විපිට්ඨි කත්වාන පෙසුනානි 108
විපිට්ඨිකත්වාන සුඛං දුඛඤ්ච 20
විභූතරූපසඤ්ඤිස්ස 342
විරත්තො කාමසඤ්ඤාය 52
විරතො ඉධ සබ්බපාපකානි 160
විරතො මෙථුනා ධම්මා 218
විරියං මෙ ධුරධොරය්හං 24
විවෙකං යෙව සික්ඛෙථ 260
විසජ්ජ ගන්ථානි මුනීධ ලොකෙ 238
විසෙනිකත්වා පන යෙ චරන්ති 264
විහෙසං භාවිතත්තානං 86
වීතගෙධො අමච්ඡරී 272
වීතතණ්හො පුරාභෙද 268
වීසං වස්සසතං ආයු 312
වෙදානි විචෙය්‍ය කෙවලානි 160

ස

සකං හි දිට්ඨිං කථමච්චයෙය්‍ය 246
සකං හි ධම්මං පරිපුණ්ණමාහු 284
සකායනෙවාපි දළ්හං වදානො 282
සඞ්ඛත්වප්පහි පරෙත්තො සො 258
සඞ්ඛාය ලොකස්මිං පරොවරානි 320
සඞ්ඛාය වත්ථූනි පහාය බීජං 64
සඞ්ගාතිගො යස්ස න සන්ති සඞ්ගා 138

ස

පිට්ඨඞ්කා

සඞ්ගා එසො පරිඤ්ඤමෙත්ථ සොඛ්‍යං 18
සඞ්ඝාටිවාසී අගහො චරාමි 134
සචෙපි සො සල්ලපෙ යාවකෙන 116
සචෙ මුනි බෲසි අනොඝතිණ්ණා 332
සචෙ ලභෙථ නිපකං සහායං 14
සචෙ චුතො සීලවතතො හොති 284
සචෙ අගාරං අජ්ඣාවසති 310
සචෙ මෙ යාචමානස්ස 306
සච්චන්ති සො බ්‍රාහ්මණො කිං වදෙය්‍ය 266
සච්චං වෙ අමතා වාචා 132
සච්චා අවොක්කම්ම මුනි 296
සච්චෙන දන්තො දමසා උපෙතො 136
සච්චො සියා අප්පගබ්භො 296
සඣානපසුතො ධීරො 220
සඤ්ඤං පරිඤ්ඤා විතරෙය්‍ය ඔඝං 246
සඤ්ඤාවිරත්තස්ස න සන්ති ගන්ථා 268
සඤ්ඤොජනං ජාතිඛයන්තදස්සී 140
සතං ච විවටං හොති 240
සතං සහස්සානං නිරබ්බුදානං 206
සත්තවස්සානි භගවන්තං 130
සත්තො ගුහායං බහුනාභි ඡන්නො 244
සදෙවකස්ස ලොකස්ස 238, 300
සද්දහානො අරහතං 58
සද්ධා ච පීති ච මනො සති ච 350
සද්ධා බීජං තපො වුට්ඨි 24
සද්ධාය තරති ඔඝං 58



Free Distribution www.aathaapi.org

**ස**

පිටුඅංකය

සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං 56
සද්ධා සුතවා නියාමදස්සී 110
සද්ධම්මපූජා ච පනා තථෙව 286
සන්ති ලොකෙ මුනයො 330
සන්තුස්සකො ච සුභරො ච 44
සන්තො ච භික්ඛු අභිනිබ්බුතත්තො 246
සන්ථවාතො භයං ජාතං 62
සන්දාලයිත්වාන සංයොජනානි 18
සන්දිට්ඨියා චෙව නවෙවදතා 278
සපත්තපාණී විචරන්තො 220
සපදානං චරමානො 122
ස පිණ්ඩචාරං චරිත්වා 220
සබ්බත්ථ උපෙක්ඛකො සතීමා 156
සබ්බත්ථ මුනි අනිස්සිතො 256
සබ්බදා සීලසම්පන්නො 52
සබ්බසංයොජනං ඡෙත්වා 192
සබ්බං තුවං ඤාණමවෙච්ච ධම්මං 114
සබ්බසො නාමරූපස්මිං 298, 338
සබ්බාභිභුං සබ්බවිදුං සුමෙධං 64
සබ්බෙ'පිමෙ භික්ඛවො නිසින්නා 114
සබ්බෙ සමග්ගා හුත්වාන 86
සබ්බෙසු කාමෙසු සො වීතරාගො 328
සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං 12
සභග්ගතො වා පරිසග්ගතො වා 118
සමඤ්ඤා හෙසා ලොකස්මිං 198
සමන්තමසාරො ලොකො 294
සමන්තා ධජිනිං දිස්වා 108
සමානභාගං කුබ්බෙථ 218

**ස**

පිටුඅංකය

සමාහිතො යො උදතාරි ඔඝං 138
සමිතාවිනො වීතරාගා අකොපා 148
සමිතාවී පහාය පුඤ්ඤපාපං 158
සමො විසෙසී උදවා විහීනො 266
සමො සමෙහි විසමෙහි දූරෙ 138
සම්පන්නවෙය්‍යාකරණං තථෙදං 106
සම්පන්නො මුනිනො චිත්තං 58
සම්බාධො'යං ඝරාවාසො 122
සම්බුද්ධෙන කතොකාසො 314
සම්බුද්ධොති වචො සුත්වා 308
සම්බුද්ධො පටිජානාසි 176
සම්බොධියග්ගං ඵුසිතායං කුමාරො 216
සම්මද්දසා වෙදගුනො 228
සයං සමාදය වතානි ජන්තු 250
ස යානභූමිං යායිත්වා 124
සවන්ති සබ්බධි සොතා 316
ස වෙ විද්වා ස වෙදගූ 296
ස සබ්බධම්මෙසු විසෙනිභූතො 250, 288
සහස්සභාගො මරණස්ස 126
සභාවස්ස දස්සනසම්පදාය 70
සංවුතො පාතිමොක්ඛස්මිං 100
සංසග්ගරාගස්ස භවන්ති ස්නෙහා 12
සංසුද්ධජිනො විවත්තච්ඡද්දො 110
සාතං අසාතඤ්ච කුතො නිදානා 274
සාතියෙසු අනස්සාවී 270
සාධාහං භගවා තථා විජඤ්ඤං 142
සාමාකචිඞ්ගූලක චීනකානි ච 74
සාරම්භා යස්ස විගතා 142



Free Distribution www.aathaapi.org

ස

පිට්ඨඞ්කා

සාරුප්පමත්තනො විදිත්වා 110
සාවත්ථියං කොසල මන්දිරෙ ජිනො 308
සිඛී යථා නීලගීවො විහඞ්ගමො 66
සිඞ්ඝානිකාය ඛෙළස්ස 60
සීතඤ්ච උණ්හඤ්ච ඛුදං පිපාසං 16
සීමන්තානං විනෙතාරං 142
සීමාතිගො බ්‍රාහ්මණො තස්ස නත්ථි 252
සීලබ්බතං වාපි පහාය සබ්බං 284
සීලුත්තමා සඤ්ඤමෙනාහු සුද්ධිං 284
සීහංවෙකචරං නාගං 50
සීහො යථා දාඨබලී පසය්හ 22
සීහො ච සද්දෙසු අසන්තසන්තො 20
සුඛන්ති දිට්ඨමරියෙහි 238
සුඛං වා යදි වා දුක්ඛං 230
සුඛිතො බාවරී හොතු 314
සුඛුමාලා මහාකායා 90
සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු 344
සුණාථ මෙ භික්ඛවො සාවයාමි වො 114
සුත්වාන ඝොසං ජිනවරචක්ක-මත්තනො 218
සුත්වාන දූතවචනං 124
සුත්වාන බුද්ධවචනං 62
සුත්වාන බුද්ධස්ස සුභාසිතං පදං 78
සුත්වානහං වීර අකාමකාමිං 338
සුත්වා රුසිතො බහුං වාචං 292
සුත්වා සබ්බධම්මං අභිඤ්ඤාය 162
සුදිට්ඨං වත නො අජ්ජ 54
සුද්ධා සුද්ධෙහි සංවාසං 86
සුපිනෙන යථාපි සඞ්ගතං 256
සුභාසිතං උත්තමමාහු සන්තො 130
සුවිජානො භවං හොති 32
සූරො යථා රාජඛාදාය දුට්ඨො 262

ස

පිට්ඨඞ්කා

සෙය්‍යො න තෙන මඤ්ඤෙය්‍ය 290
සෙලෙන්ති ගායන්ති ච වාදයන්ති 212
සෙහි දරෙහි සන්තුට්ඨො 34
සො අස්සකස්ස විසයෙ 306
සො අහං විචරිස්සාමි 58
සො උභන්තමභිඤ්ඤාය 318
සොකපරිදෙවමච්ඡරං 256
සොකමප්පජහං ජන්තු 184
සොචති පුත්තෙහි පුත්තිමා 10
සොචන්ති ජනා මමායිතෙ 256
සොතෙසු ගුත්තො විදිතින්ද්‍රියො චරෙ 76
සො දෙවයානමාරුය්හ 42
සො බාවරී අත්තමනො උදග්ගො 308
සො බොධිසත්තො රතනවරො අතුල්‍යො 214
සොභයන්තො 'අනීකග්ගං 124
සො යසං පරමං පත්තො 42
සො සබ්බසත්තුත්තමො අග්ගපුග්ගලො 214
සො සාකියානං විපුලං ජනෙත්වා පීතිං 216
සො හි බ්‍රාහ්මණ සම්බුද්ධො 308
සොණ්හජා අත්තසම්භූතා 84
ස්වාක්ඛාතං බ්‍රහ්මචරියං 178

හ

හිත්වා ඉච්ඡඤ්ච ලොභඤ්ච 220
හිත්වාන පියඤ්ච අප්පියඤ්ච 103
හිත්වා මානුසකං භොගං 196
හිත්වා රතිඤ්ච අරතිඤ්ච 196
හිරිං තරන්තං විජිගුච්ඡමානං 78
හුතඤ්ච මය්හං හුතමත්තනො සච්චං 140




Free Distribution www.aathaapi.org

# සුත්තනිපාතෙ

## සඤ්ඤානාම සූචි


අ

අග්ගාළව 102
අග්ගිකභාරද්වාජ 36
අඞ්ගුත්තරාප 166
අජිත 310, 312, 314, 346
අජිතකෙසකම්බල 152
අටට 206
අනාථපිණ්ඩික 30, 36, 80, 86, 112, 200
අබබ 204
අබ්බුද 204
අසිත 212
අහහ 204
ආදිච්ච 124
ආපණ 166
ආළවක 54
ආළවි 54, 102, 352

ඉ

ඉච්ඡානඞ්ගල 186
ඉන්ද 92, 94, 212, 314

උ

උජ්ජේනි 312
උදය 310, 346
උපසීව 310, 316
උප්පලක 206

එ

එකනාළ 22
එරාවණ 114

ඔ

ඔක්කාක 92, 308

ක

කණ්හ 106
කණ්හසිරි 214
කපිලවත්ථු 308, 312
කප්පායන 106
කලන්දකනිවාප 152
කසිභාරද්වාජ 22
කස්සප 74
කුමුද 206
කුසිනාරා 312
කෙණිය 166
කොකාලික 200
කොසම්බී 312
කොසල 124, 132, 306, 308
කොසලක 86, 204

ග

ගයා 82
ගිජ්ඣකූට 144
ගිරිබ්බජ 122
ගොතම 24, 38, 46, 50, 60, 88, 94, 112, 130, 142, 144, 150, 152, 166, 176, 186, 218, 332, 346, 350, 352
ගොදාවරී 306
ගොනද්ධ 312

ච

චඞ්කී 186




Free Distribution www.aathaapi.org

ජ

ජතුකණ්ණි 310, 346
ජම්බුසණ්ඩ 176

ජා

ජාණුස්සොණි 186
ජෙතවන 30, 36, 80, 86, 112, 130, 200

ට

ටඞ්කිතමඤ්ච 92

ත

තාරුක්ඛ 186
තිස්සමෙත්තෙය්‍ය 310, 346
තොදෙය්‍යකප්ප 310
දක්ඛිණාගිරි 22
දක්ඛිණාපථ 306

ධ

ධනිය 10
ධම්මික 112
ධොතක 310, 346

න

නන්ද 310, 330, 346
නමුචි 126
නාරද 164
නාලක 218
නිගණ්ඨනාතපුත්ත 152
නිග්‍රොධකප්ප 102
නිරබ්බුද 201
නෙරඤ්ජරා 126

ප

පකුධ කච්චායන 152
පණ්ඩව 124
පණ්ඩුකම්බල 214
පතිට්ඨාන 312

ප

පබ්බත 164
පදුම 204
පාවා 312
පාසාණක චෙතිය 312, 346
පිඞ්ගිය 310, 344, 346, 350, 352
පුණ්ඩරීක 206
පුණ්ණක 310, 346, 318
පුබ්බාරාම 224

ප

පූරණකස්සප 152
පොක්ඛරසාති 186
පොසාල 310, 346

බ

බාවරි 306, 310, 314
බිම්බිසාර 122, 170

භ

භද්‍රාවුධ 310, 346, 352
භාරද්වාජ 186, 200
භොගනගර 312

ම

මක්ඛලිගොසාල 152
මගධ 22, 346
මහී 6
මාගධ 312
මාඝ 144, 150
මාතඞ්ග 42
මාර 340
මාහිස්සති 312
මිගාරමාතුපාසාද 224
මූලක 212, 306
මෙත්තගූ 310, 346
මෙරු 212




Free Distribution www.aathaapi.org

ම

මොග්ගල්ලාන 200, 314, 316
මොඝරාජ 310, 344, 346

ර

රාජගහ 122, 144, 152
රාහුල 102

ලු

ලුම්බිනී 114

ව

වක්කලි 352
වඞ්ගීස 102, 122
වනසව්හය 312
වාසෙට්ඨ 186, 200
වෙතරණී 210
වෙදිස 312
වෙසාලි 312
වෙස්සවණ 114
වෙස්සායන 134
වෙළුවන 152

ස

සක්ක 104 200, 212, 326, 328, 344
සක්‍ය 170, 183, 214, 216
සඤ්ජය බෙල්ලට්ඨිපුත්ත 152
සභිය 152, 164
සහම්පති 204
සාකිය 124, 216
සාකෙත 312
සාරිපුත්ත 176, 200
සාවත්ථි 30, 36, 80, 86, 112, 130, 200, 224, 308, 312
සුජම්පති 314
සුද්ධොදන 214
සුන්දරික භාරද්වාජ 132
සුන්දරිකා 132
සූචිලොම 82
සෙතව්‍ය 312
සෙල 170
සොගන්ධික 206
සොපාක 42

හි

හිමවන්ත 124
හෙමක 310, 316



Free Distribution www.aathaapi.org

# සුත්තනිපාත

## විසෙසපදානුක්කමනිකා

අ


| | |
|---|---|
| අකක්කසං | 194 |
| අකම්පමානො | 246 |
| අකලඞ්කරූපො | 216 |
| අකාමො | 140 |
| අකාමකාමිං | 338 |
| අකාලචාරිං | 116 |
| අකුක්කුච්චො | 270 |
| අක්කුට්ඨවන්දිතං | 218 |
| අක්කුසලො | 278 |
| අක්කොධනො | 6 |
| අක්ඛාතාරං | 50 |
| අක්ඛාති | 30 |
| අක්ඛිගූථකො | 60 |
| අක්ඛිස්සං | 308 |
| අක්ඛෙය්‍යං | 256 |
| අක්ඛෙසු | 206 |
| අඛිල | 164 |
| අගෙහො | 134 |
| අගිහං | 144 |
| අග්ගතො | 66 |
| අග්ගිනිසමං | 208 |
| අග්ගිසිඛූපමෙ | 218 |
| අග්ගිහුත්තමුඛා | 178 |
| අග්ගිහුත්තං | 126, 132 |
| අසාවී | 216 |
| අච්චගමා | 4 |
| අච්චන්තසුද්ධි | 252 |
| අච්චයෙය්‍ය | 246 |
| අච්චසාරී | 4 |
| අචරුං | 88 |


අ


| | |
|---|---|
| අචාරිසුං | 88 |
| අච්ඡිරූපසම්පන්නා | 28 |
| අජමහි | 14 |
| අජ්ඣගමා | 2 |
| අජ්ඣත්තචින්තී | 52, 116 |
| අජ්ඣත්තං | 4 |
| අජ්ඣත්ත සන්තිං | 264 |
| අජ්ඣපත්තා | 348 |
| අජ්ඣායක කුලෙ | 42 |
| අජ්ඣෙන කුජ්ජං | 74 |
| අඤ්ඤමොක්ඛා | 244 |
| අඤ්ඤසිතා | 262 |
| අඤ්ඤාණුපක්ඛා | 104 |
| අඤ්ඤ විමොක්ඛං | 340 |
| අට්ටො | 206 |
| අට්ටා | 216 |
| අට්ඨානතං | 16 |
| අට්ඨිකඞ්කාන | 94 |
| අඩ්ඪකුම්භූපමො | 222 |
| අණීකග්ගං | 124 |
| අණුංථූලා | 44 |
| අණුධම්මො | 94 |
| අතාරු | 320 |
| අතික්කන්තා | 48 |
| අතික්කමන්ති | 82 |
| අතිවච | 112, 158 |
| අතිතරිය | 66 |
| අනිකාමයං | 64 |
| අතිතුලො | 176 |
| අතිමඤ්ඤෙති | 34 |




Free Distribution www.aathaapi.org

අ

අතිමඤ්ඤෙථ 46
අතිසාරදිට්ඨියා 280
අතිසිත්වා 236
අතීතයොබ්බනො 34
අතුලෙය්‍යා 28, 214
අත්තදණ්ඩා 294
අත්තදණ්ඩෙසු 194
අත්තදත්ථං 88
අත්තවෙතන භතො 8
අත්තසම්භූතං 84
අත්තානුදිට්ඨිං 814
අත්ථකුසලෙන 44
අත්ථබද්ධා 114
අත්ථං 12
අත්ථංගතස්ස 330
අදූසිකායො 92
අද්දසාම 10
අද්දිට්ඨො 44
අධිමානසා 216
අධිමුච්චෙසු 176
අධොසි 248
අනගාරියුපෙතස්ස 2.8
අනඤ්ඤනෙය්‍යො 16, 108
අනඤ්ඤපොසී 20
අනඤ්ඤාතං 182
අනතිමානී 44
අනත්තගරහී 288
අනත්ථදස්සිං 16
අනනුගිද්ධා 44
අනනුවජ්ජා 130
අනභිජ්ඣිතං 12
අනන්වයං 78
අනරහා 40
අනලංකරිත්වා 18
අනවජ්ජපදනි 30

අ

අනවජ්ජ භොජී 14
අනවජ්ජා 130
අනවස්සුතො 18
අනසනං 92
අනස්සාවී 270
අනාගාරො 194
අනානුගිද්ධා 30
අනානුපුට්ඨො 246
අනාරම්භවිමුත්තිතො 232
අනාලම්බෙ 52
අනාවරණදස්සාවි 310
අනාසයානො 110
අනිකෙතසාරී 268
අනිට්ඨුරී 298
අනිමිත්තං 162, 182
අනිස්සාය 140
අනිඝො 6
අනීතිහං 294
අනුගායිස්සං 318
අනුගිජ්ඣති 242
අනුගිජ්ඣන්ති 296
අනුග්ගහාය 234
අනුඤ්ඤාතපටිඤ්ඤාතා 188
අනුතීරෙ 6
අනුට්ඨානා 32
අනිකෙතං 62
අනුත්ථුනතො 184
අනුත්ථුනාති 262
අනුධම්මං 154
අනුත්තතො 216
අනුපරියගා 130
අනුප්පවෙච්ඡෙය්‍යා 62
අනුබන්ධිංසු 122
අනුරොධවිරොධවිප්පහීනං 108
අනුවිදිතං 160




Free Distribution www.aathaapi.org

## විසෙසපදානුක්කමණිකා


### අ

| | |
|---|---|
| අනුවිලොකෙසි | 132 |
| අනුසයා | 4 |
| අනුස්සදං | 192 |
| අනූපයො | 248 |
| අනෙකසාඛං | 214 |
| අනෙජං | 30 |
| අනොකසාරිං | 194 |
| අනොමනාමිං | 46, 54 |
| අනොම පඤ්ඤං | 102 |
| අනොමවණ්ණං | 214 |
| අනොසිතං | 294 |
| අන්තගූ | 162 |
| අන්තපුරො | 60 |
| අන්තරතො | 4 |
| අන්තරධායථ | 130 |
| අන්ධකමකසා | 6 |
| අන්වායන්ති | 282 |
| අපකස්සථ | 86 |
| අපචිතො | 100 |
| අපචෙවා | 308 |
| අපනමිස්සන්ති | 338 |
| අපනාමෙසි | 82 |
| අපවිද්ධා | 62 |
| අපාහතස්මිං | 262 |
| අපිහාලු | 270 |
| අපුඤ්ඤායතනං | 118 |
| අපුනබ්භවාය | 314, 84 |
| අපුරෙක්ඛරානො | 268 |
| අපෙඛා | 12 |
| අප්පගබ්භා | 44 |
| අප්පවිසො | 14 |
| අප්පතිට්ඨෙ | 52 |
| අප්පදුස්ස | 318 |
| අප්පනිග්ඝොසං | 100 |
| අබබො | 204 |

### අ

| | |
|---|---|
| අබ්බුද | 204 |
| අබ්බූළ්හසල්ලො | 184 |
| අබ්භාසනං | 104 |
| අබ්භමුත්තං | 214 |
| අබ්භාහතො | 182 |
| අබ්භුදීරයි | 216 |
| අබ්භොකාසො | 122 |
| අභික්කන්තදස්සාවිං | 314 |
| අභිජවන්ති | 208 |
| අභිජනෙත්වා | 244 |
| අභිජප්පෙය්‍ය | 290 |
| අභිජ්ඣායිංසු | 90 |
| අභිණ්හසංවාසා | 100 |
| අභිධාවන්ති | 70 |
| අභිනිබ්බුතත්තො | 134 |
| අභිනිබ්බිජ්ජයාථ | 86 |
| අභිනිබ්බුතත්තො | 102 |
| අභිප්පහාරිනී | 128 |
| අභිභුය්‍යචාරී | 22, 138 |
| අභිලෙපනං | 316 |
| අභිවිනෙය | 136 |
| අභිසඞ්ඛාසි | 174 |
| අභිසජ්ජනා | 14 |
| අභිසජ්ජෙය්‍ය | 292 |
| අභිසජෙ | 194 |
| අභිසමෙච්ච | 44 |
| අභිසම්භවිත්වා | 16 |
| අභිසම්භවෙ | 300 |
| අභිහාරං | 220 |
| අභිහාරෙසි | 122, 124 |
| අභොජනෙය්‍යං | 26 |
| අමඤ්ඤිංසු | 88 |
| අමතප්ඵලා | 24 |
| අමතඵලං | 24 |
| අමතොගධං | 194 |

අ

අම්මා 146
අමරා 76
අමූගො 220
අයසූලං 208
අයොසඞ්කුසමාහතට්ඨානං 208
අරිඤ්චමානො 20
අරියගරහී 206
අරියො 36, 162
අරොසනෙය්‍යො 66
අලිකං 130
අලිප්පමානො 20
අලීනචිත්තො 20, 222
අලොලා 8
අවජානති 40
අවදනියා 244
අවංසිරා 76
අවාසරී 214
අවිකත්ථී 270
අවිහෙඨයං 12
අවිවදනා 248
අවෙච්ච ධම්මො 96
අවොක්කම්ම 296
අවහාතං 220
අසජ්ජමානො 12
අසම්ධුරස්ස 216
අසම්පවෙධී 8
අසම්බාධං 46
අසම්භුනන්තො 118
අසංවිදං 298
අසංහීරං 352
අසිපත්තවනං 220
අසිස්සාමි 304
අදූවිකම්මිස්සිතා 74
අසූරො 128
අසනාමාතා 74

අ

අසම්බනා 128
අසස්සවා 8
අස්සාදනා 130
අහතො 204
අභාසි 138

ආ

ආකඞ්ඛයි 56
ආකිණ්ණවරලක්ඛණො 122
ආකිඤ්චඤ්ඤං 306
ආගඤ්ජං 42
ආඝාතෙත්වා 204
ආජවං 296
ආජානමානො 326
ආජානියො 136
ආතංකළිඝන 302
ආතුමානං 246, 290
ආදානගන්ථං 252
ආදානතණ්හං 340
ආදාන සත්තෙ 340
ආදානෙසු 108
ආදිච්චබන්ධුස්ස 16
ආදිසති 248
ආදෙති 38, 298
ආනන්තරිකං 68
ආනඤ්ජාතෙ 212
ආපගං 96
ආභිජ්ජඤ්ඤං 324
ආමගන්ධො 74
ආමන්තනා 12
ආමලකමත්තියො 202
ආයාගො 142
ආයූහති 64
ආරජයා 210
ආරම්මණපච්චයා 232
ආරම්මණානං 232




Free Distribution www.aathaapi.org

# විසෙසපදනුක්කමණිකා


## ආ

ආරා 48
ආරුප්පා 236
ආලයානි 162
ආවරණානි චෙතසො 20
ආවිකරොමි 28
ආසයානො 336
ආසවානි 162
ආහච්ච 222
ආහාරපච්චයා 234
ආහිතො 6
ආහුති 36

## ඉ

ඉඞ්ඝ 58, 272, 28
ඉච්ඡානිදානා 244
ඉජ්ඣෙ 134
ඉඤ්ජනා 60
ඉඤ්ජිතා 318
ඉඤ්ජිතපච්චයා 234
ඉණසාතසූචනා 76
ඉතරීතරෙන 14
ඉතිහීතිහං 334
ඉතොජා 84
ඉත්තරං 236
ඉත්ථම්භාවඤ්ඤථාභාවං 232
ඉත්ථීසොණ්ඩිං 36
ඉද්ධාභිසඞ්ඛාරං 174
ඉරියානො 296
ඉරීයති 338
ඉසිනිසභං 218
ඉසිසත්තම 106
ඉසිවහයෙ 214
ඉසෙ 314
ඉස්සත්ථං 192

## ඊ

ඊසා 24

## උ

උච්චාවචං 250
උදබ්බහී 2
උදරපූරො 60
උද වා 60
උදග්ගචිත්තො 214
උදග්ගො 212
උදච්ඡිද 2
උදබ්බහෙ 182
උදුම්බරෙසු 2
උද්දිට්ඨා 102
උද්ධනානි 168
උද්ධුමාතො 62
උපජීවන්ති 192
උපක්කිලෙසං 218
උපට්ඨිතා 46,228
උපධිසිනිද්ධතා 226,322
උපධීහි 10
උපධීසු 108
උපනාමෙසි 82
උපනාහී 38
උපනිජ්ඣායිතං 236
උපනිබජ්ඣතෙ 66
උපනිසා 224
උපපජ්ජිං 350
උපයො 248
උපරුජ්ඣිය 234
උපරුන්ධෙ 288
උපරොධනා 228
උපසෙවනා 76
උපපත්තිචෙතනා 16,140,146.158,286
උපාදානක්ඛන්ධෙ 140
උපාදානං 52
උපාවිසුං 124




Free Distribution www.aathaapi.org

## උ

| | |
|---|---|
| උපෙති | 66 |
| උපෙස්සං | 10 |
| උප්පතිතං | 2 |
| උප්පලකො | 206 |
| උප්පාතසුපිනා | 108 |
| උභන්තං | 318 |
| උම්මාදනං | 118 |
| උය්‍යුතා | 76 |
| උරගො | 2 |
| උසභො | 8,10 |
| උසූයකං | 94 |
| උස්සදං | 290 |
| උස්සද | 156,240,276 |
| උස්සුස්සති | 306 |
| උස්සෙසු | 272 |

## ඌ

| | |
|---|---|
| ඌනූදරො | 220 |
| ඌමි | 290 |
| ඌහච්ච | 314 |

## එ

| | |
|---|---|
| එකජං | 38 |
| එකාසනස්ස | 222 |
| එජති | 272 |
| එජං | 234 |
| එජානුගා | 250 |
| එණිජඞ්ඝං | 50 |
| එතෙතා | 130 |
| එධිතවා | 90 |
| එරය | 104 |
| එරයිතං | 96 |

## ඔ

| | |
|---|---|
| ඔකං | 268 |
| ඔක්ඛිත්තචක්ඛු | 18 |
| ඔගාහනෙ | 64 |
| ඔඝතිණ්ණං | 54 |
| ඔඝන්තං | 164 |
| ඔඝං | 6 |
| ඔඝාතිගං | 338 |
| ඔතාරං | 130 |
| ඔපිලාපෙසි | 26 |
| ඔමෙසු | 272 |
| ඔනාභියාත | 208 |
| ඔරකෙ | 216 |
| ඔරපාරං | 2 |
| ඔරං | 6 |
| ඔරොපයිත්වා | 14 |
| ඔසධෙහි | 2 |
| ඔසරණානි | 164 |
| ඔස්සජන්ති | 84 |
| ඔභාරයිත්වා | 18 |

## ක

| | |
|---|---|
| කබ්බ ච්ඡිදං | 30 |
| කඛායිතං | 312 |
| කඩ්ඪිතං | 164 |
| කවෙජ | 6 |
| කණ්හාභි ජාතිකො | 178 |
| කථං කථා | 274, 326 |
| කඨොජ්ජං | 262 |
| කප්පයන්ති | 252 |
| කප්පං | 286 |
| කප්පානි | 156 |
| කප්පියො | 288 |
| කමණ්ඩලං | 132 |
| කම්මානං | 52 |
| කම්මනිබන්ධනා | 200 |
| කම්මවිපාකකොවිද | 200 |




Free Distribution www.aathaapi.org

ක

කම්මන්තා 22
කම්මාරපුත්තෙන 14
කයවික්කයෙ 292
කරුණං 126
කලහාභිරතො 86
කලිං 206
කල්‍යරූපො 212
කල්‍යාණදස්සනො 174
කසම්බුං 86
කසසු 24
කසිරං 182
කස්සකො 24
කළායමත්තියො 202
කංසපාතියං 24
කාකොලගණා 210
කාමකාරො 106
කාමයමානස්ස 242
කාමයානස්ස 242
කාමවාහිනං 222
කාමා 16
කායගුත්තා 24
කයවෙය්‍යාවටිකං 168
කාරණ්ඩවං 86
කාසායවාසිං 144
කිඤ්චික්ඛකම්‍යතා 38
කිඤ්චික්ඛං 38, 40
කිබ්බිසකාරී 208
කිමී 62
කුක්කුච්චවූපසන්තං 26
කුක්කුච්චියං 304
කුටි 6
කුඨාරි 206
කුතොජා 84
කුබ්බති 50
කුබ්බනකං 318
කුමුදෙ 206

ක

කුම්භදූහනා 92
කෙවලී 26, 188
කොධනො 38
කොධපඤ්ඤාණො 32
කොමාරං 88
කොසාති 158
කොලට්ඨිමත්තියො 202
කොලමත්තියො 202
කොවිළාරො 14

ඛ

ඛග්ගවිසාණකප්පො 12
ඛණඤ්ඤූ 96
ඛත්තියා 58
ඛජ්ජා 84
ඛයාතීතං 188
ඛරාජිනානි 76
ඛිඩ්ඩං 18
ඛිඩ්ඩා 12, 292
ඛීණව්‍යප්පථො 48
ඛීයමානෙසු 126
ඛීලා 8, 246
ඛෙත්තාජිනං 158
ඛෙත්තානි 158
ඛුප්පිපාසා 128
ඛෙත්තමූලබන්ධනා 158

ග

ගජ්ජසි 208
ගණවස්සිකො 86
ගණ්ඨිනා 212
ගණ්ඩා 16
ගතයොබ්බනං 32
ගච්ඡති 58
ගබ්භකරණං 292
ගබ්භසෙය්‍යං 10




Free Distribution www.aathaapi.org

ග

ගලයන්ති 216
ගවම්පතිං 8
ගළො 18
ගාථාභිගීතං 26, 142
ගාමකථාය 290
ගාහණෙ 64
ගිද්ධිමානං 98
ගිනි 6
ගිරං 216
ගිරිගබ්භරෙ 124
ගිහිබන්ධනානි 14
ගිහිව්‍යඤ්ජනානි 14
ගුත්තද්වාරො 122
ගුත්තින්ද්‍රියො 18
ගෙධං 20
ගොත්තත්ථද්ධො 34
ගොත්තපක්ඛං 134
ගොධරණියො 8
ගොපී 8
ගොමණ්ඩල පරිබ්බූළ්හං 90
ගොරක්ඛා 190
ගොවජ්ඣා 182

ඝ

ඝම්මනි 106
ඝම්මාභිතත්තො 312
ඝරාවාසො 122
ඝාසෙසනං 220

ච

චක්කං 214
චක්ඛුම 16
චරණ 122, 120
චරති 308
චරාමසෙ 10
චලිතං 234

චා

චාතුද්දිසො 14
චාමරඡත්තගාහකා 214
චාමරා 214
චාරු දස්සනො 174
චිච්චිටායති 26
චිටිචිටායති 26
චිත්ත සිබ්බනො 90
චුජ්ජමානො 38
චෙතො විමුත්තිහීනා 224

ඡ

ඡදනං 30
ඡන්දගූ 288
ඡන්දජාතස්ස 242
ඡන්දනුනීතො 246
ඡන්නා 6
ඡසු 52
ඡින්නකථො 220
ඡින්නසංසයො 342
ඡින්නසොතස්ස 222
ඡින්නසොතො 298

ජ

ජඤ්ඤ 40
ජටා ජල්ලං 76
ජටාජිනධරා 310
ජම්බුසණ්ඩස්ස 176
ජම්මනං 312
ජරසා 254
ජරාමච්චුපරික්ඛයං 236
ජවං 66
ජහාති 2

ජා

ජාතිභයනුදස්සී 64
ජාතිත්ථද්ධො 34
ජාතිමයං 188




Free Distribution www.aathaapi.org

ජ

ජාතිමරණසංසාරං 228
ජාතිමරණස්ස 10
ජාතිවාදස්මිං 188
ජානපදෙ 124

ජි

ජිගිංසනකො 216
ජිය්‍යති 298

ජී

ජීවිතසංඛයම්හි 22
ජීවිතසෙසෙ 210

ජු

ජුතිමා 164
ජුහති 132
ජුහන්තො 126

ජො

ජොතිමන්තො 104

ඤ

ඤාණුපපන්නං 330

ඨ

ඨාපෙති 36

ඨි

ඨිතත්තා 66, 108

ඩ

ඩංසසිරිංසපෙ 16
ඩංසාධිපාතානං 302

ත

තක්කවඩ්ඪනං 334
තක්කං 64, 280
තගස 144
තචමංසාවලෙපනො 60

ත

තචං 2
තණ්හච්ඡිදං 338
තණ්හං 2
තණ්හාධිපන්නා 316
තණ්හානිග්ඝාතනං 334
තතියං 278, 286
තන්දිං 292, 296
තදමිනාපි 42
තමනුදසීනො 350
තපො 24
තම්මයො 268
තරමානරූපො 124
තසරං 66, 148
තසා 44
තාදිනො 46, 48
තාදී 30
තාරයෙතුං 96
කාරාසභං 214
තිණ්ණකථංකථො 6, 30
තිණ්හධාරං 208
තිට්ඨා 280
තිදසගණෙ 212
තිම්බරුත්ථනිං 34
තිලවාහ 204, 212
තුමස්ස 286
තුමො 280
තෙජී 338
තෙවිජ්ජා 188

ථ

ථම්භං 98
ථලං 10
ථාමබලූපපන්නො 20
ථාවරා 44
ථුතුං 66
ථුනන්ති 278
ථොමයන්ති 212



Free Distribution www.aathaapi.org

ද

දක්ඛිණාගිරිස්මිං 22
දද්දල්ලමානා 214
දමප්පත්තා 164
දමා 58
දමථා 136
දරථජා 6
දස්සනසම්පන්නා 36
දහන්ති 262, 278
දළ්හධම්මදස්සී 104
දළ්හනික්කමො 20
දළ්හපරක්කමො 90
දාඨබලී 22
දානපති 146
දාමා 8
දායෙ 218
දාරපොසී 66
දාළයිත්වා 10
දිට්ඨධම්මාභිනිබ්බුතා 334
දිට්ඨපදස්ස 70
දිට්ඨිනිවෙසා 248
දිට්ඨිපරිබ්බසානා 278, 282
දිට්ඨිවිසූකානි 16
දිපදුත්තමං 28
දිබ්බ පථෙ 52
දිවසස්සන්තෙනා 26
දිවා විහාරෙ 212
දිවාරත්ති 46
දීඝපිට්ඨිකෙ 190
දුග්ගච්චා 42
දුට්ඨමනා 246
දුත්තරං 50
දුද්ධීරො 6
දුප්පමුඤ්චා 244
දුබ්බලථාමකස්ස 350
දුබ්බිසොධො 86
දුරන්නයා 74

ද

දුස්සං 212
දුස්සඞ්ගහා 14
දූරවිහාරවුත්තිනො 66
දෙවිසි 443
ද්වයතානං 224
ද්වයතානුපස්සනා 226
ද්වාරභත්තං 88
ද්විජං 38

ධ

ධඞ්කං 84
ධජිනිං 128
ධනත්ථද්ධො 34
ධම්මචරියං 84
ධම්මතක්කපුරෙජවං 340
ධම්මතො 50
ධම්මදෙස්සී 32
ධම්මධරං 18
ධම්මපදෙ 30
ධම්මසන්දොසවාදං 28
ධම්මස්සාමිං 98
ධරියන්තං 214
ධංසන්ති 212
ධානියං 88
ධාරයුං 214
ධූනාථ 212
ධුරධොරය්හං 24
ධෙනුපා 8
ධොනං 106, 248

න

නක්ඛත්තං 292
නග්ගියං 76
නඞ්ගලං 24
නච්චයන්ති 212
නත්ථිකදිට්ඨි 74
නත්ථිකො 292




Free Distribution www.aathaapi.org

### න

නදිං 192
නන්දිසඤ්ජහං 338
නන්දීභවපරික්ඛීණො 52, 194
නභසිගමං 214
නමුචි 126
නරාසභො 214
නහුතානි 212
නළසෙතුං 2
නංගල සතානි 22
නාගො 156
නානා සකත්තං 76
නානාරත්තෙහි 88
නාරිවරගණායුතං 90
නාවජානිය 220

### නි

නිකත්වඤ්ඤනාති 14
නිකුබ්බථ 46
නිකුජ 104
නිකෙතා 62
නික්කාමො 318
නික්කාමිනො 70
නික්කාරණා 22
නික්කුහො 16
නිඛාතා 8
නිග්ගාහකො 33
නිසාති 262
නිග්ඝොසං 222
නිච්චුය්‍යුතා 76
නිච්ඡානො 220
නිච්ඡාරයෙ 116
නිජිගිංසානො 40
නිජ්ඣපෙතුං 96
නිද්දරො 78
නිද්දතං 24
නිද්දාසීලී 12

### නි

නිද්ධන්තකසාවමොහො 16
නිධාය 12
නින්නං 10
නිපච්චවාදී 66
නිපුණත්ථදස්සිං 52, 54
නිපපිපාසො 16
නිබ්බණො 318
නිබ්බන්ති 72
නිබ්බාන 342
නිබ්බානාභිරතො 30
නිබ්බිජ්ඣ 296
නිබ්බිවෙඨන 8
නිබ්බිදබහුලො 100
නිබ්බුතො 16
නිම්මක්ඛො 16
නියතො 20
නියං පුත්තං 46
නියාමදස්සී 110
නිරග්ගලං 92
නිරත්ත 248, 270, 290, 338
නිරබ්බුදෙ 204
නිරස්සජන්ති 250
නිරස්සති 248, 298
නිරංකත්වා 94
නිරාමගන්ධො 222
නිරාසත්ති 270
නිරාසය 16, 194, 336
නිරූපධි 10
නිල්ලොලුපො 16
නිවිට්ඨං 16
නිවිස්සවාදී 286
නිවුත තං 240
නිවුත්තකෙසො 134
නිවෙසනානි 64
නිසජ්ජිත්ති 298
නිසම්ම 16




Free Distribution www.aathaapi.org

නි

නිසාමෙථ 68, 122
නිස්සයෙය්‍ය 252
නිස්සයෙසු 236
නිස්සිතස්ස 234
නීචෙය්‍යො 270, 290
නීයෙය්‍ථ 292
නීලගීවො 66
නීවරණෙ 6
නෙතා 30
නහාතකො 158

ප

පකප්පනං 296
පකප්පිතෙසු 281
පකප්පිතා 248
පක්කන්තුං 92
පක්කොදනො 6
පක්ඛන්දි 30
පගබ්භා 30
පගාළ්හ- 128, 244
පග්ගහිතා 36
පඞ්කං 162
පඞ්කදන්තා 306
පච්චත්තං 286
පච්චනීකං 238
පච්චයාසෙ 6
පච්චයිකො 202
පච්ඡසාරී 4
පච්චෙකසච්චෙසු 260
පච්චුට්ඨාපනා 76
පජ්ජෙන 156
පජ්ජෙ තකරා 104
පඤ්චසෙට්ඨො 106
පඤ්චකප්පී 336
පඤ්ඤාජීවිං 56
පඤ්ඤාණවා 62
පඤ්ඤාදදං 54
පටික්කම්ම 116
පටිස්සඤ්ඤූ 46
පටිච්ච සමුප්පාදදසා 200
පටිච්ඡන්නකම්මන්තො 40
පටිච්ඡාදය 70
පටිජානාති 40
පටිජානරෙ 188
පටිනිස්සජ්ජ 296
පටිබද්ධ චිත්තො 12
පටිභාතු 132
පටිභානවන්තං 18
පටිවජ්ජා 292
පටිසල්ලානං 20
පටිසංයුජෙය්‍ය 266
පටිසූරං 262
පටිසෙනිකත්තා 264
පටිසෙනියන්ති 116
පටිසෙනිං 292
පඨමුප්පත්තිකො 124
පණ්ඩරානි 160
පණ්ඩුකම්බල 214
පතික්ඛං 218
පතිට්ඨාපෙත්වා 168
පතිදිස්සති 38
පතිනන්දිතා 132
පතිරූපෙන 30
පතිලීනචරස්ස 256
පතිලීනො 270
පතීතරූපො 114
පතීතො 212
පත්තප්ඵලං 74
පත්තයානො 190
පත්තපාණි 220




Free Distribution www.aathaapi.org

## ප


| | |
|---|---|
| පත්ථිනං | 156 |
| පත්තිපත්තා | 70, 162 |
| පත්ථයසි | 6 |
| පදකා | 188 |
| පදුමනිරයං | 204, 206 |
| පදුමී | 16 |
| පද්ධගූ | 336 |
| පධානපහිතත්තං | 126 |
| පධානවා | 20 |
| පනුජ්ජ | 108 |
| පනුදන්ති | 26 |
| පනුන්නකොධො | 138 |
| පන්නභාරො | 288 |
| පපඤ්චනාමරූපං | 160 |
| පපඤ්චසඞ්ඛා | 276, 288 |
| පපඤ්චං | 4 |
| පබ්‍රූහති | 40 |
| පභස්සරානි | 14 |
| පමත්තබන්ධු | 126 |
| පමාදනුපතිතො | 100 |
| පමුඤ්චස්සු සද්ධං | 352 |
| පමොචනං | 24 |
| පයුතං | 292 |
| පරදත්තූපජීවී | 66 |
| පරධම්මිකානං | 302 |
| පරපෙසෙසන | 192 |
| පරපාණරොධාය | 66 |
| පරමත්ථදස්සිනං | 66 |
| පරමත්ථපත්තියා | 20 |
| පරමවිසුද්ධදස්සී | 216 |
| පරමං | 30 |
| පරවෙදියං | 140 |
| පරාභවත්තං | 32 |
| පරිකිස්සති | 260 |
| පරික්ඛයං | 204 |
| පරික්ඛයානො | 112 |


## ප


| | |
|---|---|
| පරිග්ගහා | 138, 276 |
| පරිග්ගහෙසු | 246 |
| පරිචරති | 132 |
| පරිජානාති | 78 |
| පරිතස්සති | 192 |
| පරිත්තපඤ්ඤො | 116 |
| පරිත්තසෙ | 290 |
| පරිදෙවනෙය්‍ය | 304 |
| පරිපුච්ඡයානො | 216 |
| පරිපුණ්ණකායො | 174 |
| පරිඵන්දමානො | 244 |
| පරිබ්බජෙය්‍ය | 108 |
| පරිබ්බසානො | 252 |
| පරිබ්බාජං | 40 |
| පරිභාවිතං | 8 |
| පරියාදනං | 204 |
| පරිරුජ්ඣති | 38 |
| පරිවසි | 218 |
| පරිස්සයවිනයං | 290 |
| පරිවෙසනා | 22 |
| පරිස්සයා | 242 |
| පරිස්සයානං | 14 |
| පරිහීරති | 62 |
| පරොවර- | 106, 140, 218, 320 |
| පවත්තාරං | 50 |
| පවාදියා | 280 |
| පවිවෙකරසං | 78 |
| පවෙධිතං | 284 |
| පවෙණියො | 8 |
| පලාපො | 30, 86 |
| පලිපථං | 194 |
| පලෙති | 328 |
| පලොකිතං | 230 |
| පස්සතො | 124 |
| පසංසාවහනං | 78 |




Free Distribution www.aathaapi.org

ප

පසාදෙහි 202
පසුතං 16
පහූතපඤ්ඤ– 208, 108, 164
පහූතවිත්තා 34
පහූතා 272
පහොති 12
පළිබඤ්ඤ 302
පළිගුණ්ඨිතො 40
පාගබ්භියං 292
පාචනං 24
පාටිරූපිකා 76
පාටිහාරියපක්ඛං 120
පාතරාසං 116
පාතිමොක්ඛස්මිං 100
පාතිතො 194
පාදලොලා 18, 290
පාදූදරෙ 190
පත්තහාරං 194
පාපමක්ඛී 38
පාපිච්ඡා 200
පාමුජ්ජකරණං 78
පාසයෙ 118
පාරගතො 6
පාරගංගායං 56
පාරගා 10
පාරගූ 164
පාරායනං 348
පාරිජත්තො 18
පාව 250
පාවා 246
පිට්ඨිමංසිකා 74
පිණ්ඩචාරං 121
පිපීයරෙ 316
පියවිප්පයොගං 12
පියායිතං 256

පි

පිළකාහි 202
පිත්වා 78
පුග්ගලවෙමත්තතා 166
පුච්ඡිතා 150
පුඤ්ඤසම්පදං 150
පුට්ඨුං 32
පුණ්ඩරීකො 206
පුථුජ්ජා 286
පුථුසො 280
පුථුවිමණ්ඩලෙ 308
පුනබ්භවො 148
පුබ්බවාසනවාසිතා 310
පුබ්බාසවෙ 288
පුරක්ඛතො 60
පුරිසත්ත 208
පුරෙක්ඛරොන්ති 252
පුළවාවසථෙ 210
පූතිලතං 10
පූරළාසං 134
පෙක්ඛති 122
පෙක්ඛමානො 12
පෙසුනියස්මිං 208
පෙසුනියං 292
පෙසුනෙය්‍ය 270
පෙසිකො 192, 198
පොක්ඛරපත්ත 194
පොරොහිච්චං 192

ඵ

ඵන්දනෙන 184
ඵස්සයෙ 16
ඵෙසසතුං 118
ඵාලං 24
ඵුසිතග්ගො 72
ඵොඨයන්ති 212




Free Distribution www.aathaapi.org

බ

බන්ධවානි 18
බලානීකං 192
බලීයන්ති 242
බහුප්ඵලං 318
බහුස්සුතං 18
බහුලීකරෙය්‍ය 292
බාලකන්තං 118
බීජූසසරෙත 104
බිලාලමත්තිකායො 202
බෙලුවසලාටුකමත්තියො 202
බොධිසත්තා 214
බ්‍යාරොසනා 46
බ්‍රහා 122
බ්‍රහ්මකොස 158
බ්‍රහ්මඛෙත්තං 158
බ්‍රහ්මචරියං 10,84,178
බ්‍රහ්මබන්ධු 74
බ්‍රහ්මං නිධිං 88
බ්‍රහ්මා 90,150
බ්‍රාහ්මණ ධම්මං 86

භ

භත්තකො 8
භත්තියා 8
භද්දයානෙන 124
භමයථ 212
භමූහි 190
භවරාගපරෙතෙහි 240
භවසොත 230,244
භවාභවත්ථං 4
භවූපනීතා 284
භවෙසු 2
භස්සසමුස්සයො 76
භස්සං 292
භාණයෙ 118

භ

භාසිහි 222
භිසපුප්ඵං 2
භිසි 6
භීරු 228
භුජානි 212
භුම්මානි 68
භූකුටිං 68
භූතෙසු 12
භූතානි 68
භූනහු 208
භූරිපඤ්ඤාණො 350
භූරිමෙධසො 318
භෙදනපරියන්තා 182
භෙරවෙසු 290

ම

මග්ගො 84,278
මග්ගක්ඛායී 28
මග්ගජිනො 28
මග්ගදූසී 2
මග්ගදෙසකො 28
මඞ්ගලානි 88
මච්චුතරො 310
මච්චුධෙය්‍ය 340
මච්චුපරෙතානං 182
මච්ඡපාසා 50
මච්ඡො 242
මණ්ඩලමාලං 168
මත්තඤ්ඤූ 100
මත්තිකභාජනා 182
මත්තිසම්භවං 192
මද්දෙන්තා 242
මනාපදෙසං 218
මනොජවායා 52
මන්තබන්ධුනො 42
මන්තභාණී 270




Free Distribution www.aathaapi.org

ම

| | |
|---|---|
| මත්තා | 48,318 |
| මත්තාහුති | 76 |
| මත්ථලුඞ්ගස්ස | 60 |
| මච්ඡාය | 256 |
| මරූ | 212,214 |
| මහාපුරිසලක්ඛණා | 174 |
| මහාමුනි | 10 |
| මහොඝො | 2 |
| මානසත්තෙසු | 138 |
| මානං | 2 |
| මානානුසයං | 102 |
| මානාභිසමයා | 102 |
| මානුසියා | 68 |
| මාමකො | 256 |
| මායාකතං | 98 |
| මායාවී | 30 |
| මිගාභිභූ | 214 |
| මිතාහාරො | 220 |
| මිත්තද්දුහො | 74 |
| මිත්තානි | 58 |
| මිද්ධී | 262 |
| මුඛදුග්ගවිභූත | 208 |
| මුඛරජාතිකො | 84 |
| මුග්ගමත්තියො | 202 |
| මුඤ්ජමයා | 8 |
| මුඤ්ජං | 128 |
| මුණ්ඩක | 36 |
| මුණ්ඩියං | 76 |
| මුතිමා | 164 |
| මුත්තාපෙක්ඛා | 104 |
| මුත්තසද්ධා | 352 |
| මුද්ධපාතෙ | 308 |
| මුසංතෙ | 258 |
| මූගසම්මතො | 220 |
| මූලා | 4 |

මෙ

| | |
|---|---|
| මෙදවණ්ණං | 130 |
| මෙධගං | 282,294 |
| මෙරුමුද්ධවාසිනො | 212 |
| මොනපථෙසු | 164 |
| මොනං | 222 |
| මොනෙය්‍යං | 218 |
| මොමූහො | 314 |
| මොසධම්මං | 230 |
| මොසවජ්ජං | 260,292 |
| මොහධම්මෙන | 86 |
| මොහනං | 118 |
| මොහන්තරා | 140 |
| මොහමග්ගා | 104 |

ය

| | |
|---|---|
| යකපෙළස්ස | 60 |
| යක්ඛස්ස | 140 |
| යඤ්ඤං | 90 |
| යතචාරී | 304 |
| යතත්තා | 66 |
| යතො | 24 |
| යථාකරො | 118 |
| යථාතථං | 188 |
| යථාතථියං | 110 |
| යථාභිරන්තං | 16 |
| යථොධිකානි | 18 |
| යදත්ථිකං | 106 |
| යාචයොගො | 150 |
| යාජකා | 92,192 |
| යාජයොගා | 320 |
| යායිත්වා | 124 |
| යුගනංගලං | 24 |
| යුගං | 24 |
| යුගමත්තං | 122 |
| යෙනිච්ඡකං | 12 |
| යොගක්ඛෙමස්ස | 126 |




Free Distribution www.aathaapi.org

### යො

යොගක්ඛෙමාධිවාහනං 24
යොගං 196
යොත්තං 24
සොධාජීවො 192,198
යොනිජං 192

### ර

රක්ඛිතමානසානො 18
රජිස්සරො 306
රතනවරො 214
රතී 16
රථෙසභො 176
රට්ඨං 78, 262
රස්සකා 44
රාගරාගී 252
රාගං 2
රාජඛාදය 262
රාජාභිරාජා 176
රාහුග්ගහණා 136
රිඤ්චති 48
රිත්තපෙසුනො 296
රිත්තං 300
රිත්තෙන 96
රුන්නෙන 184
රුප්පති 242
රුසිතො 292
රුළ්හතිණෙ 6
රොගමූලා 160
රොචෙති 32
රොසෙති 40

### ල

ලක්ඛණමන්තපාරගූ 216
ලපයෙය්‍ය 292
ලාභකම්‍යා 270, 292

### ල

ලාලපතං 182
ලිප්පති 164
ලුනාති 160
ලූඛසා 74
ලොකපරියායං 182
ලොමහංසනො 212

### ව

වකා 62
වග්ගගතෙසු 110
වග්ගසාරී 110, 254
වග්ගුවග්ගුං 104
වග්ගුවදෙ 300
වචීගුත්තො 24
වජ්ජු 272
වණිබ්බකං 32
වණ්ණාරොහෙන 124
වණ්ණූපසංහිතං 348
වජ්ජීනො 60
වදඤ්ඤූ 144
වනථජා 6
වමතෙ 60
වම්භයිතෙන 286
වරඤ්ඤූ 72
වරත්තං 192
වරදෙ 72
වරාහරො 72
වසලක 36
වසලකරණෙ 36
වසා 8
වස්සතො 10
වසුත්තමං 84
වංසකලීරො 12
වංසො 12
වාචාපරියන්තං 64




Free Distribution www.aathaapi.org

වා

| | |
|---|---|
| වාචාභිලාපො | 14 |
| වාචායතො | 270 |
| වාජපෙය්‍යං | 92 |
| වාදසීලා | 144 |
| වාදියන්ති | 260 |
| වාරිබින්දු | 116 |
| වාසූපගතං | 124 |
| වාහෙථ | 86 |
| වීතප්පයෙය්‍ය | 250 |
| විකිරණං | 36 |
| විගතඛීලො | 6 |
| විගතමිද්ධො | 46 |
| විගය්හ | 2 |
| විඝාතභූමි | 262 |
| විචිකිච්ඡට්ඨානා | 104 |
| විචිතං | 2 |
| විචාරණා | 342 |
| විචිකිච්ඡති | 170 |
| විජිගුච්ඡතො | 170 |
| විජිගුච්ඡමානං | 78 |
| විජිතින්ද්‍රියො | 76 |
| විජ්ජරෙ | 6 |
| විජ්ජාචරණපරියෙට්ඨිං | 88 |
| විජ්ජාචරණ සම්පන්නං | 50 |
| විජ්ජාය | 50 |
| විජ්ජිත්ථ | 338 |
| විඤ්ඤුපතිං | 194 |
| විඤ්ඤූතසමාධිසාරං | 98 |
| විඤ්ඤූතසාරානි | 98 |
| විතක්කිං | 212 |
| විතක්කා | 4 |
| විතථං | 4 |
| විතතිං | 212 |
| විදහෙ | 292 |
| විදිත්වා | 162 |

වි

| | |
|---|---|
| විධූපිතා | 4 |
| විධූමො | 320 |
| විනයස්සු | 176 |
| විනයිත්වාන | 142 |
| විනළීකතා | 164 |
| විනිඝාති | 262 |
| විනිපාතං | 86 |
| විනිබන්ධාය | 6 |
| විනීලකො | 62 |
| විනෙති | 2 |
| විනෙය්‍ය | 6 |
| විනුදෙත | 58 |
| විපන්නදිට්ඨි | 38 |
| විපරක්කම්ම | 126 |
| විපිට්ඨිකත්වාන | 20, 108 |
| විප්පවසයි | 350 |
| විප්ඵාරිතං | 216 |
| විභාවයන්ති | 70 |
| විභූතරූපසඤ්ඤිස්ස | 342 |
| විභූත සඤ්ඤී | 276 |
| විභූතෙ | 276 |
| විභූසනට්ඨානා | 18 |
| විභොති | 276 |
| විමානදස්සී | 280 |
| විමානෙති | 280 |
| වියඤ්ජනා | 174 |
| වියත්තෙසු | 254 |
| ව්‍යාපන්නෙන | 94 |
| ව්‍යාරම්භා | 298 |
| විරාගරත්තො | 252 |
| විරාජයෙ | 62 |
| විරාධයිත්වා | 284 |
| විරුතං | 292 |
| විරුද්ධාතිපාතිනො | 76 |
| විරූපරූපෙන | 16 |
| විවටචක්ඛු | 290 |




Free Distribution www.aathaapi.org

වි

විවරති 216
විවසනෙ 220
විසඤ්ඤසඤ්ඤී 276
විසටං 2
විසතා 222
විසත්තා 84
විසත්තිකං 322
විසත්තො 12
විසමෙ 16
විසල්ලො 6, 30
විසෙනිකත්වා 264
විසෙනිභූතො 250, 288
විසෙසී 266
විසොසයිත්වා 2
විසොසයෙ 128
විසොසෙහි 298
විස්සවන්තො 62
විභාතෙ 104
විහෙසාභිරතො 84
වීතදොසො 4
වීතතණ්හං 28
වීතමොහො 4
වීතරාගො 4
වීතලොභො 4
වීතවණ්ණො 314
වීතිපතන්ති 214
වීතිවත්තො 4
වීසතිබාරිකො 204
වුත්තිරෙසා 26
වුඩ්ඪාපචායී 96
වෙවිකිච්ඡි 154
වෙතරණිං 210
වෙදගුං 160
වෙදනි 160
වෙහැතියං 48

වෙ

වෙමජ්ඣෙ 268
වෙවිච්ඡං 296
වෙවිච්ඡා 316
වෙස්සායනො 134
වොහාරකුටා 76
වොහාරං 190
ව්‍යක්ඛිස්සං 188
ව්‍යග්ඝුසභො 124
ව්‍යපනුජ්ජ 20
ව්‍යප්පථයො 300
ව්‍යප්පථ- 50, 300
ව්‍යසනගතො 216
ව්‍යාරුද්ධෙ 294

ස

සකායතනානි 286
සකිඤ්චනො 192
සකුන්තමංසෙහි 74
සක්කති 96
සක්කා 44
සක්ඛිසි 264
සක්ඛිධම්මං 294
සක්ඛිනාති 8
සක්ඛිපුට්ඨො 8
සඞ්කප්පා 48
සඞ්ඛං 64
සඞ්ඛාතධම්මා 20
සඞ්ඛාතුං 204
සඞ්ඛාය 64
සඞ්ඛාර නිරොධ ඤාණ කුසලො 110
සඞ්ඛ්‍යාකාරො 106
සඞ්ගණිකාරතස්ස 16
සඞ්ගතා 256
සඞ්ගමූලං 160
සඞ්ගහිතත්තභාවො 116




Free Distribution www.aathaapi.org

ස


සඞ්ගං 194, 250, 324
සඞ්ගා 116, 138
සඞ්ගාතිගං 192
සඞ්ගාතිගො 76
සඞ්ගො 18
සඞ්ඝට්ටමානානි 14
සඞ්ඝාටි රජූපවාහනං 116
සඞ්ඝාටිවාසී 134
සච්චනික්කමො 164
සච්චමනා 246
සජ්ජන්ති 116
සජ්ඣායධනධඤ්ඤ 88
සඤ්ජාත ඛන්ධො 16
සඤ්ඡින්න පත්තො 18
සඤ්ඤක්ඛරසඤ්ඤනිස්සිතො 164
සඤ්ඤතත්තා 66
සඤ්ඤතො 92
සඤ්ඤමෙන 284
සඤ්ඤසඤ්ඤී 276
සඤ්ඤසත්තො 250
සඤ්ඤං 162
සඤ්ඤාතිං 34
සඤ්ඤාවිමොක්ඛ 328
සඨානි 292
සණ්ඨතා 222
සතිමං 64
සත්ථානි 260
සත්ථුදස්සයො 176
සද්ධා 24
සද්ධාපකතං 88
සද්ධම්මපූජා 286
සනන්තනො 132
සන්තිසොරච්චසමාධි 98
සන්තුසිතො 318
සන්ථව– 12, 50, 268
සන්ථවාතො 62


ස


සන්දනං 192
සන්දිට්ඨිරාගෙන 280
සන්ධිසෙඵ 110
සන්ධූපායති 26
සපදානචාරිං 20
සපදානං 122
සපරිග්ගහෙන 118
සපරියන්තචාරිං 302
සප්පවිසං 2
සබ්බකායපරිහායිනො 342
සබ්බකොසමූලබන්ධනා 158
සබ්බයොගවිසංයුත්තං 196
සබ්බලොකාභිභුං 196
සබ්බසඤ්ඤොජන
බන්ධනච්ඡිද 146
සබ්බසඤ්ඤොජනාතිගො 52
සබ්බසත්තුත්තමො 214
සභාසීලී 32
සභොජනො 34
සමච්ඡිද්දගත්තා 210
සමණක 36, 82
සමණප්පවාදිතානි 164
සමණූපාසනස්ස 222
සයත්තකපල්ලා 210
සමානභාගං 218
සමානවාසො 6
සමානියා 8
සමාය 282
සමාරම්භා 92
සමිතාවිනො 148
සමුක්කංසෙ 40
සමුජ්ජුපඤ්ඤස්ස 106
සමුද්දහරෙය්‍ය 116
සමුප්පිලවාසෙ 210
සමූහතාසෙ 4
සමෙරිතා 294




Free Distribution www.aathaapi.org

ස

සම්පධූපායති 26
සම්පන්නං 50
සම්පායන්ති 152
සම්ඵෙස්සා 82
සම්ඵුසමානො 210
සම්බාධෙ 190
සම්බුද්ධං 240
සම්බොධගාමිනො 224
සම්භවෙසී 44
සම්මතියො 286
සම්මදයන්ති 116
සම්මසිතා 20
සම්මාපාසං 92
සම්මිඤ්ජෙති 60
සම්මුතිං 284
සයානො 46
සරික්ඛා 290
සරිතං 2
සලිලම්බුචාරි 18
සලිලකන්තො 176
සලිලවිද්ධො 242
සලිලවිද්ධානං 98
සලිලභුකවුත්ති 44
සලිලං 16, 294
සවිභූසයං 292
සස්සුං 40
සහස්ස මණ්ඩලං 214
සහිතා 14
සහිරඤ්ඤො 34
සංකප්පසත්තා 350
සංයතත්තා 88
සංයොජනියෙහි 108
සංවාසියා 8
සංවිජිත 294
සංසග්ගජාතස්ස 12

සං

සංසිතං 228
සංසීනපත්තො 14
සංසුද්ධචාරණො 50
සහාය සම්පදං 14
සහෙය්‍යුං 6

සා

සාඛගණො 86
සාතං 274
සාතියෙසු 270
සාදනෙසු 194
සාදූනි 34
සාධුවිහාරිං 14
සාමයිකං විමුත්තිං 16
සාමාකචිඞ්ගුලකචීනකානි 74
සාරලීනං 28
සාරම්භක කක්කසකසාවමුච්ඡං 98
සාරූප්පාහි 132
සාවිත්ති 134, 178
සාසපමත්තීහි 202
සාසපො 194
සාහසා 296

සි

සිවීං 214
සිඞ්ඝාණිකාය 60
සිත්වා 242
සිනෙහං 64
සිබ්බනිං 318
සීසසරං 2
සීමන්තරං 142
සීමාතිගො 252
සීලවතූපපන්නං 64
සීලුත්තමා 284
සුකුසලසම්පහට්ඨං 214
සුඛුමාලා 90




Free Distribution www.aathaapi.org

### සු

| | |
|---|---|
| සුවිචසතෙ | 212 |
| සුද්ධිපෙක්ඛා | 160 |
| සුප්පණිහිතො | 46 |
| සුපිතෙන | 98 |
| සුප්පභාතං | 57 |
| සුප්පභායා | 644 |
| සුබ්බතානං | 30 |
| සුබ්බිනයො | 282 |
| සුමෙධං | 64, 338 |
| සුයිට්ඨං | 54 |
| සුරුචි | 174 |
| සුවණ්ණදණ්ඩා | 214 |
| සුවණ්ණනෙක්ඛං | 214 |
| සුවාණා | 62 |
| සුවාමි | 208 |
| සුවිකප්පිතා | 4 |
| සුවිකප්පිතෙන | 104 |
| සුවිජානො | 32 |
| සුවුට්ඨිතං | 54 |
| සුසඬ්ඛතා | 6 |
| සුසණ්ඨානං | 8 |
| සුසිරං | 60 |
| සුසුක්කදාඨො | 174 |
| සුස්සූසමානා | 114 |
| සුහජ්ජ | 12 |
| සුජූ | 44 |

### සෙ

| | |
|---|---|
| සෙඛා | 316 |
| සෙදජල්ලිකා | 60 |
| සෙනා | 40 |

### සෙ

| | |
|---|---|
| සෙරිතං | 12 |
| සෙලෙන්ති | 212 |
| සොකමලං | 138 |
| සොඛ්‍යං | 18 |
| සොගන්ධිකො | 206 |
| සොතාවධානුපතිසුප්පතීතා | 96 |
| සොතෙහි | 60 |
| සොත්තියං | 162 |
| සොණ්ඨානං | 80 |
| සොරච්චං | 24 |
| සොරතා | 92, 164 |
| සොවචස්සතා | 82 |
| සොස්සං | 216 |
| සෙනාසජං | 12 |
| සෙනාසජා | 84 |
| සෙනාභ දෙසං | 20 |
| සෙනාභනවයං | 12 |
| සෙනාභා | 12 |
| ස්වාතිවත්තා | 248 |

### හ

| | |
|---|---|
| හව්‍ය සෙසං | 132 |
| හව්‍යං | 136, 146 |
| හාපෙති | 12 |
| හිතමිතසෙන | 218 |
| හිතසුඛතාය | 214 |
| හිරිභිසෙධො | 136 |
| හීළෙයාය | 220 |
| හුරං | 68, 146, 334 |
| හෙතුකප්පා | 6 |




Free Distribution www.aathaapi.org